2022 අගෝස්තු 24
2022 ஆகஸ்ட் 24
24 August 2022

NAOSL

# 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාව

## 2018 இன் 19 ஆம் இலக்க தேசிய கணக்காய்வு அதிகாரச்சட்டத்தின் 14 ஆவது பிரிவின் பிரகாரம் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்படுகின்ற கணக்காய்வாளர் தலைமை அதிபதியின் மூன்றாண்டு அறிக்கை

## Triennial Report of the Auditor General presented in parliament in terms of Section 14 of the National Audit Act, No. 19 of 2018

එකොළොස් වන කාණ්ඩය - 09
பதினோராவது தொகுதி - 09
Eleventh Volume - 09

රාජ්‍ය සමාගම්
பொதுக் கம்பனிகள்
Public Companies

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



# විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2018-2020

**රාජ්‍ය සමාගම්**

# පටුන



| | | | පිටු අංක. |
|---|---|---|---|
| 1. | විධායක සාරාංශය | | 6 |
| 2. | විගණකාධිපති වෙත ගිණුම් ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර | | 10 |
| 3. | සමස්ත සංඛ්‍යා ලේඛන | | 14 |
| 4. | රාජ්‍ය සමාගම්වල තනි නිරීක්ෂණ | | |
| | 4.1 | ශ්‍රී ලංකන් කේටරින් (පුද්ගලික) සමාගම | 26 |
| | 4.2 | ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සහ සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 28 |
| | 4.3 | ශ්‍රී ලංකන් එයාලයින්ස් (පුද්ගලික) සමාගම | 31 |
| | 4.4 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර (පුද්ගලික) සමාගම | 38 |
| | 4.5 | සීමාසහිත ලංකා පොහොර (පුද්ගලික) සමාගම | 47 |
| | 4.6 | සීමාසහිත NSB අරමුදල් කළමනාකරණ (පුද්ගලික) සමාගම | 67 |
| | 4.7 | සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම | 71 |
| | 4.8 | BOC ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | 75 |
| | 4.9 | ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී | 78 |
| | 4.10 | BOC දේපළ සංවර්ධන සහ කළමනාකරණ (පුද්ගලික) සමාගම | 82 |
| | 4.11 | BOC කළමනාකරණ සහ උපකාරක සේවා (පුද්ගලික) සමාගම | 88 |
| | 4.12 | හොටෙල්ස් කලම්බෝ (1963) (පුද්ගලික) සමාගම | 91 |
| | 4.13 | පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | 95 |
| | 4.14 | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී | 97 |
| | 4.15 | පීපල්ස් ලීසිං සහ ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | 99 |
| | 4.16 | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | 101 |
| | 4.17 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 102 |
| | 4.18 | පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | 104 |
| | 4.19 | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | 106 |
| | 4.20 | මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම (CESL) | 107 |
| | 4.21 | සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN) | 117 |
| | 4.22 | ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම | 124 |
| | 4.23 | සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම (ANCL) | 126 |

| | | | |
|---|---|---|---|
| | 4.24 | ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පුද්ගලික) සමාගම (Sri Lanka CERT ) | 133 |
| | 4.25 | ලංකා රජයේ තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම (LGII) | 135 |
| | 4.26 | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (පුද්ගලික) සමාගම (ICTA) | 139 |
| | 4.27 | ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම | 143 |
| | 4.28 | ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම | 149 |
| | 4.29 | ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගම | 151 |
| | 4.30 | ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත (පුද්ගලික) සමාගම (CPSTL) | 153 |
| | 4.31 | සීමාසහිත සී-නෝර් පදනම | 170 |
| | 4.32 | ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම | 176 |
| | 4.33 | ඕෂන් ව්ව් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම | 180 |
| | 4.34 | නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගම | 188 |
| | 4.35 | සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (පුද්ගලික) සමාගම | 197 |
| | 4.36 | වෝටර්ස් එජ් (පුද්ගලික) සමාගම | 207 |
| | 4.37 | ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගම | 219 |
| | 4.38 | LRDC සේවා (පුද්ගලික) සමාගම | 223 |
| | 4.39 | බී.සී.සී. ලංකා (පුද්ගලික) සමාගම | 227 |
| | 4.40 | ලංකා පොස්පේට් (පුද්ගලික) සමාගම | 231 |
| | 4.41 | ලංකා ඛනිජ වැලි (පුද්ගලික) සමාගම | 236 |
| | 4.42 | පරන්තන් කෙමිකල්ස් (පුද්ගලික) සමාගම | **257** |
| | 4.43 | SLINTEC ඇකඩමි (පුද්ගලික) සමාගම | **261** |
| | 4.44 | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (පුද්ගලික) සමාගම | **264** |
| | 4.45 | මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්ගලික) සමාගම | **274** |
| | 4.46 | හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | **279** |
| | 4.47 | කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | **280** |
| | 4.48 | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | **283** |
| | 4.49 | කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | **288** |
| | 4.50 | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | **292** |
| | 4.51 | ලිට්‍රෝ ගෑස් (පුද්ගලික) සමාගම | **297** |

| | | | |
|---|---|---|---|
| | 4.52 | ලිට්‍රෝ ගෑස් පර්යන්තය (පුද්ගලික) සමාගම | 303 |
| | 4.53 | ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම | 309 |
| | 4.54 | මහවැලි උපදේශන කාර්යාංශය (පුද්ගලික) සමාගම | 311 |
| | 4.55 | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම | 316 |
| | 4.56 | මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | 319 |
| | 4.57 | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය - ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම | 325 |
| | 4.58 | GSMB තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම | 327 |
| | 4.59 | ලංකා සෝල්ට් (පුද්ගලික) සමාගම | 332 |
| | 4.60 | සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | 349 |
| | 4.61 | සීමාසහිත ඇල්කඩුව වැවිලි (පුද්ගලික) සමාගම | 352 |
| | 4.62 | සීමාසහිත හලාවත වැවිලි (පුද්ගලික) සමාගම | 363 |
| | 4.63 | සීමාසහිත කුරුණෑගල වැවිලි (පුද්ගලික) සමාගම | 370 |
| | 4.64 | සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා (පුද්ගලික) සමාගම | 373 |
| | 4.65 | සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව | 385 |
| | 4.66 | සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 391 |
| | 4.67 | සීමාසහිත හිඟුරාන සීනි (පුද්ගලික) සමාගම | 402 |
| | 4.68 | සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම | 407 |
| | 4.69 | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය | 412 |
| | 4.70 | සීමාසහිත ජය කන්ටේනර් ටර්මිනල්ස් (පුද්ගලික) සමාගම | 422 |
| | 4.71 | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | 432 |
| | 4.72 | සිලෝන් ෂිපිං කෝපරේෂන් ලිමිටඩ් | 443 |
| | 4.73 | නෝර්ත්සී ලිමිටඩ් | 451 |
| | 4.74 | මන්තායි සෝල්ට් ලිමිටඩ් | 457 |
| | 4.75 | සීමාසහිත ශ්‍රී ලංකා වරාය කළමනාකරණය සහ උපදේශන (පුද්ගලික) සමාගම | 461 |
| | 4.76 | ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම | 466 |
| | 4.77 | කොළදෙණිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම | 476 |
| | 4.78 | ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම | 477 |
| | 4.79 | ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම | 484 |

| | | | |
|---|---|---|---|
| | 4.80 | කුඹල්ගමුව මිනිහයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම | **488** |
| | 4.81 | දැදුරු ඔය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම | **492** |
| | 4.82 | ඇන්ට් ලෙකෝ මීටරින්ග් (පුද්ගලික) සමාගම | **495** |
| | 4.83 | සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම | **499** |
| | 4.84 | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම | **519** |
| | 4.85 | සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම | **523** |
| | 4.86 | LECO ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම | **527** |
| | 4.87 | මගනැගුම උපදේශන සහ ව්‍යපෘති කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම | **530** |
| | 4.88 | මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ (පුද්ගලික) සමාගම | **537** |
| | 4.89 | මගනැගුම ඉමල්ෂන් ප්‍රොඩක්ෂන් (පුද්ගලික) සමාගම | **542** |
| | 4.90 | සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම | **547** |
| | 4.91 | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | **553** |
| | 4.92 | සීමාසහිත ලංකා සතොස | **556** |
| | 4.93 | සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | **566** |
| | 4.94 | නැෂනල් වෙල්ත් කෝපරේෂන් (පුද්ගලික) සමාගම | **569** |
| | 4.95 | නැට්වෙල්ත් සිකියුරිටීස් (පුද්ගලික) සමාගම | **571** |
| | 4.96 | ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී | **576** |
| | 4.97 | ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම | **579** |
| | 4.98 | හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී | **582** |
| | 4.99 | සීඑෆ්සී ෆවුන්ඩින්ග් (ඇපයෙන්) සීමිත සමාගම | **584** |
| | 4.100 | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම | **588** |
| | 4.101 | සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම | **589** |
| | 4.102 | ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගම | **591** |
| | 4.103 | ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල (පුද්ගලික) සමාගම | **596** |

## 1. විධායක සාරාංශය

රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය සතු සීමිත වගකීම් සමාගම්, සමාගම් පනත යටතේ ස්ථාපිත කර තිබූ අතර මෙම සමාගම් සම්පූර්ණයෙන් රජය සතුවන හෝ රාජ්‍ය පුද්ගලික බද්ධ ව්‍යාපාර ලෙස ක්‍රියාත්මක වන කොටස් ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් රජය සතුවන සමාගම් වේ. සම්පූර්ණයෙන්ම රජය සතු ව්‍යවසායන් කෙරෙහි ඇතිවන බොහෝ ගැටළු වළක්වා ගැනීමට පුද්ගලික අංශයේ මැදිහත්වීම පාලන යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කරයි. මහා භාණ්ඩාගාරයේ මැදිහත් වීමක් නොමැතිව අදාළ පුද්ගලික ව්‍යවසායන් මගින් ප්‍රාග්ධනය යොදවන පරිපාලිත හෝ ආශ්‍රිත සමාගම් ලෙස රාජ්‍ය ව්‍යවසායන් මගින් ඇති කරන ලද හා සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද රජය සතු සමාගම්ද පවතී.

කොටස්වලින් සියයට 100 ක්ම රජය හෝ රාජ්‍ය ව්‍යවසායක් සතුවන සීමිත වගකීම් සමාගම්වල අධ්‍යක්ෂවරු පත්කිරීමේ බලය රජය සතුවන අතර කිසිදු පුද්ගලික තැනැත්තෙකුට ලාභයෙන් කොටසක් ලැබිය නොහැකිය. එය සැබැවින්ම රාජ්‍ය සංස්ථාවක් වශයෙන් රජය විසින් සරල කොටස් විකිණීමක් මගින් සාමාන්‍ය "පුද්ගලික අංශයේ" සමාගමකට පරිවර්තනය කිරීම ප්‍රමාණවත්වීම හා සමාන වේ. කොටස්වලින් සියයට 50කට අඩු ප්‍රමාණයක් විකිණීමේදී ද සමාගම් අධ්‍යක්ෂවරු පත් කිරීමේ බලය රජය සතුවේ. කොටස්වලින් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් විකිණීමේදීද රජය ආයතනික ප්‍රතිපත්තියට බලපෑම් කිරීමට හැකි වන ප්‍රමාණවත් බලවත් තත්ත්වයක ඇත. කෙසේ වුවද බොහෝ රාජ්‍ය සංස්ථා විසින් පරිපාලතයන්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතරය ඔවුන්ගේ සාමාජිකයන්ගෙන් සමන්විත වුවද, ඔවුන්ගේ පාලන බලතල පරිපාලනයන් සඳහා පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

රාජ්‍ය ව්‍යවසායයන්හි ක්‍රියාකාරකම් හා මෙහෙයුම් පාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් වරින් වර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ඉදිරිපත් කර ඇති අතර එහි යම් යම් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය සමාගම් මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය ලබා ගතයුතු නමුත් එවැනි එකඟතාවයන් ලබාගැනීමකින් තොරව තීරණ ක්‍රියාත්මක කර ඇති අවස්ථා නිරීක්ෂණය විය.

### වාර්ෂික මුල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත දී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක් වන හෝ රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් කොටස් වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් දරනු ලබන සමාගමක අනුමත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් අදාළ ලේඛන සහ තොරතුරු විගණකාධිපතිවරයා වෙත ලැබී මාස තුනක් ඇතුළත, සිය වාර්ෂික වාර්තාවේ පළකිරීම සඳහා එම රාජ්‍ය සංස්ථාවේ හෝ සමාගමේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා වෙත විගණකාධිපතිවරයා විසින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

මූල්‍යමය ක්‍රියාකාරිත්වය

ලැබී ඇති තොරතුරුවලට අනුව රාජ්‍ය අංශයන්හි මෙහෙයුම් ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී ආර්ථික දියුණුවට ඉතා වැදගත් වන ක්ෂේත්‍රයන්හි නියතු සමාගම් බොහොමයක් අලාභ ලබන තත්ත්වයකට පත්ව ඇති බව නිරික්ෂනය වේ. 2018, 2019 සහ 2020 වසර සඳහා ලැබුණු තොරතුරු අනුව සමාගම් 123 ක ලාභ හා අලාභ තත්ත්වය පිළිබඳ විශ්ලේෂණය පහත පරිදි දැක්වේ.

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| මුළු සමාගම් ගණන | 123 | 123 | 123 |
| මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී ඇති සමාගම් ගණන | 99 | 94 | 79 |
| මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී නොමැති සමාගම් ගණන | 24 | 29 | 44 |
| මුළු ලාභය (රු.) | 58,193,225,299 | 69,378,042,263 | 44,077,356,416 |
| මුළු අලාභය (රු.) | 53,914,318,305 | 61,920,797,632 | 52,873,985,274 |
| ලාභ ලබන සමාගම් ගණන | 59 | 59 | 46 |
| අලාභ ලැබූ සමාගම් ගණන | 37 | 32 | 31 |

ඉහත තොරතුරු වලට අනුව, 2018, 2019 සහ 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ සමාගම් වලින්, 2018, 2019 සහ 2020 වසර සඳහා මුළු අලාභ පිළිවෙලින් රු.බිලියන 53 ක්, රු.බිලියන 61 ක්, රු.බිලියන 52 ක් වන අතර මුළු ලාභය පිළිවෙලින් රු.බිලියන 58, රු.බිලියන 69, රු.බිලියන 44 ක් වේ. ඒ අනුව, තොරතුරු ඉදිරිපත් කළ සමාගම් වලින් ශ්‍රී ලංකන් එයාලයින් සමාගම, ලංකා සතොස සමාගම, සීමාසහිත ලංකා නැව් සංස්ථාව, සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය, සිනොලංකා හොටෙල් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම ඇතුළුව 2018, 2019 සහ 2020 වසරවල පිළිවෙළින් සමාගම් 13, 15 සහ 10 ක් ඔවුන්ගේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 100 කට වැඩි අලාභයක් පෙන්නුම් කළ ආයතන අතර විය.

2018, 2019 සහ 2020 වර්ෂවල විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ සමාගම් 99, 94 සහ 79 හි පාලනය යටතේ පැවති මුළු වත්කම් ප්‍රමාණය පිළිවෙළින් රු. බිලියන 1,028 ක්, රු. බිලියන 1,164 ක් සහ රු.බිලියන 1,111 කි.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය

රාජ්‍ය ව්‍යවසායන් විසින් වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබේ. ආයතනවල ක්‍රියාකාරිත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් මූල්‍ය ප්‍රකාශනවලින් පිළිබිඹු කරන්නේද යන බවට ස්වාධීන සහතිකයක් විගණකාධිපති විසින් ලබාදෙනු ලැබේ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක්

ප්‍රකාශ කිරීම මගින් මෙම සහතිකය ලබාදෙනු ලැබේ. රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවලින් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන්නේද හෝ නොවන්නේද යන්න සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතින්ට හෝ දැනට ජාත්‍යන්තර රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූල වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතින්ට එම මූල්‍ය ප්‍රකාශන අනුකූල වන්නේද හෝ නොවන්නේද යන්න පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිගමනය විගණන මතයෙන් ප්‍රකාශ කෙරේ.

මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් හෝ නොඑකඟතාවයන් හා විෂය පථය සීමාවීම් හා කළමණාකරණය හා විගණනය අතර මතුවන නොඑකඟතාවයන් සලකාබැලීමෙන් අනතුරුව සිව් ආකාරයක මතයන් ප්‍රකාශයට පත්කරනු ලබයි. ඒවා නම්.

තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හෝ අනුකූල නොවීම වාර්තා වී නොමැති විට මෙම මතය ප්‍රකාශ කෙරේ.

තත්ත්වාගණනය කළ මතය

මූල්‍ය ප්‍රකාශනවල ඇති ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ නොගැලපීම වාර්තා කර ඇති නමුත් ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලවලට පැතිරී නොමැති විට.

අහිතකර මතය

විෂය පථය සීමා කිරීමේ ව්‍යාප්තිය අහිතකර විගණන මතය ප්‍රකාශ කිරීමට හේතු වනු ඇත.

මතය ව්‍යාවනය කිරීම

තෝරාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ කළමනාකරණය සහ විගණනය අතර ප්‍රමාණාත්මක / පුළුල් එකඟ නොවීම් සහ වැරදි ප්‍රකාශයන් ඇති විට, ඒවා අදාළ වන පද්ධතියේ හෝ මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කිරීමේ ප්‍රමාණවත් බව.

විගණන මතයක් ප්‍රකාශ කිරීමේදී සාධාරණ මතයක් ප්‍රකාශ කිරීමේ අරමුණින් පරිගණකගත විගණන මෘදුකාංගයේ සහාය ලබා ගැනේ. ගිණුම් පරීක්ෂා කිරීමෙන් තෝරාගත් විගණන නියැදියට අදාළ සම්පූර්ණ ප්‍රමාණාත්මක මට්ටමේ ප්‍රතිශතයක් ලෙස නිවැරදි නොකළ සම්පූර්ණ වැරදි ප්‍රකාශයන් ගැලපීමෙන් පසු ලැබෙන ප්‍රතිඵල මත විගණන මතය තීරණය වේ.

2018, 2019 සහ 2020 වසර සඳහා සමාගම් 123කට අදාළව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන මතයන් පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | 2018 | 2019 | 2020 |
|---|---|---|---|
| තත්ත්වාගණනය නොකල | 43 | 38 | 36 |
| තත්ත්වාගණනය කල | 43 | 45 | 36 |
| වියාචනය | 11 | 9 | 2 |
| අහිතකර | 1 | 1 | 0 |
| මතය තවමත් තීරණය කර නොමැති ගණන | 1 | 1 | 5 |
| මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැති ගණන | 24 | 29 | 44 |

## 2. විගණකාධිපති වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර

පහත සඳහන් සමාගම්වල 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී නොමැත.

| | සමාගම් නාමය |
|---|---|
| 1. | සීමාසහිත මිහින් ලංකා සමාගම |
| 2. | සීමාසහිත ජනතා පොහොර සමාගම |
| 3. | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව |
| 4. | සීමාසහිත ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය |
| 5. | සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් සමාගම |
| 6. | සීමාසහිත ජාතික කඩදාසි සමාගම |
| 7. | සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම |
| 8. | හෙලිටුවර්ස් (පුද්ගලික) සමාගම |
| 9. | මිල්කෝ (පුද්ගලික) සමාගම |
| 10. | සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම |
| 11. | සීමාසහිත පෑලියගොඩ ගබඩා සංකීර්ණ සමාගම |
| 12. | ලංකා සිමෙන්ති සමාගම |
| 13. | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම |
| 14. | ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම |
| 15. | සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව |
| 16. | හිඟුරාන ෂුගර් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් |
| 17. | ලංකා ගෑස් සමාගම |
| 18. | ඒල් ටී ඒල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම |
| 19. | අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සීමාසහිත |
| 20. | ක්‍රිකට් ඒඩ් (ඇපයෙන්) සීමිත සමාගම |
| 21. | සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම |
| 22. | සීමාසහිත ලංකා සළුසල (පුද්ගලික) සමාගම |
| 23. | සතොස - ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගම |
| 24. | සතොස සිකියුරිටි ඇන්ඩ් ජෙනරල් (පුද්ගලික) සමාගම |

පහත සඳහන් සමාගම්වල 2019 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී නැත.

| | සමාගම් නාමය |
|---|---|
| 1. | සීමාසහිත මිහින් ලංකා සමාගම |
| 2. | සීමාසහිත ජනතා පොහොර සමාගම |
| 3. | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව |
| 4. | සීමාසහිත ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය |
| 5. | සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් සමාගම |
| 6. | සීමාසහිත ජාතික කඩදාසි සමාගම |
| 7. | සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම |
| 8. | හෙලිටුවර්ස් (පුද්ගලික) සමාගම |
| 9. | මිල්කෝ (පුද්ගලික) සමාගම |
| 10. | ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම |
| 11. | සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම |
| 12. | සීමාසහිත පැලියගොඩ ගබඩා සංකීර්ණ සමාගම |
| 13. | ලංකා සිමෙන්ති සමාගම |
| 14. | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම |
| 15. | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම |
| 16. | ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම |
| 17. | සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව |
| 18. | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය |
| 19. | හිඟුරාන සීනි කර්මාන්තායතනය |
| 20. | ලංකා ගෑස් සමාගම |
| 21. | ඒල් ටී ඒල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම |
| 22. | අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සීමාසහිත |
| 23. | මග නැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගම (පුද්ගලික) සමාගම |
| 24. | ක්‍රිකට් ඒඩ් (ඇපයෙන්) සීමිත සමාගම |
| 25. | සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම |
| 26. | සීමාසහිත ලංකා සළුසල (පුද්ගලික) සමාගම |
| 27. | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් |
| 28. | සතොස - ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගම |
| 29. | සතොස සිකියුරිටි ඇන්ඩ් ජෙනරල් (පුද්ගලික) සමාගම |

පහත සඳහන් සමාගම්වල 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී නැත.

| | සමාගම් නාමය |
|---|---|
| 1. | සීමාසහිත මිහින් ලංකා සමාගම |
| 2. | සීමාසහිත ජනතා පොහොර සමාගම |
| 3. | හොටෙල්ස් කලම්බෝ (1963) (පුද්ගලික) සමාගම |
| 4. | පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම |
| 5. | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව |
| 6. | සීමාසහිත ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය |
| 7. | සීමාසහිත ජාතික කඩදාසි සමාගම |
| 8. | ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පුද්ගලික) සමාගම |
| 9. | ලංකා රජයේ තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම |
| 10. | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (පුද්ගලික) සමාගම |
| 11. | සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා සමාගම |
| 12. | හෙලිටුවර්ස් (පුද්ගලික) සමාගම |
| 13. | මිල්කෝ (පුද්ගලික) සමාගම |
| 14. | ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම |
| 15. | සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම |
| 16. | සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (පුද්ගලික) සමාගම |
| 17. | සීමාසහිත පැලියගොඩ ගබඩා සංකීර්ණ සමාගම |
| 18. | ලංකා සිමෙන්ති සමාගම |
| 19. | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම |
| 20. | ලිට්‍රෝ ගෑස් (පුද්ගලික) සමාගම |
| 21. | ලිට්‍රෝ ගෑස් පර්යන්තය (පුද්ගලික) සමාගම |
| 22. | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම |
| 23. | මහවැලි ස්වභාවික සම්පත් කළමනාකරණ (පුද්ගලික) සමාගම |
| 24. | ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම |
| 25. | සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය |
| 26. | සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම |
| 27. | සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව |
| 28. | ලංකා සීනි සමාගම (පුද්ගලික) සමාගම |
| 29. | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය |

| | |
|---|---|
| 30. | හිඟුරාන සීනි කර්මාන්තායතනය |
| 31. | ලංකා ගෑස් සමාගම |
| 32. | නෝර්ත්සී ලිමිටඩ් |
| 33. | ඒල් ටී ඒල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම |
| 34. | මග නැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ (පුද්ගලික) සමාගම |
| 35. | අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සීමාසහිත |
| 36. | මග නැගුම ඉමල්ෂන් නිෂ්පාදන සමාගම (පුද්ගලික) සමාගම |
| 37. | ක්‍රිකට් ඒඩ් (ඇපයෙන්) සීමිත සමාගම |
| 38. | සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම |
| 39. | සීමාසහිත ලංකා සළුසල (පුද්ගලික) සමාගම |
| 40. | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් |
| 41. | සතොස - ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගම |
| 42. | සතොස සිකියුරිටි ඇන්ඩ් ජෙනරල් (පුද්ගලික) සමාගම |
| 43. | සීමාසහිත ලංකා සතොස (පුද්ගලික) සමාගම |
| 44. | සී ඒෆ් සී ෆවුන්ඩින්ග් (ඇපයෙන්) සීමිත සමාගම |

## 3. සමස්ත සංඛ්‍යා ලේඛන

| | | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| මුළු සමාගම් ගණන | | 123 | 123 | 123 |
| මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී නොමැති සමාගම් ගණන | | 99 | 94 | 79 |
| | | | | |
| මුළු ආදායම (රු.) | | 585,802,232,563 | 603,364,659,173 | 354,132,969,573 |
| මුළු වියදම (රු.) | | 585,716,229,666 | 598,067,624,347 | 366,220,691,166 |
| මුළු වත්කම් (රු.) | | 1,028,703,093,452 | 1,164,763,247,558 | 1,111,345,868,339 |
| මුළු වගකීම් (රු.) | | 832,888,695,991 | 1,047,019,894,607 | 1,006,051,740,946 |
| මුළු ලාභය (රු.) | | 58,193,225,299 | 69,378,042,263 කි | 44,077,356,416 |
| මුළු අලාභය (රු.) | | 53,914,318,305 | 61,920,797,632 | 52,873,985,274 |
| | | | | |
| ලාභ ලබන සමාගම් ගණන | | 59 | 59 | 46 |
| අඳාභ ලැබූ සමාගම් ගණන | | 37 | 32 | 31 |
| | | | | |
| මතය | තත්ත්වාගණනය නොකල | 43 | 36 | 36 |
| | තත්ත්වාගණනය කල | 43 | 36 | 35 |
| | වියාචනය | 11 | 2 | 2 |
| | අහිතකර | 1 | 0 | 0 |
| | මතය තවමත් තීරණය කර නොමැති ගණන | 1 | 5 | 5 |
| | | | | |
| මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ලැබී නොතිබුණු ගණන | | 24 | 29 | 44 |
| | | | | |

**ඉහළම ලාභ ලැබූ සමාගම් 10**

| වර්ෂය | | සමාගම් නාමය | බදු වලට පෙර ලාභය රු. |
|---|---|---|---|
| **2018** | 1. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම | 12,103,450,641 |
| | 2. | ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 10,458,408,140 |
| | 3. | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 8,672,467,000 |
| | 4. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 7,150,600,000 |
| | 5. | ශ්‍රී ලංකන් කේටරින්ග් ලිමිටඩ් | 5,675,913,393 |
| | 6. | සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 3,217,302,000 |
| | 7. | ලිට්‍රෝ ගෑස් පර්යන්ත (පුද්ගලික) සමාගම | 2,026,051,819 |
| | 8. | සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් | 1,522,230,109 |
| | 9. | ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී | 1,056,061,640 |
| | 10 | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 847,015,921 |
| **2019** | 1. | ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 15,221,993,419 |
| | 2. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම | 11,563,043,364 |
| | 3. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 8,205,007,000 |
| | 4. | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 6,554,285,000 |
| | 5. | ලිට්‍රෝ ගෑස් (පුද්ගලික) සමාගම | 4,927,261,736 |
| | 6. | ශ්‍රී ලංකන් කේටරින්ග් ලිමිටඩ් | 4,799,690,965 |
| | 7. | සීමාසහිත ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගම | 3,927,792,158 |
| | 8. | සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් | 2,927,856,033 |
| | 9. | සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් | 2,277,746,050 |
| | 10. | ලිට්‍රෝ ගෑස් පර්යන්තය (පුද්ගලික) සමාගම | 2,016,745,364 |
| **2020** | 1. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම | 15,574,865,318 |
| | 2. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 7,971,782,000 |
| | 3. | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 7,095,216,000 |
| | 4. | සීමාසහිත ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගම | 2,308,992,614 |
| | 5. | සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් | 2,138,236,881 |
| | 6. | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | 1,667,521,268 |
| | 7. | සීමාසහිත NSB අරමුදල් කළමනාකරණ සමාගම | 901,087,467 |
| | 8. | ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 749,367,009 |
| | 9. | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල | 584,750,798 |
| | 10. | ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී | 518,284,059 |

**ඉහළම අලාභ ලැබූ සමාගම් 10.**

| වර්ෂය | | සමාගම් නාමය | බදු වලට පෙර අලාභය රු. |
|---|---|---|---|
| 2018 | 1. | ශ්‍රී ලංකන් එයාලයින්ස් | 44,022,670,000 |
| | 2. | සීමාසහිත ලංකා සතොස | 2,888,463,272 |
| | 3. | ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 1,814,145,920 |
| | 4. | සීමාසහිල ලංකා නැව් සංස්ථාව | 1,523,141,091 |
| | 5. | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | 801,559,524 |
| | 6. | සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | 622,461,949 |
| | 7. | ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම | 502,041,856 |
| | 8. | සීමාසහිත ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල | 341,526,610 |
| | 9. | නැටවෙල්ත් සිකියුරිටීස් ලිමිටඩ් | 243,412,073 |
| | 10 | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | 202,725,525 |
| 2019 | 1. | ශ්‍රී ලංකන් එයාලයින්ස් | 47,197,860,000 |
| | 2. | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | 5,133,182,782 |
| | 3. | සීමාසහිත ලංකා සතොස | 3,158,544,037 |
| | 4. | ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | 1,430,139,698 |
| | 5. | ලංකා සීනි සමාගම (පුද්ගලික) සමාගම | 1,312,212,893 |
| | 6. | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 1,085,215,556 |
| | 7. | සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | 597,468,619 |
| | 8. | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය | 365,514,611 |
| | 9. | ලංකා සෝල්ට් ලිමිටඩ් | 349,200,431 |
| | 10. | හොටෙල් ඩිවලොපර්ස් ලංකා පීඑල්සී | 312,448,000 |
| 2020 | 1. | ශ්‍රී ලංකන් එයාලයින්ස් | 45,231,460,000 |
| | 2. | ගුවන්තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 3,732,754,673 |
| | 3. | ශ්‍රී ලංකන් කේටරින්ග් ලිමිටඩ් | 960,462,499 |
| | 4. | හොටෙල් ඩිවලොපර්ස් ලංකා පීඑල්සී | 877,343,000 |
| | 5. | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | 527,125,027 |
| | 6. | සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | 249,681,673 |
| | 7. | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | 246,874,417 |
| | 8. | සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | 217,840,000 |
| | 9. | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | 193,289,884 |
| | 10. | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (පුද්ගලික) සමාගම | 100,148,607 කි |

**ඉහළම සෘණ ශුද්ධ වත්කම් සහිත සමාගම් 10**

| අවුරුදු | | සමාගම් නාමය | වටිනාකම රු. |
|---|---|---|---|
| 2018 | 1. | ශ්‍රී ලංකන් එයාලයින්ස් | -177,556,230,000 |
| | 2. | සීමාසහිත ලංකා සතොස | -13,848,877,057 |
| | 3. | ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | -6,234,978,110 |
| | 4. | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | -2,795,997,871 |
| | 5. | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය | -1,525,628,005 |
| | 6. | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | -55,663,307 |
| | 7. | සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (පුද්ගලික) සමාගම | -27,634,268 |
| | 8. | මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්ගලික) සමාගම | -20,500,567 |
| | 9. | SLINTEC ඇකඩමිය | -10,819,070 |
| | 10 | ලෙකෝ ප්‍රොජෙක්ට් (පුද්ගලික) සමාගම | -1,150,056 |
| 2019 | 1. | ශ්‍රී ලංකන් එයාලයින්ස් | -273,369,080,000 |
| | 2. | සීමාසහිත ලංකා සතොස | -16,431,930,926 |
| | 3. | ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | -7,521,543,412 |
| | 4. | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | -2,924,501,623 |
| | 5. | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය | -1,887,834,007 |
| | 6. | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | -1,275,502,116 |
| | 7. | නෝර්ත්සී ලිමිටඩ් | -104,461,439 |
| | 8. | මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්ගලික) සමාගම | -54,371,621 |
| | 9. | සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (පුද්ගලික) සමාගම | -19,018,389 |
| | 10. | SLINTEC ඇකඩමිය | -8,944,970 |
| 2020 | 1. | ශ්‍රී ලංකන් එයාලයින්ස් | -289,265,270,000 |
| | 2. | ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | -6,817,654,771 |
| | 3. | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | -3,171,376,039 |
| | 4. | සීමාසහිත ලංකා නැව් සංස්ථාව | -2,041,613,494 |
| | 5. | මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්ගලික) සමාගම | -88,727,179 |
| | 6. | සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම | -38,416,101 |
| | 7. | ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගම | -28,855,233 |
| | 8. | SLINTEC ඇකඩමිය | -8,314,523 |
| | 9. | ලෙකෝ ප්‍රොජෙක්ට් (පුද්ගලික) සමාගම | -632,704 |
| | 10. | සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | -423,315 |

මතය

| | සමාගම් නාමය | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| 1. | ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සහ සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 2. | ශ්‍රී ලංකන් එයාලයින්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 3. | ශ්‍රී ලංකන් කේටරින් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 4. | සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 5. | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | තීරණය කර නොමැත |
| 6. | සීමාසහිත ලංකා පොහොර (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | තීරණය කර නොමැත |
| 7. | සීමාසහිත ජනතා පොහොර (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 8. | සීමාසහිත NSB අරමුදල් කළමනාකරණ (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 9. | සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 10. | BOC ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 11. | ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 12. | BOC දේපළ සංවර්ධන සහ කළමනාකරණ (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 13. | BOC කළමනාකරණ සහ උපකාරක සේවා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 14. | හොටෙල්ස් කලම්බෝ (1963) (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 15. | පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 16. | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |

| | | | | |
|---|---|---|---|---|
| **17.** | පීපල්ස් ලීසිං සහ ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| **18.** | පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| **19.** | පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ් | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| **20.** | පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ් | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| **21.** | පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **22.** | සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **23.** | මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම (CESL) | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| **24.** | සීමාසහිත ශ්‍රී ලංකා මාධ්‍ය පුහුණු ආයතනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **25.** | සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN) | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| **26.** | ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| **27.** | සෙලන්දිවා ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | ත්ත්වාගණනය නොකල |
| **28.** | සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම (ANCL) | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| **29.** | සීමාසහිත ජාතික කඩදාසි සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **30.** | ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පුද්ගලික) සමාගම (Sri Lanka CERT ) | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **31.** | ලංකා රජයේ තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම (LGII) | වියාචනය | වියාචනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **32.** | ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (පුද්ගලික) සමාගම (ICTA) | වියාචනය | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| **33.** | ලක්දිව ඉංජිනේරු සමාගම | වියාචනය | වියාචනය | ත්ත්වාගණනය කල |

| | | | | |
|---|---|---|---|---|
| 34. | ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල |
| 35. | සීමාසහිත රක්නා ආරක්ෂණ ලංකා (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 36. | ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය නොකල |
| 37. | හෙලිටුවර්ස් (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 38. | සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් | වියාවනය | වියාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 39. | ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත (පුද්ගලික) සමාගම (CPSTL) | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 40. | සීමාසහිත සී-නෝර් පදනම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 41. | ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 42. | සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යාපාර (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 43. | ඕෂන් විව් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 44. | නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | වියාවනය |
| 45. | සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (පුද්ගලික) සමාගම | වියාවනය | වියාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 46. | වෝටර්ස් එජ් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 47. | සීමාසහිත පැලියගොඩ ගබඩා සංකීර්ණ සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 48. | ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 49. | LRDC සේවා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 50. | ලංකා ඛනිජ වැලි (පුද්ගලික) සමාගම | වියාවනය | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |

| | | | | |
|---|---|---|---|---|
| 51. | ලංකා පොස්පේට් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 52. | පරන්තන් කෙමිකල්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 53. | BCC ලංකා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 54. | ලංකා සිමෙන්ති සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 55. | SLINTEC ඇකඩමි (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 56. | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 57. | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝ ටෙක්නොලොජී (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 58. | සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 59. | මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 60. | කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 61. | කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 62. | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 63. | හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 64. | ලිට්‍රෝ ගෑස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 65. | ලිට්‍රෝ ගෑස් පර්යන්තය (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 66. | මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම | විශාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 67. | මහවැලි උපදේශන කාර්යාංශය (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |

| | | | | |
|---|---|---|---|---|
| 68. | මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 69. | ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 70. | ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය - ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 71. | GSMB තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 72. | ලංකා සෝල්ට් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 73. | සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 74. | සීමාසහිත කුරුණෑගල වැවිලි (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 75. | සීමාසහිත හලාවත වැවිලි (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 76. | සීමාසහිත ඇල්කඩුව වැවිලි (පුද්ගලික) සමාගම | අභිතකර | තීරණය කර නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 77. | සීමාසහිත කළුබෝව්ටියාන තේ කර්මාන්ත ශාලා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 78. | සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 79. | ලංකා සීනි (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ව්‍යාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 80. | සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | තීරණය කර නොමැත |
| 81. | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය | ව්‍යාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 82. | සීමාසහිත හිඟුරාන සීනි (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 83. | සීමාසහිත ජය කන්ටේනර් ටර්මිනල්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල |
| 84. | මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම | ව්‍යාවනය | ව්‍යාවනය | ව්‍යාවනය |
| 85. | ලංකා ගෑස් (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| 86. | සිලෝන් ෂිපිං කෝපරේෂන් ලිමිටඩ් | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | තීරණය කර නොමැත |
| 87. | නෝර්ත්සී ලිමිටඩ් | ත්ත්වාගණනය කල | වියාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 88. | මන්තායි සෝල්ට් ලිමිටඩ් | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | තීරණය කර නොමැත |
| 89. | සීමාසහිත ශ්‍රී ලංකා වරාය කළමනාකරණය සහ උපදේශන (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 90. | ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 91. | ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 92. | කුඹල්ගමුව මිනිහයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 93. | ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 94. | දැදුරු ඔය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය නොකල |
| 95. | කොලදෙණිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 96. | සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල |
| 97. | ඇන්ට් ලෙකෝ මීටරින්ග් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 98. | LECO ප්‍රොජෙක්ට්ස් (පුද්ගලික) සමාගම | තීරණය කර නොමැත | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 99. | වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 100. | සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 101. | එල් වී එල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 102. | මගනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | වියාවනය | ත්ත්වාගණනය කල |
| 103. | මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ (පුද්ගලික) සමාගම | වියාවනය | වියාවනය | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |


| | | | | |
|---|---|---|---|---|
| 104. | අධිවේගී මාර්ග ප්‍රවාහන (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 105. | මගනැගුම ඉමල්ෂන් ප්‍රොඩක්ෂන් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 106. | සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 107. | සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 108. | සීමාසහිත ලංකා සළුසල (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 109. | කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 110. | සතොස - ඉදිකිරීම් සහ ඉංජිනේරු සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 111. | සතොස සිකියුරිටි ඇන්ඩ් ජෙනරල් (පුද්ගලික) සමාගම | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 112. | ලංකා සතොස ලිමිටඩ් | වියාචනය | අහිතකර | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 113. | සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 114. | නැෂනල් වෙල්ත් කෝපරේෂන් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 115. | නැට්වෙල්ත් සිකියුරිටීස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය කල |
| 116. | ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පීඑල්සී | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 117. | ලංකා හොස්පිටල් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 118. | හොටෙල් ඩිවලොප්මන්ට් පීඑල්සී | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |
| 119. | සීඑෆ්සී ෆවුන්ඩින්ග් (ඇපයෙන්) සීමිත සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත |
| 120. | සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය නොකල |

| | | | | |
|---|---|---|---|---|
| 121. | සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 122. | ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල | ත්ත්වාගණනය කල |
| 123. | ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල (පුද්ගලික) සමාගම | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල | ත්ත්වාගණනය නොකල |

# 4. රජය සතු සමාගම්වල ස්වාධීන නිරීක්ෂණ

## 4.1 ශ්‍රී ලංකන් කේටරින් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 10,872,057,854 | 5,196,144,461 | 12,589,673,559 | 3,102,947,095 | 5,675,913,393 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 9,936,212,101 | 5,136,521,136 | 15,911,843,401 | 3,674,299,060 | 4,799,690,965 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 1,286,059,738 | 2,246,522,237 | 9,675,089,145 | 1,858,668,279 | (960,462,499) | තත්ත්වාගණනය නොකළ |





| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 2020 මාර්තු 31 දින වන විට ලැබිය යුතු මුළු ගිණුම් ශේෂය රු. මිලියන 11,347 ක් විය. මේ අතරින් සියයට 94 කට සමාන වන රු. මිලියන 10,686 ක් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් ලැබිය යුතු විය. තවද | ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා පියවර ගත යුතුය. | ශ්‍රී ලන්කන් ගුවන් සමාගමින් ලැබිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා කළමනාකරණය කටයුතු කරමින් සිටී. | 2021 මාර්තු 31 දින වන විට ලැබිය යුතු මුළු ශේෂය රු.මිලියන 6,258 ක් විය. මේ අතරින් සියයට 99 කට සමාන |

ඉහත ශේෂයෙන් රු. මිලියන 4,980 ක් වසරකට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුනි. 2020 මාර්තු 31 දිනට ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් අයකර ගත යුතු වූ ශේෂය එදිනට සමාගමේ මුළු වත්කම් වටිනාකමෙන් සියයට 67 ක් නියෝජනය වේ. එසේ වුවද, මෙම ලැබිය යුතු ශේෂය පිළිබඳව නොසලකා සමාගම විසින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට රු.මිලියන 1,701 ක් වූ ලාභාංශ ගෙවා තිබුණි.

වන රු. මිලියන 6,200 ක් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමෙන් ලැබිය යුතු විය.

## 4.2 ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සහ සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 31,873,433,895 | 21,415,025,755 | 100,834,949,387 | 72,355,770,721 | 10,458,408,140 | තත්ත්වාගණනය කළ |
| **2019** | 29,880,766,508 | 14,658,773,089 | 108,274,708,980 | 69,044,051,730 | 15,221,993,419 | තත්ත්වාගණනය කළ |
| **2020** | 11,453,496,443 | 15,186,251,116 | 103,216,071,222 | 66,233,169,665 | (3,732,754,673) | තත්ත්වාගණනය කළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 31,873.43 | 21,415.03 | 100,834.95 | 72,355.77 | 10,458.41 |
| 2019 | 29,880.77 | 14,658.77 | 108,274.71 | 69,044.05 | 15,221.99 |
| 2020 | 11,453.50 | 15,186.25 | 103,216.07 | 66,233.17 | (3,732.75) |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2006 පෙබරවාරි 09 දිනැති අංක.PE/GOCO/11 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපියට පටහැනිව සමාගම විසින් රජයට අයත් ඉඩම් ගොඩනැගිලි සහ වෙනත් චංචල හා නිශ්චල දේපල තක්සේරු කිරීමෙන් තොරව | වත්කම් තක්සේරු ක්‍රියාවලිය හැකි ඉක්මනින් අවසන් කර භාණ්ඩාගාර ලේකම්ගේ උපදෙස් පරිදි ශුද්ධ වත්කම්වලට අදාළ කොටස් රජය (GOSL) | දැනටමත් තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් කටුනායක ගුවන්තොටුපලේ ගොඩනැගිලි අගය කර ඇති අතර අනෙකුත් ගොඩනැගිලි අගය | අනෙකුත් ගොඩනැගිලි හා වාහන තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතින අතර අනෙකුත් වත්කම් අගය කිරීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | වගකීම් පමණක් පවරාගෙන තිබූ අතර ශුද්ධ වත්කම් පැවරීම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙත නිකුත් කිරීමට නිර්දේශ කරනු ලැබේ. | කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත. | මෙතෙක් කටයුතු කර නොමැත. |
| (ආ) | 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව සමාගම විසින් ගුවන්තොටුපල කලාප ස්ථාපනය හෝ සංවර්ධනය සඳහා ප්‍රධාන සැලසුමක් (Master Plan) සකස් කර නොතිබුණි. | ප්‍රධාන සැලැස්ම සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. | 1983 දී නෙදර්ලන්ඩ් එයාර්පෝට් කන්සල්ටන්ට් මඟින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සඳහා ප්‍රධාන සැලැස්මක් සකස් කර ඇතත් එය යාවත්කාලීන වී නොමැත. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලට අදාළ ප්‍රධාන සැලැස්ම සකස් කර ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අනුමැතිය ලබා ගන්නා ලදී. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ප්‍රධාන සැලැස්ම 2022 වර්ෂය අවසානයේදී සකස් කර නිම කිරීමට බලාපොරොත්තු වේ. | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලට අදාල ප්‍රධාන සැලැස්ම සකස් කිරීම සඳහා සුදුසු ජාත්‍යන්තර උපදේශන සමාගමක් තෝරා ගැනීම සඳහා යෝජනා කැඳවීම් (Request for Proposals) කර ඇත. |
| (ඇ) | යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල පළමු අදියර ඉදිකිරීම රු. මිලියන 218 ක මුළු වියදමින් 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හෝ පාරිසරික බලපෑම් තක්සේරුවක් සිදු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ තිරසාර බව සහතික කිරීම සඳහා කිසියම් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හෝ පාරිසරික බලපෑම් | රේඛීය අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ උපදෙස් පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. එම අවශ්‍යතා සමාගම | පලාලි ජාත්‍යන්තර ගුවන්තොටුපල මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | තවද, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල 2019 සහ 2020 වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 46.5 ක සහ රු.මිලියන 61.1 ක මෙහෙයුම් අලාභ වාර්තා කර තිබුණි. | තක්සේරුවක් සිදු කළ යුතුය. | විසින් මතු කරන ලද නමුත් ලබාදුන් කෙටි කාලය තුල එය ක්‍රියාත්මක කළ නොහැකි විය. | |
| (ඇ) | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ II අදියර සඳහා ජපන් යෙන් මිලියන 74,397 ක අරමුදල් සැපයීම වෙනුවෙන් සමාගම ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය සමඟ 2012 මාර්තු 28 සහ 2016 මාර්තු 24 යන දිනයන්හිදී ගිවිසුම් දෙකකට එළඹ තිබුණි. කෙසේ වෙතත්, අරමුදල් වටිනාකමින් සියයට 82 ට සමාන කොන්ත්‍රාත්තු වටිනාකමක් 2020 මාර්තු 04 දින දිගු කාල ප්‍රමාදයකින් පසුව ප්‍රදානය කර තිබුණි. තවද 2013 අප්‍රේල් 20 දින සිට 2021 අප්‍රේල් 20 දින දක්වා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය වෙත සමාගම විසින් රු.මිලියන 328 ක මුදලක් අරමුදල් ඌන ලෙස භාවිතා කිරීම හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි. නව පර්යන්ත ගොඩනැගිල්ලේ වහලයේ සැලසුම වෙනස් කිරීම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට හේතු වී තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව A පැකේජයේ ඉදිකිරීම් අවසන් කිරීමට ක්‍රියා කළ යුතු අතර තවදුරටත් ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා ඉදිකිරීම් ප්‍රගතිය වරින් වර සමාලෝචනය කළ යුතුය. | අරමුදල් වටිනාකමින් සියයට 81.68 ට සමාන කොන්ත්‍රාත්තු වටිනාකමක් 2020 මාර්තු 04 දින ප්‍රදානය කර ඇත. කෙසේ වෙතත් කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වීම නිසා, කොන්ත්‍රාත්කරුගේ විදේශ කාර්ය මණ්ඩලය ගෙන්වා ගැනීමේ ප්‍රමාදයක් ඇති වූ අතර අවසානයේදී කොන්ත්‍රාත් කටයුතු 2020 දෙසැම්බර් 15 දින ආරම්භ කෙරුණි. තවද, 2021 පෙබරවාරි 14 දිනට මෙම ව්‍යාපෘතියේ සැලසුම් කළ ප්‍රගතිය 0.03% ට එරෙහිව සත්‍ය ප්‍රගතිය 0.06% ක් විය. | 2021 නොවැම්බර් 23 දිනට මෙම ව්‍යාපෘතියේ සැලසුම් කළ ප්‍රගතිය 4.0% ට එරෙහිව සත්‍ය ප්‍රගතිය 2.3% ක් වී තිබුණි. තවද 2013 අප්‍රේල් 20 දින සිට 2021 ඔක්තෝබර් 20 දින දක්වා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය වෙත සමාගම විසින් රු.මිලියන 341 ක මුදලක් අරමුදල් ඌන උපයෝජනය කිරීම හේතුවෙන් බැඳීම් ගාස්තු ලෙස ගෙවා තිබුණි. |

## 4.3 ශ්‍රී ලංකන් එයාලයින්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 184,652,780,000 | 228,675,450,000 | 77,339,000,000 | 254,895,230,000 | (44,022,670,000) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 183,514,430,000 | 230,712,290,000 | 181,189,600,000 | 454,558,680,000 | (47,197,860,000) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 71,847,360,000 | 117,078,820,000 | 154,381,410,000 | 443,646,680,000 | (45,231,460,000) | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ අලාභය රු.මිලියන 47,197.86 ක් වූ අතර, එදිනට සමුච්චිත | සමාගමේ අලාභ අවම කර ගැනීමට ක්‍රමවත් සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. | 2020 ජුනි 17 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සමාගමේ මෙහෙයුම් කටයුතු දිගුකාලීනව පැවැත්මේ | 2021 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ අලාභය රු.මිලියන 45,231.46 ක්වූ අතර, එදිනට |

අලාභය රු.මිලියන 326,341.48 ක් ද, එදිනට සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.මිලියන 211,645.13 ක්ද, මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් රු.මිලියන 273,369.08 ක්ද විය. තවද, 2020 මාර්තු 31 දිනට සමූහයේ අලාභය රු.මිලියන 44,139.40ක්ද, එදිනට සමූහයේ සමුච්චිත අලාභය රු.මිලියන 316,477.65ක්ද වූ අතර, එදිනට සමූහයේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් ප්‍රමාණය රු.මිලියන 200,878.32 ක්ද, මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් ප්‍රමාණය රු.මිලියන 261,173.54 ක්ද වී තිබුණි. 2020 මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 03 හි දැක්වෙන පරිදි මෙම තත්ත්වයන් සමඟ එහි සඳහන් අනිකුත් සිද්ධීන් හා කොන්දේසි අනුව සමූහයේ / සමාගමේ අඛණ්ඩ පැවැත්ම සැලකිය යුතු තරම් සැක සහිත වන තරමට ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පවත්නා බව පෙන්නුම් කරයි.

කෝවිඩ් 19 රට තුල පැතිර යාම හේතුවෙන් රජය විසින් සංවරණ සීමාවන් පදනම මත පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා රජයේ (GOSL) සහාය ලබාදෙන බව තහවුරු කරමින් ජනාධිපති ලේකම්වරයාගේ 2020 ජුනි 29 දිනැති ලිපිය, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යවස්ථාපිත විගණනය වෙත ලබාදෙන ලද අතර. එපරිදි මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ පැවැත්මක් ඇත" යන උපකල්පනය මත සකස් කර ඇත.

සමුච්චිත පාඩුව රු.මිලියන 371,733.52 ක් ද, එදිනට සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් රු.මිලියන 221,308.99 ක්ද, මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් රු.මිලියන 289,265.27 ක්ද විය. තවද, 2021 මාර්තු 31 දිනට සමූහයේ අලාභය රු.මිලියන 49,761.57 ක්ද, එදිනට සමූහයේ සමුච්චිත අලාභය රු.මිලියන 366,284.57 ක්ද වූ අතර, එදිනට සමූහයේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම් ප්‍රමාණය රු.මිලියන 214,635.95 ක්ද, මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම් ප්‍රමාණය රු.මිලියන 281,490.87 ක්ද වී තිබුණි.

පැනවීම, නිසා සමූහයේ / සමාගමේ ආදායම් අහිමිවීම, පියවීම් ප්‍රමාදවීම් හා ණය හා ද්‍රවශීලතා අවදානම ඇතුලු අහිතකර බලපෑම් රැසකට සමූහය / සමාගම මුහුණ දී තිබුණි.

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.1 මඟින්, කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සමූහයේ / සමාගමේ අනාගත අපේක්‍ෂා, කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ සඳහා සිදු වූ බලපෑම විස්තර කර ඇත. මූල්‍ය ප්‍රකාශ සකස් කරන අවස්ථාවේදී වසංගත තත්ත්වය පැවති නිසා කලමනාකරණය විසින් මෙම සිද්ධින් හා අවස්ථාවන් සමඟ කටයුතු කිරීමට සැලසුම් කර ඇති ආකාරය පිළිබඳ විස්තර කර ඇත.

සටහන් අංක 03 හි සඳහන් සහනදායී කරුණු සහ 2020 ජුනි 17 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව සමාගමේ මෙහෙයුම් කටයුතු දිගුකාලීනව පැවැත්මේ පදනම මත පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා රජයේ (GOSL) සහාය ලබාදෙන බව තහවුරු කරමින් ජනාධිපති

| | | | | | |
|---|---|---|---|---|---|
| | ලේකම්වරයාගේ 2020 ජුනි 29 දිනැති ලිපිය, 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යවස්ථාපිත විගණනය වෙත ලබාදෙන ලද අතර. එපරිදි මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ පැවැත්මක් ඇත" යන උපකල්පනය මත සකස් කර ඇත. | | | | |
| (ආ) | A 330 – 300 ගුවන්‍යානා 06 ක් සහ A 350 – 900 ගුවන්‍යානා 04 ක් මිලදී ගැනීම, තවත් A 350 – 900 වර්ගයේ ගුවන්‍යානා 04 ක් බදු පදනම මත ලබා ගැනීම හා ඉහත A 330 – 300 ගුවන්‍යානා 06 විකුණා නැවත ආපසු බදු පදනම මත ගැනීම සඳහා වූ තීරණ 2013 වර්ෂයේදී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව ගෙන තිබූ අතර, ඒ සඳහා විධිමත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක්ද සිදුකර නොතිබුණි.<br>කෙසේ වුවද, වර්තමානය වන විට 2020 සහ 2021 වර්ෂවල ලැබීමට නියමිත A 350 - 900 ගුවන්‍යානා 04 ක් වෙනුවට A 321 නියෝ (NEOS) සහ / හෝ A 330 නියෝ ගුවන්‍යානා | මෙවැනි මහා පරිමාණ ආයෝජන සිදුකිරීමට පෙර විස්තරාත්මක හා යථාර්තවාදී පිරිවැය, ප්‍රතිලාභ විශ්ලේෂණ සිදුකළ යුතු අතර. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගත යුතුය. තවද, මෙවැනි අනාර්ථික ගනුදෙනු අනාගතයේදී වලක්වා ගැනීම සඳහා සමාගම විසින් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් පසු සැලකිලිමත්ව තම ගුවන්‍යානා මිශ්‍රණය තීරණය කළ යුතු වේ. | එක්සත් රාජධානියේ සුපිරි අධිකරණය මඟින්, බරපතල වංචා කාර්යාලය හා SAS එයාර්බස් සමාගම අතර ඇති කරගෙන තිබූ ගිවිසුම අනුමත කරමින් ලබා දෙන ලද තීන්දුවේදී සඳහන් කර ඇති පරිදි එයාර්බස් සමාගමේ සේවකයන් විසින් ශ්‍රී ලන්කන් ගුවන් සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරිගේ බිරිඳකට අයත් සමාගමකට ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට A 330-300 ගුවන්‍යානා 6 ක් සහ A 350-300 ගුවන්‍යානා 4 ක් මිලදී ගැනීම හා A 350-900 ගුවන්‍යානා 4 ක් කුලී පදනමට ලබා ගැනීමේ ගනුදෙනුවට බලපෑම් සිදුකිරීම සඳහා ගෙවීම් කිරීමට එකඟ වී තිබුණි. | 2020 සහ 2021 වර්ෂවල ලැබීමට නියමිතව තිබූ A 350 900 ගුවන්‍යානා 04 සම්බන්ධයෙන් මේ දක්වා තීරණයක් ගෙන නොමැත. නීති උපදෙස් මත පදනම්ව ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් එස් ඒ එස් එයාර්බස් සමාගම මෙම A 350-900 ගුවන්‍යානා මිලදී ගැනීමේ ගිවිසුම අවසන් කර පූර්ව ගෙවීම් වන්දියක් ද සමඟ අයකර ගැනීම පිළිබඳව 2020 සැප්තැම්බර් 29 දින ලිපියක් (Letter before Action) මඟින් දැනුම් දී ඇත. නමුත්, ඒ සම්බන්ධයෙන් එයාර්බස් සමාගම කටයුතු නොකිරීම හේතුවෙන් බේරුම්කරණය මඟින් හෝ වන්දි ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | මිලදී ගැනීම සඳහා සමාගම සහ එයාර්බස් එස් ඒ එස් සමාගම අතර සාකච්ඡා පවත්වමින් තිබෙන අතර, මෙම වාර්තාවේ දිනය වනවිට ගුවනයානා ලබාගැනීමේ පෙර ගෙවුම් ලෙස රු.මිලියන 2,528.12 ක් (එ.ජ.ඩො. මිලියන 19.21 ක්) එම සමාගම වෙත ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම වාර්තාවේ දින දක්වා මේ සම්බන්ධයෙන් අවසාන තීරණයකට එළඹ නොතිබුණි. තවද, 2016/2017 වර්ෂයේදී බදු පදනම මත ලැබීමට නියමිත වූ A350 – 900 ගුවනයානා 04 හි ගිවිසුම් අවලංගු කිරීම වෙනුවෙන් 2016/2017 වර්ෂයේදී වන්දි වශයෙන්, රු.මිලියන 16,924.36 ක් ගෙවා තිබුණි. | | නීති උපදෙස් මත පදනම්ව ශ්‍රී ලන්කන් ගුවන් සමාගම විසින් එස් ඒ එස් එයාර්බස් සමාගම මෙම A 350-900 ගුවනයානා මිලදී ගැනීමේ ගිවිසුම අවසන් කර පූර්ව ගෙවීම් වන්දියක් ද සමඟ අයකර ගැනීම පිළිබඳව 2020 සැප්තැම්බර් 29 දින ලිපියක් (Letter before Action) මඟින් දැනුම් දී ඇත. | |
| (ඇ) | සමාගම විසින් පසුගිය වර්ෂ දෙක තුළ එහි ණයගැතිභාවය වැඩි කරමින් ඇමරිකානු ඩොලර් මිලියන 200 ක්වූ (ආසන්න වශයෙන් රු.මිලියන 37,950 ක්වූ) සහ රු.මිලියන 26,250 ක්වූ ණය 2017/18 වර්ෂ තුළදී රජයේ බැංකුවලින් | සමාගමේ ණයගැතිභාවය අවම වන පරිදි ආර්ථිකභාවයෙන් යුතුව හා ලාභදායීවන ආකාරයට හිමිකරුවන්ගේ සහාය ලබාගෙන ව්‍යාපාරය මෙහෙයවීමේ වගකීම කළමනාකරණය සතු වේ. | සමාගම ප්‍රාග්ධන ඌනතාවයකට මුහුණ දී ඇති අතර 2020-2022 කාලපරිච්ඡේදය තුළදී සමාගම නැවත ප්‍රාග්ධනීකරණය සඳහා එ.ජ.ඩො. මිලියන 500 ක් දක්වා ලබාදීමට මහාභාණ්ඩාගාරයට කැබිනට් අනුමැතිය ලබා දී | මෙම වාර්තාවේ දිනය දක්වා මෙම ණය මුදල්වල මූලික ණය කිසිවක් ගෙවා නොතිබූ අතර ණය පොලිය වශයෙන් 2019/20 වර්ෂයේදී රු.මිලියන 6,563.88ක් හා 2020/21 වර්ෂයේදී රු.මිලියන |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගෙන තිබුණි. 2019/20 වර්ෂය තුල දී මෙම එ.ජ.ඩො. 200 ණය සඳහා පොලී ලෙස එ.ජ.ඩො. මිලියන 14.63 ක් ආසන්න වශයෙන් රු. මිලියන 2,776.77 ක් ගෙවා තිබුණි. | | ඇත. එහි පළමු කොටස ලෙස 2020 නොවැම්බර් 18 දින එ.ජ.ඩො. මිලියන 150 කට සමාන ශ්‍රී ලංකා බැඳුම්කර ලබා දී ඇත. රාජ්‍ය බැංකු දෙකෙන් ලබා ගන්නා ලද ණය පහසුකම් ආපසු ගෙවීම සමාගමේ සමස්ථ ප්‍රතිසංවිධාන ක්‍රියාවලියේ කොටසක් වේ. එසේ වුවද, කෝවිඩ් 19 වසංගතය නිසා මෙහෙයුම් කටයුතුවලට සිදු වූ දරුණු බලපෑම හේතුවෙන් කර්මාන්තය යථාතත්ත්වයට පත්වන තෙක් හෝ එය නැවත මූල්‍යනය කරන තෙක් ණය ආපසු ගෙවීම් ප්‍රමාද වනු ඇත. | 6,253.04ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 2019 ජූනි මාසයේදී පරිණත වූ බැඳුම්කර නිදහස් කිරීම සඳහා සමාගම විසින් එහි අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් රජයේ සුරක්ෂණය මත 2019 ජූනි මාසයේදී නැවත වරක් එ.ජ.ඩොලර් මිලියන 175 ක් (ආසන්න වශයෙන් රු. මිලියන 33,215 ක් වූ) වූ පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කර සියයට 7 | සමාගමේ ණයගැතිභාවය අවම වන පරිදි ආර්ථිකමය වශයෙන් ලාභදායී වන ආකාරයට ව්‍යාපාරය මෙහෙයවීමේ වගකීම කළමනාකරණය සතු වේ. | බැඳුම්කර ආපසු ගෙවීම 2024 දී සිදු කිරීමට නියමිත වන අතර එය සමාගමේ සමස්ථ ප්‍රතිසංවිධාන වැඩසටහන මඟින් සිදුකරනු ඇත. | බැඳුම්කර ආපසු ගෙවීම 2024 දී සිදු කිරීමට නියමිතය. |

| | | | | |
|---|---|---|---|---|
| | වාර්ෂික පොළී අනුපාතය යටතේ නිකුත් කර තිබුණි. | | | |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 5.1.1 ඡේදය පරිදි සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සමාලෝචනය කරමින් එක් චක්‍රීය සැලැස්මක් ලෙස ඉදිරියට ගෙන යා යුතු වේ. | සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සමාලෝචනය කරමින් එක් චක්‍රීය සැලැස්මක් ලෙස ඉදිරියට ගෙන යා යුතුය. | යාවත්කාලීන කරන ලද පස් අවුරුදු සංයුක්ත සැලැස්ම වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ නව ව්‍යාපාර සැලකිල්ලට ගෙන සකස් කරනු ලබන අතර 2021 වර්ෂයේ මුල් කාලයේදී එය ඉදිරිපත් කරනු ලැබේ. | 2010 සිට 2021 දක්වා වර්ෂ 11ක් ඇතුලත සංයුක්ත සැලසුම් 8 ක් සකස් කර තිබුණ ද එම සැලසුම් එකිනෙක සම්බන්ධ වන ආකාරයෙන් චක්‍රීය සැලැසුම් ලෙස සකස් කර නොතිබුණි. |

## 4.4 සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 8,209,068,934 | 7,902,622,176 | 15,330,801,728 | 12,788,210,246 | 306,446,758 | තත්ත්වාගණනය කළ |
| **2019** | 1,605,960,444 | 1,344,373,600 | 16,201,901,050 | 13,423,781,798 | 261,586,844 | තත්ත්වාගණනය කළ |
| **2020** | 1,786,329,158 | 1,472,694,189 | 20,418,328,166 | 17,407,884,294 | 313,634,969 | තීරණය කර නොමැත |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම පිහිටි ඉඩම කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වුවද ඉඩම සමාගමේ වත්කමක් ලෙස සලකා ඉඩමේ වටිනාකම වන රු.9,000,000 ක් ගිණුම්වලට ගෙනවිත් තිබූ අතර, | ඉඩමේ අයිතිය සමාගමට පවරා ගැනීමෙන් අනතුරුව සමාගමේ වත්කම ලෙස මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කිරීමට කටයුතු කළ යුතු වීම. | ඉඩමෙහි අයිතිය සමාගමට ලබා දීමට කැබිනට් අනුමැතියක් ලබාගැනීමට කටයුතු කර ඇත. | ඉඩමේ අයිතිය සමාගමට පවරාගෙන නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | එමගින් ස්ථාවර වත්කම්වල වටිනාකම එම මුදලින් වැඩි වී දක්වා තිබුණි. | | | |
| (ආ) | වෙළඳ ණයගැතියන් රු. 89,021,859 සම්බන්ධයෙන් ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුය. | මෙම ණයගැතියන් සඳහා ශේෂ සනාථන ලිපි ලබාගැනීම සඳහා සංස්ථාව විසින් ඔවුන් වෙත ලිපි යොමු කර තිබුණි. | ණයගැතියන් සඳහා ශේෂ සනාථන ලිපි ලැබී නැත. |
| (ඇ) | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.11,404,282,74 ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුය. | මෙම ශේෂයන් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීම් ලබා දෙන ලෙස මහා භාණ්ඩාගාරයට දන්වා තිබුණද තවමත් ඒවා ලැබී නොමැති බව වාර්තා විය. | මේ සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමඟ සාකච්චාවක්ද පැවති නමුත් ඒ සම්බන්ධයෙන්ද නිසි පිළිතුරක් ලැබී නොමැත. |
| (ඇ) | ණයගැතියන් රු.159,897,018 ක ශේෂ සම්බන්ධයෙන් ශේෂ සනාථන ලිපි ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුය. | මෙම ණයගැතියන් සඳහා ශේෂ තහවුරු ලිපි ලබාගැනීම සඳහා සංස්ථාව විසින් ඔවුන් වෙත ලිපි යොමු කර තිබුණි. | ණයගැතියන් සඳහා ශේෂ තහවුරු ලිපි ලැබී නැත. |
| (ඉ) | 2015 ජුලි 14 දිනැති අංක. 03/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) අනුව කාර්යය නිමකර දින 10 ක් ඇතුළත ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත් සමාගමේ නිලධාරින් 14 දෙනෙකු විසින් අවස්ථා 43 කදී ලබාගත් එකතුව රු.795,565 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම දින 10 සිට 89 ක් දක්වා ප්‍රමාදයක් සහිතව පියවා තිබුණි. | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමකල වහාම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම තත්වය ඉදිරියේ දී අවම කිරීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කිරීමට කිරීමට කටයුතු කර තිබුණි. | සම්පූර්ණයෙන් නිවැරදි වී නැත. |
| (ඊ) | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ඔක්තෝම්බර් 05 දිනැති ලිපිය අනුව පොහොර ආනයනය සඳහා | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව ණයවර ලිපි | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | විවෘත කළ ණයවර ලිපි වලට අදාළව ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් බැංකුව විසින් අයකල පොලිය පියවීම පොහොර සමාගම සතු වගකීම බව දන්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් බැංකුවට ගෙවීම් කර තිබූ රු.101,801,619 ක් වූ පොලිය භාණ්ඩාගාරයට ගෙවිය යුතු අගයෙන් අඩුකර ගෙවීම් කටයුතු කර තිබුණි. තවද 2019 වර්ෂයේ නියමිත පරිදි එම ගෙවීම් සිදුකිරීම අදාළ නිලධාරීන්ගේ වගකීම වූවත් එම නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් සමාගමට විශාල මුදලක් පොලී ලෙස ගෙවීමට සිදු වී තිබුණි. | වලට අදාළ ගෙවීම් සිදුකර රජයේ මුදල් ඵලදායී ලෙස යෙදවීමට කටයුතු කළ යුතුය. | | |
| (උ) | රාජ්‍ය ව්‍යාපාරයන්, ව්‍යාපාර කටයුතු කෙටිකාලින හා දිගුකාලින දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ලඟා කර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපාරය මෙහෙය වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වුවත්, සමාගම විසින් එවැනි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සමාගම විසින් සංයුක්ත සැලැස්ම පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුය. | රජයේ ප්‍රතිපත්ති වෙනස් වීම නිසා නව සංයුක්ත සැලැස්මක් සකස් කරමින් පවතී. | රජයේ ප්‍රතිපත්තිය වෙනස් වීම මත නව සංයුක්ත සැලැස්මක් සකස්කර විගණනයට ඉදිරිපත් කර නැත. |
| (ඌ) | පොහොර ආනයනය කිරීම සඳහා විවෘත කරන ලද ණයවර ලිපි නියමිත දිනට පියවීමට කටයුතු නොකිරීම නිසා අදාළ බැංකු විසින් එම වටිනාකම ණය මුදලකට පරිවර්තනය කිරීමේ දි රු.2,229,079 ක කොමිස් මුදලක් ද ගෙවීමට සිදු වී තිබුණි. | රජයේ අරමුදල් ඵලදායී හා කාර්යක්ෂමව ලෙස වැය කිරීමට කටයුතු කළ යුතුය. | කිසිඳු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වර්තමානයේදීත් තත්ත්වය එසේම පවතී. |
| (එ) | 1997 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.61,016,519 ක් වු හඳුනා නොගත් ආදායම් සංචිතයක් | හඳුනා නොගත් ආදායම් සංචිත හඳුනා ගෙන නිරවුල් කිරීමට | හඳුනා නොගත් ආදායම්වලින් කොටසක් | හඳුනා නොගත් ආදායම් තවදුරටත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පැවැතියද කළමනාකරණය විසින් එය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | හඳුනාගැනීමට කටයුතු කර තිබුණි. | |
| (ඒ) | 2016 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවති අලෙවි කළමනාකරණ තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරියෙකු පත් කිරීමට කටයුතු නොකර 2016 අප්‍රේල් 04 වන දින සිට එම තනතුරේ වැඩ බැලීම සඳහා නිලධාරියකු පත් කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. | නව අළෙවි කළමනාකරුවකු බඳවා ගැනීමට ප්‍රසිද්ධ දැන්වීම් පළ කොට සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබුණ ද එම තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද නිලධාරියකු ඉදිරිපත් නොවීම හේතුවෙන් ඉහත පුරප්පාඩුව පිරවීමට නොහැකි වී තිබුණි. එහෙත් නැවතත් අයදුම් පත් කැඳවා නව කළමනාකරුවකු බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | අලෙවි කළමනාකරණ තනතුර සඳහා සුදුසුකම්ලත් නිලධාරියෙකු පත් කර නොමැත. |
| (ඔ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුව තොගය භෞතිකව සත්‍යාපනය කර පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කළ යුතු වුවත් හුණුපිටිය ගබඩා සංකීර්ණයෙහි ගබඩා කර තිබූ ඇතැම් පොහොර තොග භෞතිකව සත්‍යාපනය කිරීමට නොහැකි වීම හේතුවෙන් අවසාන තොගයේ වටිනාකම ලෙස ශේෂ පත්‍රය තුළ නිරූපණය කර ඇති රු.278,323,718 ක රසායනික පොහොර තොග අගයෙහි නිවැරදිතාවය තහවුරු කරගත නොහැකි විය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. | හුණුපිටිය ගබඩා සංකීර්ණයෙහි ගබඩා කර තිබූ ඇතැම් පොහොර තොග භෞතිකව සත්‍යාපනය කිරීමට නොහැකි වන අයුරින් ගබඩා කර තිබීම හේතුවෙන් සාර්ථක වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021.03.31 දිනට භෞතිකව සත්‍යාපනයේදීද මෙම ගැටළුව එසේම පැවතුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | සමාගම විසින් සෘජුව මිලදී ගන්නා පොහොර වර්ග සමාගම තුළදී අලෙවි කිරීම, මිශ්‍ර කිරීම, කුඩා පැකට් ලෙස සැකසීම, නැවත මළු කිරීම, එක් එක් වර්ගයන් අතර මාරු කිරීම ආදී විවිධ ක්‍රියාවලියන්ට භාජනය වේ. ගිණුම් වර්ෂය තුළ මිලදීගත් සෘජු පොහොර සම්බන්ධයෙන් උක්ත විවිධ ක්‍රියාවලීන්ට ලක් කළ බවට සංඛ්‍යා ඇතුළත් කර අවසන් තොගය ගණනය කර ඇතත්, තොග ගණනයේදී හඳුනාගෙන ඇති පොහොර මෙට්‍රික් ටොන් 41.891 ක තොග ඌනතාවය රු.මිලියන 1,182 ක් වූ විකුණුම් පිරිවැයට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වසරේ ලාභය ආසන්න වශයෙන් එම ඌනතාවයේ සාමාන්‍ය පිරිවැය වන රු.2,094,550 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී තොග ඌනතාවයන් ගැලපීමට කටයුතු කළ යුතුය. | කිසිඳු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නොමැත |
| (ක) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාගමේ සේවකයන් විසින් ඉතිරිකරගත් කෙටි හා වෛද්‍ය නිවාඩු සඳහා වටිනාකම රු.4,926,394 ක නිවාඩු දීමනා හා සමාගමේ විධායක නිලධාරින් සඳහා වටිනාකම රු.847,427 ක විධායක දීමනා ගෙවා තිබුණි. | මෙම ගෙවීම් නීත්‍යානුකූල නොවූ දීමනා සේ සලකා ක්‍රියා කළ යුතුය. | කිසිඳු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නොමැත |
| (ග) | සමාගමේ පොහොර සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කළ යුතු දිනට මහා භාණ්ඩාගරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් බැංකුව මගින් ලබාගත් කෙටිකාලීන ණය මුදලක් මගින් ගෙවීම් නිරවුල් කර තිබුණි. පසුව කෙටිකාලීන ණය මුදල මහා භාණ්ඩාගාරයේ වගකීමට යටත් දීර්ඝකාලීන ණයකට පරිවර්තනය කර | මහා භාණ්ඩාගාරයෙන් වගවීම සහතික කිරීමට කටයුතු කළ යුතුය. | මෙම කරුණු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය හා දිගින් දිගටම වාචිකව සහ ලිඛිතව කරුණු සාකච්ඡා කරමින් පවතී. | නිවැරදි කර නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | තිබූ නමුත් කෙටිකාලීන ණය සඳහා බැංකුවලට ගෙවන ලද ණය පොලී අයකර ගැනීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමග එකඟතාවයට පත් නොවීම හා කෙටිකාලීන පොලිය දීර්ඝකාලීන ණය මුදලට ඇතුළත්කර නොතිබීම හේතුවෙන් භාණ්ඩාගාරයේ වගකීම තහවුරු නොකළ රු.158,498,393 ක කෙටිකාලීන ණය පොලී මහාභාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | | |
| (ච) | පෙර වර්ෂයේ සිට ජංගම වත්කමක් ලෙස පැවත එන ලංකා පොහොර සමාගමෙන් ලැබියයු තු රු.4,993,147 ක වෙළඳ ණයගැති ශේෂය 2020 වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මේ පිළිබඳව ලංකා පොහොර සමාගම වෙත දැනුවත් කොට තිබුණි. | මෙම ණය මුදල අය කරගෙන නොමැත |
| (ජ) | 2014/ 2015 වර්ෂයේ සිට ජංගම වත්කමක් ලෙස පැවත එන රු.5,047,893 ක විවිධ ණයගැති ශේෂය 2020 වර්ෂයේදීද අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | විවිධ ණයගැති ශේෂ නිවැරදිව හඳුනාගෙන අයකරගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ පාර්ශවයන් වෙත දැනුම් දී ඇති අතර සමහර ණයගැතියන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | මෙම ශේෂය අයකරගෙන නොමැත |
| (ට) | පෙර වර්ෂවලදී උපචිත වියදම් ලෙස ගිණුම්ගත කරන ලද එකතු වටිනාකම රු.3,600,816ක වියදම් 2020 වර්ෂය අවසානය වනවිටත් නිරවුල්කර නොතිබුණි. | උපචිත වියදම් නිවැරදිව ගිණුම්ගතකර අදාළ කාලපරිච්ඡේදය තුළ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂයෙන් රු.728,003.19 ක් ජර්නල් අංක.J/MAR/AQ- අනු(07) මගින් නිවැරදි කොට මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර තිබුණි. | සම්පූර්ණයෙන් නිවැරදි කර නොමැත |
| (ඩ) | 2009 අංක 09 දරන ජාතික ගොඩනැගිලි බදු පනතට අනුකූල නොවීම හේතුවෙන් දේශීය ආදායම් බදු තක්සේරුව අනුව 2016 අවසන් | අදාළ පනතට අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම ගැටලුව ඇති නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව වාර්තා කර තිබිණි. | සිදුවූ අලාභය එලෙසම පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | කාර්තුව සහ 2017 පළමු කාර්තු 02 සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.675,558 ක දඩ මුදලක් ගෙවා තිබුණි. | | | |
| (ණ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාරන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 06 පරිච්ඡේදය 5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය වර්ෂය අවසන් වී දින 200 ක් ගත වීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | ගැටලුව විසඳීම සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කර ඇත. | 2021.03.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2022.03.03 දින ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි. |
| (ත) | 2015 මැයි 25 දිනැති අංක.PED/1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක.PED 1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3 වගන්තිය තුළින් ආවරණය නොවන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 05 දෙනෙකු වෙත චක්‍රලේඛ විධිවිධාන අතික්‍රමණය කරමින් එක් නිලධාරියකු වෙත රු.10,000 බැගින් වන සේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රු.600,000 ක ප්‍රවාහන දීමනා ලබාදී තිබුණි. | මෙම දීමනා නීත්‍යානුකූල නොවූ වියදම් සේ සලකා ක්‍රියා කළ යුතුය. | කිසිඳු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නොමැත. |
| (ද) | ගිණුම් වර්ෂය තුළ කාරක ප්‍රාග්ධනය මැනවින් කළමනාකරණය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රු.78,269,924 ක් දක්වා බැංකු අයිරාවන් භාවිතයට ගැනීමට සිදුවීම හේතුවෙන් රු.2,109,634ක | ණය පොලී වියදම් අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. | කිසිඳු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 ගිණුම් වර්ෂය තුළදී බැංකු අයිරාව පවත්වා ගෙන තිබුණු අතර 2021 වර්ෂය සඳහා රු.15,876,049 ක |

| | | | | |
|---|---|---|---|---|
| | වළක්වාගත හැකිව තිබූ අයිරා පොලී වියදමක් දැරීමට සිදු වී තිබුණි. | | | අයිරා පොලී වියදමක් දරා තිබුණි. |
| (න) | සැපයුම්කරුවන් විසින් ඇනවුමට වඩා රු.6,642,835 ක් අඩුවෙන් පොහොර සපයා තිබුණු අතර එම ප්‍රමාණය සැපයුම්කරුගෙන් නැවත අයකරගත යුතු ලෙස ගිණුම්ගතකර කෙටිකාලීන බැංකු ණය මගින් ගෙවීම් කිරීමටත්, එම ණය වෙනුවෙන්ද අතිරේක පොලී වියදමක් දැරීමටත් සිදු වී තිබුණි. | ලැබුණු පොහොර ප්‍රමාණය පමණක් ගිණුම්ගත කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නැත |
| (ප) | බෙදාහැරීමේ පිරිවැය අඩු කළ හැකි බෙදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමකින් හා ගබඩා අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ගබඩා 13 ක් පවත්වාගෙනයාම තුළින් වළක්වාගත හැකි පරිපාලන මෙහෙයුම් හා ප්‍රවාහන වියදම් වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාර්යක්ෂම හා ඵලදායී බෙදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිවැරදි කර නැත. |
| (බ) | ගිණුම් වර්ෂය තුළ ආනයනය කරන ලද ණයවර ලිපි 06 කට අදාළ TSP මෙ.ටො 3,575 ක් (රසායනාගාර වාර්තා අසමත් වීම හේතුවෙන්) ගොවි ජනතාව වෙත නිකුත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අනුමැතිය ලැබී නොතිබුණි. කෙසේ නමුත් රසායනාගාර වාර්තා නිකුත්වීමට පෙර අනුමැතියකින් තොරව සමාගම විසින් උක්ත පොහොර තොග ගොවි ජනතාව වෙත බෙදාහැර තිබුණි. කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් ගොවීන් වෙත බෙදාහරින ලද උක්ත අසමත් පොහොර තොග සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය නොමැතිව ගොවීන් අතරේ පොහොර බෙදා නොහැරිය යුතුය. | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය නොමැතිව පොහොර ගොවීන් අතරේ බෙදාදීමට ගත් තීරණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | සිදුකර ඇති වරද එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | නිර්දේශකර නොතිබූ නමුත් පොහොර සඳහා ගෙවියයුතු දිනට කෙටිකාලීන බැංකු ණයක් මගින් ගෙවීම් පියවා පසුව මහාභාණ්ඩාගාරයේ වගකීම සහිතව දිගු කාලීන ණය මුදලකට පරිවර්තනයකොට විධිමත් අනුමැතියකින් තොරව සහනාධාර මුදල් ලබාගැනීමට සමාගම කටයුතු කර තිබුණි. | | | |
| (ම) | සහනාධාර පොහොර තොග නිසි කළමනාරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාගම තුළදී හානියට පත් පොහොර මෙ.ටො **369** ක් සමාලෝචිත වර්ෂය තුළ නොමිලේ බෙදාහැරීමට කටයුතු කර තිබීම හේතුවෙන් සමාගමට සිදු වී ඇති අලාභය රු. **22,140,000** ක් විය. | රජයේ සහනාධාර පොහොර තොග නිසි කළමනාකරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු කළ යුතුය. | කිසිඳු වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සිදුකර ඇති පාඩුව එලෙසම පවතී. |
| (ය) | හම්බන්තොට බදු ඉඩමේ ගබඩාවක් ඉදිකිරීම සඳහා උපදේශන ගාස්තු ඇතුළු ප්‍රාරම්භක වියදම් ලෙස පසුගිය වර්ෂවල රු.3,534,711 හා 2020 වර්ෂයේදී රු.198,190 ක් ලෙස එකතු වටිනාකම රු.3,732,901 ක් ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ (Capital Work In Progress) ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් අදාළ ඉඩමේ ගබඩාවක් ඉදිකර නොතිබීම හේතුවෙන් උක්ත වියදම් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යායනයක් කළ යුතුය. | ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | අදාළ ඉඩමේ ගබඩාවක් ඉදිකර නොමැත. |
| | (ර) | | | |

## 4.5 සීමාසහිත ලංකා පොහොර (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 2,411,526,585 | 2,291,744,540 | 27,082,981,082 | 21,551,797,069 | 119,782,045 | තත්ත්වාගණනය කළ |
| **2019** | 2,656,153,207 | 2,467,709,278 | 25,366,775,513 | 19,225,532,823 | 188,443,929 | තත්ත්වාගණනය කළ |
| **2020** | 2,588,654,849 | 2,426,064,433 | 32,098,651,854 | 25,752,673,374 | 162,590,416 | තීරණය කර නොමැත |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම විසින් පොහොර ගබඩා කර ඇති අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම සඳහා 2015 අප්‍රේල් 01 සිට 2019 මාර්තු 31 දක්වා කාලය සඳහා රු.6,460,000 ක මුදලක් වාර මුදල් සහ දඩ වශයෙන් ගෙවිය යුතු වුවද එම ශේෂය මූල්‍ය ප්‍රකාශයේ | වාර මුදල් සහ දඩ මුදල් රු.6,460,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කල යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් සිදු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දක්වා තිබුණේ නොතිබුණි. | | | |
| (ආ) | රු.105,534,809 ක් වූ විවිධ ණයගැති ශේෂයන් සඳහා ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට ණය ගැතියන්ට උපදෙස් දී තිබුණි. | වෙළඳ ණය ගැතියන් සම්බන්ධයෙන් ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.19,159,274,649 ක් වූ ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ලිඛිතව තහවුරු කර නොමැත. | ශේෂය තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඈ) | ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන්, අම්පාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගෙන් සහ රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු රු.86,408,870 ක ශේෂය, බෙදාහැරීමේ නියෝජිත ආයතන තුනකින් වසරකට වැඩි කාලයක් සඳහා ලැබිය යුතු රු.47,385,977 ක ශේෂය, පාරිභෝගිකයෙකුගෙන් ලැබිය යුතු වසරකට වඩා පැරණි රු.10,230,000 ක ශේෂය සහ මහියංගනය ගොවිජන සේවා මධ්‍යස්ථානයෙන් ලැබිය යුතු රු.1,839,321ක ශේෂය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | අදාළ ණයගැති ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | සමාගම ණය ශේෂ අයකර ගැනීම සඳහා නීති දෙපාර්තමේන්තුවට යොමු කර තිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ඉ) | වසර 05කට වඩා පැරණි තවත් ලැබිය යුතු රු. 6,644,781 ක ශේෂයක් සහ 2015 වසරේ සිට පැවත එන පොතුවිල් ගබඩාවේ | මෙම ණයගැති ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | තොග ඌණතාවය සම්බන්ධයෙන් දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇත. | ලැබිය යුතු ශේෂයන් අය කර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පොහොර ඌනතාවය සම්බන්ධයෙන් ගබඩා භාරකරුවන්ගෙන් ලැබිය යුතු රු.7,694,938 ක ශේෂයක් දක්වා තිබූ අතර, එම ශේෂයන් 2018 වසර වන විටත් අයකර ගැනීමට සමාගම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | | |
| (ඊ) | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2018 ඔක්තෝම්බර් 05 දිනැති ලිපිය අනුව පොහොර ආනයනය සඳහා විවෘත කල ණයවර ලිපි වලට අදාලව ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් බැංකුව විසින් අයකල පොලිය පියවීම පොහොර සමාගම සතු වගකීමක් බව දන්වා තිබුණි. එහෙත් පොහොර සමාගම සතු රු.බිලියනයකට අධික කාලීන තැන්පතු තිබියදී 2018/19 වර්ෂයේ ණයවර ලිපි කල්පිරීම මත නොපියවූ ප්‍රමාණය කෙටිකාලීන ණය මුදලක් ලෙසට පරිවර්තනය කර ඒ සඳහා ණය පොලී වශයෙන් රු.36,267,366 ක් ගෙවීම් කර තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ නියමිත පරිදි එම ගෙවීම් සිදු කිරීම අදාල නිලධාරීන්ගේ වගකීම වුවත් එම නිලධාරීන්ගේ නොසැළකිල්ල හේතුවෙන් සමාගමට විශාල මුදලක් පොලී ලෙස ගෙවීමට සිදු වී තිබුණි. | සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ උපදෙස් වලට අනුකූලව ණයවර ලිපි වලට අදාල ගෙවීම් සිදුකර රජයේ මුදල් එලදායි ලෙස යෙදවීමට කටයුතු කල යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | සමාගම සතුව ආදායම් ඉපයිය හැකි ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයෙහි (Sri Lanka Accreditation Board) ලියාපදිංචිය ලත් රු.18,557,867 ක් වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුල දී රු.380,750 ක ආදායමක් පමණක් උපයා තිබීම හේතුවෙන් ආදායම් ඉපයීමට හැකිවන ආකාරයේ උපායමාර්ගික සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු බවත් ඒ අනුව රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිත තත්වයේ පැවතුණු බවත් විගණනයේදී නිරීක්ෂණය විය. | රසායනාගාරය සතු උපකරණ වලින් උපරිම ඵලදායිතාවයක් ලබාගැනීමට කටයුතු කල යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | රසායනාගාර උපකරණවලින් උපරිම ඵලදායිතාවයක් ලබාගෙන නොතිබුණි. |
| (ඌ) | සමාගමේ සේවය කරනු ලබන සේවකයන්ට උසස්වීම් ලබාදීමේ දී බඳවා ගැනිමේ පටිපාටිය අනුව අදාල සුදුසුකම් සපුරාලිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුලදි සමාගමේ කළමණාකරු (පරිපාලන හා මානව සම්පත්) සහ සහකාර කළමණාකරු (මුදල්) යන තනතුරු සඳහා සමාගමේ සේවය කරනු ලබන නිලධාරින් දෙදනෙකු, අදාල සුදුසුකම් සපුරා නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එම තනතුරු සඳහා උසස් වීම් ලබා දී තිබුණි. | බඳවා ගැනීමේ පටිපාටියට අනුව උසස්වීම් ලබාදීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | කළමනාකරු (පරිපාලන සහ මානව සම්පත්) විශ්‍රාම ගොස් ඇත. සිදු වූ වරද නිවැරදි කර නොතිබුණි. |
| (එ) | කළමණාකරු (ප්‍රසම්පාදන) යන තනතුර සඳහා වැඩබැලීමේ පදනම | තනතුර සඳහා ස්ථිරවම බඳවා ගැනීමට කටයුතු | කම්කරු අධිකරණයේ | ස්ථිර තනතුර පිරවීමට කටයුතු කර |

| | | | | |
|---|---|---|---|---|
| | මත නිලධාරියකු පත්කර තිබුණ ද, එම පුරප්පාඩුව පිරවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | කළ යුතුයි. | නඩුවක් ගොනු කර ඇති බව සඳහන් කෙරේ. | නොතිබුණි. |
| (ඒ) | සමාගම විසින් සෘජුව මිලදී ගන්නා පොහොර වර්ග සමාගම තුළදී අලෙවි කිරීම, මිශ්‍ර කිරීම, කුඩා පැකට් ලෙස සැකසීම, නැවත මළු කිරීම, එක් එක් වර්ගයන් අතර මාරු කිරීම ආදී විවිධ ක්‍රියාවලියන්ට භාජනය වේ. ගිණුම් වර්ෂය තුළ මිලදීගත් සෘජු පොහොර සම්බන්ධයෙන් උක්ත විවිධ ක්‍රියාවලීන්ට ලක් කළ බවට සංඛ්‍යා ඇතුළත් කර අවසන් තොගය ගණනය කර ඇතත්, තොග ගණනයේදී හඳුනාගෙන ඇති පොහොර මෙට්‍රික් ටොන් 101.17 ක තොග ඌනතාවයක් විකුණුම් පිරිවැයට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වසරේ ලාභය ආසන්න වශයෙන් රු. 5,085,500 කින් අඩුවෙන් දක්වා තිබුණි. | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී තොග ඌණතාවය සකස් කිරීමට කටයුතු කළ යුතුය | පරීක්ෂණයක් පවත්වා ලිඛිත වාර්තාවක් ලබාදෙන ලෙස අභ්‍යන්තර විගණන අංශයට සභාපතිවරයා උපදෙස් දී ඇති බවද වාර්තා විය. | එය නිවැරදි කර නොතිබුණි. |
| (ඔ) | සමාගමේ ප්‍රයෝජනය පිණිස මිලදී ගන්නා සියලුම ද්‍රව්‍ය පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමකට ගිණුම් ගතකොට ගබඩාවට භාර දෙන අතර ගබඩාවෙන් අදාළ අංශය වෙත නිකුත් කරනු ලබන අවස්ථාවේදී අදාළ ද්‍රව්‍යයන් වත්කම් හෝ වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමේ ක්‍රමය භාවිතා කරනු ලබයි. ගිණුම් වර්ෂය තුළ පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ | ඌණතාවයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ගෙන් එය අයකර ගත යුතුය. | මෙය නිවැරදි කිරීම සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කර ඇති බව වාර්තා කෙරේ. | වත්කම් හා වියදම් ගිණුම් සඳහා හිඟ වටිනාකම් ගැලපීම නිවැරදි කර නොමැති අතර වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් ඌන අගය අයකර ගැනීම සඳහා විමර්ශනයක් සිදු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.1,978,401 ක ඌනතාවයක් ඇති වී ඇති අතර ඌනතාවය පිළිබඳ විමර්ශනයන් සිදුකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීම වෙනුවට ඌනතාවයේ අගය වත්කම් හා වියදම් ගිණුම් වලට ගලපා තිබුණි. | | | |
| (ඕ) | සමාගමේ පොහොර සැපයුම්කරුවන් සඳහා නියමිත පරිදි ගෙවීමට මහා භාණ්ඩාගරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් බැංකුව මගින් ලබාගත් කෙටිකාලීන ණය මුදලක් මගින් ගෙවීම් නිරවුල් කර තිබුණි. පසුව කෙටිකාලීන ණය මුදල මහා භාණ්ඩාගාරයේ වගකීමට යටත් දීර්ඝකාලීන ණයකට පරිවර්තනය කොට තිබූ නමුත් කෙටිකාලීන ණය සඳහා ගෙවන ලද ණය පොලී අයකර ගැනීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමග එකඟතාවයට පත් නොවීම හා කෙටිකාලීන පොලිය දීර්ඝකාලීන ණය මුදලට ඇතුළත් කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාරයේ වගකීම තහවුරු නොකළ රු.268,732,450 ක කෙටිකාලීන ණය පොලී මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් වගවීම සහතික කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | මෙම පොලිය මහා භාණ්ඩාගාරයෙන් ගෙවන බවට තහවුරු වී නොමැත. |
| (ක) | පොහොර ආනයනයේදී දෙපාර්ශවය එකඟ වූ ප්‍රමාණයන්ට | ලැබුණු පොහොර ප්‍රමාණය පමණක් සඳහා | ලැබෙන තොග පමණක් | මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර |

| | | | | |
|---|---|---|---|---|
| | වඩා අඩු ප්‍රමාණයක් සැපයුම්කරුවන් විසින් ලබාදී ඇති අවස්ථාවකදී සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකමින් අදාළ අඩු පොහොර තොගයේ වටිනාකම අඩුකොට ගිණුම් තැබිය යුතු වුවත් සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකම මිලදී ගැණුම් ලෙසත් අඩුවෙන් එවා ඇති තොගයේ වටිනාකම ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඉන්වොයිස් කළ තොග වටිනාකමට වඩා අඩුවෙන් තොග ලැබීම් ලෙස රු.16,861,511ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර ඇති අතර නොපියවූ ලැබිය යුතු ශේෂය රු.6,398,762 ක් විය. උක්ත ලැබිය යුතු ශේෂය අදාළ සැපයුම්කරුට ගෙවිය යුතු ශේෂයට ගලපා නිරවුල් කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් කෙටිකාලීන බැංකු ණය ලබාගැනීම මගින් උක්ත ශේෂයද සැපයුම්කරු වෙත ගෙවීම් කර නැවත සැපයුම්කරුගෙන් අයකර ගැනීමට සිදු වීමෙන් අතිරේක පොලී වියදමක් දැරීමට සිදු වී ඇති අතර ව්‍යාජ ලැබිය යුතු ශේෂයක් ගිණුම්වල නිරූපණය කර තිබුණි. | සැලකිල්ලට ගත යුතුය. | සමාගම ඉදිරියේදී ගෙවනු ඇති බවට වාර්තා විය. | නොතිබුණි. සිදුවූ දෝෂය එලෙසම පවතී. |
| (ග) | වෙළෙඳ ණය ගැතියන්ට අදාළ රු.72,102,543 ක ශේෂය තහවුරු කිරීමේ ලිපි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂය තහවුරු කිරීමේ ලිපි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. | ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කරන ලෙස ණය ගැතියන්ට උපදෙස් දී තිබුණි. | ශේෂය තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ච) | වෙළඳ ණය හිමියන්ට සහ විවිධ ණය හිමියන්ට අදාළව පිළිවෙලින් රු.4,636,187,820 ක සහ රු.59,421,950 ක ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ශේෂය තහවුරු කිරීමේ ලිපි විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. | ශේෂය තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් කරන ලෙස ණය හිමියන්ට උපදෙස් දී තිබුණි. | ශේෂය තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ජ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක.PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 06 පරිච්ඡේදයේ 5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය වර්ෂය අවසන් වී දින 210 ක් ගත වීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | 2020/2021 සඳහා මූල්‍ය ප්‍රකාශන 2021.11.15 දින ඉදිරිපත් කර තිබුණි. |
| (ට) | 2015 මැයි 25 දිනැති අංක.PED/1/2015 චක්‍රලේඛයට සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක.PED/1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3 වගන්තියට පටහැනිව ප්‍රවාහන පහසුකම් හිමිකම නොමැති කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) වෙත වාහන ලබාදීමකින් තොරව ඉන්ධන ලීටර් 120 ක් සඳහා රු.11,400 ක ඉන්ධන දීමනාවක් ලබාදී තිබු | මෙම දීමනා නීත්‍යානුකූල නොවන වියදම් ලෙස සැලකිය යුතුය | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර උක්ත චක්‍රලේඛය තුළින් ආවරණය නොවන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 09 වෙත චක්‍රලේඛ විධිවිධාන අතික්‍රමණය කරමින් එක් නිලධාරියකු වෙත රු.10,000 බැගින් වන සේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රු.1,160,000 ඉන්ධන දීමනා ලබාදී තිබුණි. | | | |
| (ඩ) | සහනාධාර ක්‍රමය තුළ වී ගොවිතැන සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය අනුමත කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා අනුමත ප්‍රමාණයෙන් පොහොර ලබාදීම හැර පොහොර අලෙවි ප්‍රවර්ධනය තුළින් ආදායම් වැඩි කර ගැනීමට වර්තමාන පොහොර බෙදාහැරීමේ ක්‍රමය තුළ සමාගම වෙත අවකාශ නොතිබියදී ලක් පොහොර නමින් ලොකු, කුඩා කුඩ 1,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.470,000 ක අනාර්ථික වියදමක් සිදු කර තිබුණි. අලෙවි ප්‍රවර්ධනය සඳහා මුද්‍රණය කර ඇති මෙම කුඩ තොගයෙන් කොටසක් සමාගමේ සේවකයන් වෙත නොමිලේ බෙදාහැර ඇති අතර ඉතිරි කුඩ 455 ක් මාස 16 ක් තිස්සේ පාරිභෝගික ද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කර තිබුණි. | සහනාධාර ක්‍රමය තුළ අලෙවි ප්‍රවර්ධනය සඳහා වියදම් නොකිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ණ) | සහනාධාර පොහොර තොග නිසි කළමනාරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය තුළ රු.40,288,200 ක් වටිනා පොහොර මෙ.ටො 671.47 ක් හා 2019 වර්ෂය තුළ රු.13,526,400 ක් වටිනා සහනාධාර පොහොර මෙ.ටො 225.44 ක් ගොවීන් වෙත බෙදාහැරීමට නොහැකි ලෙස හානියට පත්වීම හේතුවෙන් රජයට සිදු වී ඇති මුළු අලාභය රු.53,814,600 ක් විය. | සමාගමට අලාභයක් නොවන පරිදි කටයුතු කටයුතු කල යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | මෙම තොගයේ කොටසක් විකුණා ඇත. |
| (ත) | 2019 වර්ෂය තුළ ආනයනය කරන ලද ණයවර ලිපි 04 කට අදාළ TSP මෙ.ටො 11,024.25 ක් (රසායනාගාර වාර්තා අසමත් වීම හේතුවෙන්) ගොවි ජනතාව වෙත නිකුත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අනුමැතිය ලැබී නොතිබුණි. කෙසේ නමුත් රසායනාගාර වාර්තා නිකුත් වීමට පෙර අනුමැතියකින් තොරව සමාගම විසින් උක්ත පොහොර තොග ගොවි ජනතාව වෙත බෙදා හැර තිබුණි. ලක්පොහොර සමාගම විසින් ගොවීන් වෙත බෙදාහරින ලද උක්ත ප්‍රමිතියෙන් තොර පොහොර තොග සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය නිර්දේශ කර නොතිබූ නමුත් පොහොර සඳහා ගෙවිය යුතු දිනට කෙටිකාලීන | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතියකින් තොරව ගොවීන් අතර පොහොර බෙදා හැරීම නොකළ යුතුය. | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතියකින් තොරව ගොවීන් අතර පොහොර බෙදා හැරීමට ගෙන ඇති තීරණය සම්බන්ධයෙන් කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | ගැටළුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | බැංකු ණයක් මගින් ගෙවීම් පියවා පසුව මහා භාණ්ඩාගාරයේ වගකීම සහිතව දිගු කාලීන ණය මුදලකට පරිවර්තනය කොට විධිමත් අනුමැතියකින් තොරව සහනාධාර මුදල් ලබා ගැනීමට සමාගම කටයුතු කර තිබුණි. | | | |
| (ද) | ගිණුම් අංක 2019/MOA/CRC/UR(G)/04/01 හා ගැණුම් ඇණවුම් අංක 814 යටතේ MV Alby Meloty නෞකාවෙන් යූරියා මෙ.ටො 14,250 ක් ආනයනය කර තිබුණි. නෞකාවෙන් පොහොර තොග ගොඩබාන අතරතුර නෞකාව තුළ පොහොර ගල්ගැසී, දූර්වර්ණ වී තිබීම හේතුවෙන් සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා සමග එකඟතාවයෙන් කැළණිය පෙතියාගොඩ ප්‍රදේශයේ ගබඩාවක ගබඩාකොට දෙපාර්ශවයේ එකඟතාවයෙන් පත්කරන ලද පරීක්ෂණ කමිටුවක නිර්දේශය මත හුණුපිටිය ලක් පොහොර සමාගමේ ගබඩා කර පසුව ගොවීන් වෙත බෙදාහැර තිබුණි. දෙපාර්ශවය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව අපේක්ෂිත තත්ත්වයේ පොහොර ලැබී නොමැති අවස්ථාවකදී පොහොර තොගය ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව තිබියදී එසේ සිදු කිරීම උක්ත ගනුදෙනුව සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් | ප්‍රමිතියෙන් තොර පොහොර ආනයනය කිරීම, ගොඩබෑම, ගබඩා කිරීම සහ බෙදා හැරීම නොකළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | කළමනාකාරීත්වය ගත් තීරණය එලෙසම පවතී. දැනට රසායනික පොහොර ආනයනය නොකරයි. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලය දැනුවත් නොකිරීම, ගල්ගැසී, දුර්වර්ණ වී තිබූ පොහොර තොග සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් රසායනාගාර පරීක්ෂාවක් සිදු කරවා නොගැනීම හා ඒකාබද්ධව සිදු කෙරුණු පරීක්ෂණය සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි නියෝජිතයෙකු ඇතුළත් කර නොගැනීම හේතුවෙන්, පොහොර තොගය සම්බන්ධයෙන් සිදු කළ යුතු අත්‍යාවශ්‍ය ක්‍රමවේදයන් නොසලකා සමාගමේ කළමනාකරණය ක්‍රියාකර ඇති බව නිරීක්ෂණය විය. | | | |
| (න) | ගබඩා සේවකයන් සඳහා රු.10,530 ක් හා කාර්යාලගත සේවකයන් සඳහා රු.7,938 ක් ලෙස එකතු වටිනාකම රු.4,813,131 ක් වාර්ෂික ඇඳුම් දීමනාව ලෙස ගෙවීම් කර තිබුණද මේ සඳහා පදනම් වූ නෛතික ප්‍රතිපාදන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පවතින නීති රීති ඉක්මවා දීමනා නොගෙවිය යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | එය නිවැරදි කර නොමැත. |
| (ප) | අඩු පිරිවැය බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපිත නොකර සහ ගබඩා කිරීමේ අවශ්‍යතාවයන් හඳුනා නොගෙන සමාගම විසින් දිවයිනේ විවිධ ප්‍රදේශවල ගබඩා 46ක් පවත්වාගෙන යාම තුළින් වැටුප්, පරිපාලන, මෙහෙයුම් සහ ප්‍රවාහන වියදම අත්‍යාවශ්‍ය | සමාගම පිරිවැය ඵලදායී බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | සමාගම පිරිවැය ඵලදායී බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපිත කර නැත. දැනට රසායනික පොහොර ආනයනය කරන්නේ නොකරන බැවින් මෙහෙයුම් පාඩු තවත් |

| | | | | |
|---|---|---|---|---|
| | නොවන ලෙස වැඩිවීම් හේතුවෙන් අඛණ්ඩ මෙහෙයුම් පාඩුවක් සිදුවී තිබුණි | | | වැඩි වනු ඇත. |
| (ඛ) | ආනයනික පොහොර තොග සම්බන්ධයෙන් ලබාගත් රසායනාගාර පරීක්ෂණ වාර්තා අසමත් වීම හේතුවෙන් ආනයනික පොහොර සමාගම් 02 කට අදාළ එකතු වටිනාකම ඇමරිකානු ඩොලර් 589,587.5 ක කාර්යසාධන බැඳුම්කර 03 ක් අයකර ගැනීමට සමාගම කටයුතු කර තිබුණි. ඊට එරෙහිව සැපයුම්කරුවන් බේරුම්කරණයට යොමු වී තිබූ අතර බේරුම්කරණය හමුවේ අදාළ සමාගම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොමැති බව තහවුරු කර ප්‍රමිතින්ට අනනුකූල පොහොර සැපයීම මගින් සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණත් එසේ නොකර සමාගම විසින් සමතයකට පත්වී අයකර ගත් කාර්යසාධන ඇපකර ආපසු ගෙවා තිබුණි. මෙය මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | සමථයකට පත් කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පැවැත්විය යුතුයි. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | සමථයකට පත් කිරීමට කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයක් පවත්වා නොමැත. |
| (ග) | සමාගම සතුව ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයේ (Sri Lanka Accreditation Board) හි ලියාපදිංචිය ලත් රු.19,130,944 ක වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, | ඵලදායිතාව උපරිම වන ලෙස රසායනාගාර උපකරණ භාවිතා කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | දැනට රසායනික පොහොර ආනයනය කරන්නේ නොකරන බැවින් රසායනාගාරයේ ඇති සම්පත් ප්‍රයෝජනයට නොගනී. |

| | | | | |
|---|---|---|---|---|
| | 2019 වර්ෂය තුළ සිදු කර තිබූ නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 69 ක් වන අතර වර්ෂය තුළ උපයා තිබූ ආදායම රු.278,730 කි. මෙම රසායනාගාරයෙන් ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස, රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිතව පැවතුණ බව නිරීක්ෂණ විය. | | | |
| (ය) | පොහොර සැපයුම්කරුවන් සමඟ ඇතිකර ගන්නා ගිවිසුම් ප්‍රකාරව ආනයනික පොහොර තොග සඳහා බහාලුම් අංගනය දක්වා අදාළ වන සියළුම පිරිවැය සැපයුම්කරු ඉදිරිපත් කර ඇති මිලට ඇතුළත් වීම හේතුවෙන් ලිපිගොනු ගාස්තු, බහාලුම් සේදුම් ගාස්තු, වැටබදු හා මුද්දර ගාස්තු සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා විසින් දැරිය යුතු වේ. එහෙත් සැපයුම්කරුගේ වගකීමක් වන උක්ත කාර්යයන් නාවික නියෝජිත ආයතනයක් වෙත පැවරීම හේතුවෙන් පසුගිය වර්ෂ 2 ක කාලය තුළ එකතු වටිනාකම රු.4,222,578 ක අදාළ නොවන වියදම් සඳහා ගෙවීම් කර තිබුණි. | සැපයුම්කරු සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුකූලව ගෙවීම් සිදු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | දැනට රසායනික පොහොර ආනයනය නොකරයි. සමාගම විසින් ගෙවන ලද අදාළ නොවන වියදම් එලෙසම පවතී. |
| (ර) | 2020/2021 මහ කන්නය තුළ වී සඳහා බෙදාදීම සඳහා සහනාධාර පොහොර ප්‍රමාණවත් නොවීම | දැනට කරගෙන යන පරීක්ෂණ සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | දැනට රසායනික පොහොර ආනයනය නොකරයි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිසා එම අඩුපාඩුව මඟහරවා ගැනීම සඳහා වෙනත් බෝග සඳහා පොහොර සපයන සැපයුම්කරුගෙන් ණය පදනම මත යූරියා මෙට්‍රික් ටොන් 3,500 ක් ලබාගෙන තිබුණි. උක්ත පොහොර තොගය ලක් පොහොර සමාගම නමින් හා රජයෙන් නොමිලේ ලබාදෙන සහනාධාර පොහොර ලෙස නම් කිරීමකින් තොරව සමාගමේ ඇසුරුම් සහිතව ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී තිබීම හේතුවෙන් රජයේ සහනාධාර පොහොර අවභාවිතා කිරීම සඳහා අවස්ථාව සැලසී තිබුණි. | අතර මෙවැනි වංචාවන් නැවත සිදු වීම වැළැක්විය යුතුය. | | |
| (ල) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට හා දේශීය සැපයුම්කාර සමාගමක් හා ලක් පොහොර සමාගම අතර දියර පොහොර සැපයීම වෙනුවෙන් ඇතිකරගත් ගිවිසුමට අනුකූල නොවන සේ දේශීය සැපයුම්කාර සමාගම වෙත බැංකු අයිරාවක් ලබාගැනීම පිණිස 2018 වර්ෂයේදී ලක් පොහොර සමාගම සතු රු.94,438,766 ක් වටිනා ස්ථාවර තැන්පතු 02 ක් බැංකු ඇපකර ලෙස භාවිතා කිරීමට සමාගමේ කළමනාකාරීත්වය අවස්ථාව සලසාදී තිබුණි. මෙම ඇපකරය භාවිතයෙන් දේශීය සැපයුම්කාර සමාගම 2019 පෙබරවාරි 12 දින වන විට රු.75,980,000 ක බැංකු | එවැනි පාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර මෙම පාඩු පිළිබඳව පරීක්ෂණයක් පවත්වා තීරණයක් ගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර එදිනට උපචිත වූ පොලිය සමග ගෙවිය යුතු මුළු මුදල රු.80,502,290 ක් වී තිබුණි. දේශීය සැපයුම්කාර සමාගම උක්ත බැංකු අයිරාව පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාගම ඇපකර ලෙස තබා තිබූ ස්ථාවර තැන්පතු දෙකෙන් හිඟ ණය ශේෂ පියවාගැනීමට බැංකුව කටයුතුකර තිබුණි. මෙම අවිධිමත් අනීතික ගනුදෙනුව හේතුවෙන් මිලියන 17 ක අහිමි වූ පොලී ආදායමක් සමග ලක් පොහොර සමාගම වෙත ජනනය වී ඇති අලාභය රු.මිලියන 97.5 ක් වී තිබුණි. | | | |
| (ච) | ලක් පොහොර සමාගම හා දේශීය සැපයුම්කාර සමාගමක් අතර 2017 අප්‍රේල් 17 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සපයන ලද දියර පොහොරවලින් රු.79,716,652 ක් වටිනා කල්ඉකුත් වූ පොහොර ලීටර් 109,408 ක ප්‍රමාණයක් 2021 මාර්තු වන විටත් හුණුපිටිය ප්‍රධාන ගබඩාවේ ගබඩාකර ඇති බව නිරීක්ෂණය විය. | එවැනි පාඩු වළක්වා ගැනීමට කටයුතු කළ යුතු අතර මෙම පාඩු පිළිබඳව පරීක්ෂණයක් පවත්වා තීරණයක් ගත යුතුය. | නීතිමය හා විනය පියවර ගෙන තිබුණේ නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ස) | ලේක්හවුස් ආයතනය මගින් සමාගමේ පොදු දැන්වීම් පලකරවා ගැනීමේ ක්‍රමය වෙනස් කරමින් සභාපතිවරයාගේ ඉල්ලීමකට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව | ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කළ යුතුය. | ලේක් හවුස් හරහා දැනට අදාළ සේවාවන් සපයනු ලැබේ. | වැඩිපුර ගෙවීම් එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පෞද්ගලික ප්‍රචාරණ ආයතනයක් මගින් පුවත්පත් දැන්වීම් පලකරවා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් පූර්වයෙන් ලේක්හවුස් ආයතනයෙන් දැන්වීම් පලකරවා ගැනීමට දරූ වියදම මෙන් දෙගුණයකට අධික වියදමක් දැරීමට සමාගමට සිදුවී තිබුණි. 2019 වර්ෂය තුළ පොදු දැන්වීම් සඳහා උක්ත පෞද්ගලික ආයතනය වෙත ගෙවා ඇති මුදල රු.2,243,376 ක් විය. | | | |
| (හ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සමාගමේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් ලකුණු ලබාදීමේ ක්‍රමය වෙනස් කරමින් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන දක්ෂතා සඳහා අනුමත ලකුණු ප්‍රමාණය ලකුණු 25 සිට ලකුණු 60 ක් දක්වා වැඩි කරමින් සහ තනතුරු සඳහා ඉතා වැදගත් වන ක්ෂේත්‍රයේ පලපුරුද්ද සඳහා වෙන් කර තිබූ ලකුණු 30, ලකුණු 05 දක්වා අඩු කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබ සිටි කුසලතා හා පලපුරුද්ද සහිත අයදුම්කරුවන්ට දැඩි අසාධාරණයක් ඇති වන සේ අඩු කුසලතා හා අඩු පලපුරුද්ද සහිත අයදුම්කරුවන් වෙත පෞද්ගලික වන සේ 2019 වර්ෂයේදී කළමනාරණ සහකාර තනතුර | පරීක්ෂණයක් පවත්වා සිදු වූ අසාධාරණය නිවැරදි කළ යුතුයි. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| | සඳහා 28 දෙනෙකු බඳවා ගැනීමට සමාගමේ කළමණාකාරීත්වය කටයුතු කර තිබුණි. | | | |
| (ළ) | සහනාධාර පොහොර ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක වන දින සිට වී වගාව සඳහා පොහොර නිකුත් කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ලක් පොහොර සමාගම කටයුතු කරනු ලබන අතර එදින සිට අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි සම්බන්ධ වෙනත් කාර්යයන් විශාල ලෙස අඩුවී ඇත. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ උපදෙස් මත ප්‍රාදේශීය පොහොර ගබඩා මගින් පොහොර නිකුත් කිරීම සිදු කරනු ලබන අතර ක්ෂේත්‍රය තුළ අලෙවිකරණ කටයුතු හා නව අලෙවි ප්‍රවර්ධන උපක්‍රම හා වැඩසටහන් ක්‍රියාත්මකවීමක් හෝ අලෙවිකරණ සුපරීක්ෂණයක් ආදී කටයුතු බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ ඇතුළත් නොවේ. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම වෙනුවට සමාගම අනුමත අලෙවිකරණ කාර්යය මණ්ඩලයට අයත් දිස්ත්‍රික්ක අලෙවි ප්‍රවර්ධකයන්, ප්‍රාදේශීය අලෙවි ප්‍රවර්ධකයන්, අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් යන තනතුරුවල දිගින් දිගටම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේදීද ප්‍රාදේශීය අලෙවි කළමනාකරු තනතුරු 3 ක් සඳහා | අනුමත සේවක සංඛ්‍යාව අවශ්‍ය පරිදි සංශෝධනය කර වැටුප් හා දීමනාව අඩු කිරීමට කටයුතු කළ යුතුය. | අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් සමාගමට වැටුප් හා දීමනා සඳහා නිෂ්කාර්යය පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | | | |
| (අඅ) | 2019 වර්ෂයට අදාළව අනුමත ස්ථිර තනතුරු පුරප්පාඩු සඳහා සේවක බඳවාගැනීමකින් තොරව මාස 06 කට වරක් සේවයේ නැවත යෙදවීමේ පදනම යටතේ අනියම් සේවකයින් 12 දෙනෙකුගේ සේවය ලබාගෙන ඒ වෙනුවෙන් රු.1,362,691 ගෙවීම් කර තිබූ අතර සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සීමාවාසික පුහුණුවන්නන් 4 දෙනෙකු බඳවාගෙන 2019 වර්ෂය තුළ රු.2,74,850 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අනුමත ස්ථිර තනතුරේ පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුයි. | ස්ථිර තනතුරු සඳහා පත් කිරීම් සිදු කිරීමට කටයුතු කෙරේ. | ස්ථිර තනතුරු පුරප්පාඩු පුරවා නොතිබුණි. |
| (ආආ) | ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතු වටිනාකම රු.38,176,014 ක පිරිවැයක් දරා ඇති නමුත් උක්ත පද්ධතිය සමස්ත ආයතනයම හා සමස්ත ක්‍රියාවලියම ආවරණය වන පරිදි ස්ථාපිතකොට නොතිබීම හා ස්ථාපිතව ක්‍රියාත්මකවන පද්ධතින්ද ශක්තිමත් පාලනයන්ගෙන් තොරව ක්‍රියාත්මක වීම හේතුවෙන් දරන | සමස්ත ආයතනයම සහ සමස්ත ක්‍රියාවලියම ආවරණය වන පරිදි පද්ධතිය සකස් කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | සමස්ත ආයතනයම සහ සමස්ත ක්‍රියාවලියම ආවරණය වන පරිදි පද්ධතිය සකසා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලද ස්ථාපනය කිරීමේ පිරිවැයෙන් හා ආසන්න වශයෙන් රු.1,580,000 ක් වන ස්ථාපිත කරන ලද ආයතනය වෙත ගෙවන වාර්ෂික නඩත්තු පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි. | | | |
| (ඇඇ) | පොහොර ලැබීම, නිකුත් කිරීම, හුවමාරු කිරීම ඇතුළු පොහොර සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණකගත කර තිබූ නමුත් පරිගණක පද්ධතිය වෙත පෙර දිනයක යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමේ හැකියාව පැවතීම, අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තොග පාලනය හා සම්බන්ධ පරිගණක පද්ධතිය පිළිබඳ විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය. | අවශ්‍ය සාමාන්‍ය පාලනයන් සහ පද්ධති පාලනයන් ක්‍රියාත්මක කළ යුතුය | පසුගිය දිනවල යාවත්කාලීන කළ පරිදි පරිගණක පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේ හැකියාව නිවැරදි කර ඇති බව වාර්තා වේ. | ගැටලුව නොවිසඳී පවතී. |

## 4.6 සීමාසහිත NSB අරමුදල් කළමනාකරණ (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 1,316,195,863 | 1,313,317,282 | 16,171,543,209 | 13,448,722,051 | 2,878,581 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 1,979,912,319 | 1,211,906,432 | 15,986,045,693 | 12,648,922,388 | 768,005,887 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 2,025,721,166 | 1,124,633,699 | 16,881,766,060 | 13,048,694,869 | 901,087,467 | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකන් ගුවන් සේවය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කළමනාකරු ලෙස සමාගම පත් කර තිබුණි. මේ සඳහා දරන ලද ගාස්තු සහ වියදම් | සමාගම භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල අයකරගත යුතුය. | මේ වන විට ඉල්ලීම් ගණනාවක් කර ඇත. නවතම ඉල්ලීම 2021.07.20 දින සිදුකරන ලදී | රු. 88,939,587 ක ශේෂයක් තවමත් ඉතිරිව ඇත. සිහිකැඳවීම් කිහිපයක් මුදල් |


| | | | | |
|---|---|---|---|---|
| | මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූරණය කළ යුතුය. ඒ අනුව, භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය රු.246,939,587 ක් වූ අතර, එම ශේෂයෙන් 2020 වසර අවසානයට රු. 88,939,587 ක ශේෂයක් තවදුරටත් හිඟව පැවතුණි. | | | අමාත්‍යාංශයට යවා ඇත. |
| (ආ) | 2018 මාර්තු 02 දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත් පදනම යටතේ ලේකම් තනතුර සඳහා NSB අරමුදල් කළමනාකරණ සමාගමට බඳවා ගත් නිලධාරියෙකු ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ශාඛාවකට අනුයුක්ත කර තිබුණි. | සමාගමේ සේවකයන්ගෙන් ලබා ගන්නා ලද සේවාව සඳහා සමාගම විසින් ගෙවීම් කල යුතුය. | එම සේවකයා NSB අරමුදල් කළමනාකරණ සමාගමේ ප්‍රධාන කාර්යාලයට නැවත කැඳවා ඇත. | පිළිතුරු ලබා දී ඇති පරිදි ගැටළුව නිවැරදි කර ඇත. |
| (ඇ) | 2015 ජුනි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. පීඊඩී 3/2015 හි 2.8 ඡේදයට අනුකූලව, මාසික දීමනාව, පැමිණීමේ දීමනාව හෝ චක්‍රලේඛයේ සඳහන් දීමනා හැර වෙනත් ගෙවීම්, සභාපතිවරයාට ගෙවිය හැක්කේ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශයෙන් පමණි. කෙසේ වෙතත්, 2015 ජනවාරි සිට 2018 නොවැම්බර් දක්වා කාල සීමාව සඳහා වෘත්තීය දීමනාවක් ලෙස රු.5,195,450 ක මුදලක් NSB අරමුදල් කළමනාකරණ සමාගමේ සභාපතිවරයාට ඉහත චක්‍රලේඛයට අනුව පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි. ජාතික | සමාගම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ වලට අනුකූල විය යුතුය. | එම චක්‍රලේඛය පිළිබඳව දැනුම් දීමෙන් පසු 2019 දී දීමනාවක් ගෙවා නැත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වේතන ප්‍රතිපත්තිය සකස් කර එය අනුමැතිය සඳහා මානව සම්පත් හා වේතන කමිටු මණ්ඩලය (BHRRC) සහ NSB අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | ලබා දී ඇති පිළිතුරේ වෙනසක් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිවරයා නිල බලයෙන් සමාගමේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලබයි. | | | |
| (ඇ) | 2018 වර්ෂය සඳහා ලාභය රු.35,500ක් වුවද, 2018 නොවැම්බර් 02 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී එම වර්ෂය සඳහා රු. 2,543,546ක ප්‍රසාද දීමනාවක් අනුමත කර තිබුණි. 2018 වසරේ මූල්‍ය ප්‍රකාශන වෙනුවට 2019 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ඉහත ප්‍රසාද දීමනාව සඳහා ප්‍රතිපාදන සපයා තිබුණි. | කාර්ය සාධන ප්‍රසාද දීමනාව ගෙවන විට සමාගමේ සමාලෝචිත වසර සඳහා ලාභය කෙරෙහි අවධානය යොමු කළ යුතුය | බැංකුවේ කාර්යසාධන ප්‍රසාද දීමනා ගෙවීමේ ක්‍රමයට අනුව සමාගම කාර්යසාධන ප්‍රසාද දීමනාව කාර්යමණ්ඩලය වෙත ගෙවා ඇත. කෙසේ වෙතත්, සමාගමේ කාර්යසාධනය මත පදනම්ව කාර්යසාධන ප්‍රසාද දීමනා ගෙවීමට NSB අරමුදල් කළමනාකරණ සමාගම මානව සම්පත් හා වේතන කමිටු මණ්ඩලයේදී (BHRRC) යෝජනා කර ඇත. | යෝජිත කාර්යසාධනය මත පදනම් වූ ප්‍රසාද දීමනා යෝජනා ක්‍රමයට අනුමැතිය ලබා දී නොතිබූ බැවින් සමාගම තවමත් බැංකුවේ ප්‍රසාද දීමනා ක්‍රියා පටිපාටිය අනුගමනය කරයි. |
| (ඉ) | (i) 2019 වර්ෂයේදී පාරිභෝගික පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, සමාගම තවමත් එම කාර්යය සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දී නොතිබුණි. | සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම වාර්ෂික සැලසුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. | පාරිභෝගික කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කරමින් පවතින අතර ලබන වසරේ එය ජංගම යෙදුමක් ලෙස භාවිතා කළ හැකිය. | එම තත්ත්වයම පවතියි |
| | (ii) අභ්‍යන්තර ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමේ අරමුණින්, සමාගම විසින් 2019 වන විට නව භාණ්ඩාගාර | සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම වාර්ෂික | සමාගම නව භාණ්ඩාගාර පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ පරිශීලක පිළිගැනීමේ | ලබා දී ඇති පිළිතුරේ වෙනසක් නොමැත. |

| | | |
|---|---|---|
| කළමනාකරණ පද්ධතියක් අත්පත් කර ගැනීමටත් 2020 වන විට පර්යේෂණ සහ සංවර්ධන ඒකකයක් නිර්මාණය කිරීමටත් සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, 2021 සැප්තැම්බර් දක්වා ඉහත අරමුණු සම්පූර්ණ කිරීමට සමාගමට නොහැකි විය. | සැලසුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. | පරීක්ෂණ (UAT) ක්‍රියාවලියක යෙදී සිටී. දුරස්ථ සහය සමඟ ක්‍රියාත්මක කිරීමට පෙර කළ යුතු සංවර්ධනයන් කිහිපයක් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස එය ප්‍රමාද විය. කෙසේ වෙතත්, එය දැන් පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) අවසන් අදියරේ ඇති අතර එය ක්‍රියාත්මක වීමට පටන් ගෙන ඇත. පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් නිර්මාණය කරමින් පවතින අතර එම ඒකකය පිහිටුවීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇත. |

## 4.7 සී බැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 140,996,616 | 143,402,211 | 36,517,021 | 36,277,384 | (2,405,595) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 122,806,633 | 128,083,056 | 65,853,452 | 70,890,238 | (5,276,423) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 65,141,105 | 98,153,365 | 52,784,487 | 91,200,588 | (33,012,264) | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම (බදුකරු) සහ ලංකා බැංකුව (බදු දෙන්නා) අතර අනුරාධපුර බදු දීමේ ගොඩනැගිල්ල සඳහා ලිඛිත ගිවිසුමක් නොමැති බව නිරීක්ෂණය විය. | බදු දෙන්නා සමඟ ලිඛිත ගිවිසුමකට එළඹීම නිර්දේශ කරනු ලැබේ. | බැංකුව සමඟ සාකච්ඡා කරමින් සිටින අතර 2022 ජූනි 30 වන විට එය අවසන් වනු ඇත | සටහන් කර ගන්නා ලදී. |
| (ආ) | වෙන් කිරීම් භාර ගැනීමට සහ හැසිරවීමට මධ්‍යගත ස්ථානයක් නොමැති බව නිරීක්ෂණය විය. | පාරිභෝගිකයින්ගේ වෙන් කිරීම් එක් | සවිස්තරාත්මක මෘදුකාංග පද්ධතියක් හඳුන්වාදීමත් | ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා වෙන් කර ඇති සියලුම |


| | | | | |
|---|---|---|---|---|
| | උදා: ලංකා බැංකුවේ සුබසාධන දෙපාර්තමේන්තුව (කතරගම, අනුරාධපුර, - Oldwing නුවරඑළිය)<br>උදා: සමාගමේ ප්‍රධාන කාර්යාලය (අනුරාධපුර - පිනකල් දික්ඔය - ඉහළ - පහළ) | ස්ථානයක් හරහා ලබා ගැනීම නිර්දේශ කෙරේ. | සමඟ ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගන්නා ලදි. | පහසුකම් වෙන්කිරීම් කළමනාකරණය කරනු ලබන්නේ ලංකා බැංකුවේ සුබසාධන දෙපාර්තමේන්තුව මඟිනි.<br>නමුත් බාහිර පාරිභෝගිකයින් සඳහා ඇති පහසුකම් වෙන්කිරීම් සමාගම විසින් කළමනාකරණය කරනු ලැබේ. මේ දෙක අතර පැහැදිලි සීමා මායිම් ඇති නිසා ව්‍යාකූලත්වයක් නොමැත. |
| (ඇ) | රු.10,693,132 ක් වටිනා සම්පූර්ණ ක්ෂය වූ වත්කම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. භාවිත කළ හැකි තත්ත්වයේ පවතින වත්කම් නැවත තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු භාවිත කළ නොහැකි ඉතිරි වත්කම් ලියාහැරීමට කළමනාකාරීත්වය විසින් කටයුතු කර නොමැත. | සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් නැවත තක්සේරු කිරීමට හෝ ලියාහැරීමට කටයුතු කල යුතුය. | මෙය මීට පෙර සම්පූර්ණ කළ නොහැකි වූ නමුත් 2021 ඉන්වෙන්ට්‍රි සත්‍යාපනය සමඟ සම්පූර්ණ කිරීමට අදහස් කර ඇත. | සටහන් කර ගන්නා ලදි |
| (ඈ) | තානායම්වලින් මාසික සාරාංශයක් ලෙස ලැබුණු ආදායම ඉන්වොයිස් ලැයිස්තුවක් පවත්වා නොගෙන | ඉන්වොයිසි ලැයිස්තුවක් පවත්වාගෙන යාමට සහ ඉන්වොයිසිවල හිඩැස් සහ අනුපිටපත් | දිගුකාලීන විසඳුමක් ලෙස දැනට පුළුල් මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීමේ | ස්වයංක්‍රීය පද්ධතියක් නොමැති බැවින්, අපි එක් එක් තානායම්වලින් ලබාගත් මාසික වාර්තා සංසන්දනය කිරීමෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | සම්පූර්ණ වශයෙන් ගිණුම් පද්ධතියට දමා ඇත. | හඳුනා ගැනීමට බලයලත් පුද්ගලයෙකු විසින් එය සමාලෝචනය කිරීමට නිර්දේශ කෙරේ. | හැකියාව අපි සොයාබලමින් සිටිමු. | පසුව පමණක් ගිණුම්ගත කරමු. ඇතුළත්කිරීම් මාසික අගයක් වුවද, අපි සැසඳුම් කළ හැකි පරිදි දෛනික ගනුදෙනු අත් හුරු ක්‍රමයට පවත්වාගෙන යන්නෙමු. |
| (ඉ) | සමාගම එක්සෙල් වැඩ පත්‍රිකාවක් තුළ ඉන්වෙන්ට්‍රි වාර්තා පවත්වාගෙන යන අතර එය අක්‍රමිකතා, විෂමතා, මූල්‍ය වාර්තා හැසිරවීම මෙන්ම මන්දගාමී චලනය හේතුවෙන් වාර්තා ලබා ගැනීමේ අපහසුතාවය සහ යල් පැන ගිය අගයන් හඳුනා ගැනීමේ දුෂ්කරතා ඇති කරයි. | ඉන්වෙන්ට්‍රි චලනයන් නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා ඉන්වෙන්ට්‍රි මොඩියුලයක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරනු ලැබේ. | දිගුකාලීන විසඳුමක් ලෙස දැනට පුළුල් මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීමේ හැකියාව අපි සොයාබලමින් සිටිමු. | විස්තීර්ණ ස්වයංක්‍රීය පද්ධතියක් නොමැති බැවින් ඉන්වෙන්ට්‍රි නඩත්තුව සඳහා අප විසින් එක්සෙල් පත්‍ර නඩත්තු කරන බව නිවැරදිය.<br><br>කෙසේ වෙතත්, අක්‍රමිකතා වැලැක්වීම සඳහා අපට ඵලදායී අතින් පරීක්ෂා කිරීම් සහ පාලන ක්‍රම තිබේ. |
| (ඊ) | පහත ස්ථාන සඳහා මුල් සහ අත්සන් කළ කළමනාකරණ ගාස්තු ගිවිසුම් නොමැති බව නිරීක්ෂණය විය.<br><br>**වර්ගය** ------------- / **ස්ථානය** ----------<br>Ceybank Rests — අනුරාධපුර, කතරගම, දික්ඔය<br>නිවාඩු නිකේතන — බණ්ඩාරවෙල, හපුතලේ, ලිඳුල, ත්‍රිකුණාමලය, කයිට්ස්, නාවල | අදාළ පාර්ශ්වය සමඟ නිසි ගිවිසුම් පවත්වා ගැනීම නිර්දේශ කෙරේ. | CTI මහරගම ගිවිසුම් අලුත් කිරීමට කටයුතු යොදා ඇත. විධායක තේ සේවය සඳහා නව ගිවිසුමක් අත්සන් කෙරේ.<br><br>දැනට පවතින ගිවිසුමට ගිරාඳුරුකෝට්ටේ සහ නුවරඑළියේ ශාඛා කාර්ය මණ්ඩල නිල නිවාස දෙකක් එකතු කරනු ඇත. | අනුරාධපුර, කතරගම සහ දික්ඔය යන නිවාඩු නිකේතන තුන සඳහා 2024 දෙසැම්බර් 31 දක්වා වලංගු වන ගිවිසුම් අත්සන් කරන ලදි.<br><br>සියලුම නිවාඩු නිකේතන සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. ශාඛා කාර්ය මණ්ඩල නිල නිවාස ගිවිසුමද අත්සන් කර |

| | | |
|---|---|---|
| විධායක තේ සේවය | - | ඇත (ගිරාඳුරුකෝට්ටේ සහ නුවරඑළිය හැර). |
| CTI මහරගම | - | |
| ප්‍රධාන කාර්යාලය | කොළඹ - ආපන ශාලාව | ප්‍රධාන කාර්යාල ආපනශාලා මෙහෙයුම් දැන් අවසන් කර ඇත. |
| කාර්ය මණ්ඩල නිල නිවාස | | CTI මහරගම සඳහා වූ කළමනාකරණ ගිවිසුම කල් ඉකුත් වී ඇත. |

## 4.8 BOC ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 267,307,000 | 237,156,000 | 338,187,000 | 90,431,000 | 30,151,000 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 300,315,000 | 270,659,000 | 402,370,000 | 143,932,000 | 29,656,000 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 79,465,000 | 141,383,000 | 309,775,000 | 110,873,000 | (61,918,000) | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ගණුදෙනු හැසිරවීමේ නිලධාරීන් හරහා ගනුදෙනුකරුවන්ට ලබා දෙන ණය කාල සීමාව සහ වටිනාකම පාලනය කිරීමට සමාගමට නිසි ණය ප්‍රතිපත්තියක් නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තනි පුද්ගල ගණුදෙනු හැසිරවීමේ නිලධාරි ගිණුම් යටතේ දිගු කලක් නොගෙවූ | ණයට විකුණුම් සහ ණය අයකර ගැනීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ නිසි පාලනයක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරේ. | නැවත අය කර ගැනීමේ ක්‍රියාවලියේදී නැවත අය කිරීමේ තත්ත්වය පිළිබඳව විකුණුම් කාර්ය මණ්ඩලය සමඟ සතිපතා පසු විපරම් කිරීමට කණ්ඩායමක් පිහිටුවීමේ ක්‍රියාවලියක් ගිණුම් දෙපාර්තමේන්තුව | |

ණයගැති ශේෂය වැඩි වී තිබුණි. ඒවායින් සමහරක් පහත පරිදි වේ:

| ගණුදෙනු හැසිරවීමේ නිලධාරියාගේ නම | 2018.12.31 දිනට මුළු හිඟය (රු.) | දින 270 කට වඩා හිඟ ශේෂය (රු.) |
|---|---|---|
| කසුන් | 3,518,020 | 1,681,791 |
| රොමේෂ් | 6,531,429 | 2,782,792 |
| මුතුමාලි | 660,700 | 294,500 |

ක්‍රියාත්මක කර ඇත. මෙහෙයුම් ගැටළු සම්බන්ධ නොවන දිගුකාලීන ණය ගැතියන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ද පියවර ගැනේ.

(ආ) ගෙවිය යුතු වෙනත් ගිණුම් අටකට අදාළව රු.1,441,777 ක් වූ ශේෂයන් වසර පහකට වැඩි කාලයක් එම ගිණුම්වල පවතින බව නිරීක්ෂණය විය. සමාගම විසින් සත්‍ය වගකීම නැවත තක්සේරු කිරීමට සහ සත්‍ය වගකීමක් නොමැති නම් අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු දිගු හිඟ ශේෂය ලියාහැරීමට කටයුතු කර නොමැත. දිගු හිඟ ශේෂයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තර | 2019 දෙසැම්බර් 31 දිනට ශේෂය (රු.) | දිගු කාලීන හිඟ ශේෂය (වසර 05කට වඩා වැඩි කාලයක් පවතින) (රු.) |
|---|---|---|
| ආපසු ගෙවිය හැකි මුදල් | 9,157,714 | 676,284 |
| ගනුදෙනු කරුවන්ගෙන් ලැබුණු අත්තිකාරම් | 4,246,486 | 617,799 |
| බැංකුව විසින් හඳුනා නොගත් ණය | 1,974,514 | 95,850 |
| DAM Tours වෙතින් ලැබුණු අත්තිකාරම් | 5,899,189 | 22,370 |

දිගු හිඟ ශේෂයන් ඇගයීමට හා නිරවුල් කිරීමට පියවර ගැනීමට නිර්දේශ කෙරේ.


දීර්ඝ කාලයක් නොගෙවූ ණය ගැතියන් වෙත පසු විපරම් ලිපි සහ ඉල්ලීම් ලිපි යැවීමට පියවර ගෙන ඇත. ඒවායේ ප්‍රතිඵල මත අදාළ පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගැනේ.

| | | |
|---|---|---|
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබුනු අත්තිකාරම් - වැල්ලවත්ත | 2,208,521 | 10,000 |
| පිටතට යන සංචාර සඳහා ලැබුනු අත්තිකාරම් | 3,679,947 | 19,474 |
| **එකතුව** | **27,166,371** | **1,441,777** |

| | | |
|---|---|---|
| (ඇ) | ප්‍රවේශපත්‍ර ආදායම් සහ සංචාර ආදායම් සඳහා ලාභ ආන්තිකය ගනුදෙනුකරුවන් සමඟ ගණුදෙනුව හසුරුවන නිලධාරියා විසින් තීරණය කරනු ලබන බැවින් ඒ සම්බන්ධයෙන් නිසි පාලනයක් නොමැති බව නිරීක්ෂණය විය. | ලාභ ආන්තිකය තීරණය කිරීමට ප්‍රතිපත්තියක් තිබීමටත් නිර්දේශිත ප්‍රතිපත්තියෙන් යම් බැහැරවීමක් තිබේ නම් බලයලත් පුද්ගලයකුගෙන් අනුමැතිය ලබා ගැනීමටත් නිර්දේශ කෙරේ. |

## 4.9 ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පීඑල්සී

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 1,040,710,662 | 367,498,212 | 3,900,467,138 | 569,347,895 | 673,212,450 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 1,290,746,282 | 394,056,701 | 4,443,630,389 | 706,556,730 | 896,689,581 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 944,475,161 | 426,191,102 | 4,934,358,171 | 781,228,213 | 518,284,059 | තත්ත්වාගණනය නොකළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 1,040.71 | 367.50 | 3,900.47 | 569.35 | 673.21 |
| 2019 | 1,290.75 | 394.06 | 4,443.63 | 706.56 | 896.69 |
| 2020 | 944.48 | 426.19 | 4,934.36 | 781.23 | 518.28 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දේපළ, පිරියත සහ උපකරණ යටතේ මෙවලම් ලෙස වර්ගීකරණය කල යුතු වත්කමේ ඵලදායී ජීව කාලයට වඩා ක්ෂය කරන ලද දිගුකාලීනව පවතින | දිගු කාලීනව පවතින තොග අයිතම කෙරෙහි අවධානය යොමුකරමින් ප්‍රාග්ධනිත කල හැකි වත්කම් නිසිලෙස හඳුනා ගැනීමට | කරුණාකර වර්තමාන තත්ත්වය යටතේ ඇති පැහැදිලි කිරීම බලන්න. | ලංකා බැංකුවේ මුලස්ථාන ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සේවා සඳහා අවශ්‍ය දිගුකාලීන තොග සමාගම සතුව ඇත. දේශීය වෙළඳපොලේ මේවා නොපවතින බැවින් සහ ආනයනය කර සැපයුම් කිරීම සඳහා සාමාන්‍යයෙන් මාස 2-4 |


| | | | | |
|---|---|---|---|---|
| | අයිතම තොග යටතේ ඇතුළත් වී තිබුණි. | කළමනාකරණයට යෝජනා කෙරේ. තවද, කළමනාකරණය එම වත්කම් වල ඵලදායී ජීව කාලය තක්සේරු කිරීම කල යුතු අතර ඒ අනුව ක්ෂය කිරීම කල යුතුය. | | කට වඩා වැඩි කාලයක් පවතින බැවින් අඛණ්ඩ ගොඩනැගිලි සේවා පවත්වාගෙන යාම සඳහා මෙම තොග අපගේ තොග තුළ පවත්වාගෙන යයි. කෙසේ වෙතත්, මෙම අයිතම ප්‍රාග්ධනීකරණය සඳහා වන නිර්ණායක සපුරාලන්නේ නම්, නිකුත් කරන අවස්ථාවේදී එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස ප්‍රාග්ධනීකරණය කර අදාළ ක්ෂය ප්‍රතිපත්තිය අදාළ කෙරේ.<br><br>කෙසේ වෙතත්, සමාගම විසින් භෞතික තොග සත්‍යාපනය කිරීම සඳහා හා යල් පැන ගිය තොග සොයා ගැනීම සඳහා වාර්ෂික පදනමින් භෞතික තොග සත්‍යාපනය සහ කාර්තුමය වශයෙන් අහඹු සත්‍යාපනය සිදු කරයි. ඒ අනුව යල් පැන ගිය තොග අපහරණය කිරීමට අවශ්‍ය පියවර ගන ලැබේ. |
| (ආ) | සමාගම කොළඹ කොටස් හුවමාරුවේ (CSE) ලැයිස්තුගත කිරීමේ රීති 7.13 ට අනුව පැවතිය යුතු සියයට 20 ක අවම මහජන හිමිකාරීත්වයට අනුකූලව වී නොමැත. | සමාගම කොළඹ කොටස් හුවමාරුවේ රීතිවලට අනුකූල වීමට හෝ ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කරුණාකර වර්තමාන තත්ත්වය යටතේ ඇති පැහැදිලි කිරීම බලන්න. | අධ්‍යක්ෂ මණ්ඩලය දැන් සුළු පරිමාන කොටස් හිමියන්ට පිටවීමේ දීමනා මිල අනුමත කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුවේ නිල ලැයිස්තුවෙන් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම ඉවත් කිරීම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව 2022 පෙබරවාරි 14 දින පැවැත්වීමට නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සභාගත කරනු ඇත. 2022 මාර්තු 3 වැනි සතියේ පැවැත්වීමට නියමිත විශේෂ මහා සභා රැස්වීමේදී ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) රීති 5 හි අවශ්‍ය පරිදි කොටස් හිමියන් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | එම යෝජනාව අනුමත කරන්නේ නම්, කොටස් ප්‍රතිමිලදී ගැනීම මගින් සමාගම ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කරනු ඇති අතර සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ ඉහත රීතියේ දක්වා ඇති මාර්ගෝපදේශ අනුගමනය කරමින් සමාගම විසින් සමාගම ඉවත් කරගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ඇ) | පැමිණීමේ වේලාව සහ නඩත්තු කළමනාකරණ පද්ධතිය සඳහා ආරක්ෂිත විගණන සටහන් සක්‍රීය කර නොමැත. එබැවින් ආරක්ෂිත සටහන් පිළිබඳ වරින් වර සමාලෝචන කිරීමක්ද සිදු කර නොමැත. | පරිශීලක ක්‍රියාකාරකම් සඳහා ආරක්ෂිත විගණන සටහන් ඇතුල්වීම් හැඩගස්වා ගත යුතු අතර වරප්‍රසාද ලත් කාර්යයන් සහ ඇතුළුවීම් වරින් වර සමාලෝචනය කළ යුතුය. | වෙත වාර්තා DMS-කාල පැමිණීම සහ නඩත්තු කළමනාකරණ පද්ධතියට එකතු කර ඇත. | සම්පූර්ණ කර ඇත. |
| (ඈ) | සවිස්තරාත්මක මුරපද ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබුණද, අදාළ පද්ධති තුළ සුදුසු මුරපද පරාමිතීන් තවමත් ක්‍රියාත්මක කර නොතිබුණි. | සමාගමේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිවල ලේඛනගත කර ඇති මුරපද ප්‍රතිපත්තිය භාවිතයේ පවතින පද්ධති තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතුය. | මුරපද පරාමිතීන් ක්‍රියාත්මක කර ඇත. | සම්පූර්ණ කර ඇත. |
| (ඉ) | කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ රීති 7.13.1 සමඟ අනුකූල නොවීම හේතුවෙන්, 2014 මාර්තු | ඉවත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා නිර්දේශ කෙරේ. | | කරුණාකර විගණන නිරීක්ෂණ අංක (ආ) යටතේ දක්වා ඇති පැහැදිලි කිරීම බලන්න. |

21 දින සමාගම ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. දැනටමත් වසර හයක කාලයක් ගත වී ඇති අතර ඉවත් කිරීමේ ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී.

## 4.10 BOC දේපළ සංවර්ධන සහ කළමනාකරණ (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 399,736,762 | 134,172,721 | 1,814,317,466 | 93,909,696 | 265,564,041 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 450,532,152 | 138,250,288 | 1,927,313,990 | 98,966,066 | 312,281,864 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 421,185,820 | 129,694,732 | 2,050,867,865 | 111,488,029 | 291,491,088 | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පසුගිය වසර තුන සහ සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ. | ද්‍රවශීලතාවය සහ ලාභදායිතාවය අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීමට නිර්දේශ කෙරේ. | 2021 වසරේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව, (i) Merchant Bank of Sri | 2021 වසර අවසන් වන විට BOC ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් |

| වර්ෂය | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 67 | 66 | 56 | 39 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 32.31 | 14.62 | 23.55 | 20.17 |
| ශුද්ධ ජංගම වත්කම්, මුළු වත්කම් වලට (වාර ගණන) | 0.48 | 0.44 | 0.35 | 0.32 |

සමාගමේ කාරක ප්‍රාග්ධන කළමනාකරණයේ අසතුටුදායක මට්ටම හේතුවෙන් සමාගම ඉහළ ජංගම අනුපාතයක් පවත්වාගෙන ගොස් ඇත. තවද, කෙටි කාලීන ආයෝජන හා සසඳන විට දිගුකාලීන ආයෝජන සඳහා අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට සමාගම අවධානය යොමු කර නොතිබුණි.

Lanka & Finance PLC හි අතිරේක කොටස් නිකුතුව සඳහා රු.249,999,996 ක් ආයෝජනය කර ඇත.

(ii) ලංකා බැංකුවේ ණයකර වල වසර 5කට රු.250,000,000 ක් ආයෝජනය කර ඇත.

මැනේජ්මන්ට් සමාගම පහත සඳහන් පරිදි ද්‍රවශීලතාවය සහ ලාභදායිත්වය අතර සමතුලිතතාවය වැඩිදියුණු කරගෙන ඇති අතර තවදුරටත් වැඩිදියුණු වනු ඇත.

ශුද්ධ ලාභ අනුපාතය: 64%,

ජංගම අනුපාතය:

18.26 වාරයක්,

ශුද්ධ ජංගම වත්කම්, මුළු වත්කම් වලට: 0.42 වාරයක්

(ආ) සියලුම බදුකරුවන් සමඟ ඇති බදු ගිවිසුම් අනුව, සෑම මසකම පළමු දින කුලිය සඳහා අත්තිකාරම් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, බදු ගිවිසුමේ එකඟ වූ පරිදි කුලී නොගෙවීම පහත ණය ගැතියන්ගේ රටාවෙන් පෙන්නුම් කරයි.

| කාල සීමාව | දින 1-30 | දින 31-60 | දින 61-90 | දින 90 කට වඩා |
|---|---|---|---|---|
| හිඟ මුදල (රු.) | 5,560,543 | 2,249,146 | 2,199,488 | 9,519,849 |

බදු ගිවිසුමේ එකඟ වූ පරිදි කුලී ආදායම එකතු කරන බවට සහතික විය යුතුය.

බදු ගිවිසුම් සහ ක්‍රියා පටිපාටි දැඩි ලෙස අනුගමනය කිරීම.

පවසන ලද ගෙවිය යුතු කුලිය සම්පූර්ණයෙන්ම අයකරගෙන ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සියලුම බදුකරුවන් සමඟ ඇති බදු ගිවිසුම්වලට අනුව, සෑම මසකම පළමු දින සිට දින 14කට පෙර මාසික කුලිය ගෙවීමට අපොහොසත් වුවහොත්, මාසික කුලී මුදලෙන් සියයට 20 ක දඩයක් කුලී නිවැසියාගෙන් අය කෙරේ. කුලී නිවැසියන් 08 දෙනෙකුට යම් මාසයකට ගෙවිය යුතු ගෙවීම් මාස 03කට වැඩි කාලයක් ප්‍රමාද කළ අවස්ථා නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ප්‍රමාද වූ ගෙවීම සම්බන්ධයෙන් ඔවුන්ගෙන් කිසිදු දඩ මුදලක් අය කර නොමැත. | බදු ගිවිසුමේ එකඟ වී ඇති පරිදි මාසික කුලී ගෙවීම් ප්‍රමාද කළ කුලී නිවැසියන්ගෙන් දඩ මුදල් අය කරන බවට සහතික විය යුතුය. | මෙම කාරණය අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර අවසන් කිරීමට නියමිතය. | කළමනාකරණ කමිටුවේ සාකච්ඡා පැවැත්වේ. |
| (ඈ) | කල්බදු කාලය ආරම්භ වීමට පෙර බදු ගිවිසුම් අත්සන් කළ යුතු වුවද, නිශ්චිත කල්බදු කාලසීමාව ආරම්භ වීමෙන් පසුව බදු ගිවිසුම් අත්සන් කළ අවස්ථා පහක් නිරීක්ෂණය විය. එබැවින්, නව ගිවිසුම අත්සන් කරන කාලය තෙක් බදු දෙන්නා සහ බදුකරු අතර වලංගු කල්බදු ගිවිසුමක් නොතිබීම නිරීක්ෂණය විය. එහි විස්තර පහත දැක්වේ. | කල්බදු කාලය ආරම්භ කිරීමට පෙර කල්බදු ගිවිසුමක් අත්සන් කිරීම නිර්දේශ කරනු ලැබේ. | සමාගමේ ලිපි හුවමාරුව වේගවත් කිරීම. | සමාගමේ ප්‍රතිචාර දැක්වීමේ කාලය අඩු කිරීම. |

| **බදු ගිවිසුම අංක.** | **බදුකරුගේ නම** | **කල්බදු කාලය** | **නව ගිවිසුම අත්සන් කළ දිනය** |
|---|---|---|---|
| 270 | ඒකාබද්ධ දේපල කළමනාකරණ සේවා | 2020/04/16 - 2021/04/15 | 2020/07/30 |
| 242 | ලංකා බැංකුව බස්නාහිර පළාත - උතුර | 2019/01/01 - 2020/12/31 | 2019/05/22 |
| 236 | Engenuity (Pvt) Ltd | 2019/01/01 - 2021/12/31 | 2019/04/03 |

| | | | |
|---|---|---|---|
| 147 | ඩයලොග් | 2016/05/30 - 2021/05/29 | 2016/08/05 |
| 7 | Quess Crop Lanka (Pvt) Ltd | 2019/03/01 - 2021/02/28 | 2019/06/12 |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | එක් එක් බදු ගිවිසුම අත්සන් කිරීමෙන් පසු එය මාස තුනක කාලයක් තුළ අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුය. කෙසේ වෙතත් 2021 ඔක්තොම්බර් 29 දින වන විටත් පහත බදු ගිවිසුම් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර නොතිබුණි. විස්තර පහත දැක්වේ. | එක් එක් බදු ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බදු ගිවිසුම් ලියාපදිංචි කිරීම නිර්දේශ කරනු ලැබේ. | මේ පිළිබඳව හැකිතාක් කුලී නිවැසියන් දැනුවත් කරනු ඇත. | ඉදිරියේදී සෑම අලුත් කිරීමේ දැන්වීමකම මෙය සඳහන් කරනු ඇත. |

| බදු ගිවිසුම අංක. | බදුකරු | කල්බදු කාලය | ගිවිසුම අත්සන් කළ දිනය |
|---|---|---|---|
| --------- | ------- | ---------- | ---------- |
| 147 | ඩයලොග් | 30/05/2016 - 29/05/2021 | 05/09/2016 |
| 168 | ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව | 01/07/2017 - 30/06/2019 | 08/08/2017 |
| 179 | MBSL – Merchant Tower | 01/05/2017 - 30/04/2022 | 13/10/2017 |
| 180 | MBSL – Merchant Tower | 01/04/2017 - 31/03/2022 | 13/10/2017 |
| 186 | MBSL – Merchant Tower | 01/10/2017 - 30/09/2022 | 16/01/2018 |


| | | | |
|---|---|---|---|
| 203 | MBSL – Merchant Tower | 01/01/2018 - 31/12/2021 | 25/06/2018 |
| 205 | MBSL- Merchant Tower | 01/01/2018 - 31/12/2022 | 25/06/2018 |
| 236 | Engenuity (Pvt) Ltd | 01/01/2019 - 31/12/2021 | 03/04/2019 |
| 242 | ලංකා බැංකුව බස්නාහිර පළාත - උතුර | 01/01/2019 - 01/01/2021 | 19/05/2019 |
| 244 | Ques Crop Lanka (Pvt) Ltd (Randstad Lanka (Pvt) Ltd) | 01/03/2019 - 28/02/2021 | 12/06/2019 |
| 256 | Ceybank Asset Management (Pvt) Limited | 01/06/2019 - 31/05/2021 | 06/09/2019 |
| 257 | SLIIT | 01/01/2019 - 31/12/2021 | 20/09/2019 |
| 261 | සීමාසහිත SLIIT ඇකඩමිය | 01/01/2019 - 31/12/2021 | 28/10/2019 |
| 266 | BOC අධි ශ්‍රේණිය, මහනුවර | 01/01/2019 - 31/12/2020 | 04/03/2020 |
| 267 | BOC මධ්‍යම පළාත | 01/01/2019 - 31/12/2019 | 04/03/2020 |
| 273 | සමීර කේටර්ස් කැන්ටින් | 11/07/2019 - 10/07/2021 | 27/08/2019 |

| | | | |
|---|---|---|---|
| 296/20 | කොළඹ | 01/01/2021 | 09/02/2021 |
| | කොටස් | - | |
| | හුවමාරුව | 30/06/2021 | |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2003 ජූනි 02 දිනැති අංක.PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තියට අනුව, සංයුක්ත සැලැස්මක් වසර තුනකට නොඅඩු කාලයක් සඳහා බලපැවැත්වෙන පෙරළීමේ සැලැස්මක් විය යුතුය. සමාගමේ ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එය සකස් කළ යුතුය. කෙසේ වෙතත්, වසර තුනක කාලසීමාවක් සඳහා වූ සංයුක්ත සැලැස්ම සමාගම විසින් සකස් කර නොතිබුණි. | වසර තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර පෙරළීමේ සැලැස්මක් ලෙස දිගටම පවත්වාගෙන යාමට නිර්දේශ කෙරේ. | BOC ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් සමාගම සංයුක්ත සැලැස්ම සකස් කර එහි පිටපතක් ඔබ වෙත ඉදිරිපත් කරනු ඇත. |

## 4.11 BOC කළමනාකරණ සහ උපකාරක සේවාව (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2 | 17,050 | 1,342,405 | 357,756 | (17,048) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 2 | 53,729 | 933,632 | 360,266 | (53,727) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 340,258 | 387,948 | 933,632 | 50,400 | (47,690) | තත්ත්වාගණනය නොකළ |




| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. |
|---|---|---|---|---|---|
| 2018 | 2.00 | 17,050.00 | 1,342,405.00 | 357,756.00 | (17,048.00) |
| 2019 | 2.00 | 53,729.00 | 933,632.00 | 360,266.00 | (53,727.00) |
| 2020 | 340,258.00 | 387,948.00 | 933,632.00 | 50,400.00 | (47,690.00) |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ මූලික ව්‍යාපාරික ක්‍රියාකාරකම් වන්නේ ලංකා බැංකුවේ මිනිස් බල අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට සේවකයන් බඳවා ගැනීමයි. කෙසේ වෙතත්, සමාගම 2007 වසරේ සිට මෙම | සමාගම මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම් සමඟ සමපාත වන ව්‍යාපාරික ක්‍රියාකාරකම් සිදු කළ යුතුය. | - | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2017 දී සමාගම අනාගතයේදී වසා දැමිය යුතු බවට තීරණය කර ඇතත්, 2021 පෙබරවාරි 08 වැනි දින පැවති ලංකා |

| | | | |
|---|---|---|---|
| ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකමෙහි නිරත වී නොතිබුණි. අධ්‍යක්ෂ මණ්ඩලය 2017 අගෝස්තු 01 දින පැවති ඔවුන්ගේ රැස්වීමේදී සමාගම ඇවර කිරීමට තීරණය කර ඇත. | | | බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී අනුමත කර ඇත්තේ;<br>• බැංකුවේ ක්‍රියාකාරී නොවන අත්තිකාරම් තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා BOC කළමනාකරණ සහ උපකාරක සේවාව (පුද්ගලික) සමාගම, ණය අයකර ගැනීමේ සේවා සපයන්නා බවට පරිවර්තනය කිරීම.<br>• 1988 අංක 30 දරන බැංකු පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව BOC කළමනාකරණ සහ උපකාරක සේවාව (පුද්ගලික) සමාගම, ණය අයකර ගැනීමේ සේවා සපයන්නා බවට පරිවර්තනය කිරීමේ යෝජනාවට ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.<br>• පහත සඳහන් වගන්තිය ඇතුළත් කිරීම මගින් සංගමයේ ලිපි සංශෝධනය කිරීම සඳහා BOC කළමනාකරණ සහ උපකාරක සේවාව (පුද්ගලික) සමාගම විසින් විශේෂ යෝජනාවක් සම්මත කිරීම.<br>"මූල්‍ය ආයතන සඳහා ණය අයකර ගැනීමේ නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම සහ සෑම වර්ගයකම සහ විස්තරය අනුව |
| (ආ) මූල්‍ය ප්‍රකාශනයේ අංක 2.1.3 සටහනට අනුව, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, 2017 අගෝස්තු 01 දින පැවති රැස්වීමේදී, නුදුරු අනාගතයේ දී සමාගම ඇවර කල යුතු බවට තීරණය කර ඇත. 2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) වගන්තියට අනුව, සමාගම ස්වේච්ඡාවෙන් ඇවර කිරීම සඳහා යෝජනාවක් සම්මත කර ඇති විට, එය යෝජනාව සම්මත කිරීමෙන් දින දාහතරක් ඇතුළත, ගැසට් පත්‍රයේ පල කිරීම මගින් යෝජනාව පිළිබඳ දැනුම් දීමක් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමෙන් යෝජනාව පිළිබඳ දැනුම්දීමක් කර නොමැත. | 2007 අංක 07 දරන සමාගම් පනතේ 320(1) වගන්තියට අනුගත විය යුතුය. | - | |

ණය අයකර ගැනීමේ සේවා සැපයීම."

## 4.12 හොටෙල්ස් කලම්බෝ (1963) (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 303,346,379 | 329,289,479 | 290,695,975 | 145,953,829 | (25,943,100) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 257,329,091 | 309,505,478 | 390,267,938 | 292,247,600 | (52,176,388) | තත්ත්වාගණනය කළ |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දේපල පිරියත සහ උපකරණ ලේඛනයක් එක්සෙල් ගොනුවේ පවත්වාගෙන යන නමුත්, ප්‍රමාණවත් විස්තර, නිසි පාලන සහ අධීක්ෂණ ක්‍රියාවලියක් සහිතව සියලු දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ විස්තරාත්මක | ස්ථාවර වත්කම්වල සියලුම කාණ්ඩ සඳහා සවිස්තරාත්මක සහ යාවත්කාලීන ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට නිර්දේශ කෙරේ. | මූලික වශයෙන් අපි දැනටමත් බාහිර පාර්ශවයක් සමඟ නිසි හඳුනාගැනීමක් සහිතව සියලුම අයිතම ලැයිස්තුව ගෙන ඇති අතර ඔවුන් ඔවුන්ගේ අවසන් වාර්තාව | බාහිර සමාගම විසින් වාර්තාව අවසන් කළ පසු අපට ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යා හැක. |


| | | | | |
|---|---|---|---|---|
| | ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය. | | ඉදිරිපත් කිරීමට නියමිතය. | |
| (ආ) | සාමාන්‍ය ලෙජරය අනුව ලැබිය යුතු වැට් බදු ශේෂය සහ වැට් ප්‍රතිලාභය අනුව ශේෂය අතර රු.2,452,116 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස සඳහා සැසඳීම් සිදුකර අදාළ ජර්නල් සටහන් සකස් කිරීමට නිර්දේශ කෙරේ. | දැනටමත් ලෙජර් ගිණුම් ශේෂය සකස් කර ඇත. | දැනටමත් ලෙජර් ගිණුම් ශේෂය සකස් කර ඇත. |
| (ඇ) | සාමාන්‍ය ලෙජරය අනුව ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු මුදල සහ ජාතිය ගොඩනැගීමේ බදු ප්‍රතිලාභය අනුව ගෙවිය යුතු ශේෂය අතර රු.2,255,914 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස සඳහා සැසඳීම් සිදුකර අදාළ ජර්නල් සටහන් සකස් කිරීමට නිර්දේශ කෙරේ. | දැනටමත් ලෙජර් ගිණුම් ශේෂය සකස් කර ඇත | දැනටමත් ලෙජර් ගිණුම් ශේෂය සකස් කර ඇත. |
| (ඈ) | බඩු ලේඛන ඵලදායීව හා කාර්යක්ෂමව කළමනාකරණය කිරිම, අධික පිරිවැයක් දැරීම, බඩු ලේඛනවල පුද්ගල ශ්‍රමය යොදා සකස්කළ වාර්තා පවත්වාගෙන යාමේ උත්සාහය සහ සම්පත්, ශ්‍රමය යොදා සකස්කළ වාර්තා හරහා ජනනය වන තොරතුරු වල විශ්වසනීයත්වය අඩුවීම, මූල්‍ය වාර්තාවල අක්‍රමිකතා, විෂමතා සහ හැසිරවීමේ අවදානම වැඩි වීම, යල්පැන ගිය සහ අඩුවෙන් භාවිත වන අයිතම සඳහා ලබා දී ඇති දීමනාවෙහි ප්‍රමාණවත් බව තහවුරු කර ගැනීමේ දුෂ්කරතා සමාගමේ භාණ්ඩ ලේඛන කළමනාකරණ පද්ධතියට අදාළ දුර්වලතා ලෙස නිරීක්ෂණය විය. | ඉන්වෙන්ටරි කළමනාකරණයට අදාළව පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම සහ ඉන්වෙන්ටරි චලනයන් නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා ඉන්වෙන්ටරි මොඩියුල ක්‍රියාත්මක කිරීම සලකා බැලීම නිර්දේශ කෙරේ. | තවමත් එම ක්‍රමයම පවතින අතර සමහර හිඟතාවයන් ඒ අනුව යාවත්කාලීන වේ. | නිසි ක්‍රමය වෙනස් කරන ලෙස තවමත් ඉල්ලුම් කරයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | බැංකු තැන්පතු එකවර තැන්පත් කිරීමකින් තොරව වාර්තා කළ දිනට පසුව කිහිප වතාවක්ම තැන්පත් කිරීම, මුදල් තැන්පත් කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවීම සහ ප්‍රධාන මෙහෙයුම් සඳහා බැංකුකරණයෙන් තොරව සුළු මුදල් එකතුව ගනුදෙනු සඳහා භාවිතා කිරීම සමාගමේ බැංකු මෙහෙයුම්වලට අදාළ අභ්‍යන්තර පාලන දුර්වලතා ලෙස නිරීක්ෂණය විය. | බැංකු මෙහෙයුම් පිළිබඳ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම නිර්දේශ කෙරේ. | සාමාන්‍ය අයකැමි විසින් තැන්පත් කරන ලද විකුණුම් මුදල් තැන්පතු පරීක්ෂා කිරීමට ආදායම් විගණක වගකීම දරයි. | මේ වන විට විකුණුම් මුදල් පසු දිනයේ බැංකුගත කරනු ලැබේ. |
| (ඊ) | වැට් බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු වලට අදාළව ප්‍රතිලාභය සහ ලෙජර් ශේෂය අතර පිළිවෙලින් රු.8,869,357 ක සහ රු.1,612,426 ක වෙනසක් නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් 31 දිනට අදාළ ප්‍රතිලාභ සමඟ වැට් බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ලෙජර් ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට සමාගම විසින් සනාථ කළ හැකි සාක්ෂි ඉදිරිපත් නොකරන ලදි. | වාර්තා කරන දිනට අයකරගත හැකි මුදල තක්සේරු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) සමඟ ප්‍රතිලාභ සහ සාමාන්‍ය ලෙජරය අතර ශේෂයන් සැසඳීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ. | තවමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලේඛන ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ පවතී. | අපි දැනටමත් කාර්තු 10 න් කාර්තු 7 ක් ඉදිරිපත් කර ඇති අතර ඉතිරිය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටිමු. |
| (උ) | රු.12,146,965 ක ලැබිය යුතු වැට් බදු ශේෂයේ පැවැත්ම තහවුරු කිරීම සඳහා සමාගම විසින් සතුටුදායක සාක්ෂි ඉදිරිපත් නොකරන ලදි. | 2019 දෙසැම්බර් 31 දිනට අයකරගත හැකි මුදල තක්සේරු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් (IRD) විස්තර ලබා ගැනීම හෝ විමසීම් කිරීම නිර්දේශ කෙරේ. | තවමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් වෙත ලේඛන ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලියේ පවතී. | අපි දැනටමත් කාර්තු 10 න් කාර්තු 7 ක් ඉදිරිපත් කර ඇති අතර ඉතිරිය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටිමු. |

| | | | | |
|---|---|---|---|---|
| (ඖ) | 2019 දෙසැම්බර් 31 දිනට BOC - මෙට්‍රොපොලිටන් ශාඛාවේ බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනා නොගත් තැන්පතු ලෙස රු.6,116,285 ක් ඇති අතර 2019 දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂය අඩුවෙන් දැක්විය හැකි ඉහත ශේෂය හඳුනා ගැනීම සඳහා සතුටුදායක සාක්ෂි සපයා නොතිබුණි. | වාර්තා කරන දිනට හඳුනා නොගත් තැන්පතු හඳුනාගැනීම සඳහා අවශ්‍ය පියවර ගැනීම නිර්දේශ කෙරේ. | බැංකු සැසඳුම් ප්‍රකාශ සස් කිරීම සඳහා ගෙවිය යුතු ගිණුම් නිලධාරියෙකු දැනටමත් අනුයුක්ත කර ඇත. | බැංකු සැසඳුම් ප්‍රකාශ සස් කිරීම සඳහා ගෙවිය යුතු ගිණුම් නිලධාරියෙකු දැනටමත් අනුයුක්ත කර ඇත. |
| (ක) | 2019 දෙසැම්බර් 31 දිනට අතැති මුදල් රු.9,515,998 ශේෂය තහවුරු කිරීම සඳහා සතුටුදායක සාක්ෂි හෝ පැහැදිලි කිරීම් සපයා නොතිබුණි.<br><br>වාර්තා කරන දිනට පසුව සිදු කරන ලද අහඹු ලෙස මුදල් ගණන් කිරීමේ දී භෞතික මුදල් ශේෂය සහ පද්ධතියේ දිස් වූ ශේෂය අතර රු.4,208,976 ක වෙනසක් ද අනාවරණය විය. | වාර්තා කරන දිනට අතැති මුදල් ශේෂය සත්‍යාපනය කිරීම සඳහා සතුටුදායක සාක්ෂි සැපයීමට නිර්දේශ කෙරේ. | රු.9,515,998 ක ශේෂය පසුව තැන්පත් කරන ලද අතර අපි දැනටමත් එම තැන්පතු පත්‍රිකා ද ලබා දී ඇත. | මෙම ශේෂය පසුව තැන්පත් කර ඇති අතර දැනටමත් තැන්පතු පත්‍රිකා සපයා ඇත. |

## 4.13 පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 263,302,515 | 254,670,192 | 148,866,845 | 54,564,230 | 11,976,442 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 126,137,216 | 135,289,596 | 113,054,758 | 26,575,509 | (9,152,378) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |





| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 263.30 | 254.67 | 148.87 | 54.56 | 11.98 |
| 2019 | 126.14 | 135.29 | 113.05 | 26.58 | (9.15) |
| 2020 | - | - | - | - | - |

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| පහත උදාහරණ අනුව සමාගම විසින් කිසිදු රක්ෂණ ආවරණයක් නොමැතිව සැලකිය යුතු අතැති මුදල් ශේෂ පවත්වාගෙන ගොස් තිබුණි. එබැවින් රක්ෂණ ආවරණයක් ලබා නොගෙන දෛනිකව විශාල අතැති මුදලක් පවත්වා ගැනීම සමාගමට අවදානම් සහගත තත්වයක් වේ. | අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | | ඔබේ වාර්තාවේ පෙන්වා ඇති පරිදි රක්ෂණ ආවරණයක් සඳහා යාමෙන් හෝ අතේ ඇති මුදල් අවම කර ගැනීමෙන් අතිරික්ත මුදල් ප්‍රමාණයක් පවත්වාගෙන යාමෙන් ඇති |

| | |
|---|---|
| උදා:<br><br>(i) 17/04/2018 දිනැති ශේෂය රු.537,000<br>(ii) 22/08/2018 දිනැති ශේෂය රු.682,500<br>(iii) 30/08/2018 දිනැති ශේෂය රු.549,800<br>(iv) 26/02/2019 දිනැති ශේෂය රු.534,000<br>(v) 27/03/2019 දිනැති ශේෂය රු.822,800 | විය හැකි අවදානම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට සමාගම සලකා බලනු ඇත. |

## 4.14 පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 17,089,540,000 | 12,673,419,000 | 172,541,277,000 | 143,937,922,000 | 8,672,467,000 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 17,812,728,000 | 14,870,220,000 | 171,660,193,000 | 141,413,561,000 | 6,554,285,000 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 14,039,488,000 | 10,006,468,000 | 164,546,109,000 | 130,204,678,000 | 7,095,216,000 | තත්ත්වාගණනය නොකළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ඉල්ලා අස් වූ සේවකයින්ගේ සමහර පරිශීලක ගිණුම් "InBank" හා "Microfin" පද්ධතිවල කාලානුරූපී පදනමින් අක්‍රීය කර නොමැති | කාලානුරූපී පදනමක් මත පරිශීලක ගිණුම් අක්‍රියවීම කෙරෙහි දැඩිව අනුගතවීම අවශ්‍ය වේ. | ප්‍රවේශයට අදාල සියලු කරුණු විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ප්‍රවේශ කළමනාකරණ | සියලුම ප්‍රවේශ ලබා දීම සහ ඉවත් කිරීම "ප්‍රවේශ කළමනාකරණ ඒකකය" විසින් |

| | | | | |
|---|---|---|---|---|
| | බව සමාලෝචනය තුළදී නිරීක්ෂණය විය. | | ඒකකයක් ස්ථාපිත කර ඇත. | නියමිත වේලාවට හසුරුවනු ලැබේ. |
| (ආ) | පුද්ගලිකව වැදගත් ගනුදෙනුකරුවන්ගේ හිඟහිටි ශේෂ අයකර ගැනීමට ඇප ලෙස භාවිතාවන සුරැකුම් උපලබ්ධි කරගැනීමට ගනු ලබන ඇස්තමේන්තුගත කාලය / කාලසීමාව සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් ක්‍රියාවලියක් නොපැවතුණි. | සමාගමට විශ්වාසදායී සාක්ෂි සහිතව ඇස්තමේන්තු සාධාරණීකරණය කිරීමට හැකිවිය යුතුය. | ස්වාධීන හාණිකරණ ගණනය කිරීමේදී සුරැකුම්පත් උපලබ්ධි කර ගැනීම සඳහා විශේෂඥතාව සහ දැනුම (නීති සහ අයකිරීම් විශේෂඥයින්) මත පදනම් වූ කළමනාකරණ උපකල්පන සහ විනිශ්චයන් සමාගම භාවිතා කරයි. | සමාගම මෙම උපකල්පන සහ විනිශ්චයන් කාර්තුමය පදනමින් ඇගයීමට ලක් කරයි. |

## 4.15 පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 251,429,004 | 219,147,917 | 412,548,265 | 112,798,203 | 47,137,636 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 242,637,214 | 220,337,997 | 441,053,408 | 154,090,864 | 32,559,436 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 249,170,238 | 203,511,509 | 444,980,963 | 111,438,805 | 55,652,020 | තත්ත්වාගණනය නොකළ |





| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 251.43 | 219.15 | 412.55 | 112.80 | 47.14 |
| 2019 | 242.64 | 220.34 | 441.05 | 154.09 | 32.56 |
| 2020 | 249.17 | 203.51 | 444.98 | 111.44 | 55.65 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමහර ගනුදෙනුකරුවන් සතුව දිගුකාලීන හිඟ ශේෂයන් ඇති බව | සමාගම මෙම ශේෂයන් සඳහා ප්‍රතිපාදන සලසා ඇතත්; සමාගම ඔවුන්ගේ අයකරගැනීමේ හැකියාව | ණය පාරිභෝගික ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම | නැවත සොයා බලා ඇත. අය කරගැනීමේ හැකියාව අනුව ශේෂයන් |

| | | | | |
|---|---|---|---|---|
| | විගණනයේදී නිරීක්ෂණය විය. | පිළිබඳව නැවත සොයා බැලිය යුතුය. | | ධනාත්මක හැසිරීමක් පිළිබිඹු කර නොතිබුණි. |
| (ආ) | පොදු ලෙජරයේ 'අත්තිකාරම් ලැබීම් - ස්වයං ධාවක වාහන – 2204010209' ('Advanced Received – Self Drive Vehicles – 2204010209') ගිණුම යටතේ වටිනාකම රු.311,907 ක් වූ දිගුකාලීන හිඟ වෙනත් වගකීම් පවතින බව නිරීක්ෂණය විය. | යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා දිගුකාලීන හිඟ ශේෂයන් පසු විපරම් කිරීමට අවශ්‍ය වේ. | මූල්‍ය ප්‍රකාශන අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම. | නිවැරදි කර ඇත. |

## 4.16 පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්


| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 385,251,775 | 205,042,096 | 2,362,997,596 | 900,009,114 | 227,584,532 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 444,860,461 | 201,938,925 | 2,661,615,630 | 1,065,797,950 | 312,873,944 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 332,256,000 | 149,757,210 | 2,596,942,396 | 928,369,410 | 218,026,751 | තත්ත්වාගණනය නොකළ |




- වාර්තා කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු නොමැත.

## 4.17 පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 5,432,668,375 | 4,703,606,068 | 8,417,567,849 | 5,042,420,581 | 847,015,921 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 6,108,525,950 | 5,460,871,970 | 9,580,499,268 | 5,937,850,296 | 912,029,738 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 6,162,735,846 | 4,967,421,494 | 10,595,863,039 | 5,976,677,697 | 1,667,521,268 | තත්ත්වාගණනය නොකළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල ණය ශේෂය තුළ දැනටමත් සමාගමෙන් ඉල්ලා අස් වූ සේවකයින්ගෙන් අයවිය යුතු මුදල් ද ඇතුළත් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ඉල්ලා | හිඟ ශේෂයන් අයකර ගැනීමට පියවර ගත යුතුය. | | නියමිත මුදල් අයකර ගැනීම සමථ මණ්ඩලය හරහා අවධානය යොමු කර ඇත. එසේම, ලියාපදිංචි පොත සමඟ |

| | | | | |
|---|---|---|---|---|
| | අස්වූ සේවකයන්ගෙන් සමාගමට නියමිත මුදල් අයකරගත නොහැකි වී ඇත. තවද ඉල්ලා අස්වූ සේවකයින් විසින් පාපැදි පවා භාරදී දී තිබූ අතර, 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාර්ය මණ්ඩල වාහන ණය ගිණුමේ හිඟ ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය. | | | දේපල, සමාගමේ භාරකාරත්වය යටතේ පවතින අතර දේපල පැවරීම සඳහා නිසි තක්සේරුවක් සිදු කරනු ලැබේ. නියමිත ණය මුදල අයකර ගැනීමට ඉදිරියේදී සුදුසු පියවර ගනු ඇත. |
| (ආ) | බඳවා ගැනීමේ පටිපාටිය (SOR) ලෙස මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සෑම තනතුරක් සඳහාම වෘත්තීය නිපුණතා අවශ්‍යතා ලැයිස්තුවක් සමාගම විසින් භාවිතා කරයි. තවද කළමනාකරණ මට්ටමට ඉහල තනතුරු සහ සමහර ප්‍රධාන දෙපාර්තමේන්තු (උදා: තොරතුරු තාක්ෂණ, අභ්‍යන්තර විගණන, සමුද්‍ර, අවදානම් සහ අනුකූලතා) එම ලැයිස්තුවෙන් ආවරණය නොවන බව නිරීක්ෂණය විය. | ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය | | 2020/21 සඳහා සමාගම වෙනුවෙන් නව මානව සම්පත් මූලාරම්භයන් ලෙස නිපුණතා පදනම් කරගත් සංවර්ධනය සහ බඳවා ගැනීම් තවමත් සංවර්ධනය කරමින් හා සාකච්ඡා කරමින් පවතී. |
| (ඇ) | සෑම ව්‍යවසායයකටම ආයතනය සඳහා කාර්යය මණ්ඩලයක් සහිත සංවිධාන සටහනක් තිබීම අවශ්‍ය වුවද, සමාගම සඳහා මණ්ඩලය විසින් අනුමත කාර්යය මණ්ඩලට විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත. | වාර්ෂික අයවැයේ පවතින කාර්යය මණ්ඩලය පෙන්වීම හැර සමාගමේ කාර්යය මණ්ඩල තක්සේරුවෙන් පසුව සකස් කරන ලද වෙනම මණ්ඩලය අනුමත කාර්යය මණ්ඩලයක් පැවතිය යුතුය. | | සමාගමේ 2019 අයවැය යටතේ මණ්ඩලය අනුමත කරන ලද කාර්යය මණ්ඩලයක් ඇත. |

## 4.18 පීපල්ස් මයික්‍රො කොමර්ස් ලිමිටඩ්

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 713,297,820 | 663,534,286 | 2,245,817,743 | 2,037,190,900 | 122,413,771 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 841,852,866 | 816,360,816 | 2,876,112,751 | 2,641,931,040 | 80,475,123 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 867,994,483 | 735,315,557 | 2,684,428,134 | 2,316,839,454 | 253,439,849 | තත්ත්වාගණනය නොකළ |





| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) <u>පහසුකම්වල ගෙවීම් පැහැර හැරීම් දින</u> සමාගම වර්තමානයේ ගෙවීම් පැහැර හැරීම් දින ගණන අතින් ගණනය කරයි. | නිරවද්‍යතාව ශක්තිමත් කරමින් කිසිදු අතින් සිදු කරන මැදිහත්වීමකින් තොරව මාසය අවසාන වාර්තාවේ පහසුකම්වල ගෙවීම් පැහැර හැරීම් දින ගණන ගණනය | | සමාගම මේ වන විට ව්‍යුහාත්මක වෙනස්කම් වලට භාජනය කරමින් පවතියි. එබැවින් ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කිරීමෙන් පසුව පද්ධතිය තුළ ගෙවීම් පැහැර හැරීම් |

| | | | | |
|---|---|---|---|---|
| | | කිරීමට පද්ධතියට හැකි විය යුතුය. | | දින ගණන ගණනය කිරීමේ කොටස සංවර්ධනය කරන්නෙමු. |
| (ආ) | සමාගමේ හානිකරණ ක්‍රියාවලිය අතින් සිදුකරන ක්‍රියාවලියකි. මෙම ක්‍රියාවලියේදී, හාණිකරණය ගණනය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමට කළමනාකාරිත්වය අභ්‍යන්තර වාර්තා කිහිපයක් ජනනය කරයි. වැඩිපුර අත්හුරු ක්‍රමයට කටයුතු කිරීම සහ වාර්තා කිහිපයක් තනි වේදිකාවකට ඒකාබද්ධ කිරීම ඇතුළත් වන මෙම ක්‍රියාවලිය තුළ අතපසුවීම්, සාවද්‍ය ප්‍රකාශයන් සහ මානව දෝෂ සිදුවිය හැකිය. | හානිකරණය ගණනය කිරීමේ ක්‍රියාවලිය ප්‍රමාණවත් ප්‍රමාණයකට ස්වයංක්‍රීය කිරීමට අවශ්‍ය පියවර ගැනීමටත්, දත්ත හැසිරවීමෙන් සහ අතපසු වීමෙන් වන අවදානම වළක්වා ගැනීම සඳහා අතින් මැදිහත්වීම අවම කිරීමටත් නිර්දේශ කෙරේ. මීට අමතරව, මෙය විවිධ මූලාශ්‍රවලින් දත්ත උකහා ගැනීමට සහ ඒවා සම්පාදනය කිරීමට වැය කරන කාලයෙන් වැඩි ප්‍රමාණයක් ඉතිරි කරයි. | | හානිකරණය ගණනය කිරීමේ ක්‍රමවේදයේ සංකීර්ණත්වය හේතුවෙන් සම්පූර්ණ ස්වයංක්‍රීය පද්ධතියක් සංවර්ධනය කිරීම දුෂ්කර වේ. කෙසේ වෙතත්, ගණනය කිරීම්වලට සහාය වීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව පද්ධතිය මගින් ජනනය කරන ලද වාර්තා සකස් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. |

## 4.19 පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්


| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 221,571,445 | 180,303,423 | 2,660,137,414 | 1,550,098,679 | 41,268,022 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 221,407,466 | 171,090,821 | 2,681,675,960 | 1,521,295,161 | 50,316,645 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 205,376,300 | 124,509,180 | 2,659,956,084 | 1,418,708,165 | 80,867,120 | තත්ත්වාගණනය නොකළ |




| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| ආදායම් බදු සහ විලම්බිත බදු ගණනය කිරීම් අතර පැන නගින තාවකාලික වෙනස්කම් සැසඳීමට නිසි ක්‍රියාවලියක් සමාගමට නොතිබුණි. | ආදායම් බදු සහ විලම්බිත බදු ගණනය කිරීම් අතර පැන නගින තාවකාලික වෙනස්කම් සමනය කිරීමට නිසි ක්‍රියාවලියක් සමාගමට තිබිය යුතුය. මෙය විලම්බිත බදු ගණනය කිරීමේ නිරවද්‍යතාවය ශක්තිමත් කරනු ඇත. | සමාගම දැනටමත් නිසි තාවකාලික වෙනස්කම් සැසඳීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. | සමාගම 2021 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි නිසි තාවකාලික වෙනස්කම් සැසඳීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. |

## 4.20 මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම (CESL)

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 11,443,538,013 | 11,270,447,507 | 12,616,600,780 | 12,195,487,617 | 173,090,506 | තත්ත්වාගණනය කල |
| **2019** | 10,772,487,645 | 10,565,635,599 | 12,681,031,711 | 12,076,166,217 | 206,852,046 | තත්ත්වාගණනය කල |
| **2020** | 6,913,380,906 | 6,842,981,663 | 12,558,010,997 | 11,701,116,721 | 70,399,243 | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සියළුම දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කර ඇති බවත්, ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර ඇති බවත්, නැතිවූ අයිතම හඳුනාගෙන ඇති බවත් සහතික කිරීම සඳහා නිවැරදි හා කාලානුරූපී කේතීකරණ | ව්‍යවසාය සම්පත් සැලැසුම් (ERP) පද්ධතිය සංවර්ධනය කිරීමේදී සහ දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ නිවැරදි සහ ප්‍රමාණවත් පාලනයක් | සමාගම ව්‍යවසාය සම්පත් සැලැසුම් පද්ධතිය භාවිතයෙන් නව කේතීකරණ පද්ධතියක් සංවර්ධනය කරයි. ඒ ක්‍රමය මේ | දකුණු මූලිකයේ ව්‍යවසාය සම්පත් සැලැස්ම පද්ධතිය තුළ දේපල, පිරියත සහ උපකරණ කේතීකරණ පද්ධතිය ආරම්භ කර ඇති නමුත් එය තවමත් සම්පූර්ණ කර නොමැති |

| | | | | |
|---|---|---|---|---|
| | පද්ධතියක් දේපල, පිරියත සහ උපකරණ සඳහා අත්‍යවශ්‍ය වේ. කෙසේ වෙතත්, සමාගම සිය ස්ථාවර වත්කම් නිසි ලෙස කේතනය කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල, පිරියත සහ උපකරණ නිවැරදි බව හඳුනා ගැනීමට සහ ඒ අනුව වාර්ෂික වත්කම් සත්‍යාපනය කිරීමට හැකි වන පරිදි එම කේත ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. | සහතික කිරීම සඳහා නිසි කේතීකරණ පද්ධතියක් අවශ්‍ය වේ. | වසර ඇතුළත හඳුන්වා දෙනවා. | අතර මෙම ක්‍රියාවලිය තවමත් ආරම්භක අදියරේ පවතී. |
| (ආ) | පිරිවැය රු.මිලියන 301.68 ක් වූ සම්පූර්ණ ක්ෂය වූ වත්කම්, දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ප්‍රයෝජනවත් ඵලදායී ආයු කාලය ප්‍රත්‍යාගණනය නොකර සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ට අනුව ඇස්තමේන්තු දෝෂය නිවැරදි කරමින් නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුල ඉදිරිපත් නොකර සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරමින් පවතියි. | සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි විධිවිධාන අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල ඵලදායී ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කළ යුතු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව ඇස්තමේන්තු දෝෂ නිවැරදි කළ යුතුය. | 2020 දී සමාගම විසින් මෝටර් රථ නැවත තක්සේරු කර ඇති අතර නැවත තක්සේරු කළ ශේෂය ගිණුම් වලට ගෙන ඇත. | පසුගියදා පැවති විගණන වාර්තා සාකච්ඡා කිරීමේ රැස්වීමේදී, ප්‍රධාන විධායක නිලධාරියා පිරියත සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය ආරම්භ කරන ලෙස උපදෙස් දුන් නමුත් 2021 මූල්‍ය ප්‍රකාශන සඳහා එය කිරීමට සමාගමට නොහැකි වූ අතර එය 2022 වර්ෂයේදී සිදු කිරීමට බලාපොරොත්තු වේ. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 1 හි 32 ඡේදයට පටහැනිව පිළිවෙලින් රු. මිලියන 44.46 ක් සහ රු.මිලියන 34.69ක් වූ ණය ගැති බැර ශේෂයන් සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හර | ණයගැති ශේෂයන්ට අදාළ බැර ශේෂයන් සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන්ට අදාළ හර ශේෂයන් පිළිබඳව නිසි ගිණුම්කරණ | ණය ගැතියන්ගේ බැර ශේෂයන් සහ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හර ශේෂයන් 2021 අවසාන ගිණුම් තුළ නිසි ලෙස | එකී ශේෂයන් පිළිබඳ නිසි ගිණුම්කරණ ප්‍රතිපාදන අනුව කටයුතු කරන ලෙස සියලුම මූලිකවල ගිණුම් නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| | ශේෂයන් අවස්ථා 30 ක දී එම ගිණුම එකිනෙක කපා හැර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම වත්කම් සහ ජංගම වගකීම් සමාන ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රතිපාදනයන් සිදු කිරීම මගින් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | වර්ගීකරණය කරනු ලැබේ. | |
| (ඈ) | පවතින තොරතුරුවලට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩමක් රු.මිලියන 15.42 කට ලබාගැනීම සඳහා සමාගම 2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ දිගුකාලීන බදු ගිවිසුමකට එළඹී ඇති බව අනාවරණය විය. සමාගම මෙම වටිනාකම බදු ඉඩම් ලෙස පෙන්වා ඇතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා සමාගම බදු ගිවිසුම අත්සන් කිරීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි. | කල්බදු දේපලවල වටිනාකම සහ හිමිකම තහවුරු කර ගැනීම සඳහා බදු ගිවිසුම හෝ වෙනත් ලේඛනගත සාක්ෂි විගණනයට ලබා දිය යුතුය. | සමාගම අවශ්‍ය සියලුම ගෙවීම් සිදු කර ඇති අතර දැනටමත් සිහිකැඳවීමේ ලිපි ද යවා ඇත. | බදු ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු තවමත් අවසන් වී නැත. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 4,175.71 ක් වූ මුළු ණයගැති ශේෂයෙන් රු. මිලියන 375.42 ක් වූ ණයගැති ශේෂයක් වසර 3 කට වැඩි කාලයක් හිඟව පැවති අතර මුළු ණයගැතියන්ගෙන් රු.මිලියන 116.82 ක් වූ ණයගැති ශේෂයක් වසර 5 කට වැඩි කාලයක් ආපසු අය නොවී හිඟව පැවතුනි. මේ අතර, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අදාළව රු.මිලියන 397.88 ක් වූ ණය ශේෂයක් 2020 | තවදුරටත් ප්‍රමාදයකින් තොරව හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | එකතු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා සමාගම විසින් ණයගැති සහ රඳවා ගැනීමේ එකතු කිරීමේ ඒකකයක් ක්‍රියාත්මක කර ඇත. | 2021 වර්ෂයේදී වසර 5 කට වැඩි ණයගැති ශේෂවලින් රු.මිලියන 99 දී සමාගමට ආපසු අයකර ගැනීමට හැකි විය. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙසැම්බර් 31 වන දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | | | |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂය රු.මිලියන 2.672,63 කි. එයින්, නිම කරන ලද ව්‍යාපෘතිවලට අදාළව වසර 3 සිට 5 දක්වා සහ වසර 5කට වැඩි කාලයක් පිළිවෙලින් රු.මිලියන 358.81ක් සහ රු.මිලියන 293.24ක් හිඟ ව පවතින අතර වගකිවයුතු නිලධාරීන් විසින් නිසි අයකර ගැනීමේ ක්‍රියාමාර්ග නොගෙන ඉතිරිව පැවතුනි. | ප්‍රමාදයකින් තොරව හිඟ ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා සමාගම ණය ගැති සහ රඳවා ගැනීමේ එකතු කිරීමේ ඒකකය ක්‍රියාත්මක කර ඇත. | ණය ගැති සහ රැඳවුම් එකතු කිරීමේ ඒකකය සහ සියලුම මූලික වල වගකිව යුතු නිලධාරීන් ලැබිය යුතු රඳවා තබා ගැනීම් ශේෂ අයකර ගැනීම සඳහා අදාළ පාර්ශව වෙත සිහි කැඳවීම් ලිපි අඛණ්ඩව යවයි. |
| (උ) | විගණනය සඳහා ලබා දී ඇති කාල විශ්ලේෂණයට අනුව, ජංගම වගකීම් යටතේ පෙන්වා ඇති රු.මිලියන 261.98 ක් වූ ණයහිමියන් සහ රු.මිලියන 230.52 ගෙවිය යුතු රඳවා ගැනීමේ ශේෂය වසර 2 සිට 5 දක්වා පියවීමකින් තොරව ගිණුම්වල පැවතුනි. | සෑම දිගුකාලීන හිඟ ණයහිමි ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවීමටත් අනෙක් ශේෂ ආදායමක් ලෙස සැලකීමටත් කටයුතු කළ යුතුය. | අපගේ ගනුදෙනුකරුවන්ගෙන් එම මුදල් අයනොකර, සැපයුම්කරුවන් සමඟ එකඟ වූ ණය කොන්දේසි ලෙස මෙම හිඟ මුදල් පියවීමට හැකියාවක් නොමැත. එබැවින්, සමාගම ණයගැති සහ රඳවා ගැනීමේ ඒකතු කිරීම් වේගවත් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. | රටේ පවතින තත්ත්වය හේතුවෙන් සමාගම මුහුණ දෙන මූල්‍ය ගැටලු නිසා, ණයහිමියන් සහ ගෙවිය යුතු රැඳවුම් ශේෂයන් නිරවුල් ක්‍රියාවලිය වේගවත් කිරීම අපහසුය. |
| (ඌ) | ව්‍යාපෘති කටයුතු සම්පූරණ මට්ටමට සියයට 90 ක් අවසන් කිරීමට පෙර, ලැබුණු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම පියවිය යුතුය. කෙසේ වෙතත්, සමාගමේ මුලික | අත්තිකාරම් ප්‍රමාදයකින් තොරව පියවීමට කටයුතු කළ යුතුය. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. 23,511,130 ක ශේෂයක් 2021 වර්ෂයේදී පියවා ඇත. | නිකුත් කරන ලද අවසන් බිල්පත් වහාම සහතික කිරීමට ඉංජිනේරුවන් කටයුතු කරනු ඇත. ඒවා සහතික කළ පසු එම |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාල 05 කට අයත් සම්පූර්ණයෙන් නිම කරන ලද සහ සියයට 90 ක් නිම කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සම්බන්ධයෙන් රු.මිලියන 222.95 ක එවැනි අත්තිකාරම් මුදලක් 2020 දෙසැම්බර් 31 වන දිනට පියවීමකින් තොරව ගිණුම්වල ඉතිරිව තිබුණි. | | | ව්‍යාපෘතිවලට අදාළ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නිෂ්කාශනය කෙරේ. |
| (එ) | සමාගම රු. 2020 දෙසැම්බර් 31 දිනට මව් සමාගමට එනම් මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයට (CECB) ගෙවිය යුතු රු.මිලියන 1,652.54 ක් දක්වා ඇති අතර අතර මෙම මුදලට වාහන කුලියට ගැනීමේ ගාස්තු, ස්ථාවර වත්කම්වල වටිනාකම සහ හුවමාරු කරන ලද තොග සහ තාවකාලික ණය ආදිය ඇතුළත් විය. කෙසේ වෙතත්,. මෙම ගනුදෙනු සම්බන්ධයෙන් පාර්ශ්ව අතර නිසි සහ යාවත්කාලීන ගිවිසුමක් නොමැති අතර මෙම ශේෂය නිරවුල් කිරීමට කිසිදු ඵලදායී ක්‍රියාමාර්ගයක් නොගෙන 2017 වසරේ සිට අඛණ්ඩව මෙම ශේෂය ඉහළ ගොස් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. තවද, මෙම වාර්තාව නිකුත් කරන දිනය දක්වා සමාගම විසින් මෙම ගෙවිය යුතු ශේෂය සඳහා කිසිදු පොලියක් ගණනය කර නොතිබුණි. | සමාගම සහ මව් සමාගම අතර පැහැදිලි ගිවිසුමක් ඇති කර ගැනීමට සහ සම්බන්ධිත පාර්ශවීය ගෙවිය යුතු ශේෂය අඛණ්ඩව වැඩි වීම පාලනය කිරීමට ක්‍රියා කළ යුතුය. | කොටස් නිකුත් කිරීමේ මාර්ගයක් මගින් ශේෂයන් ප්‍රාග්ධනීකරණය කිරීමේ ක්‍රමයක් හඳුනා ගැනීම සඳහා CECB සමඟ සාකච්ඡා කර දිගු හිඟ ශේෂයන් සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක සමාගම යෙදී සිටී. | මෑත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී CESL හි ප්‍රධාන මූල්‍ය නිලධාරී සහ CECB හි කළමනාකාරීත්වය මෙම ගැටලුව විසඳීම සඳහා යෝජනාවලියක් සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. නමුත් මෙය තවමත් ආරම්භක අදියරේ පවතී. |
| (ඒ) | සමාගමට ඔවුන්ගේ ERP පද්ධතියෙන් තොග වල කාල | වාර්තා කරන දිනට තොගයේ | කිසිම ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි | තවමත් CESL කළමනාකාරීත්වය |

| | | | | |
|---|---|---|---|---|
| | විශ්ලේෂණ වාර්තාවක් උත්පාදනය කිරීමට හැකියාවක් නොමැත. එබැවින්, තොග වල කාල විශ්ලේෂණ මත පදනම්ව සෙමින් චලනය වන, චලනය නොවන සහ යල් පැන ගිය අයිතම හඳුනා ගැනීමේ දුෂ්කරතාවයන්ට සමාගම මුහුණ දී සිටී. | නිරවද්‍යතාවය, පැවැත්ම සහ සම්පූර්ණත්වය සත්‍යාපනය කිරීම සඳහා ERP පද්ධතියේම තොග කාල විශ්ලේෂණ වාර්තාව උත්පාදනය කිරීම සඳහා පද්ධති පරාමිතීන් වැඩි දියුණු කිරීමට පියවර ගත යුතුය. | | මෙම ගැටලුව සම්බන්ධයෙන් පද්ධති සංවර්ධන කණ්ඩායම සමඟ සාකච්ඡා කරමින් සිටින අතර තවමත් විසඳා නොමැත. |
| (ඔ) | සෑම ඉන්ධන පරීක්ෂණයකින්ම මාස 12ක කාලයකට පසුව හෝ කිලෝමීටර් 25,000ක දුරක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමේ ප්‍රධාන අලුත්වැඩියාවක් සිදු කිරීමෙන් පසුව මෙයින් ප්‍රථමයෙන් එළඹෙන අවස්ථාවේ ඉන්ධන පරිභෝජනය නැවත පරීක්ෂා කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් 2016 සිට 2020 දක්වා කාලය තුළ මෙම පරීක්ෂණය පවත්වා ඇත්තේ සමාගමේ වාහන 82 න් වාහන 12 ක් සඳහා පමණි. | ඉන්ධන පරිභෝජනයේ ආර්ථිකමය භාවිතය සහතික කිරීම සඳහා එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව ඉන්ධන පරිභෝජනය වරින් වර පරීක්ෂා කළ යුතුය. | සමාගම තවමත් චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවේ. | සමාගම විසින් CECB විසින් භාවිතා කරන නමුත් CESL සතු වාහනය සඳහා සෑම මාස හයකට වරක් ඉන්ධන පරීක්ෂා කිරීම ආරම්භ කර ඇත. නමුත් සමාගම CESL සතු අනෙකුත් වාහනවලට අදාළ චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවේ. |
| (ඕ) | විගණනය සඳහා ලබා දී ඇති තොරතුරුවලට අනුව, ඉදිකිරීම් නිම කරන ලද ව්‍යාපෘතිවලින් 2020, 2019 සහ 2018 වර්ෂ අවසන් වන විට සමාගම පිළිවෙළින් රු.මිලියන 973.3 ක, රු.මිලියන 722.8 ක සහ රු.රු.මිලියන 724.2 ක දළ අලාභයක් ලබා ඇත. තවද, 2020 | ඉදිකිරීම් ව්‍යාපෘතිවල අලාභ අවම කිරීම සඳහා සමාගම ඵලදායී පියවර ගත යුතුය. | දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අලාභ ලබන දැනට පවතින ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා සමාගම විසින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ක්‍රියාත්මක කර ඇති | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති, විශේෂයෙන් පාඩු ලබන දැනට පවතින ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කරන අතර අලාභ අවම කර ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | වසරේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 04කින් රු.මිලියන 43.03ක අලාභයක් සිදුවී ඇති බව වාර්තා වේ. | | අතර අලාභ අවම කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මූලිකයන් විසින් ගනු පියවර ගනු ලබයි. |
| (ක) | සමාගම 2020, 2019 සහ 2018 යන වර්ෂවලදී පිළිවෙලින් රු.මිලියන 70 ක, රු. මිලියන 206 ක සහ රු. මිලියන 152 ක බදු පෙර ශුද්ධ ලාභයක් උපයාගෙන ඇති අතර එහි මුළු වත්කම් පදනම පිළිවෙලින් රු.මිලියන 12,558 ක්, රු.මිලියන 12,681 ක් සහ රු.මිලියන 12,890 කි. එබැවින්, සමස්ත වත්කම්වල සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය වූයේ පිළිවෙලින් සියයට 0.56, සියයට 1.62 සහ සියයට 1.17 ක් පමණි. මෙම අනුපාතය සසඳන විට 2020 වසරේ මෙම අනුපාතය බෙහෙවින් අඩු බව අපට නිරීක්ෂණය විය. 2020 වර්ෂයේදී ශුද්ධ ලාභ ආන්තිකය සියයට 2.18 ක අනුපාතයකින් පවත්වා ගැනීමට අපේක්ෂා කළද එය සාක්ෂාත් කර ගැනීමට සමාගම අපොහොසත් වී ඇත. | ඉදිකිරීම් ව්‍යාපෘතිවල පාඩු අවම කර ගැනීමටත් සමාගමේ වත්කම් පදනම ඵලදායී ලෙස භාවිත කිරීමෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමටත් සමාගම ඵලදායී පියවර ගත යුතුය. | දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්‍ෂණය කිරීම සහ අලාභ ලබන දැනට පවතින ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා සමාගම විසින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ක්‍රියාත්මක කර ඇති අතර අලාභ අවම කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති, විශේෂයෙන් පාඩු ලබන දැනට පවතින ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කරන අතර අලාභ අවම කර ගැනීමට මූලිකයන් විසින් ගනු පියවර ගනු ලබයි. |
| (ග) | ආචාර්ය ඒ.එන්.එස් කුලසිංහ මහතාගේ 100 වැනි ජන්ම දින උත්සවය සැමරීම සඳහා ශ්‍රී ලංකා ගුහලෝකාගාර පරිශ්‍රයේ තාක්ෂණික උද්‍යානයක් ඉදිකිරීම සඳහා රු.මිලියන 6.3ක් වැය කර ඇත. | මෙවැනි ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති, මූල්‍යමය වශයෙන් වඩාත් වාසිදායක වන පරිදි සහ සාමාන්‍ය ජනතාවට ගුණාත්මකව හොඳම සේවාවන් සැපයීම සඳහා විනිවිද | කිසිදු පියවරක් ගෙන නැත | කිසිම වෙනසක් නොමැත |


| | |
|---|---|
| මෙම උද්‍යානය සඳහා අවශ්‍ය උපකරණ සැපයීම, ඉදිකිරීම සහ ස්ථාපිත කිරීම සඳහා (ප්‍රසම්පාදනය මගහැර) උද්‍යානයේ සැපයුම් සහ ස්ථාපනය කරන ලද උපකරණ නියමිත ප්‍රමිතියට අනුකූලව නිසි ලෙස ස්ථාපනය කර ඇති බව සහතික කරනොගෙන හා සුදුසු ස්වාධීන පාර්ශ්වයකින් වැඩ අවසන් කිරීමේ සහතික ලබා නොගෙන අදාළ නිලධාරීන් විසින් බිල්පත් සහතික කිරීම මත සමාගම විසින් සෘජුවම සමාගමේ නිලධාරීන් වෙත ගෙවීම් කර ඇත. තවද, ඉහත උද්‍යානයේ සමහර භාණ්ඩ සඳහා ප්‍රසම්පාදන පිරිවැය සහ වාරික වශයෙන් දැරීමට සිදු වූ මුදල වර්තමාන වෙළඳපල මිලට සාපේක්ෂව ඉතා ඉහළ මට්ටමක පැවති අතර එය ප්‍රායෝගික නැත. එබැවින් මෙම උද්‍යානය ඉදිකිරීම සඳහා වැය වූ මුදලේ නිරවද්‍යතාවය සහ විනිවිදභාවය පිළිබඳ විගණනයේදී බරපතළ ගැටලුවක් ඇති විය.<br><br>මේ අතර අදාළ පාර්ශ්වය සමඟ කිසිදු විධිමත් ගිවිසුමකින් තොරව උද්‍යානය ඉදිකර විවෘත කර ඇති බවත් උද්‍යානය නඩත්තු කිරීමට කිසිදු සූදානමක් නොතිබූ නිසා උද්‍යානයේ තිබූ ඇතැම් උපකරණ වසරකට අඩු කාලයක් තුළ භාවිතයට ගත නොහැකිව ඇතුළත දිරාපත් වන තත්ත්වයට පත්ව ඇති බවත් අපගේ භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය. | භාවයකින් සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉහත හේතූන් මත මෙම උද්‍යානය ඉදිකිරීමේ කිසිදු අරමුණක් ඉටු නොවූ අතර ඉහත උද්‍යානය සඳහා වැය කළ රු.මිලියන 6.37 ඵල රහිත විය. | | | |
| (ච) | සමාලෝචිත වර්ෂය අවසානයේ දී Repo, ඉතිරිකිරීමේ ගිණුම් සහ ස්ථාවර තැන්පතු ආදියෙහි ආයෝජනය කර ඇති මුදල රු.මිලියන 2,291.21 ක කෙටි කාලීන ආයෝජන මත රු.මිලියන 132.85 ක ශුද්ධ පොලී ආදායමක් සමාගම උපයා ඇත. 2020 වර්ෂය තුළ සමාගම මෙතරම් පොලී ආදායමක් උපයා නොගන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන බදු පෙර ලාභය රු. මිලියන 70.40 ක, රු.මිලියන 62.45 ක මෙහෙයුම් අලාභයක් වනු ඇති අතර මෙම ශුද්ධ පොලී ආදායම 2020 වර්ෂයේ බදු පෙර ලාභයෙන් සියයට 188.7 ක් නියෝජනය කරයි. | සමාගමේ මෙහෙයුම් ආදායම ඉහළ නැංවීම සඳහා එහි මූල්‍ය, මානව සහ අනෙකුත් භෞතික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට සමාගමේ කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. | සමාගම මෙහෙයුම් කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටින නමුත් උද්ධමනය, ආනයන සීමා කිරීම, Covid-19 වසංගතය වැනි ඉදිකිරීම් කර්මාන්තයට බලපා ඇති සමහර අහිතකර තත්ත්වයන් හේතුවෙන් අපගේ මෙහෙයුම් ප්‍රතිඵල අඩු විය. | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති, විශේෂයෙන් පාඩු ලබන දැනට පවතින ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කරන අතර පාඩු අවම කර ගැනීමට මූලිකයන් විසින් පියවර ගනු ලබයි. |
| (ඡ) | 2020 වර්ෂය තුළ පොළොන්නරුව, ඌව, COE දකුණ සහ අනුරාධපුරය යන සමාගමේ මූලික කාර්යාල 04 ක රු.මිලියන 490.77 ක ශුද්ධ අලාභයක් ලබමින් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. මේ අතර, අනුරාධපුර සහ ඌව මූලික කාර්යාලය 2020 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන | සමාගමේ මෙහෙයුම් පාඩු අවම කර ගැනීම සඳහා එහි මූල්‍ය, මානව සහ අනෙකුත් භෞතික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට සමාගමේ කළමනාකාරීත්වය අවධානය යොමු කළ යුතුය. | දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්‍ෂණය කිරීම සහ අලාභ ලබන දැනට පවතින ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා සමාගම විසින් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකයක් ක්‍රියාත්මක කර ඇති අතර අලාභ අවම කර | ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති, විශේෂයෙන් පාඩු ලබන දැනට පවතින ව්‍යාපෘති සමීපව අධීක්ෂණය කරන අතර අලාභ අවම කර ගැනීමට මූලිකයන් විසින් ගනු පියවර ගනු ලබයි. |

| | | | | |
|---|---|---|---|---|
| | 163.87 ක සහ රු. මිලියන 196.88 ක දළ අලාභයක් වාර්තා කර ඇත. | | ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| (ට) | 2020 දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 1,599.05 ක් සහ මිලියන 1,929.33 කි. එයින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති 50කට අදාළව රු.මිලියන 325.05ක් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට නිසි ක්‍රියාමාර්ගයක් නොගෙනීම හේතුවෙන් මෙම ගිණුම්වල රැඳී තිබුණි. ප්‍රධාන වශයෙන් විධිමත් හා කාලෝචිත බිල්පත් ක්‍රමයක් නොමැතිකම හේතුවෙන් මෙම ගැටලුව මතුව ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කර ගැනීමට සහ කාල විශ්ලේෂණයක් සකස් කර ගිණුම්වල නිසි ගැලපීම් සිදු කිරීමට තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඵලදායී සහ නිසි වැඩ සැලැස්මක් හඳුන්වා දිය යුතුය. | අවසාන බිල්පත් සහතික කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ඉහළ සැලකිල්ලක් දක්වන ලෙස සියලුම මූලිකයන් වෙත දැනුම් දී ඇත. | නිකුත් කරන ලද අවසන් බිල්පත් වහාම සහතික කිරීමට ඉංජිනේරුවන් කටයුතු කරනු ඇත. ඒවා සහතික කළ පසු, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අදාළව ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂයන් කපා හැරිය හැක. |

## 4.21 සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය (ITN)

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 1,376,472,384 | 1,998,934,332 | 3,070,053,703 | 928,932,018 | (622,461,949) | තත්ත්වාගණනය කළ |
| **2019** | 1,297,065,499 | 1,894,534,118 | 2,461,894,011 | 903,333,321 | (597,468,619) | තත්ත්වාගණනය කළ |
| **2020** | 1,545,710,313 | 1,795,391,986 | 2,365,143,615 | 1,033,443,885 | (249,681,673) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මාධ්‍ය ජාලයේ ස්කන්ධ ප්‍රාග්ධනය අඛණ්ඩව අඩු වී තිබුණු අතර 2016 වර්ෂයේ 2020 වර්ෂය දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබුණි. 2020 වර්ෂයේ ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ අලාභය රු.210,623,700 ක් වූ අතර ඒ යටතේ පවතින, අයිටීඑන් එෆ්එම්, | අලාභ තත්වය මග හරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වේ. | ඉදිරි වර්ෂ වලදී අඛණ්ඩව ආදායම් ඉලක්ක සපුරා ගනිමින් අලාභ තත්වය ලාභදායී තත්වයකට පත් කර | 2020 වර්ෂයට සාපේක්ෂව 2021 වර්ෂයේදී ආදායම රු.මිලියන 250 කින් පමණ වැඩි වී ඇති අතර ශුද්ධ අලාභය සියයට 17.6 කින් |

| | | | | |
|---|---|---|---|---|
| | වසන්තම් එෆ් එම් හි අලාභයන් පිළිවෙලින් රු.52,557,304 ක්, සහ රු.13,177,729 ක් විය. කෙසේ නමුත්, වසන්තම් ටීවී ආයතනයේ ලාභය රු. 62,384,227 ක් විය. ඒ අනුව 2020 වර්ෂයේ සමාගමේ මුළු අලාභය රු.213,974,507 ක් වී තිබුණි. | | ගැනීමට අපේක්ෂා කරයි. | පමණ අඩු බවට ඇස්තමේන්තු කර ඇත. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට සේවාදායක ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය රු.26,102,280 ක් වූ අතර මාධ්‍ය ජාලය විසින් අදාළ සේවාවන් සපයා නොගැනීම හේතුවෙන් වසර 05 ක් ඉක්මවා ඇති ප්‍රතිවෙළඳ ණයගැති ශේෂයන්ගේ එකතුව රු. 14,641,728 ක් සඳහා මූල්‍ය වර්ෂයේ හානිකරණ ගැලපීම සිදුකර තිබුණි. | ප්‍රතිවෙළඳ ගණුදෙනු සම්බන්ධයෙන් නිසියාකාරව ලේඛන පවත්වා ගැනීම හා අදාල සේවාව ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු ය. | වර්තමානයේදී ප්‍රති වෙළඳ ණයගැති ශේෂයන් පිළිබඳව ගනුදෙනු නිසියාකාරව කිරීමට කටයුතු කර ඇත. | නිවැරදි කිරීමට මේ දක්වා කටයුතු කර නැත. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.63,929,480ක් වූ විලම්බිත ආදායම් ශේෂය තුළ වසර 05 ට අඩු ශේෂය රු.18,866,794 ක් ද, වසර 05 ත් 10 ත් අතර ශේෂය රු. 16,108,606 ක් ද, වසර 10 ට වැඩි ශේෂය රු. 28,954,081 ක් ද ඇතුළත්ව තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට 2020 වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | විලම්භිත ආදායම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | 2022 වර්ෂයේ ගිණුම් වලින් ගැලපීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන රු. 137,772,746 ක් වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වසර 10 ක් ඉක්මවූ ශේෂය රු. 33,620,223 ක් වූ අතර මෙම ශේෂය නිරවුල් කිරීම සඳහා 2020 වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | සේවාදායක අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | මෙම සේවාදායක අත්තිකාරම් වලට අදාළ සේවාදායකයන් හඳුනාගෙන ඇති අතර 2021 ගිණුම් | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | | | වලදී ගැලපීමට කටයුතු කර ඇත. | |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.11,898,232 ක් වූ අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද චෙක්පත් 554 ක වටිනාකම රු.4,541,250 ක් සහ වසර 02 ත් 05 ත් අතර චෙක්පත් 570 ක වටිනාකම රු.6,602,258 ක් ඇතුළත් වූ අතර මෙම ශේෂය නිරවුල් කිරීමට 2020 වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | අවලංගු කල චෙක්පත් ගිණුමේ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | 2017.12.31 දක්වා පැවති අවලංගු කල චෙක්පත් ගිණුමේ ශේෂයන් 2021 ගිණුම් වලදී ගැලපීමට කටයුතු කර ඇත. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.2,268,386 ක් වූ හිමිකම් නොපෑ ගෙවීම් වලින් වර්ෂ 3 කට වඩා පැරණි, හිමිකම් නොපෑ ශේෂය රු.1,208,728 ක හිමිකම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් පසු ආපසු ගෙවීමට හෝ විධිමත් ගිණුම්කරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි | හිමිකම් නොපෑ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | හිමිකම් නොපෑ ගෙවීම් ශේෂය 2021 ගිණුම් වලදී ගැලපීමට කටයුතු කර ඇත. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (උ) | 2012 වසරේ සිට පැවත එන එකතුව රු.50,628,651 ක් වූ ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට2020 දෙසැම්බර් 31 වන විට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | අදාළ ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කිරීම. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඌ) | 2020 දෙසැම්බර් 31දිනට වටිනාකම රු.1,687,956 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තුළ ඇතුලත් වසර 03 ක් ඉක්මවා ඇති එකතුව රු. 855,707 ක් වූ ගෙවියයුතු තැන්පතු 112 ක් තැන්පතුකරුවන්ට ආපසු ගෙවීමට හෝ විධිමත් ගිණුම්කරණ ක්‍රියාමාර්ගයක් | ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | ආපසු ගෙවිය යුතු තැන්පතු ගිණුමේ පැවති ශේෂයෙන් 2017.12.31 ට පෙර පැවති ශේෂයන් 2021 ගිණුම් වලදී ගැලපීමට කටයුතු කර ඇත. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (එ) | 2020 දෙසැම්බර් 31 දිනට රු. 1,253,409 ක් වූ හඳුනා නොගත් ණයහිමි ශේෂය සේවාදායකයා හඳුනාගෙන නිරවුල් කිරීමකින් තොරව හඳුනානොගත් ණයහිමි ගිණුමේ ඇතුලත් කර තිබුණි. | ණයහිමි ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. | මෙම හඳුනා නොගත් ශේෂයන් නිසි පරිදි විශ්ලේෂණය කර විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත 2022 ගිණුම් වලින් ගැලපීමට කටයුතු කරනු ලැබේ. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඒ) | 2018 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව පාඩුව අඩුකරගෙන තිබූ රජයට අයත් සමාගම්වල එක් පුද්ගලයෙකුට රු.5000 බැගින් ගෙවිය හැකි වුවද, එම අවශ්‍යතාවයට පටහැනිව 2019 වසරේ පාඩුවක් වාර්තා වී තිබුණද ලෙස 2020 දෙසැම්බර් මාසයේදී සේවකයින් 696 දෙනෙකු සඳහා එක් අයෙකුට රු. 13,000 ක් බැගින් රු.9,046,000 ක් සමාගම විසින් ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය | 2021වර්ෂයේදී නියමිත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම. | හිමිකම් නොලද ශේෂයන් පියවීමට කාලීන ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඔ) | මාධ්‍ය ජාලයේ හිටපු සේවකයෙකු විසින් 2011 වර්ෂයේදී වංචා කරන ලද මුදලකින් තවදුරටත් ලැබිය යුතු රු.1,210,620 ක් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි. | අයකර ගැනීම් අප්‍රමාදව සිදු කිරීමට කටයුතු කළ යුතුය | ඉදිරියේදී වංචා සිදුවීමට ඇති ඉඩකඩ අවම වන පරිදි අභ්‍යන්තර පාලන පිළිවෙත් සැකසීම. | මෙම ශේෂය අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඕ) | 2020 වර්ෂය තුළදී අයිටීඑන් නාලිකාව විසින් ටෙලිනාට්‍ය 20 ක් මිලදීගෙන තිබුණු අතර ඉන් ටෙලිනාට්‍ය 13 කින් රු.60,965,986 ක අලාභයක් ලබා | ටෙලිනාට්‍ය මිලදී ගැනීම විධිමත් හා විනිවිද භාවයෙන් සිදු කළ යුතුය | හැකිතාක් අවම මිළ ගණන් යටතේ මිළදී ගැනීමට කටයුතු කර ඇත. | ටෙලි නාට්‍ය මිල දී ගැනීමේ ක්‍රම වේදය විධිමත් කිරීමට |


| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. තවද ටෙලිනාට්‍ය මිලදී ගැනිමේදී, කථාංගයක් සඳහා ගෙවිය යුතු අනුමත රේටය ඉක්මවා ගෙවීම් සිදුකර තිබුණු අතර 2020 වර්ෂය තුලදී නාට්‍ය 06 ක් සඳහා එසේ වැඩිපුර ගෙවන ලද වටිනාකම රු. 15,565,000 ක් වී තිබුණි. | | | මෙතෙක් කටයුතු කර නැත. |
| (ක) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2018 මැයි 8 දිනැති අංක.DMS/1590/Vol II දරන ලිපිය මගින් සීමාසහිත ස්වාධීන රූපවාහිනි මාධ්‍ය ජාලය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණු අතර එම අනුමැතිය ප්‍රකාරව යෝජිත බඳවා ගැනිමේ පටිපාටි පිළියෙල කර තිබුණ ද එය අනුමත කර ගැනීම සඳහා 2020 දෙසැම්බර් 31 දින වනවිටද කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය | වැටුප් බාණ්ඩ කොටසකට අදාල බඳවා ගැනීමේ පරිපාටි 2021 වර්ෂය තුල දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර අනිකුත් බාණ්ඩ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති නමුත් මේ දක්වා JM 1-1 බදවාගැනීමේ පරිපාටි අනුමත කර නොමැත. | තනතුරු කොටසකට අදාල බඳවා ගැනීමේ පරිපාටි මේ දක්වා අනුමත කරවා ගෙන නොතිබුණි. |
| (ග) | අනුමත කාර්යමණ්ඩලයට අයත් නොවන ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා පුද්ගලයකු බඳවාගෙන 2019 වර්ෂය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.550,000 ක් ගෙවා තිබුණි. තවද, අනුමත බඳවා ගැනීමේ ක්‍රමවේදයක් නොමැතිව තනතුරු 7ක් සඳහා බඳවා ගැනීම් සිදු කර තිබූ අතර තනතුරු දෙකක් සඳහා උසස්වීම් ලබාදී තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියකට අනුවබඳවා ගැනීම් කළ යුතුය. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව මාසික දීමනාව රු.75,000 ක්, අංක 327/09 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව රු.25,000/-ක සංග්‍රහ දීමනාවක් සහ රු.10,000/-ක දූරකථන දීමනාවක් මාසිකව ගෙවා ඇත. | මෙම තත්වය නිවැරදි කිරීමට මෙතෙක් කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ච) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව ප්‍රවාහන හා ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති නිලධාරින් 337 දෙනෙකුට ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා වශයෙන් රු.21,639,349 ක් 2020 වර්ෂය තුළ දී ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. | සේවක අභිප්‍රේරණය වර්ධනය කිරීම සඳහා ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් සිදු කරනු ලැබේ. | මෙම තත්වය නිවැරදි කිරීමට මෙතෙක් කටයුතු කර නැත. |
| (ජ) | 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මාධ්‍ය ජාලය විසින් අලෙවිකරණ ලද ගුවන් කාලය සඳහා අයවිය යුතු රු.9,869,852 ක් වෙනුවෙන් සේවාදායක ණයගැතියන්ට එරෙහිව නඩු 07 ක් පවරා තිබුණු අතර එයින් රු. 6,652,442 ක් වටිනා නඩු 04 ක් සඳහා සිතාසි භාර දීමට නොහැකිවීමෙන් නඩු කටයුතු නවතා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු වර්ෂය අවසන් දිනට වසර 02 ක් ඉක්මවා ඇති ණයගැති ශේෂය රු.266,926,032 ක් වුව ද ඉන් සියයට 4 ක වටිනාකමක් අයකර ගැනීම සඳහා පමණක් නඩු පවරා තිබුණි. | සේවාදායක ණයගැති අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | විකාශනයේ ගැටලු නිසා මෙම ලැබිය යුතු මුදල ඉතිරි විය. දළ වශයෙන් ණයවලින් සියයට 98 ක් අයකර ගැනීමට කටයුතු කරන අතර ඉතිරිය නීතිමය ක්‍රියාමාර්ග මගින් අයකර ගැනීමට නීති අංශය වෙත යොමු කරන ලදී. | මෙම තත්වය නිවැරදි කිරීමට මෙතෙක් ක්‍රියා කර නැත. |
| (ට) | මාධ්‍ය ජාලය විසින් 2015 වර්ෂයේ මිලදීගත් රු. 1,588,500 ක් වූ Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් මිලදී ගත් දින සිට සහ 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද පිරිවැය රු.1,218,274 ක් වූ ArosFlexus FT- 30, 30KVA UPS පද්ධතිය වසර 03 ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | වත්කම් නිසි අන්දමින් උපයෝජනය කල යුතුය. | ප්‍රධාන ගොඩනැගිල්ලේ කොටසක් අවශ්‍ය පරිදි සකස් කර ඉදිකිරීම් වැඩ නිම කිරීමෙන් පසු Hot Swappable Power Distribution Rack ස්ථාපනය කරන ලදී. අවශ්‍ය උපකරණ ලැබුණු වහාම විදුලිය | මේ දක්වා නිෂ්ක්‍රීයව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සම්බන්ධ කළ හැකිය. | |
| (ඩ) | මාධ්‍ය ජාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් තනතුරු සඳහා ස්ථිර වශයෙන් නිලධාරින් පත්කර ගැනිමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් 34 ක් බඳවා ගැනීමටත් අනුමත නොවන තනතුරු 4 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමටත් කටයුතු කර තිබුණි. | ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා ස්ථිර නිලධාරින් බඳවා ගැනීම් කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විස්තර විගණන විමසුම් අංක එම්ඊඩී/බී/අයිටීඑන්/ 2020/බී/වී.වී.04 හි අංක 7 (අ) හා (ආ) යටතේ දක්වා ඇත. | 2021 දෙසැම්බර් 31 දිනට ස්ථිර කාර්යමණ්ඩලයේ තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මතබඳවාගත් නිලධාරීන් සංඛ්‍යාව 84 ක් වේ. |

## 4.22 ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | - | 15,000 | 19,079,497 | 45,000 | (15,000) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | - | 352,430 | 18,702,067 | 20,000 | (352,430) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | - | 9,600 | 18,692,467 | 20,000 | (9,600) | තත්ත්වාගණනය නොකළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | - | 0.02 | 19.08 | 0.05 | (0.02) |
| 2019 | - | 0.35 | 18.70 | 0.02 | (0.35) |
| 2020 | - | 0.01 | 18.69 | 0.02 | (0.01) |


| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| දේපල සංවර්ධන ව්‍යාපාරයේ නියැලීම සඳහා මුලින්ම 1985 දී සමාගම ආරම්භ කර තිබුණු අතර 2007 දී, මෝටර් කාර්, ලොරි, බස්, වෑන්, කුලී රථ, කැබ් රථ, ඔම්නි බස් හෝ වෙනත් ඕනෑම මෝටර් | එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම මෙහෙයවීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. | 2013 වර්ෂයේදී ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමෙන් සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම | පුනරාවර්තන ගැටළුවකි. මෙතෙක් විසඳී නොමැත. |

වාහන මිලදී ගැනීම් විකිණීම / බදු ගැනීම හෝ කුලියට ගැනීම ලෙස එහි අරමුණු පසුව විවිධාංගීකරණය කර වෙනස් කර තිබුණි. කෙසේ වෙතත් සමාගම මේ දක්වා එම කිසිදු ව්‍යාපාරික කටයුත්තක නිරත වී නොතිබුණි.

වෙත පැවරූ හෝකන්දර ඉඩමේ අයිතිය සහ 2016 වර්ෂයේදී ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය සඳහා ණය ලබා ගැනීමට කොමර්ෂල් බැංකුවට උකස් කිරීම සහ කාරක ප්‍රාග්ධනය.

## 4.23 සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම (ANCL)

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 3,085,621,000 | 3,251,848,000 | 2,406,141,000 | 1,810,124,000 | (166,227,000) | තත්ත්වාගණනය කල |
| **2019** | 3,092,361,000 | 3,308,465,000 | 2,109,369,000 | 1,717,092,000 | (216,105,000) | තත්ත්වාගණනය කල |
| **2020** | 2,072,985,000 | 2,290,825,000 | 2,030,669,000 | 1,824,916,000 | (217,840,000) | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.4.1 වගන්තියට අනුව, විගණන සහ කළමනාකරණ කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල | විගණන හා කළමනාකරණ කමිටුව චක්‍රලේඛයේ විධිවිධානවලට | 2021 වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කර ඇත. | එය මෙතෙක් විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, භාණ්ඩාගාර නියෝජිතයෙකු හෝ මූල්‍ය කළමනාකරණ කුසලතා ඇති පුද්ගලයෙකු විසින් මුලසුන දරනු ලැබේ. කෙසේ වෙතත්, කිසිදු භාණ්ඩාගාර නියෝජිතයෙකු සහභාගී වී නොතිබූ අතර විධායක අධ්‍යක්ෂවරයෙකු රැස්වීම්වල මුලසුන දරා තිබුණි. | අනුකූලව පැවැත්විය යුතුය. | | |
| (ආ) | 2015 ජුනි 17 දිනැති අංක PED 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, සමාගම රජය සතු ව්‍යාපාරයක් ලෙස වර්ගීකරණය කර ඇත. කෙසේ වෙතත්, සමාගම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද උපදෙස් පිළිපැද නොතිබුණි. | චක්‍රලේඛයේ ඇති විධිවිධානවලට අනුකූල විය යුතුය. | සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම වෙත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ වල අදාළත්වය සම්බන්ධයෙන් ස්ථාවරය තවමත් පැහැදිලි කර ගත යුතු කරුණකි. මීට පෙර බොහෝ ඉල්ලීම් තිබියදීත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මේ පිළිබඳව තීන්දුවක් ලබා දී නැත. | එය මෙතෙක් විසඳී නොතිබුණි. |
| (ඇ) | සමාගම විසින් 2014 වර්ෂයේදී "බුදුසරණ" සඟරාවේ පිටපත් 192,665 ක් දිවිනැගුම දෙපාර්තමේන්තුවට නිකුත් කර ඇති අතර, මෙම පිටපත්වල වටිනාකම රු.2,209,560 කි. කෙසේ වෙතත්, කිසිදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් නොගෙන, 2015 සිට මේ දක්වා සමාගම | හිඟ ශේෂයන් ප්‍රමාදයකින් තොරව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කළමනාකාරිත්වය විසින් කිසිදු පිළිතුරක් ලබා දී නොතිබුණි. | දිවිනැගුම දෙපාර්තමේන්තුව දැනටමත් විසුරුවා හැර ඇති අතර මෙම ගැටළුව විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් අවිනිශ්චිත වෙළඳ ණය සඳහා පූර්ණ ප්‍රතිපාදන ලබා දී තිබුණි. | | | |
| (ඈ) | විශ්‍රාම යෑම, සේවය අවසන් කිරීම හෝ මරණය හේතුවෙන් සමාගමෙන් දැනට ඉවත්ව ඇති සේවකයන්ගෙන් ලැබිය යුතු රු.6,881,484 ක මුදලක් කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් ලෙස වසර 01 සිට 20 දක්වා හිඟව පැවතුනි. | ණය නිකුත් කරන අවස්ථාවේ දී ඔවුන්ගේ වයස සමඟ ආපසු අයකර ගැනීමේ හැකියාව, ආපසු ගෙවීම සහ ධාරිතාව ද ඇගයීමට ලක් කළ යුතුය. | අයකර ගැනීමට ඇති ශේෂයන් පියවන ලෙස ඉල්ලා සිහිකැඳවීම්, ඉවත්වූ සේවකයන්ට යවා ඇත.<br><br>නොපිය වූ ආපදා ණය ශේෂ අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | සම්පූර්ණ මුදල තවමත් අයකරගෙන නොතිබුණි. |
| (ඉ) | සමාගමේ ප්‍රකාශන සඳහා දායක වීමට සමාගම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ සාමාන්‍ය ජනතාවට අවසර දී තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට දායකත්ව ගිණුමේ රු.14,899,522 ක් වූ හිඟ ශේෂයක් පැවතුණි. එයින් රු.2,171,715 ක මුදලක් 2011 වර්ෂයේ සිට 2020 දක්වා හිඟව පැවතුනු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දායකත්ව මත පුවත්පත් ලබා දෙන විට, අයකර ගැනීම් ද නිරීක්ෂණය කළ යුතුය. | විශ්ලේෂණය යටතේ, ප්‍රධාන හිඟ අවස්ථා මාස 06 ක ණය කාල සීමාවන්ට සීමා කර ඇති අතර ණය අවදානම අවම කිරීම සඳහා මාසිකව බිල්පත් යවනු ලැබේ. | පුනරාවර්තන ගැටළුවකි. එය මෙතෙක් විසඳී නොමැත. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තියට අනුව, සමාගම එහි බඳවාගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ | සමාගමට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලින් බැහැර වීමට අවශ්‍ය | කළමනාකාරිත්වය විසින් කිසිදු පිළිතුරක් ලබා දී නොතිබුණි. | මෙම ගැටළුව මෙතෙක් විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණි. | නම්, මහ පෙන්වීමක් ලබා ගත යුතුය. | | |
| (උ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 9.4 වගන්තියට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ආයතන සඳහා මාධ්‍යවේදීන් නව දෙනෙකු, කර්තෘවරුන් හතර දෙනෙකු, සහකාර කළමනාකරුවෙකු, ඡායාරූප ශිල්පීයෙකු, ජ්‍යොෂ්ඨ විධායක නිලදාරියෙකු සහ මුදල් අයකැමියෙකු ඇතුළු නිලධාරීන් දහහත් දෙනෙකු නිදහස් කර ඇති අතර ඔවුන්ගේ වැටුප් සහ දීමනා ලෙස සමාගම රු.5,476,800 ක මුදලක් ගෙවා ඇත. මාධ්‍යවේදීන් 9 දෙනෙකු සහ කර්තෘවරුන් හතර දෙනෙකු නිදහස් කළද, සමාලෝචිත වර්ෂය තුළ මාධ්‍යවේදීන් විසිහය දෙනෙකු සහ කර්තෘවරුන් විසිතුන් දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත අලුතින් බඳවාගෙන තිබුණි. | සමාගමට රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලින් බැහැර වීමට අවශ්‍ය නම්, මහ පෙන්වීමක් ලබා ගත යුතුය. | සේවකයින් නිදහස් කිරීම සම්බන්ධයෙන් 2020/08/26 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අනුව, තීරණය කරන ලද සමාගම් ප්‍රතිපත්තියට අනුව, එවැනි නිදහස් කිරීම් සිදු කළ හැක්කේ ජනාධිපති කාර්යාලයට, අගමැති කාර්යාලයට සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයට පමණි. | මෙම ගැටළුව මෙතෙක් විසඳී නොමැත. |
| (ඌ) | 2020 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.26,800,895 ක් වූ චෙක්පත් 263 ක් අගරු වී තිබුණි. එයින් රු.2,155,046 ක් වටිනා චෙක්පත් 60 ක් සහ රු.216,802 ක් වටිනා චෙක්පත් 10 ක් පිළිවෙළින් වසර 5 කට වැඩි කාලයක් සහ වසර 3 කට වැඩි කාලයක් හිඟව පැවතුනි. | පවතින පද්ධතිය හොඳින් නිරීක්ෂණය කළ යුතුය. | ගෙන ඇති ක්‍රියාමාර්ග සඳහා දැනටමත් විගණනය වෙත සපයා ඇති අගරු චෙක්පත් පිරික්සුම් ලැයිස්තුව බලන්න | පුනරාවර්තන ගැටළුවකි. එය මෙතෙක් විසඳී නොමැත. |
| (එ) | 2008 දෙසැම්බර් මාසයේ දී ලංකා පුවත් ලිමිටඩ් - ශ්‍රී ලංකා ජාතික පුවත් ඒජන්සියේ කොටස් 1200ක් මිලදී ගැනීම | ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා | LKPB 202.17 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත | පුනරාවර්තන ගැටළුවකි. එය |


| | | | | |
|---|---|---|---|---|
| | සඳහා අතුරු ගෙවීමක් ලෙස සමාගම රු.1,200,000 ක මුදලක් ගෙවා තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. සීමාසහිත ලංකා පුවත් සමාගමට අදාළ සේවකයින් තිදෙනෙකු සඳහා 2017 වසරේ දී වැටුප් සහ වේතන වශයෙන් ගෙවා ඇති රු.2,194,637 ක මුදලක් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | ආයෝජනය කළ යුතුය. | පදනම්ව සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම, ලංකා පුවත් පුද්ගලික සමාගමේ කොටස් 1200 ක ආයෝජනය කර ඇත. | මෙතෙක් විසඳී නොමැත. |
| (ඒ) | වසර දෙකකට ආසන්න කාලයක් ඔවුන් සමඟ කරන ලද ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ ආධාරක ලියකියවිලි අස්ථානගත වීම හේතුවෙන් දින 720කට වැඩි කාලයක් නොගෙවූ එකතුව රු.7,673,033 ක ශේෂයක් සහිත ණය ගැතියන් අට දෙනෙකුට එරෙහිව සමාගමට ක්‍රියාමාර්ග ගත නොහැකි විය. | ලේඛන භාර ගැනීම සම්බන්ධයෙන් වගකීම් ස්ථාපිත කළ යුතුය. | මෙය නිවැරදි කිරීමට සහ අනාගතයේදී එවැනි ගැටළු වළක්වා ගැනීමට ණය පාලන ක්‍රියාවලිය දැඩි කිරීමට පියවර ගෙන ඇත. | පුනරාවර්තන ගැටළුවකි. එය මෙතෙක් විසඳී නොමැත. |
| (ඔ) | සමාගම වෙනුවෙන් පෙනී සිටි සමාගමේ නීතිඥවරයා අදාළ අධිකරණ ශාලාවට පැමිණ නොසිටි නිසා පැමිණිල්ලට පක්ෂව තීන්දුව ලබාදීමට අධිකරණය තීරණය කර ඇත. පැමිණිලිකරු සමාගමෙන් රු.මිලියන 500ක් ඉල්ලා තිබුණි. සමාගම 2019 වසරේදී නැවතත් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇත. සමාගම නීති ගාස්තු ලෙස රු.18,230,000ක් ගෙවා ඇති අතර මෙම නඩුව සඳහා වැරදි අධිකරණ ශාලාවක සිටි නීතිඥවරයා 2020 අප්‍රේල් 08 දින විශ්‍රාම ගොස් 2020 මැයි 15 දින කොන්ත්‍රාත් පදනම මත නැවත පත් කර ඇත. එම නිලධාරියාට එරෙහිව මෙතෙක් | සමාගමට එරෙහිව ඇති අපහාස නඩු අවම කිරීමට සමාගම පියවර ගත යුතුය. | කළමනාකාරිත්වය විසින් කිසිදු පිළිතුරක් ලබා දී නොතිබුණි. | පුනරාවර්තන ගැටළුවකි. එය මෙතෙක් විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | |
| (ඕ) | නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මිලදී ගත් හෝකන්දර ප්‍රදේශයේ අක්කර 8 ක ඉඩමක් 1985 වසරේ සිට උපයෝජනයට නොගෙන පැවතුනි. | ප්‍රතිලාභයක් උත්පාදනය කිරීමට සමාගම මෙම වත්කම භාවිතා කළ යුතුය. | 2013 වර්ෂයේදී ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගමෙන් සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම වෙත පැවරූ හෝකන්දර ඉඩමේ අයිතිය සහ 2016 වර්ෂයේ VRS සඳහා ණය ලබා ගැනීම සහ කාරක ප්‍රාග්ධනය සඳහා කොමර්ෂල් බැංකුවට උකස් කර ඇත. | පුනරාවර්තන ගැටළුවකි**.** එය මෙතෙක් විසඳී නොමැත**.** |
| (ක) | 2017 ජූනි 06 දින සකස් කරන ලද සේවක සංඛ්‍යාව සඳහා 2021 මාර්තු 26 දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. එම සේවක සංඛ්‍යාවට අනුව සාමාන්‍ය සහ කර්තෘ දෙපාර්තමේන්තු සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යාව පිළිවෙලින් 658 සහ 327 විය. කෙසේ වෙතත්, සාමාන්‍ය සහ කතෘ දෙපාර්තමේන්තුවල සත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 964 සහ 483 ක් වූ අතර අතිරික්ත කාර්ය මණ්ඩලය 462 ක් විය. ඔවුන්ගෙන් 434 ක් 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇත. සමාලෝචිත වර්ෂය සහ පෙර | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ගත යුතුයි. | කළමනාකාරිත්වය විසින් කිසිදු පිළිතුරක් ලබා දී නොතිබුණි. | පුනරාවර්තන ගැටළුවකි**.** එය මෙතෙක් විසඳී නොමැත**.** |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය තුළ කාර්ය මණ්ඩල පිරිවැය ආදායමෙන් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 62 ක් සහ සියයට 53 ක් විය. | | | |
| (ග) | දක්ෂතා අත්පත් කර ගැනීම, උසස් කිරීම, නිවාඩු ප්‍රතිපත්තිය, කාර්ය සාධන කළමනාකරණය ආදී ප්‍රතිපත්ති හතක් 2017 වසරේදී උපදේශකයෙකුට රු.2,250,000ක් ගෙවා සකස් කර සමාගම විසින් භාවිතා කර තිබුණද, 2020 දෙසැම්බර් 31 දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණේ කාර්ය සාධන කළමනාකරණ ප්‍රතිපත්තිය සඳහා පමණි. | සියලුම ප්‍රතිපත්ති සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. | කළමනාකාරිත්වය විසින් කිසිදු පිළිතුරක් ලබා දී නොතිබුණි. | පුනරාවර්තන ගැටළුවකි. එය මෙතෙක් විසඳී නොමැත. |

## 4.24 ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (පුද්ගලික) සමාගම (Sri Lanka CERT )

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 73,028,310 | 60,514,040 | 72,910,689 | 25,525,245 | 12,514,270 | තත්ත්වාගණනය කළ |
| **2019** | 87,075,386 | 71,169,633 | 105,402,768 | 22,160,247 | 15,905,753 | තත්ත්වාගණනය කළ |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත. | | | | | |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 මාර්ගෝපදේශය ප්‍රකාරව අනුමත කාර්ය මණ්ඩලයක් සහිත ලියාපදිංචි | සමාගම යහපාලන මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති ලත් සංවිධාන සටහනක් පවත්වා ගෙන යනු ලබයි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංවිධාන සටහනක් සමාගම සතුව නොපවතියි. | | | |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම තනතුරක් සඳහාම බඳවාගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපරිපාටියක් සමාගම සතුව නොතිබුණි. | සමාගම යහපාලන මාර්ගෝපදේශයන්හි අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ආයතනය සඳහා වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපටිපාටියක් සකස් කර ඇති නමුත් අනුමැතිය ලැබී නොමැත. | චක්‍රලේඛයට අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඇ) | 2020 වර්ෂය සඳහා Acnetix Web Valnerabyly ස්කෑනිං මෘදුකාංග අලුත් කිරීමේ ගාස්තුවක් ලෙස රු.1,382,800ක් ගෙවා තිබුණද දෙපාර්ශවය අතර ගිවිසුමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල ගිවිසුම විගණනයට ඉදිරිපත් කල යුතුය. | ඉදිරි වසර සඳහා මෘදුකාංග අලුත් කිරීමේදී ගිවිසුමක් මගින් අලුත් කිරීමට කටයුතු යොදන ලදී. | ගිවිසුම් ගත වී නොමැත. |

## 4.25 ලංකා රජයේ තොරතුරු යටිතල පහසුකම් (පුද්ගලික) සමාගම (LGII)

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 33,112,670 | 35,245,997 | 52,742,788 | 2,603,929 | (2,133,327) | වියාචනය |
| **2019** | 34,680,250 | 41,997,214 | 50,395,871 | 5,574,071 | (7,316,964) | වියාචනය |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ සියලුම ස්ථාවර වත්කම් 2017 වර්ෂයේදී රු.11,601,568 කට ප්‍රත්‍යාගණනය කර ඇති අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.2,307,807 ක් වූ ප්‍රත්‍යාගණන වත්කම් සහ ඊට අදාළ සමුච්චිත ක්ෂය රු.461,561 ක් නිසි | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර තිබුණද තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. |


| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතියකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර ඇත. තවද, සමාලෝචිත වර්ෂය තුළ අදාළ වත්කම්වල රු. 1,846,245 ක් වූ ශුද්ධ පොත් වටිනාකම ලාභ හා අලාභ ගිණුමට හර කර ඇත. | | | |
| (ආ) | 2017 වර්ෂයේ දී අලෙවි කරන ලද රු.2,033,673 ක් වටිනා වත්කම් සහ එහි සමුච්චිත ක්ෂයවීම් රු.406,735 ක් 2017 වර්ෂයේ දී ගැලපීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර ඇත. තවද, සමාලෝචිත වර්ෂය තුළ රු.1,269,838 ක මුදලක් අය කිරීම වෙනුවට වත්කම් අපහරණය කිරීමේ පාඩුව ලෙස ලාභ හා අලාභ ගිණුමට රු.1,626,938 ක මුදලක් වැරදි ලෙස අය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය රු.357,100 කින් අඩු වී ඇත. තවද, අපහරණය කරන ලද වත්කම්වලින් ලද රු.357,100 ක් වූ ආදායම 2017 වර්ෂයේ විවිධ ආදායම් ලෙස දෝෂ සහිතව හඳුනාගෙන තිබුණි. | ගනුදෙනු දෝෂ රහිතව ගිණුම්ගත කළ යුතුය. | සමාගම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් සිදුකිරීමට පියවර ගෙන තිබුණි. | තක්සේරුව සැලසුම් කිරීම. |
| (ඇ) | 2018 වර්ෂයේ රු. 901,673 ක් වූ වත්කම් වටිනාකම් සහ ඊට අදාළ රු. 180,335 ක් වූ ක්ෂය වටිනාකම 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවලින් අනුමැතියකින් තොරව ඉවත් කර තිබුණි. | අදාළ අනුමැතීන් ලබා ගත යුතුය. | සමාගම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුවක් සිදුකිරීමට පියවර ගෙන තිබුණි. | තක්සේරුව සැලසුම් කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තිය ප්‍රකාරව 2011 ජූලි 18 වැනි දින සමාගම පිහිටුවීමෙන් පසු සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. | සමාගම් පනතේ විධිවිධාන අනුව වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. | සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | | | |
| (i) 3 සහ 4 වගන්තිය | | | |
| අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ii) 5.1 වගන්තිය | | | |
| සමාගම සංයුකිත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතුය. | ICTA යටතේ LGII හි විෂය පථය පාලනය කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී තිබුණි. | සංයුක්ත සැලැස්ම සකස් කර නොතිබුණි. |
| (iii) 9.2 වගන්තිය | | | |
| මානව සම්පත් සැලැස්ම, මානව සම්පත් අයවැය සමඟ ඒකාබද්ධ කර සකස් කළ යුතු අතර අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. එසේ වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. | මානව සම්පත් සැලැස්මක් මේ වන විටත් සකස් කර නොතිබුණි. |
| (iv) 9.3 (1) වගන්තිය | | | |
| සමාගම එක් එක් තනතුර සඳහා බඳවා ගැනීමේ සහ | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. | පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණි. | | | |
| (ඊ) | ඊ - ශ්‍රී ලංකා ව්‍යාපෘතියේ අරමුදල් සපයන්නා ලෙස ලෝක බැංකුව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ ස්වාධීනත්වයේ අවශ්‍යතාව පෙන්වා දී ඇති බැවින්, 2003 ජුලි 16 දිනැති කැබිනට් තීරණයට අනුව මූල්‍ය හා පරිපාලන අංශ සඳහා පරම ස්වාධීනත්වය ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය නියෝජිතායතනය වෙත ලැබී තිබුණි. කෙසේ වෙතත්, එහි අනුබද්ධිත ආයතනයක් ලෙස, සමාගම සම්පූර්ණයෙන්ම දැනට ඒකාබද්ධ අරමුදල් මත රඳා පවතියි. එසේ වුවද, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පෙර පැවති මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් නොවෙනස්ව පවතින බව නිරීක්ෂණය විය. | රජයේ ඒකාබද්ධ අරමුදලින් අරමුදල් සපයන ආයතනයක් නම්, ඒ වෙනුවෙන් මූල්‍ය පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් අදාළ වන්නේද යන්න සලකා බැලිය යුතුය. | පියවර ගෙනෙ නොතිබුණි. | මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය නොවෙනස්ව පැවතිණි. |

## 4.26 ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (පුද්ගලික) සමාගම (ICTA)

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 3,006,711,680 | 2,676,933,580 | 314,204,847 | 1,839,832,852 | 329,778,080 | වියාචනය |
| **2019** | 1,631,910,961 | 1,997,425,571 | 321,168,542 | 2,209,002,549 | (365,514,611) | තීරණය කර නොමැත |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර තිබුණද ස්ථාවර වත්කම් ලේඛණයක් හා ප්‍රත්‍යාගණනය කිරීමේ පදනම නොමැතිවීම නිසා | ප්‍රත්‍යාගණන අගයන් ඇතුළත් කර ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගත යුතුය. එසේම වත්කම් | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කර තිබූ නමුත් ඇතුළත් කර ඇති තොරතුරු වල |


| | | | | |
|---|---|---|---|---|
| | 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් දේපළ, පිරියත හා උපකරණ අගයෙහි නිවැරදිතාවය විගණනයට නිශ්චය කර ගැනීමට නොහැකි විය. | ප්‍රත්‍යාගණනය කරන ලද පදනමද විගණනයට ඉදිරිපත් කළ යුතුය. | | නිවැරදිතාවය තහවුරු නොවීය |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ඉක්මවූ මුළු වගකීම්වල වටිනාකම රු.1,525,628,004 ක් වූ අතර සමාගමේ ජංගම වත්කම් ඉක්මවූ ජංගම වගකීම්වල වටිනාකම රු.1,527,245,089 ක් විය. ඒ අනුව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පවතින බව නිරීක්ෂණය වුවද සමාගමේ කළමනාකරණය විසින් එවැනි තත්ත්වයන් මගහරවා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් මෙවැනි තත්ත්වයන්ගෙන් මිදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර අදාල තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත් කටයුතු කළ යුතුය. | මෙය නිවරැදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. | 2019 වසරේ ද මෙම තත්ත්වය එලෙසම පැවතුණි. |
| (ඇ) | සමාගමේ වැටුප් පිළියෙල කිරීම, ආහාර සැපයීම හා ආරක්ෂක සේවා සැපයීමට අදාලව දෙපාර්ශවය අතර ඇතිකර ගත් ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොමැත. | අදාල ගිවිසුම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ගිවිසුම් ගත වී නොමැත. |
| (ඈ) | 2007 අංක 7 දරන සමාගම් පනතේ 133 (1) වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික මහාසභා රැස්වීම් පවත්වා නොතිබුණි. | සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්විය යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනතේ 6 (2) වගන්තිය ප්‍රකාරව 2010 – 2012 වර්ෂ සඳහාවූ ප්‍රථම ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්තිය පිළියෙළ කර නොතිබුණු | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ජාතික ඩිජිටල් ප්‍රතිපත්තිය සකස් කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අතර එම ප්‍රතිපත්තිය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. | | | |
| (ඊ) | ඉ - ශ්‍රී ලංකා ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුදල් සපයන්නා වශයෙන් ලෝක බැංකුවෙහි අවශ්‍යතාවය මත මූල්‍ය හා පරිපාලන අංශයන් සඳහා සම්පූර්ණ ස්වාධීනත්වය අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මෙම ආයතනයටහිමි වී තිබුණි. වර්තමානයේදී සම්පූර්ණයෙන්ම සමාගම ඒකාබද්ධ අරමුදල් මත යැපෙන නමුත් මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් අඛණ්ඩව පවතින බව නිරීක්ෂණය විය. | රජයේ ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ලබා ගන්නා ආයතනයක් වූ විට මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය තවදුරටත් අවශ්‍යවේද යන්න සලකා බැලිය යුතුය | අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගැනීමට කටයුතු කිරීම. | මූල්‍ය හා පරිපාලන ස්වාධීනත්වය නොවෙනස්ව පැවතුනි. |
| (උ) | බිල් ඇන්ඩ් මෙලින්ඩා ගේට් පදනම (Bill and Melinda Gate Foundation) යටතේ ව්‍යාපෘති 3 ක් ක්‍රියාත්මක කිරීමට ලැබුණු රු.32,085,570 ක් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකිරීම නිසා 2018 වර්ෂයේ අවසන් කළ යුතු ව්‍යාපෘති 3 ක් නිම කිරීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘති සඳහා ලැබුණු මුදල් ව්‍යාපෘති සඳහා පමණක් යෙදවිය යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඌ) | 2003 ජූනි 2 දිනැති යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 9.2 ඡේදයට අනුව, මානව සම්පත් අයවැය සහ ඒකාබද්ධ මානව සම්පත් සැලසුම් සකස් කර රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පියවර ගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | 2003 ජුනි 2 දිනැති යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 9.3.1ඡේදය ප්‍රකාරව තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සමාගම විසින් පිළියෙළ කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස්කළ යුතුය. | කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඒ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයෙහි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 21 ක ප්‍රමාදයක් සහිතවය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. | නියමිත පරිදි ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් පවතී. |

## 4.27 ලක්දිව ඉංජිනේරු (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 133,673,206 | 31,933,865 | 71,754,545 | 15,587,411 | 23,778,392 | වියාචනය |
| **2019** | 193,783,770 | 40,248,431 | 116,624,664 | 27,448,674 | 23,956,337 | වියාචනය |
| **2020** | 131,721,818 | 33,884,474 | 95,161,076 | 30,961,369 | (26,326,283) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට රු.27,075,878 ක් වත්කම් ශේෂය තුළ වූ රු.8,290,423 ක ස්ථාවර වත්කම් සඳහා මිලදීගත් වර්ෂය සඳහන්ව නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදිව ක්ෂය කිරීම් සිදු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගෙන නිවැරදි කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එකී වත්කම් සඳහා සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය කිරීම්ද සිදු කර නොතිබුණි. මේ නිසා වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | | | |
| (ආ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 60 වගන්තිය ප්‍රකාරව සමාගමක් ආදායම් බදු ගෙවීම සඳහා නීතියෙන් බැඳී සිටින අතර, සමාගම විගණිත දිනය වන 2020 දෙසැම්බර් 31 දින දක්වා අදාළ අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කර නොතිබුණි. | දේශිය ආදායම් පනතට අනුව බදු වගකීම සිදු කළ යුතුය. | අදාළ නීති රීති ඉදිරියේදී අනුගමනය කරනු ඇත. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාරය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද දිරිදීමනා යෝජනා ක්‍රමයක් පවත්වා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී දිරි දීමනා වශයෙන් රු.1,839,840 ක මුදලක් ගෙවා තිබුණි. එසේම මෙම වටිනාකම තුළ ඇතුළත් රු.795,600 ක දිරි දීමනාවක් කර්මාන්තශාලා කාර්ය මණ්ඩලය වෙත ගෙවා තිබුණු අතර එහිදී අපේක්ෂිත කාල ඉලක්කය සපුරා නොතිබියදී මෙම ගෙවීම් සිදු කර තිබුණි. | දිරි දීමනා ගෙවීම භාණ්ඩාගාර අනුමැතිය ඇතිව නිවැරදි ඇගයීම් ක්‍රමයක් යටතේ සිදු කළ යුතු වේ. | අදාළ නීති රීති ඉදිරියේදී අනුගමනය කරනු ඇත. | අදාළ නීති රීති අනුගමනය කර නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | ප්‍රසම්පාදන අංශයේ පවත්වාගෙන යනු ලබන ප්‍රධාන බින්කාඩ් පත් යාවත්කාලීන නොකිරීම සහ නිතරම භාවිතයට ගැනෙන ද්‍රව්‍යයන් වෙනුවෙන් තොග මට්ටම් පවත්වාගෙන යාම නොසලකා හැර ආරක්ෂක තොග (Buffer Stock) මට්ටම් නොමැතිවීම තුළ ක්ෂණික මිලදී ගැනීම් රු.38,348,373 ක් පමණ වූ අතර එය මුළු මිලදී ගැනීම් සියයට 80 කින් වැඩිවීමට මෙම ක්ෂණික මිලදී ගැනීම් හේතු වී තිබුණි. තවද බින්කාඩ් පත්‍ර පරීක්ෂාවේදී දැනට භාවිතා නොවන අයිතම 90 ක තොගයක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි තොග පාලන මට්ටම් පවත්වා ගැනීම හා නිසි පරිදි බින්කාඩ් පවත්වා ගත යුතුය. | 2020 වසරේ වසංගතය පැතිරීම හේතුවෙන් ප්‍රමාණවත් තරම් ආරක්ෂිත තොග සහිතව නිෂ්පාදන ක්‍රියාවලිය නිසියාකාරව කරගෙන යාමට නොහැකි විය. කෙසේ වෙතත්, ඉදිරි කාලය තුළ නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අදාළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඉ) | 2021 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව 121ක් වූ අතර ඔවුන්ගෙන් සේවකයන් 96ක් ස්ථිර පදනම මත ද, සේවකයන් 12ක් කොන්ත්‍රාත් පදනම මත ද බඳවාගෙන තිබුණි. ප්‍රධාන කළමනාකාර තනතුර වන සාමාන්‍යාධිකාරී තනතුර සමාගමේ අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර නොතිබුණු අතර, කර්මාන්තශාලා ඉංජිනේරු තනතුරට බඳවා ගැනීම් ද කොන්ත්‍රාත් පදනම මත සිදු කර ඇත. සමාගම සඳහා ෆෝමන් තනතුරු 06ක් අනුමත කර තිබුණද ඉන් 03ක් 2021 පෙබරවාරි මාසය දක්වා පුරප්පාඩු විය. | අදාළ තනතුරුවල පුරප්පාඩු නියමිත පරිදි පිරවීම් කළ යුතුය. | සමාගමේ අනුමත කාර්යය මණ්ඩලයට අදාළ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වූ විගස සමාගමේ මූල්‍ය තත්වයට උචිත ලෙස අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරමි. | අදාළ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අංක.ඩීඑම්එස්/1623 හා 2018 ඔක්තෝම්බර් 03 දිනැති ලිපිය අනුව, සමාගමේ නව සේවක ව්‍යුහය සඳහා අනුමැතිය ලබා දී තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද බඳවා ගැනීම් පරිපාටිය සකස් කර අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර අනුමත කර ගත යුතු වේ. | 2021 වර්ෂයේදී බඳවා ගැනීමේ පරිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (උ) | සමාගම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ජා ඇල ප්‍රදේශයේ පිහිටි අක්කර 23 ක ඉඩමක පවත්වාගෙන ගොස් තිබූ අතර ඉඩම් පරිහරණය සඳහා අදාළ ඉඩමේ හිමිකරු සමඟ ලිඛිත ගිවිසුමක් ඇති කර ගෙන නොතිබුණි. | ඉඩමේ අයිතිකරු සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. | පිළිතුරු දක්වා නොතිබුණි. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඌ) | බස් රථ අලුත්වැඩියා කිරීම සඳහා 2018 වසරේදී සමාගම් 12ක් සමාගම තුළ ලියාපදිංචි කර තිබුණද එම සමාගම්වල පළපුරුද්ද සහ ඒවා අයත් වූ ක්ෂේත්‍ර තීරණය කිරීමට අවශ්‍ය සාමාජිකයන් සංඛ්‍යාව විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය. තවද, 2018 වසරේ බස් රථ අලුත්වැඩියාව සඳහා රු.මිලියන 4.82ක් කිසිදු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය නොකර කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | 4.2 වගන්තියට අනුව නිවැරදි ක්‍රියා පටිපාටි අනුගමනය කරමින් කම්කරු කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම කළමනාකරණය කල යුතුය. | ඉදිරියේදී නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරයි. | නිවැරදි ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | 2020 වර්ෂයේදී සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී රු.1,400,559 ක් වටිනා අයිතම 86 ක් පොත් ශේෂයට වඩා වැඩියෙන් දැක්වුණු අතර, රු.244,631 ක් වටිනා අයිතම 51 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පොත්වල ගැලපීම් සිදු කරමින් ගබඩා පිළිබඳ වාර්ෂික සමීක්ෂණ නිසි ලෙස පැවැත්විය යුතුය. | 2020 වසර අවසන් වන විට වාර්ෂිකව පවත්වනු ලබන භාණ්ඩ සමීක්ෂණයේදී පොත් වෙත ගෙනවිත් නොතිබුණද, නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කිරීම හෝ නියමිත කාලයට අපහරණය කිරීම සැලකිල්ලට ගෙන අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පොත් වෙත ගෙනවිත් තිබුණි. | අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඒ) | 1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 (අ) වගන්තිය පරිදි වාහන සේවා කටයුතු සිදු කරන ආයතන විසින් ඊට අදාළ බලපත්‍රයක් ලබාගත යුතු වුවද, සමාගම 2020 දෙසැම්බර් 31 දින වන විටද එම බලපත්‍ර ලබා ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | පරිසරය හා සම්බන්ධ නීති රීති අනුගමනය කළ යුතුය | ඉදිරියේදී අදාළ නීති සහ රීතිවලට අනුකූලවීමට පියවර ගනු ලැබේ. | පරිසරයට අදාළ නීති රීති අනුගමනය කර නොතිබුණි. |
| (ඔ) | 2000 අංක 33 දරන කර්මාන්තශාලා (සංශෝධිත) පනතේ 39 (1) වගන්තිය ප්‍රකාරව කර්මාන්තශාලාවේ සේවයේ නියුතු පුද්ගලයින් සඳහා ගිනි ගැනීමකදී පිටවීමේ දොරටුව සකස් කර තිබිය යුතුය. කෙසේ වෙතත්, සමාගම එසේ සිදු කර නොතිබුණි. | කර්මාන්තශාලා පනතේ දක්වා ඇති පියවර ගත යුතු වේ. | අදාළ නීති රීති ඉදිරියේදී අනුගමනය කරනු ඇත. | අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තියට පටහැනිව ජාතික වශයෙන් තරඟකාරී ලංසු කැඳවා මිළ ගණන් ඇගයීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුලදී බස් රථ අළුත්වැඩියා කටයුතු සඳහා රු.74,935,429 ක් වටිනා අමතර කොටස් පුද්ගලික සමාගම් වෙතින් මිළදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව මිලදී ගැනීම් සිදු කළ යුතුය. | අදාළ නීති රීති ඉදිරියේදී අනුගමනය කරනු ඇත. | නීති රීති අනුගමනය කර නොතිබුණි. |
| (ක) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 4.2 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැසමක් හා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛවලට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතුය. | අදාළ නීති රීති ඉදිරියේදී අනුගමනය කරනු ඇත. | නීති රීති අනුගමනය කර නොතිබුණි. |

## 4.28 ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 51,767,838 | 553,809,695 | 1,017,828,751 | 50,000 | (502,041,856) | තත්ත්වාගණනය කළ |
| **2019** | 122,144,176 | 6,174,862 | 1,121,665,369 | 1,294,787 | 115,969,314 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 291,896,507 | 6,478,598 | 1,405,289,860 | 2,501,818 | 285,417,909 | තත්ත්වාගණනය කළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන තුළ රු.626,473 ක් වටිනා ඉඩමක් අන්තර්ගත වූවද, ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය හෝ භුක්තිය සමාගමට නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශවල ඇති ඉඩම්වල අයිතිය, පැවැත්ම හා භුක්තිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඔප්පුවට අනුව, සමාගමට ඉඩම අයත් වන අතර, එම ඉඩම් පොත්පත්වලින් ඉවත් කිරීම සඳහා එම කාලයට ඇතුළත් නොවූ ඉඩම් පිළිබඳ අදාළ ලිඛිත සාක්ෂි සමාගම සතුව නොතිබුණි. | ඉඩම්වල අයිතිය, පැවැත්ම සහ අයිතිය තහවුරු කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාගමේ මානව සම්පත් සම්බන්ධයෙන් ලේඛනගත ප්‍රතිපත්තියක් නොතිබූ අතර 2020/2021 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වූ ගෙවීම් ඇතුළුව පරිපාලන වියදම් ලෙස රුපියල් 6,465,067 ක් වැය කර ඇති අතර අනුමත කාර්ය මණ්ඩලයක් හා කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකමක් නොමැතිව පරිපාලන වියදම් ලෙස රු.මිලියන 6ක් දැරීම ආර්ථික නොවන වියදම් ලෙස නිරීක්ෂණය විය. | ප්‍රමාණවත් මෙහෙයුම් ක්‍රියාකාරකම් නොමැති බැවින් සීමාවකින් යුක්තව පරිපාලන වියදම් දැරිය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | මෙහෙයුම් කටයුතු නොමැතිව පරිපාලන වියදම් දරා තිබුණි. |
| (ඇ) | සමාගම සතුව නිසි ලිඛිත ව්‍යාපාර සැලැස්මක් හෝ සංයුක්ත සැලැස්මක් නොතිබුණි. | සමාගම සඳහා විධිමත් ව්‍යාපාර සැලැස්මක් හා සංයුත්ත සැලැස්මක් සකස්කර ඒ අනුව කටයුතු කළ යුතුය. | වෙනත් මෙහෙයුම් නොමැති බැවින් අපගේ ව්‍යාපාර සැලැස්ම වන්නේ අපගේ ආයෝජන ආදායම වැඩි කිරීමයි. | ව්‍යාපාර සැලැස්මක් හෝ සංයුක්ත සැලැස්මක් නොමැත. |
| (ඈ) | සමාගම සතුව ලිඛිත මානව සම්පත් සැලැස්මක් නොතිබුණි. | ව්‍යාපාර සැලැස්මට අනුව ස්ථිර සේවකයන් බඳවා ගත යුතුයි. | මානව සම්පත් සැලැස්මක් සකස් කර නොමැත. | ලිඛිත මානව සම්පත් සැලැස්මක් නොමැත. |

## 4.29 ඇකඩමි ඔෆ් ෆයිනෑන්ෂල් ස්ටඩීස් (ඇපයෙන්) සීමිත සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 214,100,654 | 78,327,066 | 324,042,712 | 54,465,797 | 61,131,633 | තත්ත්වාගණනය කළ |
| **2019** | 157,886,847 | 82,861,412 | 320,390,536 | 40,648,052 | 30,137,234 | තත්ත්වාගණනය කළ |
| **2020** | 74,143,605 | 59,675,485 | 305,520,982 | 46,722,007 | (90,945) | තත්ත්වාගණනය නොකළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයෙහි, 4.2 වගන්තිය ප්‍රකාරව රු. 12,149,018 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස දක්වනු වෙනුවට ගෙවිය යුතු | මූල්‍ය ප්‍රකාශනවල අදාළ හෙළිදරව් කිරීම් සිදුකළ යුතුව. | ප්‍රමිතිය ප්‍රකාරව ගෙවිය යුතු ආදායම් බදු වෙනම අයිතමයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර ඇත. | ගැටලුව නිවැරදි කිරීමට කාලෝචිත පියවර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවස්ථාපිත වැය යටතේ දක්වා තිබුණි. | | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | අදාළ චක්‍රලේඛ පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුය. | ඉහළ කළමනාකරණයෙහි සිදුවූ වෙනස්වීම් මත අදාළ වර්ෂයන්හි පැවැත්වීමට නියමිතව තිබූ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | ගැටලුව නිවැරදි කිරීමට කාලෝචිත පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට පටහැනිව, වට්ටම් කළ හැකි වර්තමාන අගය මත පදනම්ව නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගණනය කර නොතිබුණි. | ප්‍රමිතයේ විධිවිධාන ප්‍රකාරව, නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව ගණනය කළ යුතුවීම. | නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු සිදු කරන ලදී. | ගැටලුව නිවැරදි කිරීමට කාලෝචිත පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | සාවද්‍ය ගණනය කිරීම් හේතුවෙන් 2019/2020 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු රු.2,241,192 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවන ලද මුදල අය කරගැනීමට කටයුතු කළ යුතුය. | වැඩියෙන් ගෙවන ලද ආදායම් බදු, ආදායම් බදු වාර්තා තුල ආපසු ලැබිය යුතු (Refund Amount) ලෙස දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. | වැඩියෙන් ගෙවන ලද ආදායම් බදු මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ නිරන්තර පසුවිපරම් මෙ සඳහා සිදු කරනු ලැබේ. |

## 4.30 ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත (පුද්ගලික) සමාගම (CPSTL)

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 13,952,435,115 | 12,430,205,006 | 30,321,966,787 | 2,106,107,929 | 1,522,230,109 | වියාචනය |
| **2019** | 16,515,254,612 | 13,587,398,579 | 32,205,354,378 | 2,204,531,398 | 2,927,856,033 | වියාචනය |
| **2020** | 14,450,477,900 | 12,312,241,019 | 32,576,788,664 | 1,709,065,251 | 2,138,236,881 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | LKAS 16 ට අනුව වත්කම්වල ප්‍රයෝජනවත් ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව දළ වශයෙන් රු. මිලියන 7,727.6 ක් වූ අයිතම 15,148 කින් සමන්විත සම්පූර්ණයෙන් ක්ෂය කල වත්කම් සමාගම විසින් අඛණ්ඩව භාවිතා කර තිබුණි. | සමාගම විසින් ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතුය. | කළමනාකරණය මෙම කාර්යය සම්පූර්ණ කර 2022 මූල්‍ය වර්ෂය තුළ ස්ථාවර වත්කම්වල වටිනාකම එහි වෙළඳපල තත්ත්වයන් දක්වා ගෙන ඒමට සැලසුම් කර තිබේ. | මේ දක්වා වත්කම් නැවත තක්සේරු කිරීම සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | එමෙන්ම, සමාගමේ ආරම්භක වර්ෂය වන 2003 සිටම සිය වත්කම් නැවත තක්සේරු කිරීමට අදාලව විධිමත් ප්‍රතිපත්තියක් ස්ථාපිත කර නොතිබුණි. | | | |
| (ආ) | සමාගම විසින් 2017 වර්ෂයේදී මෙහෙයුම් කල්බදු පදනම මත අත්පත් කරගත් මෝටර් රථ වාහන 6කට අදාළව SLFRS 16 හි 47 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල භාවිත කිරීමේ අයිතිය හිමි වත්කම් (the right of use assets) ලෙස හඳුනාගෙන නොතිබූ අතර ඊට අනුරූපී කල්බදු වගකීම ද හඳුනාගෙන නොතිබුණි. | සමාගම විසින් ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කළ යුතුය | M/s Rajagiriya Tours (Pvt.) Ltd වෙතින් කුලියට ගත් මෝටර් රථ 06 මෙහෙයුම් කල්බදු ගිවිසුම යටතේ පවතින අතර කොන්ත්‍රාත් කාලය අවසානයේ මෙම වාහනවල අයිතිය සමාගමට පැවරෙන්නේ නැත. | ප්‍රමිතියට අනුව භාවිත කිරීමේ අයිතිය හිමි වත්කම් (the right of use assets) හඳුනාගෙන නොතිබුණි. . |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) වාර්තා අතර ගෙවිය යුතු මුළු ආදායම් බදු, ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද (VAT), ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු, ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු (PAYE) සහ ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව (ESC) ශේෂයන් සම්බන්ධයෙන් 2018, 2019 සහ 2020 වර්ෂවලදී පිළිවෙලින් රු. මිලියන 199.8, රු. මිලියන 437.53 ක් සහ රු. මිලියන | මූල්‍ය ප්‍රකාශන සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ඇති මෙම වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ලෙජර් ශේෂයන් සමඟ මූල්‍ය ප්‍රකාශන සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ශේෂයන් අතර සැසඳුමක් සකස් කිරීමේ අරමුණ ඇතිව මූල්‍ය ප්‍රකාශන සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් විස්තර ඉල්ලා ඇති අතර එම තොරතුරු මෙතෙක් ලැබී නොමත. | මූල්‍ය ප්‍රකාශන සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ශේෂයන් සහ ලෙජර් ශේෂයන් සමග සිදුකරන ලද සංසන්දනයක් මේ දක්වා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | 409.50 ක නොගැලපෙන වෙනස්කම් නිරීක්ෂණය විය. | | | |
| (ඇ) | 2019 සහ 2020 වසර අවසානයේදී වසර 5 කට වැඩි කාලයක් අයකර ගැනීමට නොහැකි වූ වෙනත් ලැබිය යුතු ශේෂයන් පිළිවෙළින් රු.මිලියන 8.8 ක් සහ රු.මිලියන 7.2 ක් පැවතුණි. කෙසේ වෙතත්, එම ශේෂ අයකර ගැනීමේ හැකියාව පිළිබඳ ප්‍රමාණවත් තහවුරු කිරීමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිගුකාලීන ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙහි ඇතුළත් බොහොමයක් ශේෂ 2010 වර්ෂයේ SAP ERP ක්‍රියාත්මක කිරීමට පෙර සිට ඉදිරියට ගෙන යනු ලැබූ ශේෂ වේ. මෙම ශේෂයන් නැවත අයකර ගැනීමේ හැකියාව ඉතා දුරස්ථ ය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිව දිගු කාලීනව හිගව පවතින මෙම ලැබිය යුතු හිඟ ශේෂය කපා හැරීමට විගණන සහ කළමනාකරණ කමිටුවද නිර්දේශ කර තිබුණි. | වෙනත් ලැබිය යුතු ශේෂ වසර 5 කට වැඩි කාලයක සිට තවදුරත් නිරවුල් නොකර පවතී. |
| (ඉ) | 2020 වර්ෂය අවසානයේ දී වසර 5 කට වැඩි කලයක් පවතින රු. මිලියන 0.18 ක් වූ හර ශේෂයන් 2 ක්ද ඇතුළුව එකතුව රු. මිලියන 2.7 ක් වූ වෙළඳ හා වෙනත් ගෙවියයුතු හර ශේෂ 7 ක් පැවතුණි. තවද, එහි එකතුව රු. මිලියන 2.5 වූ වසර 1 සිට 5 දක්වා නොපියවා පවතින හර ශේෂයන් 5ක්ද ඇතුළත්ව තිබුණි.<br>2019 වර්ෂය අවසානයේ දී, එකතුව රු. මිලියන 38.96 ක් වූ වෙළඳ හා වෙනත් ගෙවියයුතු හර ශේෂ 48 ක් පැවතුණි. එහි | සියලු නිරවුල් නොකල ශේෂයන් නිෂ්කාශනය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | විකුණුම්කරුවන් අදාල වැරදි ඉන්වොයිස් ආපසු හැරවීමේදී සත්‍යාපනය කිරීමකින් තොරව SAP (MIRO) ට ඇතුළත් කිරීම හේතුවෙන් විකුණුම් ගිණුම්වල බොහොමයක් හර ශේෂයන් දැක් වේ. | වර්තමානයේදී ද, වෙළඳ හා වෙනත් ගෙවියයුතු ගිණුම්වල හර ශේෂයන් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | රු. මිලියන 2.98 ක අගයකින් යුතු 2010 වසරේ සිට හෝ ඊට පෙර සිට පැවතෙන වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ගිණුම් 14 ක් ද, අවුරුදු 5 සිට 10 දක්වා වන රු. මිලියන 0.55 ක අගයකින් යුත් ගෙවිය යුතු හර ශේෂ 03 ක් ද, අවුරුදු 01 සිට 05 දක්වා වන රු. මිලියන 35.42 ක අගයකින් යුත් ගෙවිය යුතු හර ශේෂ 03 ක් ද ඇතුළත් වන අතර, එම ශේෂ නොපියවූ බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, සමාගම එකී හර ශේෂ පියවීමකින් තොරව විකුණුම්කරුවන් සමඟ පසුකාලීන ගනුදෙනු සිදු කර තිබුණි. ඒ අනුව එම හර ශේෂවල පැවැත්ම සහ නිරවද්‍යතාවය විගණනයේදී ප්‍රශ්නකාරී වේ. | | | |
| (ඊ) | 2018, 2019 සහ 2020 වර්ෂ අවසන් වන විට, පිළිවෙලින් රු.මිලියන 333.3 ක, රු.මිලියන 86.81 ක සහ රු.මිලියන 72.32 ක නොපියවූ ගෙවිය යුතු වෙළඳ ශේෂ පැවතුණි. කෙසේ වෙතත්, ඒවා සමථයකට පත් කිරීමට CPSTL කළමනාකාරීත්වය නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ අනුව එම ශේෂවල පැවැත්ම සහ නිරවද්‍යතාවය සැක සහිත වුණි. | සියලු නිරවුල් වියයුතු ශේෂයන් නිෂ්කාශනය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | සමාගම විසින් තවදුරටත් ගෙවීමට අවශ්‍ය නොවන ඇතැම් විකුණුම්කරුවන්ට අදාල දිගු කාලීන ගෙවියයුතු හිඟ ශේෂ පවතී. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS 9), හෝ IFRS-9 අනුව, ගෙවිය යුතු ඕනෑම ගිණුමක් කපා හැරීමට පෙර සපුරාලිය යුතු නිර්ණායක ලැයිස්තුවක් සපයනු ලැබේ. මෙම මාර්ගෝපදේශ අනුව, මූල්‍ය වගකීම් | මූල්‍ය ප්‍රකාශනවල දිගුකාලීන හිඟ ශේෂයන් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | සමාගම විසින් හඳුනා නොගත යුත්තේ ගෙවීමට ඇති බැඳීම කල් ඉකුත් වූ විට, අවලංගු වූ විට හෝ ඉවත් වූ විට පමණි. එම නිසා, කාල රාමුව මත පදනම්ව එම ශේෂ ලියා හැර නොමැත. | |
| (උ) | 2018, 2019 සහ 2020 වර්ෂ අවසන් වන විට, සමාගම සහ CPC අතර අන්තර් සමාගම් ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂවල පිළිවෙලින් රු.මිලියන 2475.8 ක, රු.මිලියන 1,623.13 ක සහ රු.මිලියන 993.89 ක නො එකග වූ ශුද්ධ වෙනස්කම් නිරීක්ෂණය කරන ලදී. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2021 ජූලි 22 දිනති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මතභේදයට තුඩු දී ඇති හිඟ ණය පොලී රු.මිලියන 637.04 ක් ආපසු සමගම (CPSTL) වෙත ගෙවීමට තීරණය කර තිබුණි. | සියලු නිරවුල් නොකල ශේෂයන් නිෂ්කාශනය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ පවතින හිඟ ශේෂයන් නිරවුල් කිරීමට 2021 වර්ෂය ඇතුලත කටයුතු කරනු ඇත. | CPC සමඟ අන්තර් සමාගම් ශේෂවල නොගැලපෙන වෙනස්කම් වර්තමානයේදී ද පවතී. |
| (ඌ) | 2018, 2019 සහ 2020 වර්ෂ අවසන් වන විට, සමාගම සහ LIOC අතර අන්තර් සමාගම් ශේෂවල පිළිවෙලින් රු.මිලියන 55.1 ක, රු.මිලියන 5.1 ක සහ රු.මිලියන 40.18 ක නො එකග වූ ශුද්ධ වෙනස්කම් නිරීක්ෂණය විය. | සියලු නිරවුල් නොකල ශේෂයන් නිෂ්කාශනය කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | රුපියල්. 43,458,458 ණය පොලී ආපසු ගෙවීම බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව CPSTL AMC විසින් රු.37,057,076 ක් බදු ඇතුළත් වටිනාකම ලියහැරීමට තීරණය කර | LIOC සමඟ අන්තර් සමාගම් ශේෂවල නොගැලපෙන වෙනස්කම් වර්තමානයේදී ද පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තිබේ. ඒ අනුව, CPSTL විසින් 2020 දෙසැම්බර් 31 දිනට LIOC යෙන් ලැබිය යුතු මුළු ප්‍රමාණයෙන් රු. 43,458,458 ක් ලියාහැර ඇත. LIOC සමග නොවිසඳී ඇති ඉතිරිව ඇති රු. 3,308,922 ශේෂය 2021 වසර තුළ විසඳීමට බලපොරොත්තු වේ. | |
| (එ) | 2003 ජුනි 2 දිනැති අංක PED/12 දරන යහ පාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව රු. මිලියන 10 ඉක්මවන ප්‍රාග්ධන වියදම් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. | සියලුම ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘති සඳහා CPSTL අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගනු ලබන අතර, එහිදී භාණ්ඩාගාරය, අමාත්‍යාංශය, CPC සහ LIOC නියෝජනය කරමින්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් CPSTL හි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නම් කරන ලද අතර අදාළ ආයතනවලින් සමගාමී අනුමැතිය ලබා ගනු ලැබේ. | අවශ්‍ය පූර්ව අනුමැතතීන් ලබාගෙන නොතිබුණි |
| (ඒ) | සමාගම සතුව මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අනුමත සේවක සංඛ්‍යාව සහිත සුදුසු සංවිධාන සටහනක් සකස්කර අනුමතකරගෙන නොතිබුණි. තවද, නව සේවක සංඛ්‍යාව පිහිටුවීමේදී හෝ අතිරික්ත සේවක සංඛ්‍යාවක් ඇති අවස්ථාවන්හිදී, සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. | 2016-2021 සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව පිළිබඳව අපගේ අංක Rf. DGM (HR-07) සහ 2016 ජුලි 22 දිනැති ලිපිය මගින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර, එය ලද බවට PED විසින්ද තහවුරු කර ඇත. නමුත් | අනුමත සේවක සංඛ්‍යාව ඇතුළු සංවිධාන සටහන ලියාපදිංචි කර නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ උපදේශනයන් ලබාගැනීමට පියවර ගෙන නොතිබුණි. ඒ අනුව, 2003 ජූනි 2 දිනැති අංක PED/12 දරන යහ පාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණි. | | එය අනුමත කර ඇති බවට හෝ නොමති බවට තහවුරු කරමින් කිසිදු ලියවිල්ලක් අප වෙත ලබා දී නොමත. නව සේවක සංඛ්‍යාව හඳුන්වා දීමෙන් පසු අප විසින් කිසිදු නව සේවක සංඛ්‍යා තනතුරු නිර්මාණය කර නොමත. | |
| (ඔ) | 2003 ජූනි 2 දිනැති අංක PED/12 දරන යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව සමාගම විසින් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සහ අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, එකගතාවය සහිතව බඳවා ගැනීමේ සහ උසස්කිරීමේ ක්‍රියාපටිපාටියක් (SORAP) සකස් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය. | මූලික අදියර ලෙස විධායක ශ්‍රේණි සඳහා වන SORAP සමාලෝචනය කිරීමට කටයුතු කර ඇති අතර B සහ C ශ්‍රේණි සඳහා ඉදිරියේදී සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ, අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | සමාගම සඳහා බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ ක්‍රමය (SORAP) තවමත් අවශ්‍ය අනුමැතිය සහිතව සකස් කර නොතිබුණි. |
| (ඕ) | 2003 ජූනි 2 දිනැති අංක PED/12 දරන යහ පාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබද රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව කොන්ත්‍රාත් පදනම මත සේවකයින් පත් කිරීම සඳහා සමාගම විසින් භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන මෙම කොන්ත්‍රාත් පදනම මත සිටින සේවකයන් ස්ථිර කාර්යමණ්ඩලයට අන්තර්ග්‍රහණය කලහ. | සමාගම විසින් මේ දක්වා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණි. 2018, 2019 සහ 2020 වර්ෂ අවසානයේදී, පිළිවෙළින් 50 ක, 29 සහ 30 ක සේවකයන් සංඛ්‍යාවක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | | | |
| (ක) | සමාගම විසින් අනුගමනය කරන ලද සුභසාධන යෝජනා ක්‍රමය සඳහා වන මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත්, 2019 සහ 2020 වසර වළදී සමාගම විසින් පිළිවෙලින් රු. මිලියන 239.29 ක් සහ 222.28 ක් කාර්ය මණ්ඩල සුබසාධන වියදම් ලෙස ගෙවා තිබුණි. ඒ අනුව, 2003 ජූනි 2 දිනැති අංක PED/12 දරන යහ පාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර තිබුණි. | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය | සමාගම 2003 වර්ෂයේ අත්සන් කරන ලද CUF ගිවිසුමට අනුව CPC හා සමගාමීව සිය සේවකයින් සඳහා පුළුල් පරාසයක සුභසාධන යෝජනා ක්‍රම සපයයි. මෙම පහසුකම් පසුගිය වසර 18 ක කාලය තුළ CPSTL සේවකයින් විසින් භුක්ති විඳ ඇත. ඉදිරියේදී භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | සමාගම විසින් අනුගමනය කරන ලද සුබසාධන යෝජනා ක්‍රමය සඳහා නිසි අනුමැතියක් ලබාගෙන නොමැත. |
| (ග) | 2006 - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට පටහැනිව, බාහිර ප්‍රවාහනකරුවන් (බවුසර්) තෝරා ගැනීමේදී ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර නොතිබූ අතර අතර, මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි. | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය | ප්‍රවාහන ගාස්තු ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් තීරණය කරනු ලබන අතර, කුලියට ගත් බවුසර් සඳහා ගෙවීම් CPC & LIOC විසින් ප්‍රතිපූරණය කරනු ලැබේ. ගෙවීම් සඳහා කලින් තීරණය කළ ගාස්තු භාවිතා කරන බැවින් කුලී බවුසර් තෝරා ගැනීමට | බාහිර ප්‍රවාහකයන් තෝරාගැනීමේදී ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | විධිමත් ක්‍රමවේදයක් නොමැත. නියමු ව්‍යාපෘතියක් ලෙස තෝරාගත් බෙදාහැරීම් සඳහා තොග ඉන්ධන ප්‍රවාහනය ප්‍රදානය කිරීම සඳහා තරඟකාරී ලංසු කැඳවීම සඳහා ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමට කළමනාකාරීත්වය තීරණය කර ඇත. වසංගත කාලසීමාව තුළ ඉන්ධන සඳහා ඇති ඉල්ලුමේ උච්චාවචනය හේතුවෙන් ඉහත තීරණය ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇත. | |
| (ච) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක 124 සහ 1997 ඔක්තෝබර් 24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ විධිවිධානවලට පටහැනිව, 2018, 2019 සහ 2020 වර්ෂ අවසානයේ දී පුරප්පාඩු වූ තනතුරු වල වැඩ ආවරණය කිරීමේ රාජකාරි සඳහා පිලිවෙලින් නිලධාරීන් 07, 27 සහ 05 දෙනෙකු මාස 3 කට වැඩි කාලයක් පුරා අනුයුක්ත කර තිබුණි. | සමාගම අදාළ මාර්ගෝපදේශයට අනුකූල විය යුතුය | සියලුම තාවකාලික වැඩබලන තනතුරු ලබා දී ඇත්තේ විශ්‍රාම ගැන්වීම සහ පුරප්පාඩු වීම හේතුවෙන් වන අතර ගබඩා සහ රසායනාගාර කාර්යයන් හැර අනෙකුත් තනතුරුවල පුරප්පාඩු සඳහා බඳවාගැනීමට දැනටමත් අභ්‍යන්තරව සහ බාහිරව ප්‍රචාරණය කර ඇති අතර 2021 වසර තුළ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතය. | පුරප්පාඩු වූ තනතුරුවල රාජකාරි ආවරණය කිරීම වර්තමානයේදී ද කරනු ලැබේ. |
| (ජ) | ශ්‍රී ලංකා රජය සහ LIOC අතර 2007 ජනවාරි 05 දිනැති බේරුම්කරණ ගිවිසුමේ (Settlement Agreement) 03 | කොන්දේසි වලට අනුකූල වීම සුපරීක්ෂණය කිරීම සඳහා විධිමත් | 2003 වර්ෂයේදී CPSTL පිහිටුවීමෙන් පසුව, LIOC ශ්‍රී ලංකාව තුළ සිය වාණිජ මෙහෙයුම් ආරම්භ කර | අදාළ අනුකූලතා නිරීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කර නොමැති |

| | | | | |
|---|---|---|---|---|
| | වැනි වගන්තියට අනුව, LIOC ට වින වරාය පර්යන්තයෙන් ඛණිජ තෙල් නිෂ්පාදන බෙදා හැරිය හැකි උපරිම සීමාව රටේ සමස්ථ ඛනිජ තෙල් සැපයුමෙන් උපරිම සියයට 5 කට සීමා කර ඇති අතර CPC ටද සපුගස්කන්ද පිරිපහදුවෙන් බෙදාහැරිය හැකි උපරිමය සියයට 5 දක්වා සීමා කර තිබේ. කෙසේ වෙතත්, ඉහත විධිවිධානවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමට සැලකිය යුතු මෙහෙයුම් ආදායමක් (throughput income) අහිමි වීමේ හැකියාවක් පවතී. | ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. | ඇත. ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය ලිහිල් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීම සඳහා රජය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව (PUCSL) පත් කර ඇත. මේ වන විට ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් කර්මාන්තය නියාමනය කිරීමට PUCSL නියාමන යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන්, ඛනිජ තෙල් කර්මාන්තය ආශ්‍රිත කටයුතු නියාමනය කිරීමේ නියාමකයා ලෙස ගරු. බලශක්ති අමාත්‍යවරයා කටයුතු කරනු ලැබේ. | අතර මෙහෙයුම් ආදාය (throughput income) අහිමි වීමේ හැකියාව තවදුරටත් පවතී. |
| (ට) | ලංකා ඛනිජතෙල් සංස්ථාව, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර එළඹ තිබූ සාමාන්‍ය පොදු පහසුකම් පරිශීලනය සඳහා කොටස් හිමිකරු ගිවිසුම හා කොටස් විකිණුම් මිලදී ගැනීමේ ගිවිසුම (Shareholders Agreement & Share Sales Purchase Agreement for the common user facility between CPC, LIOC and CPSTL) 2008 දෙසැම්බර් 31 දින අවසන් වී තිබුණි. කෙසේ | කොන්දේසි වලට අනුකූල වීම සුපරීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. | CPC සහ CPSTL වෙත පොදු පරිශීලක පහසුකම් සේවා සපයන්නා ලෙස ක්‍රියා කිරීම සඳහා CPSTL හි මෙහෙයුම්, මූල්‍ය අවශ්‍යතා විධිමත් කිරීම සඳහා CPC/CPSTL සහ CPSTL/LIOC අතර ගිවිසුමක් අත්සන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අප විසින් ගරු. අමාත්‍යතුමාගෙන් හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලා ඇත. | සියලු සම්බන්ධ පාර්ශ්වයන්ගේ එකඟතාව ඇතිව මේ දක්වා ගිවිසුම දීර්ඝ කර හෝ අලුත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙතත්, ගිවිසුම තවත් කාලසීමාවකට දීර්ඝ කිරීමට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිසි ඇගයීමකින් සහ අනුමැතියක් ඇතිව අදාළ සියලු පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් නව ගිවිසුමකට එළඹීමට හෝ සමාගම විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අදාළ සියලු පාර්ශ්වයන්ගේ එකගතාවය ඇතිව මෙහෙයුම් ගාස්තු (throughput charges), SLAB ගාස්තු අයකරගැනීම ඇතුළුව ප්‍රවාහන ගාස්තු තීරණය කිරීම සඳහා භාවිත කරන ලද මිල සූත්‍රය 2011 වසරේ සිට සංශෝධනය කර නොතිබුණි. | | | |
| (ඩ) | ව්‍යාපාරයක් සුමටව පවත්වාගෙන යාමට සහ පිරිවැය අවම කර ගැනීම සඳහා කිසියම් ආයතනයකට කිසියම් උපකාරක සේවාවක් සපයන පාර්ශ්වයන් අතර නිසි එකඟතාවයක් පවත්වා ගත යුතු වුවද, අදාළ සියලුම ව්‍යාපාරික කටයුතු ආවරණය වන පරිදි CPC සහ LIOC අතර කිසියම් ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට (MOU) හෝ එළඹ නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එක් එක් පාර්ශ්වයේ ක්‍රියා පටිපාටි, භූමිකාවන් සහ වගකීම් | කොන්දේසි වලට අනුකූල වීම සුපරීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය. | අදහස් ඉදිරිපත් කර නොමැත | අදාළ ව්‍යාපාරික කටයුතු ආවරණය වන පරිදි CPC සහ LIOC සමඟ මේ දක්වා ගිවිසුමකට හෝ අවබෝධතා ගිවිසුමකට එළැඹී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | නිසි ලෙස නිර්වචනය කර නොතිබුණි. | | | |
| (ණ) | අභ්‍යන්තර පාලන දුර්වලතා හෝ සිදුවිය හැකි දෝෂ සහ අක්‍රමිකතා හඳුනාගැනීමට සහ වැලැක්වීම සඳහා පවතින පාලන ක්‍රම දැක්වෙන ලිඛිත ක්‍රියාපටිපාටි අත්පොතක් නොමැති බව නිරීක්ෂණය විය. කළමනාකරණය නියම කරන ලද/සැලසුම් කරන ලද ක්‍රියාවලිය ව්‍යතිරේකයකින් තොරව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා සමාගමේ එක් එක් ක්‍රියාවලිය සඳහා පවතින පාලන ක්‍රියාවලී පිළිබඳ වාර්තා තබා ගැනීම සමාගමට වැදගත් සහ ප්‍රයෝජනවත් වේ. ඒ වගේම, ක්‍රියාපටිපාටි අත්පොතක් නිර්මාණය කළ පසු එහි අදාළත්වය සහතික කිරීම සඳහා සාධාරණ කාල පරාසයන් තුළ එය වරින් වර ඇගයීමට ලක් කළ යුතුය. | අවශ්‍ය අනුමැතීන් සමග අඛණ්ඩව යාවත්කාලීන කර, ක්‍රියා පටිපාටි අත්පොත් නිසි ලෙස ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට ක්‍රියා කළ යුතුය | ක්‍රියා පටිපාටි අත්පොත් කිහිපයක් සකස් කර ඇති අතර, දැනට මුදල් දෙපාර්තමේන්තුවේ පවතින ක්‍රියා පටිපාටි අත්පොත් සමාලෝචනය කර අනුමත කිරීමට කටයුතු කර ඇත.<br>තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අන්තර්ජාල ප්‍රතිපත්ති, පරිශීලක ප්‍රවේශ ප්‍රතිපත්තිය, මෘදුකාංග සංවර්ධන ප්‍රතිපත්තිය, විද්‍යුත් තැපැල් ප්‍රතිපත්තිය, දෘඪාංග නඩත්තු කිරීමේ ප්‍රතිපත්තිය ආදිය සකස් කර ඇත. | සම්පූර්ණ ක්‍රියා පටිපාටි අත්පොතක් සමාගම විසින් මේ දක්වා සකස් කර නොතිබුණි. |
| (ත) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ) හි 5.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රාග්ධන ව්‍යාපෘති වාර්ෂික අයවැයට ඇතුළත් කිරීමේදී ඒ පිළිබඳව විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබූ බවට නිරීක්ෂණය වුණි. | සමාගම මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කල යුතුය. | ශක්‍යතා අධ්‍යයනයන් වාර්තා ලෙස ඉදිරිපත් කර නොතිබුණද, අදාළ අවශ්‍යතාවල ශක්‍ය තත්ත්වයන් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, 2021 සිට අනාගත ව්‍යාපෘති සඳහා | ශක්‍යතා අධ්‍යයන වාර්තා සකස් කර නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | | | මාර්ගෝපදේශ වලට අනුව ශක්‍යතා වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ද) | ප්‍රාග්ධන අයවැයෙහි ඇතුලත් වටිනාකම රු. මිලියන 3,662 ක් ඉක්මවූ ප්‍රාග්ධන ව්‍යාපෘති 52 ක නිවැරදි සහ යාවත්කාලීන වාර්තා (මූල්‍ය සහ භෞතික ප්‍රගතිය ඇතුළුව) පවත්වා ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘති ආරම්භ කිරීම හා අවසන් කිරීම පිළිබඳව විගණනයේදී සැකසහිත වේ. | ප්‍රාග්ධන ව්‍යාපෘති පිළිබඳ විධිමත් සහ යාවත්කාලීන වාර්තා සමාගම විසින් පවත්වාගෙන යා යුතුය. | ව්‍යාපෘති 22 ක භෞතික ප්‍රගතිය ඉංජිනේරු කාර්යාංශය මගින් ඉදිරිපත් කර තිබේ. | ප්‍රාග්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය සහ ව්‍යාපෘති 26ක භෞතික ප්‍රගතිය විගණනයට වාර්තාකර නොතිබුණි. |
| (න) | සමාගමේ 2020 වර්ෂය සඳහා ඉදිරියට ගෙන යන ලද අයවැයෙහි ඇතුළත් ව්‍යාපෘති 33ක් නිම කිරීම සඳහා සැලකිය යුතු ප්‍රමාදයන් ඇති බව නිරීක්ෂණය වුණි. ඒ අතුරින්, ඇතම් ව්‍යාපෘති ආරම්භ කර තිබුණේ 2015 වර්ෂයේදී පමණ වේ. | ප්‍රමාද වූ ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | සමහර කටයුතු 2015 දී ආරම්භ කර ඇති නමුත් මෙහෙයුම් අවශ්‍යතා හේතුවෙන් අදියර අනුව සහභාගී වීමට / ඉවුකිරීමට අවශ්‍ය විය. අනෙක් අතට, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් ද ඇතම් කටයුතුවලට බලපෑම් ඇති වූ අතර, අවස්ථානෝචිතව කොන්ත්‍රාත්තු කොන්දේසි අනුව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලදී. COVID-19 ද ඇතම් ව්‍යාපෘතිවල ප්‍රගතිය කෙරෙහි තවදුරටත් බලපෑවේය. | සමහර ව්‍යාපෘති තවමත් ක්‍රියාත්මක කර නොමැති අතර, තවදුරටත් ප්‍රමාද වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ප) | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව, සමාගම විසින් 2018 වසරේ වාහන 01ක් සහ 2020 වසරේදී වාහන 05ක් (වෘත්තීය සමිති සඳහා වාහන 3ක් ඇතුළුව) නිකුත් කර තිබුණි. තවද, සමාගම විසින් 2018 දී පුද්ගලයින් 04 දෙනෙකු, 2019 දී පුද්ගලයින් 03 දෙනෙකු සහ 2020 දී එක් පුද්ගලයෙකු නිදහස් කර ඇති අතර, ඔවුන්ගේ වේතන සහ අනෙකුත් දීමනා ද දරා තිබුණි. | සමාගම චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කල යුතුය | සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ඇතිව පහත වාහන මුදාහරින ලදී.<br>• බලශක්ති අමාත්‍යාංශයේ පරිහරණය සඳහා (KV-4708) (භාණ්ඩාගාරයේ අනුමැතියට යටත්ව)<br>• අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික/ CPC කළමණාකරන අධ්‍යක්ෂගේ භාවිතය සඳහා (KI-0786)<br>• අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ඇතිව SLNSS හි වෘත්තීය සමිති ක්‍රියාකාරකම් භාවිතය සඳහා (PH-3385)<br>මෙම වාහන දෙක (PH-7530 සහ KF- 5256) වෘත්තීය සමිති නායකයින් භාවිත කරන්නේ නිසි අනුමැතියකින් තොරවයි. නිසි අනුමැතියක් ඉදිරිපත් කරන ලෙස ලිඛිතව හා වාචිකව වරින් වර ඔවුන් වෙත උපදෙස් ලබා දී තිබුණද මේ දක්වා ඒ පිළිබඳව ප්‍රතිචාර දක්වා නොමැත. | වාහන සහ කාර්ය මණ්ඩලය වර්තමානයේදී ද මුදා හැර ඇත. |
| (බ) | සමාගමේ අනුමත සේවක සංඛ්‍යාවෙන් 2018, 2019 සහ 2020 වර්ෂයන් අවසන් වන විට | සමාගමේ කාර්ය මණ්ඩලය වඩා විමර්ෂණශීලීව | තනතුරු 154ක් සඳහා අභ්‍යන්තර දැන්වීම් නිකුත් කර තිබූ අතර මෙම | තවදුරටත් පුරප්පාඩු පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | පිළිවෙළින් තනතුරු 1, 263ක්, 343ක් සහ 746ක් පුරප්පාඩුව පැවතුණි. මේ අතුරින් තනතුරු 62ක්, තනතුරු 44ක් සහ තනතුරු 58ක් පිළිවෙලින් 2018, 2019 සහ 2020 වර්ෂ තුළ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික මට්ටමේ තනතුරු විය. කෙසේ වෙතත්, අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව 2018දී පුද්ගලයින් 944 ක් ද, 2019 දී පුද්ගලයින් 833 ක් ද සහ 2020 දී පුද්ගලයින් 1,148 ක් ද බඳවාගෙන තිබූ බවට නිරීක්ෂණය වුණි. | නැවත ඇගයීමට ලක් කළ යුතු අතර, ඒ අනුව සමාගමේ මෙහෙයුම් කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීම සඳහා සුදුසු සේවක මට්ටම්/ප්‍රමාණය තීරණය කළ යුතුය. | තනතුරු 150න් 95ක් සඳහා සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලීන් අවසන් කර ඇත. විමසුමේ සඳහන් ජ්‍යෙෂ්ඨ තනතුරු බොහොමයක් දැනටමත් පුරවා ඇත. කෙසේ වෙතත්, තවමත් A1-A7 (ජ්‍යෙෂ්ඨ තනතුරු 14ක් සහ කනිෂ්ඨ විධායක තනතුරු 41ක්) ශ්‍රේණිවල පුරප්පාඩු 55ක් පවතින අතර මෙම තනතුරුවලින් බොහොමයක් සඳහා සම්මුඛ පරීක්ෂණ ඉදිරි මාස දෙක ඇතුළත පැවැත්වීමට නියමිතය. | |
| (ම) | සමාගම විසින් නිලධාරීන් සඳහා වාහන සහ ඉන්ධන දීමනා ලබාදීම පිළිබඳව හෝ භාවිතාකරන ආකාරය පිළිබඳව විධිමත් ක්‍රමයක් ස්ථාපිත කර නඩත්තු කර නොතිබුණි. විගණනයට ලැබී ඇති තොරතුරුවලට අනුව විධිමත් අනුමැතියකින් තොරව හිමිකම් නොමති පුද්ගලයන්ට/ පාර්ශ්වයන්ට වාහන ලබාදී තිබූ අතර එක් නිලධාරියකු සඳහා එක් වාහනයකට වඩා වැඩි ගණනක් වෙන්කර තිබූ අවස්ථාවක් ද නිරීක්ෂණය වුණි. වාහන ධාවනයට අදාළ වාර්තා නිසි පරිදි නඩත්තු කර නොතිබූ අතර සහ සමාගම විසින් එම | සමාගම තුළ වාහන පරිපාලනය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය | සමාගම විසින් නිලධාරීන් සඳහා වාහන සහ ඉන්ධන දීමනා ලබාදීම පිළිබඳව හෝ භාවිතාකරන ආකාරය පිළිබඳව විධිමත් ක්‍රමයක් ස්ථාපිත කර නඩත්තු කර නොතිබුණි. නිලධාරීන් සඳහා වෙන්කල වාහන සඳහා සමාගම විසින් ප්‍රතිපත්තියක් ස්ථාපිත කර තිබේ.<br><br>(අ) සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වරුන්ට (DGM) ලීටර් 140ක ඉන්ධන දීමනාව සහිත සමාගමට අයිති වාහනයක් වෙන් කර ඇත. | නිලධාරීන් සඳහා වාහන සහ ඉන්ධන දීමනා ලබාදීම සඳහා හෝ භාවිතය සඳහා විධිමත් ක්‍රමවේදයක් සමාගම විසින් මේ දක්වා ස්ථාපිත කර නඩත්තු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුතු සමීපව අධීක්ෂණය කර නොතිබූ අතර, විධිමත් අවසරයකින් තොරව වාහන ධාවන වාර්තා තබා ගැනීම, වාහනවල ඉන්ධන භාවිතය පිළිබඳ විස්තර නොමැතිවීම, ධාවන වාර්තා දුර්වල ලෙස යාවත්කාලීන කිරීම යනාදිය වාර්තා වී තිබුණි. ඉන්ධන කූපන් පත්වල සහ ERP (SAP) පද්ධතියේ පෙන්වා ඇති විස්තර අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. එක් එක් වාහනය සඳහා වෙන වෙනම ලඝු-සටහන් පොත් (Log Books) (රිය පැදවීම වාර්තා) නොමතිවීම හේතුවෙන් වාහනවල ධාවන තත්ත්වය, නඩත්තුව සහ අනෙකුත් අදාළ කරුණු පිළිබඳ තොරතුරු විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. ඒ අනුව, සමාගමේ වාහන පරිපාලනය, නඩත්තුව සහ ඉන්ධන භාවිතය පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේදය අපේක්ෂිත ප්‍රමිතියට නොමතී බවටත් සහ රජයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියට අනුකූල නොවන බවටත් නිරීක්ෂණය කෙරේ. | | (ආ) එක් එක් අංශ ප්‍රධානීන් (HOFs) සඳහා ලීටර් 120 ක ඉන්ධන දීමනාවක් සහිතව සමාගමේ වාහනයක් වෙන් කරනු ලැබේ.<br><br>(ඇ) අංශ ප්‍රධානීන් (HOF) නිල රාජකාරි සඳහා තමන්ගේම වාහනය භාවිතා කරන්නේ නම්, ඔවුන්ට රු. 50,000 වාහන දීමනාවක් හා අමතර ලීටර් 120 ක ඉන්ධන දීමනාවක් හිමිවේ.<br><br>(ඈ) නියෝජ්‍ය කළමනාකරුවන්ට වාහන අනුයුක්ත නොකරන අතර ඉන්ධන ලීටර් 100ක දීමනාවක් සඳහා පමණක් හිමිවේ.<br><br>(ඉ) වත්මන් ඉන්ධන මිල පදනම්ව නිලධාරීන්ට ඔවුන්ගේ අදාළ සීමාව දක්වා ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතු කරනු ලැබේ. | |
| (ය) | ස්ථාවර වත්කම් ලේඛනයට අනුව, 2020 වර්ෂය අවසානය දක්වා සමාගම විසින් ගර්හිත මෝටර් රථ 17ක් හඳුනාගෙන | ගර්හිත වාහන පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි. | අදහස් දක්වා නොතිබුණි | මෙම වාහන සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳ මේ දක්වා විගණනයට |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. කෙසේ වෙතත්, මෙම ගර්හිත වාහන සම්බන්ධයෙන් සමාගම විසින් මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | | තොරතුරු ලැබී නොතිබුණි. |
| (ර) | 2003 ජූනි 2 දිනැති අංක PED/12 දරන යහ පාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 5.1.1 හි ඇතුළත් විධි විධානයන්ට අනුකූලව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් පිළියල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම මාර්ගෝපදේශයට අනුකූලව කටයුතු කල යුතුය. | සංයුක්ත සැලැස්මක් සකස් කිරීම සඳහා ටෙන්ඩරය 2018 වර්ෂයේදී ප්‍රදානය කරන ලද අතර 2018 ඔක්තෝම්බර් මාසයේදී උපදේශක අර්නස්ට් ඇන්ඩ් යන්ග් (M/s . Ernst & Young) විසින් සංයුක්ත සැලැස්මේ කෙටුම්පත් ඉදිරිපත් කර තිබුණි. 2020 ආණ්ඩු මාරුවෙන් පසු සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ විෂය පථය වෙනස් වූ බැවින් 2021 වර්ෂයේදී සංශෝධිත සංයුක්ත සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු සලසනු ලැබේ. | මාර්ගෝපදේශ අනුව සංයුක්ත සැලැස්මක් තවමත් සකස් කර නොමැත. |

## 4.31 සීමාසහිත සී-නෝර් පදනම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 244,188,595 | 294,040,322 | 502,356,689 | 147,840,721 | (49,851,727) | තත්ත්වාගණනය කළ |
| **2019** | 126,717,300 | 149,615,433 | 638,954,914 | 313,048,497 | (22,898,133) | තත්ත්වාගණනය කළ |
| **2020** | 82,314,422 | 104,285,450 | 613,326,613 | 309,396,224 | (21,971,028) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ නෝර්ත් සී පුද්ගලික සමාගම නමින් 2011 වර්ෂයේ සිට පැවත එමින් තිබුණු රු.9,204,498 ක ශේෂය වෙනුවෙන් ශ්‍රී | ප්‍රමිතය ප්‍රකාරව හානිකරණයට යටත් වූ වත්කම්වල ධාරණ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුල හෙළිදරව් කළයුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9 හි 5.5 ඡේදය ප්‍රකාරව හානිකරණ අලාභ හඳුනාගෙන නොතිබුණි. | | | |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 - තොග පිළිබඳ ප්‍රමිතයේ 28 පරිච්ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් අවසානයේදීම පවතින තොගයෙහි ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳ නව තක්සේරුවක් කර ඒ අනුව තොගයෙහි අගය ගැලපීම් කර නොතිබුණි. | ප්‍රමිතය ප්‍රකාරව තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳව නව තක්සේරුවක් කර මූල්‍ය ප්‍රකාශනයේ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ප්‍රකාරව සංචලනය නොවන හා හානි වූ රු.8,803,275 ක තොග සම්බන්ධයෙන් හානිකරණය සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | ප්‍රමිතය ප්‍රකාරව තොගවල ශුද්ධ උපලබ්ධි අගය පිළිබඳව නව තක්සේරුවක් කර මූල්‍ය ප්‍රකාශනයේ ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ඈ) | ධීවර අමාත්‍යාංශය විසින් රු.146,952,561 ක් වටිනා ගොඩනැගිල්ලක් ඉදිකර 2018 අගෝස්තු 10 වන දින සීමාසහිත සී නෝර් පදනම වෙත ලබා දී තිබුණද, දේපල පිරියත උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 07 වැනි ඡේදය ප්‍රකාරව ඉඩමේ වටිනාකම නිසි ලෙස තක්සේරු කර සැලකිල්ලට ගෙන නොතිබුණි. | ප්‍රමිතය ප්‍රකාරව ඉඩමේ වටිනාකම නිවැරදිව තක්සේරු කර ගිණුම්වලට ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමානය වන විටද තක්සේරු කර ගිණුම්වලට ගෙන නැත. |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 වන ඡේදය ප්‍රකාරව පදනම ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා ගොඩනැගිලි 2009 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | ප්‍රමිතය ප්‍රකාරව පදනමේ ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර සාධාරණ වෙළඳ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ දැක්විය යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2020 දෙසැම්බර් 31 දිනට මත්තුමගල ඉඩමෙහි ආයෝජන ආදායම් ලෙස රු.2,700,000ක් දක්වා තිබුණ ද එවැනි ආයෝජන වත්කමක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. එසේම පදනම හා සීමාසහිත ෆ්‍රන්ටියර් ඔටෝ මෝට්ව් (පුද්ගලික) සමාගම අතර වූ බදු ගිවිසුම අනුව මෙම ඉඩමෙහි අයිතිය ලංකා ධීවර සංස්ථාවට අයත් බව සඳහන් වුවත්, ලංකා ධීවර සංස්ථාව මඟින් මෙම ඉඩම සීමාසහිත සීනෝර් පදනම වෙත ලබාදීමට අදාලව හා තෙවන පාර්ශවයකට කුලී පදනමක් යටතේ පැවරීමට අනුමැතිය ලබාදීමට අදාලව ලිඛිත සාක්ෂි නොවීය. | ආයෝජන ආදායම් ලබන වත්කම්වල අයිතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.57,275,179ක් වූ සත්‍ය වෙළඳ ණයගැති ශේෂය තුළ 2008 හා 2014 වර්ෂවල සිට ගනුදෙනු කිරීමකින් තොරවූ හා අයකර ගැනීමට නොහැකි වූ එකතුව රු.345,413ක්ද වූ ණය ශේෂ සඳහා අඩමාණ ණය වෙන්කිරීම සිදුකර නොතිබුණි. | දිගු කාලයක් තිස්සේ අය කර ගැනීමට නොහැකි වූ ශේෂයන් සඳහා අඩමාණ ණය වෙන්කිරීම කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව එකතුව රු.3,653,360ක් වූ ණයහිමි ශේෂ 77ක් විවිධ ආදායම් ගිණුමට බැර කර තිබුණි. | ගිණුම්වලින් ලියාහැරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ අලාභය අඩුවී තිබුණි. |
| (එ) | අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ පෙන්වා තිබුණු ධීවර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද දික්ඕවිට ධීවර වරාය ව්‍යාපෘතියට අදාල කාර්යයන් වෙනුවෙන් 2015 හා 2017 වර්ෂ වලදී රඳවා ගන්නා ලද පිළිවෙලින් | දිගු කාලයක් තිස්සේ ගෙවිය යුතු මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | රු.1,757,057ක් හා රු.1,770,766ක් ලෙස එකතුව රු.3,527,824ක් වූ මුදල අයකර ගැනීමට ආයතනය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | |
| (ඒ) | 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු.3,103,068ක් වූ ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | දිගු කාලයක් තිස්සේ ගෙවිය යුතු මුදල නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ඔ) | 2020 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් තුල පැවති රු.14,140,125 කින් 2003 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා පැවත එන රු.8,878,264 ක ශේෂය අයකර ගැනීම සඳහා කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි. | අත්තිකාරම් ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ඕ) | ධීවර දැල් නිෂ්පාදනය සඳහා පුද්ගලික සමාගමකට උප කොන්ත්‍රාත් පදනමක් යටතේ 2011 වසරේ ලබාදුන් අමුද්‍රව්‍ය වටිනාකමින් රු.4,909,775ක මුදලක් වසර 09ක කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල පැවති අතර, මෙම ශේෂය අයකර ගැනීමට පදනම කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | දිගුකාලීන හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ක) | සාංසමික සංස්ථා පත්‍රයේ 3.3 හා 3.5 ඡේදවලට අනුව, සීමාසහිත සී නෝර් පදනම අයිස් නිෂ්පාදනය, සමුද්‍ර නිෂ්පාදන ඇසුරුම් කිරීම, අලෙවි කිරීම සහ අපනයනය කිරීම, ධීවර දැල් සහ බෝට්ටු නිෂ්පාදනය සහ බෙදා හැරීමේ කටයුතුවල නිරත විය යුතු වුවද, පදනම, බෝට්ටු නිෂ්පාදනයට පමණක් සම්බන්ධ වී ඇති බව නිරීක්ෂණය විය. | පදනම පිහිටුවීමේ පරමාර්ථවලට අනුව කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | සාංඝමික ව්‍යවස්ථාවලියේ 58 ඡේදය ප්‍රකාරව වාර්ෂික මහා සභා රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතු වුවත් සභාපතිවරයා පත්කිරීම ඒ අනුව සිදුකර නොතිබුණි. | සාංඝමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් පදනමේ සභාපතිවරයා පත්කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ච) | කොළඹ 10, සී-නෝර් පදනමේ 335 ඩීආර් විජේවර්ධන මාවතේ ඇති හිස් ඉඩම 1998 ජූලි 4 සිට වසර 20 ක කාලයකට සීමාසහිත ඔරියන්ට් පර්ල් හෝටල් සමාගමට බදු දී ඇත. නමුත් කල්බදු ගිවිසුම අවසන් වීමෙන් පසුව පදනම රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම හේතුවෙන් ඇති වූ අර්බුදය හේතුවෙන් 2018 වසරේ සිට මේ දක්වා වසර දෙකකට වැඩි කාලයක් එම දේපලෙහි ආර්ථික ප්‍රතිලාභ පදනමට අහිමි විය. තවද, පදනම විසින් 2018 වර්ෂය සඳහා සමාගමේ ලාභයෙන් රු.323,515 ක් ලබා ගත් අතර ඉඩම ලබා ගැනීමට නීතිමය පියවර ගැනීමට සිදු විය. | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වී කටයුතු කළ යුතු අතර ලාභ කොටස අයකර ගැනීමට හා ඉඩම් සන්තකය ලබාගැනීමට කළමනාකරණය ක්‍රියාමාර්ග ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමුවී ඇතත් මේ වන තෙක් ඉඩම හා ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී ඇත. |
| (ජ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය ප්‍රකාරව පදනම විසින් 2019/2023 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |
| (ට) | 2020 ක්‍රියාකාරි සැලැස්ම අනුව රු.මිලියන 16,680.91 ක් වෙන්කර ක්‍රියාකාරකම් 15 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් පිළියෙල කර තිබුණද 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ප්‍රගති වාර්තාව අනුව රු.මිලියන 57.33 ක් | ක්‍රියාකාරි සැලැස්ම අනුව සැලසුම් කළ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වර්තමාන තත්වය නොවෙනස්ව පවතී. |

පමණක් ක්‍රියාකාරි සැලැස්මෙන් බාහිර වූ ක්‍රියාකාරකම් කීපයක් සඳහා වියදම් කර තිබුණි.

## 4.32 ශ්‍රී ලංකා කුකුළු පාලන සංවර්ධන (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 76,989,669 | 93,202,373 | 312,435,417 | 88,449,800 | (16,212,705) | තත්ත්වාගණනය කළ |
| **2019** | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | | | | | |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ලැබී නොමැත | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම වටිනාකම රු.මිලියන 33 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපල, පිරියත සහ උපකරණ තවදුරටත් භාවිතා කළද, එම වත්කම්වල ඵලදායී ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබූ අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි | මූල්‍ය ප්‍රකාශන ප්‍රමිතවලට අනුකූල සකස් කළ යුතුය. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව සංශෝධනය කර ප්‍රමිතයේ 79 වැනි ඡේදය අනුව ඉදිරි මූල්‍ය ප්‍රකාශනවල | වත්මන් තත්ත්වය නොවෙනස්ව පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | 51 ඡේදය අනුව ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කර නොතිබුණි. | | අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | සමාගම සතු සත්ව ආහාර ඇඹරුම් යන්ත්‍රය 2016 වර්ෂය තුළ දී රු.3,853,490 ක වියදමින් අලුත්වැඩියා කර ඇත. නමුත් එය 2019 ජුනි මාසය වන විටත් නිෂ්කාර්යව පැවතුනි. | ව්‍යාපෘතියක් සඳහා මුදල් වියදම් කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළ යුතු අතර, මෙම යන්ත්‍රය භාවිතය නැවැත්වීමට පෙර ආහාර නිෂ්පාදනය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවේද යන්න සහ එහි ගුණාත්මකභාවය ඇගයීමට ලක් කළ යුතු වේ. | මෙම යන්ත්‍රයෙන් සත්ව ආහාර නිෂ්පාදනය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වන අතර වෙළඳපොලෙන් අඩු පිරිවැයකට සත්ව ආහාර මිලදී ගැනීම හැකි බැවින් සත්ව ආහාර නිෂ්පාදනය සඳහා මෙම යන්ත්‍රය භාවිතා කර නොමැත. මෙම යන්ත්‍රය කිසිදු මුදල් ප්‍රවාහයක් ජනනය නොකරන අතර එය වාර්ෂිකව රු.578,024 කින් (15% කින්) ක්ෂය වේ. | වත්මන් තත්ත්වය නොවෙනස්ව පවතී. |
| (ඇ) | කාර්ය සාධන වාර්තා සකස් කර නොතිබූ බැවින් ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කර ඇති සියලුම ක්‍රියාකාරකම් සිදු කළේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි වූ අතර කාර්ය සාධනය ඇගයීමට පසුබිමක් සකස් කර නොතිබුණි. | කළමනාකාරීත්වය කාර්ය සාධන වාර්තා සකස් කර ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය | පිළිතුරු දී නැත | කාර්ය සාධන වාර්තා සකස් කර නොතිබුණි |
| (ඈ) | අක්කර 330 ක භූමි ප්‍රමාණයේ ප්‍රධාන පොල් වගාවට අමතරව යටි වගාවක් සිදු කර නොමැති බවත් එම නිසා සමාගමට ඇතැම් ප්‍රදේශවල යටි වගාව යටතේ | සමාගමේ වත්කම්වලින් උපරිම ඵලදායිතාව ලබා ගැනීම සඳහා | පොල් වගාව අක්කර 330ක් පුරා පැතිරී තිබුණද, ඉඩම එළිපෙහෙළි කිරීමට | වත්මන් තත්ත්වය නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | උපයා ගත හැකි ආදායම අහිමි වී ඇති බවත් ඉඩම පිරිසිදු කර නොමැති නිසා පොහොර යෙදීම සඳහා පොල් ගස් වෙත ළඟා වීමට නොහැකි බවත් භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එබැවින් ආයතනය සතු වත්කම් උපරිම ආදායමක් ලැබෙන පරිදි පරිපාලනය කර නොමැති බව භෞතික පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | පද්ධති සහ පාලන හඳුන්වා දිය යුතුය. | අප සතුව ඇත්තේ ට්‍රැක්ටර් 02ක් පමණි. දැනට සිටින කම්කරුවන් අභිජනන ව්‍යාපෘතිය සඳහාද ප්‍රමාණවත් නොවන අතර එම නිසා දැනට සිටින කම්කරුවන් ඉඩම එළිපෙහෙළි කිරීමට යොදා ගත නොහැක. | |
| (ඉ) | 2005 ජූනි 16 වැනි දිනැති කැබිනට් තීරණයට අනුව උපදේශකයන් සඳහා පත්වීම් ලබාදීමේ නිශ්චිත පැවරුම සහ කාලසීමාව පිළිබඳව කැබිනට් අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වෙතත්, ඒ අනුව ක්‍රියාමාර්ග නොගෙන සහ උපදේශන සේවා ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් 2017 නොවැම්බර් මාසයේදී නිකුත් කරන ලද මාර්ගෝපදේශවල තේරීම් 4.3 සහ 4.4 ට පටහැනිව, එක් වසරකට වැඩි කාලයක් සඳහා උපදේශකයින් 02 දෙනෙකු පත් කර ඇත. පත්වීමේ ලිපිය මගින් තමාට පවරා ඇති පැවරුම් සම්පූර්ණ කර ඇත්දැයි කිසිදු සහතිකයක් ලබා නොගෙන මෙම ඉංජිනේරු උපදේශකවරයාට 2015 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි වසර 03කුත් මාස 06 ක කාලයක් සඳහා මාසයකට රු.20,000 බැගින් එකතුව රු. 840,000 ක් ගෙවා තිබුණි.. | 2005 ජූනි 16 දිනැති අංක CP/05/Mis/(026) කැබිනට් තීරණයට අනුව ක්‍රියා කළ යුතුය. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා කුකුළු සංවර්ධන පුද්ගලික සමාගමෙහි මව් සමාගමයි. ඉහත මණ්ඩලයේ උපදේශකවරුන් අප ආයතනයේ උපදේශකවරුන් ලෙසද පත් කර තිබුණි. | වත්මන් තත්ත්වය නොවෙනස්ව පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | ගොවිපළේ භෞතික පරීක්‍ෂණයේදී තැඹිලි ගස් 50ක් පමණක් නිරීක්ෂණය වූ අතර, එම වර්ෂය තුළ තැඹිලිවලින් ලැබුණු ආදායම රු.5,070ක් විය. ඒ අනුව, එක් ගසක වාර්ෂික ආදායම රු.101ක් වූ බැවින්, තැඹිලිවලින් ලැබෙන ආදායමේ නිවැරදිභාවය සහතික කළ නොහැකි විය. | උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා සමාගම සතු වත්කම් නඩත්තු කළ යුතුය. | ගොවිපළේ තැඹිලි ගස් 50ක් පමණ තිබුණද දිගු කලක් පොහොර නොදැමීම නිසා නිෂ්පාදනයක් නොවීය. මේ වන විට පොහොර දැමීම සම්පූර්ණයෙන්ම සිදු කර ඇත. | භෞතික පරීක්ෂණය තවමත් සිදු කර නොමැත |
| (උ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.4.1 වගන්තියට අනුව කාර්තුවක් ඇතුළත අවම වශයෙන් එක් විගණන කමිටු රැස්වීමක් පැවැත්විය යුතුය. නමුත් ඒ අනුව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව විගණන කමිටු රැස්වීම පැවැත්විය යුතුය | විගණන කමිටු රැස්වීම මේ දක්වා පවතිවා නොතිබුණි. | වත්මන් තත්ත්වය නොවෙනස්ව පවතී. |

## 4.33 ඕෂන් විව් ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 309,873,947 | 201,768,207 | 2,680,541,946 | 177,447,032 | 108,105,741 | තත්ත්වාගණනය කල |
| **2019** | 149,327,560 | 138,396,098 | 2,698,823,872 | 189,618,576 | 10,931,462 | තත්ත්වාගණනය කල |
| **2020** | 408,515,302 | 102,338,641 | 3,001,292,476 | 192,585,690 | 306,176,658 | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED/12 හි 8.8 පරිච්ඡේදය අනුව, අධිකාරිය පැවරීම සෑම වසරකම ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යාවත්කාලීන කර අනුමත කළ යුතුය. නමුත් සමාගම 2018 | අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛවලට සමාගම අනුකූල විය යුතුය. | සමාගමේ අත්පොතෙහි පැහැදිලිව සඳහන් කර ඇත | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම වසරකම ආරම්භයේදී අධිකාරියේ පැවරීම යාවත්කාලීන කර |

| | | | | |
|---|---|---|---|---|
| | වසරේ සිට 2020 දක්වා අධිකාරිය පැවරීම අනුමත කර නොතිබුණි. | | | අනුමත කර නොතිබුණි. |
| (ආ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක. PED/01/2015 හි විධිවිධානවලට පටහැනිව, සමාගම සාමාන්‍යාධිකාරීවරයාට හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයාට ඉන්ධන ලීටර් 200 ක දීමනාවක් සහ සභාපතිවරයාට අසීමිත ඉන්ධන දීමනාවක් අනුමත කර ඇත. | අදාළ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛවලට සමාගම අනුකූල විය යුතුය. | සභාපතිවරයාගේ වාහනය හැර අනෙකුත් සියලුම වාහන සඳහා ලීටර් 200 ඉන්ධන වෙන් කර ඇති අතර බොහෝ අවස්ථාවලදී සැබෑ ඉන්ධන පරිභෝජනය ලීටර් 140 ට වඩා අඩුය. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | අධ්‍යක්ෂවරුන්ගේ දීමනා සහ ප්‍රසාද දීමනාවලට අදාළව උපයන විට ගෙවීමේ බද්ද අඩු නොකර 2018 සිට 2020 දක්වා සමාගම විසින් ගෙවා තිබුණි. | අදාළ බදු රෙගුලාසි අනුකූල විය යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව උපයන විට ගෙවීමේ බද්ද ද අධ්‍යක්ෂ දීමනාවෙහි කොටසකි. | සමාගම අදාළ බදු රෙගුලාසිවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | බිම් මහලේ ඒකක පහක් වත්මන් වෙළඳපල කුලී වටිනාකමට වඩා අඩුවෙන් කුලියට දී ඇති අතර 2018 සිට 2020 දක්වා නිසි කුලී තක්සේරුවක් ලබා නොගෙන තවත් බිම් මහලේ ඒකක තුනක් කුලියට දී ඇත. | වත්මන් තක්සේරුව අනුව කුලී මුදල යාවත්කාලීන කළ යුතුය | කුලී තක්සේරු කිරීමේ සාමාන්‍ය පරිචය වන්නේ කුලී සහ සේවා ගාස්තු සමඟ සංසන්දනය කිරීම වන අතර කුලී තක්සේරුව 2012 වාර්තාවේ ඇත. | වත්මන් තක්සේරුව අනුව කුලී මුදල යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඉ) | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 3.2 ක අනෙකුත් ගෙවිය යුතු මුදල් ගිණුම්ගත කර නොතිබූ අතර වියදම් ද ගිණුම්ගත කර නොමැත. | අදාළ වගකීම් හඳුනාගෙන ගිණුම්ගත යුතුය. | **මේවා නඩු ගාස්තු වන අතර 2020 වර්ෂය සඳහා මිලියන රු.1.025 ක ප්‍රතිපාදන ලබා දෙන ලදී.** 2021 දී රු.මිලියන 1.65 කි. | 2020 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබා දුන්නේ රු.මිලියන 1.025 ක ප්‍රතිපාදන පමණි. |

| | | | |
|---|---|---|---|
| (ඊ) 2015 ජුනි 17 දිනැති අංක.PED/03/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | | | |
| (i) ඡේදය 2.2 | | | |
| මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය හා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන සමාගම විසින් 2018, 2019 සහ 2020 වසරවල පිළිවෙලින් රු.250,000, රු.256,250 සහ රු.100,000 බැගින් මාසික දීමනාවක් සමාගමේ සභාපතිවරයාට ගෙවා ඇත. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව අමතර දීමනා ගෙවිය යුතුය. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක.PED 1/2020 අනුව සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ දීමනා ගෙවා ඇත. | සමාගම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED1/2020 ට අනුකූල වී නොමැත. |
| (ii) 2.8 ඡේදය | | | |
| මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන සමාගම විසින් 2018 සහ 2019 වසර තුළ රු.850,000 ක සහ රු.450,000 ක ප්‍රසාද දීමනා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට ගෙවා තිබුණි. | භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව ප්‍රසාද දීමනාගෙවිය යුතුය. | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්පොත අනුමත කරන විට සමාගම කිසිදු රේඛීය අමාත්‍යාංශයක් යටතේ නොතිබුණි. එය ඉහත සඳහන් අත්පොතට අනුකූල වේ. | භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |
| (උ) 2015 ජූලි 10 දින අංක.02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය. | | | |
| (i) 03 සහ 4(ආ) ඡේද | | | |
| විශේෂ ඇගයීම් මණ්ඩලයක් පත් කිරීමකින් සහ අවශ්‍ය අනුමැතියෙන් තොරව සමාගම විසින් 2015 වසරේ මිලදී ගත් වාහන හතරක් කිසිදු තාක්ෂණික දෝෂයක් නොතිබුණද, 2019 වසරේ | චක්‍රලේඛයයේ පරිදි සමීක්ෂණ මණ්ඩලයක් පත් කර අනුමැතිය ලබා දීමට කටයුතු කළ යුතුය. | වාහන බැහැර කිරීමට මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | චක්‍රලේඛයේ පරිදි සමීක්ෂණ මණ්ඩලයක් පත් කර අනුමැතිය ලබා දීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.12,300,000 කට අලෙවි කර අපහරණය කර ඇත. | | | |
| | (ii)05 ඡේදය | | | |
| | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ පරීක්ෂකවරයෙකුගෙන් යුත් කමිටුවක් පත් නොකර පෞද්ගලික තක්සේරුකරුවෙකු විසින් කරන ලද තක්සේරුව මත පදනම්ව අවම විකුණුම් මිල තීරණය කර ඇත. තවද, විකුණුම් මිල ඉහත තක්සේරුවට වඩා අඩු විය. | චක්‍රලේඛ උපදෙස් අනුව මෝටර් රථ බැහැර කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට කටයුතු කළ යුතුය. | මෝටර් වාහන තක්සේරු කිරීම පිළිගත් තක්සේරුකරුවෙකු විසින් සිදු කරන ලදී. විවෘත ටෙන්ඩරයෙන් විකුණුම් මිල තීරණය වූ අතර වැඩිම ලංසුකරුට වාහනය විකුණා ඇත. | කමිටුවක් පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඍ) | 2006 ජනවාරි 25 දිනැති අංක.08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛය.<br>(i) 04 ඡේදය<br>(ii) 8.9 ඡේදය | | | |
| | කුලී නිවැසියන් සමඟ ගිවිසුම අත්සන් නොකර, 2018 වර්ෂයේ සිට කොටස් 2 ක් කුලියට ලබා දී තිබුණි. එබැවින්, වාර්ෂික කුලිය වැඩි කිරීමට සමාගමට නොහැකි වී ඇත. | නීතිමය අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා වෙනත් වගකිව යුතු පාර්ශ්ව සමඟ ලිඛිත ගිවිසුමක් අත්සන් කළ යුතුය. | අලුත් කිරීමේ ගිවිසුමක් නොමැති අවස්ථාවක එම අනුපාතයම දිගටම කරගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. | කුලී නිවැසියන් සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |
| (එ) | උද්‍යාන මාර්ග ව්‍යාපෘතියට අදාළව තොගය යටතේ පෙන්වා තිබූ රු.25,183,741ක ශේෂය සඳහා ආධාරක ලියකියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනට අදාළව ඉල්ලා සිටින ලේඛනය ලබා දීමට කටයුතු කල යුතුය. | සමාගමට අදාළ ලියකියවිලි සොයා ගැනීමට නොහැකි විය. | සමාගම විගණනය සඳහා අදාළ ලේඛනය සපයා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ලෙස රු.672,301 ක මුදලක් දක්වා ඇති අතර නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු යටතේ එය පෙන්වා ඇත්තේ රු.5,613,836 ලෙස ය. | ගිණුම් සැසඳුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | නාගරික සංවර්ධන අධිකාරියට ලැබිය යුතු රු.5,013,830 ශේෂය තහවුරු කර ගැනීමට සමාගමට නොහැකි විය. | සැසඳුම් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඔ) | වසර 5 කට වැඩි ලැබිය යුතු කුලී රු. 4,738,004 ක ශේෂය 2020 වසර අවසන් වන විට ලැබී නොතිබුණි. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අඛණ්ඩ සාකච්ඡා, සේවා විසන්ධි කිරීම්, කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ඇතුළු ක්‍රියාමාර්ග සමාගම විසින් ගෙන ඇත. | 2021 වර්ෂය තුළ අයකර ගත් මුදල රු.මිලියන 1.4 කි. |
| (ඕ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 සහ 6.5.3 ඡේදවලට අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගමේ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇති අතර චක්‍රලේඛයේ 6.5.3 ඡේදයට අනුව 2015 සිට 2020 දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදාළ රෙගුලාසිවලට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු අතර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වසර ගණනාවක් පුරා ඕෂන් වීව් ඩිවලොප්මන්ට් සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඔවුන්ගේ වාර්ෂික වාර්තාවට ඒකාබද්ධ කර ඇත. එබැවින් මූල්‍ය තොරතුරු අනුපිටපත් වීම වැළැක්වීම සඳහා සමාගම විසින් වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවේ වෙනම සභාගත කර නොමැත. | වාර්ෂික වාර්තාව කෙටුම්පත ඉදිරිපත් කිරීමටත්, වාර්ෂික වාර්තාවක් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් කටයුතු කර නොතිබුණි |
| (ක) | 2015 සහ 2016 වර්ෂවල ආරාමය පාර සහ මහවත්ත නිවාස ව්‍යාපෘති සඳහා ගෙවා ඇති උපදේශන ගාස්තු පිළිවෙලින් රු.700,000ක් | නිසි අනුමැතියකින් ශේෂය ලියා හැරීමට කටයුතු කළ යුතුය. | ආරාමය පාර සහ මහවත්ත නිවාස ව්‍යාපෘති සඳහා දරන වියදම් ව්‍යාපාර ව්‍යාපෘති ජයග්‍රහණය කිරීම සඳහා | සමාගම විසින් ලාභ හා අලාභ ගිණුමට මාරු කර ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | සහ රු.1,050,000ක් විය. කෙසේ වෙතත්, එම නිවාස ව්‍යාපෘතිය අතහැර දැමීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා නිසි අනුමැතියකින් තොරව ඉහත වියදම් ලියා හැර තිබුණි. | | දරන වියදමට හෝ ප්‍රාග්ධනීකරණය කර ඇති ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්වලට සමාන වේ. කෙසේ වෙතත්, සත්‍ය සහ සාධාරණ දැක්මකින් ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා එම ප්‍රාග්ධන වියදම් ලාභ හා අලාභ ගිණුම වෙත මාරු කරනු ලැබුවේ මෙම ව්‍යාපෘති දෙක මගින් සමාගමට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබා නොදෙන පදනම මතය. | |
| (ග) | කුලියට ලබා දී තිබූ නිවාස 44 න් නිවාස 22 ක් ගිවිසුම් නොමැතිව කුලියට දී ඇති අතර ඉහත නිවාස 2015 වර්ෂයේදී තක්සේරුකරුවෙකු විසින් තක්සේරු කර ඇති අතර කුලී වටිනාකම වාර්ෂිකව සියයට 5 කින් වැඩි කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. නමුත් ඊට පටහැනිව නිවාස කුලියට දී තිබුණි. මේ හේතුවෙන් කුලී නිවාස 11 කින් 2020 වර්ෂය සඳහා සමාගමට සිදු වූ පාඩුව රු.2,980,010 කි. | සමාගම ගිවිසුම් අත්සන් කිරීමට අඛණ්ඩව කටයුතු කල යුතු අතර සංශෝධිත ගාස්තු අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. | වගකිවයුතු පාර්ශ්ව සමඟ ගිවිසුම් අත්සන් කිරීමට ක්‍රියා කළ යුතු අතර සමාගම කුලී නිවැසියන් සමඟ කුලී වටිනාකම සාකච්ඡා කළ යුතුය. (පාස්කු ඉරිදා බෝම්බ පිපිරීමෙන් පසු සහ වත්මන් වසංගත තත්ත්වය මහල් නිවාස කුලියට ගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත.) ඊට අමතරව කුලිය, තක්සේරු මුදල සමඟ සංසන්දනය කිරීමේදී, එයට සේවා ගාස්තුව එකතු කළ යුතුය. වෙළඳපල වටිනාකම් තීරණය කිරීමේදී තක්සේරුකරුවන් සාමාන්‍යයෙන් සලකා බලන්නේ වාර්ෂික නඩත්තු | කුලියට ගත් 15 දෙනෙකු ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර සංශෝධිත ගාස්තු අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | පිරිවැය හා ප්‍රතිසංස්කරණ පිරිවැය බැවිනි. | |
| (ච) | ගිවිසුම්වලට එළඹීමේදී කුලී නිවැසියන්ගෙන් ආපසු ගෙවිය හැකි තැන්පතු අය කිරීම සඳහා ප්‍රතිපත්තියක් සමාගම විසින් නියම කර නොතිබුණි. | ආපසු ගෙවිය හැකි තැන්පතුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ආපසු ගෙවිය හැකි තැන්පතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත. | සමාගම ආපසු ගෙවිය හැකි තැන්පතු නියම කර නොතිබුණි. |
| (ඡ) | පාර්ක් රෝඩ් නිවාස ව්‍යාපෘතියේ රු. 25,183,741 ක් වටිනා වෙළෙඳසැල් විසි එකක් (21) නඩු විභාගයක් හේතුවෙන් විකිණීමට නොහැකි වූ අතර කහතුඩුව නිවාස ව්‍යාපෘතියට අයත් රු.75,719,339ක වටිනාකමකින් යුත් නිවාස 11ක් සහ රු.19,558,200ක් වටිනා ඉඩම් කැබලි 25ක්, මත්තේගොඩ නිවාස ව්‍යාපෘතියට අයත් රු.10,343,909ක වටිනාකමකින් යුත් නිවසක් සහ රු.2,919,158ක වටිනාකමකින් යුත් ඉඩම් කැබලි 3ක් 2016 වසරේ සිට විකිණීමට කටයුතු කර නොතිබුණි. තවද, රු.106,345,401 කට මිලදී ගන්නා ලද දෙල්කඳ පිහිටි පර්චස් 100 ක භූමි ප්‍රමාණය 2018 වසරේ සිට කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා භාවිත කර නොතිබුණි. | සංවර්ධන කටයුතු කඩිනම් කළ යුතුයි. | පාර්ක් පාර ව්‍යාපෘතියේ වෙළඳසැල් 21 ක් විකිණීම ප්‍රමාද වී ඇත්තේ එම පරිශ්‍රයේම මහල් නිවාස හිමියා විසින් නඩු ගොණුකර තිබීම හේතුවෙනි. එබැවින් ක්‍රියාමාර්ගයක් නොතිබුණි ලෙස සඳහන් කිරීම නිවැරදි නොවේ.<br>කහතුඩුව නිවාස ව්‍යාපෘතියේ නිවාස 11 න් නිවාස 4 ක් 2021 වසරේ සම්පූර්ණයෙන්ම විකුණා ඇති අතර තවත් නිවාස 3 ක් විකිණීමට අත්තිකාරම් ලබා දී ඇත.<br>දෙල්කඳ මහල් නිවාස ව්‍යාපෘතිය සඳහා යොජනා 2021 වර්ෂයේදී කැඳවනු ලැබේ. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ට) | කුලී නිවැසියන් අදාළ නිවාසවලින් ඉවත් වීවසර 5 සිට 10 දක්වා ගෙවී ගියද කුලී නිවැසියන් විසින් තබන ලද ආපසු ගෙවිය හැකි තැන්පතු | ආපසු ගෙවිය හැකි තැන්පතු පියවීමට කටයුතු කළ යුතුය. | වසර 10ක් පුරා ආපසු ගෙවිය හැකි තැන්පතු වෙළඳ ණය ගැතියන්ට එරෙහිව පිහිටුවා ඇත. | වසර 10කට වැඩි ආපසු ගෙවිය හැකි තැන්පතු වෙළඳ ණය ගැතියන්ට |

| | | | | |
|---|---|---|---|---|
| | රු.3,314,563 ක මුදල් නිරවුල් කර නොතිබුණි. | | | එරෙහිව සකස් කර ඇති අතර වසර 5කට වැඩි ශේෂයන්, තීරණයක් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කෙරේ. |
| (ඩ) | 2017 සිට 2019 දක්වා කාලය තුළ මාලිගාවත්ත නිවාස ව්‍යාපෘතිය සඳහා රු. 876,625ක් වැය කර බව හා නුවරඑළිය නිවාස ව්‍යාපෘතිය සඳහා තවත් රු. 10,954,477ක් වැය කර ඇති බව ක්‍රියාකාරී ප්‍රගතිය ගිණුම යටතේ පෙන්වා ඇත. කෙසේ වෙතත්, 2020 වසර තුළ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු කර නොතිබුණි. | සංවර්ධන කටයුතු කඩිනම් කළ යුතුයි. | අදාළ ඉඩම පවරා ගැනීමට පියවර ගනිමින් ඇත. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ණ) | නීතිවිරෝධී ලෙස එක් නිවසක් පදිංචිව සිටි කුලී නිවැසියන් 4 දෙනෙකුට එරෙහිව සමාගම විසින් නීතිමය නඩු පවරා ඇති අතර අනෙක් අතට නිවැසියන් දෙදෙනෙකු සහ සමාගමේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු සමාගමට එරෙහිව නඩු පවරා තිබුණි. 2020 වර්ෂය තුළ නීතිමය වියදම් ලෙස සමාගම විසින් රු. 1,075,000 ක මුදලක් දරන ලදී. | නඩු සමථයකට පත් කිරීමට කටයුතු කළ යුතුයි. | නඩු සමථයකට පත් කිරීමට ක්‍රියාමාර්ගය ගෙන ඇත | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 4.34 නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 649,744,947 | 392,763,781 | 3,989,966,601 | 2,763,641,842 | 256,981,166 | තත්ත්වාගණනය කල |
| **2019** | 684,655,983 | 364,529,675 | 3,936,552,819 | 2,387,054,110 | 320,126,307 | තත්ත්වාගණනය කල |
| **2020** | 665,970,836 | 303,028,874 | 3,844,120,237 | 1,946,859,336 | 362,941,962 | වියාචනය |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (LKAS 16) ට අනුව, නමුත් තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර | සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල ඇතුළත් විධිවිධානවලට අනුකූල විය යුතුය. | ඉදිරියේදී මෙම වත්කම් නැවත තක්සේරු කර ගිණුම් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව අපි ඔබට දන්වා සිටිමු. | 2022 මාර්තු 14 වැනි දින වන විටත් ගැටළුව විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය සඳහා LKAS 08 ප්‍රකාරව ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුය. කෙසේ වෙතත්, 2020 වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පවතින රු.මිලියන 22.1 වත්කම් සඳහා ඒ අනුව ක්‍රියා කර නොතිබුණි. | | | |
| (ආ) | 2020 වර්ෂය සඳහා රු.1,901,559,252 ක් වූ ජංගම නොවන වගකීම් සඳහා සවිස්තරාත්මක උපලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලෙජරයේ පිටපත විගණන කාර්යය සඳහා උපලේඛනයක් ලෙස ඉදිරිපත් නොකළ යුතු අතර එය සවිස්තරාත්මක උපලේඛනයක් විය යුතුය. අදාළ උපලේඛන විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට සමාගම කටයුතු කළ යුතුය. | 2020 වර්ෂය සඳහා සීමාසහිත නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගම විසින් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.1,903,019,550 ක ශේෂය සඳහා සවිස්තරාත්මක උපලේඛන 2021 නොවැම්බර් මස රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලදි. | 2022 මාර්තු 14 වන දින වන විට මෙම වගකීම සඳහා සවිස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2020 වර්ෂය සඳහා රු.263,447,550 ක් වූ ණය ගැතියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කිරීමේදී කාල විශ්ලේෂණය පිළිවෙළින් මාස 1 ට අඩු සහ මාස 1 සිට 2 දක්වා සහ මාස 3 කට වැඩි වශයෙන් පමණක් සඳහන් කර තිබීම හේතුවෙන් ඒවා හඳුනා ගැනීමට නොහැකි විය. | අවදානම් සහිත ණය ශේෂයන් හඳුනා ගැනීමට හැකි වන පරිදි ණය ගැතියන්ගේ කාල විශ්ලේෂණය ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | අනාගතයේදී එම කාල විශ්ලේෂණය වෙනස් කිරීමට අවශ්‍ය දැයි සමාගම සොයා බලනු ඇත. | 2022 මාර්තු 14 වන දින වන විටත් ගැටලුව විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සමාගම විසින් කුලියට දුන් කාර්යාල පරිශ්‍ර සඳහා රාජ්‍ය ආයතන 32 කින් සහ පෞද්ගලික ආයතන 03 කින් 2020 වසර අවසානයේ අය විය යුතු වසරක් ඉක්මවන හිඟ විදුලි බිල්පත් ශේෂය රු.15,058,727 කි. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | රු. 18,860,828 ක් ලෙස පෙන්වා ඇති විදුලි බිල් ශේෂයෙන් රු.9,450,760 ක ශේෂයක් දැනටමත් අය කර ගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට අදාළ පියවර ගෙන ඇත. | 2021 දෙසැම්බර් 31 වන විටත් හිඟ විදුලි බිල්පත් ශේෂය රු. මිලියන 20.7 ක් වූ අතර සමාගම විසින් ගැටලුව විසඳා නොතිබුණි. |
| (ඉ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වසර **5**කට වැඩි කාලයක සිට පැමිණෙමින් තිබූ රු.1,960,987 ක හිඟ ශේෂය පියවීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | මෙම දිගු හිඟ ශේෂයන් පියවීමට සමාගම විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. එසේම අවශ්‍ය අනුමැතියට යටත්ව වගකීම් නොවන ශේෂයන් ආදායමට ලියා හැරීමට කටයුතු කළ යුතුය. | 2021 වසර සඳහා පොත්පත්වල ඉතිරි මුදල් ඉවත් කර අවසන් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට සමාගමේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටී. | 2022 මාර්තු 14 වන විට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඊ) | මුදල් අමාත්‍යාංශයේ අනුමැතියක් ලබා නොගෙන සමාගම විසින් 2014 ජුනි 27 වන දින රු.17,965,749 ක මුදලකට **ටොයෝටා ලෑන්ඩ් ක්‍රෑෂර්** වර්ගයේ ජීප් රථයක් මිලදී ගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත එය 2019 අගෝස්තු මාසයේ සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරියට රු.100,000 ක මාසික කුලියකට ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව, සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගමේ අරමුදල් භාවිතා කළ යුතුය. | මෙම ජීප් රථය එවකට සභාපතිවරයාගේ නිල අවශ්‍යතාවය මත මිලදී ගෙන පසුව 2016 වසරේ තේරී පත් වූ නව සභාපතිවරයාට නිල වශයෙන් පිරිනැමූ නමුත් ඔහු එම ජීප් රථය භාවිත නොකළ නිසා සමාගමේ මව් සමාගම වූ නාගරික සංවර්ධන අධිකාරියේ එවකට සභාපතිවරයාගේ භාවිතය සඳහා 2019 ජනවාරි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය | වර්තමානයේ නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති සමාගමේ සභාපතිවරයෙකු ලෙස ක්‍රියා කරන බැවින් සමාගම වෙත මාසිකව වාහන කුලිය ලෙස ගෙවීම 2021 දෙසැම්බර් මාසයේ සිට නතර කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇතිව සාධාරණ කුලී පදනමක් මත ලබාදී තිබුණි. | |
| (උ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 8.2.3 වගන්තිය පරිදි සමාගමක ආයෝජනය කර ඇති රු. 5,471,978 ක් සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධානවලට සමාගම අනුකූල විය යුතුය. | ඕනාලි හෝල්ඩිංග්ස් හි කළමනාකාර අයිතිය ලබා ගැනීමට තවත් පොදු සමාගමක් උත්සාහ කළේය, අවදානම අවම කිරීම සඳහා නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) සමාගම ඕනාලි හෝල්ඩිංග්ස් හි කොටස් මිලදී ගත්තේය. | 2022 මාර්තු 14 වන විටත් මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි |
| (ඌ) | 2013/14 සහ 2014/15 තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු ගිණුම්ගත නොකළ ආර්ථික සේවා බද්ද රු. 2,668,338 ක් වූ අතර, එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු අගය එකතු කළ බද්දෙන් හිලව් කිරීමට ඉල්ලා ඇතත්, ඒ සඳහා තීරණයක් ලබා දී නොමැති විට, ලැබිය යුතු ආර්ථික සේවා බදු ගිණුමට එම අගය හර කර ගෙවිය යුතු ආදායම් බදු ගිණුමට ගැලපීමෙන් පසුව **2020** මූල්‍ය ප්‍රකාශයේ සඳහන් කර තිබුණි. | සමාගම ආදායම් බදු පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් එකඟ වූ පරිදි 2013/14 සහ 2014/15 වසර සඳහා සමාගම ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බැවින් සහ එම පදනම මත, ආර්ථික සේවා බද්ද ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩු කර ජංගම වත්කමක් ලෙස ශේෂ පත්‍රයේ පෙනවා ඇත. | 2022 මාර්තු 13 වන විටත් ගැටලුව විසඳී නොතිබුණි. |
| (එ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා ඇති රු. 85,409,990ක අගය එකතු කළ අගය මත බද්ද (VAT) වසර ගණනාවක සිට ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල | දිගුකාලීන ශේෂයන් විශ්ලේෂණය කර පියවීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල් ආපසු ගෙවීම සම්බන්ධයෙන් සාකච්ඡා කඩිනම් කර මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | 2022 මාර්තු 31 වන විටත් ගැටළුව විසඳී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගිණුම්ගත කර තිබූ අතර 2020 වසර අවසානයේදීත් එම හර ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඒ) | යෝජිත සංවර්ධන සැලසුම් 44ක කාර්යයන් ඉටු කිරීමට සහ උපදේශන සේවා සැපයීමට නාගරික සංවර්ධන අධිකාරිය සමාගම සමඟ 2019 වර්ෂයේදී ගිවිසුමකට එළඹ ඇත, අදාළ උපදේශන සහ මාර්ගෝපදේශ සේවාවන් අධිකාරියට ලබා දී නොතිබුණද, එම කාර්යය වෙනුවෙන් කළමනාකරණ ගාස්තු ලෙස සමාගම විසින් රු.17,082,061ක් අධිකාරියෙන් ලබාගෙන තිබුණි. | සමාගමට කළ හැකි කාර්යයන් සඳහා පමණක් ගිවිසුම්වලට එළඹිය යුතු අතර අදාළ කාර්යයන් ඉටු කර ගාස්තුව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2021 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් රු.898,011ක් මුදලක් සේවකයින් 12 දෙනෙකු සම්බන්ධයෙන් කළමනාකරණ ගාස්තු ලෙස සමාගම විසින් ලබාගෙන තිබුණි. |
| (ඔ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක. PED/12 හි 7.3 වගන්තිය සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය ප්‍රකාරව 2015 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සමාගම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. 2020 සහ පසුගිය වසර හතර සඳහා ජංගම නොවන වත්කම් මිලදී ගැනීම සඳහා රු. 20,313,474 ක් වැය කර ඇති අතර 2020/2021 වසර සඳහා සේවා ගිවිසුම් 08 ක් යටතේ රු. 28,786,980 ක් වැය කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ අනෙකුත් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. | සමාගමේ මිලදී ගැනීම්වල ස්වභාවය සහ අවශ්‍යතාවය අනුව මව් සමාගම වන නාගරික සංවර්ධන අධිකාරිය ප්‍රධාන සහ සුළු ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ඇත. | සමාගම නාගරික සංවර්ධන අධිකාරියේ පරිපාලිත ආයතනයක් වන බැවින් රු.මිලියන 01 ට වැඩි භාණ්ඩ හෝ සේවා සමාගමට මිලදී ගැනීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන අංශයේ අධීක්ෂණය යටතේ ඒවා සිදුකරන බව දන්වා තිබුණි. කෙසේ වෙතත්, |

| | | | | |
|---|---|---|---|---|
| | | | | 2022 මාර්තු 14 වන විටත් සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඔ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED/12 හි 9.2 (ආ) සහ (ඈ) ඡේද සහ 9.3.1 (1) ඡේදයට අනුව අනුමත කාර්ය මණ්ඩලයක් සකස් කර භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. සමාගම ආරම්භයේ සිටම බඳවා ගැනීමේ සහ ප්‍රවර්ධන ක්‍රමයක් සකස් කර නොතිබූ අතර 2020 දෙසැම්බර් 31 දින වන විටත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර අනුමත කර ගැනීමටත්, ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුය. | සේවක මණ්ඩලයක් සකස් කර ඉදිරියේදී ඊට අදාළ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන අතර මේ දක්වා බඳවා ගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොමැත. සීමාසහිත නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගමේ කටයුතු 11 දෙනෙකුගෙන් යුත් සීමිත කාර්ය මණ්ඩලයකින් සිදු කෙරෙන බැවින් ආයතනයේ විෂය පථය පුළුල් වුවහොත් ඉදිරියේදී ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. | සමාගම දැනට සාමාජිකයින් 11 දෙනෙකුගෙන් යුත් සීමිත කාර්ය මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබන අතර මෙම සාමාජිකයින්ගෙන් 09 දෙනෙකු නාගරික සංවර්ධන අධිකාරියේ සේවකයින් වන අතර සමාගමේ සේවකයින් දෙදෙනෙකු පමණි. එහෙත්, 2020 වර්ෂය තුළ, සමාගමේ සේවකයින් 14 දෙනෙකු නාගරික සංවර්ධන අධිකාරිය වෙත අනුයුක්ත කර ඇති අතර, 2022 මාර්තු 14 වන දින වන විටත් සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ සහ උසස්වීම් යෝජනා |


| | | | | |
|---|---|---|---|---|
| | | | | ක්‍රමය සඳහා අනුමැතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන නොතිබුණි. |
| (ක) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED/12 හි 9.4 ඡේදයට පටහැනිව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් තොරව නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 09 දෙනෙකු සමාගම වෙත නිදහස් කර ඇත. 2020වර්ෂය තුළ රු. මිලියන 9.1 මෙම නිලධාරීන්ට ගෙවා ඇති අතර,2019 වර්ෂයේදී නිලධාරීන් අට දෙනෙකු සඳහා රු. මිලියන 87ක් ගෙවා ඇත. 2018 වර්ෂයේ නිලධාරීන් අට දෙනෙකු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල දීමනාවට අමතරව රු.මිලියන 8.9 ක් ගෙවා ඇති අතර, සමාගමේ රාජකාරි ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිලධාරීන් තිදෙනෙකුට දීමනා ලෙස රු.1,150,000 ක් ගෙවා ඇත | සමාගමට අවශ්‍ය සේවක සංඛ්‍යාවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. | විධායක ශ්‍රේණියේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් සමාගමේ පරිපාලනය සහ මූල්‍ය කටයුතු සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් උපදෙස් සහ මගපෙන්වීම් ලබා දෙනු ලැබේ. ඒ සඳහා ඔවුන්ට දීමනාවක් ද ගෙවනු ලැබේ. අධ්‍යක්ෂවරුන් දෙදෙනා සඳහා මෙතෙක් රාජකාරි ලැයිස්තුවක් සකස් කර නොමැත. එමෙන්ම ආයතනයට අනුයුක්තව සේවය කළ සේවකයන් 09 දෙනා නාගරික සංවර්ධන අධිකාරිය මගින් පූර්ණ කාලීනව ආයතනයට මුදා හැර ඇති බැවින් ආයතනයේ සේවය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් අදාළ නිලධාරීන්ට ගෙවන වැටුප් ප්‍රතිපූරණය කිරීමට සමාගම කටයුතු කර ඇති අතර එය සමාගමේ වැටුප් පිරිවැයට ඇතුළත් කර ඇත. | 2022 මාර්තු 14 වන විටත් සමාගම විසින් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. |
| (ග) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු | වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ | ඉදිරියේදී සමාගමේ වාර්ෂික වාර්තා ද වෙනම | සමාගම විසින් 2022 මාර්තු 14 වන |

| | | | | |
|---|---|---|---|---|
| | චක්‍රලේඛ අංක. PED/12 හි 6.5.1 ඡේදයට අනුව, සමාගම විසින් මූල්‍ය වර්ෂය අවසාන වී දින 60ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර අවසාන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයි. එහෙත් සමාගම ආරම්භ කළ 2006 වසරේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වාර්ෂික වාර්තාවක් හෝ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාගත කිරීමට කටයුතු කළ යුතුයි. | පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත බව දන්වා සිටී. | විටත් වාර්ෂික වාර්තාවක් සකස් කර නොතිබුණි. |
| (ච) | 2018 සිට 2020 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැස්ම සමඟ යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට සහ මහා භාණ්ඩාගාරයට යොමු කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | සමාගම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල විය යුතුය. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමු. | 2022 මාර්තු 14 වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ජ) | සමාගමේ ක්‍රියාකාරකම් මැනීම සඳහා සමාගම විසින් 2019 සහ 2020 වසර සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සකස් කර නොතිබූ අතර, එම හේතුවෙන් සමාගමේ සත්‍ය සහ අපේක්ෂිත කාර්ය සාධනය විගණනයේදී | සමාගමේ අපේක්ෂිත මෙහෙයුම් මැනීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සකස් කළ යුතුය. | කාර්ය සාධන දර්ශක දැනට පූර්ණ කාලීන සේවකයින් සඳහා සංවර්ධනය කරමින් පවතින අතර ඒ අනුව අනාගතයේදී වාර්ෂිකව කාර්ය සාධනය මැනීමට අපේක්ෂා කෙරේ. | පූර්ණ කාලීන සේවකයින් සඳහා (KPIs) දැනටමත් සූදානම් කර ඇකි බව සමාගම විසින් දන්වා සිටින නමුත් 2022 මාර්තු 14 වන විටත් |

| | | | | |
|---|---|---|---|---|
| | ඇගයීමට ලක් කිරීමට නොහැකි විය. | | | සේවකයන්ගේ කාර්ය සාධනය මැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ට) | ආරම්භයේ සිටම සමාගම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර, මව් සමාගම වන නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් සමාගම විගණනය කළද 2020 වර්ෂය සඳහා විගණන දිනය වන විට එක විගණන විමසුමක් හෝ නිකුත් කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතියේ කොටසක් ලෙස අභ්‍යන්තර විගණන කාර්යයන් ඵලදායී ආකාරයෙන් සිදු කළ යුතුය. | මෙම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා 2020 සහ 2021 වසර සඳහා අභ්‍යන්තර විගණන කටයුතු සිදු කෙරේ. | නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනය සිදු කර ඇත. නමුත් 2022 මාර්තු 14 වන විටත් සමාගම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ඩ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක. PED/12 හි 7.4.1 වගන්තියට අනුව, විගණන හා කළමනාකරණ කමිටුව සෑම මාස තුනකට වරක්, වසරකට හතර වතාවක් රැස්විය යුතු වුවද, සමාගම ආරම්භයේ සිට විගණිත දිනය දක්වා කිසිදු විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව විගණන කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. | විගණන කමිටු පිහිටුවීමට සහ පැවැත්වීමට කළමනාකරණ පත්‍රිකාවක් කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත ඉදිරියේදී ඉදිරිපත් කරනු ලැබේ. කෙසේ වෙතත්, සමාගමේ අනාගත ක්‍රියාකාරිත්වයේ ස්වභාවය සහ නීතිමය අවශ්‍යතා සලකා බලා භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු පැමිණීමෙන් පසු විගණන කමිටුව පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. | 2022 මාර්තු 31 දින වන විටත් සමාගම විසින් විගණන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. |

## 4.35 සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 30,961,535 | 22,585,675 | 62,558,133 | 90,192,402 | 8,375,861 | වියාචනය |
| **2019** | 33,934,120 | 23,727,143 | 69,177,280 | 88,195,669 | 10,206,977 | වියාචනය |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 30.96 | 22.59 | 62.56 | 90.19 | 8.38 |
| 2019 | 33.93 | 23.73 | 69.18 | 88.20 | 10.21 |
| 2020 | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත - 16 හි 81 ඡේදයට අනුව, මෙහෙයුම් කල්බදු ක්‍රමයට ලැබෙන ආදායම සෘජු රේඛා ක්‍රමය හෝ වෙනත් ක්‍රමානුකූල පදනමක් මත හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, 2019 ජූලි 10 | ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුව කුලී ආදායම හඳුනාගත යුතුය. | මෙය වසර 10ක කාලයක් පුරා ක්‍රමක්ෂ කළ බැවින්, ජර්නල සටහන් 2019 සඳහා පමණක් තබා ඇති අතර, එය නිවැරදි කරනු ලැබේ. | මෙම ගැටළුව නිවැරදි කර ඇති බව සමාගමට දන්වා තිබුණද, 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2022 මාර්තු 16 වන දින වන විටත් විගණකාධිපතිවරයා |

| | | | | |
|---|---|---|---|---|
| | වන දිනට වසර 10 ක කාලයකට කුලියට ලබා දුන් තානායම් 3 කින් ලැබුණු රු.2,787,000 ක මූලික මුදල කුලී කාලය පුරාවට ක්‍රමානුකූල පදනමින් හඳුනා ගැනීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2019 වර්ෂයේ ලාභය ප්‍රමාණය වැඩි කර දක්වා තිබුණි. | | | වෙත ලබා දී නොතිබුණි. |
| (ආ) | LKAS - 37 අනුව, සමාගම විසින් ආරම්භ කරන ලද නීතිමය ක්‍රියාමාර්ග සහ සමාගමට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළි කළ යුතුය. කෙසේ වෙතත්, 2009 නොවැම්බර් සිට 2017 නොවැම්බර් දක්වා කාලය සඳහා වැලිගම තානායම කුලියට ගත් තැනැත්තාට එරෙහිව සමාගම විසින් පවරා ඇති නඩුව සහ 2009 නොවැම්බර් සිට 2017 නොවැම්බර් දක්වා කාලය සඳහා කුලියට ගත් මීගමුව (පැරණි) තානායමේ කුලීකරු විසින් සමාගමට එරෙහිව පවරා ඇති නඩුව, 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි. | ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව නීතිමය වගකීම් අවශ්‍ය පරිදි හෙළිදරව් කර අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | මෙම ගැටළුව නිවැරදි කර ඇති බව සමාගමට දන්වා තිබුණද, 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය 2022 මාර්තු 16 වැනි දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ලබා දී නොතිබුණි. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත සහ උපකරණ රු.10,289,128 ක් දක්වා තිබුණද, 2011 වර්ෂයෙන් පසුව | සමාගමට අයත් සියලුම වත්කම් සත්‍යාපනය කිරීමට ක්‍රියා කළ යුතු අතර | සමාගම වත්කම් ලේඛනයක් පවත්වා නොතිබූ අතර 2011 ට පෙර වර්ෂයට අදාළ | මෙම ගැටළුව නිවැරදි කර ඇති බව සමාගම දන්වා තිබුණද, 2022 මාර්තු 16 වන විට වත් |

| | | | | |
|---|---|---|---|---|
| | මිලදී ගත් වත්කම් පමණක් එම මුදලට ඇතුළත් කර ඇත. 2011 වසරට පෙර අත්පත් කරගත් වත්කම් ද සමාගම සතු බවත් තානායම් ඇතුළු අනෙකුත් වත්කම් දැනටමත් පවතින බවත් සමාගමේ කළමනාකාරිත්වය පිළිගෙන තිබුණි. එහෙත් එම වත්කම් නැවත තක්සේරු කර ගිණුම්වලට ගෙන ඒමට කටයුතු කර නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට සමාගම සතු වත්කම්වලට අදාළ වත්කම් ලේඛනයක් සවිස්තරාත්මකව සහ යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඒවා වත්කම් ලේඛනයකට ඇතුළත් කර එම තොරතුරු සවිස්තරාත්මකව හා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. | තොරතුරු සැපයිය නොහැක. | වත්කම් ලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 2019 වර්ෂයේ මහියංගනය තානායම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගෙවිය යුතු වියදම රු.3,194,655 ක් වූ අතර එම ශේෂය වියදමක් ලෙස හෝ ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් සහ වගකීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. | 2019 වර්ෂයේ වැඩ කරමින් පවතින බව සඳහන් කරමින් නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා වියදම් ජර්නල සටහනක් හරහා ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. | ගැටලුව විසඳීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඉ) | තානායම්වලින් ලැබිය යුතු ආදායම 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.1,499,047 කින් වැඩි කර දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල වසරේ ලාභය සහ වෙළඳ ණය ගැතියන් එම වටනාකමින් වැඩි කර දක්වා තිබුණි. | ලැබිය යුතු ආදායම නිවැරදිව හඳුනාගත යුතුය. | සමාගම ණයගැති ලෙජරයක් නඩත්තු කර නොතිබුණි. කෙසේ වෙතත්, සැබෑ තොරතුරු සැපයීම සඳහා, පියවර ගෙන ඇත. | නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක වෙමින් පවතින බව සමාගම දන්වා තිබුණද, 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | පළාත් පාලන ආයතන සතු තානායම් කළමනාකරණය කිරීමෙන් සමාගම උපයන ආදායම මත පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු රු.3,668,269 ක් වූ එකතු කළ අගය මත බදු ශේෂය 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ලැබුණු ආදායමෙන් අදාළ වගකීම් අඩු කිරීමෙන් පසු ශුද්ධ ආදායම පමණක් ආදායම ලෙස හඳුනාගත යුතුය. | මෙය ගිණුම් වලින් සම්පූර්ණයෙන්ම මග හැරී ඇති අතර නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක වෙමින් පවතින බව සමාගම දන්වා තිබුණද, 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2019 වර්ෂය තුළ කතරගම තානායමේ ස්ථාවර වත්කම් අපහරණය කිරීම පිළිබඳව දන්වා තිබුණද, අපහරණ කිරීමේ අධිකාරිය ලබා ගැනීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර නොතිබුණි. (අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි) මූල්‍ය ප්‍රකාශනවල ද අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි. | අපහරණ වලින් සමාගමට උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා කළමනාකාරිත්වය විසින් අවශ්‍ය පද්ධතිය සහ පාලන ක්‍රියා පටිපාටි හඳුන්වා දිය යුතුය. | බොහෝ වත්කම් නිල වශයෙන් මහියංගනය තානායම වෙත පවරා දී ඇති අතර ඉන් අනතුරුව එම වත්කම් වෙන්දේසි කර තිබුණි. | මෙම ගැටළුව නිවැරදි කර ඇති බව සමාගම දන්වා තිබුණද, 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය 2022 මාර්තු 16 වන දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ලබා දී නොතිබුණි. |
| (ඌ) | රු. 4,152,161 ක බොල් ණය ගණනය කිරීම් පිළිබඳ විස්තර සහ ආදායම් බදු පිළිබඳ සවිස්තරාත්මක උපලේඛන සහ ගණනය කිරීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයට තොරතුරු සැපයීමට කටයුතු කළ යුතුය. | ගණනය කිරීම් විස්තර සඳහා ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණද, 2019 වසර සඳහා එය පවත්වාගෙන යාමට කටයුතු කිරීමට නියමිතය. | 2022 මාර්තු 16 වන විටත් කිසිදු විස්තරයක් සපයා නොතිබුණි |
| (එ) | වෙළෙඳ ණයගැතියන් 2018 වර්ෂයේ රු. 4,836,103 ක ශේෂයක් සහ 2019 වර්ෂයේ රු.10,352,823 ක ශේෂයක් සහ වසර 1 සිට 5 දක්වා | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | ණය ගැතියන්ගේ අයකර ගැනීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් |

| | | | | |
|---|---|---|---|---|
| | කාලසීමාවක් සඳහා වන අනෙකුත් ණය ගැතියන් රු.6,673,529 ක ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඒ) | 2019 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන වෙත ගෙවිය යුතු රු.21,125,835ක මුදල නියමිත කාල සීමාව තුළ ගෙවා නොතිබුනු බව නිරීක්ෂණය විය. | පළාත් පාලන ආයතනවලට ගෙවිය යුතු මුදල් නීති ප්‍රකාරව ගෙවිය යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | පියවීමට කටයුතු කරමින් පවතින බව සමාගම දන්වා සිටියද, 2022 මාර්තු 16 වන දින වන විටත් කිසිදු විස්තරයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඔ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.3 වගන්තියට අනුව, රාජ්‍ය සමාගම් ද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම 2019 වර්ෂයේදී රු.8,761,999 ක් වටිනා භාණ්ඩ හා සේවා ලබාගෙන තිබුණද, 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ සමාගම විසින් අනුගමනය කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 16 දින වන විටත් ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඕ) | 1980 සැප්තැම්බර් 09 සහ 1981 දෙසැම්බර් 11 වැනි දින නිකුත් කරන ලද ගැසට් නිවේදන මත පදනම්ව පළාත් පාලන ආයතන සතු සංචාරක බංගලා සහ තානායම් 38ක් නාගරික සංවර්ධන අධිකාරියට පවරාගෙන තිබුණි. එසේම 2006 ජූලි 17 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත තානායම්වල | අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව සියලු කටයුතු සිදු කළ යුතුයි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | උපදෙස් පිළිපැද ඇති බව සමාගම දැනුම් දුන්නද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිපාලන කටයුතු සමාගම වෙත පවරා තිබුණි. කුලියට ගත් වත්කම් සහ කීර්තිනාමය ඇතුළු වත්කම් පළමු ශේෂ පත්‍රයට ගෙන ඒමටත්, පෞද්ගලික කළමනාකරණ නියෝජිතයකු පත් කර එම නියෝජිතයාට සියයට 49ක කොටස් නිකුත් කිරීමටත් කීර්තිනාමය ඇතුළු සියලු වත්කම් යළි තක්සේරු කිරීමටත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබිණි. කෙසේ වෙතත්, 2019 වසර අවසන් වන විටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි. | | | |
| (ක) | තානායම් කළමනාකරණය සඳහා ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් නමින් සමාගමක් නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ස්ථාපිත කර තිබුණද, නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් තානායම් දිගු කාලීනව කුලියට දීමට සමාගම කටයුතු කර නොතිබුණි. විශේෂයෙන්, තානායම් කළමනාකරණ අත්දැකීම් සහ මූල්‍ය හැකියාවන් ඇගයීමේදී ඉහළම ලංසුකරුවන් තෝරා ගැනීම සඳහා මිල ගණන් කැඳවීමෙන් පසු තානායම් කුලියට දී නොතිබුණි. | අවශ්‍ය පද්ධති සහ පාලන හඳුන්වාදීම මගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කළමනාකාරීත්වය ක්‍රියා කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | තානායම් කුලියට දීම සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රතිපත්තියක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ග) | 2019 වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද කාර්ය සාධන වාර්තාවක් සකස් | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමෙන් පසු අහිතකර ප්‍රතිඵල | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 16 වන විටත් කාර්ය සාධන |

| | | | | |
|---|---|---|---|---|
| | කර නොතිබුණි. එබැවින්, සිදු කරන ලද ක්‍රියාකාරකම් වර්ෂයට සම්බන්ධද නැද්ද යන්න, වර්ෂය තුළ ලබා ගත් ප්‍රතිඵල, ක්‍රියාත්මක නොකළ ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක නොකිරීමට හේතු සහ වර්ෂය තුළ ලබා ගත් අඩු ප්‍රගතියට හේතු ආදිය හඳුනා ගැනීමට සමාගම අපොහොසත් වී ඇත. | සම්බන්ධයෙන් නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. | | වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ච) | සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව තානායම් 43 ක් සමාගමේ කළමනාකාරිත්වය යටතේ පැවතුනි. ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් හි අධීක්ෂණය යටතේ පවතින තානායම් 40 කින්, 2018 සහ 2019 වර්ෂවල ලාභ ඉපැයූ තානායම් පිළිවෙලින් 30 සහ 26 ක් වූ අතර තානායම් 10 ක් සහ 14 ක් අක්‍රියව පැවතිණි. | තානායම් හා එම තානායම්වල වගකීම් සම්බන්ධයෙන් නිසි ලේඛන පවත්වාගෙන යා යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | නිෂ්ක්‍රීය තානායම් සම්බන්ධයෙන් සමාගම විසින් ගත යුතු ක්‍රියාමාර්ග 2022 මාර්තු 16 දින වන විටත් දන්වා නොතිබුණි. |
| (ජ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 9.2 වගන්තියට අනුව සේවක සංඛ්‍යාව සකස් කිරීමෙන් පසු එය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුය. එසේම, චක්‍රලේඛයේ 9.3.1 වගන්තියට අනුව බඳවා ගැනීමේ සහ උසස්වීම් පටිපාටිය සඳහා අමාත්‍යාංශයේ සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද 2019 වසර අවසාන වන විටත් | සමාගමේ සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටිය සකස් කිරීමෙන් පසු චක්‍රලේඛ උපදෙස් අනුව අවශ්‍ය අනුමැතිය ලබා ගත යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 16 වන විටත් අනුමත සේවක සංඛ්‍යා විස්තර සහ අනුමත බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටිය ඉදිරිපත් කර නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| | එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය අනුව සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | | |
| (ට) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 වගන්තියට අනුව, කෙටුම්පත් කරන ලද වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2019 වසර සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නියමිත කාල සීමාව තුළ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 16 වැනි දින වන විටත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ලබාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඩ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 12 වගන්තියට අනුව, 2019 වර්ෂය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සමාගමේ සංයුක්ත සැලැස්ම 2022 මාර්තු 16 දිනට පවා සපයා නොතිබුණි. |
| (ණ) | 2014 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 5(2) ඡේදයට අනුව, සංයුක්ත සැලැස්ම මත පදනම්ව සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. එසේම, 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.1.3 | සමාගමේ ක්‍රියාකාරකම්වලට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමෙන් පසු අනුමැතිය ලබා ගත යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 16 වන විටත් ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වගන්තියට අනුව, ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ මුදල් වර්ෂය ආරම්භ කිරීමට මාස 3කට පෙර එය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2018 වසර සඳහා කිසිදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ අතර 2019 වසර සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණි. | | | |
| (ත) | අභ්‍යන්තර විගණන අංශයක් සමාගම විසින් පිහිටුවා නොතිබුණි. නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය හරහා සමාගමේ කටයුතු විගණනය කළ හැකි වුවද එය සමාගම විසින් සංවිධානය කර නොතිබුණි. එබැවින් 2018 සහ 2019 වසර තුළ සමාගම සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | සමාගමට අභ්‍යන්තර විගණන අංශයක් නොමැති බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය හරහා අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | 2018 වසර සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශය මගින් 2019 වසරෙන් පසු අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර ඇත. නමුත් 2022 මාර්තු 16 වන විටත් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. |
| (ද) | 2018 සහ 2019 වර්ෂවලදී සමාගම විසින් විගණන කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | විගණන කමිටු පැවැත්වීමට කටයුතු කළ යුතුයි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2012 මාර්තු 10 වන විටත් සමාගම විසින් විගණන කමිටුවක් පවත්වා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (න) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.2.4 වගන්තියට අනුව, සමාගමේ අයවැය අදාළ මූල්‍ය වර්ෂය ආරම්භ වීමට මාස 3කට පෙර අනුමත කළ යුතු අතර, 2018 සහ 2019 වසර සඳහා අයවැය ලේඛනය එසේ අනුමත කර නොතිබුණි. | වාර්ෂික අයවැය සකස් කිරීමෙන් පසු අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | එය නිවැරදි කර ඇති බව සමාගම විසින් දන්වා තිබුණද, 2022 මාර්තු 16 වන විටත් මෙම වසර සඳහා අනුමත අයවැයක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 4.36 වෝටර්ස් එජ් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 1,402,717,851 | 1,233,490,377 | 2,553,466,276 | 1,360,907,505 | 169,227,474 | තත්ත්වාගණනය කල |
| **2019** | 1,360,473,507 | 1,200,060,820 | 6,191,065,009 | 4,863,350,663 | 160,412,687 | තත්ත්වාගණනය කල |
| **2020** | 901,404,772 | 964,067,215 | 6,189,965,038 | 4,933,625,754 | (62,662,443) | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්‍ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම විසින් 2019 වසරේදී රු.මිලියන 14.7 ක වියදමින් ඔකිඩ් පැල මිලදී ගෙන වාණිජ අරමුණු සඳහා සමාගම් පරිශ්‍රයේ සිටුවා ඇත. කෙසේ වෙතත්, ඔකිඩ් ශාකවලින් | LKAS 41 අනුව හෙළිදරව් කිරීම් කළ යුතුය. | ඔකිඩ් ව්‍යාපෘතිය ආරම්භයේදීම මෙම ව්‍යාපෘතිය යටතේ වගා කරන ලද පැළවලින් කොටසක් විකිණීමට | 2022 වසරේ මූල්‍ය ප්‍රකාශනවල සිට ඉන්වෙන්ට්‍රියේ වාණිජ ජීවිත කාලය පුරාවට එවැනි |

| | | | | |
|---|---|---|---|---|
| | කිසිදු ආදායමක් උපයා නොතිබූ අතර ඇතැම් පැල හොඳ තත්ත්වයේ නොතිබූ නිසා පැල නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. කෙසේ වෙතත්, LKAS - 41 පරිදි මේ පිළිබඳ කිසිදු අනාවරණයක් සිදු කර නොතිබුණි. | | තීරණය කළ නමුත් එය සාර්ථක වූයේ නැත. එසේම, මෙම ශාක අලංකාර අරමුණු සඳහා පමණක් භාවිතා කරන ලදී. අලංකාර කිරීම සැලකිය යුතු වක්‍ර අගයක් එකතු කරයි. ඉහත කරුණු නිසා මෙම ව්‍යාපෘතිය වෙනම ජීව විද්‍යාත්මක වත්කමක් ලෙස හඳුනාගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. | ඉන්වෙන්ට්‍රි ලාභ අලාභ ගිණුමට එරෙහිව අය කළ යුතු බව සමාගම දන්වා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) විසින් ඉදිකරන ලද දුම්රිය ආපන ශාලාව 2018 පෙබරවාරි 28 වන දින ක්‍රියාත්මක කිරීම සඳහා සමාගමට පවරා ඇත. SLLDC හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ ඇති අදාළ ලේඛනය අනුව, 2019 සහ 2020 වර්ෂ සඳහා පිළිවෙලින් රු. මිලියන 130.8 ක් සහ රු. මිලියන 122.1 ක් SLLDC වෙත ගෙවිය යුතුව ඇති අතර මේ සම්බන්ධයෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන කිසිවක් සපයා නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ සඳහා ප්‍රතිපාදන සකස් කිරීමට කටයුතු කළ යුතුය. | ආපනශාලාව සම්බන්ධයෙන් නීතිමය ගිවිසුමක් මේ වන විට සකස් කරමින් පවතින අතර ගෙවිය යුතු මුදල සහනදායී ආකාරයකට ගෙවීම සම්බන්ධයෙන් සාකච්ඡා කරමින් පවතී. ඒ අනුව, විධිමත් එකඟතාවයකට පැමිණි පසු මෙම වගකීම නිසි ලෙස ගිණුම්ගත කරනු ලැබේ. | 2021 මාර්තු 14 වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඇ) | මාස හයක් ඇතුළත ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා සමාගම 2017 දෙසැම්බර් 21 වැනි දින විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ සංවර්ධන ගිවිසුමකට එළැඹ ඇත. ඉදිකිරීම් අවසන් වූ වහාම වසර 15 ක කාලයක් සඳහා ළමා උද්‍යානයේ | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදල් යටතේ ගිණුම්ගත කළ යුතුය. | 2021 වසර දක්වා සමාගමට ලැබිය යුතු සියලුම ආදායම් අයකර ගැනීමට අප සමාගම සක්‍රීය පියවර ගෙන ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. දෙපාර්ශවය අතර කාර්ය සාධන වගකීම පිළිබඳ එකඟතාවයකට | ඔවුන් ගෙවිය යුතු රු.මිලියන 10.8 මුදල අත්හැරීමට තීරණය කර ඇති බව සමාගම දන්වා ඇති නමුත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් |

| | | | | |
|---|---|---|---|---|
| | කළමනාකාරීත්වය භාර ගැනීමට සංවර්ධක සමාගම එකඟ වී ඇති අතර සංවර්ධක සමාගම විසින් ළමා උද්‍යානය ක්‍රියාත්මක කිරීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කළ යුතුය. සංවර්ධන ගිවිසුමේ 4.1 වගන්තියට අනුව සහ ගිවිසුමේ 5.1.1 වගන්තියට අනුව, කළමනාකරණ කාලය තුළ සංවර්ධක සමාගම විසින් සමාගමට රු. 600,000 ක මාසික කුලියක් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේ දී සංවර්ධකය සමාගමෙන් ලැබිය යුතු රු. මිලියන 10.8ක මුදල සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. | | පැමිණීමෙන් පසු ගිණුම් නිසි පරිදි වාර්තා කරන බව ප්‍රකාශ කරමි. | ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 චක්‍රලේඛය අනුව අනුමැතිය ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් රු.7,541,733 ක් වූ බොල් ණය 2018 වර්ෂයේ දී ලියාහැර තිබුණි. | PED/12 හි විධිවිධාන අනුව බොල් ණය ලියාහැරීම සිදු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 මාර්තු 31 වන විටත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි |
| (ඉ) | රු.22,078,073 ක හානිකරණ සම්බන්ධයෙන් ගණුදෙනුකරුවන් අනුව විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | බොල් ණය අඩු කර ගැනීමට කටයුතු කළ යුතුයි. | වර්ෂයේ හිඟ ශේෂය රු.22,078,073 ක් වන අතර ඉන් වැඩි ප්‍රමාණයක් රජයට අනුබද්ධ පාර්ශව දෙකකින් සමන්විත වේ. එනම් ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් රු.10,805,048 ක් සහ ශ්‍රී | 2022 මාර්තු 14 වන දින වන විට සමාගම විසින් කිසිදු විස්තරයක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් රු.4,159,986 ක් බැගින් මුළු මුදල රු.14,965,035 කි. මෙම අගය වසර තුළ ණය ගැතියන්ගේ වටිනාකමෙන් 68% කි. ණය අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පාර්ශ්වවලින් ලැබුණු ප්‍රතිචාරය අවිනිශ්චිත වූ නිසා ඒ සඳහා මුදල් වෙන් කරන ලදි. 2018 සිට, IFRS-09 ණයගැති ශේෂයන් සම්බන්ධයෙන් හානිකරණ අලාභය සඳහා ප්‍රතිපාදන ගණනය කර ලද අතර, දින 365 ඉක්මවන ණය ගැතියන් සඳහා වැඩි ප්‍රතිපාදන වෙන් කර යුතුය. එබැවින්, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මුළු ණයගැති ශේෂය වන රු.27,842,273 න් 73% ක්ම දින 365 ඉක්මවන ණයගැති ශේෂයන් වීම ඉහළ ප්‍රතිශතයක් ලැබීමට හේතු විය. | |
| (ඊ) | ඉඩම් සංවර්ධන සංස්ථාවට ලබා දී ඇති සේවාවන්ට අදාළව එම සංස්ථාවෙන් ලැබිය යුතු රු.1,561,148 ඇතුළුව ලැබිය යුතු රු.7,541,733 ක ශේෂයක් බොල් ණය ලෙස ලියාහැරීමට කටයුතු කර තිබුණි. ලියාහැරීම සඳහා | ණය සීමාවන් තුළ විධිමත් ගිවිසුම්වලට එළඹීමෙන් පසුව පමණක් සේවා සැපයීම සිදු කළ යුතුය. බොල් ණය | පිළිතුරු ලබා දී නොතිබුණි. | 2022 වසර තුළදී අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව සමාගම දන්වා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2019 මාර්තු 14 දින ලබා දී තිබුණි. නිසි ගිවිසුමකින් තොරව හෝ අත්තිකාරම් ලබා නොගෙන ඉඩම් සංවර්ධන සංස්ථාවට සේවා සැපයීම මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව විය. එසේම, 2018 වර්ෂයේදී රු.5,159,986 ක් වටිනා තවත් සේවාවක් එම සංස්ථාවට සපයා ඇති අතර එයින් රු.3,664,986 ක මුදලක් 2019 දෙසැම්බර් 31 දින දක්වා සමාගම වෙත ලැබී නොතිබුණි. | ලියාහැරීමට පෙර අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | | |
| (උ) | විධිමත් සේවා ගිවිසුමකට එළඹීමකින් තොරව වාචික ගිවිසුමක් මත Lion Bruawary සමාගමට විකුණුම් ප්‍රවර්ධන සේවා ලබා දී ඇති අතර එම සේවා සඳහා ලැබිය යුතු මුදලින් රු.3,440,904 ක මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන ලියාහැර තිබුණි. එසේම, තවත් ලැබිය යුතු රු.2,000,000 ක අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි. | ගිවිසුමකට එළැඹීමෙන් තොරව සේවා සැපයීම සහ ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි | 2022 මාර්තු 14 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඌ) | 2019 සහ 2020 වර්ෂයන්හි රාජ්‍ය ආයතන 04කින් ලැබිය යුතු පිළිවෙළින් රු. මිලියන 16.9 ක් සහ රු. මිලියන 16.6ක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඉහත ආයතනවල මූල්‍ය | සමාගමට නිසි ණය ප්‍රතිපත්තියක් තිබිය යුතු අතර නියමිත වේලාවට ණය ආපසු අයකර ගැනීම සඳහා පසු | රාජ්‍ය අංශයේ ණය ගැතියකු වන ආයුර්වේද දෙපාර්තමේන්තුවට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේ. ඉඩම් ගොඩකිරීමේ හා | 2022 මාර්තු 14 දින වන විටත්, මෙම ලැබිය යුතු මුදල් සමාගම විසින් අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශනවල එවැනි ශේෂයන් පෙන්නුම් කර නොතිබුණි. | විපරම් ක්‍රියාමාර්ග ගත යුතුය. | සංවර්ධනය කිරීමේ සංස්ථාව සමඟ ගිවිසුම්ගත වීමේදී එම මුදල අඩු කරන ලෙස දුම්රිය අවන්හලට උපදෙස් දී ඇත. | |
| (එ) | එළිමහන් රංග ශාලාවක් ඉදිකිරීම සඳහා Green Leaves Entertainment (Pvt) Limited සමඟ 2016 නොවැම්බර් 06 වන දින සමාගම ගිවිසුමකට එළඹුණි. ගිවිසුමට අනුව 2018 සැප්තැම්බර් 01 දින සිට කොන්ත්‍රාත්කරු රු.3,000,000ක අවම මාසික කුලියක් ගෙවිය යුතුය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට සමාගමට ලැබිය යුතු රු.84,000,000ක මුළු කුලී ආදායම ලැබී නොතිබූ අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම සහ ණය ගැතියන් තුළ එම මුදල පෙන්වා නොතිබුණි. | ආදායම් හා ණය ගැතියන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වීමට කටයුතු කළ යුතුයි. | Green Leaves Entertainment (pvt) ltd විසින් එහි ඉදිකිරීම් සඳහා වන මූල්‍ය පිරිවැය වෝටර්ස් එජ් සමාගමට ලැබෙන කුලී ආදායමෙන් පියවා ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර නිවැරදි තක්සේරුවක් ලබා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට යෝජනාව ඉදිරිපත් කර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ අවසන් තීරණ සහ අනුමැතියට යටත්ව මෙම ගණනය කිරීම් අනුව ගිණුම් ඉදිරියේදී පවත්වාගෙන යනු ඇත. | Green Leaves Entertainment (Pvt) Limited විසින් එහි දේපලක් වෝටර්ස් එජ් වෙත පැවරීමට යෝජනාවක් ඉදිරිපත් කර තිබුණි. මෙම යෝජනාව නිරීක්ෂණ සහ අදහස් සඳහා මව් සමාගම වන නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත. |
| (ඒ) | වෝටර්ස් එජ් යනු නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ණ අනුබද්ධිත ආයතනයකි. වෝටර්ස් එජ් රික්‍රියේෂන් ලිමිටඩ්, වෝටර්ස් එජ් හි අනුබද්ධිත ආයතනයක් ලෙස 2020 නොවැම්බර් 12 දින ආරම්භ කරන ලද අතර ඔටර් ඇක්වාටික් ක්ලබ් විසින් (Otter Aquatic Club) විසින් වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගම 2020 නොවැම්බර් 20 දින පවරා ගන්නා ලද්දේ වෝටර්ස් එජ් හි අධ්‍යක්ෂ | සමාගම රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | Otters Aquatic club පිහිටි භූමිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන ඇති බැවින් Otters Aquatic club හි මෙහෙයුම් සහ පරිපාලනයට සහය වීමට නාගරික සංවර්ධන අධිකාරියට හැකියාවක් නොමැත. එබැවින් Otters Aquatic club හි මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු | සමාගම 2022 මාර්තු 14 වන විටත් අනුබද්ධිත සමාගම පිහිටුවීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලයේ අනුමැතිය ඇතිව පමණි. ඔටර් ඇක්වාටික් ක්ලබ් ආයනය පිහිටි ඉඩම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වූ අතර එය සීමාසහිත වෝටර්ස් එජ් රික්‍රියේෂන් සමාගමට පවරා ගන්නා විට නාගරික සංවර්ධන අධිකාරිය සහ වෝටර්ස් එජ් ලිමිටඩ් එක්ව ඉඩම සඳහා බදු ගිවිසුමකට එළඹීමට යෝජනා කර තිබුණි. මීට අමතරව, ඔටර් ඇක්වාටික් ක්ලබ් හි වත්කම් සහ වගකීම් වෝටර්ස් එජ් සමාගම විසින් අත්පත් කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, 2003 ජූනි දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 8.2.3 වගන්තියට පටහැනිව, රේඛීය අමාත්‍යාංශයේ සහ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සහ නිර්දේශ ලබා ගැනීම වෙනුවට නව සමාගම පිහිටුවා ඔටර් ඇක්වාටික් ක්ලබ් වෙත එම සමාගමට පවරා ගැනීමට මෙම නව සමාගම කටයුතු කර තිබුණි. | | අධීක්ෂණය කිරීම සඳහා Waters Edge recreation Limited සමාගම පිහිටුවීමට තීරණය කෙරිනි. ඒ අනුව වත්කම් බැරකම් ඇතුළුව Otters Aquatic Club හි අනාගත කළමනාකරණය, අරමුදල් රැස්කිරීම් සහ භාරකාරත්වය තීරණය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය, Waters Edge Recreation Limited සහ otters Aquatic club අතර ත්‍රෛපාර්ශවික ගිවිසුමකට එළඹුණි. | |
| (ඔ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 4.1 වගන්තියට අනුව, ණයට විකුණුම් සඳහා ප්‍රතිපත්තියක් සැකසීමට සහ චක්‍රලේඛයේ උපදෙස් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර නොතිබුණි. එබැවින්, ණයට විකුණුම්, ණයට විකුණුම් සීමාවන්, විකුණුම් අනුමත කිරීමේ සීමාවන්, | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සමාගම විසින් අනුගමනය කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත ණය ප්‍රතිපත්තිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ණය එකතු කිරීමේ ක්‍රියා පටිපාටි සිදු කිරීමේදී යෙදිය යුතු ක්‍රියා පටිපාටි විශේෂයෙන් දක්වා නොමැත. මේ අනුව, ණයට විකුණුම් සිදු කිරීමේදී අවිධිමත් ක්‍රියා පටිපාටි යෙදීම සඳහා ඉඩකඩ පැවතුනි. ණය ආපසු අයකර ගැනීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවීම සහ බොල් ණය ලෙස විශාල ප්‍රමාණවලින් කපාහැරීම එවැනි ප්‍රතිපත්තියක් නොමැතිකම හේතුවෙන් සිදුවන අහිතකර තත්ත්වයන් වේ. | | | |
| (ඔ) | 2014 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 5(2) ඡේදය සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.1.3 වගන්තියට අනුව, අපේක්ෂිත වාණිජ ඉලක්ක ඇතුළුව සමාගමේ ව්‍යාපාරික සැලැස්ම මත පදනම්ව ඉදිරි වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, චක්‍රලේඛ උපදෙස් අනුව 2018 සිට 2020 දක්වා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගමේ ව්‍යාපාරික සැලැස්ම මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | 2022 වසරේ සිට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක කිරීමට නියමිතය. | 2022 මාර්තු 14 වන විටත් ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. |
| (ක) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.3 ඡේදයට පටහැනිව, ප්‍රසම්පාදන සැලැස්මක් සකස් නොකර 2020 වර්ෂය තුළදී වටිනාකම රු.109,254,182 ක් වූ වත්කම් මිලදී ගෙන ඇත. | සමාගම වැඩ/ භාණ්ඩ/ උපදේශන යනාදිය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. | 2022 සිට දේපල, පිරියත සහ උපකරණ සඳහා වෙනම ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. | 2022 මාර්තු 14 දින වන විටත් සමාගමට ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.2 ඡේදය ප්‍රකාරව, සමාගමේ සංවිධාන සටහන සහ සේවක සංඛ්‍යාව සඳහා සමාගම ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සමාගමේ සංවිධාන සටහන සහ සේවක සංඛ්‍යාව සඳහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුය. | 2022 වසරේ සිට මානව සම්පත් සැලසුම්කරණයට අදාළ මෙම ප්‍රතිපත්ති මාලාව සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. | 2022 මාර්තු 14 වන විටත් භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමත කරන ලද සේවක සංඛ්‍යාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඩ) | Flora Park Island සඳහා ඕකිඩ් පැල මිලදී ගැනීම සඳහා උද්‍යාන කළමනාකරු 2018 වසරේදී තායිලන්තයට ගොස් රු.මිලියන 8.55 කට ඕකිඩ් පැල 16,000ක් ආනයනය කර ඇත. මීට අමතරව දේශීයව ඕකිඩ් පැල 3900ක් රු.මිලියන 1.24කට මිලදී ගෙන තිබූ අතර ඕකිඩ් බීජ 6,180ක් රු.744,250කට මිලදී ගෙන ඇත. ඕකිඩ් පැල සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 10.53 කි. කෙසේ වෙතත්, කාණ්ඩ 10 කට අයත් ඕකිඩ් පැල 1,161 ක් මිය ගිය අතර, රු.මිලියන 1.7 ක වියදමක් දරා ආනයනය කරන ලද පැල 4,250 ක මල් නොපිපුණි. ඕකිඩ් වගාව නඩත්තු කිරීමට දෛනික වියදම් දැරුවද වගාව නිරෝගීව පවත්වාගෙන යාමට අපොහොසත් වී ඇත. එබැවින් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව වගාව සඳහා කරන ලද වියදම් ඵල රහිත වියදම් බවට පත්වී තිබුණි. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර අවශ්‍යතාවය තීරණය කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර නිසි කළමනාකරණ ක්‍රමයක් යොදා ගනිමින් ව්‍යාපෘති පවත්වාගෙන යා යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි | 2022 මාර්තු 14 වන විටත් ප්‍රතිලාභයක් ජනනය කර නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ජ) | නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකර හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර කන්ටේනර් කිහිපයක් එකලස් කර ස්පෝර්ට් බාර් ආපන ශාලාව (Sport Bar Restaurant) ඉදිකිරීමට රු.52,890,111 ක මුදලක් වැය කර ඇත. ඉදිකිරීම් සඳහා මුදල් යෙදවීමෙන් පසු එම ඉදිකිරීම් විකල්ප කාර්යයන් සඳහා යොදා ගැනීමට 2020 සැප්තැම්බර් 03 වැනි දින තීරණය කර තිබුණේ එම ඉදිකිරීමට එරෙහිව සාමාන්‍ය ජනතාවගෙන් විරෝධයක් එල්ල විය හැකි බව පවසමිනි. කෙසේ වෙතත්, 2021 මාර්තු දක්වා, එය විකල්ප කාර්යයක් සඳහා භාවිතා කර නොතිබුණි. 2020 වසරේ සිදු කරන ලද භෞතික පරීක්ෂණයේදී, අවන්හල සඳහා මිලදී ගත් ගෘහ භාණ්ඩ, වැසි ජලය අවන්හලට කාන්දු වීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව ඇති බව නිරීක්ෂණය විය. | ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමෙන් පසුව පමණක් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි | ප්‍රශ්නය නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ට) | සමාගම විසින් රු. 80,000,000 ක මුදලකට අක්කර 01 රූඩ් 03 ක් සහ පර්චස් 34.02 ක ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරියෙන් වසර 20 ක බදු පදනම මත 2018 සැප්තැම්බර් 21 දින ලබා ගත් අතර, ඉඩම සංවර්ධනය කිරීම සඳහා සමාගම විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ ඉදිකිරීම් සංවර්ධන ගිවිසුමක් 2018 | ගිවිසුමට අනුව ගැටලු නිරාකරණය කර ලැබිය යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | කුලී එකතු කිරීමේ සහ ගෙවීමේ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් කුලී වටිනාකම සමාගමේ ගිණුම්වල සටහන් නොවූ අතර මෙම අගයන් මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කිරීමට බලාපොරොත්තු වේ. | සීමා නිර්ණය කරන ලද පරිශ්‍රයේ මෙම පහසුකම ඇති කිරීම සඳහා සංවර්ධකයා සමඟ සාකච්ඡා කරන බව වෝටර්ස් එජ් ලිමිටඩ් දන්වා ඇති අතර වාර්තා කරන දින වන විටත් ගැටළුව විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ජනවාරි 26 දින අත්සන් කර තිබුණි. නමුත් මේ වන විට ඉඩමේ මායිම් සම්බන්ධයෙන් සංවර්ධකයා සමඟ ඇති වූ ගැටලු හේතුවෙන් සංවර්ධන කටයුතු නවතා ඇත. ඒ අනුව, සංවර්ධන ගිවිසුමේ 8.1 සහ 8.21 ඡේදවලට අනුව, 2021 අප්‍රේල් 30 වන දින වන විටත් සංවර්ධකයාගෙන් ලැබිය යුතු මුදල සමාගමට ලැබී නොතිබුණි. | | | |
| (ඞ) | පසුගිය වසර 3 සඳහා සකස් කරන ලද අයවැයවල සැබෑ ආදායම සහ වියදම් අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය. 2020 වර්ෂය තුළදී සමහර විචලනයන් සියයට 1082 සිට සියයට 210 දක්වා විය. එසේම ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වියදම් වෙන් නොකළ අතර අයවැය ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස යොදා නොගත් බව නිරීක්ෂණය විය. | අයවැය යථාර්ථවාදී ලෙස සකස් කළ යුතුයි. | අයවැයෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාග්ධන වියදම් වෙන් කර නැත. කෙසේ වෙතත්, ආයතනය විසින් ආරම්භ කිරීමට නියමිත ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරනු ඇත. | 2022 මාර්තු 14 වන විට සමාගම විසින් ප්‍රාග්ධන අයවැයක් සකස් කර නොතිබුණි. |
| (ඹ) | කාමර 48 කින් සමන්විත හෝටල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කැබිනට් අනුමැතිය හිමිව ඇත. ගිවිසුම අත්සන් නොකර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රු.මිලියන 1,288 කට කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමට 2019 සැප්තැම්බර් 18 වැනි දින ලබා දී ඇති අතර රු.මිලියන 71 ක අත්තිකාරම් මුදලක් ගෙවා ඇත. කෙසේ | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ කොන්දේසි අදාළ කර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | කාමර 48 ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින අතර කොන්ත්‍රාත්තුව පෙර කොන්ත්‍රාත්කරු වන සතුට බිල්ඩර්ස් වෙත 2021 නොවැම්බර් 10 දින ලබා දී ඇත. |

වෙතත්, අවශ්‍ය මුදල් නොමැතිකම හේතුවෙන් පසුකාලීන බිල්පත් පියවා නොතිබූ අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.5.1 (අ) වගන්තියට අනුව, වැඩ ආරම්භ කිරීමට පෙර අරමුදල් තිබේදැයි තහවුරු නොකිරීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට සිදු විය. සහ එම ඉදිකිරීම් කටයුතුවලින් සමාගමට සිදුවූ අලාභය විගණනයට පැහැදිලි කර නොතිබුණි.

## 4.37 ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 302,945,489 | 297,904,848 | 475,443,700 | 373,132,570 | 5,040,642 | තත්ත්වාගණනය කළ |
| **2019** | 234,419,965 | 283,394,104 | 804,229,379 | 747,144,004 | (48,974,138) | තත්ත්වාගණනය කළ |
| **2020** | 151,658,790 | 242,682,525 | 738,781,158 | 767,636,391 | (91,023,735) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයේ 23.17 වගන්තිය අනුව කොන්ත්‍රාත් ක්‍රමය සම්පූර්ණ කිරීම මත පදනම්ව සමාගමේ ඉදිකිරීම් | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියට අනුව, සේවාලාභියා විසින් | කොන්ත්‍රාත් ක්‍රමය අවසන් කිරීම මත ඉදිකිරීම් ආදායම හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාගම විසින් කොන්ත්‍රාත් ආදායම ප්‍රමිතයට අනුව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුවල ආදායම සහ වියදම් හඳුනාගත යුතු වුවත්, 2018, 2019 සහ 2020 වසරවල සමාගමේ කොන්ත්‍රාත් ආදායම පිළිවෙලින් රු.මිලියන 221.95 ක්, රු.මිලියන 127.46 ක් සහ රු. මිලියන 72.40 ක් ඒ අනුව හඳුනාගෙන නොතිබුණි. | සහතික කරන ලද කාර්යයන් මත පදනම්ව කොන්ත්‍රාත් ආදායම හඳුනාගත යුතුය. | | |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයේ 13.4 වගන්තිය අනුව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට ගිණුම් ගත කලයුතු වුවද සමාගම සතුව පැවති 2018,2019 හා 2020 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 13.13 ක රු.මිලියන 13.63 ක හා රු.මිලියන 13.23 ක තොගය අගයකිරීමේදී ශුද්ධ උපලබ්ධි අගය සැලකිල්ලට නොගෙන තොගය පිරිවැයට ආගණය කර තිබුනි. | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය අනුව, තොගය අගය කළ යුතුය. | පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය සංසන්දනය කර නොතිබුණි. | ප්‍රමිතියට අනුව තොග අගය කිරීමේදී ශුද්ධ උපලබ්ධි අගය සැලකිල්ලට ගැනීමට අවශ්‍ය කටයුතු කර නොමැත. |
| (ඇ) | කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරණ ප්‍රමිතයේ 2.26 (ආ) වගන්තියට අනුව හඳුනාගත් අලාභ කඩිනමින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය තුළ අලාභයක් ලෙස හඳුනාගත යුතු වුවද 2012 - | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය අනුව කොන්ත්‍රාත්තුවේ | 2020 වර්ෂය තුලදී එලෙස අසාර්ථක වූ කොන්ත්‍රාත් 6කට අදාල රු.මිලියන 6.57 ක කෙරීගෙන යන වැඩ පමණක් මූල්‍ය ප්‍රකාශන වල ගලපා අලාභ ලෙස හඳුනාගෙන තිබුණි. | අලාභ ලෙස හඳුනාගත යුතු අසාර්ථක කොන්ත්‍රාත් 7 කට අදාල රු.මිලියන 24.39ක කෙරීගෙන යන වැඩ තවදුරටත් අලාභ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුව පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | 2017 කාලපරිච්ඡේදය තුළ සමාගම විසින් ක්‍රියාත්මක කර අසාර්ථක වූ කොන්ත්‍රාත් වෙනුවෙන් දරන ලද රු.මිලියන 24.39 ක් අලාභයක් ලෙස හඳුනා ගැනීමට කටයුතු නොකර කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ ලාභය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. | අලාභය ගණනය කළ යුතුය. | | |
| (ඇ) | නාවල පෙරසවි කොන්ක්‍රීට් කර්මාන්ත ශාලාව හැර අනෙකුත් කර්මාන්තශාලා 7 සඳහා රු.මිලියන 62.25ක සෘණ දායකත්වයක් ලබාදී ඇත. විකුණුම් අඩුවීම, වෙළෙඳපොළ ඉලක්ක කරගත් අලෙවිකරණ උපාය මාර්ග ක්‍රියාත්මක නොකිරීම සහ කළමනාකරණ දුර්වලතා මෙම පාඩු සඳහා හේතු විය. තවද, ඉහත අංශවල සමාගමේ අපේක්ෂිත ආදායම 2019 සහ 2020 වර්ෂවලදී දී පිළිවෙලින් රු.මිලියන 184.78 ක් සහ රු.මිලියන 230.78 ක් වුවත් සැබෑ ආදායම රු. මිලියන 87.62 ක් සහ රු. මිලියන 14.26 ක් විය | වැඩ බිම ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | සමාගමේ නිෂ්පාදිතයන් සඳහා තිබූ ඉල්ලුම අපේක්ෂිත අකාරයෙන් ඇති නොවීම, නිෂ්පාදන පිරිවැය ඉහළ යාම, රටේ පැවති අයහපත් වාතාවරණය සහ වෙළඳපොල පිළිබඳව නිසි අධ්‍යයනයකින් තොරව ව්‍යාපාරික තීරණ ගැනීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇති බැවින් ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවන සේ කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | 2021 වර්ෂය අවසාන වන විට සමාගම විසින් අමුද්‍රව්‍ය වැඩියෙන් මිලදී ගෙන වැඩියෙන් විකුණුම් ප්‍රමාණයක් සිදු කර නාවල කර්මාන්තශාලාවේ දායකත්වය රු.මිලියන 18ක් ළඟාතරගෙන තිබුණි. නමුත් හිඟුරක්ගොඩ කර්මාන්තශාලාව වසා දමා තිබුණු අතර සෘජු දායකත්වයක් සහිත කර්මාන්තශාලා 4 හි සෘජු දායකත්ව එකතුව රු.මිලියන 2ක් පමණක් විය. |

.

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | සමාගම විසින් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර තිබුණද සාමාන්‍යාධිකාරී තනතුරක් අනුමත කර නොතිබුණි. නමුත් එම තනතුර අනුමත කර ගැනීමෙන් තොරව තනතුරට පත්කිරීමක් කර තිබුණි. | අනුමත සේවක සංඛ්‍යාව මත ඉහළ කළමනාකරණ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය. | අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් මඟින් ඉහළ කළමණාකරණ තනතුරු සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කළ යුතු වුවද සමාගම විසින් එසේ කටයුතු කර නොමැත. | 2020 වර්ෂය අවසාන වන විට සමාගම විසින් බඳවා ගැනීමේ පටිපාටියක් පිළියෙල කර තිබුණ ද සාමාන්‍යාධිකාරී තනතුරක් අනුමත කර නොතිබුණි. නමුත් එම තනතුර අනුමත කර ගැනීමකින් තොරව තනතුරට පත් කිරීමක් කර තිබුණි. |
| (ඊ) | කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 13.90 ක් වු මුණ්ඩිගල ආරණ්‍ය සේනාසනයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2016 ජූලි 20 දින සමාගම භාරගෙන තිබුණු අතර එය දින 120 ක් තුළ අවසන් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 40 ක් හා සියයට 32 ක් විය. 2020 වර්ෂය අවසානයට මෙම කොන්ත්‍රාත්තුව මඟින් සමාගමට සිදුවු අලාභය රු. මිලියන 4.79 ක් විය. | ගිවිසුම් ප්‍රකාරව වැඩ කටයුතු කරගෙන යාමටත් බිල්පත් මගින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | සේවාදායක කොන්ත්‍රාත් කටයුතු මනා කළමණාකරණයකින් සිදු කිරීමට සමාගම කටයුතු කර නොමැත. | 2020 වර්ෂය අවසාන වන විට මෙම කොන්ත්‍රාත්තුවේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 40ක් හා සියයට 32ක් වූ අතර කොන්ත්‍රාත්තුව මඟින් සමාගමට සිදු වූ අලාභය රු.මිලියන 4.79ක් වී ඇත. |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක පි.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ නියමයන්ට අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය. | අදාල නියමයන්ට අනුව සමාගම කටයුතු කර නොමැත. | 2020 වර්ෂය සඳහා ද අදාල චක්‍රලේඛය පරිදි සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. . |

## 4.38 LRDC සේවා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2,025,132,493 | 1,963,502,425 | 917,045,617 | 673,635,244 | 61,630,069 | තත්ත්වාගණනය කළ |
| **2019** | 2,188,280,130 | 2,112,017,496 | 1,010,640,643 | 712,221,497 | 76,262,634 | තත්ත්වාගණනය කළ |
| **2020** | 2,096,768,814 | 2,056,791,802 | 1,169,442,522 | 843,207,995 | 39,977,011 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | එක් එක් ණයගැති ශේෂ අයකර ගැනීමේ හැකියාව පිළිබඳ විශ්ලේෂණය නොකර, සමාගමේ අඩමාන ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තියට අනුව වර්ෂ 1-2 අතර සියයට 50 ක්ද, වර්ෂ 2-3 අතර සියයට 75 ක්ද වර්ෂ 3 ට වඩා වැඩි ණයගැතියන් වෙනුවෙන් සියයට 100ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | අනුමත ගිණුම්කරණ ප්‍රතිපත්තියකට අනුව, අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සැපයිය යුතුය. | විශ්ලේෂණාත්මකව සලකා බලා ඉදිරියේදී වඩාත් යථාර්ථවාදී පදනමක් මත අඩමාණ ණය වෙන් කිරීම සිදු කරන කිරීමට නියමිතය. | 2021 වර්ෂයේ ගිණුම්වල ද නිවැරදි කර නොමැත. |


| | | | | |
|---|---|---|---|---|
| | මේ අනුව 2018, 2019 හා 2020 වර්ෂ අවසානයට පිළිවෙලින් රු.මිලියන 63.25ක්, රු.මිලියන 33.24 ක් හා රු.මිලියන 63.56 ක ප්‍රතිපාදන සිදු කර තිබූ අතර ප්‍රතිපත්තියේ සඳහන් වූ අඩමාන ණය වෙන් කිරීමේ අනුපාතයන් හඳුනාගැනීමේ ක්‍රමවේදය විගණනයේදී ගැටළු සහගත විය. | | | |
| (ආ) | සමාගමේ ආදායම හඳුනා ගැනීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, විශ්වසනීයව මනින ලද පදනම් පිරිවැය අඩු කරමින් සමාගමේ ආදායම හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, 2018, 2019 සහ 2020 අවසානයේ විශ්වසනීය සාක්ෂි සැලකිල්ලට නොගෙන ඉන්වොයිසි සකස් කිරීම නිසා ගනුදෙනුකරුවන් විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සමාගමට පිළිවෙළින් රු.මිලියන 100.84 ක් රු.මිලියන 71.10 ක් සහ රු.මිලියන 40.31 ක් අහිමි වී තිබුණි. | සමාගම සේවාදායකයන් සමඟ ඇතිකරගෙන ඇති ගිවිසුම්වල කොන්දේසි අනුව ආරක්ෂක නිලධාරීන්ගේ සේවය යෙදවීම මත අධිභාර / දඩ මුදල් අවම කර ගැනීමට පියවර ගත යුතුය. | ගනුදෙනුතරුවන් සමඟ ගිවිසුම්ගත වීමේදී අධිභාර සම්බන්ධයෙන් වන සමාගමට අවාසිදායක කොන්දේසි ඉවත් කර නව ගිවිසුම් සඳහා එළඹීමට මේ වන විට කටයුතු කර ඇත. | 2018 වසරේ සිට 2020 වසර දක්වා ඉන්වොයිස් අගයන්ගෙන් කරනු ලැබූ අඩු කිරීම් ආයතනය විසින් හඳුනාගෙන පාලන ක්‍රියාමාර්ග තුළින් අවම කර ඇති බව දන්වා ඇත. |
| (ඇ) | ආරක්ෂක සේවාවන් සැපයීම, ආරක්ෂක විමර්ශන සහ අනෙකුත් විමර්ශන සේවා සැපයීම සමාගමේ ප්‍රධාන කාර්යයන් විය. එසේ වුවත්, ලගාකර ගැනීමට අපේක්ෂිත භෞතික හා මූල්‍ය ඉලක්කයන් දැක්වෙන ක්‍රියාකරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේම, සමාගමේ ප්‍රමුඛ කාර්යයන් වෙනුවෙන් ප්‍රධාන කාර්යසාධන දර්ශක කළමනාකරණය විසින් 2020 වර්ෂය දක්වාම පිළියෙල කර නොතිබුණි. මෙම නිසා සමාගමේ කාර්ය සාධනය විගණනයේදී නිශ්චය කළ නොහැකි විය. | මෙහෙයුම් කටයුතු වඩා ඵලදායීව කිරීමට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතුය. | කාර්යසාධනය මැනීමේදී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොමැති බව පිළිගන්නා අතර එය නිවැරදි කර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. | 2021 වර්ෂයට ද ක්‍රියාකාරී සැලැස්මක් හා කාර්යසාධන දර්ශක පිළියෙල කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2018 වර්ෂයේදි සමාගම සිය ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අත්තිඩියේ පිහිටි පර්චස් 120 ක ඉඩමක් ප්‍රධාන මව් සමාගමෙන් බදු පදනම මත රු.මිලියන 16.52 කට ලබා ගෙන තිබුණද 2019 ජුනි වන විටත් ඇස්තමේන්තු ගත වටිනාකම රු. මිලියන 200 ක් වූ එම ඉදිකිරීමට අදාළ අනුමැතින් ලබා ගැනීමට හෝ මූලික සැලසුම් සකස් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ වන විට එහි LRDC අනොන්‍යාධාර සංගමය මඟින් ආහාර සැකසුම් මධ්‍යස්ථානයක් ලෙස යොදා ගෙන ඇත. | සමාගමට සිය ප්‍රධන කාර්යාලය පවත්වාගැනීමට සමාගමට අයිති ගොඩනැගිල්ලක් නොමැති බැවින් සැලසුම්ගත පරිදි එකී ඉදිකිරීම් කටයුතු කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. | ආයතනයේ මූල්‍ය සක්‍යතාවය අනුව මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීම තාවකාලිකව නතර විය. | 2022 වසරේදී මූලික කටයුතු ආරම්භ කිරීම සඳහා රු.මිලියන 100 පමණ වන ප්‍රතිපාදන 2022 ආයතනික අයවැය තුළින් වෙන් කර ඇත. |
| (ඉ) | සමාගම 2017 වර්ෂයේදි ව්‍යාපාර විවිධාංගීකරණය මත නව ව්‍යාපාර කටයුක්තක් ලෙස CCTV කැමරා සවිකිරීමේ ව්‍යාපෘතියෙන් ඉපයීමට ඉලක්ක කළ ආදායම රු. මිලියන 75 ක් වුවද ඉපයූ සත්‍ය ආදායම රු.මිලියන 8.5 ක් වූ අතර, 2018 වර්ෂය අවසානයට ලැබූ ශුද්ධ අලාභය රු. මිලියන 2.64ක් විය. 2019 හා 2020 වර්ෂ වල කිසිදු ආදායමක් උපයා නොමැති අතර 2020 අවසානයේදී රු.මිලියන 20.93ක පිරිවැය වූ තොගයක් ඉතිරි වී තිබුණි. | නව ව්‍යාපෘති පිළිබද විධිමත් ශක්‍යතා අධ්‍යනයක් සිදුකර තීරණ ගත යුතුය. | මෙම තත්ත්වය මගහරවා ගැනීමට නව කළමනාකරණය මේ දක්වා යම් යම් තීන්දු තීරණ ගෙන ඇත. මෙම ප්‍රසම්පාදයේදී සිදු වී ඇති අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | 2020 වන විට සමාගමට CCTV අංශයේ සිදු කිරීමට කාර්යයන් නොතිබූ නිසා ඉතිරි තොගය යල් පැනීමේ අවදානමක් මතු වී තිබුණි. |
| (ඊ) | ඇස්තමේන්තුගත ශුද්ධ ලාභය තථ්‍ය ශුද්ධ ලාභය සමඟ සැසඳීමේදී 2018, 2019 හා 2020 වර්ෂ වලදී පිළිවෙලින් සියයට 54ක, 160ක හා 31ක ක විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරයකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | අයවැය ලේඛනය ඵලදායී පාලන උපකරණයක් ලෙස යොදාගත යුතුය. | යථාර්තවාදී ලෙස අයවැය සකස් කිරීමට අදාල පියවරයන් ඉදිරි වර්ෂයේදී පිළියෙල කරනු ලබන අයවැය ලේඛනයේදී ගනු ලැබේ. | පාලන උපක්‍රමයක් ලෙස ආයතනයේ අයවැය ලේඛනය යොදාගෙන ඇති බව දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | විගණනය මගින් පවත්වනු ලබන නියැදි පරීක්ෂණයේදී ඉන්වොයිස් කරන ලද සේවා මුර සංඛ්‍යාව සහ මාසය තුළ සේවය කරන ලද සේවා මුර ගණනට වඩා වැඩිය. උදාහරණයක් ලෙස, අගෝස්තු මාසයේදී සමාගම විසින් අමතර වැඩ කරන දින 6,008ක් සඳහා එම මාසය තුළ ගනුදෙනුකරුවන් සඳහා රු. මිලියන 3.52 ක් ගෙවූ වූ අතර සමාගම විසින් ඉන්වොයිසිස් කරන ලද මුදල රු. මිලියන 6.89කි. | ඉන්වොයිස් සකස් කිරීමේදී නිවැරදිව තහවුරු කර ඉදිරිපත් කළ යුතුය. | මෙහි දන්වා ඇති තත්ත්වයන් අවම කිරීමට බිල්පත් සැකසීමට අදාළව සේවා මුර වාර්තා අනුව සංසන්දනය තුළින් වැටුප් ගෙවීමට කටයුතු කරනු ඇත. | තත්ත්වය අවම කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

## 4.39 බී.සී.සී. ලංකා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 266,637,729 | 248,153,342 | 8,431,359,113 | 262,156,521 | 18,484,387 | තත්ත්වාගණනය කළ |
| **2019** | 263,478,393 | 232,820,104 | 8,472,091,580 | 272,886,241 | 30,658,289 | තත්ත්වාගණනය කළ |
| **2020** | 316,189,149 | 72,693,881 | 8,526,349,986 | 286,277,607 | 43,600,867 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2021 මාර්තු 31 දිනට ගැනුම් අත්තිකාරම් ශේෂය රු.2,503,673ක් වූ අතර එයින් වසර 11 කට වඩා පැරණි රු.1,420,474ක් වූ ශේෂයන් 32 ක් විය. මෙම හිඟ ශේෂයන් අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | රු.1.420,474 ක් වූ අත්තිකාරම් ශේෂයට අදාළ ආයතන වලට ශේෂ නිරවුල් කිරීම සඳහා ලිපි දැනටමත් එම ආයතන වලට යවා ඇත. | එම ලිපි වලට පිළිතුරු ලැබුණු පසු ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |


| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට කුලියට ලබා දී තිබූ ගබඩා වලින් ලැබිය යුතු කුලිය රු.14,968,317ක් වූ අතර එයින් වසර 10කට වඩා පැරණි රු.2,834,261ක ශේෂ පැවතුනි. මෙම හිඟ ශේෂ අයකර ගැනීමට සමාගම ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | රු.2,834,261.00 ක ගබඩා කුලී ලෙස ලැබිමට ඇති ශේෂයන් වසර 10 කට වඩා පැරණි වන අතර එම ආයතන බොහෝමයක් රජයේ ආයතන වන අතර එම ශේෂයන් නිරවුල් කිරීමට එම ආයතන සඳහා කිහිප වරක් සිහිකැඳවීම් ලිපි යවා ඇති අතර සමහර ආයතන ඉදිරියේ දී එම මුදල් ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත. | තවමත් එම ආයතන වලින් නිසි ප්‍රතිචාරයක් නොලැබුණු අතර නැවත සිහිකැඳවීම් ලිපි යවා ඇත. |
| (ඇ) | 1985, 2002 හා 2004 යන වර්ෂයන් තුල පොල් සංවර්ධන අධිකාරියෙන් රු.58,265,037 ක් හා 2003 වර්ෂයේ කළුබෝවිටියාන තේ සමාගමෙන් රු.10,000,000 ක් බැගින් ලබාගත් ණය මුදල සඳහා සමාලෝචිත වර්ෂය වන විට ගෙවිය යුතු පොලිය පිළිවෙලින් රු.53,153,819 ක් හා රු.48,382,429 ක් වූ අතර ඒ වෙනුවෙන් වාර්ෂිකව රු.6,747,521 බැගින් ගෙවිය යුතු පොලී සඳහා වෙන් කිරීම් කර තිබුණද රු.169,801,285 ක් වූ ඉතිරි ණය හා පොලී මුදල් නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | ණය හා පොලී නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | පොල් සංවර්ධන අධිකාරියට සහ කළුබෝවිටියාන තේ සමාගමට ගෙවිය යුතු ණය සහ පොලී ගෙවීමට අධිකරණ අමාත්‍යාංශයට පැවරූ ඉඩම වෙනුවෙන් ලැබිමට නියමිත වන්දි මුදලින් තීරණය කර ඇත. කළුබෝවිටියාන සමාගමට ගෙවිය යුතු ණය වාරික ලෙස ගෙවීමට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කළත් එම සමාගම ඊට එකඟ නොවිය. | අධිකරණ අමාත්‍යාංශයට පැවරූ ඉඩමේ තක්සේරු කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින අතර වන්දි මුදල් ලැබූ විගස ඉහත හිඟ මුදල් ගෙවීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | වර්ෂ 14කට වැඩි කාලයක සිට පැවත එන එකතුව | දිගුකාලීනව පැවත එන | ගෙවිය යුතු සියළුම ණය හිමි ශේෂ, වරිපනම් බදු හා | කොළඹ නගර සභාවට ගෙවීමට ඇති වරිපනම් |

| | | | | |
|---|---|---|---|---|
| | රු.58,296,534ක් වූ ගෙවිය යුතු වරිපනම් බදු, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, භාණ්ඩ හා සේවා බදු, වැට් බදු ශේෂ හා වසර 10කට වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.12,976,524ක ණයහිමි ශේෂ නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | නිරවුල් නොකළ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අනෙකුත් බදු ගෙවීමට ඉඩම සඳහා ලැබෙන වන්දි මුදලින් ගෙවීමට තීරණය කර ඇත. | බදු මුදල අධිකරණ අමාත්‍යාංශය අප වෙනුවෙන් ගෙවා ඇත. |
| (ඉ) | වසර 15 කට වැඩි කාලයක සිට පැවත එන ගොඩනැගිලි කුලියට දීමේදී මූලික තැන්පතු ලෙස ලබා ගන්නා ලද රු.1,949,142ක තැන්පතු නිදහස් කිරීමට හෝ අදාල තැන්පතු ඉල්ලුම් නොකරන බව තහවුරු කර ගැනීමෙන් පසු සමාගමේ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉල්ලීම් නොලැබෙන්නේ නම් ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. | විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි එම ආයතන වලින් ඉල්ලීම් ලිපි නොලැබෙන බව තහවුරු කර ගැනිමෙන් පසු සමාගමේ ආදායමක් ලෙස රු.1,949,142 තැන්පතු මුදල ගැනිමට කටයුතු කරනු ඇත. | ඉදිරි අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට සූදානම් වේ. |
| (ඊ) | සමාගම විසින් පොල් තෙල් සැපයුම්කරුවන්ගෙන් ලබාගෙන කුඩා ටැංකි කිහිපයක ගබඩා කර තබා පෙරීමකට ලක් කර සුදු පොල් තෙල් ලෙස බෝතල් කිරීම සිදුකරනු ලබන අතර Cooks Joy තෙල් පමණක් පිරිපහදු ක්‍රියාවලියකට ලක් කරනු ලබයි. සමාලෝචිත වර්ෂයේදී මෙසේ සුදු පොල් තෙල් හා Cooks Joy තෙල් මෙ.ටොන් 311.50ක් නිෂ්පාදනය කර තිබූ අතර අතර එහි ආදායම රු.193,856,378 ක් විය. දැනට සමාගම විසින් සීමිත සැපයුම්කරුවන් කිහිප | උපරිම ආර්ථික වාසි ලබාගැනීමට හා ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | දැනට බී සී සී ලංකා සමාගම තුල ස්ථාපනය කර ඇති පොල්තෙල් පිරිපහදු අංශය වැඩි දියුණු කිරීමට නිතීමය බාධා ඇති බැවින් තිබෙන තත්ත්වය අනුව නිෂ්පාදන කටයුතු කරගෙන යයි. | පිරිපහදු අංශය වැඩි දියුණු කිරීමට විශාල මුදලක් අවශ්‍ය බැවින් අධිකරණ අමාත්‍යාංශයට පැවරූ ඉඩම වෙනුවෙන් ලැබෙන වන්දි මුදලින් නවීන පන්නයේ පොල්තෙල් නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් සහ පිරිපහදු අංශයක් වෙනත් භූමියක ඉදිකිරීමට අධ්‍යක්ෂක මණ්ඩලයේද අවධානය යොමු වී ඇත. නමුත් ඒ සඳහා විශාල මුදලක් අවශ්‍ය බැවින් ඉඩම වෙනුවෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | දෙනෙකුගෙන් පොල් තෙල් ලබාගෙන බෝතල් කිරීම පමණක් සිදු කරනු ලබයි. එහෙත් නිෂ්පාදනයේ මූලාරම්භය වන පොල්තෙල් නිෂ්පාදනයේ සිට අලෙවිය දක්වා දිවෙන පුළුල් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට සමාගමේ අවධානය යොමු වී නොතිබුණි. | | | ලැබෙන වන්දි මුදලින් එය කිරීමට බලාපොරොත්තු වේ. |
| (උ) | බී.සී.සී සමාගමට අයත් අක්කර 12 රූඩ් 3 පර්චස් 8.77ක් වූ භූමි ප්‍රමාණය 2013 වර්ෂයේ දී රු.මිලියන 8,195 කට තක්සේරු කර තිබුණි. 2015 දෙසැම්බර් 17 දිනැති අංක. 15/1874/702/010-VII දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සහ 2016 අප්‍රේල් 20 දිනැති අංක. 16/0597/731/009-I දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මෙම ඉඩමෙන් අක්කර 6ක බිම් කොටසක් කොළඹ අධිකරණ පියස ඉදිකිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණද, රජයේ ඉඩම් අත්පත් කර ගැනීමේ පටිපාටිය අනුව ඉඩම් පැවරීම හා වන්දි ලබා ගැනීමේ කටයුතු මේ දක්වා නිමවී නොතිබුණි. | වන්දි ලබා ගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය | අධිකරණ පියස ඉදි කිරීම සඳහා පැවරූ අක්කර 06ක බිම් කොටස වෙනුවෙන් ලැබිය යුතු වන්දි මුදල් ලබා ගැනිම සඳහා අවශ්‍ය කටයුතු ප්‍රාදේශිය ලේකම්තුමා මගින් සිදු කරනු ලබයි. | එම අක්කර 06 හි තක්සේරු වාර්තාව ලබා ගැනිම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් තක්සේරු දෙපාර්තමේන්තුවට මේ වන විට භාර දී ඇත. දැනට එම තක්සේරු කටයුතු නිම වෙමින් පවතී. |

## 4.40 ලංකා පොස්පේට් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 564,935,103 | 536,271,853 | 891,637,547 | 117,077,974 | 28,663,250 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 546,327,194 | 532,847,032 | 948,648,519 | 117,270,430 | 13,480,162 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 780,000,404 | 629,417,936 | 1,099,694,171 | 155,821,863 | 150,582,468 | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | රු.71,447,853ක් වූ ණයගැති ශේෂය තුළ වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතියේ වසර 3කට වැඩි කාලයක සිට හා එප්පාවල පොස්පේට් සමාගමේ වසර 6කට වැඩි කාලයක සිට පැවත එන පිළිවෙලින් රු.1,487,567ක හා රු.10,100,566ක | දීර්ඝ කාලයක සිට පවතින බැර ශේෂයන් නිරවුල් කිරීමට හා අදාළ ණයගැති ශේෂය අයකර ගැනීමට | සියළු විකිණීම් මුදල් ලබා ගැනීමෙන් පසු ක්‍රියාත්මක කිරීමටත්, ණය පදනම මත භාණ්ඩ ලබා ගැනීමට අපේක්ෂා කරන ගණුදෙනුකරුවන් විසින් ඊට සමාන පිළිගත් බැංකු | රු.මිලියන 1.4 ක ප්‍රමාණය ක්‍රමිකව අයකර ගැනීම, නොගෙවන ගණුදෙනුකරුවන්ට නඩු පැවරීමට කටයුතු කිරීම, රු.මිලියන 8.7 හිඟහිටි ණය ගැති වටිනාකම, |

| | | | | |
|---|---|---|---|---|
| | ණයගැති ශේෂයන් පැවති අතර මෙම ණය ශේෂයන් අයකර ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. මෙම ණයගැති ශේෂයට වර්ෂ කිහිපයක සිට පැවත එන රු.550,000 ක බැර ශේෂ හා 2005 වර්ෂයේ සිට පැවත එන මුදලට විකුණුම් රු.2,475,958 ක ශේෂයන් ඇතුළත් කර තිබුණි. මෙම බැර ශේෂ හා ඉහත සඳහන් මුදලට විකුණුම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් විය. | කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. | ඇපකරයක් හෝ මුදල් තැන්පතුවක් ලබා දීම අනිවාර්ය කිරීම. | අධ්‍යක්ෂ මණ්ඩලයේ හා විගණන හා කළමනාකරණ රැස්වීමේ දී සාකච්ඡා කොට අදියර කිහිපයක් යටතේ, ණය ගැති වටිනාකම් වල ස්වභාවය හා ප්‍රමාණය සැළකිල්ලට ගෙන ගිණුම් වලින් ලියා හැරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | 2014 පෙබරවාරි 14 දින ආරම්භ කරන ලද පොල් පොහොර ව්‍යාපෘතිය සඳහා රු.21,226,633 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණ අතර ව්‍යාපෘතිය මඟින් වාර්ෂිකව රු. මිලියන 72 ක පොල් පොහොර ආදායමක්, රු.මිලියන 10 ක ශුද්ධ ලාභයක් හා වාර්ෂිකව ආදායම සියයට 10 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂා කර තිබුණි. තවද පොල් පොහොර වෙළඳපලෙන් සියයට 10ක වෙළඳපල කොටසක් අත්පත් කර ගැනීම දිගුකාලීන අරමුණ වී තිබුණි. එසේ වුවද 2020 මැයි සිට නොවැම්බර් දක්වා ව්‍යාපෘතියට අමුද්‍රව්‍ය ලබා නොදීම මත පොල් පොහොර නිෂ්පාදනය සිදුවී නොතිබුණි. | රු.මිලියන 21 කට අධික ප්‍රාග්ධන වියදමක් දරමින් ආරම්භ කරන ලද පොල් පොහොර ව්‍යාපෘතිය ක්‍රියාකාරී හා ඵලදායී මට්ටමට ගෙන ඒමට ක්‍රමවේද සකස් කළ යුතුය. | සමාගම ක්‍රියාකාරී සහ ඵලදායී මට්ටමකට ගෙන ඒම සඳහා රජයේ පොහොර සමාගම හරහා ERP, යූරියා සහ MOP සහන මිලකට ලබා ගැනීම. | පොල් පොහොර මිශ්‍රණ සඳහා අවශ්‍ය යූරියා, MOP ලබා ගැනීමේ අපහසුතාවය මත, තාවකාලිකව මෙම ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු අත්හිටුවා ඇත. |
| (ඇ) | 2011 වර්ෂයේදී චීනයේ පුද්ගලික ආයතනයකින් මිලදී ගන්නා ලද 6 Roller (TGM 160) මිල් යන්ත්‍රයට අවශ්‍ය අමතර කොටස් සැපයීමට නම් | යන්ත්‍ර කොටස් ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳ සැලකිලිමත්ව | සියළු යන්ත්‍ර මිලදී ගැනීම්, නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසුව සත්‍ය අවශ්‍යතාවය හා | පොස්ෆේට් සමාගමේ සේවක ශ්‍රම දායකත්වයෙන් ස්ථාපනය කිරීමට |


| | | | | |
|---|---|---|---|---|
| | රු.43,435,115ක වටිනාකමින් යුතු 6 Roller (TGM 160) නව මිල් ඇඹරුම් යන්ත්‍රයක් මිලදී ගත යුතුය යන කොන්දේසිය මත චීනයේ වෙනත් පුද්ගලික ආයතනයකින් 2014 වර්ෂයේදී මිලදී ගත් නව මිල් යන්ත්‍රයේ රු.11,513,434 ක් වූ මිල් පාදම කොටස, 2014 – 2016 අතර කාලය තුල මිල් යන්ත්‍ර සඳහා මිලදී ගත් රු.14,290,237 ක අමතර කොටස් හා මෙම මිල් යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා නොනිමි වැඩ ලෙස පෙන්වා ඇති රු.7,440,000 ක ඉදිකිරීමද 2021 ජූලි 30 දින දක්වා ප්‍රයෝජනයට ගැනීමකින් තොරව පැවතිණි. | කටයුතු නොකර අදාල යන්ත්‍ර කොටස් මිලදී ගැනීමට ක්‍රියාකර ඇති නිලධාරින්ට එරෙහිව ක්‍රියාකළ යුතු අතර හැකි ඉක්මනින් අදාළ යන්ත්‍ර කොටස් ස්ථාපිත කර ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. | වෙළඳපොළ අවශ්‍යතා මත පදනම්ව පමණක් මිලදී ගැනීම හෝ ස්ථාපනය කිරීම. | කටයුතු කොට ඇති අතර 85% ක ට වඩා ප්‍රමාණයක් ස්ථාපන කටයුතු අවසන්ව ඇත. |
| (ඈ) | ඉහල යන පොහොර ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි පොහොර සැපයීමට හා පොහොර ආනයන වියදම අඩුකර ගැනීමේ අරමුණින් රු.34,654,178 කට ක්‍රෂර් යන්ත්‍රයක් මිලදී ගෙන තිබූ අතර එම යන්ත්‍රයේ කිසිම කොටසක යන්ත්‍රයේ වර්ගය, මාදිලිය, නිෂ්පාදන සමාගම හෝ නිෂ්පාදිත රට පිළිබඳව තොරතුරු අඩංගු නොවන බව එවකට සිටි නිෂ්පාදන කළමණාකරු විසින් ලිඛිතව ඡායාරූපමය සාක්ෂි සහිතව, සාමාන්‍යාධිකාරිට දැනුම් දී තිබුණි. එම යන්ත්‍රය ස්ථාපිත දින සිට 2021 ජූලි 30 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. තවද නව ක්‍රෂර් යන්ත්‍රයක් වෙනුවට පාවිච්චි කරන ලද යන්ත්‍රයක් මිලදී ගැනීමෙන් පොස්පේට් සමාගමට සිදුවී ඇති අලාභය හා අදාල යන්ත්‍රය | රු. මිලියන 34 කට වැඩි මුදලක් වැයකර මිලදීගෙන ඇති යන්ත්‍රය ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. | සියළු යන්ත්‍ර මිලදී ගැනීම්, නිසි ශක්‍යතා අධ්‍යනයකින් පසුව සත්‍ය අවශ්‍යතාවය හා වෙළඳපොළ අවශ්‍යතා මත පදනම්ව පමණක් මිලදී ගැනීම හෝ ස්ථාපනය කිරීම. | අළුත්වැඩියා කොට නැවත නිෂ්පාදනයට දායක කර ගැනිමට උතුරු මැද පළාත් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතුන්ගේ සහභාගීත්වයෙන් වාර්තාවක් කැඳවා එම නිර්දේශ මත අවශ්‍ය යාවත්කාලීන කිරීම් සිදු කොට, අමුද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදවා ගැනීමට කටයුතු කරනු ඇත |

| | | | | |
|---|---|---|---|---|
| | භාවිතයට නොගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ගෙන් මෙම අලාභ අයකර ගැනීම සම්බන්ධයෙන් සමාගමේ බලධාරීන් කටයුතු කර නොතිබුණි. එසේම මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අනාරක්ෂිතව තැබීම නිසා මේ වන විට යන්ත්‍රය විනාශ වී තිබුණු බව නිරීක්ෂණය විය. | | | |
| (ඉ) | 2019 ජනවාරි 07 දින සිට ධාවනයෙන් ඉවත් කර වෙන්දේසි කිරීමට නිර්දේශ කර තිබූ ඩබල් කැබ් රථය 2021 නොවැම්බර් 10 දින වන විටත් වෙන්දේසි කිරීමට හෝ ධාවනය සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ධාවනය සඳහා යොදා ගැනීමට හෝ අදාල අනුමැතීන් සහිතව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | නැවත පුවත්පත් දැන්වීමක් පළකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2019 වර්ෂයේ වෙන්දේසිය සඳහා යොමු කළත් ඉල්ලුම් මිළ ගණන් තක්සේරු වාර්තාවට වඩා බෙහෙවින් අඩුවූ නිසා නැවත වෙන්දේසියේ යෙදවීමට කළමනාකාරිත්වය තීරණය කරන ලදි. | මෑතක දි අළුත් තක්සේරු වාර්තාවක් ලබාගෙන ඇති අතර, පුවත්පත් දැන්වීමක් නුදුරේදිම පළකර වෙන්දේසි කිරීමට කටයුතු යොදා ඇත. |
| (ඊ) | 2016, 2017, 2018 වර්ෂයන් වල සිට පැවත එන රු.3,808,331 ක යල් පිනූ තොග ඉවත් කිරීම සඳහා විගණන දිනය වන විටත් සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමේ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | ආයතනය සතුව පවතින යල්පැනු අබලි ද්‍රව්‍ය වාර්ෂික කමිටුවක් හරහා අපහරණය කිරීමට කටයුතු කිරීම | 03 Roller Mill යන්ත්‍රයට අදාල අමතර කොටස්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලබා දෙන ලෙසට ඉල්ලීමක් සිදු කොට ඇත. ඒ මෙම අමතර කොටස්, පොත් අගයට, අදාල සමාගම වෙත ලබා දීමට අමාත්‍යාංශයේ උපදෙස් මත අධ්‍යක්ෂ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කරනු ඇත. |
| (උ) | වසර ගණනාවක සිට බැහැර කරන ලද අබලි යකඩ හා වෙනත් යන්ත්‍ර කොටස් යන්ත්‍රාගාර පරිශ්‍රයේ තැනින් තැන අනාරක්ෂිතව දමා තිබූ අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අපහරණය කිරීමේ කටයුතු කඩිනමින් සිදුකළ යුතුය. | විධිමත් පුවත්පත් දැන්වීමක් පළ කොට , අබලි යකඩ වාර්ෂිකව හෝ අවශ්‍යතාවය මත වෙන්දේසි කිරීමට කටයුතු කරනු ඇත. | පුවත්පත් දැන්වීමක් හරහා තෝරා ගන්නා ලද ගැණුම්කරුවෙකු වෙත වර්තමානයේ ආයතනය තුළ පවතින අබිලි යකඩ අලෙවි කිරීමට සියළු කටයුතු මේ අවස්ථාව වන විට සිදු කොට ඇත. |
| (ඌ) | සමාගමේ ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයට අදාළව අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා කම්කරු තනතුරු එකක්ද, දෛනික පදනම මත සේවකයන් 29 ක්ද, වතු සහායක තනතුරේ 03 ක්ද බඳවාගෙන තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පත්වීම් ලබාදීමට කටයුතු නොකළ යුතුය. | පොස්පේට් නිෂ්පාදනය ඉහළ දැමීම සහ අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දෛනික ගෙවීම් පදනම මත ශ්‍රමිකයන් 29 දෙනෙකුගේ සේවය වරින්වර ලබාගන්නා ලදි. ඊට සමගාමීව එම වැඩිවීම මත සනීපාරක්ෂක කටයුතු ඉහළ යාම හේතුවෙන් ස්ථිර සේවයේ නියුතු සේවකයකු ඒ සඳහා අනුයුක්ත කරන ලදි. නිෂ්පාදන අංශයේ සේවයේ නියුතු සේවකයින් රෝගී තත්ත්වයන්ට මුහුණ පෑවිට වෛද්‍ය නිර්දේශ මත සැහැල්ලු සේවයේ යෙදවීමට ලබාදුන් නිර්දේශ මත වතු අංශයට අනුයුක්ත කිරීම මත මෙවැනි තත්ත්වයන් සාමාන්‍ය වේ. | ඉදිරියේදි කාර්යය මණ්ඩල සංශෝධනයක් කර ප්‍රශස්ත සේවක මට්ටම දක්වා පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. |

## 4.41 ලංකා ඛනිජ වැලි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 1,665,267,796 | 1,043,538,000 | 3,945,079,381 | 933,069,942 | 621,729,796 | වියාචනය |
| **2019** | 4,045,059,827 | 1,767,313,777 | 5,294,501,665 | 1,940,208,932 | 2,277,746,050 | තත්ත්වාගණනය කළ |
| **2020** | 1,009,819,732 | 1,060,617,060 | 5,421,813,644 | 2,034,453,482 | (50,797,328) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2011 ජනවාරි 9 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සමාගම විසින් රු. මිලියන 500ක මුදලක් පිහන් සංස්ථා සේවක වන්දි ගෙවීම සඳහා රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත 2012 ජනවාරි 10 දින ලබා දී තිබුණි. 2020 වර්ෂයේ දී මෙම | ණය හා පොළිය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | අය කර ගැනීමට දැනට නෛතිකව කටයුතු සිදු කරන අතර නඩුව සමතයට පත්කර ගැනීම සඳහා ඉදිරියේදී ආයතනය විසින් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ සඳහා වසරකට රු.මිලියන 50 බැගින් ලාභාංශ | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තීරණ අංක PED1/LMSL/03/11(i) හා 2022.01.25 දිනැති ලිපියෙන් උපදෙස් ලබා දී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම මුදල |

| | | | | |
|---|---|---|---|---|
| | ණය වෙනුවෙන් රු.103,484,290ක අඩමාන ණය වෙන් කර තිබූ අතර රු.517,421,448ක් වූ ණය මුදල හා පොලිය 2020 වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. | | වලට හිලව් කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | අලාභ ලියා හැරීම යටතේ ක්‍රමානුකූලව කපා හැරීමටයි. ඒ අනුව මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී අධ්‍යක්ෂ මණ්ඩල දැනුවත් කිරීමට කටයුතු කරන අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ඉදිරි කටයුතු සිදු කරනු ඇත. |
| (ආ) | 2012 වර්ෂයේ සිට වැවිලි සංස්ථාවට හා ජාතික කඩදාසි සංස්ථාවට ලබාදී තිබූ පිළිවෙලින් රු.25,000,000 හා රු.5,000,000ක ණය මුදල් අය කරගැනීමට සමාගමට නොහැකිවී තිබුණි | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් වෙන් කිරීමක් කළ යුතු අතර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල් අය කර ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය හා අධ්‍යක්ෂ මණ්ලය ද දැනුවත් වී ඇත. ඉදිරියේදී මෙවැනි ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ඒ සම්බන්ධයෙන් සුදුසු ප්‍රතිපත්තිමය තීරණ ගැනිමට අදාල පාර්ශවයන්ගේ අවධානය යොමු කිරීමට කටයුතු කරනු ඇත. | රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු රු.මිලියන 25ට සරිලන පරිදි ඉඩමක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර හා ජාතික කඩදාසි සංස්ථාවෙන් ලැබිය යුතු රු.මිලියන 50 සඳහා ගතහැකි විකල්ප ක්‍රියා මාර්ග පිළිබඳව සොයා බලමින් පවති. |
| (ඇ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතු වූවද, වසර 2ත් වසර 10ත් අතර කාලයක සිට ධාවනයෙන් ඉවත් කර ඇති සමාගම සතු වාහන 08 ක් අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ නියමයන් අනුව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | අපහරණය කිරීමට මෙතෙක් කටයුතු කර නැත. |
| (ඈ) | 2019 වර්ෂයේ සමාගමේ ප්‍රධාන නිෂ්පාදනය වන ඉල්මනයිට් සම්පූර්ණ ප්‍රමාණයද අනෙකුත් ප්‍රධාන නිෂ්පාදන වලින් සියයට 49 සිට සියයට 70 දක්වා ප්‍රමාණයක් | උපරිම තරඟකාරිත්වයක් තුලින් ඉහල මිලක් ලබාගැනීමට කටයුතු කළයුතු | අතුරු නිෂ්පාදන අලෙවි නොකිරීමට මේ වන විට ආයතනය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. | අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් මේ වන විට EOI කැඳවා ඇත. මෙය |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගමේ අර්ධ නිෂ්පාදිතයක් වන නන් මැග්නටික් හෙවි මිනරල් මෙ.ටො. 39,775ක් ශ්‍රී ලාංකික පුද්ගලික සමාගමක් වෙත ලබාදී තිබුණු අතර අදාළ සමාගම, ලංකා ඛණිජවැලි සමාගමෙන් ලබාගන්නා ඛණිජ තවදුරටත් පෙරසැරිකරණයට ලක්කර අමුද්‍රව්‍යක් ලෙස අපනයනය කරන අතර අගය එකතු කිරීමක් සිදු කරනු නොලබයි. | අතරම ඛණිජ ද්‍රව්‍ය සඳහා අගය එකතු කිරීමේ ක්‍රමවේදයන් කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | | ස්ථාපිත කිරීම සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු අක්කර 200ක් දක්වා වූ භූමි ප්‍රමාණයක් ලබා දීමට එකඟතාවය ලබා දුන් වහාම RFP කැඳවීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් කර්මාන්ත අමාත්‍යාංශය විසින් ඒ සඳහා පත්කර ඇති කමිටුව හරහා සූදානම් කර ඇත. |
| (ඉ) | ඉල්මනයිට් මෙ.ටොන් 85,000ක ටෙන්ඩරය සඳහා ලංසු 4ක් ලැබී තිබූ අතර මෙ.ටොන් 01 කට ඇ.ඩො. 165.20 ක ඉහලම මිල ලංසුව නිසි වගකීමකට බැඳුනු ලංසු සුරක්ෂණයක් නොවන බව දක්වමින්ද, ඇ.ඩො.163 ඉදිරිපත් කළ දෙවන මිල ලංසුව මෙ.ටොන් 5,000ක් සඳහා පමණක් බව දක්වමින්ද ප්‍රතික්ෂේප කර තිබුණි. පසුගිය වසරේ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණද, ඇමෙරිකානු ඩොලර් 147කට මිලදී ගැනීමට එකඟ වූ තුන්වැනි ලංසුකරුට ටෙන්ඩරය ලබා දී ඇත. මේ නිසා ඉහලම මිල ඉදිරිපත් කළ ලංසුකරුට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට එකඟතාවයකට පත් නොවීමෙන් මෙ.ටොන් 01 කට ඇ.ඩො.18.20 බැගින් මෙ.ටොන් 85,000කට ඇ.ඩො.1,547,000 ක පාඩුවක් ආයතනයට සිදුවී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර උපරිම තරඟකාරිත්වයක් තුලින් ඉහල මිලක් ලබාගැනීමට කටයුතු කළ යුතු අතරම ආයතනයට වාසිදායක වන පරිදි තීරණ ගත යුතුය. | ඛනිජ වැලි අලෙවි කිරීමේදි පවතින ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කිරීම හේතුවෙන් උද්ගතව තිබූ ගැටළු හා සීමාවන් මඟ හැරීම සඳහා නව අලෙවි ක්‍රමවේදයක් සකස් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මහ භාණ්ඩාගාරය විසින් කමිටුවක් පත් කර ඇත.<br>එම කමිටුව විසින් පවතින ක්‍රමවේදය අධ්‍යනය කර සුදුසු නව ක්‍රමවේදයක් හඳුන්වා දීමට කටයුතු කරමින් පවතින අතර යෝජිත නව ක්‍රමවේදය යටතේ අත්හදා බැලීමක් වශයෙන් එක් අලෙවික් සිදු කිරීමට ද 2021 වර්ෂයේදි කටයුතු කරන ලදි.<br>එහිදි ලබා ගත් ප්‍රායෝගික අත්දැකීම් ද සමඟ අදාල කමිටුව විසින් නව ක්‍රමවේදයේ සුදුසු වෙනස්කම් සිදුකර කර්මාන්ත | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පත්කළ කමිටුව විසින් සකස් කරන ලද නව ක්‍රමවේදය අනුව ඛනිජ වැලි නිෂ්පාදන අලෙවිය නියමු ව්‍යාපෘතියක් යටතේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත ක්‍රියාත්මක කරන ලදී. එහිදී ජාත්‍යන්තර වෙළඳපලට සාපේක්ෂව ඉහල මිලක් නිෂ්පාදන සඳහා ලැබූ අතර ටෙන්ඩර ප්‍රදානය නියමිත කාලය තුල අවසන් කරන ලදී.<br>අදාල කමිටුව විසින් සකස් කරමින් පවතින නව අලෙවිකරණ ක්‍රමවේදයේ තව දුරටත් දියුණු කළ යුතු කාරණා ගැන මේ දින වල අධ්‍යයනය කරමින් පවතින අතර නව අලෙවිකරණ ක්‍රමවේදය |

| | | | | |
|---|---|---|---|---|
| | ඉල්මනයිට් විකිණීමේ ටෙන්ඩරය 2020 ඔක්තෝබර් 28 දින ලබා දී තිබුණද, දින 130ක් ඇතුළත ඇමෙරිකානු ඩොලර් 147කට මෙට්‍රික් ටොන් 85,000ක් ඉවත් කිරීමට එකඟ විය. සමාලෝචිත වර්ෂය අවසානයේ මෙට්‍රික් ටොන් 5,032.86ක් සඳහා ඇමෙරිකානු ඩොලර් 3,675,000ක් ගෙවා ඇති අතර තවත් ඇමෙරිකානු ඩොලර් 2,940,000ක් ගෙවා 2021 මාර්තු මස අවසන් වන විට මෙට්‍රික් ටොන් 30,000ක් පමණක් ඉවත්කරගෙන ඇත. ඉතිරි ඇමෙරිකානු ඩොලර්.5,880,000ක් 2021 මාර්තු අවසානය දක්වා ගෙවා තිබුණේ නැත. | | අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් මහා භාණ්ඩාගාරයේ සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය කඩිනමින් ලබා ගැනිමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවති. ඒ අනුව නව ක්‍රමවේදය හඳුන්වා දීමෙන් පසුව මෙම ගැටළුව මඟහැරී යනු ඇතැයි අපේක්ෂා කරයි. | සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව 2022 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරිමට අපේක්ෂා කෙරේ. |
| (ඊ) | 2020 වර්ෂය තුල සමාගමේ අපේක්ෂිත මුළු ඛණිජ විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 113,996 ක් හා එහි විකුණුම් වටිනාකම රු.4,660,524,000ක් වුවත් සත්‍ය විකුණුම් ප්‍රමාණය මෙ.ටොන් 14,955 ක් වූ අතර එහි විකුණුම් වටිනාකම රු.696,597,134 ක් විය. ජාත්‍යන්තර තරඟකාරී ලංසුකරණය යටතේ ඉදිරිපත්වන ගැණුම්කරුවන් සීමිත වීම, විවිධ හේතූන් මත ටෙන්ඩර් අවලංගු වීම, එකවර විශාල තොගයක් අලෙවි කිරීමට කටයුතු කිරීම වැනි හේතූන් නිසා මෙලෙස අපේක්ෂිත ඉලක්ක කරා ලඟාවිමට නොහැකිවී තිබුණි. මෙලෙස | විකුණුම් වර්ධනය කර ගැනීමට, නව ගැණුම්කරුවන් සොයා ගැනීමට හා ටෙන්ඩර් පරිපාටි නියමිත පරිදි අනුගමනය කර අවලංගුවීම් වළක්වා ගැනීමට ආයතනය කටයුතු කළ යුතුය. | පවත්වා ගෙන යන අලෙවි ක්‍රමවේදයට සංශෝධන ඉදිරිපත් කරමින් අලෙවි ක්‍රමවේදය වෙනස් කිරීමට අමාත්‍යාංශය විසින් යෝජනා ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් ඒ සඳහා ලබා දුන් නියෝගයන් පසුව අමත්‍ය මණ්ඩල පත් කළ කමිටුවක් මගින් අලෙවි ක්‍රම වේදයෙහි අඩුපාඩු සහ දුර්වලතා අවධානයට ගෙන ලබා දුන් නිර්දේශ මත ලංසු ලබා ගැනීම සඳහා පිළියෙළ කරන ලද නව අලෙවි ක්‍රමවේදයට අනුව ඛනිජ | නිෂ්පාදන යාන්ත්‍රනය යාවත්කාලීන කර නිෂ්පාදන වැඩි කිරීමට කටයුතු කර ඇත. නව අලෙවි ක්‍රමවේදයට අනුව ගැනුම්කරුවන්ට ඔවුන්ගේ වත්කම් තත්ත්වය මත ලංසු ඉදිරිපත් කර අවශ්‍ය නිෂ්පාදන සඳහා මුදල් ගෙවීම පහසු වී ඇත. ඒ අනුව ගැණුම්කරුවන්ගේ සහභාගිත්වය වර්ධනය වී ඇත. |

ක්‍රමවත් ලෙස සමාලෝචිත වර්ෂයේදී විකුණුම් සිදු නොවීමෙන් ආයතනයේ මූල්‍ය තත්ත්වය අයහපත්වී ද්‍රවශීලතාවය අඩුවීමෙන් දෛනික අවශ්‍යතා සඳහා කිහිප අවස්ථාවකදී රු.450,000,000ක් වූ ස්ථාවර තැන්පතු 6ක් කල් පිරීමට පෙර ආපසු මුදල් කර ගැනීම හේතුවෙන් රු.7,573,770 ක අපේක්ෂිත පොලී ආදායම අහිමිවී තිබූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ අපේක්ෂිත අලෙවිය සිදු නොවීම මෙන්ම තොග ඉවත් නොවීමෙන් ගබඩා පහසුකම් ප්‍රමාණවත් නොවීම හා තොග සංරක්ෂණය දුර්වලවීම වැනි ගැටළු රැසකට සමාගම මුහුණදී තිබුණි.

නිෂ්පාදන අලෙවිය සඳහා 2021 දී කටයුතු කර ඇත.

ටෙන්ඩර් කිරීම අමාත්‍යාංශ අනුමැතිය මත සිදුවන අතර ප්‍රදානය කිරීම හා අවලංගු කිරීම් ටෙන්ඩර් කමිටුව හෝ අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සිදුවේ.

වාර්ෂික නිෂ්පාදන ඇස්තමේන්තුවට අනුව අදාල වර්ෂයේ අලෙවි අයවැය සාදන අතර සත්‍ය නිෂ්පාදන ප්‍රමාණය ඇස්තමේන්තු ගත නිෂ්පාදන ප්‍රමාණයට වඩා බොහෝ දුරට අඩුවේ. 2020 වර්ෂය තුල මෙ.ටො. ලක්ෂයකට වඩා නිෂ්පාදන ප්‍රමාණයන් අලෙවිය සඳහා ඉදිරිපත් කළ අතර එයින් මෙ.ටො.89,450ක් අලෙවි කළ අතර, ඒහි අලෙවි වටිනාකම ඇ.ඩො.මි.14.814කි (ශ්‍රී ලංකා රු.බිලියන 2.7ක්)

කොවිඩ් වසංගතය තත්ත්වය මත ඉහළ කළමනාකාරීත්වය විසින් මුදල් ගෙවීම හා තොග ඉවත් කර ගැනීම් සඳහා කාලය දීර්ඝ කර ලබා දුන් අතර මේ නිසා මුදල් ගෙවීම හා තොග ඉවත් කර ගැනීම් සඳහා කල්ගත විය. නව අලෙවි ක්‍රමවේදයට අනුව ගැනුම්කරුවන්ට අවශ්‍ය ප්‍රමාණය මෙ.ටො.50 සිට මෙ.ටො.5000 දක්වා ලංසු

| | | | | |
|---|---|---|---|---|
| | | | ඉදිරිපත් කිරීමට පහසුකම් සපයා ඇත. | |
| (උ) | සමාලෝචිත වර්ෂයේදී සමාගම සතුව ආරම්භක හා වර්ෂයේ නිෂ්පාදිත ඉල්මනයිට් තොග පිළිවෙලින් මෙ.ටොන් 77,247ක් හා මෙ.ටොන් 15,419ක් වූ අතර ඉන් ජනවාරි මස මෙ.ටොන් 5,436 ක් හා දෙසැම්බර් මස මෙ.ටොන් 5,053 ක් අලෙවිකර තිබුණි. සමාගම 2020 ඔක්තෝබර් මස අලෙවි කළ මෙ.ටොන් 85,000 ක් නිසි පරිදි මුදල් ගෙවා ගැනුම්කරු විසින් ඉවත් කර නොගැනීම නිසා සමාගම සතු මෙ.ටොන් 60,000ක ඉල්මනයිට් ගබඩා කළ හැකි ගබඩා දෙකෙහි මුළු ධාරිතාවය ඉක්මවා ගොස් තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට මැයි දක්වා සැලකිය යුතු දින ප්‍රමාණයක් ඉල්මනයිට් නිෂ්පාදනය අත්හිටුවා තිබූ අතර 2020 ජුනි 01 සිට 2021 මාර්තු 18 දින දක්වා Block B යන්ත්‍රාගාරයේ නිෂ්පාදනය නවතා තිබීමෙන් Block C ඇතුළු අනෙකුත් යන්ත්‍රාගාර මෙන්ම සියළු සම්පත් එම කාලය දක්වා නිශ්කාර්යව පැවතිණි. | තොග අලෙවි වූ වහාම ඒවා ඉවත් කර ගැනීමට ගැනුම්කරුට නියම කළයුතු අතර පමා කාලයට අදාලව ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නව අලෙවි ක්‍රමවේදය තුල පවතින තෙග සඳහා දින 40කට වරක් සීමිත අලෙවිය ටෙන්ඩර් ප්‍රසිද්ධ කිරීමටත් දින 03ක් වැනි කෙටි කාලයක් තුල ටෙන්ඩර් විවෘත කිරීමටත් ප්‍රදානය කිරීමටත් අලෙවි නිෂ්පදන ඉවත් කිරීමටත් ක්‍රියාමාර්ග ඇතුලත් කර ඇත.<br>2020 වර්ෂයේ ජුනි මස 01 වැනි දින සිට බ්ලොක් බී යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු තාවකාලිකව නතර කරන ලදි. එසේ නැවැත්වීමට ප්‍රධානතම හේතුව වනුයේ බ්ලොක් බී යන්ත්‍රාගාරයේ නිෂ්පාදනය කරනු ලබන තෙත ඉල්මනයිට් බ්ලොක් සී යන්ත්‍රාගාරය මගින් වියලිමට ලක් කර ගබඩා කිරීමේ දි ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති විම හේතුවෙනි. මන්ද ඒ වන විටත් ඉල්මනයිට් ගබඩාවේ ගබඩා කළ හැකි මුළු ධාරිතා ප්‍රමාණය ඉක්මවා ගබඩා කිරිමයි. ආයතනය විසින් අලෙවි කරන ලද ඉල්මනයිට් මෙ.ටො 85000 අදාල ගැනුම්කරු විසින් 2020 වර්ෂයේ දෙසැම්බර් මස සිට ඉවත් කර ගැනිමට කටයුතු සිදු කිරිම නිසා වියලි වැලි ගබඩාවේ | නව අලෙවිකරණ ක්‍රමවේදය සකස් කිරීමේදි මෙම කරුණ කෙරෙහිද අවධානය යොමු වී ඇති අතර ඒ අනුව නව ක්‍රමවේදය තුළ මෙම ගැටළුව විසදි යනු ඇත. |

ඉඩ පහසුකම් නැවත ලැබීම හේතුවෙන් බ්ලොක් බී යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු 2021.03.12 වැනි දින ආරම්භ කරන ලදි. ඒ අනුව බ්ලොක් සී යන්ත්‍රාගාරයද 2021 අප්‍රේල් මාසයේ දි ආරම්භ කරන ලදි.

බ්ලොක් බී යන්ත්‍රාගාරය නවතා දැමූ කාල සීමාව තුල එම යන්ත්‍රාගාරයේ සියළු නඩත්තු කටයුතු සිදු කෙරුණු අතර නඩත්තු කිරිමෙන් පසු දින 06ක් commission කරන ලදි. මෙම නඩත්තු කටයුතු සිදු කිරිමෙන් ඉල්මනයිට් ප්‍රකෘතිමත් වීම 60% සිට 90% දක්වා ඉහල නංවා ගැනීමට හැකියාව ලැබුණි. ඒ තුලින් මාසික ඉල්මනයිට් නිෂ්පාදනය මෙ.ටො 5000 සීමාව ඉක්මවා ඉහල කාර්ය සාධනයක් බ්ලොක් බී යන්ත්‍රාගාරයට ලබා ගැනිමට හැකි විය. බ්ලොක් ඒ යන්ත්‍රාගාරය ක්‍රියාත්මක විම නිසා එම කාලය තුල බ්ලොක් බී යන්ත්‍රාගාරය සඳහා අවශ්‍ය යෙදවුම් නිෂ්පාදනය අඛණ්ඩව සිදුවුණි. ඒ තුලින් යන්ත්‍රාගාරය ආරම්භ කිරිමෙන් පසු අඛණ්ඩව ක්‍රියාත්මක කිරිමට හැකියාව ලැබුණි.

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | බ්ලොක් A පැරණි යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය දළ වැලි යෙදවුම් පැයකට මෙ.ටො. 100 ක් වුවද වර්තමාන ධාරිතාවය පැයට මෙ.ටො. 40 හා 50 තරම් අඩු අගයක් විය. පූර්ණ ධාරිතාවයට සරිලන පරිදි යෙදවුම් යොමු නොකිරීම නිසා ලැබෙන අඩු නිමැවුම සමස්ත නිෂ්පාදනාගාරයේම ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා තිබුණි. මෙම යන්ත්‍රාගාරයේ ස්පයිරල් නිර්මාණය කර ඇත්තේ අවම බර ඛනිජ වැලි ප්‍රතිශතය සියයට 40 සිට 80දක්වා වන ඛනිජ වැලි වෙන් කිරීම සඳහා වුවත් නියැදිව ලබාගන්නා ලද සාම්පල වලට අදාල 2019 මාර්තු, අප්‍රේල්, සැප්තැම්බර් හා 2020 පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස වල පරීක්ෂණ වාර්තා අනුව දින කිහිපයක හැර අනෙක් සෑම දිනකම යෙදවුම් බර ඛනිජ ප්‍රතිශතය සියයට 40ට වඩා අඩු විය. | ඉහළ සංයුතියකින් යුතු නව ඛනිජ වැලි නිධි සොයා ගැනීමට කටයුතු කළ යුතුය. | බ්ලොක් ඒ යන්ත්‍රාගාරයේ පරණ ගොඩනැගිල්ලේ තිබූ යන්ත්‍ර නව ගොඩනැගිල්ල වෙත මාරු කර සවි කිරිමේ කටයුතු 2021.07.15 දින ආරම්භ කරන ලදි. මෙම කටයුතු 2021.10.01 දින අවසන් කර 2021.10.02 දින නැවත යන්ත්‍රාගාරයේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදි. මෙම යන්ත්‍ර සවි කිරිමෙන් අනතුරුව යන්ත්‍රාගාරය වෙත පැයකට යෙදවුම් ලෙස මෙ.ටො.40ක ප්‍රමාණය මෙ.ටො 60දක්වා ඉහල නංවා ගැනිමට හැකියාව ලැබුනි. ඉදිරියේ දී එම අගය මෙ.ටො 80ට වඩා වැඩි අගයක පවත්වා ගැනිමට බලාපොරොත්තු වේ.<br>තවද මුල් අවධියේ දී දළ වැලි හි ඇති බර ඛනිජ වැලි සාන්ද්‍රණ මට්ටම 40% -80% මට්ටමක පැවතුනද වර්තමානයේ දි එම මට්ටම 20% ක් දක්වා පහත වැටී ඇත. මෙම තත්ත්වයට විසඳුම් ලෙස පහත ක්‍රියාමාර්ගයන් මේ වන විටත් ආරම්භ කර ඇත.<br><br>**ජංගම පිරිපහදු යන්ත්‍රාගාරයක් ඇනවුම් කිරිම**<br>මෙම යන්ත්‍රාගාරය මගින් අඩු බර ඛනිජ වැලි සාන්ද්‍රණයක් සහිත වැලි ඇති ප්‍රදේශයක් තෝරා එම ප්‍රදේශය තුලම දළ වැලි පිරිපහදු කර බර ඛනිජ | මුහුදේ ගවේශන බලපත්‍ර (ග්‍රිඩ් 63) ලබා ගැනිම - නව ඛනිජ නිධි සොයා ගැනීමේ එක් පියවරක් ලෙස මුහුදේ ග්‍රිඩ් 63 ගවේශන බලපත්‍ර අයදුම්කර ඇත. ඒ සඳහා වන ව්‍යාපෘති යෝජනාව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයට ඉදිරිපත්කර අදාල ආයතනවල නිර්දේශ ද ලබා දී ඇත. ඒ අනුව නුදුරේදිම අදාල ගවේෂණ බගලපත්‍ර 4 ලබා ගැනිමට හැකි වන අතර ගවේෂණ කටයුතු ආරම්භ කිරීමට ද මේ වන විට සැලසුම් කර ඇත.<br>ඊට අමතරව පහත සඳහන් ගොඩබිම් ප්‍රදේශ හඳුනාගෙන ඒ සඳහා ගවේෂණ බලපත්‍ර අයදුම්කර ඇත. ඒ අනුව ගවේෂණ බලපත්‍ර ලබා ගැනිමට මෙම වසරේ මුල්භාගයේදි කටයුතු කරන අතර මෙම වසර තුලදීම අදාල ප්‍රදේශ වල ගවේෂණ කටයුතු ආරම්භ කිරීමට ද සැලසුම් කර ඇත.<br>1. පානම -(ග්‍රිඩ් 8)<br>2. හම්බන්තොට -( ග්‍රිඩ් 11)<br>3. නිලාවේලි -( ග්‍රිඩ් 15)<br>4. මුත්තුර් (ග්‍රිඩ් 18) |

වැලි සාන්ද්‍රණ මට්ටම 60% දක්වා වැඩි කර ගැනිමට හැකියාව ලැබෙනු ඇත. මේ තුලින් දළ වැලි ප්‍රවාහනය කිරිමේ පිරිවැයද අඩු වේ.

**<u>කැණීම් සීමාව පුළුල්කර ගැනීමට කටයුතු කිරීම - (මී100 සීමාව මී300 දක්වා පුලුල් කිරීම)</u>**

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති බලපත්‍රය යටතේ අනුමත මීටර් 100 සීමාව වැඩි කිරීමට අවශ්‍ය කටයුතු දැනටමත් සැලසුම් කර ඇත. අදාළ මූලික පාරිසරික බලපෑම් තක්සේරු අධ්‍යයනය එහි අවසන් අදියරේ පවතියි.

**<u>නව කැණීම් බලපත්‍ර ලබා ගැනිමට කටයුතු සැලසුම් කිරිම</u>**

පොඩවකට්ටු ප්‍රදේශයේ ආයතනයට ගවේෂණ අයිතිය හිමි අක්කර 2500ක් වූ භූමි ප්‍රමාණයට කැණීම් බලපත්‍ර ලබා ගැනිමට පාරිසරික බලපෑම් තක්සේරුව සිදු කර ඇත. අදාල පළමු සාකච්ඡාව 2022 පෙබරවාරි 01 වැනි දින ආරම්භ කිරිමට නියමිතය. එය මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබාදි ඇත.

| | | | | |
|---|---|---|---|---|
| (එ) | නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම වසර 30ක බද්දකට රු.24,220,118 ක් ගෙවා ඛනිජ වැලි සමාගමේ ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා 2013 වර්ෂයේදී ලබාගෙන තිබුණි. වර්ග අඩි 15,325 ක මහල් 06 කින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.171,453,486 කට (වැට් රහිත) 2018 මාර්තු කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.6 වගන්තිය ප්‍රකාරව ලංසුකරුවකු විසින් ඉදිරිපත්කරන ලද ලංසුව ප්‍රතිග්‍රහණය කිරීමෙන් පසු වහාම විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම සිදු කළ යුතු වුවත් කොන්ත්‍රාත් ආයතනය සමඟ ගිවිසුම අත්සන් කර නීතිමය බැඳීමක් ඇති කරගෙන තිබුණේ 2020 පෙබරවාරි 26 දින එනම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර වසර 02ක් ගතවීමෙන් පසුව විය. එහෙත් මෙම ගිවිසුමට කොන්ත්‍රාත් පිරිවැය, ගෙවීම් කොන්දේසි , කොන්ත්‍රාත් කාලය වැනි ප්‍රධාන පිරිවිතරයන් ඇතුලත් කර නොතිබුණි.<br>2020 මාර්තු ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ කර තිබූ අතර වසර 07 ක කාලයක් මෙම ඉඩම නිශ්කාර්යව පැවතී තිබුණි. වසර 30ක බදු කාලයෙන් 2020 මාර්තු අවසන් වන විට වසර 8ක් ගෙවී ඇති මුත් මහල් 06කින් යුත් මෙම | ප්‍රධාන පිරිවිතරයන් ඇතුලත් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීම හා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම කඩිනම් කිරීම කළ යුතුය. | කොන්ත්‍රාත් ගිවිසුම ලංසු ප්‍රතිග්‍රහණය කළ විගසම අත්සන් කිරීමට නොහැකි වූ අතර CIDA ආයතනය මගින් අනුමත Form of Agreement (Refer SBD 02) භාවිතයෙන් ඉදිකිරීම් ආරම්භය සඳහා අවශ්‍ය කොන්ත්‍රාත්තුව අත්සන් කරන ලදී. | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින අතර 2022 වර්ෂයේ මැද භාගය වන විට ඉදි කිරීම් කටයුතු අවසන් කර ගැනීමට හැකි වනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ගොඩනැගිල්ලේ මහල් 04 ක් ඉහලට නැංවීම පමණක් සිදුකර තිබුණි. | | | |
| (ඒ) | පොඩුවකට්ටු සිට බර ඛනිජ වැලි පුල්මුඩේ යන්ත්‍රාගාරයට ප්‍රවාහනය කිරීම හා ඉඩම් නැවත පිරවීමට සහ වැලි ප්‍රවාහනය සඳහා මෙ.ටොන් 1ක් රු.234ක මිලට වූ ටෙන්ඩරයට ඉදිරිපත් වූ ලංසුකරුවන් 06 දෙනෙකුගෙන් එක් අයෙකු තෝරා 2020 මැයි 27 දින ටෙන්ඩරය ප්‍රදානය කර තිබුණද එම මිලට ලංසුකරු ඛනිජ වැලි ප්‍රවාහනය කර නොතිබුණි. එකඟ වූ මිලට ඛනිජ වැලි ප්‍රවාහනය නොකිරීමට අදාළව ලංසුකරුට එරෙහිව සමාගම කිසිදු ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණු අතර ඉතිරි ලංසුරුවන්ට වැලි ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලබා නොදී 2020 ජූලි 11 දින සමාගම විසින් මෙ.ටොන් එකකට රු.320 බැගින් ගෙවීමට එකඟවී පළමු ලංසුකරුටම අවස්ථාව ලබාදී තිබුණි. මුල් ලංසු ප්‍රදානය අනුව ගෙවීමට එකඟ වූ මුදල රු.20,439,258ක් වුවද මිල වෙනස් කිරීම නිසා රු.27,836,420ක් සැපයුම්කරුට ගෙවීම නිසා සමාගමට රු.7,397,161 ක අලාභයක් සිදු වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කර ආයතනයට වාසිදායක තීරණ ගත යුතුය. | පිලිතුරු දී නැත. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | 1990 මාර්තු 12 දින කර්මාන්ත අමාත්‍යාංශය විසින් අනුමත කරනු ලැබූ ප්‍රසාද දීමනා ගෙවීම් පටිපාටියේ 6 - B ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීම් කිරීම වර්ෂයේ ලාභය පදනම් කරගත යුතු බව දක්වා තිබුණද, එම පටිපාටියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ ලාභයක් නොලබා තිබිය දී ප්‍රධාන කාර්යාලයේ සේවකයින් සඳහා රු.10,300,000 ක් හා පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයින් සඳහා රු.49,200,000ක්ද වශයෙන් මුළු එකතුව රු.59,500,000 ක් ප්‍රසාද දීමනා අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. තවද මේ සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේද, අමාත්‍යාංශයේද, භාණ්ඩාගාරයේ ද අනුමැතියක් නොවීය. | අනුමත ප්‍රසාද ගෙවීම් පටිපාටියට අනුගතව කටයුතු කළ යුතුය. | 2020 වර්ෂයේ ආයතනය විසින් ලාභ උපයාගෙන නොතිබූ බැවින් එය පදනම් කර ගෙන සේවකයින් හට ප්‍රසාද දීමනා ගෙවීම් කිරීමට නොහැකි විය. මෙයට ප්‍රධානතම හේතුව වූයේ 2020 ඔක්තෝබර් මස ටෙන්ඩර් කරන ලද ඉල්මනයිට් මෙ.ටො. 85,000 ක ටෙන්ඩරය 2020 දෙසැම්බර් 31 දින වන විට ගනුදෙනුකරුට ආයතනයෙන් පිටතට තොග රැගෙන යාමට නොහැකි වීමයි.<br>එබැවින් ආයතනයේ සේවකයින් විසින් 2021 වර්ෂයේදි සිදුවන මෙම අලෙවිය පදනම් කර ගෙන ප්‍රසාද දීමනා අත්තිකාරම් ලෙස රු.100,000 ක දිරි දීමනාවක් ඉල්ලා වැඩ වර්ජනයක් කිරීමයි. මෙම වැඩ වර්ජනයේ බලපෑම මත පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලියට බලපාන බැවින් කළමනාකාරිත්වය මේ සම්බන්ධයෙන් ආයතන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රේඛීය අමාත්‍යාංශය (කර්මාන්ත අමාත්‍යාංශය) හරහා මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා සිටින ලදි. මහා භාණ්ඩාගාරය විසින් මෙම අත්තිකාරම් මුදලින් සියයට 50 ක් සඳහා අදාල අනුමැතිය ලබා දී ඇත. මෙය වසර අවසානයේ (2021 දෙසැම්බර් 31 දිනෙන් | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අවසන් වර්ෂයේ) ගිණුම් සැකසීමෙන් අනතුරුව ලැබෙන ලාභයට ගැලපීම් කිරීමට යටත්ව ආයතනයේ සේවකයින්ට දිරි දීමනා අත්තිකාරම් ලෙස ලබා දෙන ලදි. මෙය වලක්වා ගැනීමට නම් ආයතනයේ ලාභය පදනම් කර ගෙන පමණක් ප්‍රසාද දීමනා ගෙවීමටත් ලාභ නොමැති නම් අත්තිකාරම් වශයෙන් හෝ දිරි දීමනා නොගෙවීමටත් පියවර ගැනීමට ආයතනය විසින් කටයුතු කරනු ලැබේ. | |
| (ඕ) | 1990 මාර්තු 12 දිනැති කර්මාන්ත අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති චක්‍රලේඛයට පටහැනිව 2019 වර්ෂයේ ජනවාරි සිට මාර්තු දක්වා වූ දළ විකුණුම් ආදායම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ රු.30,300,767 ක ප්‍රසාද දීමනා සමාලෝචිත වර්ෂයේ ලාභ මත ප්‍රසාද දීමනා වලින් අඩුකොට එක් සේවකයෙකු වෙනුවෙන් උපයාගත් ලකුණු (point) ප්‍රමාණය තීරණය කළ යුතු වේ. නමුත් එසේ නොකොට පෙර ගෙවූ අතුරු ප්‍රසාද දීමනාවද එකතු කර ගණනය කිරීම හේතුවෙන් රු.26,990,437 ක ප්‍රසාද දීමනා වැඩියෙන් ගෙවා තිබුණි. තවද මෙම ගෙවීම් ලාභ මත ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධයෙන් | චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව ගෙවීමටත් වැඩිපුර ගෙවා ඇති ප්‍රසාද දීමනා නැවත අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | 2018/12/31 දිනෙන් අවසන් වසරේ වාර්ෂික ගිණුම් සැකසීමෙන් අනතුරුව වාර්ෂික ලාභය පදනම් කර ගෙන ගෙවනු ලැබූ ප්‍රසාද දිරි දීමනා මුදල් ප්‍රමාණය ඉතා අඩු වීමෙන් ආයතනයේ සේවකයින් විසින් 2018 වසරේ ටෙන්ඩර කරන ලද හා මුදල් ලැබී තිබූ Non Magnetic Heavy Mineral Concentrate තොගය පදනම් කර ගෙන 2019 වසරේ මුල් කාර්තුවේදී ප්‍රසාද දිරි දීමනා අත්තිකාරම් ලෙස ගෙවන ලෙස ආයතනයේ කළමනාකාරිත්වයෙන් ඉල්ලා සිටි අතර ඒ අනුව අත්තිකාරම් ලෙස රු.30,300,767.74 ක මුදලක් 2019 වසරේ මුල් කාර්තුවේදි අතුරු ප්‍රසාද දීමනා | පිළිතුරු සපයා නැත. (මෙතෙක් ගැලපීම් කර නැත.) |

| | | | | |
|---|---|---|---|---|
| | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | | ලෙස ගෙවන ලදී. නැවත 2019 වසරේ අවසන් ගිණුම් සැකසීමේදි ආයතනය විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල එය වියදමක් ලෙස සලකා අවසානයේ ඉතිරි ලාභයට වෙනම ගලපන ලදී. කෙසේ නමුදු ඔබ විසින් පෙන්වා ඇති ප්‍රමාණය නිවැරදි නොවන අතර ප්‍රසාද දිරි දීමනා අප විසින් නැවත ගණනය කරන ලදි. ඒ අනුව අතිරේක ප්‍රසාද දිරි දීමනා මුදල ඉදිරියේදි ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදි.<br>නැවත ඉදිරි වර්ෂයේදි මෙසේ ප්‍රසාද දිරි දීමනා අත්තිකාරම් ලෙස නොගෙවීමට ආයතනය තවදුරටත් සටහන් කර ගන්නා ලදි. | |
| (ක) | 2013 වර්ෂයේදී ඛණිජ වැලි බහුලව පවතින හෙක්ටයාර් 17.6 ක බිම් ප්‍රමාණයක් කෝකිලායි ප්‍රදේශයෙන් සමාගම විසින් අත්පත් කරගෙන ඒ සඳහා රු.මිලියන 2.25ක මුදලක් මුලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත 2012 වර්ෂයේදී ගෙවා තිබුණු අතර එම වර්ෂයේදීම කෝකිලායි ව්‍යාපෘතිය වෙනුවෙන් යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා රු39,339,473 ක් ද වැයකර තිබුණි. කැනීම් කිරීම සඳහා අවශ්‍ය කැණීම් බලපත්‍රය ලබාගෙන නොතිබීම මත සමාලෝචිත වර්ෂය දක්වාම එම ප්‍රදේශයේ කිසිදු කැනීම් | කෝකිලායි ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කළයුතු අතර යන්ත්‍රසූත්‍ර ද නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. | පිලිතුරු සපයා නැත. | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පාරිසරික නිර්දේශය ලබා ගැනීමෙන් අනතුරුව කෝකිලායි-කොක්කුතුඩුවායි ප්‍රදේශය සඳහා කැණීම් බලපත්‍රය මේ වන විට ලබාගෙන ඇත. කෝකිලායි යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම සඳහා මේ වන විට කටයුතු සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කටයුත්තක් කර නොතිබුණි. තවද ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් වත්කම් සියල්ල පුල්මුඩේ යන්ත්‍රාගාරයේ වෙනත් ස්ථානවල ස්ථාපිත කර නිශ්කාර්යව තිබුණු අතර ඇතැම් යන්ත්‍ර ගබඩාවේ නිශ්කාර්යව ගොඩ ගසා තිබුණි. මෙම යන්ත්‍රවලින් ස්පයිරල් 24 ක් බ්ලොක් A පැරණි යන්ත්‍රාගාරයේ සවිකර තිබුණ ද ඒවාද ක්‍රියාකාරී තත්ත්වයේ නොතිබුණි. එසේම 2015 වර්ෂයේදී කෝකිලායි ව්‍යාපෘතිය සඳහා සේවකයින් 117 දෙනෙකු බඳවාගෙන ඔවුන් යන්ත්‍රාගාරයේ විවිධ ස්ථාන වලට අනුයුක්ත කර තිබුණි. ඒ අනුව අතිරික්ත සේවක සංඛ්‍යාවක් පැවතීමෙන් නිෂ්පාදනවල පිරිවැය ඉහල යාමට එයද බලපා තිබුණි. | | | |
| (ග) | ඉන්ධන වියදම් සියයට 50 කින් ඉතිරිකර ගැනීම සඳහා රු.62,370,234 ක් වටිනා ඩ්‍රයර් යන්ත්‍ර 2016 ජුනි 30 දින ආනයනය කර ඒ සඳහා රු.1,164,350ක ප්‍රමාද ගාස්තු ඇතුළුව රු.43,838,767ක් 2020 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් ගෙවා තිබුණු අතර වසර 5ක් ගතවුවද, මෙම යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට 2021 මාර්තු 21 දින වන විටත් සමාගමට නොහැකිවී තිබුණද ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන | යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ගැනීමට කටයුතු කළ යුතු අතර වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙය ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කටයුතු මේ වන විට 75% ක් අවසන් කර ඇත. වැඩ කටයුතු කර ගෙන යාමට අවශ්‍ය රහස්‍ය අංකය (password) නොමැති බැවින් අවසන් කිරීමට නොහැකි වීම නිසා ඉදිරියේදි එයට අදාල මෘදුකාංගය නැවත ලිවීමට හෝ වෙනස් කිරීමට අදාල කටයුතු ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ලැබේ. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඔවුනට එරෙහි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | | | |
| (ච) | සමාගමේ නිෂ්පාදන කටයුතු වර්ධනය කරගැනීම සඳහා හදිසි මෙන්ම අත්‍යාවශ්‍ය මිලදී ගැනීමක් ලෙස සලකා තෙත වැලි යන්ත්‍රාගාරයට නව Hydroziser යන්ත්‍රය මිලදී ගැනීම සඳහා සමාගම විසින් ඕස්ට්‍රේලියානු මිනරල් ටෙක්නොලොජීස් හි නියෝජිත ශ්‍රී ලාංකීය සමාගමක් මඟින් ආනයනය කිරීමට 2014 වර්ෂයේදී තීරණය කර 2016 ජනවාරි 15 දින රු.15,426,302 කට මිලදීගෙන තිබුණි. මිලදීගෙන වසර 4ක් ගතවුවද, මෙම යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදා ගැනීමට 2021 මාර්තු 21 දින වන විටත් සමාගම කටයුතු කර නොතිබුණි. ඒ අනුව මෙම යන්ත්‍රය හදිසි අවශ්‍යතාවයන් මත මිලදී ගත් යන්ත්‍රයක් නොවන බව පැහැදිළි වුවද යන්ත්‍රය මිළදී ගැනීම සම්බන්ධයෙන් වගකිව කිවයුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | යන්ත්‍රය නිෂ්පාදන කටයුතුවලට යොදාගැනීමට කටයුතු කළ යුතු අතර වගකිව යුතු නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. | පිලිතුරු සපයා නැත. | Hyarosizer යන්ත්‍රය කමිෂනින් කිරිමෙන් පසු ආරම්භ කරන ලදි. ආරම්භ කිරිමෙන් දින 2 1/2කට පසු නැවත අක්‍රිය තත්ත්වයකට පත්වන ලදි. එසේවිමට ප්‍රධාන හේතුව වනුයේ විදුලි පද්ධතියේ සිදුවන්නාවූ හදිසි බිද වැටිමකදි එහි පරිපථයට හානි සිදු විමයි.<br>මේ සම්බන්ධව යන්ත්‍රය මිලදි ගත් ආයතනය සමග සාකච්ඡා කර එම දෝෂයට ලක්වි ඇති කොටස ගෙන්වා ගැනිමට මේ වන විටත් කටයුතු සැලසුම් කර ඇත. එම කොටස ලැබුණු විගස යන්ත්‍රය නැවත යථා තත්ත්වයට පත් කර නිෂ්පාදනය සඳහා භාවිතා කළ හැක. |
| (ජ) | 2004 වර්ෂයේ සිදු වු සුනාමි ව්‍යවසනයෙන් පුල්මුඩේ යාත්‍රාංගණය විනාශවීමෙන් පසු කොඩ්බේ යාත්‍රාංගණයද භාවිතයට ගෙන නොතිබුණි. ඒ | යාත්‍රා අලෙවි කිරීමට, පැවරිමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග | මේ වන විට ටග් යාත්‍රා හා බත්තල් වල තත්සේරු කටයුතු සිදු කිරීම සඳහා තත්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඒ අතර අදාල | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් එහි තිබූ ටග් හා බත්තල් යාත්‍රා ප්‍රයෝජනයට නොගෙන වසර 16 කට වැඩි කාලයක් දිරා පත්වෙමින් පැවතියද අදාල යාත්‍රා හා උපාංග පැවරිමට හෝ අපහරණය කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩිනමින් ගත යුතුය. | තත්සේරු කටයුතු සිදු වූ පසු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කටයුතු සූදානම් කර ඇත. | |
| (ට) | යන්ත්‍රාගාරවලින් ඉවත්වන (සුදුවැලි) තොගවලට අමතරව පෙරසැරි කරන ලද ඛනිජවැලි තොග සමාගමේ විශාල භූමි ප්‍රදේශයක විවිධ ස්ථාන වල අනාරක්ෂිතව වසර කිහිපයක සිට ගොඩ ගසා තිබූ අතර එම වැලි තොග අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු නොකිරිම හේතුවෙන් භූමියේ ඉඩකඩ ඇහිරී තිබුණි. | වැලි තොග අලෙවි කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | යන්ත්‍රාගාරයේ ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන්, හයිටයි ඉල්මනයිට් යන ප්‍රධාන නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරිමේ දි බිහිවන්නාවූ අතුරු නිෂ්පාදන වන Low Geade Zircon Crude, Final Tallings Lot -02, Hydrosizer Fines ආදිය ප්‍රධාන වශයෙන් ගබඩා කරනුයේ විවෘත ගුදම් තුලය. මෙම අතුරු නිෂ්පාදනයන් හි නියැදි තෝරා රසායනාගාරය වෙත යොමු කිරිමේ දි යම් යම් වැලි තොගයන්හි වටිනාකමින් වැඩි බර ඛනිජ වැලි යම් ප්‍රතිශතයක් පවතින හෙයින් එම වැලි නැවත පරිපහදු කාර්යය සඳහා භාවිතා කර එයින් ඉවත් වන්නාවූ Tallings නැවත ගබඩා කිරිමකින් තොරව කැණීම් කලාප පිරවීමේ කාර්ය සඳහා භාවිතා කරයි. මේ වන විට Low Geade Zircon Crude යන නිෂ්පාදිතය එසේ පිරිපහදු කර ඇත.<br>හයි ටයි ඉල්මනයිම් අලෙවි කිරිම සඳහා මේ වන විටත් ටෙන්ඩර් කැඳවා ඇත. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දැනට මෙ.ටො.40000කට ආසන්නව ගබඩා කර ඇති අතුරු නිෂ්පාදනයක් වන Final Tallings Lot -02 නැවත පිරිපහදු කිරිම සඳහා නව යන්ත්‍රාගාර ස්ථාපනය කිරිම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇත. | |
| (ඞ) | 1997 දෙසැම්බර් 02 දින සිට පරිපාලන නිලධාරි තනතුර දරමින් සිටිය දී විනය පරික්ෂණයකට අනුව චෝදනා 11 කට වැරදිකරු ලෙස නිගමනය ලදුව 2017 සැප්තැම්බර් 15 දින සිට සමාගමේ සේවයෙන් පහ කළ නිලධාරියකු සභාපතිවරයා විසින් සමාගමේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන)(වැ.බ.) තනතුර සඳහා 2020 අප්‍රේල් 01 දින සිට රු.120,000 ක මාසික දීමනාවකට ද, 2020 ඔක්තෝබර් 12 දින සිට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත පුල්මුඩේ යන්ත්‍රාගාරයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන) - (HM1-3) තනතුරේ වැඩ බැලීමටද පත් කර තිබුණු අතර අදාල නිලධාරියා වෙනුවෙන් 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා දීමනා ලෙස රු.2,052,898 ක් සමාගමෙන් ගෙවා තිබුණි. මෙම අයථා පත් කිරිම නිවැරදි කිරීමට හා ඒ | අයථා පත් කිරිම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත. | මෙම පත්කිරීමට කිරිමට අදාල අංක MI/CIA/LMSL/APP/D GMAdmin/2020 දරන 2021.05.31 දිනැති විමර්ශණ වාර්තාවක් කර්මාන්ත අමාත්‍යාංශයෙන්ද ඉදිරිපත්ව ඇති අතර ඒ සම්බන්ධයෙන් ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව සිය නිර්දේශය අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අදාල විගණන වාර්තාවේ සඳහන් කරුණු සමඟ එකඟ නොවන අතර අදාල විගණන වාර්තාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය පරිදි පිළිතුරු ලබා ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | වෙනුවෙන් කරනලද ගෙවීම් වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට සමාගම මෙන්ම අමාත්‍යාංශයද කටයුතු කර නොතිබුණි. | | | |
| (ණ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව සභාපතිවරයාගේ පෞද්ගලික සහකාර තනතුරට පත්කළ නිලධාරියා හට සමාගමෙන් 2020 මාර්තු සිට 2021 පෙබරවාරි දක්වා දිමනා ලෙස රු.646,749 ක්ද, අතිකාල වශයෙන් රු.500,000 ක්ද පුල්මුඩේ ගමන් කිරීම සඳහා දිනකට රු.1000 බැගින් රු.60,000ක් ද වශයෙන් එකතුව රු.1,206,749 ක ගෙවීම් කර තිබුණි. මෙම තනතුර අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ නොමැති තනතුරක් වන අතර අනිසි ලෙස බඳවාගෙන ඒ වෙනුවෙන් ගෙවන ලද වැටුප් හා දීමනා වගකිව යුතු නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයථා පත් කිරිම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු සපයා නැත.<br><br>(මෙම පත් කිරීම 2021.06.30 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි අවසන් කර ඇත.) | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ත) | සමාගමේ උසස් කිරීම් පිළිබඳ සිදු කළ නියැදි පරික්ෂාවේදි බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට පටහැනිව කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතියකින් තොරව සමාගමේ සභාපති විසින් නිලධාරීන්ට පෞද්ගලික වන ලෙස වැටුප් කේත වෙනස් | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියට බැහැරව කටයුතු නොකළ යුතුය. | පිළිතුරු සපයා නැත. | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කරමින් තනතුරු උසස් කර වැටුප් ගෙවා තිබුණි. | | | |
| (ද) | සමාගමේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු වන ප්‍රධාන රසඥ තනතුර වසර 10ක සිටද වෛද්‍ය නිලධාරි තනතුර වසර 05ක සිටද ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි( මූල්‍ය) හා ජ්‍යෙෂ්ඨ සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) යන තනතුරු 2019 අප්‍රේල් මස සිටද පුරප්පාඩුව පැවතුණි. මේ දක්වා ස්ථිර නිලධාරින් මෙම තනතුරු සඳහා බඳවාගැනීමට සමාගමට නොහැකි වී තිබුණි. | ප්‍රධාන තනතුරු සඳහා නිලධාරීන් කඩිනමින් බඳවා ගත යුතුය. | පිළිතුරු සපයා නැත.<br><br>(මේ වන විට සේවයේ යෙදී සිටින රසඥ මහතුන් දෙදෙනා රසායනාගාරයට අයත් රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි.) | ගැටළුව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (න) | සමස්ත ආයතනයේ නිෂ්පාදන, පරිපාලන, ගිණුම් හා අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් ගනු ලබන ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින සාමාන්‍යාධිකාරී තනතුර ස්ථිරව පිරවීමට කටයුතු කළ යුතු වුවත් එසේ නොකර අදාළ තනතුර සඳහා ද්විතික පදනම මත නිලධාරින් බඳවාගෙන තිබුණු අතර 2021 දෙසැම්බර් සිට කොන්ත්‍රාත් පදනමින් වසරක කාලයකට නිලධාරියකු බඳවාගෙන තිබුණි. | ස්ථිර නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | 2020.11.05 වන දින පුවත්පත් දැන්වීම් පළ කර අයදුම්පත් කැඳවීම් කරන ලදි. ඒ සඳහා අයදුම්කරුවන් 19 දෙනෙකු විසින් අයදුම්පත් ඉදිරිපත් කරන ලද අතර ඒ අතරින් අපේක්ෂිත සුදුසුකම් සහිත එක් අයදුම්පත්‍රයක් පමණක් ලැබී ඇත. ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදි. එම අයදුම්කරු මූල්‍ය අංශයට අදාල සුදුසුකම් සහිත අයෙකු වීම නිසා රේඛීය අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධව තිරණයක් ලබා දී නොමැති බව වාර්තා වේ. | මේ වන විට අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ එක් වසරක කාලයක් සඳහා 2021.09.28 සිට 2022.09.27 දක්වා කොන්ත්‍රාත් පදනම මත සාමාන්‍යාධිකාරි තනතුරේ රාජකාරි කටයුතු කිරිම සඳහා පත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ප) | අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව නිලධාරින් පස් දෙනෙකු අනුයුක්ත කර තිබුණද, විගණන සැලැස්මට අනුව ප්‍රමාණවත් විගණනයක් සිදුකර නොතිබුණි. | විගණන සැලැස්ම පරිදි කටයුතු කළ යුතුය. | නිසි බලධාරිගේ 2017/06/05 දිනැති ලිපිය මගින් සමාගමේ සියළුම ගෙවීම් හා ප්‍රසම්පාදන කටයුතු පූර්ව විගණනයකට ලක් කළ බවට නියෝග කරන ලදි. ඒ අනුව ප්‍රධාන කාර්යාලයේ සියළුම මිල ගැනීමේ හා ප්‍රසම්පාදන කටයුතු පූර්ව විගණනය සඳහා කාර්ය මණ්ඩලයේ සැලකිය යුතු කාලයක් වැය කිරිමට සිදු විය. මේ තුල 2018/2019/2020 කාලය තුල විශාල කාර්ය භාරයක් අභ්‍යන්තර විගණන අංශය සිදු කරන ලදි.<br><br>එසේ නමුදු මේ තුල අනවශ්‍ය මිලදී ගැනිම අසුරා ලීම, අනාර්ථික ගනුදෙනු කලින් හඳුනාගැනීම, වැරදි ගෙවීම්, ආදිය මුලින්ම හඳුනාගෙන වැලැක්විමට කටයුතු කරන ලදි.<br><br>කෙසේ වුවද පූර්ව විගණන කටයුතු විශාල ප්‍රමාණයක් ඉටු කිරිම තුල විගණන වැඩසටහන අනුව සිදු කිරිමට අපේක්ෂිත යම් යම් විෂය කොටස් මගහැරි ගිය අතර දැනට පූර්ව විගණන කටයුතු ප්‍රසම්පාදන කටයුතු වලට පමණක් සීමා කර ඇති පසුබිමක යලිත් 2021 වර්ෂයේ සිට විගණන සැලසුමට අනුව කටයුතු කිරිමට පියවර ගෙන ඇත. | 2020 සහ 2021 වර්ෂ වල කොරෝනා තත්ත්වය තුල රට වසා දැමිම/සීමිත සේවක සංඛ්‍යාවක් පමණක් සේවයට කැඳවිම මත 2021 වර්ෂය සඳහා අනුමත විගණන වැඩසටහනේ සියළුම කාර්යයන් විගණන සැලැස්මේ දක්වා ඇති ආකාරයටම 2022.03.31 දිනට පෙර නිම කිරිමට කටයුතු කරනු ලැබේ.<br><br>ඉදිරියේ දී විගණන සැලසුමට අනුව කටයුතු කිරිමට සටහන් කරගන්නා ලදි. |

## 4.42 පරන්තන් කෙමිකල්සි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 335,906,171 | 261,642,255 | 723,035,747 | 673,635,143 | 74,263,916 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 325,646,375 | 252,265,648 | 793,890,376 | 131,730,114 | 73,380,727 | තත්ත්වාගණනය කළ |
| **2020** | 339,618,072 | 257,588,332 | 863,720,313 | 184,500,513 | 82,029,740 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වසා දමා ඇති ආයතන 5කින් අයවිය යුතු රු.4,579,926ක් වූ ණය ශේෂ අයකර ගැනීමට හෝ අවශ්‍ය අනුමැතීන් ලබාගෙන පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය අනුමැතීන් ලබාගෙන ගිණුම්වල ගැලපීම් කළ යුතුය. | වසා දමා ඇති ආයතනවලින් ලැබිය යුතු ශේෂයන් පිළිබඳ තීරණයක් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට ආයතනය කටයුතු කරන ලදි. | වසා දමා ඇති සමාගම් දෙකෙන් අයවිය යුතු රු.3,669,987.50 ක මුදල පොත්වලින් ඉවත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| (ආ) | තවමත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ආයතන වෙතින් අයවිය යුතු ලෙස ගිණුම්වල දක්වා ඇති වසර 10කට වඩා පැරණි රු.5,052,627 ක් වූ ශේෂයන් අයකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බී.සී.සී. ලංකා ලිමිටඩ් වෙතින් ලැබිය යුතු රු.3,631,896 ක මුදල සම්බන්ධයෙන් මෙම ආයතනය වෙත අවස්ථා ගණනාවකදී ලිඛිත දැනුම්දීම් සිදුකර ඇති අතර අදාළ ණය මුදල අයකර ගැනීමට අමාත්‍යාංශයේද මැදිහත්වීමෙන් අවශ්‍ය කටයුතු සිදුකර ගෙන යනු ලැබේ. | ඉදිරියේදී මාස තුනක් ඇතුලත අදාළ සම්පූර්ණ මුදලම පරන්තන් කෙමිකල්ස් සමාගම වෙත ගෙවීමට කටයුතු කරන බව බීසීසී සමාගමේ සාමාන්‍යාධිකාරී විසින් 2022.02.11 වන දින දුරකථන මාර්ගයෙන් දැනුම් දී ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද ලැබී ඇති බව දැනුම් දී ඇත. |
| (ඇ) | කෝස්ටික් සෝඩා ලයි සඳහා ඇති ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, කොස්ටික් සෝඩාවලට වටිනාකමක් එකතු කිරීම හා පරන්තන් කෙමිකල්ස් ආයතනයට දැනට ලබාගත නොහැකි වෙළඳපල වෙත ළඟා වීමේ අරමුණින් කෝස්ටික් සෝඩා දියර සෑදීමේ ව්‍යාපෘතිය 2015 දෙසැම්බර් 30 දින කළුතර නාගොඩ කර්මාන්තපුරයේ ආරම්භ කර 2016 අප්‍රේල් 25 දින වැඩ අවසන් කර තිබුණි. එසේ වුවද මෙම කෝස්ටික් සෝඩා දියර සකසන යන්ත්‍රය යකඩ වලින් සාදා තිබීම නිසා යකඩ හා කෝස්ටික් සෝඩා දියර ප්‍රතික්‍රියා කර යකඩ කෝස්ටික් සෝඩා ලයි සමඟ මිශ්‍ර වී ඒවා අලෙවි කිරීමට නොහැකි වීමෙන් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. නිසි අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා | සිදුවී ඇති අලාභයන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | මෙම ව්‍යාපෘතිය “පර්යේෂණ සහ සංවර්ධන” සංකල්පය මත ආරම්භ කර ඇති අතර මේ වන විටත් එහි කටයුතු සිදු කරමින් පවතී. | ➢ මල බැඳීම තවදුරටත් අවම කිරීම සඳහා උක්ත යකඩ ටැංකිය වෙනුවට සුදු යකඩ ටැංකියක් ආදේශ කිරීමට අපේක්ෂා කරමි.<br>➢ මෙම ව්‍යාපෘතිය මේ දක්වා කිසිදු අයුරකින් අතහැර දමා නොමැති අතර වෙනත් ටැංකියක් ආධාරයෙන් නිෂ්පාදන සිදුකිරීම දිගින් දිගටම සිදුකරනු ලබයි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතනයට රු. 2,089,000 ක අලාභයක් සිදු වී තිබුණි. මෙම යන්ත්‍රය භාවිතා නොකිරීම හේතුවෙන් මළ බැඳීම් වලට ලක් වී තිබූ අතර සමහර කොටස් එම භූමියේ තැන තැන දමා දිරාපත්ව වල් බිහි වී තිබුණි. එසේම එම යන්ත්‍රය ගබඩා කර ඇති ගොඩනැගිල්ලද කිසිදු කාර්යයකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | | | |
| (ඇ) | 1986 වසරේ සිට පරන්තන් නිෂ්පාදනාගාරයේ ක්ලෝරීන් නිෂ්පාදනය නවතා දැමීම හේතුවෙන් මෙරටට අවශ්‍ය කෝස්ටික් සෝඩා හා ක්ලෝරීන් මුළුමනින්ම ආනයනය මඟින් සපුරාගෙන තිබුණි. පරන්තන්හි පිහිටා ඇති අක්කර 227 ක භූමියේ ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු සඳහා යන්ත්‍රාගාරයක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ යෝජනා කර තිබූ අතර 2020 වර්ෂයේදී ශක්‍යතා අධ්‍යයනයක් හා පරිසර බලපෑම් තක්සේරුවක් කර ඒ වෙනුවෙන් පිළිවෙලින් රු.7,611,111 ක හා රු.2,116,750 ක වියදම් දරා තිබුණද යන්ත්‍රාගාරය ඉදිකිරීම් කටයුතු මේ දක්වා ආරම්භ කර නොතිබුණි. | පරන්තන් කම්හලෙහි ක්ලෝරීන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම ව්‍යාපෘතිය පරන්තන්හි ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සමාගම විසින් ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. | මෙම ව්‍යාපෘතියට අදාල ශක්‍යතා අධ්‍යයන කටයුතු EML Consultant (Pvt) Limited ආයතනය විසින් අවසන් කර ඇති අතර එහි පාරිසරික බලපෑම (Environment Impact Assessment) පිළිබඳ අධ්‍යනය එම ආයතනය විසින් සිදු කරමින් පවතී. ඒ අනුව ඉහත අධ්‍යයනය 2022.07.31 දිනෙන් නිම කිරීමට නියමිත අතර ඊට සමගාමීව ඉදිරි පියවරයන් මහා භාණ්ඩාගාරය සමඟ සම්බන්ධීකරණය වෙමින් සිදු කරමින් පවතී. |
| (ඉ) | පරන්තන් කෙමිකල්ස් සමාගමේ අනුමත කාර්යය මණ්ඩලය 70 ක් වූ අතර තත්‍ය කාර්යය මණ්ඩලය 55 ක් විය. ඒ තුල ඇතුලත් | පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | අදාල තනතුරු සඳහා බඳවා ගැනීමට කඩිනම් අනුමැතිය ඉල්ලා ලිපි ගණනාවක් රාජ්‍ය ව්‍යාපාර |

| | | | | |
|---|---|---|---|---|
| | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී හා විගණක යන තනතුරු 2019 වර්ෂයේ සිටද, සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර 2013 වර්ෂයේ සිටද, පුරප්පාඩුව පැවතියද 2021 ඔක්තෝබර් 30 දින දක්වා අදාල තනතුරු පිරවීමට සමාගම කටයුතු කර නොතිබුණි. | | | දෙපාර්තමේන්තුව සහ කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ. කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2022.02.07 දිනැති ලිපිය මගින් මේ සඳහා අනුමැතිය ලැබී ඇති අතර ඒ අනුව බඳවා ගැනීම් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. |
| (ඊ) | 2015 සිට 2019 දක්වා වන වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සෑම වසරක් සඳහා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | 2015 සිට 2019 කාල සීමාව සඳහා නිසි බලධාරිවරයෙක් යටතේ පාලනය වූ අතර අධ්‍යක්ෂක මණ්ඩලයක් පත්කර නොතිබිණි. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, වාර්ෂික මහා සභා රැස්වීම් පැවැත්වීමට හැකියාවක් නොවූ බැවින්, වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම මහා භාණ්ඩාගාරය හා අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | නව අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ 2022මාර්තු මස තුල මහා සභා රැස්වීම පවත්වා 2015 සිට 2020 දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |

## 4.43 SLINTEC ඇකඩමි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 9,493,334 | 20,292,944 | 8,722,170 | 19,541,240 | (10,799,610) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 7,758,331 | 5,910,320 | 9,496,137 | 18,441,107 | 1,848,011 | තත්ත්වාගණනය කළ |
| **2020** | 2,616,661 | 1,988,842 | 5,542,498 | 13,857,021 | 627,819 | තත්ත්වාගණනය කළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 9.49 | 20.29 | 8.72 | 19.54 | (10.80) |
| 2019 | 7.76 | 5.91 | 9.50 | 18.44 | 1.85 |
| 2020 | 2.62 | 1.99 | 5.54 | 13.86 | 0.63 |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පවතින අතරම ස්ලින්ටෙක් ඇකඩමිය වෙනම උපාධි ප්‍රදානය කරන | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම හරහා උපාධිය පිරිනැමීමේ හැකියාව සලකා බැලීමට නිර්දේශ කෙරේ. | අධ්‍යක්ෂ මණ්ඩලය ඔබගේ විමසුමේ පෙන්වා දී ඇති සියලුම කරුණු පිළිබඳව සැලකිලිමත් වන අතර ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත විකල්ප ඇගයීමට ලක් කරමින් සිටී. | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම හරහා උපාධිය |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතනයක් ලෙස ලියාපදිංචි කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ ඇකඩමිය විසින් ආරම්භ කරන ලද ආචාර්ය උපාධි පාඨමාලා සහ දර්ශනපති පාඨමාලා සඳහා සමාගම රු.20,293,000 ක මුදලක් වැය කර ඇත. එයින් ඇකඩමියේ නිලධාරීන් දෙදෙනකුගේ වැටුප් සඳහා දරන ලද මුදල සහ ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම ඔවුන්ගේ මානව හා භෞතික සම්පත් පරිහරණය සඳහා ගෙවා ඇති මුදල පිළිවෙලින් රු.9,612,750 ක් සහ රු.7,285,239 කි. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම හරහා එම පාඨමාලා ප්‍රදානය කළ හැකි බැවින් ස්ලින්ටෙක් ඇකඩමිය වෙනම උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස පවත්වාගෙන යාම අකාර්යක්ෂම බව විගණනයේදී අනාවරණය විය. | | | පිරිනැමීමේ හැකියාව සමාලෝචනය කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ආ) | 2017/2018, 2018/2019, සහ 2019/2020 වසරවල ආදායම් සහ වියදම් හා සැසඳීමේ දී වසර තුනක සමුච්චිත ආදායම සහ වියදම පිළිවෙලින් රු.16,891,665 ක් සහ රු.28,115,764 කි. එබැවින් වියදම් පියවා ගැනීමට | අවම වශයෙන් වියදම් පියවීමට ප්‍රමාණවත් ආදායමක්වත් උපයා ගත යුතුය. | ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි (පුද්ගලික) සමාගම හට පර්යේෂණ සහ දීමනා සඳහා අරමුදල් වෙන් කිරීමට මූල්‍ය දුෂ්කරතා ඇති බැවින්, 2018 දී සිසුන් බඳවා ගැනීම නතර කරන ලදී. 2022 පෙබරවාරි | ගැටළුව විසඳීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට ඇකඩමිය අපොහොසත් වී ඇති අතර කළමනාකාරීත්වය මේ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | මාසයේ සිසුන්ගේ උපාධිය ලබා දීමෙන් පසු, ස්ලින්ටෙක් ඇකඩමිය සඳහා ඉදිරි ගමන් මගක් සකස් කෙරේ. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ සමාගමේ මුළු වත්කම් සහ මුළු වගකීම් පිළිවෙලින් රු.5,542,498 සහ රු.13,857,021 ක් වූ අතර මුළු වගකීම් රු.8,314,523 කින් මුළු වත්කම් ඉක්මවා ඇත. එබැවින්, සමාගමේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පැවැත්මේ අවදානමක් ඇති බව විගණනය නිරීක්ෂණය කරන ලදී. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සලකා බැලිය යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | අවදානම අවම කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

## 4.44 ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 110,717,975 | 101,980,053 | 2,731,731,923 | 2,560,423,893 | (165,205,857) | තත්ත්වාගණනය නොකල |
| **2019** | 83,323,479 | 104,230,652 | 3,132,890,936 | 3,026,154,036 | (150,335,139) | තත්ත්වාගණනය කල |
| **2020** | 85,549,401 | 90,163,505 | 3,870,959,655 | 3,863,232,080 | (100,148,607) | තත්ත්වාගණනය කල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 110.72 | 101.98 | 2,731.73 | 2,560.42 | (165.21) |
| 2019 | 83.32 | 104.23 | 3,132.89 | 3,026.15 | (150.34) |
| 2020 | 85.55 | 90.16 | 3,870.96 | 3,863.23 | (100.15) |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි මස සින්තටික් ජීව විද්‍යාගාරය සඳහා මිල දී ගත් පිරිවැය රු.73,596,384ක් වූ උපකරණ 2019 සැප්තැම්බර් මාසය අවසන් වන විටත් එම කාර්යය සඳහා යොදා නොගෙන ඉතිරිව තිබුණි. | උපකරණ ප්‍රසම්පාදනය කළ යුත්තේ නිශ්චිත අරමුණ හඳුනාගෙන වන අතර ඒවා නිෂ්ක්‍රීය නොකර එම කාර්යය සඳහා යොදා ගත යුතුය. | නිරීක්ෂණය පැහැදිලි නැත. ප්‍රතිචාරය සඳහා වැඩි විස්තර අවශ්‍යයි. | නිරීක්ෂණයට සමානයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දේපල පිරියත සහ උපකරණ පිළිබඳ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතයේ 17.19 වගන්තියට (17 වන වගන්තිය) අනුව වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කළ යුතු අතර පෙර ඇස්තමේන්තුවට වඩා වෙනස් නම්, එම වෙනස 10.15- 10.18 ඡේදයට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත්, සම්පූර්ණ ක්ෂය වී ඇති රු. 235,016,653 ක් වූ ස්ථාවර වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාගම විසින් සමාලෝචනය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සමාගම ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. | සමාගම් ප්‍රතිපත්තිය වන්නේ දේපල, පිරියත සහ උපකරණ පිරිවැය පදනම මත අගය කිරීම මිස ප්‍රතිඅගය පදනම මත නොවේ. ඉතිරි වත්කම් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර ඒවා බැහැර කිරීමට තවමත් තීරණය කර නොමැත. | නිරීක්ෂණයට සමානයි. |
| (ඇ) | 2020 මාර්තු 31 වන විට සමුච්චිත අලාභයක රු.1,255,772,577 ක් වන අතර ශුද්ධ වත්කම් රු.106,736,899 දක්වා පහත වැටී තිබීම හේතුවෙන් ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 1,362,99,477 ක් විය. එබැවින් සමුච්චිත අලාභය හේතුවෙන් ආයෝජනය කරන ලද ප්‍රාග්ධනය 92.2% කින් අපහායනය වී ඇති බව නිරීක්ෂණය විය. 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වන වගන්තිය අනුව ආයතනයේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩුය වූ විට ව්‍යාපාරික අස්ථිත්වයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දරුණු ගැටළුවක් පවතියි. | ආදායම වැඩි කර අනවශ්‍ය වියදම් අඩු කිරීමෙන් පාඩුව අවම කර ගැනීමට සමාගම උත්සාහ කළ යුතුය. | COVID - 19 වසංගතය හේතුවෙන්, රටේ ප්‍රධාන කර්මාන්ත සඳහා පර්යේෂණ ප්‍රමුඛතාවයක් නොවීය. එබැවින් විවිධ භාණ්ඩ 5ක් යටතේ ප්‍රක්ෂේපණය කර ඇති පරිදි අපේක්ෂිත ආදායම ලබා ගැනීමට ස්ලින්ටෙක් හට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය මධ්‍යයේ ස්ලින්ටෙක් විසින් ව්‍යාපාරික අවස්ථා අත්පත් කර ගෙන ඇති අතර ස්වැබ් (SWAB) නිෂ්පාදනයෙන් | SWAB නිෂ්පාදන තාක්ෂණය සාර්ථකව පුද්ගලික අංශයට පැවරූ නමුත් ඒවායේ මිල සීඝ්‍රයෙන් පහත වැටීම හේතුවෙන් ආනයනික SWAB මිලදී ගැනීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කිරීම නිසා අපේක්ෂිත ආදායම නොලැබුණි. කෙසේ වෙතත්, වසංගතයේ මුල් |

2017 අංක 14 දරණ සමාගම් පනතේ 220 වන වගන්තියේ අරමුණු ප්‍රකාරව 2020 අගෝස්තු 10 වන දින අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සභාගත කරන ලද චක්‍රලේඛය අනුව, විද්‍යා කණ්ඩායම ඛාණ්ඩ 5 ක් සඳහා වෙන් කර සෑම ඛාණ්ඩයකටම ආයතනයේ කෙටි කාලීන ආදායම් උපාය මාර්ගයක් ලෙස ඉදිරි මාස 09 තුළ රු. මිලියන 4 ක් ජනනය කිරීමේ ව්‍යාපෘති 02ක් බැගින් සකස් කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ඒම මාස 09 ඉකුත් වී තවත් මාස 06 ක් ගත වී තිබුණද, එවැනි ව්‍යාපෘතියක් තුළින් කිසිදු ආදායමක් විගණනය කරන දිනය වන 2020 ජනවාරි 06 වනවිටත් ජනනය වී නොමැති බව නිරීක්ෂණය විය.

රු.මිලියන 86 කට වැඩි පුරෝකථනය නොකළ ආදායමක් උපයා ගැනීමට හැකි විය. නව මුහුණු ආවරණ පරීක්ෂා කිරීමේ පහසුකම විශ්ලේෂණ සේවා ආදායම වැඩි කිරීමට දායක විය. තවද, ස්ලින්ටෙක් විසින් LAMP PCR පරීක්ෂණ කට්ටලය නිපදවා ඇති අතර එය ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලියක පවතී. අනුමැතිය ලැබුණු පසු නිවැමුම වාණිජකරණය කිරීම සඳහා පුද්ගලික අංශය සමඟ නව හවුල් ව්‍යාපාරයක් නිර්මාණය කෙරේ.

අවධියේදී, ගෝලීය වෙළඳාම ඇණහිට ඇති විට සහ Covid 19 පරීක්ෂණ සඳහා රට තුළ SWAB නොමැති විට, ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලජි සමාගම විසින්, රට සම්පූර්ණයෙන් අගුලු දමා තිබියදී, වෙහෙස නොබලා වැඩ කර මාසයක් ඇතුළත ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමත SWAB සාර්ථකව නිෂ්පාදනය කර රජයට සපයන ලදී. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලජි සමාගමෙහි මෙම මැදිහත්වීමෙන් රටට ලැබුණු සමාජ ප්‍රතිලාභය මුදල් වලින් මැනිය නොහැක. ජාතික ඖෂධ නියාමන

අධිකාරිය සමඟ සාර්ථකව ලියාපදිංචි වීමෙන් පසු SLINTEC LAMP PCR පරීක්ෂණ කට්ටලය දේශීයව නිෂ්පාදනය සඳහා හවුල් ව්‍යාපාර සමාගමක් පිහිටුවන ලදී. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිෂ්පාදනය ලියාපදිංචි කර අපගේ නිෂ්පාදන පහසුකම සඳහා GMP තත්ත්වය ද ලබා දී ඇත. ආනයනය කරන ලද PCR පරීක්ෂණ කට්ටල මිල ශීඝ්‍රයෙන් පහත වැටී ඇති බැවින් මෙහිදී නැවතත් අපේක්ෂිත ආදායම ජනනය නොවීය. මීට අමතරව, ප්‍රාථමික පරීක්ෂාව සඳහා මිල අඩු නමුත් අඩු විශ්වාසනීය ක්‍රමයක් වන ප්‍රතිදේහජනක

පරීක්ෂණ කට්ටලය භාවිතය ද රජය අනුමත කළේය. පොහොර සහ කෘෂි රසායන ආනයනය/භාවිතා කිරීම තහනම් කිරීම අනුව ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලජි සමාගම විසින් අරමුදල් ලබා ගැනීම සඳහා ප්‍රධාන පාර්ශ්වකරුවන් වන කෘෂිකර්ම අමාත්‍යාංශය, LPL, SAPP, ලක් පොහොර සහ කෘෂි රසායන සමාගම් වෙත ජෛව පොහොර/ ජෛව පළිබෝධනාශක ව්‍යාපෘති කිහිපයක් ඉදිරිපත් කරන ලදී. ලැබුණු ධනාත්මක ප්‍රතිපෝෂණ මත පදනම්ව, POC අදියර සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තර

| | | | | |
|---|---|---|---|---|
| | | | | අරමුදල් සහිත ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කරන ලදී. අවසානාවන්ත ලෙස. තහනම ඉවත් කිරීමත් සමඟ, ඔවුන්ගෙන් කිහිප දෙනෙකු හැර, බොහෝ දෙනෙකුගේ උනන්දුව නැති විය. |
| (ඇ) | වසර 6කට වැඩි කාලයක් ගෙවීම පැහැර හැර ඇති ඉන්දියානු සමාගම් දෙකකින් ගෙවිය යුතු රු.170,006,139ක ශේෂයන් දෙකක් ණය ගැතියන්ට ඇතුළත් විය. සමාගම ඒ පිළිබඳව ප්‍රතිපාදන සලසා තිබූ අතර, නැවත අයකරගැනීමේ ක්‍රියාමාර්ග සතුටුදායක මට්ටමකින් සිදු නොවන බව නිරීක්ෂණය විය. | ණය ගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | ඉහත කාරණය නිශ්චිත ගැටළුවක් වන අතර සමස්ත ණය ගැතියන් සෑම මසකම ඉතා උනන්දුවෙන් පසු විපරම් කරන බවත් ප්‍රධාන විධායක නිලධාරී / COO නිරන්තරයෙන් සේවාදායකයා වෙත සම්බන්ධ වී සිටින අතරම හෝ පසු විපරම් ලෙස ඊමේල් මගින් සම්බන්ධ වන බවත් අවධාරණය කිරීමට අපි කැමැත්තෙමු. විස්තරාත්මකව පැහැදිලි කළ පරිදි නාගර්ජුන සෙමෙන් නිකුත් කරන පොහොරවල අයිතිය ඇමෙරිකානු ඩොලර් | නිරීක්ෂණයට සමානයි. |

මිලියන 1.0 කට මිලදී ගෙන ඇත. SLINTEC විසින් පේටන්ට් බලපත්‍රය මාරු කිරීමත් සමඟ ඔවුන් දෙවන වාරිකය ගෙවීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය අභියෝග හේතුවෙන් සේවාදායකයාට ගෙවිය යුතු මුදල් පියවීමට නොහැකි විය. අපි ඉතා උනන්දුවෙන් පසු විපරම් කළ අතර අපගේ සභාපතිවරයා, ප්‍රධාන විධායක නිලධාරියා සහ පර්යේෂණ ප්‍රධානියා සමඟ ඉහත සඳහන් දේ සමථයකට පත් කිරීම සඳහා සේවාදායකයා වෙත ගියේය. තවද අප විසින් අපගේ නමින් ඇති පේටන්ට් බලපත්‍ර නිදහස් කර නොමැති අතර අපට ලැබිය යුතු ඉතිරි මුදල නොලැබුණහොත් අපගේ පේටන්ට් බලපත්‍රය මුදල් ඉපැයීමට ඉදිරිපත් කරන බවට ලිපියක් ද සේවාදායකයා වෙත නිකුත් කර ඇත.


| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2017 සැප්තැම්බර් සිට 2020 අගෝස්තු දක්වා සමාගම විසින් SLINTEC ඇකඩමියේ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා පූර්ණ කාලීන නිවාඩු මත නිදහස් කරන ලද නිලධාරීන් හතර දෙනෙකුගේ වැටුප ලෙස රු.14,730,754 ක මුදලක් ගෙවා ඇත. කෙසේ වෙතත්, ආචාර්ය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු නිශ්චිත සේවා කාලයක් ලබා ගැනීම සඳහා සේවකයින් සමඟ ගිවිසුම් අත්සන් කිරීමට සමාගම අපොහොසත් වී ඇත. | සේවකයාට අධ්‍යාපනය සඳහා පහසුකම් ලබාදීමේදී සමාගම සේවකයන් සමඟ ගිවිසුම් අත්සන් කළ යුතුය. | සියලුම දේශන සතියේ දිනවල සවස 5.00 න් පසු පවත්වා ඇති අතර රසායනාගාර ප්‍රායෝගික සැසි සෙනසුරාදා දිනවල පවත්වන ලදී.<br>ඉහත සඳහන් කළ නිලධාරීන්ගේ අධ්‍යයන කටයුතු SLINTEC හි රාජකාරිවලට බාධාවක් නොවීය. | නිරීක්ෂණයට සමානයි. |
| (ඊ) | සක්‍රීය ඖෂධ අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් ප්‍රමාණයෙන් නිෂ්පාදනය කිරීම සඳහා සක්‍රීය ඖෂධීය අමුද්‍රව්‍ය නියමු උපාය මාර්ගික ව්‍යාපෘතිය වසර 3ක් සඳහා (2017 ආරම්භ කරන ලදී) සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා සමාගම රු.27,315,188ක් වියදම් කරන ලදී. එම වියදම් හැර 2017 වර්ෂයේ සිට රු.88,307,858 ක වියදමින් ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රසායනාගාර උපකරණ 2021 මාර්තු මස අවසානය වන විටත් එම කටයුතු සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. සාර්ථක ලෙස නිම කරන ලද පර්යේෂණ 2ක සමස්ත ඵලදාව අඩුවීම සහ ආර්ථික සඵලතාවය අඩුවීම පවසමින් නියමු අධ්‍යයනය නතර කිරීමට කළමනාකාරිත්වය | සමාජ-ආර්ථික ප්‍රතිලාභ ඉලක්ක කරගත් රාජ්‍ය ප්‍රදාන සමඟ සිදුකරන පර්යේෂණවලින් සමාජ-ආර්ථික ප්‍රතිලාභ ලබා ගත යුතුය. | Thyroxin සඳහා යෝජිත සංස්ලේෂණ මාර්ගය ඉතා අඩු ඵලදාවක් ලබා දුන් අතර එබැවින් එය අත්හැර දමන ලදී - විශේෂයෙන් කෘතිම රසායන විද්‍යාවේ පර්යේෂණ සිදු කිරීමේදී එවැනි අසාර්ථකත්වයන් අපේක්ෂා කළ යුතුය. Beclamethazone සහ Betamethasone යන දෙකම සාර්ථකව සංස්ලේෂණය කර ඇතත්, මෙම මාර්ගය අඩු සමස්ත ඵලදාවක් සහිත පියවර අවශ්‍ය ප්‍රමානයට වඩා වැඩියන් ඇති බවත් ආර්ථික වශයෙන් ශක්‍ය නොවන බවත් සොයා ගන්නා ලදී. එබැවින් | එච් ඒ යූරියා ව්‍යාපෘතිය සඳහා ඇතැම් වත්කම් භාවිතා කර ඇති අතර, නියමු අධ්‍යයනය අවසන් වූ පසු මෙම තාක්ෂණය අමාත්‍යාංශයට පැවරිය හැක.<br><br>කෘත්‍රිම වැඩ සඳහා අවශ්‍ය ප්‍රතික්‍රියාකාරක බොහොමයක් ආනයනය කිරීමට සිදුවන බැවින් ඩොලර් අර්බුදය හේතුවෙන් කාබනික සංස්ලේෂණ |

| | | | | |
|---|---|---|---|---|
| | තීරණය කර ඇත. මේ අනුව, මෙම ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබූ බව නිරීක්ෂණය වේ. | | නියමු පරිමාණයේ අධ්‍යයනය දිගටම කරගෙන නොයාමට කළමනාකාරීත්වය තීරණයක් ගනු ලැබීය. ඉහත හේතූන් නිසා ප්‍රතික්‍රියාකාරක, ද්‍රාවක වාෂ්පීකරණ, අධිශීතකරණ, ගබඩා කැබිනට් වැනි API නියමු බලාගාර ඒකක (සාමාන්‍ය අරමුණු වන) නිෂ්ක්‍රීයව පැවති බැවින්, ඒවා SLINTEC ග්‍රැෆීන් පර්යේෂණ සඳහා ඵලදායී ලෙස භාවිතා කරන ලදී. මෙම සාමාන්‍ය කාර්ය නියමු ඒකක කාබනික සංස්ලේෂණ කටයුතු සඳහා ඕනෑම වේලාවක භාවිතා කළ හැකි බව සඳහන් කළ යුතුය. | වැඩසටහනේ ප්‍රගතියට නැවතත් බලපා ඇත. |
| (උ) | රසායනික වාෂ්ප තැන්පත් කිරීමේ (CVD) ව්‍යාපෘතිය මගින් වියළි කරකැවිය හැකි සහ සිරස් අතට පෙළගස්වා ඇති, බහු බිත්ති සහිත කාබන් නැනෝ ටියුබ් සංස්ලේෂණය කිරීම වාණිජකරණය කිරීමේ මූලික පරමාර්ථය ඇතිව 2019 වසරේ රජයේ ප්‍රදානය යටතේ රු.27,712,850 ක වියදමින් නිම කර ඇත. 2021 මාර්තු වන විට එම | සමාජ ආර්ථික ප්‍රතිලාභ ලබාදීම සඳහා රජයේ ප්‍රදානයන් යෙදවිය යුතුය. | අඩු වාණිජ හැකියාවක් සහ ඉහළ පේටන්ට් බලපත්‍ර පිරිවැයක් හේතුවෙන් CNT නිෂ්පාදන ක්‍රියාවලියේ යම් නව්‍යතාවයක් ඇතත් එම ක්‍රියාවලියට පේටන්ට් බලපත්‍ර ලබා නොදීමට තීරණය විය. කෙසේ වෙතත්, උසස් තත්ත්වයේ ප්‍රකාශනයක් සූදානම් වෙමින් පවතින | මෙම ව්‍යාපෘතිය යටතේ SLINTEC විද්‍යාඥයෙකුට තම ආචාර්ය උපාධි අධ්‍යයනය සාර්ථකව නිම කිරීමට හැකි විය. මෙමගින් මෙම විද්‍යාඥයා ආචාර්ය |

| | | |
|---|---|---|
| ව්‍යාපෘති වාණිජකරණය කිරීමට සමාගම අසමත් විය. | අතර ඉක්මනින් ඉදිරිපත් කරනු ඇත. | උපාධියක් සඳහා විදේශගතවීම සහ විදේශයේ පදිංචි වීම වැළැක්වූවා පමණක් නොව වටිනා විදේශ විනිමය ඉතිරි කර ගැනීමට ද ඉවහල් වේ. අධීක්ෂකවරුන් විසින් සමාලෝචනය කළ පසු සම්පූර්ණ පත්‍රිකා දෙකක් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. |

## 4.45 මැනේජ්මන්ට් සර්විස් රක්ෂණ (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 491,112,502 | 489,043,777 | 98,463,069 | 118,963,636 | 2,068,725 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 583,689,301 | 583,133,628 | 126,289,280 | 180,660,901 | 555,673 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 700,921,898 | 697,459,039 | 146,579,314 | 235,306,493 | 3,462,859 | තත්ත්වාගණනය නොකල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 491.11 | 489.04 | 98.46 | 118.96 | 2.07 |
| 2019 | 583.69 | 583.13 | 126.29 | 180.66 | 0.56 |
| 2020 | 700.92 | 697.46 | 146.58 | 235.31 | 3.46 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම විසින් ජර්නල් සටහන් මෘදු ආකෘතියෙන් (එක්සෙල් පත්‍රයෙන්) පවත්වාගෙන ගොස් ඇති අතර අනුක්‍රමික අංකය සහිත භෞතික ජර්නල් වවුචරයක් සකස් කර වගකිවයුතු නිලධාරියාගේ නිසි | සුදුසු අධිකාරියක් සහිත ජර්නල සටහන් මගින් ගණුදෙනු වාර්තා කිරීම සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් කළමනාකරණය විසින් හඳුන්වා දිය යුතුය. | විගණක විසින් නිර්දේශ කර ඇති පරිදි, අදාළ ජර්නල සටහන් වල දෘඪ පිටපත් නිසි අනුමැතිය සහිතව ගොනු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නෙමු. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුමැතිය ඇතිව පවත්වාගෙන ගොස් නොතිබුණි. | | | |
| (ආ) | සමාගමේ සියලුම ගෙවීම් සිදු කර ඇත්තේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (මව් සමාගම) ගෙවීම් වවුචර මගිනි. ස්වාධීන ආයතනයක් ලෙස, සමාගම සඳහා අනන්‍ය වූ ගෙවීම් වවුචර ක්‍රියාවලියක් සකස් කර නොතිබුණි. | කළමනාකාරිත්වය විසින් නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් සහිත අනන්‍ය ගෙවීම් වවුචර් පද්ධතියක් සමාගමට හඳුන්වා දිය යුතුය. | දැනට, සියලුම ගෙවීම් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ බැංකු ගිණුම් හරහා සිදු කෙරේ. කෙසේ වෙතත් මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගම වෙත මූල්‍ය නිලධාරියෙකු බඳවා ගැනීමෙන් පසු සියලුම ගෙවීම් මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගමේ බැංකු ගිණුම් හරහා සිදු කෙරෙන අතර එම අවස්ථාවේදී මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගමේ වවුචරය භාවිතා කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (ඇ) | සමාගමේ සේවකයින්ට ගෙවන ලද ණය සහ ඒවායේ අයකර ගැනීම් සමාගමේ පොත්වල සටහන් කර නොතිබුණි. ඒ වෙනුවට එම ශේෂයන් මව් සමාගමේ පොත්වල සටහන් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු.134,742,311 කි. | සේවකයන්ට ලබා දෙන ණය ද සේවක ප්‍රතිලාභවල කොටසකි. එබැවින් සේවක ණය සමාගමේ පොත්වල සටහන් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. | මෙය වෙනම සමාගමක් වුවද, සේවකයින් සෘජුවම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත අනුයුක්ත කර ඇත. ඒ අනුව ආරම්භයේ සිටම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් කාර්ය මණ්ඩල ණය ප්‍රදානය කර ඇත. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ ඇති ජංගම ගිණුමේ රු.882,729 ක නොසැසඳුනු වෙනසක් පවතින බව නිරීක්ෂණය විය. | කළමනාකාරීත්වය වෙනස සඳහා හේතු හඳුනාගෙන කාලීනව නිවැරදි කළ යුතුය | අපි දැනටමත් සැසඳුම් සිදු කිරීම ආරම්භ කර ඇති අතර 2021 මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමට පෙර මෙය සම්පූර්ණ කිරීමට අපි සැලසුම් කරමින් සිටිමු. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (ඉ) | රු. 20,789,305 ක් වූ වෛද්‍ය නිවාඩු දීමනා සඳහා අනුමත ප්‍රතිපත්තිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම විධිමත් ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා අවශ්‍ය අධිකාරී බලය ලබා ගත යුතුය | මෙය ආරම්භයේ සිටම සමාගමේ පරිචයක් වූ අතර මෙය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රතිපත්තියට ඇතුළත් කිරීම සඳහා අපි ඔවුන්ගේ මානව සම්පත් දෙපාර්තමේන්තුවට දැනුම් දෙන්නෙමු. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (ඊ) | රු. 1,215,000 ක් වූ අලුත් අවුරුදු තෑගි දීමනාව ගෙවීම සඳහා අනුමත ප්‍රතිපත්තිය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි | සමාගම විධිමත් ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා අවශ්‍ය අධිකාරී බලය ලබා ගත යුතුය | මෙම ගෙවීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පවතියි. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (උ) | 1935 වෘත්තීය සමිති ආඥාපනතේ (පනත) 8(1), 8(2) වගන්තිය සහ 1935 ඔක්තෝබර් 25 දිනැති අංක 8160 දරන ගැසට් පත්‍රය අනුව විධායක ශ්‍රේණි වැටුප් පිළිබඳ සාමූහික ගිවිසුමේ පාර්ශ්වකරුවන් වන වෘත්තීය සමිති හය (06) වලංගු සහ ක්‍රියාකාරී ද යන්න සනාථ කිරීමට විගණනය සඳහා | සාමූහික ගිවිසුමට එළඹීමට පෙර වෘත්තීය සමිති, ක්‍රියාකාරී සහ වලංගු වෘත්තීය සමිති දැයි පරීක්ෂා කල යුතුය. | මානව සම්පත් දෙපාර්තමේන්තුව මෙම කාරණය සම්බන්ධයෙන් ලංකා හාම්පුතුන්ගේ සම්මේලනය (The Employers' Federation of Ceylon) සමඟ සම්බන්ධීකරණය කරමින් සිටින අතර නිරාකරණය වූ පසු | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | | ඔවුන්ගේ පැහැදිලි කිරීම් ඉදිරිපත් කරනු ඇත. | |
| (ඌ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතට අනුව, පෙර වසරේ සිට ගෙන ආ රු.47,545 ක ශේෂය අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි. | ආයතනය, පනතට අනුකූල විය යුතුය. | මෙම මුදල සේවක අර්ථසාධක අරමුදල වෙත ගෙවිය යුතු නොවේ. ඒ අනුව ලබන වසරේ එය ආපසු හැරවීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (එ) | 1980 අංක 46 දරන සේවක භාර අරමුදල් පනතට අනුව, පෙර වසරේ ගෙන ආ රු.5,706 ක ශේෂය අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි | ආයතනය පනතට අනුකූල විය යුතුය. | මෙම මුදල දරන සේවක භාර අරමුදලට ගෙවිය යුතු නොවේ. ඒ අනුව ලබන වසරේ එය ආපසු හැරවීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (ඒ) | 2018 වසරේ සිට සක්‍රීය ගනුදෙනු සඳහා භාවිත නොකළ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ රු.356,677 ක හිතකර බැංකු ශේෂයක් සමාගම සතුව පැවතුනි. | බැංකු ගිණුම පවත්වාගෙන යාමේ අරමුණ සමාලෝචනය කර භාවිතා කිරීමට හෝ අනවශ්‍ය නම් වසා දැමීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත සපයන ලද සේවාව වෙනුවෙන් ලැබුණු මුදලකි. මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගම වෙත නව ගිණුම් නිලධාරියෙකු බඳවා ගැනීමට සහ මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගම තුළ ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපි සැලසුම් කරමින් සිටින අතර එම අවස්ථාවේදී අරමුදල් භාවිතා කරනු ලැබේ. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.1,213,750 ක ශේෂයක් පවතින රු. 1,000,000 ස්ථාවර තැන්පතුවක් 2018 වර්ෂයේ සිට පැවතුනි. සමාගමේ අරමුණු සහ මෙහෙයුම් ස්වභාවය අනුව, මෙම ස්ථාවර තැන්පතුව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් හේතු හෝ තාර්කිකත්වයක් නොතිබුණි. | මෙම ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාමේ අරමුණ සමාලෝචනය කර එය වඩා හොඳින් භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත සපයන ලද සේවාව වෙනුවෙන් ලැබුණු මුදලකි. මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගම වෙත නව ගිණුම් නිලධාරියෙකු බඳවා ගැනීමට සහ මැනේජ්මට් සර්විස් රක්ෂණ පුද්ගලික සමාගම තුළ ගෙවීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට අපි සැලසුම් කරමින් සිටින අතර එම අවස්ථාවේදී අරමුදල් භාවිතා කරනු ලැබේ. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (ඕ) | 2020 ජනවාරි 01 දින සිට ආර්ථික හා සේවා ගාස්තු (ESC) අවලංගු කර තිබුණද, සමාගම විසින් ගෙවිය යුතු ආර්ථික හා සේවා ගාස්තු රු.1,940,901 ක ශේෂයක් සහ ලැබිය යුතු ආර්ථික හා සේවා ගාස්තු රු. 4,346,862 ක ශේෂයක් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශනවල පැවතුනි. | සමාගම බදු නීතිවල වෙනස්කම් වලට අනුකූල විය යුතුය | අපි සැසඳුම් ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු මෙය විසඳනු ඇත | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |
| (ක) | 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | කාලානුරූපී අභ්‍යන්තර විගණන හෝ සමාලෝචන පැවැත්වීම නිර්දේශ කෙරේ. | කාර්තුමය පදනමින් විගණනය සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇත. | මෙම කාරණය තවමත් එලෙසම පවතී. |

## 4.46 හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 0 | 6,415,872 | 648,026,090 | 7,233,477 | 40,704,220 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 39,142,280 | 4,003,549 | 683,974,038 | 17,881,539 | 35,138,732 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 21,624,281 | 3,918,547 | 684,681,298 | 5,132,441 | 17,705,734 | තත්ත්වාගණනය නොකල |





| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | - | 6.42 | 648.03 | 7.23 | 40.70 |
| 2019 | 39.14 | 4.00 | 683.97 | 17.88 | 35.14 |
| 2020 | 21.62 | 3.92 | 684.68 | 5.13 | 17.71 |

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| සමාගම නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.මිලියන 177.97 ක් බදු පදනම මත ආයෝජනය කර හෙක්ටයාර 3.8 ක ඉඩමක් ලබාගෙන ඇත. කෙසේ වෙතත්, මිලදී ගත් ඉඩම කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | මෙම දේපල අපේක්ෂිත අරමුණ සඳහා හෝ එම අරමුණු ක්‍රියාත්මක වන තෙක් වෙනත් ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා භාවිතා කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘතියේ සහ සමාගමේ ඉදිරි ගමන පිළිබඳව සමාගමේ වත්මන් කළමනාකාරිත්වය රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනී | කළමනාකාරීත්වය කිසිදු පියවරක් ගෙන නොමැත. |

## 4.47 කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 97,835,928 | 163,950,973 | 1,085,441,236 | 96,096,328 | 44,853,064 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 137,630,774 | 101,032,665 | 1,173,897,099 | 157,059,219 | 79,426,574 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 130,152,100 | 96,693,193 | 1,225,121,193 | 157,059,218 | 49,716,495 | තත්ත්වාගණනය නොකල |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ අභ්‍යන්තර විගණන අංශය 2018 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක නොවිය. | අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුයි | කැනොවින් හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ විගණන කාර්ය මණ්ඩලය වෙත පැවරීමට | අභ්‍යන්තර විගණනය තවම සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කළමනාකාරීත්වය තීරණය කර ඇත. | |
| (ආ) | එක් පැත්තකට වර්ග අඩි 3004ක් පමණ වන ආකේඩ් හි "A" පැත්තේ සහ "B" පැත්තේ ඉහළ මහල 2012 වර්ෂයේ සිට විගණිත දිනය දක්වා භාවිතා කර නොතිබුණි. | ඉහළ මහලේ ඇති ඉඩ ප්‍රයෝජනයට ගැනීමට වහාම පියවර ගත යුතුය. | වැළැක්වීමේ පියවර ආයතනය විසින් ගෙන නොමැත. | වැළැක්වීමේ පියවර තවමත් ගෙන නොමැත. |
| (ඇ) | 2019 සහ 2020 වසර සඳහා සමාගම විසින් විගණන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | විගණන කමිටුව නිතිපතා රැස්වී සමාගමේ කටයුතු අධීක්ෂණය කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය. | සමාගම විගණන කමිටුව පැවැත්වීම සඳහා විගණන කමිටුව සඳහා සාමාජිකයින් පත් කර ඇත. | 2019 වසරේ සිට විගණන කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | වාර්ෂික ස්ථාවර වත්කම් සත්‍යාපනය සමාගම විසින් සිදු කර නොතිබුණි. | වාර්ෂිකව වත්කම් සත්‍යාපනය කිරීමට කළමනාකාරීත්වය පියවර ගත යුතුය. | වැළැක්වීමේ පියවර ආයතනය විසින් ගෙන නොමැත | ආයතනය 2022 පෙබරවාරි වන විටත් ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීමට භාණ්ඩ සමීක්ෂණයක් පවත්වා නැත. |
| (ඉ) | ස්ථාපිත කරන ලද නළ ළිංවල ජලය නොමැතිකම හේතුවෙන් ආයතනය, ආකේඩ් හි පරිභෝජනය සඳහා කුලී පදනම මත ජලය මිලදී ගෙන ඇත. මේ සඳහා සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් රු.5,526,589ක මුදලක් අතිරේකව දරන | කළමනාකරණය විසින් පරිශ්‍රයට ස්ථාවර හා අඛණ්ඩ ජල සැපයුම සහතික කළ යුතුය. | ජල හිඟය හේතුවෙන් වැලිපැන්න සේවා කලාපයට නළ ජලය ලබා දෙන ලෙස එම ආයතනය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් ඉල්ලීමක් කර තිබුණි. | ජාතික ජල සම්පාදන මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලදී. පරිශ්‍රයට ප්‍රමාණවත් ස්ථාවර ජල සැපයුමක් නොමැතිකම, ආකේඩ් හි කටයුතුවල ඵලදායී ක්‍රියාකාරිත්වයට සහ ආකේඩ් මගින් සපයනු ලබන සේවාවට අහිතකර ලෙස බලපානු ඇත. | | | |
| (ඊ) | සමාගම සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ උපාය මාර්ගික මාවත සකස් කල යුතුය. | ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | සංයුක්ත සැලැස්ම ආයතනය විසින් සකස් කර නොතිබුණි. |

## 4.48 සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 11,845,254 | 214,570,779 | 21,049,376,711 | 2,658,856,918 | (202,725,525) | තත්ත්වාගණනය නොකල |
| **2019** | 12,582,592 | 5,145,765,374 | 22,887,517,789 | 5,577,874,954 | (5,133,182,782) | තත්ත්වාගණනය නොකල |
| **2020** | 17,160,417 | 210,450,301 | 22,364,877,039 | 5,247,733,550 | (193,289,884) | තත්ත්වාගණනය නොකල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 11.85 | 214.57 | 21,049.38 | 2,658.86 | (202.73) |
| 2019 | 12.58 | 5,145.77 | 22,887.52 | 5,577.87 | (5,133.18) |
| 2020 | 17.16 | 210.45 | 22,364.88 | 5,247.73 | (193.29) |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ කළමනාකාරිත්වය සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අවිනිශ්චිත අනාගත කාල පරිච්ඡේදයක් සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට සම්පත් ඇති බවට තහවුරු කරගෙන ඇත. තවද, සමාගමට අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව | ව්‍යාපෘතියේ අනාගත මග පෙන්වීම් සඳහා සුදුසු ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමට කළමනාකාරිත්වය සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා ප්‍රාග්ධනය හා ණය වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 175ක් යෙදවීමේ වැඩසටහනක් සඳහා සමාගම කටයුතු කරමින් සිටී. | ව්‍යාපෘතිය දිගටම කරගෙන යාම සඳහා අරමුදල් රැස් කිරීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමට සමාගම කටයුතු කරමින් සිටී. |

| | | | | |
|---|---|---|---|---|
| | සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකරණයට වාර්තා වී නොමැත. කෙසේ වෙතත්, මූල්‍ය හිඟය හේතුවෙන් ග්‍රෑන්ඩ් හයට් කලම්බු (Grand Hyatt Colombo) ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ හෝ රජයේ මූල්‍ය සහාය අවශ්‍ය විය හැකිය. | | | |
| (ආ) | ඉදිකිරීම් ගිවිසුම් තුනක් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘති දීර්ඝ කිරීමේ පිරිවැය ලෙස රු.913,174,853ක් සමාගම විසින් ගෙවා තිබුණි. | මෙවැනි ස්වභාවයේ අනවශ්‍ය වියදම් මඟහරවා ගැනීමට හැකිවන පරිදි කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට පෙර ප්‍රමාණවත් අරමුදල් ගලා ඒම කළමනාකරණය විසින් සහතික කළ යුතුය. | ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වී ඇත්තේ සමාගම විසින් අත්විඳින මූල්‍ය බාධාවන් හේතුවෙනි. | ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා පවත්වයි. |
| (ඇ) | 2012 අගෝස්තු 15 දිනැති අංක 177/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව සමාගම් විසින් ඇ.ඩො. 158,890,000 (රු.බිලියන 18.5) ක් ආයෝජනය කර අංක 116, ගාලු පාර, කොළඹ 03 දරණ ස්ථානයේ ගෘහ ඒකක 90 කින් හා කාමර 475 ක් සහිත නාගරික හෝටලයක් ඉදිකර පවත්වාගෙන යාම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි. ඉහත ගැසට් පත්‍රයට අනුව | ආයෝජකයින්ට ඔවුන්ගේ ආයෝජනවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට සහ ව්‍යාපෘති පිරිවැය ඉහළ යාම වළක්වා ගැනීමට ලබා දී ඇති කාල සීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කිරීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. | ප්‍රමාදයට හේතු සහ ඒ සඳහා වන බලපෑම අදාළ රාජ්‍ය බලධාරීන්ට නිසි පරිදි දන්වා ඇත.<br><br>මෙය රජයේ ප්‍රතිපත්ති තීරණ මත යැපෙන සමාගමක් බැවින් සමාගමේ කළමනාකාරිත්වය ඉදිරි කටයුතුවලදී රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් පිළිපදියි. | 2021 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය 50% ක් වන අතර භෞතික ප්‍රගතිය 52% කි. |


ව්‍යාපෘතියේ ආරම්භක දිනය 2012 ජූලි 19 වන අතර ව්‍යාපෘතිය ආරම්භයේ සිට මාස 24ක් ඇතුළත වාණිජ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම් ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, තවමත් ව්‍යාපෘතිය අවසන් කර නොමැත. 2020 ජූලි 10 දිනැති අංක.20/1042/204/050-I දරන කැබිනට් තීරණයට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය දළ වශයෙන් රුපියල් බිලියන 60 කි. 31 වන මහල සමඟ මහල් 16 ක් හා කාමර 458 න් කාමර 236 ක වැඩ නිමවා අර්ධ වශයෙන් නිම වූ අංගසම්පූර්ණ හෝටලයක් ලෙස ක්‍රියාත්මක කිරීමට කැබිනට මණ්ඩලය තීරණය කර තිබුණි. තවද අදියර 2 යටතේ කාමර 236 ක් සහ ගෘහ ඒකක 100 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණි. පළමු අදියරේ ඉලක්කගත අවසන් දිනය 2021 අගෝස්තු ලෙස තීරණය කර තිබුණි. කෙසේ වෙතත් මුල් ව්‍යාපෘතිය අවසන් කළ යුතු දිනය වන 2014 ජූලි 19 වන දින සිට සමාලෝචිත වර්ෂය සඳහා වසර පහයි (05) මාස පහ (05) ක ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.1 පරිච්ඡේදයට අනුව, ආයතනය සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම සිය උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට සමාගමට දැනට භාර දී ඇති අතර ව්‍යාපෘති නිම කිරීමේ සැලැස්ම අවශ්‍ය පරිදි සංයුක්ත සැලැස්මක් ලෙස දීර්ඝ කිරීමට නියමිතය. | 2022 ජනවාරි 31 වන විට කිසිදු සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම සිය වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතිය අවසන් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මකයි. | 2022 ජනවාරි 31 වන විට කිසිදු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 3.7.5 වගන්තියට අනුව, මෙහෙයුම් සත්‍ය සහ සාධාරණ ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කළමනාකරු වගකිව යුතුය. නමුත් ආයතනයේ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්ය භාරය ගෙවීම් පිළිබඳ පූර්ව විගණනයක් කිරීමට සහ ගෙවීම් වවුචර සහතික කිරීමට සීමා කර ඇත. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස සමාගම සඳහා අභ්‍යන්තර විගණනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. | 2015 වසරේ සිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කර කාලීන අභ්‍යන්තර විගණන කාර්යය වරලත් ගණකාධිකාරී සමාගමකට පවරා ඇත. ඔවුන් 2018 ජුනි 30 දින දක්වා කාර්තුමය වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කර ඇත. ඔවුන් 2019 සහ 2020 වසර සඳහා පත්කරන ලද නමුත්, ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම සහ පසුව ඇති වූ covid19 සීමා කිරීම් හේතුවෙන් අභ්‍යන්තර විගණනය සඳහා කැඳවීම් නොකරන ලදී. 2022 වසරේ සිට අභ්‍යන්තර විගණන කටයුතු බාහිරින් | 2022 සඳහා අභ්‍යන්තර විගණන කාර්යය වෘත්තීය ආයතනයකට පැවරීමට විගණන කමිටුව තීරණය කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලබා ගැනීම් සැලසුම් කර ඇත. අභ්‍යන්තර විගණන කළමනාකරු විසින් ප්‍රධාන කරුණු විගණන කමිටුවේ අවධානයට යොමු කර ඇත. | |
| (ට) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.4.1 වගන්තියට අනුව, විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් නිතිපතා රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම එක් වරක් පමණක් පවත්වා තිබුණි. | අදාළ නීති සහ රෙගුලාසි සහ පරිචයන්ට අනුකූලව විගණන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. | රට අගුලු දැමීම හේතුවෙන් හා රැස්වීම්වලට සීමා පැනවීම හේතුවෙන් විගණන කමිටු රැස්වීම් නිතිපතා පැවැත්වීමට නොහැකි විය. | විගණන කමිටු රැස්වීම් නිතිපතා පවත්වා නොතිබුණි. |
| (ටා) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.2 වගන්තියට අනුව, සමාගම සඳහා වාර්ෂික අයවැයක් සකස් කර කාලීනව අයවැය සමාලෝචනය කර නොතිබුණි. | කළමනාකරණයට සමාගමේ වියදම් සම්බන්ධයෙන් නිසි පාලනයක් ඇති වන පරිදි ඵලදායී අයවැය පාලනයක් සමාගම තුළ පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ විය | කළමනාකාරිත්වයට අනුව ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා වාර්ෂික අයවැය 2022 වසර සඳහා සකස් කර ඇත. කෙසේ වෙතත්, අනුමත අයවැයේ පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

## 4.49 කැන්විල් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 34,397,900 | 8,725,269 | 18,886,743,754 | 34,792,015 | 25,672,631 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 9,435,080 | 9,931,740 | 18,883,814,642 | 32,110,007 | (496,660) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 1,225,668 | 6,540,696 | 18,881,828,851 | 18,347,461 | (5,315,028) | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගමේ (පරිපාලිතය) හම්බන්තොට හෝටලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අත්හිටුවීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. තවද රාජ්‍ය ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය විසින් සමාගමේ කොටස්, | ව්‍යාපෘතියේ ඉදිරි ගමන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමට කළමනාකාරීත්වය | ව්‍යාපෘතියේ සහ සමාගමේ ඉදිරි ගමන පිළිබඳව සමාගමේ වත්මන් කළමනාකාරීත්වය රෙකීය | කාරණය තවමත් පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | හිමිකාරීත්වයට සමානුපාතිකව සමාගමේ කොටස් හිමිකරුවන් වෙත පැවරීමට උපදෙස් ලබාදී ඇත. කෙසේවෙතත්, සමාගම ඈවර කිරීමට සමාගම තීරණය කර නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනී. | |
| (ආ) | සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (පුද්ගලික) සමාගම (පරිපාලිතය) හි කළමනාකාරීත්වය සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර ඉදිරි කාලය සඳහා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය සම්පත් තමන් සතුව ඇති බවට සෑහීමකට පත්වේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂය තුළ නැවත ආරම්භ කරන ලද අතර වාර්තා කරන දිනට සිදු කොරමින් පවතී. කෙසේ වෙතත්, රජය සහ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව (මව් සමාගම) මූල්‍ය හිඟය හේතුවෙන් මූල්‍යමය වශයෙන් ආධාර කර ඇත. | ව්‍යාපෘතියේ ඉදිරි ගමන පිළිබඳව අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමට කළමනාකාරීත්වය සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කිරීම සඳහා කොටස් හා ණය වශයෙන් ඩොලර් මිලියන 175ක් යෙදවීමේ වැඩසටහනක් සඳහා සමාගම කටයුතු කරමින් සිටී. | ව්‍යාපෘතිය දිගටම කරගෙන යාම සඳහා අරමුදල් රැස් කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමට සමාගම කටයුතු කරමින් සිටී. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.1 පරිච්ඡේදයට අනුව, ආයතනය සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. | ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් කිරීමට සමාගමට දැනට භාර දී ඇති අතර ව්‍යාපෘති නිම කිරීමේ සැලැස්ම අවශ්‍ය පරිදි සංයුක්ත සැලැස්මක් ලෙස දීර්ඝ කිරීමට නියමිතය. | 2022 ජනවාරි 31 වන විටත් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | සමාගම සිය වාර්ෂික ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාකාරී | ව්‍යාපෘතිය අවසන් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මකයි. | 2022 ජනවාරි 31 වන විටත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. | | |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 3.7.5 වගන්තියට අනුව, මෙහෙයුම් සත්‍ය සහ සාධාරණ ලෙස සිදු කිරීම සහතික කිරීම සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට අභ්‍යන්තර විගණන කළමනාකරු වගකිව යුතුය. නමුත් ආයතනයේ අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යභාරය ගෙවීම් පිළිබඳ පූර්ව විගණනයක් කිරීමට සහ බිල්පත්/ගෙවීම් වවුචර සහතික කිරීමට සීමා කර ඇත. | ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස සමාගම සඳහා අභ්‍යන්තර විගණනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. | 2015 වසරේ සිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කරමින් වරලත් ගණකාධිකාරී සමාගමකට කාලීන අභ්‍යන්තර විගණන කාර්යය බාහිරව ලබා දී ඇත. ඔවුන් 2018 ජූනි 30 දින දක්වා කාර්තුමය වාර්තා විගණන කමිටුවට ඉදිරිපත් කර ඇත. 2019 සහ 2020 වසර සඳහා ඔවුන් නම් කරන ලද නමුත් ඉදිකිරීම් කටයුතු අත්හිටුවීම සහ කොවිඩ් 19 සීමා කිරීම් හේතුවෙන් අභ්‍යන්තර විගණනය සඳහා කැඳවීම් නොකරන ලදි. 2022 වසරේ සිට අභ්‍යන්තර විගණන කටයුතු බාහිරින් ලබා ගැනීමට සංවිධානය කරනු ඇත.<br><br>අභ්‍යන්තර විගණන කළමනාකරු විසින් ප්‍රධාන කරුණු විගණන කමිටුවේ අවධානයට යොමු කර ඇත. | 2022 සඳහා අභ්‍යන්තර විගණන කාර්යය වෘත්තීමය විගණන ආයතනයකට පැවරීමට විගණන කමිටුව තීරණය කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2003 ජූනි 02 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.4.1 වගන්තියට අනුව, විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් නිතිපතා රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත මුදල් වර්ෂය සඳහා විගණන කමිටු රැස්වීම පවත්වා තිබුණේ එක් අවස්ථාවක් පමණි. | අදාළ නීති සහ රෙගුලාසි සහ පරිචය පරිදි විගණන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය. | රට අගුලු දැමීම හේතුවෙන්, රැස්වීම්වලට සීමා පැනවීම නිසා විගණන කමිටු රැස්වීම් නිතිපතා පැවැත්වීමට නොහැකි විය. 2022 වර්ෂයේදී එයට දැඩි ලෙස අනුකූල වේ. | විගණන කමිටු රැස්වීම් නිතිපතා පවත්වා නොතිබුණි. |
| (උ) | 2003 ජූනි 02 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 5.2 වගන්තියට අනුව, ආයතනය විසින් සමාලෝචිත මුදල් වර්ෂය සඳහා වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. | සමාගමේ වියදම් සම්බන්ධයෙන් කළමනාකරණයට නිසි පාලනයක් ඇති කිරීම සඳහා ඵලදායී අයවැය පාලනයක් සමාගම තුළ පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ විය. | වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. |

## 4.50 සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 44,379,869,000 | 37,229,269,000 | 198,658,277,000 | 137,574,392,000 | 7,150,600,000 | තත්ත්වාගණනය කල |
| **2019** | 48,608,572,000 | 40,403,565,000 | 211,699,744,000 | 149,426,747,000 | 8,205,007,000 | තත්ත්වාගණනය කල |
| **2020** | 52,614,494,000 | 44,642,712,000 | 235,630,350,000 | 172,508,826,000 | 7,971,782,000 | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2009 ජූනි 04 වැනි දින ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුවට අනුව, පුද්ගලික හිමිකාරීත්වය පවතින කාලය තුළ සමාගමේ ලාභය ගණනය කිරීමට සහ පෙර මව් සමාගමට ආරෝපිත ලාභය ගෙවීමට භාණ්ඩාගාර | ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුව කටයුතු කිරීමට නිර්දේශ කෙරේ. | පෙර මව් සමාගමට ආරෝපිත ලාභය ගණනය කර ගෙවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය භාණ්ඩාගාර ලේකම්වරයාට නියෝග කළේය. එබැවින් ලාභය ගණනය කිරීමට සමාගමට | කාරණය තවමත් එලෙසම පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලේකම්වරයාට නියෝග කරන ලදී. ඉහත සඳහන් ආරෝපිත ලාභයන් නිශ්චය වී නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර නොතිබුණි. | | සෘජු මැදිහත් වීමක් නොමැත. | |
| (ආ) | ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී වෙතින් ලැබිය යුතු රු.168,763,399 ක ශේෂයන් පිළිබඳ ශේෂ තහවුරු කිරීම් නොතිබුණි. | ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කෙරේ. | මෙම ශේෂයට ඩිස්ටිලරීස් සමාගම් සමූහයෙන් ලැබිය යුතු ශේෂය ඇතුළත් වේ. 2009 ජූනි 04 දින ලබා දුන් අධිකරණ තීන්දුව අනුව ගෙවීම් අවසන් වූ පසු මෙම මුදල ගැලපීම් කරනු ලැබේ. | කාරණය තවමත් එලෙසම පවතියි. |
| (ඇ) | 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත නියාමන (සංශෝධන) පනතේ 53 වැනි වගන්තිය අනුව සමාගම විසින් පවත්වාගෙන යනු ලබන දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙනම සමාගම් දෙකකට වෙන් කර නොමැත. | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව නියම කරනු ලබන රෙගුලාසි සහ අවශ්‍යතා අනුගමනය කිරීම නිර්දේශ කෙරේ | ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපාර වෙන් කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2020 ජූනි 15 දිනැති ඔවුන්ගේ ලිපිය මගින් දීර්ඝ කිරීමක් ලබා දී ඇත. | කාරණය තවමත් එලෙසම පවතියි. |
| (ඈ) | 2000 අංක 43 දරන රක්‍ෂණ කර්මාන්ත නියාමන පනතේ 31(1) වගන්තියට අනුව, අවම ණය සහ මූල්‍ය ශක්තිය ශ්‍රේණිගත කිරීම් ඇති ප්‍රතිරක්‍ෂණ සමාගමක් සමඟ පමණක් රක්ෂණකරුවන් ප්‍රතිරක්‍ෂණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් වෛකල්පිත ප්‍රතිරක්‍ෂණයන් සඳහා තිබිය | ප්‍රතිරක්ෂණකරු තෝරා ගැනීමේදී ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ අනුගමනය කිරීම නිර්දේශ කෙරේ . | ගෝලීය වසංගතය හේතුවෙන්, බොහෝ ප්‍රතිරක්ෂණකරුවන් ඇතැම් කලාපවල ව්‍යාපාර සිදුකිරීම නතර කර ඇති නිසා හෝ පිළිගැනීම සඳහා ඉතා දැඩි මාර්ගෝපදේශ ඇති බැවින් ඉහළ ශ්‍රේණිගත කිරීමක් සහිත ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් ඉතා විශාල අගයන් සහිත | කාරණය තවමත් එලෙසම පවතියි. |


| | | | | |
|---|---|---|---|---|
| | යුතු අවම ණය සහ මූල්‍ය ශක්ති ශ්‍රේණිගතකිරීම් සම්පූර්ණ නොකල ප්‍රතිරක්ෂණ සමාගමක් සමඟ ගිවිසුම්වලට එළඹී තිබුණි විධිවිධාන තබා ඇති බව නිරීක්ෂණය විය. | | අවදානම් සඳහා ප්‍රතිරක්ෂණය සොයා ගැනීම වඩ වඩාත් දුෂ්කර වෙමින් පවතී. එම හේතුව නිසා, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හට මෙම ප්‍රතිරක්ෂණකරු සමඟ 3% ක ඉතා කුඩා කොටසක් තැබීමට සිදු විය. මීළඟ අලුත් කිරීමේදී මෙම ප්‍රතිරක්ෂණකරු වෙනුවට වෙනත් ප්‍රතිරක්ෂණකරුවෙකු පත් කිරීමට උපරිමයෙන් කටයුතු කරන බව ඔවුන් අදහස් දක්වා තිබුණි. | |
| (ඉ) | ක්‍රියාත්මක නොවන බැංකු ගිණුම් 42ක් හඳුනාගෙන තිබුණි. | කළමනාකාරිත්වය එම ක්‍රියාත්මක නොවන ගිණුම් සමාලෝචනය කළ යුතු අතර සුදුසු යැයි සිතන්නේ නම්, එම ක්‍රියාත්මක නොවන බැංකු ගිණුම් වසා දැමීමට අවශ්‍ය පියවර ගත යුතුය. | බැංකු ගිණුම් සැසඳුම් ප්‍රකාශ සහ බැංකු ගාස්තු අනවශ්‍ය ලෙස වැඩිවීම අවම කිරීම සඳහා 2020 වර්ෂය තුළ සමාගම විසින් ඇතැම් බැංකු ගිණුම් පොකුරු ඇති කිරීමේ කිරීමේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. අනාගතයේදී අලුතින් විවෘත කරන ලද ශාඛා සඳහා ඒවා භාවිතා කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හැකි වනු ඇත. | කාරණය තවමත් එලෙසම පවතියි. |
| (ඊ) | ජීවිත රක්ෂණ ව්‍යාපාරය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ගනුදෙනු කර ඇත්තේ එක් ප්‍රතිරක්ෂණකරුවෙකු සමඟ පමණි. | ඉහත කාරණය සම්බන්ධයෙන් දැඩි සැලකිල්ලක් දැක්වීම නිර්දේශ කරනු ලැබේ. | ප්‍රතිරක්ෂණකරු දශක ගණනාවක් තිස්සේ අපගේ ප්‍රතිරක්ෂණකරුවා වන අතර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා ඉතා යෝග්‍ය වේ. | කාරණය තවමත් එලෙසම පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | තවද එම ප්‍රතිරක්ෂණකරු AA- (සටෑන්ඩඩ් සහ පුවර් ශ්‍රේණිගත කිරීම් සේවය) ශ්‍රේණිගත කිරීම සහ ශ්‍රී ලංකාවේ සියලුම රක්‍ෂණ සමාගම්වල සිටින ඉතා විශාල සහ ස්ථාවර ප්‍රතිරක්ෂණකරුවෙකි. | |
| (උ) | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා සමාගම හයට් රීජන්සි හම්බන්තොට හෝටලය ඉදිකිරීම සඳහා හෙක්ටයාර 3.8 ක ඉඩමක් රු.මිලියන 177.97 ක් ආයෝජනය කර නාගරික සංවර්ධන අධිකාරියෙන් බදු පදනම මත ලබා ගන්නා ලදි. කෙසේ වෙතත්, එහි කිසිදු මෙහෙයුම් කටයුත්තක් ආරම්භ කර නොමැති අතර, මෙම අරමුණ සඳහා මිලදී ගත් ඉඩම වෙනත් කිසිදු ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | උපායමාර්ගික තීරණ සැලකිල්ලට ගනිමින් වත්කම් භාවිතා කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර එමගින් අපේක්ෂිත පරිදි ධනාත්මක ප්‍රතිඵල ලබා ගත යුතුය. | සමාගමේ කළමනාකාරිත්වය සමාගමේ ඉදිරි ගමන පිළිබඳව රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනී. | කාරණය තවමත් එලෙසම පවතියි. |
| (ඌ) | කැන්විල් හෝල්ඩින්ග් පුද්ගලික සමාගමේ සහ එහි පරිපාලිත සමාගමක් වන සිනොලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා සමාගම හරහා ක්‍රියාත්මක වන ග්‍රෑන්ඩ් හයට් ෆ්‍රැන්චීස් හොටෙල් (Grand Hyatt Franchise Hotel) | උපායමාර්ගික තීරණ සලකා බලා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර එමගින් මුදල් ප්‍රවාහ පුරෝකථනයේ | සමාගමේ කළමනාකාරිත්වය සමාගමේ ඉදිරි ගමන පිළිබඳව රේඛීය අමාත්‍යාංශයෙන් අවශ්‍ය උපදෙස් ලබා ගනී. | කාරණය තවමත් එලෙසම පවතියි. |

| | |
|---|---|
| ව්‍යාපෘතිය සඳහා සමූහය විසින් රු.බිලියන 13.5 ක් ආයෝජනය කර ඇත. වියදම රු. බිලියන 20ක් වන මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී අවසන් කිරීමට මුලින් සැලසුම් කර තිබුණු අතර, ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2018 වසරේ සිට අර්ධ වශයෙන් ද, 2019දී සම්පූර්ණයෙන්ම ද නතර විය. තවද, මේ වන විට ව්‍යාපෘතිය නිම කිරීමට ඇස්තමේන්තුගත මුදල රු.බිලියන 60කි. | අපේක්ෂිත පරිදි ධනාත්මක ප්‍රතිඵල ලබා ගත යුතුය. |

## 4.51 ලිට්‍රෝ ගෑස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 40,326,428,839 | 39,870,041,675 | 25,429,770,636 | 11,848,587,127 | 456,387,163 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 44,719,625,153 | 39,792,363,416 | 30,043,978,698 | 14,110,122,789 | 4,927,261,736 | තත්ත්වාගණනය නොකල |
| **2020** | මූල්‍ය ප්‍රකාශ ලැබී නැත | | | | | |




| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) LP ගෑස් ආනයනයේදී අවලංගු කරන ලද නැව්ගත කිරීම් සඳහා 2013, 2018 සහ 2019 වර්ෂ වලදී පිළිවෙලින් රු.මිලියන 15.5 ක්, රු.මිලියන 15.1 ක් සහ රු.මිලියන 29.8 ක් වරාය සහ ගුවන්තොටුපල | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | රේගු දෙපාර්තමේන්තුවෙන් මෙම මුදල් අයකර ගැනීමට සමාගම කටයුතු කර ඇත | රු.මිලියන 15.1 ක් පමණක් අයකරගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංවර්ධන බද්ද ලෙස සමාගම විසින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගම තවමත් එම හිඟ ශේෂයන් අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | | | |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු බහාලුම් තැන්පතු ප්‍රමාණය රු.මිලියන 5.2 කි. එයින් රු.මිලියන 4.55ක් 2006 සිට 2014 දක්වා කාලයට අදාළ වේ. එය පසුගිය වසරේ විගණන වාර්තාවේ පෙන්වා ඇතත්, තවමත් එම හිඟ ශේෂයන් අය කර ගැනීමට සමාගම අසමත් වී තිබුණනි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. | සමාගම නැවත අයකර ගැනීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන යයි. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (ඇ) | අයවැයට, ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, 2019 වසර සඳහා එවැනි ක්‍රියාකාරී සැලැස්මක් සමාගම විසින් සකස් කර නොතිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | අයවැයට, අයවැයගත ප්‍රාග්ධන වියදම් ඇතුළත් විය. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (ඈ) | විධිවිධානවලට පටහැනිව රු.2,269,737ක බෝනස් මුදලක් සමාලෝචිත වර්ෂය තුළ සභාපතිවරයාට ගෙවා තිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | මෙම ගැටළුව සම්බන්ධයෙන් සමාගම පියවර ගෙන නොමැත. | ප්‍රධාන විධායක නිලධාරියාගේ ගෙවීම වෙනුවට මෙම වසරේ ප්‍රසාද දීමනාව සභාපතිවරයාට ගෙවා නැත. |
| (ඉ) | සමාගමට අනුමත කාර්ය මණ්ඩලයක් සහිත රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංවිධාන සටහනක් නොතිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංවිධානයේ ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහයේ සියලුම විස්තර, වැටුප් ව්‍යුහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) | කාරණය තවමත් ඉතිරිව ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇතුළත් ලිපියක් සමාගම විසින් 2019 සැප්තැම්බර් 19 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා යවා ඇත. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | |
| (ඊ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව සහිත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් සමාගම සතුව නොමැත. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංවිධානයේ ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහයේ සියලුම විස්තර, වැටුප් ව්‍යුහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) ඇතුළත් ලිපියක් සමාගම විසින් 2019 සැප්තැම්බර් 19 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා යවා ඇත. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (උ) | වැටුප් සහ දීමනා, අනුමත බඳවාගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමය මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව කිසිදු | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංවිධානයේ ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහයේ සියලුම විස්තර, වැටුප් ව්‍යුහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) | කාරණය තවමත් ඉතිරිව ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | සංශෝධනයක් සිදු කල නොහැක. කෙසේ වෙතත්, සමාගම ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විධායක වැටුප් ලේඛනයේ මසකට දළ වැටුප රු.38,000 සිට රු.1,000,000 දක්වා පරාසයක පැවතුනි. | | ඇතුළත් ලිපියක් සමාගම විසින් 2019 සැප්තැම්බර් 19 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා යවා ඇත. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | |
| (ඍ) | සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා තීරණය කිරීමට පෙර සමාගම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව ලබාගෙන තිබේද යන්න තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා තීරණය කිරීම සඳහා සමාගම ලබාගෙන ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණි. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (එ) | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සභාපතිවරයාට ගෙවන ලද දීමනා මත සමාගම EPF සහ ETF ගෙවා තිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | මෙම ගැටළුව සම්බන්ධයෙන් සමාගම පියවර ගෙන නොමැත | මෙම වර්ෂයේ ප්‍රධාන විධායක නිලධාරියා සඳහා ගෙවීම් කිරීම වෙනුවට සභාපතිවරයාගේ දීමනාවලට අදාළව ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | ආගමික ස්ථාන 100 ක් සඳහා රු.8,070,000 ක ඇස්තමේන්තුගත පිරිවැයකින් යුත් එල්.පී.ජී නල පද්ධති සහ ගෑස් උඳුන් නොමිලේ ප්‍රදානය කිරීමේ ව්‍යාපෘතියක් ආයතනික සමාජ වගකීම් කටයුත්තක් ලෙස ආරම්භ කර තිබුණද, ඒ සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. කෙසේ වෙතත්, එම උපකරණ ආගමික ස්ථාන 82 ක් සඳහා පමණක් සවිකර කර තිබූ අතර ගෘහස්ත රබර් හෝස් සහිත ගෑස් උඳුන් 317 න් 192 ක් සහ මනිෆෝල් අයිතම 89 න් 18 ක් මාබිම ගබඩා පරිශ්‍රයේ දිගු කාලයක් නිෂ්කාර්යව පැවතුණි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරඇති පරිදි ආගමික ස්ථාන තෝරාගෙන තිබේද යන්න සහ බෙදාහරින්නන් වෙත ලබා දුන් සියලුම උපකරණ එම ආගමික ස්ථානවල සවි කර තිබේද යන්න තහවුරු කිරීම සඳහා සාක්ෂි විගණනය ලැබී නොමැත. අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලට පටහැනිව සේවා සපයන්නන් ටෙන්ඩර් පටිපාටියකින් තෝරාගෙන නොතිබූ අතර සේවා සපයන්නන් සමඟ ගිවිසුම් ඇති කර ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර ටෙන්ඩර් පටිපාටියක් මගින් සේවා සපයන්නන් තෝරා ගත යුතුය. | දැනට සමාගම ව්‍යාපෘතිය දිගටම කරගෙන යයි. | දැනට සමාගම ව්‍යාපෘතිය දිගටම කරගෙන යයි. |
| (ඔ) | පෙර පරිපාලන සමාගම වූ කලම්බු ගෑස් සමාගම විසින් 1986 දී රු.මිලියන 13 කට ඔරුගොඩවත්තේ ඉඩම මිල දී | ඉඩම් අයිතිය සමාගමට පවරා ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. | ජ්‍යෙෂ්ඨ නීති කළමණාකරු වශයෙන්, ඉඩම් හිමිකම් පනතේ විධිවිධාන යටතේ මෙම | කාරණය තවමත් ඉතිරිව ඇත. |

| | |
|---|---|
| ගෙන තිණි. කෙසේ වෙතත්, ඉඩමේ ඔප්පුව ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් වෙත පවරා ගෙන නොතිබූ අතර ඉඩම මිලදී ගත් දින සිට සමාගම විසින් භාවිතා කර නොතිබුණි. | දේපලෙහි සැබෑ අයිතිය සමාගමට ඇති අතර 2006 වසරේ සිට එය සමාගම සන්තකයේ පවතී. ඉඩමේ පරම හිමිකම, සමාගම සමඟ බෙදා හැර ඇති බැවින් පැවරීමේ ඔප්පුවක් සකස් කිරීම අවශ්‍ය නොවේ. |

## 4.52 ලිට්‍රෝ ගෑස් පර්යන්තය (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 2,651,460,692 | 625,408,873 | 11,501,468,451 | 2,576,847,707 | 2,026,051,819 | තත්ත්වාගණනය කල |
| **2019** | 2,766,967,293 | 750,221,929 | 12,178,620,589 | 2,390,906,077 | 2,016,745,364 | තත්ත්වාගණනය කල |
| **2020** | මූල්‍ය ප්‍රකාශ ලැබී නැත | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2011 අංක 3 දරණ රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විභේදනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිංග්ස් ලිමිටඩ් වෙත රු.මිලියන 100 ක පොලී රහිත අත්තිකාරම් මුදලක් 2014 අගෝස්තු 08 දින අධ්‍යක්ෂ | අත්තිකාරම් ආපසු අයකර ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. | ප්‍රතිචාර දක්වා නොමැත | කාරණය තවමත් ඉතිරිව ඇත. |

මණ්ඩලය විසින් සම්මත කරන ලද 2014 අංක 04 දරණ චක්‍රලේඛ යෝජනාවට අනුව ලබා දී ඇත. මෙම මුදල 2015 අගෝස්තු 31 දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝර්ඩින්ග්ස් ලිමිටඩ් විසින් මුදල් මගින් හෝ ලාභාංශ පියවීමක් මගින් ආපසු ගෙවිය යුතුය. ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩිස් ලිමිටඩ් සමාගම සංස්ථාගත කිරීමේ දී, එක් පුද්ගලයකුට එක් සාමාන්‍ය කොටස බැගින් වන පරිදි සහ භාණ්ඩාගාර ලේකම් වෙත එම කොටස් දෙක ප්‍රායෝගිකව හැකි ඉක්මනින් පැවරීමේ අවබෝධය මත එවකට සමාගමේ සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂ වරයා ආරම්භක කොටස් හිමියන් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුවද, මෙම අත්තිකාරම් මුදල මේ දක්වා ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් විසින් ආපසු ගෙවා නොමැති අතර මෙම අත්තිකාරම් මුදල පියවීම සම්බන්ධයෙන් සමාගම ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් සමාගම සමග ගිවිසුමකට එළඹී නොමැත. තව ද, සමාගම් රෙජිස්ට්‍රාර් වරයාගේ වාර්තාවලට අනුව, ශ්‍රී ලංකා ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ස් ලිමිටඩ්හි මුළු කොටස් ප්‍රමාණය තවමත් මහා භාණ්ඩාගාරයට පවරා නොතිබූ අතර එය පුද්ගලයින් දෙදෙනෙකුට අයත් වේ. එබැවින් එම අත්තිකාරම්

| | | | | |
|---|---|---|---|---|
| | මුදල නැවත අයකර ගැනීමේ හැකියාව සහ සමාගමට අයත් එවැනි වත්කමක පැවක්ම සම්බන්ධයෙන් විවේචනාත්මක සැකයක් විගණනය සතුව පවති. | | | |
| (ආ) | සමාගමේ ගබඩා ටැංකි, නල මාර්ග සහ පොම්පපාගාර භාවිතා කිරීම සඳහා ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සමාගමෙන් ප්‍රතිදාන ගාස්තුවක් ලෙස තොග අංශය සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 51 ක් සහ ගෘහ අංශය සඳහා මෙට්‍රික් ටොන් එකකට ඇමරිකානු ඩොලර් 31 ක් අය කර තිබුණි. කෙසේ වෙතත්, ප්‍රතිදාන ගාස්තු අනුපාතය නියම කිරීමේ පදනම විගණනයේදී පැහැදිලි නොවුණි. තවද, ව්‍යාපාරයේ නියමයන් හා කොන්දේසි නියම කිරීම් සඳහා සමාගම සිය එකම පාරිභෝගිකයා වන ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සමඟ ගිවිසුමකට එළඹී නොතිබුණි. | සමාගම ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සමඟ පවතින ගිවිසුම යාවත්කාලීන කළ යුතුය. | ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් (පෙර ෂෙල් සමාගම) සමඟ මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 51 ක ප්‍රතිදාන ගාස්තු ගිවිසුමක් අත්සන් කර ඇති අතර පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් මිල නියම කිරීමේ ගිවිසුමේ පරිදි මෙය මෙට්‍රික් ටොන් එකකට ඩොලර් 31 දක්වා අඩු කර ඇත. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම සමඟ අයවැයගත ප්‍රාග්ධන වියදම් අයවැයට ඇතුළත් විය යුතුය. කෙසේ වෙතත්, එවැනි ක්‍රියාකාරී සැලැස්මක් 2019 වසර සඳහා සමාගම විසින් සකස් කර නොතිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | අයවැයගත ප්‍රාග්ධන වියදම් අයවැයට ඇතුළත් විය. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (ඈ) | සමාගමට අනුමත කාර්ය මණ්ඩලයක් සහිත මහා භාණ්ඩාගාරයේ සහ රාජ්‍ය ව්‍යාපාර | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංවිධානයේ ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහයේ සියලුම විස්තර, වැටුප් ව්‍යුහය සහ බඳවා | කාරණය තවමත් ඉතිරිව ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සංවිධාන සටහනක් නොමැත. | | ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) ඇතුළත් ලිපියක් සමාගම විසින් 2019 සැප්තැම්බර් 19 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා යවා ඇත. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | |
| (ඉ) | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය සහිත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටියක් සමාගම සතුව නොමැත. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංවිධානයේ ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහයේ සියලුම විස්තර, වැටුප් ව්‍යුහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) ඇතුළත් ලිපියක් සමාගම විසින් 2019 සැප්තැම්බර් 19 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා යවා ඇත. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | කාරණය තවමත් ඉතිරිව ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | වැටුප් සහ දීමනා, අනුමත බඳවාගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රම මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව කිසිදු සංශෝධනයකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, සමාගම ඉහත සඳහන් විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වැටුප් ලේඛනයේ මසකට දළ වැටුප රු.51,000 සිට රු.641,000 දක්වා පරාසයක පැවතුනි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංවිධානයේ ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහයේ සියලුම විස්තර, වැටුප් ව්‍යුහය සහ බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) ඇතුළත් ලිපියක් සමාගම විසින් 2019 සැප්තැම්බර් 19 වැනි දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචිය සඳහා යවා ඇත. විගණනයට ලැබී ඇති තොරතුරු අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (උ) | සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනාව තීරණය කිරීමට පෙර සමාගම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාව ලබාගෙන තිබේද යන්න තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා තීරණය කිරීම සඳහා සමාගම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | කාරණය තවමත් ඉතිරිව ඇත. |
| (ඌ) | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සභාපතිවරයාට ගෙවන ලද දීමනා මත සමාගම EPF සහ ETF ගෙවා තිබුණි. | සමාගම මාර්ගෝපදේශයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | මෙම ගැටළුව සම්බන්ධයෙන් සමාගම පියවර ගෙන නොමැත. | මෙම වර්ෂයේ ප්‍රධාන විධායක නිලධාරියා සඳහා ගෙවීම් කිරීම වෙනුවට සභාපතිවරයාගේ |

දීමනාවලට අදාළව ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා නොමැත.

## 4.53 ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2,555,284 | 3,822,354 | 9,213,402 | 1,167,856 | (1,267,070) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 717,910 | 2,306,952 | 7,509,648 | 1,053,143 | (1,589,042) | තත්ත්වාගණනය කළ |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | | | | | |




| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2012 වර්ෂයේදී සමාගම ඈවර කිරීමට තීරණය කර තිබුණද, සමාගම ඈවර කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගම ඈවර කිරීමට කටයුතු කළ යුතුය. | 1. අමප/19/2250/104/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම සමාගම ඈවර කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී.<br>2. | සමාගම ඈවර කිරීමේ කටයුතු අවසන් කර නොමැත. |

ඒ අනුව මෙම සමාගම ඇවර කිරීමේ ක්‍රියාවලිය සඳහා ඇවරකරුවකු පත්කර ගෙන කටයුතු කළද, නියමිත කාලසීමාව තුළ ඇවරකරු ක්‍රියාත්මක නොවීම මත ඇවර කිරීමේ ක්‍රියාවලිය අසාර්ථක විය.


3. ඒ අනුව මෙම සමාගම ඇවර කිරීමේ කටයුතු භාණ්ඩාගාරය මඟින් සිදුකර ගැනීම සඳහා 2021 මාර්තු 15 දින වාරිමාර්ග අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙම සමාගමේ ඇවර කිරීමේ කටයුතු භාණ්ඩාගාරය හරහා ඉටුකර දෙන මෙන් ඉල්ලා ලිපියක් යොමු කරන ලදී.

4. සමාගම ඇවර කිරීමට අදාලව මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙකු හා මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරියෙකු ඇවරකරුවන් ලෙස පත් කොට ඇත.

5. ඉහත සඳහන් කළ ඇවරකරුවන් මගින් සී/ස ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම ඇවර කිරීමට අනුමතිය ලබා ගැනීම සඳහා 2022 පෙබරවාරි 28 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු කිරීමට කටයුතු කරමින් සිටී.

## 4.54 මහවැලි උපදේශන කාර්යාංශය (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 98,152,361 | 93,461,482 | 129,582,010 | 49,696,403 | 4,690,879 | තත්ත්වාගණනය කළ |
| **2019** | 35,821,402 | 33,448,217 | 109,736,841 | 27,304,698 | 2,373,185 | තත්ත්වාගණනය කළ |
| **2020** | 4,083,465 | 18,007,675 | 94,287,676 | 16,788,156 | (13,924,210) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්හි පරිච්ඡේද 17 හි 19 වන වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,058,326 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළයුතුය. | සමාගම ඈවර කිරීමට එවකට ප්‍රතිපත්තිමය තින්දුවක් තිබුණ බැවින් ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂ ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. නමුත් එම ප්‍රතිපත්තිමය | වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | | තීරණය වෙනස්වී ඇති බැවින් එම දෝෂ 2022 ගිණුම් වර්ෂයේදී ප්‍රතිශෝධනය කිරීමට තීරණය කර ඇත. | |
| (ආ) | 2018 වර්ෂය අවසානයට වර්ෂ 05 ඉක්මවූ රු. 1,273,787 ක් හා වර්ෂ 1 සිට 05 දක්වා වූ රු.6,016,484 ක රඳවාගත් මුදල් නිරවුල් කිරීමට හා වර්ෂ 05 කට වැඩි රු.1,762,118 ක් වූ වෙනත් ලැබියයුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශේෂයන් නිරවුල් කිරීමට හා අයකර ගැනීමට පියවර ගතයුතුය | රඳවාගත් මුදල් අයකර ගැනීමට අදාල පාර්ශවයන් වෙත සිහිකැඳවීම් යැවීම. වර්ෂ 1-5 දක්වා රු.6,016,484 ක රඳවාගත් මුදල් වලින් රු.3,058,057 ක් නිරවුල් කරගෙන ඇත. | වර්ෂ 5 ට වැඩි රු.1,273,787 ක රඳවාගත් මුදල් ශේෂයක් නිරවුල් කර නැත. එකතුව රු.1,762,118 ක වෙනත් ලැබියයුතු ශේෂයක් හා වර්ෂ 1 සිට 05 දක්වා වූ රු.2,958,427 ක රඳවාගත් මුදල් ශේෂයක්ද 2022 පෙබරවාරි වනවිටද පවතී. |
| (ඇ) | වර්ෂ 8 ක් ඉක්මවූ රු. 166,039 ක ගෙවිය යුතු ජාතික ආරක්ෂණ බද්ද, වර්ෂ 5 ඉක්මවූ රු. 8,410,207 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (mobilization advances) හා වර්ෂ 2 ඉක්මවූ රු. 2,454,530 ක වෙනත් ගෙවිය යුතු ශේෂ පැවතියද එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට පියවර ගතයුතුය. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා රු.2,454,530 ක වෙනත් ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. | වර්ෂ 8 ක් ඉක්ම වූ රු.166,039 ක ගෙවිය යුතු ජාතික ආරක්ෂණ බද්ද නිරවුල් කර නැත. |
| (ඈ) | සමාගම සඳහා අනුමත කාර්යය මණ්ඩලයක් නොවූ අතර බඳවාගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාගමේ | අනුමත කාර්යය මණ්ඩලයක් හා ඊට අදාලව බඳවාගැනීම් කාර්යය පරිපාටියක් | 2022 වර්ෂයේ නව කළමනාකාරිත්වය යටතේ ආයතනයට ලැබෙන නව ව්‍යාපෘති සලකා බලා ඒ මත ආයතනික ව්‍යුහය | 2022 පෙබරවාරි වනවිටද එම තත්වයේම පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | කාර්යය මණ්ඩලය සඳහා බඳවා ගැනීම්, උසස් කිරීම්, තනතුරුවලට අදාල සුදුසුකම් සහ වැටුප් තීරණය කිරීම්වල නිවැරදිභාවය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය. | අනුමත කරගැනීමට පියවර ගතයුතුය. | වෙනස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සලකා බලමින් සිටී. | |
| (ඉ) | මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි දිමුතුවැව ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් සමාගම විසින් රු.11,998,130 ක අවසන් බිල්පතක් ඉදිරිපත් කර තිබුණද, දිමුතුවැව පහළ නිම්නය සංවර්ධනය කිරීමේදී විෂයය පථයෙන් පරිබාහිරව සිදු කර ඇති බැවින්, එම මුළු මුදලම ගෙවීම් නොකිරීමට දිමුතුවැව ප්‍රතිසංස්කරණය කිරීමට අදාලව පත්කල කමිටුව නිර්දේශ කර තිබුණි. ඒ අනුව කමිටුව විසින් සමාගම වෙත ගෙවීමට නිර්දේශ කරන ලද මුළු මුදල රු.4,840,515 ක් වූ අතර ඉන් ලබා දී තිබුණු රු.2,971,485 අත්තිකාරම් මුදල් අඩුකිරීමෙන් පසු රු.1,869,030 ක් පමණක් සමාගමට ගෙවා තිබුණි. ඒ අනුව සමාගමට රු.7,157,615 ක අලාභයක් සිදු වී තිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථය අනුව පමණක් ඉදිකිරීම් සිදුකිරීමට කටයුතු කළ යුතු අතර අනුමැතියකින් තොරව අමතර වැඩ සිදුකර සමාගමට අලාභ සිදු වී තිබේනම් වගකිව යුතු පාර්ශව වෙතින් අදාල අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | කරන ලද අමතර වැඩ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම. | සිදුවූ අලාභය අයකර ගෙන නොමැත. |
| (ඊ) | සමාගම කණේවෙල අමුණ ප්‍රතිසංස්කරණය කිරීමට එළඹ තිබුණු කොන්ත්‍රාත් ගිවිසුම අවලංගුකර තිබුණි. ඒ අනුව රඳවාගත් රු.1,730,055 ක කාර්යසාධන සුරක්ෂණය අත්තිකාරම් සුරක්ෂණයේ නැවත නොගෙවන ලද රු.1,000,089 ක ඉතිරි මුදල සහ රු.419,421 ක රැඳවුම් මුදල්ද ඇතුළුව රු.3,149,565 ක අලාභයක් සමාගමට සිදු වී තිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. | රැඳවුම් මුදල වන රු.419,421 ක මුදල සමාගමට අයකර ගැනීමට කටයුතු කරමින් සිටී. | අලාභය වූ රු.3,149,565 ක් අයකරගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තවද ඉදිකිරීම් ප්‍රගතිය සියයට 25 ක් තිබියදී රු.849,744 ක් වූ ගේට්ටු 10 ක් සහ රු.562,941 ක කම්බි මිලදීගෙන තිබුණු අතර එම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | |
| (උ) | ණයගැති කාල විශ්ලේෂණය අනුව 2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ ලැබිය යුතු ශේෂ වටිනාකම රු.47,074,872 ක් වූ අතර, ඉන් රු.4,176,453 ක් වටිනා ගිණුම් ශේෂ අවුරුදු 05 කට වඩා වැඩි කාලයක් අයකර ගැනීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය. | සමාගමේ ලැබිය යුතු ශේෂ නිරවුල් කරගැනීම සඳහා කටයුතු කළ යුතුය. | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.8,511,509 දක්වා අඩුකර ගැනීමට කටයුතු කර ඇත. | වසර 5 කට වැඩි කාලයක් සඳහා රු'4,176,453 ක හිඟ මුදල 2022 පෙබරවාරි වන විටත් අය කර ගෙන නොමැත. |
| (ඌ) | ස්ථාවර වත්කම් ලේඛනයට අනුව 2019 දෙසැම්බර් 31 දිනට මහවැලි උපදේශක සේවා කාර්යාංශය සතුව රු. 16,749,105 ක් වටිනා වත්කම් පැවති නමුත්, අදාල වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගැනීම සඳහා භෞතික සත්‍යාපනයක් සිදුකර නොතිබුණි | වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කරගැනීම සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. | සමාගම විසින් සෑම වසරකම වත්කම් භෞතිකව සත්‍යාපනය සිදුකරන අතර වත්කම් සමීක්ෂණ ක්‍රමවේදයට අනුව පත්කරනු ලැබූ මණ්ඩලයක් විසින් කර නොතිබිණි. 2022 වර්ෂයේ සිට නව කළමනාකාරිත්වය යටතේ මේ සඳහා කටයුතු කරන බව දන්වා ඇත. | භාණ්ඩ පිළිබඳ භෞතික සත්‍යාපනය සිදු කර නොමැත. |
| (එ) | 2017 වර්ෂයේදී මොරගහකන්ද සංචාරක බංගලාව සහ නැරඹුම් මැදිරියේ ඉදිකිරීම් වෙනුවෙන් උප කොන්ත්‍රාත් ලබා දීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව කටයුතු කිරීම නිසා සමාගමට රු. 20,200,000 පාඩුවක් සිදුව තිබුණි. 2019 පෙබරවාරි 21 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාව විසින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් | පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. | මුදල් අයකරගැනීම සඳහා නිතිපති උපදෙස් ඉල්ලා ඇත. | මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ආරම්භ කොට මාසයක් තුල කාරක සභාව වෙත වාර්තා කළ යුතු බව නිර්දේශ කර තිබුණද එම නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණු අතර විගණිත දිනය වූ 2021 අගෝස්තු 2 දක්වා අදාල මුදල් අයකරගැනීම සඳහා වන නෛතික ක්‍රියාමාර්ග ද ආරම්භකර නොතිබුණි. | | | |
| (ඒ) | සමාගමේ ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන උපදේශක සේවා ක්‍රියාත්මක කිරීමට අදාල කළමනාකාර (ව්‍යාපෘති) තනතුර සහ ඉංජිනේරු අංශයේ ඉංජිනේරු තනතුර 2019 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතියද 2021 සැප්තැම්බර් දක්වා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. | සමාගම ඇවර කිරීමට ගෙන තිබූ තීරණය හේතුවෙන් වර්ෂයේ සිට සමාගම මෙතෙක් කරගෙන ආ ව්‍යාපෘති නතර කිරීම මත අදාල නිලධාරීන් පත්කල නොහැක. | බඳවා ගැනීමට කටයුතු කර නැත. |

## 4.55 මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 496,420 | 129,929 | 15,596,230 | 381,208 | 366,491 | වියාචනය |
| **2019** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 0.50 | 0.13 | 15.60 | 0.38 | 0.37 |
| 2019 | - | - | - | - | - |
| 2020 | - | - | - | - | - |

| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 2012 අගෝස්තු 13 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ නිර්දේශය ප්‍රකාර එම වර්ෂයේ දෙසැම්බර් මස අවසන් වනවිට සමාගම | සමාගමේ ඇවර කිරීමේ කටයුතු නිම කිරීමට කඩිනම් පියවර ගතයුතුය. | 1. අමප/19/2250/104/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම සමාගම ඇවර කිරීමට අදාළව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. | සමාගම ඇවර කිරීමේ කටයුතු අවසන් කර නොමැත. |

ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට 2012 සැප්තැම්බර් 28 දින පැවැති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව හා 2014 නොවැම්බර් 20 දිනැති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගම ඈවර කිරීම සඳහා ඈවරකරුවකු පත්කර තිබුණි. ඒ අනුව 2014 ඔක්තෝබර් 21 දින ඈවර කිරීමේ කටයුතු හා ගිණුම් පිළියෙල කිරීම වෙනුවෙන් රු.125,000 ක් ගෙවීමට එකගවී රු.62,500 ක් 2015 ජනවාරි 10 දින ගෙවා තිබුණි. කෙසේ වුවද, සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට ගෙන තිබූ තීරණය, පසුව ණයහිමියන්ගේ ගණන් බේරා වසාදැමීමක් බවට පත්ව තිබුණු බව සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අංක පීඩී/9854 හා 2016 ජූලි 25 දිනැති ලිපිය අනුව සනාථ විය. එම ලිපිය ප්‍රකාරව ණයහිමියන්ගේ රැස්වීමක් පවත්වා ඉදිරි කටයුතු සිදුකරන ලෙස දන්වා තිබුණද, එවැනි රැස්වීමක් පැවැත්වූ බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, 2019 අගෝස්තු 31 දින වනවිටද සමාගමේ ඈවර කිරීමේ

2. ඒ අනුව මෙම සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලිය සඳහා ඈවරකරුවකු පත්කර ගෙන කටයුතු කරන ලදී. අදාල ඈවරකරු මිය යාමත් සමඟ ඈවර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරගත නොහැකි විය.


3. ඒ අනුව මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු භාණ්ඩාගාරය මඟින් සිදුකර ගැනීම සඳහා 2021 මාර්තු 15 දින වාරිමාර්ග අමාත්‍යාංශයේ ගරු ලේකම්තුමා විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත මෙම සමාගමේ ඈවර කිරීමේ කටයුතු භාණ්ඩාගාරය හරහා ඉටුකර දෙන මෙන් ඉල්ලා ලිපියක් යොමු කරන ලදී.

4. සී/ස මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම ඈවර කිරීමේ ක්‍රියාවලිය සඳහා ඈවරකරුවකු නම් කිරීමෙන් අනතුරුව ඊට අදාලව කොටස් හිමියන්ගේ යෝජනාවලියක් සහ අධ්‍යක්ෂවරුන්ගේ යෝජනාවලියක් සම්මත කර ගතයුතු වේ. මෙහිදී සී/ස මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම මුළු කොටස්වලින් කොටස් 03 ක් කොටස් හිමියන් තිදෙනෙකු අතර එක බැගින් බෙදාදී තිබේ. මෙම කොටස්කරුවන් සොයා ගැනීමට නොහැකිවී ඇති අතර සමහර කොටස් හිමියන් මියගොස් ඇති බව වාර්තා වේ. ඒ අනුව කොටස් හිමියන්ගේ යෝජනාවලිය සම්මත කරගැනීමේ ගැටළු ඇති අතර, එබැවින් 2021 ජූලි 06 දිනැති ලිපිය මඟින් ප්‍රධාන කොටස් හිමියා වන කොටස් 1,039,800 ක් හිමි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට කොටස් හිමියන්ගේ යෝජනාවලිය තනිව සම්මත කරගැනීමේ හැකියාව පවතින්නේද යන්න පිළිබඳව නෛතික උපදෙස් ඉල්ලා සිටින ලදී.

| | |
|---|---|
| කටයුතු අවසන් කර නොතිබුණි. | 5. සමාගම ඈවර කිරීමට අදාලව මුදල් අමාත්‍යාංශයේ නිලධාරියෙකු හා මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිලධාරියෙකු ඈවරකරුවන් ලෙස පත් කොට ඇත. |
| | 6. ඉහත නම් කරන ලද ඈවරකරුවන් මඟින් සී/ස මහවැලි වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම ඈවර කිරීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2022 පෙබරවාරි 28 දිනට යොමු කිරීමට කටයුතු කරමින් පවතී. |

## 4.56 මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 57,207,407 | 61,636,307 | 93,888,135 | 40,265,713 | (4,428,900) | තත්ත්වාගණනය කළ |
| **2019** | 65,448,978 | 70,112,509 | 90,883,438 | 42,940,439 | (4,663,531) | තත්ත්වාගණනය කළ |
| **2020** | 63,348,925 | 69,141,931 | 80,658,665 | 49,873,176 | (5,793,006) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය වෙත පවරා තිබුණු නිරාවිය ගොවිපල සතුව තිබුණු පශු සම්පත් තොගය වෙනුවෙන් ලැබිය යුතු රු. 5,820,430 ක් සමාලෝචිත | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. | මෙම ශේෂ නිරවුල් කරන ලෙස ඉල්ලීම් සිදුකර ඇත. | 2022 පෙබරවාරි වන විටත් නිරවුල් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය අවසාන වනවිටද අයකරගෙන නොතිබුණි. | | | |
| (ආ) | දැනට පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්) සමාගම රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා පෞද්ගලික ආයෝජකයකු සම්බන්ධ කර ගැනීම සඳහා 2016 ජනවාරි 28 දිනැති අංක.16/0063/704/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී තිබුණු අතර, 2018 ඔක්තෝබර් 03 දිනැති අංක.18/2083/803/031 මගින් පෞද්ගලික සමාගමකට අනුමැතිය ලබාදී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම්ට නියම කර තිබුණද, 2019 ජූලි 29 දින වනවිටත් එම තීරණ ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට හෝ එසේ නොකරන්නේ නම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ සංශෝධනය කර ගැනීමට කටයුතු කළයුතුය. | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස ප්‍රතිසංවිධානය කිරීම සඳහා නැවත අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම. | 2022 ජනවාරි 25 දිනැති අංක. අමප/ 21/2229/317/025(I) දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගම ප්‍රතිසංවිධානය කිරීමට අදාලව ඉදිරිපත්වන ආයෝජකයින්ගේ ව්‍යාපාර යෝජනා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර පිළිබඳ විශේෂඥ දැනුම ඇති කමිටුවක් මගින් අධ්‍යනය කිරීම සම්බන්ධව කටයුතු කරමින් සිටී. |
| (ඇ) | විධිමත් ලිඛිත ලේඛන හුවමාරුවීමකින් තොරව සමාගම සතුව පැවතුණු නිරාවිය, තුංකම, කන්තලේ, සිද්ධපුර, හා මුතුවැල්ල යන ගොවිපලවල් 2005-2010 අතර කාලපරිච්ඡේය තුළ මහවැලි අධිකාරිය වෙත පවරා තිබුණද, එම ගොවිපලවල් සතු පිරිවැය රු. 25,073,083 ක් වූ ගොඩනැගිලි හා සවි කිරීම 164 ක්, වාහන 26 ක්, කාර්යාල උපකරණ 45 ක්, යන්ත්‍රෝපකරණ හා ජෙනරේටර් 66 | වත්කම් නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළයුතුය. | මෙම වත්කම් නැවත මහවැලි අධිකාරිය වෙත පවරාදීමට අදාලව තොරතුරු මහවැලි අධිකාරිය වෙත ඉදිරිපත්කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් ලිඛිතව වත්කම් පැවරීම සිදුකර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ක් හා ලී බඩු හා සවිකිරීම් 260 ක් තවදුරටත් සමාගමේ ගිණුම්වල ඇතුළත් කර තිබුණි. එම වත්කම්වලට අදාල වාර්ෂික ක්ෂය රු.1,873,629 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, ඒවායේ භෞතික පැවැත්ම පිළිබඳ සත්‍යාපනයන් මහවැලි අධිකාරිය හෝ සමාගම විසින් සිදුකර නොතිබීම හේතුවෙන් එම වත්කම්වල භෞතික පැවැත්ම විගණනයේදී තහවුරු නොවුණි. | | | |
| (ඇ) | ණයගැති ශේෂ යටතේ රු.3,512,504 ක අවිනිශ්චිත ගිණුම් ශේෂයක් දක්වා තිබුණු අතර, ඉන් රු.2,047,972 ක ශේෂ 2017 වර්ෂයේ සිට පැවත එන බව නිරීක්ෂණය විය. | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට නොපමාව කටයුතු කළ යුතුය. | මෙම ශේෂයෙන් කොටසක් විශ්ලේෂණය කර නිරවුල් කර ඇත. | නිරවුල් කලයුතු ශේෂයක් තවදුරටත් පවතී. |
| (ඉ) | 2015 වර්ෂයේදී සිදුකළ වැටුප් සංශෝධනයට අනුව සේවකයින්ට ගෙවිය යුතු රු. 6,893,711 ක හිඟ වැටුප්ද, 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිභාර අරමුදලට ගෙවිය යුතු රු. 18,927,439 ක් සහ රු. 611,083 ක දායක මුදලක්ද ගෙවා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී සේවා නියුක්තිභාර අරමුදලට අධිභාර ලෙස රු. 11,830 ක් ගෙවා තිබුණි. | ගෙවිය යුතු මුදල් ගෙවීමට නොපමාව පියවර ගත යුතුය. | 2021 වර්ෂයේ දී රු.615,823 ක් ගෙවා ඇත. | තවද, රු. 6,277,888 ක හිඟ වැටුප් ශේෂයක්ද, රු.18,927,439 ක ගෙවිය යුතු අර්ථසාධක අරමුදල් ශේෂයක් සහ රු. 611,083 ක ගෙවිය යුතු සේවා නියුක්තිභාර අරමුදල් ශේෂයක්ද නිරවුල් කලයුතුව පවතී. |
| (ඊ) | සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව අනුදත් ප්‍රාග්ධනය රු. 10 කොටස් 5,000,000 කින් සමන්විතවී | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත කොටස් නිකුත් | නිකුත් කර ඇති කොටස් තුන නැවත සමාගම වෙත පවරා | 2022 පෙබරවාරි දක්වාම කොටස් නිකුත් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණු අතර, ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වෙත කොටස් 03 ක් පමණක් නිකුත් කර තිබුණද, අනෙකුත් කොටස් 2020 දෙසැම්බර් 31 දින දක්වාම නිකුත් කර නොතිබුණි. නිකුත් කර තිබූ කොටස් 03 ම වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත ලබාදී තිබුණු අතර, මහවැලි අධිකාරියේ හිමිකාරීත්වය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණි. | කිරීමට කටයුතු කළයුතුය. | ගෙන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නිකුත් කිරීමට තීරණය කර ඇත. | |
| (උ) | සමාගමේ සංගමික සංස්ථා පත්‍රයේ මූලික අරමුණු 12 ක් දක්වා තිබුණද, සමාගමේ ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව ඌරන් කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණු අතර මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි. | සංස්ථා පත්‍රයේ දක්වා ඇති අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. | සාංගමික සංස්ථා පත්‍රයේ දක්වා ඇති කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා සමාගම සතුව ප්‍රාග්ධන හැකියාවක් නොමැති බැවින්, ඒ සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය කරන පසුබිම සකස් කිරීමට ඉල්ලීම් කර ඇත. | වර්තමාන තත්වයේ වෙනසක් සිදු වී නැත. |
| (ඌ) | සමාගම විසින් දැනට භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් රු. 3,162,812 ක් වූ වාහන 04 ක් හා සමාගමේ ප්‍රධාන කාර්යාලය | වත්කම් නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළයුතුය. | ඉදිරි වර්ෂයේදී නිරවුල් කිරීමට තීරණය කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් පවරාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පිහිටි මහවැලි අධිකාරියට අයත් දෙමටගොඩ ප්‍රදේශයේ පිහිටි ඉඩම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු. 14,929,159 ක් ලෙස දක්වා තිබුණද, එම වත්කම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (එ) | ගිරාඳුරුකෝට්ටේ ගොවිපල තුළ පිහිටි කිරි සැකසුම්හල ආරම්භ කරන ලද 1986 වර්ෂයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර මගින් කිරි නිෂ්පාදන කටයුතු සිදුකරන අතර, කර්මාන්තශාලා ගොඩනැගිල්ලේ බිම ටයිල් කැඩී ගොස් තිබීම, වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලා තුළට කාන්දුවීම, කානු පද්ධතිය අබලන්වීම හා අභ්‍යන්තර පිරිසිදු කිරීමේ පද්ධතිය දුර්වලව පැවතීම ආදී කරුණු නිසා නිෂ්පාදනවල සෞඛ්‍ය ආරක්ෂිතභාවය සම්බන්ධයෙන් ගැටළු පැන නැඟී තිබුණි. | නිෂ්පාදනයේදී සෞඛ්‍ය ආරක්ෂිත ගැටලු ඇතිවීමට තුඩු දෙන හේතූන් නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. | අවම මට්ටමින් අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත. | ගැටළු නිරාකරණය වී නොමැත. |
| (ඒ) | 2020/21 මහ කන්නයේ බඩ ඉරිඟු වගාව සඳහා සමාගමේ ඉඩම් කන්න බදු ක්‍රමය යටතේ ගොවීන්ට ලබාදීමේදී ගොවීන් තෝරා ගැනීම සහ බදු මුදල් තීරණය කිරීම කමිටුවක් මගින් සිදු කළයුතු අතර, මෙමගින් ලබාගන්නා බදු මුදල් ආදායම මස් ගබඩා කිරීම සඳහා ශීතාගාර කන්ටේනරයක් මිලදී ගැනීමටත්, බ්‍රොයිලර් කොටු අළුත්වැඩියා කරගැනීමටත් යෙදවීම සඳහා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් | ගොවීන් තෝරාගැනීම හා බදු මුදල් තීරණය කිරීම කමිටුවක් මගින් සිදුකිරීමට කටයුතු කල යුතුය. | මෙම ඉදිකිරීම් ඉදිරියේ දී සිදුකිරීමට තීරණය කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් ඉදිකිරීම් සිදුකර නැති අතර මුදල් ජංගම ගිණුමේ රඳවාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් අනුමැතිය ලබාදී තිබුණි. එසේ වුවද ගොවියන් තෝරා ගැනීම හා බදු මුදල් තීරණය කිරීම උක්ත කමිටුව මඟින් සිදුකර නොතිබුණ අතර, උපයන ලද මුදල විගණිත දින වනවිටත් සමාගමේ ජංගම ගිණුමේ රඳවාගෙන තිබුණි. | | | |
| (ඔ) | 1986 වර්ෂයේ ඉදිකර තිබූ ගිරාඳුරුකෝට්ටේ සත්ව ගොවිපලට අයත් ගොඩනැගිලි 57 ක් 2019 වර්ෂයේදී නැවත තක්සේරු කර ගිණුම්වලට ගෙන තිබුණද, මින් ගොඩනැගිලි 7 ක් සම්පූර්ණයෙන් අබලන් තත්ත්වයේ පවතින හෙයින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අබලන් තත්වයේ පවතින ගොඩනැගිලි අලුත්වැඩියාවට කටයුතු කල යුතුය. | 2022 වර්ෂයේ දී ලියා හැරීමට කටයුතු සැලසුම් කර ඇත. | වත්කම් ලියා හැරිම කරනැත. |
| (ඕ) | සමාගම සතු ගිරාඳුරුකෝට්ටේ ගොවිපල සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් 2014 සහ 2015 වර්ෂවලදී රු.12,501,900 ක් වැය කර ඉදිකරන ලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු. 8,967,600 කට අගය කර 2016 පෙබරවාරි 08 දින සමාගමට පවරා දී තිබුණි. මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවූ බැවින්, පවරා දුන් දිනයේ සිට එම වත්කම් නිෂ්කාර්යව පැවතුණි. | මෙම ඉදිකිරීම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ක්‍රමවේද සකසා ගතයුතුය. | රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ආරම්භ කල පසු භාවිතයට ගැනීමට සැලසුම් කර ඇත. | 2022 පෙබරවාරි වන විටත් එම වත්කම් නිෂ්කාර්යව පවතී. |

## 4.57 ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය - ලංකා ජෙමොලොජිකල් ලැබොරටරි (පුද්ගලික) සමාගම

**2018** මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නැත.

**2019** මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නැත.


**2020** මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නැත.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2015, 2016, 2017, 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂ සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ආ) | 2014 අප්‍රේල් 01 සිට 2021 මාර්තු 31 දක්වා කාලය තුළ පහත සඳහන් පොත් සහ වාර්තා සමාගම විසින් නඩත්තු කර නොතිබුණි.<br>(i) මුදල් පොත්.<br>(ii) ලෙජර් ගිණුම්.<br>(iii) ජර්නල්<br>(iv) බැංකු සැසඳුම් ප්‍රකාශයන්.<br>(v) ගෙවීම් වවුචර. | පොත්පත් හා ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඇ) | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් 2014 වසරේ දී සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂවරයාගේ තායිලන්ත සංචාරය වෙනුවෙන් රු. 369,440 ක මුදලක් ද, ජර්මානු සංචාරය සඳහා රු.1,032,887 ක මුදලක්ද ගෙවා ඇත. කෙසේ වෙතත්, එම මුදල් 2021 මාර්තු 31 වන විටත් සමාගම විසින් පියවා නොතිබුණි. | හිඟ ශේෂය පියවීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විගණන දිනය දක්වා ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට කටයුතු කර නොතිබුණි. තවද, ගෙවිය යුතු ආදායම් බදු සහ රඳවා තබා ගැනීමේ බදු පිළිවෙලින් රු.14,619,695 ක් සහ රු.4,784,831 ක් 2020 මාර්තු 31 වන විටත් සමාගම විසින් ගෙවා නොතිබුණි. | ලියාපදිංචි වී ආදායම් බදු ගෙවීමට කටයුතු කළ යුතුයි. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඉ) | සමාගම 2008 වර්ෂයේදී ආරම්භ කර ඇත. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සමාගමේ කිසිදු අරමුණක් සාක්ෂාත් කර ගැනීමට සමාගමේ කළමනාකාරීත්වය අපොහොසත් විය. | සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පියවර ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

## 4.58 GSMB තාක්ෂණික සේවා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 846,162,622 | 793,454,563 | 522,946,817 | 257,552,618 | 52,708,059 | තත්ත්වාගණනය කළ |
| **2019** | 871,399,061 | 817,864,289 | 504,660,454 | 202,687,861 | 53,534,772 | තත්ත්වාගණනය කළ |
| **2020** | 490,964,094 | 547,867,128 | 463,912,424 | 208,230,416 | (56,903,035) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කාර්යාලයේ කන්ටේනරයක් නිෂ්ක්‍රීයව තිබූ අතර එහි සවිකර තිබූ වායු සමීකරණ පද්ධතිය කිසියම් පිරිසක් විසින් ගෙනගොස් තිබුණි. 2020 සැප්තැම්බර් 10 වන දින විගණනය විසින් මෙම | පරීක්ෂණයක් පවත්වා වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව නිසි පියවර ගත යුතුයි. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | අස්ථානගතවීම පිළිබඳව සමාගමට දන්වා ඇතත්, 2021 මැයි 17 වන දින දක්වා වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ආ) | සමාගම විසින් වැලි නිකුත් කිරීම සඳහා සාධාරණ සහ නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබූ අතර, ව්‍යාපෘතියෙන් හැරූ වැලිවලින් සියයට 75ක් පොළොන්නරුව මහවැලි එක්සත් ටිපර් රථ සංගමයේ ලොරි සඳහාද, සියයට 10ක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අනෙකුත් ලොරි සඳහාද, සියයට 15ක් පිටත දිස්ත්‍රික්කවල ලොරි සඳහාද ලබාදී තිබුණි. ඊට අමතරව දේශපාලන ඉල්ලීම්, මහජන හා ආගමික ඉල්ලීම් සහ අනෙකුත් ඉල්ලීම් ඇතුළු ප්‍රමුඛතා ලේඛනය මත පදනම්ව දිනපතා වැලි නිකුත් කර තිබුණි. | වැලි නිකුත් කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් ලිඛිතව සකස් කළ යුතුය. | ක්‍රමවේදයක් සකස් කර ඇතැයි සැලකුවද එය අභ්‍යන්තර චක්‍රලේඛයක් ලෙස ව්‍යාපෘති කාර්යාල අතර බෙදා හැර නොතිබුණි. | ක්‍රමවේදයක් සකස් කර ඇතැයි සැලකුවද එය අභ්‍යන්තර චක්‍රලේඛයක් ලෙස ව්‍යාපෘති කාර්යාල අතර බෙදා හැර නොතිබුණි. |
| (ඇ) | මනම්පිටිය වැලි කැණීම් ව්‍යාපෘතියේ II අදියරෙහි වැලි ගොඩදැමීම සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර නොතිබුණි. | පසු විපරම් කමිටුව කඩිනමින් පත් කර ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කළ යුතුය. | මනම්පිටිය ව්‍යාපෘතියේ II අදියර ආරම්භ කර නොතිබුණි. | මනම්පිටිය ව්‍යාපෘතියේ II අදියර ආරම්භ කර නොතිබුණි. |
| (ඈ) | 2019 වසරේ ව්‍යාපෘති කාර්යාලයේ ඇති වූ ගින්නට අදාළ පොලිස් වාර්තාව නිකුත් කර තිබුණේ 2020 අගෝස්තු 21 වැනිදාය. එම වාර්තාවට අනුව මෙම ගින්න අහම්බෙන් සිදු වූවක් නොවන බවත්, එය හිතාමතාම කන්ටේනර් පෙට්ටිවල ලියකියවිලිවලට පෙට්‍රල් දමා සිදු කර ඇති බවත් වාර්තා වේ. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙය හිතාමතා කළ ගිනි තැබීමක් බවට පොලිස් වාර්තාවේ සඳහන් වූ බැවින් ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |


| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2019 වර්ෂයේ රු. 8,883,520 ට මිල දී ගත් සහ 2020 දෙසැම්බර් 31 දිනට පොත් වටිනාකම ශුන්‍ය වූ ලෝඩරය අලුත්වැඩියා කිරීම සඳහා 2019 වර්ෂයේදී රු. 966,565 ක් වැය වී තිබුණද, එය 2021 ජුනි 10 වන විටත් භාවිතයට ගත නොහැකි තත්ත්වයක පැවතුණි. | අලුත්වැඩියාව නිසියාකාරව සිදු කිරීමට හෝ එසේ නොමැති නම් වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඊ) | **<u>කොටිකාම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය</u>** අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත එම තිරුවානා නිධිය කැණීමට සහ අගය එකතු කර අපනයනය කිරීමට සමාගමට 2017 වර්ෂයේදී භාර දී තිබුණි. පරිසර බලපෑම් තක්සේරුවක් (EIA) වෙනුවට මූලික පාරිසරික ඇගයීමක් (IEE) සිදුකිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. මූලික පාරිසරික ඇගයීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගත වූ දීර්ඝ ප්‍රමාදය හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පියවර ගත යුතුයි. | අදාළ ආයතනවල අනුමැතිය තවමත් ලැබී නොතිබුණි. | ව්‍යාපෘතිය තවම ආරම්භ කර නොමැත. |
| (උ) | පාරිසරික බලපෑම් ඇගයීමක් සිදු කිරීම වෙනුවට මූලික පාරිසරික නිරීක්ෂණයක් ප්‍රමාණවත්ද යන්න පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියෙන් සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පළමු එකඟතාව ලබාගැනීමට 2019 ඔක්තෝබර් 29 වෙනිදා නැවතත් කැබිනට් මණ්ඩලය තීරණය කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනතුරුම තීරණයක් ගෙන නොතිබුණි. | අදාළ ආයතන සමඟ සාකච්ඡා කර කඩිනම් තීරණයක් ගෙන ව්‍යාපෘතිය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුයි. | අදාළ ආයතනවල අනුමැතිය තවමත් ලැබී නොතිබුණි. | ව්‍යාපෘතිය තවම ආරම්භ කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඍ) | 2017 සිට ව්‍යාපෘතියෙන් කිසිදු ආදායමක් උපයා නොමැති වුවත්, 2017-2020 කාලසීමාව තුළ, කැණීම් කරන ලද තිරිවානා ගබඩා කිරීම සඳහා ඉඩමක් කුලියට ගැනීම, කැනීම් කරන ලද තිරිවානා කිරා මැන බැලීමට තරාදියක් මිලදී ගැනීම සහ එහි ආරක්ෂාව සඳහා ආරක්ෂක නිලධාරීන් යොදවා ගැනීම ඇතුළු පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු. 20,942,314 ක් දරා තිබුණි. | ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුයි. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (එ) | කන්තලේ සූරියපුර තුම්මෝදර ප්‍රදේශයේ වැලි ගොඩදැමීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුමට අනුව 2020 ජනවාරි මාසය වන විට වැලි කියුබ් 103,128ක් කැනීම් සිදු කිරීමට නියමිතව තිබුණද, 2020 අගෝස්තු 19 වන විට කැණීම් කර තිබුණේ වැලි කියුබ් 41,297ක් පමණි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ වැලි ගොඩදැමීම සඳහා ගිවිසුමකට එළැඹීමේදී අදාළ පිරිවැය නොසලකා බැංකු ඇපකරයක් ලබාදීමට එකඟ වීම හේතුවෙන් රු. 900,000 ක කොමිස් මුදලක් ගෙවීමට සිදුවූ අතර එය සමාගමට ආර්ථිකමය නොවන වියදමකි. | ව්‍යාපෘති කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම්වලට එළඹීමේදී අදාළ පිරිවැය සලකා බැලීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ඒ) | පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලි ව්‍යාපෘතිවල සේවය කරන වැලි ගොඩදැමීම්කරුවන් හරිත වැලි තොටුපළ සංකල්පයට ඇතුළත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය ඇතිව රු. 2,893,340 ක මුදලක් වැය කරමින් 2020 ජුනි 22 වැනි දින වැඩමුළුවක් පවත්වා ඇත. මේ සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිලධාරීන් වෙනුවට පෞද්ගලික | අදාළ අනුමැතිය ඇතිව පමණක් වැඩමුළු සංවිධානය කළ යුතු අතර අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතනයක් සම්බන්ධ කර සිදු කිරීම හේතුවෙන් ඒ සඳහා රු.235,000 ක මුදලක් ගෙවා තිබුණි. වැලි ගොඩ දමන්නන් 1500 කට බෙදා දීමට රු.1,049,000 ක වියදමින් සකස් කළ වියළි ආහාර මළු 1500 න් 934 ක් වැලි ගොඩ දමන්නන් සඳහා එදින බෙදා දී ඇති අතර රු.396,000 ක වටිනාකමක් ඇති ඉතිරි වියළි ආහාර ද්‍රව්‍ය මළු 566 බෙදා හැරීමට අදාළ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. සමාගමේ බොහෝ වැලි ව්‍යාපෘතිවල කොරිඩෝවල හරිත වැලි තොටුපළ සංකල්පය නිසි ලෙස ක්‍රියාත්මක කර නොතිබූ අතර වැඩමුළුවේ අපේක්ෂිත අරමුණු ද ඉටු වී නොතිබුණි. | | | |
| (ඔ) | මනම්පිටිය ව්‍යාපෘතිය සඳහා රු.2,423,224ක් වැයකර මිලදී ගත් කිලෝවොට් 40ක ජනන යන්ත්‍රය කිසිදු ආවරණයක් සහ ආරක්ෂාවක් නොමැතිව කන්ටේනරයක වහලය මත සවිකර තිබුණි. | වත්කම්වලට ආරක්ෂාව ලබාදීමට කටයුතු කළ යුතුයි. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |

## 4.59 ලංකා සෝල්ට් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 1,352,481,952 | 1,390,330,414 | 2,211,306,078 | 832,283,123 | 12,651,164 | තත්ත්වාගණනය කළ |
| **2019** | 1,567,174,191 | 1,916,374,623 | 1,842,185,807 | 800,324,878 | (349,200,431) | තත්ත්වාගණනය කළ |
| **2020** | 1,338,719,767 | 1,279,377,078 | 1,671,671,949 | 620,508,951 | 59,342,688 | තත්ත්වාගණනය කළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 1,352.48 | 1,390.33 | 2,211.31 | 832.28 | 12.65 |
| 2019 | 1,567.17 | 1,916.37 | 1,842.19 | 800.32 | (349.20) |
| 2020 | 1,338.72 | 1,279.38 | 1,671.67 | 620.51 | 59.34 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 13.4 වගන්තිය අනුව ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකමට තොග අගය කර මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්විය යුතු වුවද සමාගම විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කර නොතිබූ අතර පිරිවැය රු.393,325,917 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව තොගවල ශුද්ධ උපලබ්ධි අගය හෝ පිරිවැය යන දෙකෙන් අඩු වටිනාකමට තොග අගය කර දැක්විය යුතුවීම. | ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමට පියවර ගෙන නොමැත. | 2021 දෙසැම්බර් 31 දිනට ද තොගය සඳහා ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර නොතිබුණි. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ 17.19 වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතු වුවත්, සමාගම ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ ජංගම නොවන වත්කම් වටිනාකම රු.75,376,038 ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ඵලදායී ජීවිත කාලය නිවැරදිව සමාලෝචනය නොකිරීමෙන් වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිතියෙහි 10.15 – 10.18 වගන්ති ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකල යුතු වීම. | ස්ථාවර වත්කම් සඳහා භෞතික සත්‍යාපනයක් සිදු කරමින් පවතී. | මේ දක්වා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | | | |
| (ඈ) | කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.38,360,509 ක ශේෂයක් සඳහා සනාථන ලිපි හා කොන්ත්‍රාත් ගිවිසුම් විගණනය වෙත ඉදිරිපත් නොවීය. | මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ශේෂ පිළිබඳව ප්‍රමාණවත් තහවුරු කිරීමේ සාක්ෂි පවත්වා ගත යුතුය. | අලුත්වැඩියා කටයුතු 2022 වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂිත බැවින් එම මුදල එම පිරිවැයට එරෙහිව කපා හැරීමට තීරණය කර ඇත. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද නිවැරදි කිරීම් සිදුකර නොමැත. |
| (ඈ) | 2019 ජුනි 11 සිට 2020 නොවැම්බර් 13 දක්වා කාල පරිච්ඡේදය තුලදී ලුණු ප්‍රවාහනයෙන් ලද ආදායමෙන් රු.7,579,030 ක මුදලක් අස්ථානගතවී තිබූ අතර ඊට සම්බන්ධ පාර්ශවයන්ගෙන් අයකර ගැනීම වෙනුවට එම සම්පූර්ණ ආදායම සඳහාම අඩමාණ ණය වෙන්කිරීම් සිදු කර තිබුණි. එම ආදායමෙන් 2019 වර්ෂයට අදාල ආදායමද 2020 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. මෙම වටිනාකම ණයගැති අවසන් ශේෂයෙන් සියයට 18 ක් තරම් විශාල අගයක් වන අතර එය සමාගමේ ණයගැති ප්‍රතිරූපය වෙනස් කිරීමට විශාල වශයෙන් බලපෑමක් කරනු ලබයි. | එක් එක් කාල පරිච්ඡේදයන්ට අදාලව ආදායම් වෙන් වෙන්ව හඳුනාගත යුතු වීම, ප්‍රමාණවත් හෙළිරව් කිරීම් කල යුතු විම හා වගකිව යුතු පාර්ශවයන්ගෙන් අහිමි වූ ආදායම් අයකර ගැනීම සඳහා නිතිමය පියවර ගත යුතු වීම. | විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. | විමර්ශන කටයුතු අවසන් කර වගකිව යුතු පාර්ශවන්ගෙන් සමාගමට වූ අලාභය අයකර ගෙන නොමැත. |
| (ඉ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය සහිත කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව නව කාර්ය මණ්ඩල සඳහා අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් | නිසි කාර්ය මණ්ඩල ඇගයීමක් සිදුකර අවශ්‍ය කාර්ය මණ්ඩලය හඳුනාගෙන එය අනුමත කරවා ගැනීමටත්, මනා | වාර්ෂිකව පිරිස්බල අවශ්‍යතාවය ගණනය කර එම අවශ්‍යතාවයට අනුව පමණක් සේවක සංඛ්‍යාව පවත්වාගැනීමට තීරණය කර ඇත. | තවදුරටත් කාර්ය මණ්ඩල අතිරික්තයක් පවතින අතර කාර්ය මණ්ඩලය සඳහා භාණ්ඩාගාරයේ |

| | | | | |
|---|---|---|---|---|
| | 31 දිනට 1036 ක් වූ කාර්ය මණ්ඩලය 2018 දෙසැම්බර් 31 දිනට 1780 දක්වා 744 ක් වාර්ෂිකව වැඩිකරගෙන තිබුණි. කාර්ය මණ්ඩලය වැඩිකිරීම සඳහා වූ හේතුන් විගණනයට අනාවරණය නොවුණි. කෙසේ වුවද, සමාගමේ පිරිස් බල ව්‍යුහය අනුව 2018 දෙසැම්බර් 31 දිනට අතිරික්ත සේවක සංඛ්‍යාව 368 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 384 ක් විය. | කාර්ය මණ්ඩල පරිපාලනයක් පවත්වා ගෙන යාමටත් කටයුතු කළ යුතුය. | | අනුමැතිය ලබාගෙන නොමැත. |
| (ඊ) | 2015 මැයි 25 දිනැති හා අංක.පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 වගන්තිය ප්‍රකාරව සමාගමේ සභාපතිට හිමි උපරිම මාසික ඉන්ධන දීමනාව ලීටර් 170 වුවද 2019 වර්ෂයේ ලීටර් 170 ක් ඉක්මවා ඉන්ධන ලබාදී තිබූ අවස්ථා 5 ක් නිරීක්ෂණය විය. ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය සහිතව අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන සියලු රාජ්‍ය සමාගම් විසින් අදාල කර ගත යුතු බැවින් නිලධාරීන්ට ඉන්ධන දීමනා ලබාදීමේදී මෙම චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව පමණක් කටයුතු කිරීමට තීරණය කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව ගෙවීම් සිදුකරනු ලබයි. |
| (උ) | 2015 මැයි 25 දිනැති හා පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන හා 3 වන වගන්තිය අනුව සමාගම විසින් චක්‍රලේඛය පරිදි කාර්ය මණ්ඩල ව්‍යුහය සකස්කර නිශ්චිතව වාහන හා ඉන්ධන දීමනා හිමි තනතුරු හඳුනානොගෙන නිලධාරීන් 13 න් දෙනෙකුට සමාගමේ වාහන වෙන් කර දී තිබුනු අතර ඔවුන් සඳහා | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන සියලු රාජ්‍ය සමාගම් විසින් අදාල කර ගතයුතු බැවින් නිලධාරීන්ට වාහන හා ඉන්ධන දීමනා ලබාදීමේදී මෙම චක්‍රලේඛ විධිවිධාන | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ඉන්ධන ලබාදීම සිදුකරනු ලැබේ | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | මාසිකව ලීටර් 125 සිට 250 දක්වා ඉන්ධන ද ලබා දී තිබුණි. තවද, ඉහත සඳහන් නිලධාරින් 13 දෙනාට අමතරව සමාගමේ කළමනාකරුවන්, සහකාර කළමනාකරුවන් සහ ලිපිකරුවන් ඇතුළු කාර්ය මණ්ඩලයේ 20 දෙනෙකුට නිල වාහන ලෙස සමාගමේ මොටර් සයිකල් ලබාදී තිබු අතර මාසිකව ලීටර් 8 සිට 45 දක්වා ප්‍රමාණයන්ගෙන් ඉන්ධනද සමාගමෙන් ලබා දී තිබුණි. එසේම පෞද්ගලික කාර් රථ 02 ක් හා පෞද්ගලික මොටර් සයිකල් 25 ක් වෙනුවෙන් සමාගමේ කාර්ය මණ්ඩලයේ 27 දෙනෙකුට මාසිකව ලීටර් 08 සිට ලීටර් 60 දක්වා ප්‍රමාණයන්ගෙන් ඉන්ධනද සමාගමෙන් ලබා දී තිබුණි. තවද, ඉහත නිලධාරින් 47 දෙනාට වාහන ඇතුලු ඉන්ධන සමාගමෙන් ලබා දීමට අදාල අනුමැතින් විගණනයට ඉදිරිපත් නොවිණි. | ප්‍රකාරව කටයුතු කල යුතුය. | | |
| (ඖ) | 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 11 වන වගන්තිය ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයෙකුගෙන් අයකළ යුතු වන සියයට 8 දායක මුදල් වැඩි කිරීම සඳහා සේවායෝජකයා විසින් කම්කරු කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් එම අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාගමේ ස්ථිර | දායක මුදල් ප්‍රතිශතය ඉහල දැමීම සම්බන්ධයෙන් සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීම සඳහා පියවර ගෙන නොමැත. | මේ දක්වා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සේවකයින්ගේ ඉපැයීම් මත එම ප්‍රතිශතය සියයට 10 දක්වා වැඩිකර තිබුණි. | | | |
| (එ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක. පීඊඩී 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 වන ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ගෙවීමට සුදුසුකම් ලැබීමට නම් පූර්ව වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන එම මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත්කර තිබිය යුතු වේ. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 සැප්තැම්බර් 18 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබියදී 2020 වර්ෂයේ ලාභය පදනම් කර ගනිමින් රු.28,362,054 ක් ප්‍රසාද දීමනා ලෙස 2021 මැයි මාසයේ දි ගෙවා තිබුණි. එසේම මෙම ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියක් ද ලබා ගෙන නොතිබුණි. | රජයේ සමාගම් විසින් භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛවලට අනුගත විය යුතු බැවින් එම චක්‍රලේඛ වලින් බැහැරව කටයුතු කරන්නේ නම් අදාළ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව වාර්ෂික ප්‍රසාද දීමනා ලබාදී ඇත. | භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතීන් ලබාගෙන ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 9.2, 9.3.1 සහ 9.14 වගන්ති ප්‍රකාරව සමාගමේ සංවිධාන සටහන හා අනුමත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර නොමැති අතර සමාගම විසින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රියාපරිපාටිය සහ මානව සම්පත් කළමනාකරණය සඳහා වූ අත්පොතක් පිළියෙල කර ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. තවද, 2017 මැයි 3 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී සමාගමේ සේවක සංඛ්‍යාව තීරණය කිරීමේදී භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු බව දන්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධාන සියලු රාජ්‍ය සමාගම් විසින් අදාල කර ගත යුතු බැවින් චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | මෙම සියලු කටයුතු සිදුකර ගැනීම සඳහා බාහිර ආයතනයක් පත්කිරීමට 2021 සැප්තැම්බර් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව අදාල අවශ්‍යතාවයන් මේ වන විටත් සම්පූර්ණකර ගෙන නොමැත. |
| (ඔ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.2.3 වගන්තිය 2020 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස් කර තිබුනද, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මූල්‍ය වර්ෂය ආරම්භ වීමට පෙර අයවැය ලේඛනය සකස් කර චක්‍රලේඛයෙහි ප්‍රතිපාදන ප්‍රකාරව අවශ්‍ය අනුමැතීන් ලබාගත යුතු වීම | ඉදිරි වර්ෂයේ සිට නියමිත ක්‍රමවේදය තුල පිහිටා කටයුතු කිරීමට එකඟ වෙමි. | මේ දක්වා මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| (ඕ) | සමාගම විසින් මහලේවාය හා බුන්දල යන ලේවායන්හි පොල් වගාවන් පවත්වාගෙන යනු ලබන අතර, මෙම වගාවන්හි පසුගිය වසර 03 ක සහ ප්‍රවර්තන වර්ෂයේ දරන ලද වියදම් හා ලද ආදායම් සැලකීමේ දී දිගින් දිගට ශුද්ධ අලාභ ලබා තිබුණි. 2017, 2018 හා 2019 වර්ෂවලදී ලද ශුද්ධ අලාභය පිළිවෙලින් රු.7,517,387 ක්, රු.7,050,800 ක් හා රු.7,305,655 ක් වූඅතර 2020 වර්ෂයේදී එය රු.8,086,837 ක් දක්වා වර්ධනයවී තිබුණි. ඒ අනුව මෙම වගාව වෙනුවෙන් දරන වියදම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. | ඵලදායී ලෙස වියදම් දැරීමටත් ආදායම් වැඩිකර ගැනීමටත් කළමනාකරණය වග බලාගත යුතු වීම | පොල් වගාව සම්බන්ධව නව අධීක්ෂණ නිලධාරියෙකු පත්කර ඇත. | 2021 වර්ෂයේ දී ද පොල් වගාවෙන් අලාභ ලබා ඇති අතර එම අලාභය රු.2,566,170 ක් විය. |
| (ක) | මේස ලුණු නිෂ්පාදනය කිරීම සඳහා 2011 වර්ෂයේ දි ඉන්දියානු සමාගමකින් රු.24,671,591 ක මුදලකට මිලදීගෙන තිබූ යන්ත්‍ර 04 ක් නියමිත පිරිවිතරයන්ට සුදුසු ලෙස මිලදී නොගැනීම හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන වර්ෂ 09 ක කාලයක් කර්මාන්තශාලාව තුල නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන වත්කම් මිලදී ගැනීමටත්, ඒවා ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් පියවර ගත යුතු වීම. | එම යන්ත්‍ර විකිණීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | නියමිත පිරිවිතරවලට අනුව මිලදී ගෙන නොතිබීම හේතුවෙන් මෙම යන්ත්‍ර තවදුරටත් නිෂ්කාර්යව පවතී. එම යන්ත්‍ර සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැත. |
| (ග) | සමාගම විසින් අලෙවි නියෝජිතවරුන් හරහා ලක්ලුණු අලෙවිය සිදු කරනු ලබන අතර 2020 ආරම්භයේදී ලක්ලුණු කිලෝග්‍රෑම් 1 ක් අලෙවි නියෝජිතයින්ට විකුණනු ලැබූ මිල වූ රු.40 ක මිල අවස්ථා කිහිපයක දී රු.12.50 කින් හා රු.15 කින් | සමාගමෙහි ආදායම වර්ධනය වන ආකාරයේ විකුණුම් ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරිම කලමනාකරණයේ වගකීම වන බව | 2020 මැයි 21 දින සිට ලක් ලුණු මෙ.ටො. 01 ක මිල රු.32,000 දක්වා පහත දැමීමට තීරණය කර ඇත. 2020 සැප්තැම්බර් මස සිට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය අනුව පෙර | ආයතනයේ ලාභාන්තිකය වැඩිකර ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | පහත දමා තිබූ අතර 2020 වර්ෂයේ අවසානය වන විට කිලෝග්‍රෑම් 1 ක විකුණුම් මිල රු.27.50 ක් විය. වෙළඳපොළ මිල රු.60 ක ස්ථාවරයෙහි පැවතිය දී මෙලෙස විකුණුම් මිල සැලකිය යුතු ප්‍රතිශතයකින් එනම්, සියයට 31.25 කින් පහත දැමීම සඳහා පදනම් කර ගත් පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක්, වෙළඳපොළ විශ්ලේෂණයක්, පදනම් කර ගත් වෙනත් අදාල සාධක හා විශේෂඥයින්ගෙන් සැදුම්ලත් මිල කමිටුවක නිර්දේශ විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. මේ අනුව අලෙවි නියෝජිතයින්ට මිල පහත දැමීම මත රු.161,273,875 ක අලෙවි සහනයක්ද, රු.42,786,475 ක දිරිදීමනාවක්ද ගෙවා තිබුණි. මෙලෙස ලක් ලුණු අලෙවිය අලෙවි නියෝජිතයින් හරහා සිදුකර ගැනීමේදී ලක්ලුණු කිලෝග්‍රෑම් 1 ක වෙළඳපොළ මිල රු.60 ක් සහ සමාගමෙහි අලෙවි මිල රු.27.50 ක් වන අවස්ථාවේ දී රු.32.50 ක් එනම් වෙළඳපොළ විකුණුම් මිලෙන් සියයට 54.17 ක් සමාගමට අහිමිව තිබුණි. | | පැවති රු.75 ක් වූ දිරි දීමනාව ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත. |
| (ච) | සමාගම විසින් ලක් ලුණු අලෙවිය මත අලෙවි නියෝජිතයින්ට දිරිදීමනාවක් ගෙවනු ලබන අතර එම දිරිදීමනාව ගණනය කිරීමේදී අදාල ඉලක්කගත අලෙවිය ලඟාකර නොගත් අලෙවි නියෝජිතයන් හටද දිරිදිමනා | අලෙවි ඉලක්ක ලඟා කරගත් අලෙවි නියෝජිතයන්ට පමණක් දිරි දිමනා ගෙවනු ලබනු බවට තහවුරු කර ගැනීම | 2020 වර්ෂයේ කොරෝනා තත්ත්වය මත අලෙවි කටයුතු සිදුකිරීමේ දී ගැටළු මතුවූ බැවින් එවකට සිටි සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරීතුමාගේ | දිරිදීමනා ගෙවීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාදුන් අවස්ථා පැවතුණි. නියැදි විගණන පරීක්ෂාව අනුව 2020 වර්ෂයේදී අලෙවි නියෝජිතයන් 8 දෙනෙකුට මෙලෙස ඉලක්කගත අලෙවිය ලඟාකරගෙන නොතිබියදී රු.981,875 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි. | කළමනාකරණයේ වගකීම බව. | උපදෙස් පරිදි මෙම දිරිදිමනාව ලබා දි ඇති බව දන්වා ඇත. | |
| (ජ) | අලෙවි ඉලක්ක ලඟාකර ගැනීම මත අලෙවි නියෝජිතයින් දිරිදීමනාවකට හිමිකම් ලබන අතර එම දිරිදිමනාව ලුණු තොග නොමිලේ නිකුත් කිරීම මගින් ගෙවනු ලබයි. අලෙවි අංශය මගින් සැපයූ තොරතුරු අනුව 2020 වර්ෂයේ දී අලෙවි ඉලක්ක ලඟාකර ගැනීම මත අලෙවි නියෝජිතයින් උපයාගත් දිරිදිමනාව රු.42,786,475 ක් වුවද, විකුණුම් වටිනාකම රු.44,919,575 ක් වූ ලුණු තොග දිරි දීමනා ලෙස අලෙවි නියෝජිතයින් වෙත නොමිලේ නිකුත් කර තිබීම හේතුවෙන් නිසි ප්‍රමාණයට වඩා රු.2,133,100 ක ලුණු තොග සමාගම විසින් දිරි දීමනා ලෙස නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. | උපයා ගන්නා ලද දිරිදීමනා නිවැරදිව ගණනය කිරීම සහ ඒ මත පදනම්ව නොමිලේ ලුණු තොග නිකුත් කිරිම ආදිය සම්බන්ධයෙන් පැහැදිලි වැඩ බෙදීමක් සිදුකර වගකීම් පැවරිය යුතු වීම හා ඉහළ කළමනාකරණයෙහි අනුමැතියෙන් තොරව නොමිලේ නිකුත් කිරීම් අනුමත නොකල යුතු වීම. | ක්‍රමවේදයන්හි වෙනසක් සිදුකර නොමැත. | ක්‍රමවේදයන්හි වෙනසක් සිදුකර නොමැත. |
| (ට) | සමාගම විසින් 2020 වර්ෂය සඳහා අලෙවිකරණ අංශයේ නිලධාරීන් හට රු.3,240,890 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණු අතර මෙම දිරිදිමනාව 2020 දෙසැම්බර් මස සිට ගෙවිමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වි ඇතත්, 2020 ජනවාරි සිට නොවැම්බර් දක්වා | නිසි අනුමැතිය ලබාගෙන ගෙවීම් සිදුකල යුතු බව | ක්‍රමවේදයන්හි වෙනසක් සිදුකර නොමැත. | ක්‍රමවේදයන්හි වෙනසක් නිරීක්ෂණය නොවේ. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.3,082,007 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. තවද, මෙම දිරිදීමනාව ගෙවීමේ දී ඉලක්කගත විකුණුම් ප්‍රමාණය ලබා කර නොගත් නිලධාරීන් සඳහා ද ගෙවීම් සිදුකල අවස්ථා නිරීක්ෂණය විය. 2020 ජනවාරි මාසයේදී අලෙවි ඉලක්ක ලබාකර නොගත් නිලධාරීන්ට රු.125,012 ක් ගෙවා තිබූ බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | | | |
| (ඩ) | ක්ෂේත්‍රගත නිලධාරීන් 12 දෙනෙකු අලෙවි අංශයෙහි සේවය කරනු ලබන අතර එම සෑම නිලධාරියෙකුටම තනතුර අනුව විධිමත් පරිදි ලිඛිතව රාජකාරි පැවරීමක් සිදුකර නොතිබුණි. තවද, එක් එක් නිලධාරීන්ට මාසික වැඩ සැලැස්මක් ලබා දීම, ඒ මත පදනම්ව කාර්යසාධනය ඇගයීම හා අදාල ක්ෂේත්‍රයතුළ රාජකාරි ඉටුකරන බව විධිමත් පරිදි සනාථ කර ගැනීම ආදිය සිදුකරන බව නිරීක්ෂණය නොවුණි. මෙම නිලධාරීන් සෘජුවම විකුණුම් අවස්ථා සමාගමට ගෙන ඒමක් සිදු නොකරන අතර, අලෙවි නියෝජිතයින්ගේ කාර්යය සඳහා සහයෝගය දැක්විමක් සිදුකරන බව නිරීක්ෂණය විය. ඒ අනුව. එකම විකුණුම් මත අලෙවි නියෝජිතයින්ට ද අලෙවි අංශයේ නිලධාරීන්ට ද දිරිදීමනා ගෙවන බව නිරීක්ෂණය විය. | සෑම නිලධාරියෙකුටම තම තනතුරට අදාලව ලිඛිතව වැඩ පැවරීම් සිදුකල යුතු වීම්, කාර්යය සාධනය ඇගයීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත කරන ලද විධිමත් ක්‍රමවේදයක් සකස් කල යුතු වීම සහ සමාගමෙහි වියදම් විචක්ෂණශීලීව දැරීම පිළිබඳව අවධානය යොමු කල යුතුය. | ලිඛිත රාජකාරී කටයතු පැවරීමටත්, රාජකාරී කටයුතු ජීපීඑස් තාක්ෂණය ඔස්සේ පරික්ෂා කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත් මට්ටමක නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ණ) | 1994 වර්ෂයේ සිට වසර 30 ක කාලපරිච්ඡේදයක් සඳහා දීර්සකාලීන බදු පදනම යටතේ ලබාගෙන තිබුණු මහලේවායේ ඉඩම සඳහා 2021 නොවැම්බර් 15 විගණිත දිනය වන විටත් බදු ඔප්පු සකස් කර නොතිබුණි. දීර්සකාලීන බදු පදනම යටතේ ලබාගෙන තිබූ කොහොලංකල හා බුන්දල ලේවායන්ගේ ඉඩම්වල බදු කාලසීමාවන් පිළිබඳ තොරතුරු අනාවරණය නොවූ අතර එම ඉඩම් සඳහා ද බදු ඔප්පු සකස් කර නොතිබුණි. | බදු ඔප්පුව සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා පසු විපරම් කටයුතු සිදුකල යුතුය. | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් සිදුකල යුතු කටයුතු සිදුකරමින් පවතී. | මේ වන විටත් අදාල බදු ඔප්පු සකස්කර ගෙන නොතිබුණි. |
| (ත) | සමාගම විසින් ලුණු ප්‍රවාහන ආදායම් පදනම් කරගෙන රියදුරන්ට සහ සහායකට අමතර දීමනාවක් ගෙවනු ලබන අතර,රු.7,579,030 ක ආදායමක් සමාගමට ලැබී නොතිබියදී ඒ මත පදනම්ව රු.1,541,221 ක් අමතර දීමනා ලෙස ගෙවා තිබුණි. | ගෙවීම් සහතික කිරීමේ දි සහ අනුමත කිරීමේ දී එම ගෙවීම් වල නිරවද්‍යතාවය සහ සාධාරණත්වය සහතික කර ගැනීමෙන් පසුව පමණක් සහතික කිරීම සහ අනුමත කිරීම් කල යුතුය. | මේ වන විට විමර්ශන කටයුතු ආරම්භ කර ඇති බව දන්වා ඇත. | මූලික විමර්ශන වාර්තාවක් ඉදිරිපත් කර නොමැත. මූල්‍ය අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොමැත. |
| (ද) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 අනුව, සමාගමේ එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර අනුමත කරවාගෙන නොතිබුණි. | සමාගමේ එක් එක් ප්‍රසම්පාදන කාර්යයන් වෙනුවෙන් මුළු පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කර අනුමත | පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කර නොමැත. | 2021 වර්ෂයේ දීද සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | කරවාගැනීමට කටයුතු කළ යුතුය. | | |
| (න) | මහලේවාය, පලටුපාන හා බුන්දල ලේවායන්හි ප්‍රධාන ගබඩාවන්හි විවිධ මෙවලම් හා අමතර උපාංග යටතේ රු.2,183,924 ක් වටිනා තොගයක් වසර 02 කට වැඩි කාලයක සිට භාවිතයකින් තොරව පැවති අතර රු.10,001,126 ක් වටිනා සෙමින් චලනය වන තොගයක් ද නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමාගමේ අවශ්‍යතාවය අනුව මිලදී ගැනීම් කිරීමටත් මනා තොග පාලනයක් පවත්වා ගැනීමටත් කටයුතු කල යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි සුදසු පියවර ගැනිමට කටයුතු කරන බව දන්වා ඇත. | මෙම තොග සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන නොමැත. |
| (ප) | අතුරු අග්‍රිමයක් දෙන ලද කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවද 2019 ජනවාරි 01 දින සිට 2021 සැප්තැම්බර් 30 දක්වා අවස්ථා 14 කදී නිකුත් කරන ලද එකතුව රු.231,980 ක් වූ අත්තිකාරම් ද විවිධ සැපයුම් හා සේවාවන් සඳහා 2012 වර්ෂයේ සිට 2021 සැප්තැම්බර් දක්වා අවස්ථා 55 කදී බාහිර ආයතන වෙත ලබාදී තිබූ එකතුව රු.4,423,277 ක අත්තිකාරම් ද 2021 නොවැම්බර් විගණිත දින වන විටත් පියවා නොතිබුණි. | අත්තිකාරම් ලබා ගත් නිලධාරින්ගෙන් අදාල අත්තිකාරම් නොපියවීම් සම්බන්ධයෙන් ලිඛිතව කරුණු විමසීම සහ කඩිනමින් අත්තිකාරම් පියවා ගැනිම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය. | භාණ්ඩ හා සේවා වෙනුවෙන් ලබාදෙනු ලබන අත්තිකාරම් පියවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ නව චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත් ඒ අනුව අත්තිකාරම් ලබාදීම හා පියවීම නිවැරදිව සිදු කිරීමට එකඟ වන බවත් දන්වා ඇත. | තවදුරටත් නිරවුල් නොවූ දීර්ඝකාලීන අත්තිකාරම් පවතී. |
| (බ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව සමාගම වෙනුවෙන් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා වූ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා 2020 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට පියවර ගෙන නොමැත. | අදාල සැලසුම් සකස් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය වෙනුවෙන් වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව දැක්වෙන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි. | | | |
| (ම) | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. ඉහත පරිදි වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සමාගම විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබද එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය"ට අනුකූලව ආයතනය විසින් කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත. | මේ සම්බන්ධයෙන් පියවර ගෙන නොමැත. |
| (ය) | 2017 වර්ෂයේදි සමාගමේ සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, මූල්‍ය හා ක්‍රියාවලි අධීක්ෂණ කළමනාකාර, ජ්‍යෝෂ්ඨ පිරියත කළමනාකාර, රසායනඥ හා විකුණුම් කළමනාකාර යන ජ්‍යෝෂ්ඨ කළමනාකරුවන්ගේ නිර්දේශයකට අනුව ලූණු හිඟයක් පවතින නිසා බාහිර පාර්ශවයකගෙන් ලූණු මිලදී | අවශ්‍යතාවන් නිසියකාරයෙන් හඳුනාගෙන තොග මිලදී ගැනීමටත්, ඒවා නිවැරදිව කළමනාකරණය කිරීමටත් පියවර ගත යුතුය. | 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පරීක්ෂණ මණ්ඩලයක් පත්කර වාර්තාවක් සකස්කර දෙන ලෙස උපදෙස් ලබාදී ඇත | මෙම තොගයෙන් පිරිවැය රු.90,529,003 ක් වූ ලූණු තොග මෙ.ටොන් 4,562 ක් ලූණු නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලාවට නිකුත් කර ඇති අතර පිරිවැය |

ගැනීමට යෝජනාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. එවකට සමාගම සතුව පැවති ලුණු තොගය, ඉදිරි වෙළඳපොළ අවශ්‍යතාවය, කාලගුණික තත්ත්වය ඇතුලු නිෂ්පාදන ගැටළු, ලුණු මිල ගණන් ආදී කරුණු සැලකිල්ලට ගෙන ලුණු හිඟය පිළිබඳව සහ එම තොග ලබා නොගැනීමෙන් සමාගමට සිදුවන බලපෑම පිළිබඳ විශ්ලේෂණ වාර්තාවක් අදාල නිලධාරීන් විසින් සකස්කර තිබූ බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද එම කරුණු පිළිබඳව සැලකිල්ලට ගැනීමෙන් තොරව අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නියෝජ්‍ය සභාපතිට බලය පවරා තිබුණි. මේ අනුව 2017 වර්ෂය තුළ අවස්ථා 4කදී රු.මිලියන 268.64 ක් ගෙවා ලුණු මෙට්‍රික් ටොන් 13,515 ක් සමාගම විසින් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද රසායනාගාර පරික්ෂණ අනුව තත්ත්වයෙන් බාල බවට තහවුරුවී තිබූ මෙම තොගය විකිණීමට නොහැකිව පැවති අතර 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 141.59 ක් වූ ලුණු මෙට්‍රික් ටොන් 7,136 ක් ඉතිරිව පැවතුණි. 2019 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදි මෙම ඉතිරිව පැවති ලුණු තොගය මෙට්‍රික් ටොන් 1 ක් රු.6,177 බැගින් රු.44,076,734ක් ලෙස අගය කර දක්වා තිබූ අතර ඒ අනුව තොග හානිකරණය රු.මිලියන


රු.38,948,146 ක් වූ ලුණු මෙ.ටොන් 6,391 රු.29,590,139 කට විකුණා ඇත.පිරිවැය රු.41,638,458 ක් වූ ලුණු තොග මෙ.ටොන් 2,584 ක ඌනතාවයක් හඳුනාගෙන ඇති අතර රු.97,521,853 ක් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමේ දි අඩු කර ඇත. ඒ අනුව මෙම ලුණු තොගය මිලදී ගැනීමෙන් සමාගමට මූල්‍ය අලාභයක් සිදුව ඇත.

| | | | | |
|---|---|---|---|---|
| | 117.62 ක් ලෙස හඳුනා ගෙන තිබුණි. එසේ වුවද මෙම ලුණු තොගය හේතුවෙන් සමාගමට සිදුවන පාඩුව අයකර ගැනීම සඳහා ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව කටයුතු කිරීමට 2020 අගෝස්තු අවසන් වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාගම විසින් ගෙන නොතිබුණි. | | | |
| (ර) | සමාගම විසින් මූල්‍ය කළමනාකරු, අභ්‍යන්තර විගණක හා ප්‍රසම්පාදන සහ සැපයුම් කළමනාකරු යන තනතුරුවලට නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ 2020 දෙසැම්බර් 04 වන දින පවත්වා තිබූ අතර, 2020 දෙසැම්බර් 22 හා 24 දිනයන්හිදී තෝරාගත් නිලධාරීන් සඳහා පත්වීම් ලිපි නිකුත්කර තිබුණි. සමාගමේ කාර්ය මණ්ඩල තනතුරුවලට අදාල පත්වීම් බලධාරියා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වුවද, මෙම පත්වීම්වලට අදාල අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය 2021 දෙසැම්බර් 23 දින, එනම් පත්වීම් ලබාදී වර්ෂයක කාලයක් ගතවීමෙන් පසුව ලබාදී තිබුණි. ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා දීර්ඝ කාලයක් ගතවීමත් එම පත්වීම් විධිමත් අයුරින් සිදු නොකිරීමත් මඟින් එම අංශවල කටයුතු නිසි ලෙස ඉටුකිරීමට අහිතකර බලපෑම් ඇතිකරන බව නිරීක්ෂණය කෙරේ. තවද, උක්ත | අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අසාමාන්‍ය කාලයක් නොගත යුතු වීම, එම පත්වීම් විධිමත් පරිදි සහ විනිවිදභාවයකින් යුත්තව සිදු කල යුතු විම සහ විගණනය සඳහා අවශ්‍ය ලිඛිත තොරතුරු ලබා දිම සහ ලබා නොදීම සම්බන්ධයෙන් සොයා බැලීම කළමනාකරණයේ වගකීම වන බව. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් පසුව ලබාගෙන ඇත. | කාර්ය මණ්ඩලය සඳහා විධිමත් අනුමැතීන් ලබා ගෙන නොමැති අතර, සමාගමෙහි බඳවා ගැනීම් හා පුරප්පාඩු පිරවීම් සම්බන්ධව දිගින් දිගටම ගැටළුකාරී තත්ත්වයන් නිරීක්ෂණය කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | තනතුරුවලට අදාල සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගත් ලකුණු ඇතුළු සම්මුඛ පරීක්ෂණ ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොවූයෙන් අදාළ පත්වීම් විනිවිදභාවයකින් යුක්තව සිදුකරන ලද්දේද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය. | | | |
| (ල) | 2020 වර්ෂයේදී සමාගම විසින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම්, ක්‍රියාත්මක කරන කාල රාමුව හා එම ක්‍රියාකාරකම් වල අපේක්ෂිත නිමැවුම් සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක දැක්වෙන ලෙස 2020 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගමේ අපේක්ෂිත කාර්යභාරයන් අනුව එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කිරිම කලමනාකරනයේ වගකිම වන බව. | ඉදිරියේ දී විධිමත් පරිදි සකස් කිරිමට අවශ්‍ය පියවර ගන්නා බව දක්වා ඇත. | 2021 වර්ෂය සඳහා ද සකස් කර නොමැත. |

## 4.60 සීමාසහිත දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 67,769,778 | 52,651,915 | 130,321,946 | 12,751,153 | 15,117,863 | තත්ත්වාගණනය කල |
| **2019** | 73,388,537 | 57,676,699 | 139,394,473 | 7,273,986 | 15,711,838 | තත්ත්වාගණනය කල |
| **2020** | මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 67.77 | 52.65 | 130.32 | 12.75 | 15.12 |
| 2019 | 73.39 | 57.68 | 139.39 | 7.27 | 15.71 |
| 2020 | - | - | - | - | - |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය 2018 දෙසැම්බර් 19 සිට 25 දක්වා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා අධ්‍යයන චාරිකාවක් සංවිධානය කර තිබූ අතර වෙන්කරවා ගත් ගුවන් ටිකට්පත් සඳහා රු. 243,228 ක මුදලක් ගෙවා | ගෙවීම් කළ යුත්තේ අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසුව පමණි. | පැහැදිලි කිරීම් ලබා දුන්නද කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ගුවන් ටිකට්පත් සඳහා ගෙවන ලද මුදල ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස ඉතිරිව ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | ඇත. කෙසේ වෙතත්, සභාපතිවරයාගේ අනුමැතිය නොලැබීම හේතුවෙන් සමාගම විසින් සංචාරය අවලංගු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගුවන් ටිකට්පත් වෙන්කරවා ගැනීම සඳහා දරන ලද වියදම ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස හඳුනා ගැනේ. | | | |
| (ආ) | ආහාර සැපයුම් සේවාව ලබා ගැනීම සඳහා සමාගම විසින් පෞද්ගලික ආයතනයකට රු. 9,620,390 ක මුදලක් ගෙවා ඇති අතර, ආහාර සැපයුම් සේවාව තෝරා ගැනීමේදී මේ සම්බන්ධයෙන් වූ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොමැති බව නිරීක්ෂණය විය. | ආහාර සැපයුම් සේවා සඳහා සැපයුම්කරුවෙකු තෝරාගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය | කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය නොසලකා ආහාර සැපයීමේ සේවාව එකම සේවා සපයන්නාගෙන් ලබා ගනී. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තියට අනුකූල නොවෙමින්, 2018 සහ 2019 වසර තුළ පිළිවෙලින් රු.575,512 ක් සහ රු.632,539 ක් දිරි දීමනා ලෙස සමාගම විසින් ගෙවා තිබුණි. | අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු දිරි දීමනා ගෙවිය යුතුය. | ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අවශ්‍ය අනුමැතියෙන් තොරව ගෙවීම සිදු කර ඇත. නමුත් 2021.11.16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් දිරි දීමනා යෝජනා ක්‍රමය සඳහා එවැනි අනුමැතියක් ලබා ගැනීමෙන් දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය නිදහස් කර තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 වගන්තියට අනුව අවම වශයෙන් වසර 3ක කාලයක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් ආයතනය විසින් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කල යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. |

## 4.61 සීමාසහිත ඇල්කඩුව වැවිලි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 423,507,872 | 457,130,131 | 1,203,985,035 | 656,988,376 | (33,622,258) | අහිතකර |
| **2019** | 394,076,557 | 454,602,829 | 1,210,019,400 | 806,382,601 | (60,526,270) | තීරණය කර නැත |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ වතු හා ප්‍රධාන කාර්යයාලය අතර සිදුවන ගණුදෙනු සටහන් කිරීම සඳහා ප්‍රධාන කාර්යාලය හා එකිනෙක වතු මගින් පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම් ශේෂ හිලව් විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන | පාලන ගිණුම්වල ශේෂයන් අතර වෙනස හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | පාලන ගිණුම්වල ශේෂයන් අතර වෙනස හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | සැසඳීමෙන් පසුව වෙනස රු.4,173,530 දක්වා අඩු කර ඇත. මෙම ශේෂය 2021 ගිණුම් සමඟ සැසඳේ. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන පාලන ගිණුම්වල රු.299,934,257ක හර ශේෂයක් හා වතු පාලන ගිණුම් අනුව රු.327,247,677ක හර ශේෂයක් පැවතීම හේතුවෙන් එම ගිණුම් අතර රු.27,313,240ක වෙනසක් පැවතුනි. | | | |
| (ආ) | සමාගම විසින් සිදුකල ගණුදෙනුවලට අදාලව වර්ෂ 03 ඉක්ම වූ රු.87,385,616 ක ලැබිය යුතු වෙළඳ හා අනෙකුත් ගිණුම් ශේෂ අයකරගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතුකර නොතිබුණි. | ලැබිය යුතු වෙළඳ හා අනෙකුත් ශේෂඅයකර ගැනීමට කටයුතු කල යුතුය. | ලැබිය යුතු වෙළඳ සහ අනෙකුත් ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර ඇත. | බොහෝ ශේෂයන් 2021/12/31 වන විට සහ තොරතුරු නොමැතිකම හේතුවෙන් නිරවුල් නොවී පවතී. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තියට අනුව වැඩ බැලීමේ පත්වීමක් ලබාදියයුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික පදනමකින් වුවද, සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා නිත්‍ය පදනමින් නිළධාරියකු පත් නොකර, වැඩ බැලීමට හා තාවකාලික පදනම මත නිළධාරීන් 03 දෙනෙකු 2011 වර්ෂයේ සිට පත්කර තිබුණි. | සාමාන්‍යාධිකාරී තනතුරට ස්ථිර නිලධාරියෙක් පත් කළ යුතුයි. | ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීමටත්, එය අනුමත වූ වහාම ස්ථිර තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමටත් කටයුතු යොදා ඇත. | පුරප්පාඩුව පිරවීම සඳහා, අයදුම්පත් කැඳවනු ලැබූ නමුත් වෙළඳපල වැටුප් පරිමානය සහ අනුමත පරිමානය අතර වැටුප් විෂමතා හේතුවෙන් තනතුර සඳහා පත්කිරීම් සිදුකිරීමට නොහැකි විය. බඳවා ගැනීමේ පටිපාටිය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර මේ වන විට එය අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1980 අංක 46 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ II වන කොටසේ 16(I) වගන්තිය හා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 15 වන වගන්තිය අනුව සේවා යෝජක විසින් තම සේවකයාගේ මුළු ඉපයුම් වලට අදාලව දායක මුදල් ගණනය කර ඊලඟ මාසයෙහි අවසන් දින හෝ ඊට පෙර අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු වුවත්, 2002 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නොගෙවූ රු.9,284,933 ක් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් වගකීම් ද, රු.113,681,008 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් වගකීම්ද, වතු සේවකයිනගේ අර්ථසාධක අරමුදලට රු.5,828,972 ක්ද, ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක අරමුදලට රු.8,370,625 ක් සමාලෝචිත වර්ෂය අවසන් දින දක්වා ගෙවීමට කටයුතු කර නොතිබුණි. | සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ සඳහන් පරිදි දායක මුදල් කාලීනව ගෙවීමට කටයුතු කල යුතුය | වර්තමාන කාලපරිච්ඡේදයට අදාළ වගකීම් පියවීමට කටයුතු කරන අතර හිඟ මුදල් ඉදිරි කාලය තුළ පියවනු ඇත. | හිඟ මුදල් නිරවුල් කර නොතිබුණි. |
| (ඉ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 5(I) වගන්තිය අනුව, යම් සේවකයකු සේවය අවසන් කිරීමේ දින සිට දින 30ක කාලයක් ඇතුළත පාරිතෝෂික ගෙවිය යුතු වුවත්, 1992 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු.116,127,708 ක ගෙවිය යුතු පාරිතෝෂික වගකීම් පියවීමට කටයුතු කර නොතිබුණි. | පාරිතෝෂික ගෙවීම් පනතේ සඳහන් නියමයන් අනුව ගෙවීම් කාලීනව සිදුකල යුතුය | විශ්‍රාම යාම සහ සේවකයින්ගේ අවශ්‍යතා සහ පවතින මුදල් ප්‍රවාහයන් අනුව ගෙවීම් පියවීමට කටයුතු සම්පාදනය කෙරේ. | 2021/12/31 වන විටත් හිඟ මුදල් පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 වැනි ඡේදය උල්ලංඝනය කරමින්, අදාළ වරප්‍රසාද හිමි නොවන MM 1-1 වැටුප් පරිමාණයේ සමාගමේ ස්ථිර නිලධාරීන් දෙදෙනකුට රු.1,910,000ක ප්‍රවාහන දීමනාවක් ගෙවා ඇති අතර 2019 වර්ෂයේදී තාවකාලික පදනමින් බඳවාගත් තවත් නිලධාරීන් දෙදෙනෙකුට රු.1,729,679ක් ප්‍රවාහන දීමනාවක් සහ ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. MM 1-1 වැටුප් පරිමාණයේ වතු අධිකාරීවරයෙකුට ද රු.1,260,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. | රජයේ චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුයි. | එම ගෙවීම් / දීමනා සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. එම වෙනස්කම් ඇතුළත් වන පරිදි සමාගමේ බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කරනු ලැබේ. | බඳවා ගැනීමේ පටිපාටිය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර මේ වන විට එය අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. |
| (උ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය උල්ලංඝනය කරමින්, සමාගමේ නිලධාරීන්ට 2019 වර්ෂය සඳහා ගෙවන ලද වැටුප්වලට අමතරව විශේෂ දීමනාව, විනෝදාත්මක දීමනාව, තාවකාලික දීමනාව, අතුරු දීමනාව සහ වැඩ බලන දීමනාව ලෙස අනුමත නොකළ එකතුව රු.331,980ක් වූ දීමනා ගෙවා තිබුණි. | දැනටමත් සිදු කර ඇති අනුමත නොකළ ගෙවීම් නීති විරෝධී ක්‍රියාවක් ලෙස සැලකිය යුතුය. | මෙය සමාගම යෝජිත (නව) බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් කරනු ඇත. | ගෙවීම් දිගටම කරගෙන යාමට හා යෝජිත (නව) බඳවා ගැනීමේ පටිපාටිය සකස් කිරීමේදී අදාළ සේවකයාගේ වැටුපට එම දීමනා ඇතුළත් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය කටයුතු කරනු ඇත.<br>බඳවා ගැනීමේ පටිපාටිය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර මේ වන විට එය අනුමැතිය සඳහා අමාත්‍යාංශය |

| | | | | |
|---|---|---|---|---|
| | | | | වෙත ඉදිරිපත් කර ඇත. |
| (ඍ) | සමාගම ස්ථාපිත කරන අවස්ථාවේදී ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් කල්බදු පදනම මත ලද හෙක්ටයාර් 1.8 ක භූමියක පිහිටි ගොඩනැගිල්ලක් 1996 ජූලි 25 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල තීරණයක් අනුව රු.1,756,912 ක වන්දි මුදලක් ලබා ගැනීමේ එකඟතාවය මත ආරක්ෂක අමාත්‍යාංශයට ලබාදී තිබුණද, අදාල වන්දි මුදල 2018 වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් නිදහස් කිරීමට අදාළ වන්දි මුදල ලබා ගැනීමට සමාගම කටයුතු කළ යුතුය. | ඉඩම සඳහා වන්දි ලබා ගැනීමට නඩු පැවරීමේ ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය. | මෙතෙක් වන්දි ලබාගෙන නොතිබුණි. |
| (එ) | සමාගම සතු හෙක්ටයාර් 4.25 ක ඉඩමක් පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා රු.4,700,000 ක වන්දි මුදලක් ලබා ගැනීමේ එකඟතාවය මත ලබා දී තිබුණද, අදාල වන්දි මුදල 2018 වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් නිදහස් කිරීමට අදාළ වන්දි මුදල ලබා ගැනීමට සමාගම කටයුතු කළ යුතුය. | ඉඩම සඳහා වන්දි ලබා ගැනීමට නඩු පැවරීමේ ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය. | මෙතෙක් වන්දි ලබාගෙන නොතිබුණි. |
| (ඒ) | සමාගම විසින් ශක්‍යතා අධ්‍යනයක් කර පොල් වගාව සඳහා සුදුසු භූමියක් හා පරිසර සාධක අනුව පොල් වගාවන් ආරම්භකිරීම වෙනුවට පොල් වගාව සඳහා සුදුසු භූමියක් නොමැතිව රත්වත්ත වතුයායෙහි 2007 වර්ෂයේ හෙක්ටයාර් 10 ක පොල් වගාවක් ආරම්භකර ඒ සඳහා රු.6,396,615 ක පිරිවැයක් දරා තිබු නමුත්, අදාල වගාව සමාලෝචිත | නව වගාවන් ආරම්භ කිරීමට පෙර පාංශු යෝග්‍යතාවය සහ වගාවේ ශක්‍යතාව පරීක්ෂා කර බැලීමෙන් පොල් වගාව ආරම්භ කළ යුතුය. | වගාව ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් ක්‍රියාත්මක කරන ලදී. | මේ වන විට වගාවන් ආරම්භ කිරීමට පෙර වගා ව්‍යාපෘතිවල ශක්‍යතා කළමනාකරණය විසින් අධ්‍යනය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂය අවසන් වන විට සම්පූර්ණයෙන්ම අසාර්ථක වී තිබුණි. | | | |
| (ඔ) | සමාගමේ මානව සම්පත් කළමණාකරු තනතුර සඳහා පැවතිය යුතු අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවා තිබූ නමුත්, එම සුසුසුකම් සපුරා නොමැති නිළධාරියකු කොන්ත්‍රාත් පදනම මත මානව සම්පත් කළමණාකරු තනතුර සඳහා 2019 වර්ෂයේදී බඳවාගෙන තිබුණි. | අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, අනුමත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින්ගෙන් වඩාත් සුදුසු අපේක්ෂකයා තෝරා ගත යුතුය. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සුසුසුකම් සපුරා නොමැති නිලධාරියා තවමත් මානව සම්පත් කළමනාකරු ලෙස කටයුතු කරයි. |
| (ඕ) | 2018 ජනවාරි සහ 2019 මැයි කාල සීමාව අතරතුර සමාගමේ සභාපතිවරයාගේ භාවිතය සඳහා විවිධ පුද්ගලයන්ගෙන් සහ ආයතනවලින් වාහන හයක් කුලියට ලබාගෙන ඇත. ඒ සඳහා රු. 2,601,726 ක මුළු කුලී මුදලක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කරන ලදී. | | | |
| | (i) 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 3.4 මාර්ගෝපදේශ ප්‍රකාරව මිල ගණන් කැඳවා නොතිබුණි.. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය නොකළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| | (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 8.9.1 (අ) මාර්ගෝපදේශයට අනුව නීතිමය ගිවිසුම්වලට එළඹී නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (iii) එම වාහන සඳහා මාසික ධාවන සටහන් සහ මාසික සාරාංශ පවත්වා ගෙන නොතිබීම නිසා වාහන සඳහා වැය වූ රු.993,022 ක ඉන්ධන වියදම පිළිබඳව පරීක්‍ෂා කිරීමට නොහැකි විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු අතර, ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස් කර විගණනයට ඉදිරිපත් කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (iv). කුලියට ගත් සමස්ත වාහනවල සාමාන්‍ය ධාවන පිරිවැය කිලෝ මීටරයකට රු.133 ක් වූ අතර එය වෙළඳපල මිල ඉක්මවා ගොස් තිබුණි. | සමාගමට හිතකර අවම පිරිවැයක් යටතේ ගනුදෙනු සිදු කරමින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (v). එම වාහන සඳහා ගෙවිය යුතු කුලී මුදල් සම්බන්ධයෙන් වවුචර එක් එක් මාසයේ හිමිකරුවන්ගේ නමට සකස් කර තිබුණි. කෙසේ වෙතත්, රු. 937,401 ක් වූ චෙක්පත් සභාපති, මූල්‍ය කළමනාකරු, මානව සම්පත් කළමනාකරු, තොරතුරු තාක්ෂණ කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවෙකු විසින් මුදල් කර ඇති බව විගණනයේදී තහවුරු විය. එම චෙක්පත් ආදායකයා හැර වෙනත් අයෙකුට මාරුකර ගැනීම සඳහා, මූල්‍ය කළමනාකරු, තොරතුරු තාක්ෂණ කළමණාකරු, සාමාන්‍යාධිකාරීවරයා සහ සභාපතිවරයාගේ නිර්දේශ යටතේ "ආදායකයාගේ ගිණුමට | සමාගමේ සභාපතිවරයා ඇතුළු ඉහළ පෙළේ කළමනාකාරීත්වය සාමූහිකව මුදල් වංචා කර ඇති බැවින් නීතිමය පියවර ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | පමණයි" යන රේඛනය අවලංගු කර ඇති අතර බැංකුව එම නිර්දේශ අනුගමනය කර චෙක්පත් ඉදිරිපත් කළ අයට මුදල් ගෙවා ඇත. ඒ නිසා සමාගමේ වගකිවයුතු නිලධාරීන් ඒ අනුව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය වේ. අදාළ මුදල් සභාපතිවරයා වෙත ලබා දී ඇති බවට ලේඛනගත සාක්ෂි චෙක්පත් මාරු කරන ලද නිලධාරීන් විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. | | | |
| (vi). | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ 2019 ජනවාරි 30 දිනැති ලිපියක් මගින් සභාපතිවරයා පත් කරනු ලැබුවද එම ලිපියේ දිනට පෙර එම 2018 දෙසැම්බර් 17 සිට 2019 ජනවාරි 29 දක්වා කාල සීමාව තුලද සමාගමේ සභාපතිවරයාගේ තත්ත්වයෙන් කටයුතු කර සමාගමේ වතු අධිකාරීවරයෙකුට අයත් අංක 32 ශ්‍රී 4764 දරන වාහනය ඔහුගේ පරිහරණය සඳහා කුලියට ගෙන ඇත. තවද, එම කාලයට අදාළව වාහනය සඳහා කුලිය ලෙස රු. 250,161 ක් ද, ඉන්ධන ලීටර් 615ක් සඳහා රු.60,150ක් ද සමාගම විසින් ගෙවා තිබුණි. මෙම වියදම අධිකාරියකින් තොරව සිදු කර ඇති බව නිරීක්ෂණය වේ. තවද, | අරමුදල් අනිසි ලෙස පරිහරණය කිරීම නිරීක්ෂණය වන බැවින් වගකිව යුතු පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| | වාහනයේ හිමිකරු වන වතු අධිකාරීවරයාට එම කුලී මුදල ලැබී නොමැති බව විගණනයට ලිඛිතව තහවුරු වේ. | | | |
| (ක) | සමාගමට අයත් රත්වත්ත තේ කම්හල 2008 වසරේ සිට පෞද්ගලික සමාගමකට බදු දී ඇත. 2013 වසරේ සිට 2019 වසර අවසානය දක්වා එම සමාගමෙන් අයකරගත යුතු රු.7,468,900 ක බදු මුදල විගණිත දිනය වන 2020 දෙසැම්බර් 31 දින වනතුරුත් අයකරගෙන නොතිබුණි. | හිඟ බදු මුදල කඩිනමින් අයකර ගත යුතුය. | ඇල්කඩුව වැවිලි සමාගම විසින් දේපල අත්පත් කර ගනු ලබන අතර, හිඟ බදු මුදල ලබා ගැනීමට නඩු පැවරීමට අවශ්‍ය වේ. | දේපල අත්පත් කර ගෙන ඇති අතර මේ වන විට බදු මුදල ලබා ගැනීමේ නඩු කටයුතු ආරම්භ කර ඇත. |
| (ග) | ස්ථිර තනතුරක පුරප්පාඩුවක් ඇත්නම් ස්ථිර පත්වීමක් සිදුකරන තුරු අනියම් පදනමින් පත්වීම් නොකළ යුතුය. කෙසේ වෙතත් හදිසි අවශ්‍යතාවයක් මත අනියම් පත්වීමක් සිදුකරන විට හැකි ඉක්මනින් ස්ථිර පත්වීමක් ලබාදීමට කටයුතු කළ යුතුය. මාස 03ක කාලයක් ඇතුළත පුරප්පාඩුව පිරවිය යුතුය. කෙසේ වෙතත්, 2019 ජනවාරි 15 දින සිට කොන්ත්‍රාත් පදනම මත මානව සම්පත් කළමණාකාර තනතුර සඳහා සුදුසුකම් අඩු නිලධාරියෙකු බඳවාගෙන විගණන දිනය වන 2020 දෙසැම්බර් 31 වන දින දක්වා වසර 02 කට වැඩි කාලයක් සේවයේ යොදවාගෙන තිබුණි. | පුරප්පාඩු වන ස්ථිර තනතුරු මාස 03ක කාලයක් තුළ පිරවීමට කටයුතු කළ යුතුය. | විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ච) | සමාගමේ ප්‍රධාන කාර්යාලයේ ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රය 2019 වර්ෂයේදී නිසි පරිදි නඩත්තු කර නොතිබූ අතර, බොහෝ අවස්ථාවලදී | නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රය හරහා සටහන් කළ යුතුය. | කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය යන්ත්‍රයක් මේ වන විට |

| | | | | |
|---|---|---|---|---|
| | පැමිණීමේ ලේඛන පමණක් පවත්වාගෙන ගොස් ඇත. | | | පවත්වාගෙන නොයයි. |
| (ජ) | වසර 05කට වරක් බදු කුලී ප්‍රතිශතය සංශෝධනය කිරීමට අදාළ කොටස් බදු ගිවිසුමට ඇතුළත් නොකර සෙලගම තේ කම්හල 2006 වසරේදී බදු දී ඇත. ඒ අනුව, 2006 වසරේ සිට 2019 වසර අවසානය දක්වා රු.1,430,542 බදු ආදායමක් සමාගමට අහිමි වී තිබුණි | කල්බදු ගිවිසුමට සංශෝධිත වගන්ති ඇතුළත් කිරීමටත් හිඟ බදු මුදල් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | නව මාසික බදු මුදල සකස් කිරීම සඳහා රජයේ තක්සේරු වාර්තාවක් ලබා ගැනීමෙන් පසු බදු ගිවිසුම නිවැරදි කිරීමට වත්මන් කළමනාකාරිත්වය යෝජනා කර ඇත. | ගිවිසුම් සංශෝධනය කර නොතිබුණි. |
| (ට) | වාර්ෂිකව හෙක්ටයාරයකට නිම් තේ කිලෝග්‍රෑම් 550 ට අඩු අස්වැන්නක් ලබා දෙන හෙක්ටයාර 379 ක භූමි ප්‍රමාණයක් විශ්‍රාමිකයන් වන බාහිර වැවිලිකරුවන් සඳහා ලබා දී ඇත. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ දත්තවලට අනුව එම ඉඩම්වලින් නෙළාගත හැකි නිම් තේවල සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 604,856ක් වූ නමුත් 2019 වසරේ බාහිර වැවිලිකරුවන් ලබාදී තිබුණේ එම ප්‍රමාණයෙන් සියයට 8කට සමාන නිම් තේ කිලෝග්‍රෑම් 50,495 ක ප්‍රමාණයෙන් පමණි. | බාහිර වැවිලිකරුවන්ට ලබා දෙනවා වෙනුවට අස්වැන්න වැඩි කිරීමට පියවර ගත යුතුය. | බාහිර වගාකරුවන් ලැයිස්තුගත කර ගැටලුව හඳුනාගෙන ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා ඔවුන් පෙළඹවීම. ඇල්කඩුව වැවිලි සමාගම විසින් කටයුතු පරීක්ෂා කිරීමට සහ බාහිර වගාකරුවන්ගේ තේ ක්ෂේත්‍රවල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීමට කළමනාකරුවන් යොදවා ඇත. | ඇගයීමක් සිදු කර නොතිබුණි. |
| (ඩ) | බර අනුව තිරිවාණා අලෙවි කිරීමට හැකියාව තිබියදී, සමාගම විසින් ප්‍රමාණය අනුව තිරිවාණා අලෙවි කිරීමට තීරණය කිරීම හේතුවෙන් සමාගමට ඉහළ මිලක් ලබාගැනීමට තිබූ අවස්ථාව මගහැරී තිබුණි. තවද, ගිවිසුම පරිදි තිරිවාණා ගල් කියුබ් 01 ක් රු. 13,650 බැගින් මිල දී ගැනීමට ගැණුම්කරු එකඟව පැවතියදී | කොන්ත්‍රාත් මිලට වඩා අඩු මිලට තිරිවානා විකිණීමට අවසර ලබාදී සමාගමට ලබාගත හැකි ආදායමක් අහිමි කල නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | වත්මන් කළමනාකාරිත්වය ගිවිසුමට අනුව තිරිවානා කියුබ් 1ක් සඳහා රු.13,650 ක් ලෙස විකුණුම් මිල නිවැරදි කර ඇත. මෙම ගිවිසුම කල් ඉකුත් වන අතර වත්මන් ගිවිසුම් කාලය | වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව තවමත් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගමේ සාමාන්‍යාධිකාරී (ආවණ) විසින් රු.1,000 බැගින් කියුබ් 104.6 ක් අලෙවි කිරීමට අවසර ලබා දීම හේතුවෙන් සමාගමට රු.1,323,190 ක පාඩුවක් සිදුකර තිබුණි. | | අවසානයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය නව ආයෝජකයින් තෝරා ගැනීමට කටයුතු කරනු ඇත. | |
| (ණ) | සමාගම සතු කර්මාන්තශාලා 06 න් කර්මාන්තශාලා 03 ක් අක්‍රීය තත්වයේ පැවති අතර අක්‍රීය කර්මාන්තශාලා තේ නිෂ්පාදන කටයුතු සඳහා දායක කර ගැනීමට හෝ බඳු දීමට කටයුතු කර නොතිබුණි. | නිෂ්පාදන කටයුතු සඳහා අක්‍රිය කර්මාන්තශාලා දායක කර ගැනීමට හෝ ඒවා බඳු දීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ඇල්කඩුව සහ පිටකන්ද යන කම්හල් දෙකම දිගු කාලයක් තිස්සේ අක්‍රියව පැවතුනි. රු.බිලියන 1ක ප්‍රාග්ධන වියදමක් මෙම කර්මාන්තශාලා නවීකරණය කිරීමට යෙදිය යුතු වේ. සමාගමට එවැනි මුදලතක් ආයෝජනය කිරීමට නොහැකි අතර ආදායම් උත්පාදන ක්‍රියාවලිය සඳහා විකල්ප සොයමින් පවතියි. |
| (ත) | නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කළ හැකිව තිබූ රත්වත්ත තේ කර්මාන්ත ශාලාව 2019 වසරේ ජූලි මාසයේ සිට විගණනය කරන දිනය වන 2020 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙහෙයුම් ආරම්භ කිරීමට හෝ බඳු දීමට කටයුතු කළ යුතුය. | නීතිමය කටයුතු සිදුවෙමින් පවතියි. | තවමත් කර්මාන්ත ශාලාවේ කටයුතු ආරම්භ කර නොමැත. |

## 4.62 සීමාසහිත හලාවත වැවිලි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 436,957,031 | 472,135,727 | 1,305,324,678 | 396,941,839 | (35,178,696) | තත්ත්වාගණනය කල |
| **2019** | 553,045,334 | 489,034,730 | 1,428,470,323 | 464,505,238 | 64,010,604 | තත්ත්වාගණනය කල |
| **2020** | 856,323,535 | 573,223,873 | 1,885,276,761 | 566,620,177 | 283,099,662 | තත්ත්වාගණනය කල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 436.96 | 472.14 | 1,305.32 | 396.94 | (35.18) |
| 2019 | 553.05 | 489.03 | 1,428.47 | 464.51 | 64.01 |
| 2020 | 856.32 | 573.22 | 1,885.28 | 566.62 | 283.10 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | භූමිය පිළිබඳ අධ්‍යයනයකින් තොරව සමාගම විසින් 2013 සහ 2014 වර්ෂවල රු.මිලියන 4.45ක වියදමින් පුත්තලම මංගලඑළිය වතු යායේ හෙක්ටයාර් 18.75 ක භූමි ප්‍රමාණයක ආරම්භ කරන ලද කජු ගස් 3850 කින් සමන්විත වගාවක් 2015 වසර | භෞතිකව නොපවතින වත්කම් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. | අදාළ අගයන් ලියා හැරීමට කමිටුවට වාර්තාවක් ලබා දී ඇති අතර විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් වෙනත් |

| | | | | |
|---|---|---|---|---|
| | වන විට සම්පූර්ණයෙන්ම විනාශ වී තිබූ අතර, ඊට අදාළව ගිණුම්වල ගැලපීම් සිදු නොකර මෙම වියදම 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනීකරණය කර තිබුණි. | | | කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ) | 1992 වර්ෂයේදී සමාගම පිහිටුවීමේදී තිබූ රු. රු.142,502,287ක වටිනාකමින් යුත් හෙක්ටයාර් 5,733 ක භූමි ප්‍රමාණයෙන්, හෙක්ටයාර 187.44ක් 2018 දෙසැම්බර් 31 දින වන විට බාහිර පාර්ශ්වයන් විසින් අත්පත් කරගෙන තිබූ අතර, අදාළ ඉඩම්වල පිඹුරුපත් සමාගම සතුව නොතිබූ බැවින්, අයිතිය පැහැදිලිව ඉදිරිපත් කර අනවසරයෙන් දේපළ අත්පත් කර ගැනීමට එරෙහිව නීතිමය පියවර ගැනීමට කළමනාකාරීත්වය අපොහොසත් වී තිබුණි. | සමාගම සතු නොවන ඉඩම් මිනුම් කර ඒ අනුව සීමා නිර්ණය කළ යුතු අතර අනවසර අත්පත් කර ගැනීම්වලට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. බදු දී ඇති ඉඩම් සම්බන්ධයෙන් ඔප්පු සහ පිඹුරුපත් සකස් කළ යුතුය. | සමාගම ඉඩම් මැනීම සහ බදු ඉඩම් සඳහා පිඹුරුපත් සකස් කරමින් සිටී. | සමාගම විසින් මංගලඑළිය සහ බිංගිරිය ප්‍රදේශයේ වතුවල මැනුම් කටයුතු සිදු කර ඇති අතර අනෙකුත් වතුවල මැනුම් කටයුතු සිදුකරමින් පවතී. |
| (ඇ) | 2009 මැයි 26 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව දීමනා තීරණය කිරීමේදී ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද එසේ නොමැතිව JM සහ ඊට වැඩි වැටුප් කාණ්ඩවල නිලධාරීන් 28 දෙනෙකු සඳහා “සේවක දීමනාව” ලෙස රු.7,740,249ක් 2018 වර්ෂයේදී ගෙවා තිබුණි. | දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත මෙම ගෙවීම තවමත් පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | හලාවත සහ පලුගස්වැව අලෙවි මධ්‍යස්ථාන දෙකේ සහ පලුගස්වැව කජු සැකසුම් මධ්‍යස්ථානයේ භෞතික තොග ශේෂය සහ ලේඛනගත තොග ශේෂය අතර රු.551,581ක් වටිනා නිම් කජු කිලෝග්‍රෑම් 259ක හිඟයක් පැවතුනි. පලුගස්වැව සහ ප්‍රධාන කාර්යාලයේ රු. 76,860 ක් වටිනා පොල්තෙල් බෝතල් 200 ක හිඟයක් 2019 ජූලි 30 දිනට පැවතුණි. 2020 ජූලි 31 දින වන විටත් මෙම හිඟයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | තොග හිඟයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගෙන අදාළ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | සමාගම විසින් මූලික පරීක්ෂණයක් පවත්වා ඇති අතර 2022 පෙබරවාරි මාසය වන විටත් විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට පියවර ගෙන නොමැත. |
| (ඉ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 වැනි ඡේදයේ විධිවිධානවලට පටහැනිව, සමාගම විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සහ මාණ්ඩලික නිලධාරීන් 28 දෙනෙකු සඳහා රු.මිලියන 1.72ක අයවැයගත දීමනා, රු. මිලියන 2.12 ක රියදුරු දීමනා සහ මධ්‍යම මට්ටමේ සහ පහළ මට්ටමේ කළමනාකරුවන් නව දෙනෙකු සඳහා රු.438,934 ක ප්‍රවාහන දීමනා 2019 වර්ෂය තුළ ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. . | අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත මෙම ගෙවීම තවමත් සිදුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | සමාගමට ණය දීමටත් සහ මෙහි සඳහන් සංස්ථා, සමාගම් සහ අමාත්‍යාංශවලට ණය ගැනීමටත් නීත්‍යානුකූල බලයක් නැතත්, සමාගම විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය, ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සහ සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව වෙත 2010 වර්ෂය ලබා දුන් රු. මිලියන 105 ක ණය මුදල, 2019 වසර අවසානයේදී පොළිය සමඟ එකතුව රු. මිලියන 164.5 ක මුළු මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | මෙම ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | අදාළ ආයතන වෙත සිහිකැඳවීම් යවා ඇති අතර 2022 පෙබරවාරි මාසය වන විටත් සමුච්චිත පොලිය පියවා නොමැත. |
| (උ) | පොල් වගාවේ සාමාන්‍යයෙන් අක්කරයක පොල් ගස් සංඛ්‍යාව දළ වශයෙන් 70ක් වන අතර ඒ අනුව හෙක්ටයාරයකට තිබිය යුතු පොල් ගස් සංඛ්‍යාව ගස් 172කි. සමාගම සතු සමස්ත පොල් වගා ප්‍රමාණය හෙක්ටයාර 3,099 ක් වන අතර, ඒ අනුව පැවතිය යුතු මුළු ගස් සංඛ්‍යාව 624,007 කි. කෙසේ වෙතත්, සමාගම විසින් දැනට වගා කර ඇති මුළු පොල් ගස් සංඛ්‍යාව 310,635 කි. මේ අනුව, සාමාන්‍ය සංඛ්‍යාවට වඩා පොල් ගස් 313,372ක් අඩුවෙන් එනම් සියයට 50ක් පොල් ඉඩම ඌන නියෝජනය වන බව නිරීක්ෂණය විය. | පොල් ඉඩම්වල ප්‍රශස්ත පොල් ගස් ප්‍රමාණයක් වගා කර නඩත්තු කළ යුතුය. | සමාගම නැවත සැපයීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන යන අතර වගාවට යටින් 12% ක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණයෙන් නඩත්තු කරනු ලැබේ. | එම ඉඩම ප්‍රශස්ත ලෙස වගා කිරීම සඳහා යොදා ගැනීමට සමාගම විසින් ක්‍රියාමාර්ගයක ගෙන නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ඍ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1 මාර්ගෝපදේශයට අනුව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සකස් කළ යුතු අතර මාස හයකට නොවැඩි කාලසීමාවකදී නිතිපතා යාවත්කාලීන කළ යුතු අතර ඉන් පසුව අදාළ වර්ෂය සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. | සමාගමේ 2022 වසරේ සැලැස්ම ඒ අනුව යාවත්කාලීන කෙරේ. | ගැටලුව නොවිසඳී පවතී. |
| (එ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 5.1.3 වගන්තිය සහ 2014 පෙබරවාරි 11 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 5(2) ඡේදය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන කරන ලද පිටපත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අනුමැතිය සඳහා යොමු කළ යුතු අතර ඉන් අනතුරුව එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට දින 15කට පෙර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපති වෙත යොමු කළ යුතුය. එසේ වුවද, 2018-2022 කාලසීමාවට අදාළ සංයුක්ත සැලැස්ම ප්‍රමාදයක් සහිතව 2021 නොවැම්බර් 30 දින ජාතික විගණන කාර්යාලය වෙත යොමු කර තිබුණි. | සංයුක්ත සැලැස්ම නියමිත කාල සීමාව තුළ අනුමත කර විගණකාධිපති වෙත යොමු කළ යුතුය. | සමාගමේ 2022 වසර සඳහා සැලැස්ම නියමිත කලෙ සීමාව තුල ඉදිරිපත් කරනු ලැබේ | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | 2003 ජූනි 02 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 5.1.2 වගන්තියට අනුව, සංයුක්ත සැලැස්මට ඇතුළත් කළ යුතු පහත කරුණු 2018-2022 සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.<br>(i) ව්‍යාපාරය සඳහා පවතින වත්මන් සම්පත්<br>• ඉඩම් සහ ගොඩනැගිලි<br>• නිෂ්පාදන සහ මෙහෙයුම් පහසුකම්<br>• මානව සම්පත් සහ කළමනාකරණ කුසලතා<br>• තාක්ෂණික දැනුම<br>• වෙළඳපල සහ සැපයුම්කරුවන්<br>(ii) සංවිධාන ව්‍යුහය<br>(iii) සංවිධානයේ ශක්තීන් සහ දුර්වලතා සහ බාහිර තර්ජන සහ අවස්ථා (SWOT විශ්ලේෂණය)<br>ක්‍රියාකාරී සැලැස්ම මගින් සැලසුම් කාල සීමාව තුළ සාක්ෂාත් කර ගත යුතු අරමුණු සහ ඉලක්ක සමඟ කළමනාකරුවන්ගේ වගකීම් පැහැදිලිව හඳුනා ගත හැකි වේ. | සංයුක්ත සැලැස්ම චක්‍රලේඛයට අනුව සකස් කළ යුතුය. | 2022 වර්ෂයේ සැලැස්ම සමඟ සමාගම අදාළ ලියකියවිලි ඉදිරිපත් කරනු ඇත | ගැටලුව නොවිසඳී පවතී. |
| (ඔ) | 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 5(2) ඡේදය ප්‍රකාරව, සංයුක්ත සැලැස්ම මත පදනම්ව ඉදිරි මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වාණිජ කටයුතු ඇතුළත්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර එසේ සකස් කරන ලද | නිවැරදි උපලේඛන ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු කළ යුතුය. | සමාගමේ 2022 වර්ෂයේ සැලැස්ම, අදාළ තොරතුරු සමඟ ඉදිරිපත් කරනු ලැබේ. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රියාකාරී සැලැස්මේ පහත සඳහන් උපලේඛන අඩුපාඩුව ඇති බව නිරීක්ෂණය කරන ලදී.<br>(i) යෝජිත ප්‍රධාන ආයෝජන, ධාරිතාව පුළුල් කිරීම සහ ප්‍රධාන ප්‍රසම්පාදන ඇතුළත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම<br>(ii) මානව සම්පත් සංවර්ධන සැලැස්ම<br>(iii) ණය ආපසු ගෙවීමේ සැලැස්ම | | | |
| (ඕ) | සමාගමට අයත් බිංගිරිය වත්තේ මාරවිල II වැව ප්‍රතිසංස්කරණය කිරීමට හා ඉවත් වන රොන් මඩ කියුබ් 35,000ක් එකකට රු. 1800 බැගින් සමාගමට ගෙවා ඉවත් කිරීම සඳහා 2018 ජනවාරි 11 වැනි දින ගිවිසුමකට එළැඹ තිබුණද, කොන්ත්‍රාත්කරු රොන් මඩ ඉවත් කර ඇතත්, ඊට අදාළ මුදල් අය කර ගැනීමට හෝ රොන් මඩ ඉවත් කිරීම නැවැත්වීමට සමාගම නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඇති කර ගත් ගිවිසුම ප්‍රකාරව ඉවත් කරන ලද රොන් මඩ සඳහා මුදල් අයකර ගැනීමට හෝ රොන් මඩ ඉවත් කිරීම නැවැත්වීමට නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. | සමාගම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නීතිමය කටයුතු සිදු වෙමින් පවතී. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ක) | හලාවත වතුයායට අයත් මාවත ගම වත්තේ අක්කර 40ක පමණ ඉඩමක 2012 වසරේ සිට අනවසර පුද්ගලයින් විසින් කැණීම් සිදුකරන අතර එම අනවසර කැණීම් නතර කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | සමාගම සතු ඉඩම් මැනීම්කර ඒ අනුව වැට මායිම් පවත්වාගෙන යා යුතු අතර, අනවසර අත්පත් කර ගැනීම් සහ ක්‍රියාකාරකම් හෙළිදරව් වන පරිදි වතු අධීක්ෂණය පවත්වා ගත යුතුය. | සමාගම විසින් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර නීතිමය නඩුව ප්‍රගතියේ පවතී. | ගැටලුව නොවිසඳී පවතී. |

## 4.63 සීමාසහිත කුරුණෑගල වැවිලි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 731,419,015 | 510,007,212 | 2,455,590,043 | 468,138,351 | 221,411,803 | තත්ත්වාගණනය කල |
| **2019** | 621,135,627 | 500,964,720 | 2,437,860,149 | 459,015,622 | 120,170,906 | තත්ත්වාගණනය කල |
| **2020** | 750,511,013 | 535,564,262 | 2,801,888,968 | 523,263,772 | 214,946,751 | තත්ත්වාගණනය කල |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | වැවිලි කටයුතු සඳහා සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමට බදු දී ඇති ඉඩම්වලින් රජයේ විවිධ කටයුතු සඳහා මුදා හරින ලද හෙක්ටයාර 1,751ක ඉඩම්වලට අදාළව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු බදු මදල් 2009 වසරේ සිට අත්හිටුවීමට | අදාළ තීරණය සඳහා රේඛීය අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. | සමාගම රේඛීය අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. | 2022 පෙබරවාරි වන විටත් භාණ්ඩාගාරයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගම එළැඹුණු තීරණයට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබුණි. තවද, 2020 වසර අවසානය දක්වා එසේ නොගෙවූ රු.මිලියන 221 ක බදු මුදල් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | | | |
| (ආ) | මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දේපළ, පිරියත සහ උපකරණ යටතේ පෙන්වා ඇති රු. මිලියන 139ක වටිනාකමට කල් බදු ඉඩම්වලට අදාළ සැලසුම් 2020 වර්ෂයේදී සමාගම සතුව නොතිබුණි. එබැවින් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සහ නිරවුල් අයිතිය තහවුරු කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි. | කල් බදු ඉඩම් සම්බන්ධයෙන් සැලසුම් සකස් කළ යුතුය. | සමාගම, ඉඩම් මැනීම සහ බදු ඉඩම් සඳහා සැලසුම් සකස් කරමින් සිටී. | කොට්ඨාශ 87 න් සැලසුම් 70 ක් ලැබී ඇති අතර ඉතිරි කොට්ඨාශ 17 ක මිනුම් කටයුතු සිදුවෙමින් පවතී. |
| (ඇ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 ඡේදය උල්ලංඝනය කරමින්, මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 09 දෙනෙකු සඳහා මසකට රු. 10,000 බැගින් එකතුව රු.මිලියන 1.08 ක ගැලපුම් දීමනාව නමින් දීමනාවක් සහ සහ විධායක මට්ටමේ නිලධාරීන් වෙත රු.1,418,894 ක වෛද්‍ය දීමනාවක් 2020 වර්ෂයේදී ගෙවා ඇත. ඒ සඳහා චක්‍රලේඛය මගින් කිසිදු ප්‍රතිපාදනයක් සපයා නොතිබුණි. | මෙම දීමනා අනුචිත ලෙස සලකා කටයුතු කළ යුතුයි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ගෙවීම් 2021 වර්ෂයේ ද සිදුකරමින් පවතී. |
| (ඈ) | 2009 මැයි 29 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ ඡේදයේ 1 වන ඡේදය උල්ලංඝනය කරමින්, සමාගමේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ | මෙම දීමනා අනුචිත ලෙස සලකා කටයුතු කළ යුතුයි. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම ගෙවීම් 2021 වර්ෂයේ ද සිදුකරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන් සහ මාණ්ඩලික නිලධාරීන් 09 දෙනෙකු සඳහා වතු කම්කරුවන් සේවයට යෙදවීම වෙනුවෙන් ගෙවිය යුතු රු. මිලියන 5.4ක සේවක වැටුප්, සේවකයන් සේවයේ යෙදවීමකින් තොරව මුදල් බවට පරිවර්තනය කළ හැකි සේවක දීමනා ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2020 වර්ෂයේදී අදාළ නිලධාරීන්ට ගෙවා තිබුණි. | | | |
| (ඉ) | 2011 සැප්තැම්බර් 16 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව, සීමාසහිත කුරුණෑගල වැවිලි සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව 268ක් විය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ තත්‍ය සේවක සංඛ්‍යාව 212ක් විය. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ තනතුරු 56 ක පුරප්පාඩු පැවතුණි. | අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීමෙන් පසු පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් කළ යුතුය. | විගණන නිරීක්ෂණය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනුමත සෙවක සංඛ්‍යාව සමාගම විසින් සමාලෝචනය කරමින් සිටියි. |

## 4.64 සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 996,054,982 | 1,049,003,013 | 611,782,270 | 205,826,033 | (52,948,031) | තත්ත්වාගණනය කළ |
| **2019** | 959,715,256 | 916,447,679 | 627,617,237 | 185,787,222 | 43,267,577 | තත්ත්වාගණනය කළ |
| **2020** | 1,202,465,377 | 1,217,610,337 | 618,356,191 | 198,529,380 | (15,144,959) | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 වර්ෂයේදී තේ ඇසුරුම් මධ්‍යස්ථානයක් සඳහා සමාගම විසින් බී.සී.සී. ලංකා සමාගම වෙතින් බදු පදනම මත ලබා ගෙන තිබූ ගොඩනැගිල්ලකට ගෙවිය යුතු කුලී රු. 750,000 ක් ගෙවිය යුතු | බදු පදනම මත ගොඩනැගිලි ලබාගැනීමේදී ආදාළ පාර්ශවයන් සමඟ වලංගු ගිවිසුමකට | කුලී ගිවිසුමක් ඇති කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සමාගම සහ බී.සී.සී. ලංකා සමාගම අතර විධිමත් ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | මුදලක් ලෙස ගිණුම්ගත කර ඇතත්, සමාගම සහ බී සී සී ලංකා සමාගම අතර විධිමත් කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | එළඹීමට කටයුතු කළ යුතුය. | | |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1(vi) ඡේදය අනුව වැඩබැලීමේ පත් කිරීමක් කළයුත්තේ නිත්‍ය පත්කිරීමක් කරන තෙක් තාවකාලික පදනම මත වුවත්, සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සහකාර කළමනාකරු (අලෙවි) තනතුර සඳහා නිත්‍ය පත් කිරීමක් සිදුනොකර 2017 මාර්තු 22 දින සිට නිළධාරියකු වැඩබැලීම සඳහා පත්කර තිබුණි. | අදාළ අනුමැතීන් සහිතව සහකාර කළමනාකරු (අලෙවි) තනතුර සඳහා නිත්‍ය පත්වීමක් ලබාදීමට කටයුතු කළ යුතුය. | වර්තමානය වන විට මෙම තනතුර සඳහා නිත්‍ය පත්වීමක් සිදු කර ඇත. | වර්තමානය වන විට මෙම තනතුර සඳහා නිත්‍ය පත්වීමක් සිදු කර ඇත. ආයතන සංග්‍රහයට පටහැනිව ගෙවන ලද දීමනා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | වෙනත් රාජ්‍ය ආයතනයක කළමණාකරුවකු ලෙස නිත්‍ය තනතුරේ පූර්ණ කාලීනව රාජකාරී සිදුකර එම තනතුරට අදාළ වැටුප් හා දීමනා ලබන නිළධාරියෙකුක සමාගමේ විධායක අධ්‍යක්ෂක ලෙස පත්කර විධායක අධ්‍යක්ෂ දීමනා සහ ඉන්ධන දීමනා ලෙස රු.718,825 ක් 2018/2019 වර්ෂයේදී සමාගම විසින් ගෙවා තිබුණි. | වෙනත් රාජ්‍ය ආයතනයක පූර්ණ කාලීනව සේවය කරනු ලබන නිළධාරියෙකු විධායක අධ්‍යක්ෂක තනතුරට පත් කිරීමත්, පූර්ණ වැටුප් ලබාදීමත් නොකළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම අධ්‍යක්ෂකවරයා 2019 දෙසැම්බර් 01 දින සේවයෙන් ඉල්ලා අස් වී ඇත. චක්‍රලේඛයට පටහැනිව ගෙවන ලද වැටුප් දීමනා අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක පීඊඩී 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, 2016 මූල්‍ය වර්ෂය තුළ දී අලාභ තත්ත්වයක් වාර්තා කර ඇති හා එම අලාභදායී බව 2017 මූල්‍ය වර්ෂය තුළ දී අඩු කර ගැනීමට අපොහොසත් වූ සමාගම්වල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව | නිලධාරීන්ට චක්‍රලේඛය ප්‍රකාර හිමි ප්‍රසාද දීමනා පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | චක්‍රලේඛයට පටහැනිව ගෙවූ ප්‍රසාද දීමනා අයකර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සලකා බලා එක් සේවකයකු සඳහා රු.3,000 බැගින් රු.252,000 ක මුදලක් පමණක් ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකි වුවද එම මුදල ඉක්මවා රු.559,719 ක් හා 2017 මූල්‍ය වර්ෂය සම්බන්ධයෙන්ද ගෙවිය යුතු ප්‍රසාද දීමනා රු.501,000 ක් වුවද අදාළ සීමාව ඉක්මවා රු.1,665,978 ක් ප්‍රසාද දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි. | | | |
| (ඉ) | මැණික්දිවෙල කර්මාන්තශාලාවේ නිෂ්පාදනය ඉහළ නංවා ගැනීමේ අරමුණින් අමු දළු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2018/2019 වර්ෂයේ දී දළු සැපයුම්කරුවන්හට අමු දළු දිරිදීමනා වශයෙන් රු. 2,167,569 ක් ගෙවා තිබුණු අතර එම වැඩසටහන අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු පත්කර තිබුණද ඉකුත් වර්ෂයට සාපේකෂව අමු දළු මිලදී ගැනීම කිලෝග්‍රෑම් 74,540 කින් අඩුවී තිබුණි. ඒ අනුව ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | ඉලක්කගත අරමුණු ඉටු කරගැනීමට හැකි වන අයුරින් කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. | 2019/ 2020 වර්ෂයේ දළු දිරි දීමනා නවතා ඇති අතර උසස් තත්ත්වයෙන් යුතු අමු දළු මිලදී ගැනීමට කලමණාකරීත්වය තීරණය කර ඇත. | උසස් තත්ත්වයෙන් යුතු අමු දළු සපයා ගැනීම සඳහා උපාය මාර්ගික වැඩ පිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි. |
| (ඊ) | හිනිදුම තේ කර්මාන්තශාලාවේ අමු දළු ලබා ගැනීම ඉහළ නංවා ගැනීම සඳහා සමාගම විසින් දළු සැපයුම්කරුවන්ට රු.672,028 ක දිරිදීමනා ගෙවා තිබුණ ද 2018/2019 වර්ෂයේ අමු දළු ලබා ගැනීම 2017/2018 වර්ෂයට සාපේක්ෂව කිලෝග්‍රෑම් 349,704 | දිරිදීමනා ලබාදීමේදී ඒ තුළින් සමාගමේ අපේක්ෂිත අරමුණු ඉටුවන බවට කළමනාකාරිත්වය වගබලාගත යුතුය. | දළු දිරි දීමනා නවතා ඇති අතර උසස් තත්ත්වයෙන් යුතු අමු දළු, වැඩි මිලක් (Enhance Rate) ගෙවා මිලදී ගැනීමට කලමණාකරීත්වය තීරණය කර ඇත. | දිරිදීමනා ගෙවීම තුළින් අපේක්ෂිත පරිදි ප්‍රමාණවත් දළු සපයාගැනීමට හැකි වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කින් පහත වැටී තිබුණ ද, ඒ සඳහා ක්‍රියාමාර්ග කළමනාකාරීත්වය විසින් ගෙන නොතිබුණි. | | | |
| (උ) | 2014 වර්ෂයේදී රු.1,000,000 ට අපහරණය කරන ලද තේ වියලුම් යන්ත්‍රයෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය 2020/2021 වර්ෂය අවසානය දක්වා ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි. | අපහරණය කරනලද තේ වියලුම් යන්ත්‍රයෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත්කළ යුතුය. | මෙම යන්ත්‍රයේ පිරිවැය සොයා ගැනීමට ප්‍රමාණවත් ලිපිලේඛණ නොමැති බැවින් එය ඉවත් කර නොමැති අතර වත්කම් ප්‍රත්‍යාගණනය මෙම වර්ෂයේදී සිදු කර අවසන් බැවින් මෙම වටිනාකම එමගින් නිවැරදි කරනු ඇත. | මේ දක්වා ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. |
| (ඌ) | අංක. KTFL / 1419 /2019 හා 2019 මාර්තු 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සමාගම යටතේ පවතින තේ කර්මාන්තශාලාවල නිෂ්පාදනයේ අඩුපාඩු හඳුනාගැනීම සහ දැනට ලාභ නොලබන තේ කර්මාන්තශාලා ලාභදායී තත්ත්වයකට පත් කිරීමට මෙහෙයුම් උපදේශකවරයෙකු වසරක් සඳහා බඳවා ගෙන තිබුණි. එසේ වුවද රැකියා පිරිවිතරයෙහි සඳහන් තේ දළු ලබා ගැනීම, නිෂ්පාදන ක්‍රියාවලිය, තේ වෙන්දේසිය හා දේශීය හා විදේශීය තේ අළෙවි කටයුතු යනාදි කාර්යයන්හි ප්‍රගතියක් පෙන්වා නොතිබුණු අතර මාස 8 කට පසු අදාළ උපදේශකවරයා සේවයෙන් ඉවත්ව යන අවස්ථාව වන විට ඔහු වෙනුවෙන් රු. 1,602,040ක් වැය කර තිබුණි. | විශේෂිත කාර්යයන් සඳහා බඳවා ගන්නා නිලධාරීන්ගෙන් රැකියා පිරිවිතරයෙහි සඳහන් කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කළයුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත සමාගම විසින් උපදේශකවරයෙකුගේ සේවය ලබාගෙන ඇති අතර ඊට අදාළ ඉල්ලීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. කෙසේ වෙතත්, අනුමැතිය ලැබීමට පෙර උපදේශකවරයා ඉල්ලා අස්වී ඇති බැවින්, 2019 නොවැම්බර් මාසයේ සිට ඔහුගේ සේවය ලබාගෙන නොමැත. | ගිවිසුමට අනුව පවරන ලද කාර්යය ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | තේ මණ්ඩලයේ නිර්ණායක අනුව යෙදවූ අමු තේ දළු කිලෝ ග්‍රෑම් 100 කින් අවම වශයෙන් නිමි තේ කිලෝ ග්‍රෑම් 21.5 ක නිෂ්පාදන මට්ටමක් පවත්වාගත යුතු නමුත් 2019/2020 වර්ෂය තුළ සමාගමට අයත් තේ කම්හල් 04 හි නිෂ්පාදනය එම මට්ටමට ළඟා වී නොතිබීම හේතුවෙන් අමු තේ දළු මත රු.24,101,145 ක් අනාර්ථිකව වැය කර තිබුණි. එසේම 2019/2020 වර්ෂයේදී ගුණාත්මක බවින් ඉහළ අමු තේ දළු ලබාගැනීම සඳහා සුපිරි දළු සංකල්පය යටතේ රු.1,566,580 ක් වැයකර තිබුණද අපේක්ෂිත අරමුණ ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | තේ මණ්ඩලයේ නිර්ණායකයන්ට අනුව නිෂ්පාදන මට්ටම පවත්වා ගැනීමටත්, නිමි තේ අඩු වීමට බලපාන වෙනත් හේතු පවතීද යන්න පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. | පවත්නා නිර්ණායකයන්ට අනුව නිෂ්පාදන මට්ටම පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉහළ මිලක් යටතේ කම්හල් වල ධාරිතාවයට සරිලන තේ දළු ලබා ගැනීමට හැකි වුවද නියමිත නිමි තේ ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකිව තිබුණි. |
| (ඒ) | සමාගමට අයත් තේ කර්මාන්තශාලා 2019/2020 වර්ෂයේදී නිෂ්පාදන ධාරිතාවයට වඩා පහළ මට්ටමක ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වූ අතර හිනිදුම හා මැණික්දිවෙල කර්මාන්තශාලා පිළිවෙලින් සියයට 71 හා සියයට 72 ක ඌන උපයෝජන මට්ටමක පැවතුණි. හිනිදුම හා දැරංගල තේ කර්මාන්තශාලා සඳහා තේ දළු සැපයුම ඉහළ නංවා ගැනීමේ අරමුණින් සමාලෝචිත වර්ෂයේ දී දළු සැපයුම්කරුවන්ට අමු දළු සඳහා දිරිදීමනා ලෙස පිළිවෙලින් රු.1,531,453 ක් හා රු.1,543,417 ක් ගෙවා තිබුණද අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | කර්මාන්තශාලාවන්හි පවත්නා නිෂ්පාදන ධාරිතාවය භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | පෞද්ගලික තේ කර්මාන්තශාලා සමඟ තරඟකිරීම අසීරුවීම නිසා මුළු ධාරිතාවය උපයෝගී කරගැනීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | දේශීය අලෙවි ආදායම වර්ධනය කරගැනීමේ අරමුණින් 2019 අප්‍රේල් මාසයේදී ''නුවරඑළිය වසන්ත උදානය'' සැණකෙළිය හා අනෙකුත් වෙළඳ ප්‍රදර්ශන වෙනුවෙන් රු.966,860 ක් වැය කර තිබුණි. එසේ වුවද 2018/2019 වර්ෂයට සාපේක්ෂව 2019/2020 වර්ෂයේ අලෙවි ආදායම රු.10,577,492 කින් අඩු වී තිබුණි. මෙවැනි වියදම් දැරීම අලෙවි මධ්‍යස්ථානයේ දේශීය තේ විකුණුම් ආදායම වර්ධනය වීමට හේතුවී නොතිබුණි. | ප්‍රවර්ධන වියදම් දැරීමේදී ඵලදායී ප්‍රවර්ධන උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | වෙළඳපොලේ විවිධ සන්නාම යටතේ තේ වර්ග විශාල ප්‍රමාණයක් ඇති බැවින් කළුබෝවිටියන තේ පාරිභෝගිකයින් අතර ප්‍රචලිත කිරීම හා දැනුවත් කිරීම සඳහා වෙළඳ ප්‍රචාරණ වැඩසටහන් දියත් කර ඇත. | වෙළඳ ප්‍රචාරණ වැඩසටහන් දියත් කළද සාපේක්ෂව තේ විකුණුම් ආදායම අඩු වී තිබුණි. |
| (ඕ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2018 වර්ෂය වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් කර ඇති පිරිවැය රු. 240,350,688 ක් වූ පිරියත හා උපකරණ, ලීබඩු හා සවිකිරීම්, කාර්යාල උපකරණ හා මෝටර් වාහන යනාදී වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. | වත්කම් ප්‍රත්‍යාගණනය 2021/2022 මූල්‍ය වර්ෂයේදී සිදු කර අවසන් කරන බැවින් මෙම ඇස්තුමේන්තුගත දෝෂය මෙම මූල්‍ය වර්ෂයේදී නිවැරදි කරන බව දන්වා තිබුණි. | මෙතෙක් නිවැරදි කර නොතිබුණි. |
| (ක) | 1994 වර්ෂයේදී අත්පත් කරගෙන තිබූ එකතුව රු.2,550,000 ක් වූ කළුබෝවිටියාන හා දැරංගල කර්මාන්තශාලා පිහිටි ඉඩම්, ශ්‍රී | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ට අනුකූලව ඉඩම් ප්‍රත්‍යාගණනය | කළුබෝවිටියන හා දැරංගල කර්මාන්තශාලා පිහිටි ඉඩම් සම්බන්ධයෙන් | මේ දක්වා ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව මේ දක්වා ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | කර අගය ගිණුම්ගත කළ යුතුය. | තක්සේරු වාර්තාවක් මෙතෙක් ලබා ගෙන නොතිබුණි. | |
| (ග) | මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පරිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවද, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | කාර්ය පරිපාටි අත්පොතක් කඩිනමින් සකස් කර අදාළ අනුමැතිය ලබාගත යුතුය. | මානව සම්පත් කළමණාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පටිපාටි අත්පොත සකස් කරමින් පවතී. | මානව සම්පත් කළමනාකරණය සඳහා කාර්ය පටිපාටි අත් පොතක් මේ දක්වා පිළියෙල කර නොතිබුණි. |
| (ච) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 14 (1) වගන්තිය ප්‍රකාරව අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනා එකතු කර එම ඉපයීම මත දායක මුදල ගණනය කළ යුතු වුවත්, 2017/18 වර්ෂය දක්වා සමාගම විසින් ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගෙන අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීම හේතුවෙන් 2012/2013 වර්ෂයේ සිට 2017/2018 වර්ෂය දක්වා අර්ථසාධක අරමුදලට බැර කළයුතු හිඟ දායකය රු.1,695,177 ක් වූ අතර ඒ මත ගෙවිය යුතු අධිභාරය රු.847,589 ක් බවත් විගණනයේදී නිරීක්ෂණය වූ අතර සමාගම මේ වියදම වෙනුවෙන් 2020/2021 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 14 (1) වගන්තිය ප්‍රකාරව අර්ථසාධක අරමුදල් දායකය ගණනය කර ගෙවීම් කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි | මේ දක්වා හිඟ දායකය අර්ථසාධක අරමුදලට බැර කර නොතිබුණි. |
| (ජ) | ඉදිරියට කළ ගෙවීම් හා වෙනත් ලැබිය යුතු ශේෂ යටතේ වෙනත් | වගකිවයුතු නිලධාරීන්ගෙන් හෝ | දීර්ඝ කාලීනව පැවත එන ශේෂ බැවින් විගණන | මෙම ලැබිය යුතු ශේෂ මේ දක්වා අයකර |

| | | | | |
|---|---|---|---|---|
| | අත්තිකාරම් වශයෙන් රු.1,408,881 ක් නිරූපනය වන අතර විගණනයට ඉදිරිපත් කරනු ලැබූ උපලේඛනයට අනුව මෙම ශේෂයන් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සිදු වූ ගනුදෙනු මත ඇති වූ ශේෂ විය. දීර්ඝ කාලයක සිට පැවත එන මෙම ශේෂ මතභේදාත්මක අයිතමයන් ලෙස විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | අදාළ ආයතනවලින් අයකර ගත යුතුය | කමිටුව වෙත ඉදිරිපත් කර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | ගෙන හෝ නිරවුල් කර නොතිබුණි. |
| (ට) | පුස්සැල්ල වැවිලි සමාගමට අයත්, ගිරාගම වතුයායෙන් සමාගම වෙත ගෙවිය යුතු මුදලක් නොමැති බව 2019/2020 හා 2020/2021 වර්ෂයන්හී ශේෂ සනාථන ලිපි අනුව දක්වා තිබුණද 2020/2021 මූල්‍ය ප්‍රකාශන තුළ රු. 1,046,771 ක් එම සමාගමෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | ගිරාගම වතුයායේ ශේෂ සනාථන ලිපි අනුව ලැබිය යුතු ශේෂ සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කළ යුතුය. | ගිණුම් නිවැරදි කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ඇති අතර 2021/2022 මූල්‍ය වර්ෂයේදී මෙය නිවැරදි කරනු ලබන බව විගණනයට දන්වා ඇත. | මේ දක්වා නිවැරදි කර නොතිබුණි. |
| (ඩ) | 2003 වර්ෂයේදී බී.සී.සී. ලංකා ලිමිටඩ් සමාගමට රු.10,000,000 ක ණය මුදලක් සියයට 22 ක පොලී අනුපාතිකයක් මත වාරික 12 කින් අයකර ගැනීමේ පදනම මත ලබාදී තිබුණු නමුත් ඉන් කිසිදු වාරිකයක් අයකරගැනීමට නොහැකිවී තිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ණය හා පොලී මුදල රු. 58,382,429 ක් විය. | ණයමුදල හා ඊට අදාළ පොලී මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | බී.සී.සී.ලංකා සමාගම වෙත ලබා දී ඇති ණය මුදල සහ ඊට අදාළ පොලිය සම්බන්ධව සිහි කැඳවීමේ ලිපි නිකුත් කර ඇති අතර 2021 ඔක්තෝබර් 21 වන දින බී.සී.සී ලංකා සමාගම විසින් නිකුත් කරන ලද ලිපියට අනුව බී.සී.සී.ලංකා සමාගමට අයත් ඉඩමෙන් අක්කර 06ක් අධිකරණ අමාත්‍යාංශයට පවරා දීමෙන් අනතුරුව එම සමාගමට හිමි වන්දි මුදල | මේ දක්වා ණය මුදල හෝ පොලී මුදල් අය කර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ලැබීමෙන් පසු ණය මුදල ගෙවීමට අවශ්‍ය කටයුතු කරන බවට දන්වා ඇත. | |
| (ණ) | 2009 වර්ෂයේ සිට පුද්ගලික තේ තැරැව්කාර ආයතනයකින් සමාගමට ලැබිය යුතු රු. 798,461 ක් ඉදිරියට ගෙන එමින් පැවති අතර, එය අයකර ගැනීමට 2022 පෙබරවාරි 28 දක්වාම කටයුතු කර නොතිබුණි. | අදාළ මුදල අයකරගැනීමට හෝ විධිමත් අනුමැතියකින් පොත්වලින් ලියාහැරීමට කටයුතු කළ යුතුය. | මෙම මුදල සම්බන්ධව පැමිණිල්ලක් 2021 දෙසැම්බර් 17 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව වෙත යොමු කළ ද මෙය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විෂයපථයට අයත් නොවන බැවින් නුගේගොඩ විශේෂ අපරාධ විමර්ෂණ අංශය වෙත පැමිණිල්ලක් යොමු කර ගැටලුව විසඳා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට ඵලදායි පියවරක් ගෙන නොතිබුණි. |
| (ත) | වර්ෂ හතරකට වැඩි කාලයක සිට තේ ශක්ති අරමුදලට සහ තවත් පෞද්ගලික සමාගම් දෙකකට ගෙවිය යුතු එකතුව රු. 3,710,375 ක්වූ, චෙක්පත් අවලංගු කිරීම් සහ උපචිත වියදම් යටතේ වූ උපයන විට ගෙවීම් අධිභාර පිළිවෙලින් රු.843,158 ක් හා රු. 59, 344 ක් හා වෙළඳ ණයහිමියන් යටතේ ගෙවියයුතු රු.1,582,797 ක වටිනාකමින් යුතු ශේෂයන් 2020/2021 වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබිණි. | ණය වහා පියවීමට හෝ හිමිකම් තවදුරටත් මතු නොවීමට වග බලා ගනිමින් ආදායම බැර කිරීමට පියවර ගත යුතුය. | දීර්ඝ කාලීනව පැවත එන ශේෂ බැවින් විගණන කමිටුව වෙත ඉදිරිපත් කර නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මෙතෙක් ශේෂයන් නිරවුල් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ද) | සමාගම 2015 වර්ෂයේදී තේ ශක්ති අරමුදලට වාර්ෂිකව සියයට 11 ක පොලී අනුපාතිකයක් මත රු. මිලියන 50 ක ණය මුදලක් ලබා දී තිබූ අතර රු. 59,532,264 ක් වැයකර තේ ශක්ති අරමුදලට අයත් මැණික්දිවෙල ඉඩමේ ගොඩනැගිලි ඉදිකර තිබුණි. අංක අමප/19/0743/117/024 හා 2019 මාර්තු 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීන්දුව ප්‍රකාරව ණය මුදල, අදාළ පොලිය හා සමාගම වැය කරන ලද සංවර්ධන වියදම් වෙනුවෙන් හිනිදුම හා මැණික්දිවෙල කර්මාන්තශාලාවල අයිතිය නීත්‍යානුකූලව මෙම සමාගම වෙත පවරාගැනීමට අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයිතිය පවරාගෙන නොතිබුණු අතර වාර්ෂිකව රු. 5,500,000 ක් බැගින් වූ ලැබිය යුතු පොලි මුදල ද ගිණුම්ගත කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව තේ කර්මාන්තශාලාවල අයිතිය සමාගමට පවරාගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | අමාත්‍යමණ්ඩල තීරණය අනුව මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව අප සමාගම වෙත පැවරුවද ඉඩමේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට විටත් සිදුවෙමින් පවතින අතර මෙම වර්ෂයේදී පවරා ගැනීමට කටයුතු කරනු ඇති බව විගණනයට දන්වා ඇත. | ඉඩම් හි අයිතිය පවරා ගැනීමට හෝ අදාළ ණය මුදල සහ පොලී මුදල ලබා ගැනීමට මේ දක්වා අපොහොසත්ව ඇත.මෙම තත්ත්වය සමාගමේ මූල්‍ය දුෂ්කරතා ඇති වීමටද හේතු වී තිබුණි. |
| (න) | තේ ශක්ති අරමුදල ආරම්භ කරන ලද හිනිදුම හීල්ස් හා මැණික්දිවෙල තේ කර්මාන්තශාලා නිෂ්පාදන කටයුතු කිරීම සඳහා පවරා දෙමින්, මෙම කර්මාන්තශාලා දෙක මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී ලාභදායී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලු කටයුතු සමාගම විසින් සිදු කළ යුතු බව අංක. අමප/19/0743/117/024 හා 2019 මාර්තු 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් දන්වා තිබුණි. 2015 | මහා භාණ්ඩාගාරයට වැය බරක් නොවී අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ලාභදායී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සියලු කටයුතු සමාගම විසින් සිදු කළ යුතුය. | කර්මාන්තශාලා වල ධාරිතාවයට සරිලන ලෙස දළු ලබා ගැනීමට හා උපරිම විකුණුම් සාමාන්‍යයක් රඳවා ගැනීම සඳහා දළු හිමියන් වෙත ඉහල මිලක් ලබාදීම. | දළු හිඟකම හේතුවෙන් වැඩි මිලකට දළු සපයා ගැනීම නිසා අලාභ තත්ත්වයට පත් වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේදි සමාගමට මෙම කර්මාන්තශාලා ලබාදීමෙන් පසු 2020/2021 වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභදායී තත්ත්වයක් පැවති අතර 2020/2021 වර්ෂය අවසානයට සමුච්චිත අලාභය රු.112,475,388 ක් විය. එමෙන්ම දැරංගල තේ කර්මාන්තශාලාවද 2015 වසර සිට සලකා බැලීමේදී අඛණ්ඩව අලාභ ලබමින් පැවතුනි. | | | |
| (ප) | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම පුද්ගලික සැපයුම්කාර සමාගමකින් රු.23,414,275 කට 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලද ජල තාප උත්පාදන යන්ත්‍රයක් සඳහා සැපයුම් කොන්දේසි ප්‍රකාරව සැපයිය යුතු රේඩියේටර් යන්ත්‍ර 02 ක් නොසැපයීම නිසා රු.1,566,002 ක් රඳවාගෙන තිබුණි. මෙසේ තිබියදී ජල තාප උත්පාදන යන්ත්‍රය සවිකිරීමද දෝෂ සහිතව සිදුකර ඇති බැවින් මෙම මුදල නොගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2016 දෙසැම්බර් මස 21 දින තීරණය කර තිබුණද 2020/2021 වර්ෂය අවසානය දක්වා එම ශේෂය නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කළ යුතුය. | 2021/2022 මුල්‍ය වර්ෂයේදී මෙම ගනුදෙනුව සඳහා ගිණුම් නිවැරදි කිරීමට අපේක්ෂා කෙරේ. | නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (බ) | අරමුදල් ආයෝජනයේදී මුදල් අමාත්‍යවරයාගේ සහ අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2021 මාර්තු 31 දිනට සමාගම විසින් රු. 159,454,572 ක් | චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය අනුව අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ | ඉදිරියේදී නියමිත අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

කෙටිකාලීන තැන්පත්වල අනුමැතිය ලබාගත ආයෝජනය කර තිබුණද ඒ අනුව යුතුය. අවශ්‍ය අනුමැතීන් ලබාගෙන නොතිබුණි.

## 4.65 සීමාසහිත ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව

**2018** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත.

**2019** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත.

**2020** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2010 ජූලි 01 දිනැති අංක පීඊ/ජීඊසීඕ/ටීආර්9 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කළ ලිපිය අනුව සී/ස ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන අපනයන සංස්ථාවට නිසි බලධාරියකු එම ලිපියේ දින සිට වසරක කාල සීමාවක් සඳහා පත්කර තිබියදී අදාළ පත්වීම දීර්ඝ කර නොගෙන 2019 වර්ෂය දක්වා නිසි බලධාරියා ලෙස කටයුතු කර තිබුණි. | නිසි බලධාරීගේ වසරක ධූර කාලය ඉකුත් වී ඇති බැවින් වහාම එම තනතුරු දැරීම නීත්‍යානුකූල කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | නිසි බලධාරි තනතුර විධිමත් කිරීම සඳහා 2022 පෙබරවාරි මස මුදල් අමාත්‍යාංශයට ලිපියක් යවා ඇත. |
| (ආ) | රබර් ආශ්‍රිත නිමි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තශාලා ඇති කර කුඩා රබර් වතු හිමියන්ට සහන සැලසීම සඳහා 1999 වර්ෂයේදී හා 2001 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් මෙම සමාගමට ලබාදී තිබූ උප ණය මුදලින් 2019 සැප්තැම්බර් 30 දින වන විට රු. මිලියන 773.34 ක් එදිනට උපචිත පොළිය රු. මිලියන 612.80 ක් අයවීමට ඇති බව භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. | ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව භාණ්ඩ විකිණීම සඳහා වැවිලි අමාත්‍යාංශයේ කමිටුවක් පත්කර ඇත. | ඒ අනුව කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | විසින් 2019 ඔක්තෝබර් 07 දින අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කර තිබුණි. එසේම එම ණය මුදල් පියවීමට ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාව සුදුසු ආයෝජකයෙකුට බදුදීමටත් එහි යන්ත්‍ර සූත්‍ර අලෙවි කිරීමටත් භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් දී ඇතත්, එම උපදෙස් ක්‍රියාත්මක කර ඉහත උප ණය පියවීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඇ) | මාවනැල්ල සෙන්ටේජ්, මාවනැල්ල ටයර් ටියුබ් හා බදුරලිය ක්‍රේප් රබර් යන කර්මාන්තශාලා බදුදීමට අදාළ බදු ගිවිසුම්වල බදු කොන්දේසි අංක 05 හි සඳහන් පරිදි බදු කාල සීමාව ආරම්භයේ සිට සෑම අවුරුදු 05 කට වරක් බදු වාරිකය සියයට 50 කින් වැඩි කළ යුතු විය. ඒ අනුව පළමු අවුරුදු පහ 2017 මාර්තු 12 දිනෙන් අවසන් වී තිබූ නමුත්, ගිවිසුම් ප්‍රකාරව බදු වාරිකය වැඩි නොකිරීම නිසා 2020 මාර්තු 31 දින මාස 36 යි දින 19 ක් සඳහා එම කර්මාන්ත ශාලා තුනෙන් රු. 11,033,847 ක් අඩුවෙන් බදු කුලිය අයකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. | බදු ගිවිසුමට අනුව කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | වාරික වැඩිවීමක් සහ හිඟ මුදල් අයකර ගැනීමක් සිදුවී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | "ඇරෝමා" නැමති පෞද්ගලික සමාගම වෙත බදු දී තිබූ මාවනැල්ල පිහිටි සෙන්ටේජ්/ කුට්ටි රබර් කර්මාන්තශාලාවේ බදු ගිවිසුමේ 5 වන වගන්තියේ බදු ගැණුම්කරුගේ කොන්දේසි ප්‍රකාරව (xi) කොන්දේසිය ප්‍රකාර බදු ගැනුම්කරු විසින් ගොඩනැගිලි හා අනෙකුත් ස්ථිර ඉදිකිරීම්ද ඇතුළුව සියලු අවදානම් සඳහා රක්ෂණය කළ යුතු නමුත්, එසේ කර නොතිබීම හා වත්කම් නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා, | | | |
| (i) | එම කර්මාන්ත ශාලාවේ ප්‍රධාන ගොඩනැගිලි වහලය කඩා වැටී මේ වන විට වසර 02 කට අධික කාලයක් ගත වී ඇතත් එම වහලය නැවත ප්‍රතිසංස්කරණය කර නොතිබුණි. | බදු ගිවිසුම ප්‍රකාරව කර්මාන්තශාලාව හානිවීම ප්‍රතිපූර්ණය කිරීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | වහලය අලුත්වැඩියා කර නොතිබුණි. |
| (ii) | ගොඩනැගිලි වහලය කඩා වැටීම සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදු කර නොතිබුණි | හානියට අදාල පූර්ණ පරීක්ෂණයක් කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (iii) | වහලය කඩා වැටුන 2018 ජූලි සිට 2020 මාර්තු 31 දින වන විටත් මෙම කර්මාන්තශාලාවෙන් අයවිය යුතු රු.13,856,787 ක් | ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අය කර ගැනීමට කටයුතු කල යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටළුව නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| | (රු.659,847*මාස 21) වූ බදු මුදල් අයකරගෙන නොතිබුණි. | | | |
| (ඉ) | සමාගම සතු කර්මාන්තශාලා තුනක් බදු දෙනු ලබන අවස්ථාවේ බදු ගැනුම්කරුවන්ට භාරදුන් වත්කම් පිළිබඳ ලැයිස්තු විගණනය වෙත ඉදිරිපත් නොකිරීම නිසා එම අවස්ථාවේ දී තිබූ වත්කම් පොත්වලින් ඉවත් කර තිබේද යන්න තහවුරු කර ගැනීමට නොහැකිව ඇත. | යාවත්කාලීන කරන ලද නිවැරදි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | වත්කම් ලැයිස්තුවක් විගණනය සඳහා සපයා නොතිබුණි. |
| (ඊ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව සීමාසහිත ලංකා නිෂ්පාදන අපනයන සංස්ථාවේ ආයෝජනය කර තිබූ රු.මිලියන 52 ක ආයෝජනවල වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ආයෝජනවල වත්මන් තත්ත්වය ඉදිරිපත් කර නොතිබුණි. |
| (උ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව ආශ්‍රිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු එකතුව රු.764,957,506 ක් හා එකතුව රු. 56,133,035 ක් වූ වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ සම්බන්ධයෙන් 2019 මාර්තු 31 දිනට අයවිය යුතු ශේෂ පිළිබඳ | ලැබිය යුතු ශේෂ පිළිබද වාර්තා නිසි පරිදි පවත්වා ගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | නියමිත ශේෂය සඳහා කාල විශ්ලේෂණය සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | උපලේඛන, කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ඌ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව පිරිවැය රු.17,357,133 ක් වූ වාහන හා රු.23,530,433 ක් වූ යන්ත්‍ර තක්සේරු කර ආයෝජකයෙකුට විකුණා ඇතත්, තක්සේරු වාර්තා හා මුදල් ලද බවට තහවුරු වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් අපහරණයට අදාළ වාර්තා සුරක්ෂිතව තබාගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | තක්සේරු වාර්තාව සහ අරමුදල් ලැබුණු බව තහවුරු කර නොතිබුණි. |
| (එ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු.1,283,471 ක මුදල් ශේෂය හා රු.3,037,306 ක ස්ථාවර තැන්පතු මුදල් ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනි. | 2011 මාර්තු 31 දිනට වූ අදාළ වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීන වාර්තා පවත්වාගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ශේෂය තහවුරු කිරීම සිදු කර නොතිබුණි. |
| (ඒ) | ඉඩම් ඇපයට තබා මූල්‍ය ආයතනවලින් ලබාගෙන තිබූ රු. 901,610,000 ක දිගුකාලීන ණය, රු.17,185,562 ක් වූ බැංකු අයිරා හා එම ශේෂයන්හි වර්තමාන තත්ත්වයන් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2011 මාර්තු 31 දිනට පැවති වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් යාවත්කාලීන වාර්තා පවත්වාගත යුතුය. | ආයෝජකයන්ගෙන් ලද අත්තිකාරම් මගින් බොරැල්ල මහජන බැංකු ශාඛාවේ තිබූ බැංකු අයිරාව පියවීමට කටයුතු කර ඇත. | දිගුකාලීන ණය පියවීමට ක්‍රියාමාර්ගයක් ගෙන නැත. |
| (ඔ) | 2011 මාර්තු 31 දිනට වූ විගණිත මූල්‍ය ප්‍රකාශනවලට අනුව වෙළඳ හා අනෙකුත් | 2011 මාර්තු 31 දිනට පැවති වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ශේෂය තහවුරු කිරීම සිදු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ගෙවිය යුතු ශේෂය රු.10,768,203 ක්ද ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත හඳුනා නොගත් රු. 17,874,912 ක්ද තහවුරු කර ගැනීමට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොවුණි. | යාවත්කාලීන වාර්තා පවත්වාගත යුතුය. | | |
| (ඕ) | ඇල්පිටිය ෆෝම් රබර් කර්මාන්තශාලාවේ සිදු වූ රු.මිලියන 500 කට ආසන්න රාජ්‍ය මුදල් අවභාවිතයක් පිළිබඳව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ ගොනු කර ඇති නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් අවභාවිතාවයට අදාළව ගෙන ඇති පියවර සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය යාවත්කාලීනව පවත්වාගත යුතුය. | මෙම නඩුව අධිකරණයේ විභාග වෙමින් පවතින බව දක්වා ඇත. | එම නඩුව මෙතෙක් අවසන්ව නොමැත. |

## 4.66 සීමාසහිත ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2,056,190,222 | 3,870,336,141 | 3,821,489,956 | 10,056,468,066 | (1,814,145,920) | තත්ත්වාගණනය කල |
| **2019** | 3,790,122,454 | 5,220,262,153 | 3,844,074,341 | 11,365,617,753 | (1,430,139,698) | තත්ත්වාගණනය කල |
| **2020** | 6,861,029,424 | 6,111,662,414 | 4,258,630,129 | 11,076,284,900 | 749,367,009 | තීරණය කර නැත |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 2,056.19 | 3,870.34 | 3,821.49 | 10,056.47 | (1,814.15) |
| 2019 | 3,790.12 | 5,220.26 | 3,844.07 | 11,365.62 | (1,430.14) |
| 2020 | 6,861.03 | 6,111.66 | 4,258.63 | 11,076.28 | 749.37 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම මූල්‍ය ආයතනවලින් ලබාගත් කල්බදු පහසුකම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු කල්බදු වාරික නොගෙවීම හේතුවෙන් රු.5,812,203 ක අමතර පොලියක් ලෙස ගෙවීමට සිදු විය. | නියමිත දිනට කල්බදු වාරික නොගෙවීම මත විශාල අමතර පොලියක් ගෙවීමට සිදුවීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කළ යුතුය. | වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | නියමිත දිනට කල්බදු වාරික නොගෙවීම හේතුවෙන් 2020/2021 වර්ෂයේ ගෙවා ඇති ලීසිං පොලිය රු.13,875,476 කි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාගමේ අමුද්‍රව්‍ය හා සේවා සැපයුම්කරුවන් වෙත ලබාදී තිබූ වසර 03 ට වඩා පැරණි පිළිවෙලින් රු.3,951,090 ක් හා රු.2,831,338 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වන විටත් පියවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | ලබා දී ඇති අත්තිකාරම් මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. | වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | අත්තිකාරම් ආපසු අය කරගෙන නොතිබුණි. |
| (ඇ) | සමාගමට අඛණ්ඩ පැවැත්මක් ඇතැයි උපකල්පනය කරමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණ ද, සමාගම දිගින් දිගටම අලාභ ලබමින් පැවත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රු.1,430,139,698 ක ශුද්ධ අලාභයක් ලබා තිබූ අතර එදිනට සමුච්චිත අලාභය රු.8,677,402,641 ක් විය. එදිනට සමාගමේ මුළු වත්කම් ඉක්මවූ වගකීම් ප්‍රමාණය රු.7,521,543,411 ක් වී තිබුණි. තවද, සමාගමේ කොටස් ප්‍රාග්ධනය රු.1,011,764,730 ක් වී තිබිය දී කොටස්කාර සමාගම් හා එම සමාගම් සම්බන්ධ වෙනත් සමාගම්වලින් ලබාගෙන ඇති රු.6,092,272,225 ක ණය ඇතුළුව මුළු ණය ප්‍රමාණය රු.8,272,917,286 ක් වීමෙන් ප්‍රාග්ධන ණය තෝලන අනුපාතය සියයට 818 ක් වී තිබූ අතර 2020 මාර්තු 31 දිනට රු.50,633,696 ක බැංකු ශේෂයක් පැවතිය ද, එදිනට සමාගමේ බැංකු අයිරාව රු.62,844,095 ක් වී තිබුණි. මේ | ණය පිරිවැය අවම කර කොටස්කරුවන්ගේ ගිවිසුමේ ඇති කොන්දේසිවලට අනුකූලව සමාගම ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | භාණ්ඩාගාරය මැදිහත් වී සමාගමේ පැවැත්ම සහතික කිරීම සඳහා කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | 2021 මාර්තු 31 දිනට සමුච්චිත පාඩුව රු.7,935,198,192 කි. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අහෝසි වී අවධානමක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය වන අතර සමාගමේ සියයට 51 ක කොටස් හිමිකාරිත්වය ඇති රජය වෙනුවෙන් මෙම කටයුතු අධීක්ෂණය කරනු ලබන මහා භාණ්ඩාගාරය මෙම තත්ත්වය සමාලෝචනය කර එයට අවශ්‍ය ප්‍රතිකාර්මික නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ඇ) | 2009 වර්ෂයේදී සමාගම මහා භාණ්ඩාගාරයත් සමඟ අත්සන් තබන ලද කොටස්කරුවන්ගේ ගිවිසුමේ 18.2.1(10) වගන්තිය සහ 2010 වර්ෂයේදී ගල්ඔය හෝල්ඩින්ස් පුද්ගලික සමාගම සමඟ අත්සන් තබා ඇති කළමනාකරණ ගිවිසුමෙහි 19.1.1(a) වගන්තිය ප්‍රකාරව සමාගම සෑම වර්ෂයකදීම එම වර්ෂය ආරම්භයේදී පවතින අවම භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතයට සමාන ලාභාංශයක් මහා භාණ්ඩාගාරයට ගෙවිය හැකි වන සේ වාර්ෂික බදු පසු ලාභයක් නොලබන්නේ නම් රජයට කොටස්කාර ගිවිසුම අවසන් කිරීමේ හැකියාව පවතින බව දක්වා ඇත. මෙම සමාගම සංස්ථාපනය කළ 2010 වර්ෂයේ සිටම අඛණ්ඩව අලාභ ලබමින් පවත්වාගෙන ගොස් තිබූ අතර ඉහත (ඇ) ඡේදයේ දක්වා ඇති | කොටස්කරුවන්ගේ ගිවිසුම හා කළමනාකරණ ගිවිසුම ප්‍රකාරව මහා භාණ්ඩාගාරයට ලාභාංශ ගෙවීමට හැකි වන ආකාරයට වාර්ෂික බදු පසු ලාභයක් ඉපැයීමට එකඟ වී ඇති බැවින් එම කොන්දේසි උල්ලංඝනය නොකළ යුතුය. | කොටස්කරුවන්ගේ ගිවිසුමේ සහ ලාභාංශ පිළිබඳ කළමනාකරණ ගිවිසුමේ වගන්ති සඳහා සෘජුවම අවධානය යොමු නොකළේය. අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා වැළැක්වීමේ පියවරක් ගෙන ඇති බව විගණනයට තහවුරු කර නොමැත. | කොටස්කරුවන්ගේ ගිවිසුමේ කොන්දේසි සහ කළමනාකරණ ගිවිසුමට අනුව භාණ්ඩාගාරයට කිසිදු ලාභාංශයක් ගෙවා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පරිදි සමාලෝචිත වර්ෂය අවසානයට සමුච්චිත අලාභය රු.8,677,402,641 ක් වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයට 2020 වර්ෂය දක්වාම කිසිදු ලාභාංශයක් ගෙවා නොතිබුණි. මේ අනුව කොටස්කාර ගිවිසුම සහ කළමනාකරණ ගිවිසුම උල්ලංඝනය වීම මඟින් සමාගමේ අඛණ්ඩ පැවැත්ම අහෝසි වීමේ අවදානමක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය කෙරේ. | | | |
| (ඉ) | සමාගම අඛණ්ඩව අලාභ ලබමින් පවත්වා ගෙන ගියද, කොටස්කාර පෞද්ගලික සමාගම් දෙකෙන් සහ එම සමාගම්වල ආශ්‍රිත සමාගම්වලින් සියයට 24 තරම් ඉහළ පොලී අනුපාත යටතේ ණය ලබාගෙන වාර්ෂිකව සැලකිය යුතු මුදලක් පොලී වශයෙන් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 5,220 ක් වූ මුළු වියදමෙන් රු.මිලියන 1,673.6 ක් හෙවත් සියයට 32 ක් එම ආශ්‍රිත සමාගම් සඳහා වූ පොලී වියදම විය. | ඉහළ අනුපාත යටතේ ණය ලබාගෙන සමාගම අළාභදායී තත්ත්වයට පත් කර තිබීම එහි අඛණ්ඩ පැවැත්මට බලපා ඇති බැවින් අසාමාන්‍ය පොලී වියදම අඩු කරගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | රු.මිලියන 2,083.4ක් හෙවත් රු.මිලියන 6,111ක මුළු වියදමෙන් සියයට 34ක් 2020/2021 වර්ෂයේදී එම ආශ්‍රිත සමාගම්වලට ගෙවන ලද පොලී වියදම් විය. |
| (ඊ) | 2020 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.782,388,545 ක තොග, පිරිවැය රු. 3,580,142,292 ක ජංගම නොවන වත්කම් සහ රු රු.3,138,361 ක ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු සම්බන්ධයෙන් භෞතික | ගිණුම් වර්ෂය අවසාන භෞතික සත්‍යාපනයක් සිදු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොග හා වත්කම්වල අගය හා පැවැත්ම සනාථ කරගත යුතුයි. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | සීනි, මොලැසස් සහ කොම්පෝස්ට් තොග හැර අනෙකුත් අයිතම පමණක් 2021 මාර්තු 31 වන දින සත්‍යාපනය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සත්‍යාපනයක් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි. | | | |
| (ල) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 වගන්තියට අනුව, සමාගමේ ශුද්ධ වත්කම් එහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩුවන අවස්ථාවක දින 60 ක් ඇතුළත කොටස්හිමියන්ගේ මහා සභා රැස්වීමක් කැඳවා, පාඩුවල ස්වභාවය හා ප්‍රමාණය, ඊට හේතු වූ කරුණු, වැලැක්වීම සඳහා ගනු ලබන පියවර පිළිබඳව දැනුම් දීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන නමුත් සමාගමේ ශුද්ධ වත්කම් රු.7,521,543,411 ක ඍණ අගයක් දක්වා පහළ ගොස් තිබියදීත් සමාගමේ කළමනාකරණය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සමාගම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | කොටස් හිමියන්ගේ මහා සභා රැස්වීමක් කැඳවා නොතිබුණි. | ගැටළුව නිවැරදි කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ළු) | 2017/20118 වර්ෂයේ සිට 2019/2020 වර්ෂය දක්වා වූ වර්ෂ 03 ක කාලපරිච්ඡේදය සලකා බලන විට හෙක්ටයාරයකට සාමාන්‍ය වාර්ෂික උක් අස්වැන්න පිළිවෙලින් මෙට්‍රික්ටොන් 65, 53 හා 54 ක් වශයෙන් ක්‍රමයෙන් පහළ ගොස් 2017/2018 වර්ෂයට සාපේක්ෂව 2019/2020 වර්ෂය වනවිට මෙට්‍රික්ටොන් 11 කින් පහළ ගොස් තිබුණි. එසේ වුවද, මෙම තත්ත්වය වර්ධනය කර | වාර්ෂික උක්අස්වැන්නේ අඩුවීමට බලපාන සාධක හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදිය යුතුයි. | කාලගුණික තත්ත්වයන්, විවිධ රෝග සහ පළිබෝධකයන්, ජල ප්‍රවාහයේ උච්චාවචනයන් හේතුවෙන් එළිමහන් උක් වගා අංශයේ හෙක්ටයාරයකට අස්වැන්න අඩු වී ඇති අතර වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගත් බවක් වාර්තා වී නොමැත. | 2020/2021 වර්ෂයේ හෙක්ටයාරයකට සාමාන්‍ය වාර්ෂික උක් අස්වැන්න මෙට්‍රික් ටොන් 55 ක් වූ අතර එය වැඩි කිරීමට නිසි ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමට සමාගම අපොහොසත්ව තිබුණි. | | | |
| (එ) | සීනි නිෂ්පාදනයේදී ඉවතලන බැගෑස් ආධාරයෙන් කර්මාන්තශාලාවට අවශ්‍ය බලශක්තිය නිපදවන අතර එය ප්‍රමාණවත් නොවූ පසු ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධවී යන්ත්‍ර ක්‍රියාත්මක කරයි. 2015/2016 වර්ෂය වන විට මෙගාවොට් පැය 2800 ක් වූ අභ්‍යන්තර බලශක්ති උත්පාදනය 2019/2020 වර්ෂය වන විට මෙගාවොට් පැය 766 ක් දක්වා අඛණ්ඩව සියයට 73 කින් පහළ ගොස් තිබුණි. මෙම පහළයාම වළක්වාගැනීම සඳහා ආයතනයේ දැනට පවත්නා බලශක්ති උත්පාදන ඒකකයේ ධාරිතාවය මෙගාවොට් 2 සිට මෙගාවොට් 10 දක්වා ඉහළ නැංවීමේ ව්‍යාපෘතියක් 2018 වර්ෂයේ ආරම්භ කර 2020 වර්ෂයේ මැද භාගය වනවිට අවසන් කිරීමට යෝජිතව තිබූ නමුත් අදාළ ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විට දීද ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විදුලි උත්පාදනය උපරිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බවක් වාර්තා වී නොතිබුණි. | 2020/2021 වසර තුළ අභ්‍යන්තර විදුලි ජනනය මෙගාවොට් පැය 105 දක්වා අඩු වී ඇත. |
| (ඒ) | සමාගමෙහි අතුරු නිෂ්පාදන වශයෙන් 2019/2020 වර්ෂයට අදාළ ඇස්තමේන්තු ගත කොම්පෝස්ට් නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 5000 ක් වුවද, සත්‍ය නිෂ්පාදිත ප්‍රමාණය මෙට්‍රික්ටොන් | ශක්‍යතාවය හඳුනාගෙන ඇස්තමේන්තු සකස් කර ඉලක්කය කරා ගමන් කළ යුතුය. | හොඳ ඉල්ලුමක් ඇති වූ පසු අපේක්ෂිත නිෂ්පාදන ධාරිතාව වන ටොන් 7000 දක්වා ළඟා විය හැකි බව වාර්තා කෙරේ. | 2020/2021 වර්ෂයේදී අපේක්ෂිත කොම්පෝස්ට් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 6,000ක් වූ අතර සත්‍ය නිෂ්පාදනය |

| | | | | |
|---|---|---|---|---|
| | 1000 ක් හෙවත් සියයට 20 ක් පමණක් විය. 2017/2018 වර්ෂයේදී රු.2,625,200 ක පිරිවැයකින් ඉදිකළ කොම්පෝස්ට් අංගනයෙන් වාර්ෂිකව කොම්පෝස්ට් මෙට්‍රික්ටොන් 7000 ක් නිපදවා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ගැනුම්කරුවන්ට අලෙවි කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් වසර 03 ක් ගත වන විටත් ප්‍රමාණවත් පරිදි ගැණුම්කරුවන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවීම මත කොම්පෝස්ට් නිෂ්පාදනය අපේක්ෂිත මට්ටමට ලඟාකර ගැනීමට නොහැකි වීම හා කොම්පෝස්ට් අංගනය පූර්ණ ලෙස උපයෝජනය කිරීමට සමාගම අපොහොසත්ව තිබුණි. | | | මෙට්‍රික් ටොන් 1,250ක් වූ නිසා කොම්පෝස්ට් අංගනය සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගැනීමට සමාගම අපොහොසත් විය. |
| (ඔ) | සමාගමේ කළමනාකරණය සඳහා පිහිටුවා ඇති ගල්ඔය හෝල්ඩින්ස් පුද්ගලික සමාගමට හිමිකම් ඇත්තේ ගල්ඔය වැවිලි සමාගමේ බදු පසු ලාභයෙන් සියයට 02 ක කළමනාකරණ ගාස්තුවක් අයකර ගැනීම පමණක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ගල්ඔය හෝල්ඩින්ස් පුද්ගලික සමාගමින් වසර ගණනාවක සිට ලැබිය යුතු රු.15,873,623 ක අයනොවන ශේෂයක් දක්වා තිබූ අතර මෙම ශේෂය ඇතිවූ ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. තවද, මේ වෙනුවෙන් | මෙම ලැබිය යුතු ශේෂය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකිරීමටත් එම මුදල අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. | මෙම මුදල අයකර ගැනීමට කටයුතු කර නොමැත. | අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර 2020/2021 වසර සඳහා මූල්‍ය ප්‍රකාශනවලින් ප්‍රමාණවත් හෙළිදරව් කිරීමකින් තොරව රු.12,392,179 ක් වූ අඩමාණ ණය වෙන්කිරීම පවත්වාගෙන ගොස් ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගම රු.12,392,179 ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර තිබුණි. | | | |
| (ඕ) | ගොවීන්ගෙන් අයවිය යුතු රු.82,642,083 ක ණය මුදලින් රු.47,214,354 ක් කපාහැර තිබීම මතභේදාත්මක වන අතර ඉතිරි මුදලින් රු.22,953,208 ක් 2021 මාර්තු මාසය වනවිට තවදුරටත් අයවිය යුතුව පැවතුණි. | සමාගමට අයවිය යුතු මුළු ණය මුදල අයකර ගතයුතු අතර ණයගැති භාවය හා කපා හැරීමට හේතුව හෙළිදරව් කළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව වසර 4කට වඩා ගොවීන්ගෙන් අයවිය යුතු රු.82,642,083ක ණය මුදලින් රු.47,214,354ක් කපා හැර ඇති අතර ඉතිරි රු.35,427,728න් රු.12,474,521ක් (35% ක්) මේ වන විට අය කර ඇත. ඉතිරි රු.22,953,207 මෙම කෙටි ඇඹරුම් කන්නයේ දී සහ ඊළඟ දිගු ඇඹරුම් කන්නයේ දී අයකර ගැනීමට අපේක්ෂා කෙරේ. | 2021 මාර්තු 31 දිනට, වසර 5කට වැඩි කාලයක් ගොවීන්ගෙන් අයවිය යුතු ණය මුදල රු.22,770,870 කි. |
| (ක) | 2020 මාර්තු 31 දිනට ගෙවිය යුතු රු.8,272,917,286 ක් වූ මුළු ණය ප්‍රමාණයෙන් රු.6,092,272,225 ක් හෙවත් සියයට 73.6 ක් සමාගමේ කොටස්කාර සමාගම් හා එම සමාගම්වල ආශ්‍රිත සමාගම් වලින් සියයට 15 ත් සියයට 24 ත් අතර පරාසයක වාර්ෂික පොලී ප්‍රතිශතයන් යටතේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාගත් ණය මුදල් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.2,093,733,282 ක් වූ මුළුණය පොලී වියදමෙන් රු.1,673,581,209 ක් හෙවත් සියයට 79.9 ක් කොටස්කාර සමාගම් හා එම සමාගම්වල ආශ්‍රිත | ණය පොලී වියදම් අවම කිරීමට කටයුතු කළ යුතුයි. | ණය සඳහා පොලී වියදම් අවම කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020/2021 වසර සඳහා ණය පොලී වියදම රු.මිලියන 2,119 ක් වූ අතර ඉන් රු. මිලියන 2,083.4ක් හෙවත් සියයට 98ක් කොටස්කාර සමාගම්වල සහ ඔවුන්ගේ ආශ්‍රිත සමාගම්වල පොලී වියදම් විය. |

සමාගම් සඳහා වන පොලිය විය. තවද, 2019 අප්‍රේල් 01 දිනට එම සමාගම් වල ආශ්‍රිත සමාගම්වලට ගෙවිය යුතුව තිබූ රු.746,679,237 ක ණය මුදල හා ඒ සඳහා ගෙවිය යුතුව තිබූ රු.768,609,290 ක පොලී මුදල් එකට එකතු කර සියයට 20 ක පොලී ප්‍රතිශතයක් යටතේ රු.1,515,288,527 ක නැවත ලබාගත් ණය මුදලක් වශයෙන් පරිවර්තනය කර තිබුණි. සමාගම විසින් 2016/2017 හා 2018/2019 වර්ෂයන්හිදී රජයේ හා පෞද්ගලික බැංකු 02 කින් සියයට 6.5 ක් බැගින් වූ පොලී ප්‍රතිශත යටතේ ණය පහසුකම් ලබාගෙන තිබීමෙන් මුදල් වෙළඳපල තුළ ඉතා අඩු පොලී ප්‍රතිශතයක් පවතින අවස්ථාවක කොටස්කරුවන් හා ඒ හා සම්බන්ධිත සමාගම්වලින් මෙලෙස ඉතා ඉහළ පොලී ප්‍රතිශත යටතේ ණය මුදල් ලබා ගැනීමත්, ගෙවිය යුතු පොලී, ණය මුදල් බවට පරිවර්ථනය කිරීමත්, මූල්‍ය අවශ්‍යතා පිළිබඳව භාණ්ඩාගාරය දැනුවත් නොකිරීමත් තුළින් සමාගම ප්‍රබල මූල්‍ය අර්බුදයකට මුහුණපා ඇතිබව නිරීක්ෂණය වන අතර මෙම මතභේදාත්මක ගණුදෙනු කෙරෙහි මහා භාණ්ඩාගාරයේ අවධානය යොමුකර නොතිබූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

| | | | | |
|---|---|---|---|---|
| (ග) | ආයතනයේ සේවයේ නියුක්ත නිලධාරීන් වෙනුවෙන් ලබාදිය හැකි නිල නිවාස 113 ක අනවසර පදංචිකරුවන් පදිංචිව ඇතිබව ආයතනය විසින් ලබාදුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය. එහෙත් එම නිවාස අත්පත් කරගැනීමට සමාගම පියවර ගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු බැවින් දිස්ත්‍රික් ලේකම්ගේ සහය ලබාගෙන මෙම නිවාස අත්පත් කර ගැනීමට පියවර ගත යුතුය. | දිගුකාලීන බදු ගිවිසුම ලබාදීමට රජය අපොහොසත් වීම හේතුවෙන් නිල නිවාස ලබා ගැනීමට ආයතනයට නීතිමය පදනමක් නොමැති බව වාර්තා විය. | 2021 වසර වන විට නිල නිවාස 207ක් සහ නේවාසිකාගාර 05ක් අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන ඇත. |
| (ච) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.3.1 ඡේදයට අනුව, එක් එක් ආයතනය සඳහා කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කළ යුතු නමුත්, ආයතනය සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | සමාගම සඳහා බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ජ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසානයේ සිට දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාගම මාස 06ක ප්‍රමාදයකින් පසු 2020 නොවැම්බර් 24 වැනි දින සිය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබූ නමුත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව, මූල්‍ය වර්ෂය අවසානයේ සිට දින 60ක් ඇතුළත කෙටුම්පත් කළ වාර්ෂික වාර්තාව සමඟ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. | වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | 2021 මාර්තු 31 වැනි දිනට මාස 5ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර ඒ සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ට) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ විගණන | පනත ප්‍රකාරව සමාගමේ විගණන කටයුතු සිදු කිරීම | වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුරක් නිර්මාණය කර නොතිබුණි. |

| | |
|---|---|
| කටයුතු සිදු කිරීම සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යථා පරිදි පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු නමුත් අභ්‍යන්තර විගණක තනතුරක් ඇති කර නොගෙන ලංකා ඔරික්ස් ලීසින් සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලය විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර තිබුණි. | සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු අභ්‍යන්තර විගණන තනතුරක් ඇති කර කාර්යය මණ්ඩලයක් පත් කරගත යුතුය. |

## 4.67 සීමාසහිත හිඟුරාන සීනි (පුද්ගලික) සමාගම

**2018** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත

**2019** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත

**2020** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 වගන්තියට අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2016, 2017 සහ 2018 වර්ෂවලට අදාළ මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන සහ ඇවර කිරීමේ ගිණුම් විගණකාධිපති වෙත යොමු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | 2015 වසරෙන් පසු ගිණුම් පොත් පවත්වාගෙන යාමට සහ සමාගම ඇවර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2015 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සහ ඇවර කිරීමේ ගිණුම් සකස් කර නොමැත. |
| (ආ) | 1993 වර්ෂයේ පුද්ගලීකරණයට යටත් වූ මෙම ආයතනය අසාර්ථක වීම නිසා නැවත 1997 වර්ෂයේදී රජයට පවරා ගත්තද 1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවූ බැවින් 2001 වර්ෂයේදී සියලු සේවකයන්ට වන්දි ගෙවා ඔවුන්ගේ සේවය අවසන් කර තිබුණු අතර මෙම කර්මාන්තායතනයට අයත් ඉඩම්වලින් කොටසක් සහ ගොඩනැගිලි අවුරුදු 30 ක බදු පදනම මත ලබාදී ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම පිහිටුවා තිබුණි. ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා 2016 | මෙම ආයතනයට අයත් වත්කම් දැනට ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමට පවරා ඇති නිසා මෙම ආයතනයේ ගණුදෙනු බේරා ඇවර කිරීමට කටයුතු කළ යුතුද යන්න සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුය. | ආයතනයේ වත්කම් හා පරිපාලන කටයුතු ආරක්ෂා කිරීමට පියවර ගෙන නොතිබුණි. | මේ වන විට සේවකයන් නොමැති බවත් ගනුදෙනු පියවා සමාගම ඇවර කිරීමට කැබිනට් පත්‍රිකාවක් සකස් කිරීමට කමිටුවක් පත් කිරීමට තීරණය කර ඇති බවත් විගණනයට වාර්තා විය. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේදී සේවකයින් 9දෙනෙකු සේවයේයෙදී ඇති අතර වර්තමානය වන විට තාවකාලිකව පත් කරන ලද සාමාන්‍යාධිකාරිවරයකු පමණක් සේවයේයෙදී සිටි. ඒ අනුව මෙම ආයතනය නාමිකව තිබෙන ආයතනයක් බවට පත්වී ඇත. | | | |
| (ඇ) | 2018 වර්ෂයේ ගනුදෙනුවලට අදාළ වවුචර්පත්, මුදල් පොත, බැංකු ප්‍රකාශන ආදිය ලිඛිතව විගණනය කිරීම සඳහා අවස්ථා කිහිපයකදී ඉදිරිපත් කරන ලෙස ලිඛිතව දැනුම් දී තිබුණද ඒවා විගණනයට ඉදිරිපත් කර නොමැත. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව ඉල්ලා සිටිනු ලබන තොරතුරු සහ පැහැදිලි කිරීම් විගණකාධිපති වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. | ගිණුම් පොත් පවත්වාගෙන නොගිය බව ප්‍රකාශ කළා. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ඈ) | කර්මාන්තායතනයට අයත් හෙක්ටයාර් 277.73 ක ඉඩම් හා ඊට අදාළ කර්මාන්තශාලා ගොඩනැගිලි වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම වෙත 2007 වර්ෂයේදී ලබාදී තිබුණි. 2009 මාර්තු 06 දිනැති අංක.09/0398/329/003 සහ 2009 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බදු ගිවිසුමක් පිළියෙල කොට ඒ සඳහා නීතිපතිගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව බදු ගිවිසුමක් සකස් කර නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | බදු ගිවිසුමක් සකස් කර නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ගොවීන් 4493 ක් අතර අක්කර 2.5 බැගින් අක්කර 11232 ක් බදු ගිවිසුම් වලින් ලබාදී තිබුණද, එම ඉඩම්වලින් බදු මුදල් අයවී නොතිබුණු අතර එම බදු ගිවිසුම්වල කාලයද ඉකුත්වී තිබුණි. ඒ අනුව අලුතින් බදු ගිවිසුම් අත්සන් කර ඒවා පැවරීමට හා බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | බදු ගිවිසුම් අලුත් කිරීමටත් අදාළ බදු මුදල් අය කිරීමටත් පියවර ගත යුතුයි. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | නව බදු ගිවිසුම් අත්සන් කර ඒවා පැවරීමට සහ බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඊ) | කර්මාන්තායතනය සතුව තිබෙන වත්කම් හා තොග සම්බන්ධයෙන් වසර 20 කට අධික කාලයක සිට භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබු බැවින් වත්කම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. | වත්කම්වල පැවැත්ම සහ ඒවායේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා වත්කම්වල භෞතික සත්‍යාපනයක් සිදු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. |
| (උ) | නාරාහේන්පිට කාර්යාලය තුළ බෝතල් නිෂ්පාදනාගාරයට අයත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, යතුරුපැදි 3 ක් මෝටර් රථයක්ද, හිඟුරාන කම්මල් පරිශ්‍රයේ තිබෙන යන්ත්‍ර උපකරණ ඇතුළු වත්කම් 1997 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණු අතර ඒවා අපහරණය කර රජයට ආදායමක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | භාවිතයට ගත නොහැකි වත්කම් නැවත තක්සේරු කර ඒවා අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | වත්කම් නැවත තක්සේරු කිරීමට සහ ඒවා බැහැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඌ) | කර්මාන්තායතනයේ පවතින සියලුම වත්කම් පිළිබඳව රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු බවට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | වත්කම් බැරකම් හඳුනාගෙන ඒවා පියවීමට අවශ්‍ය පියවර ගෙන තිබුණේ නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | පෙබරවාරි 27 දිනැති ලිපිය මඟින් දැනුම් දී තිබුණු අතර 2017 පෙබරවාරි මස පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කර්මාන්තායතනය ඇවර කිරීම සඳහා වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු බවට නියෝග කළ තිබියදී මේ දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කටයුතු කඩිනමින් සකස් කළ යුතුය. | | |
| (එ) | හිඟුරාන සීනි කර්මාන්තායතනය සතුව ප්‍රයෝජනයට ගත හැකි රු. මිලියන 222 ක් වටිනා වත්කම් සහ තොග ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමට පවරා දී තිබුනද එම වත්කම් හිඟුරාන සීනි කර්මාන්තායතනයේ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ වගකිවයුතු ආයතන විසින් අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කළ යුතුයි. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ඒ) | සේවකයින් ඉවත් කිරීමට පෙර හිඟුරාන පරිශ්‍රය තුළ සහ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ පවතින වත්කම් නිසි පරිදි වගකිවයුතු නිලධාරීන්ට භාරදීමට අවශ්‍ය කටයුතු නොකර සේවකයන් ඉවත් කර තිබුණි. | සේවකයින් භාරයේ පවතින වත්කම් ඔවුන් සේවයෙන් ඉවත්වීමට පෙර වගකිවයුතු නිලධාරියෙකුට භාරදී සේවයෙන් ඉවත් වීමට කළමනාකාරිත්වය වගබලා ගත යුතුය. | වගකිවයුතු නිලධාරීන්ට වත්කම් නිසියාකාරව භාර දී නොතිබුණි. | වත්කම් නිසි ලෙස පවරා නොගෙන සේවකයන් ඉවත් කර ඇත. |
| (ඔ) | 2017 වර්ෂයේ මාර්තු මාසය දක්වා නාරාහේන්පිට කාර්යාලයේ සේවකයින් 06 දෙනෙකු සහ හිඟුරාන කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකු රජකාරියේ යෙදී සිටි අතර 2017 මාර්තු 29 දිනැති ලිපිය මඟින් 2017 පෙබරවාරි 28 දින සිට සේවකයින් 5 දෙනෙකුගේ සේවය | ආයතනයේ ගණුදෙනු බේරා අවසන් කරන තුරු අදාල පොත්පත් ලේඛන සහ වත්කම්වල ආරක්ෂාව | වත්කම් ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දැනට ආයතනයේ කිසිම සේවකයෙක් නොමැත. |

| | |
|---|---|
| අවසන් කර තිබුණි. 2018 වර්ෂය සම්බන්ධයෙන් අවසාන වන විට සේවකයින් දෙදෙනෙකු පමණක් සේවයේ යෙදී තිබුණි. වර්තමානය වන විට එක් නිලධාරියෙකු පමණක් සේවයේ යෙදී සිටී. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4.68 සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 6,583,972,070 | 6,439,629,701 | 8,464,705,122 | 3,499,146,170 | 144,342,369 | තත්ත්වාගණනය කල |
| **2019** | 7,844,580,613 | 9,156,793,506 | 6,789,204,509 | 3,178,038,995 | (1,312,212,893) | වියාචනය |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත. | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | පැලවත්ත සීනි කර්මාන්ත ශාලාව හා සෙවනගල සීනි කර්මාන්ත ශාලාව ලංකා සීනි සමාගමට පවරා ගැනීමෙන් පසුව 2013 හා 2014 වර්ෂයන්හිදී වත්කම් ප්‍රත්‍යාගණනය කර තිබූ නමුත් සෙවනගල කර්මාන්තශාලාවේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණවලින් කොටසක් හැර අනෙකුත් වත්කම්වල ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල අයිතිය සම්බන්ධයෙන් පවත්නා ගැටළු විසඳා ගැනීමටත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරවවත්කම් ප්‍රත්‍යාගණන කර නිවැරදි වටිනාකම් මත | අනාගතයේ දී නිවැරදිව වත්කම් නැවත තක්සේරු කිරීමට සහ අදාළ ගැලපීම් කිරීමට අපේක්ෂා කෙරේ. | වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍යාගණන දෝෂ හා වත්කම්වල අයිතිය සම්බන්ධ ගැටළු ඊට හේතු වශයෙන් මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. ඒ අනුව අදාළ දෝෂ නිවැරදි කර ගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ප්‍රකාරව වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු නොකර පැල්වත්ත කර්මාන්තශාලාවේ පවරාගත් වත්කම්වල පොත් අගය රු.2,900,032,369 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබූ අතර සෙවනගල කර්මාන්තශාලාවේ පසුව මිලදීගත් වත්කම් හැර අනෙකුත් වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් එම වත්කම් හා ඊට අනුරූප ක්ෂය වටිනාකම් සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශ තුළින් හෙළිදරව් නොවන බව නිරීක්ෂණය විය. | ගිණුම් ගැලපීමටත් කටයුතු කළ යුතුයි. | | |
| (ආ) | වසර 5 ක කාලයක් සඳහා පාර්ශ්ව පහකින් ලැබිය යුතු එකතුව රු.19,498,293 ක මුදල අයකර ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර ඊට අදාළ පාඩු සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 59 හි 36 ඡේදය අනුව ප්‍රතිපාදන සපයා නොතිබුණි. | එකී මුදල අය කර ගැනීමට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 හි 59 වැනි ඡේදය ප්‍රකාරව ඊට අදාළ පාඩු සඳහා ප්‍රතිපාදන සැලසීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | එම මුදල අයකර ගැනීමට නොහැකි බැවින් ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | අයකර ගැනීමට හෝ වෙන්කර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ඇ) | තක්සේරු වර්ෂය තුළදී උපයාගත් එකතු කළ අගය මත බද්ද ඇතුළුව විවිධ ආදායම රු.25,800,321 ක් සහ අනෙකුත් සේවාවන්ගෙන් ලැබෙන ආදායම රු.43,889,267 ක් සඳහා සමාගම විසින් රු.10,453,438 ක් වූ නිමැවුම් බද්ද ගණනය කර නොතිබුණි. | බදු ගණනය කිරීම් නිවැරදිව සිදු කළ යුතු අතර ගෙවීම් නියමිත දිනට සිදු කළ යුතුය. | ගෙවිය යුතු බදු වගකීම් ගෙවීමට ඉදිරි පියවර ගනු ලැබේ. | ගෙවිය යුතු බදු මුදල් ගෙවා නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පැල්වත්ත සීනි අංශයේ කර්මාන්තශාලා අමතර කොටස් සැපයුම්කරුවන් වෙත ලබා දී තිබූ රු. 4,074,404 ක අත්තිකාරම්වලට අදාළ සැපයීම් ලබා ගැනීමට හෝ මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | භාණ්ඩ නොලැබීමට හේතු හා වගකිවයුතු නිලධාරීන් පිළිබඳව සොයා බැලීමට පියවර ගත යුතුයි. | එම ශේෂයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මූල්‍ය ප්‍රකාශනවලින් කපා හැරීමට කටයුතු කරන බව වාර්තාවේ. | අය කර ගෙන නොතිබුණි. |
| (ඉ) | පැල්වත්ත ඒකකයේ සහ සෙවනගල ඒකකයේ ගොවීන්ගේ ණය වශයෙන් රු.326,014,262ක් සහ රු.6,475,123ක් සහ පෞද්ගලික සමාගමකින් සෙවනගල ඒකකයට ලැබිය යුතු රු.7,741,248ක් වසර 3ත් 5ත් අතර කාලයක සිට ආපසු අයකර නොතිබුණි. | හිඟ ණය අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුයි. | ණය අයකර ගැනීමට කටයුතු කරන බව වාර්තාවේ. | අය කර ගෙන නොතිබුණි. |
| (ඊ) | ඒකකයට ලැබිය යුතු රු.1,202,124. පෞද්ගලික පාර්ශව 07 කින් පැලවත්ත අංශයට 2014 වර්ෂයේ සිට ලැබිය යුතුරු.1,202,124 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු සියලුම ණය අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. | ආයතනයේ මාණ්ඩලික සමාජය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2014 වර්ෂයේ දී ලබා දී ඇති රු. 1,021,627 ක මුදල අයකර ගැනීමට කටයුතු කරන බව සහ පාර්ශව 06 කින් ලැබිය යුතු ඉතිරි රු.180,467 පොත්පත්වලින් කපා හැරීම සඳහා කටයුතු කරන බව වාර්තා වේ. | අය කර ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ද) | පැල්වත්ත අංශයේ සැපයුම්කරුවන් 4 දෙනෙකුට වර්ෂ 5 ක සිට වර්ෂ 7 ට වැඩි කාලයක් දක්වා ගෙවිය යුතු එකතුව රු.136,789,984 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු මුදල් පියවීමට නිසි පියවර ගත යුතුය. | එය ගෙවීමට හෝ ගිණුම් වාර්තාවලින් ඉවත් කිරීමට බලාපොරොත්තු වන බව වාර්තා වේ. | පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ධ) | 2002 අංක 14 අගය එකතු කළ අගය මත බදු පනතේ 26(1) වගන්තිය සහ 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 04(i) වගන්තිය අනුව සෑම මසකම අවසාන දිනට ගණනයකරන බදු මුදල් ඊළඟ මාසයේ 20 වැනි දින හෝ එදිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවත් 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.35,054,595 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම රු.93,091,778 ක් ගෙවීමට ගෙවීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පනත්වලට අනුව නිසි පරිදි බදු ගෙවිය යුතු අතර හිඟ බදු ගෙවීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (න) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2003 ජුනි 02 දින චක්‍රලේඛ අංක PED/12 හි 6.5.1 වගන්තියට අනුව, ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 17 ක් ප්‍රමාද කර 2020 ජූලි 31 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණේ 2019 ඔක්තෝම්බර් 31 දින දී විය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන් වීමෙන් පසු දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන සහ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. | 2019 වසරේ මූල්‍ය ප්‍රකාශන මාස 18ක් ප්‍රමාද වී ඉදිරිපත් කර ඇත. | ප්‍රමාදය වළක්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | පැල්වත්ත අංශය රජයට පවරා ගන්නා අවස්ථාවේදී පැවති යල්පැනගිය තොග සඳහා වූ රු.9,251,437 ක වෙන්කිරීම නිරවුල් කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මූල්‍ය ප්‍රකාශවලින් ඉදිරියට ගෙනවිත් තිබුණි. | යල්පැනගිය හා සෙමෙන් චලනය වන තොග සමාගමට වාසි දායක වන ආකාරයට අපහරණය කළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු එය මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කළ හැකිය. | නිරවුල් කර නොතිබුණි. |
| (ඔ) | පැල්වත්ත අංශය රජයට පවරාගැනීමට පෙර සිට පැවති රු.37,410,797 ක ව්‍යාපෘතිය හා රජයට පවරා ගැනීමෙන් පසු ආරම්භ කළ තවත් රු.53,701,955 ක් වැය කළ ව්‍යාපෘති 5 ක් අවසන්වීමකින් තොරව නවතා දමා තිබූ නමුත් ඒ කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල අවධානය යොමුවී නොතිබූ අතර ඒවා කෙරීගෙන යන වැඩ වශයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ව්‍යාපෘති ප්‍රමාදයට හේතු සොයා බලා ප්‍රමාදයකින් තොරව නිම කළ යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට ලක්වීමෙන් පසු තීරණ ගත හැකි බව වාර්තා වේ. | ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. |

## 4.69 සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 5,027,588 | 18,219,852 | 163,089,006 | 157,556,815 | (13,192,264) | වියාචනය |
| **2019** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත | | | | | |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 5.03 | 18.22 | 163.09 | 157.56 | (13.19) |
| 2019 | - | - | - | - | - |
| 2020 | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 හි 09 වන ඡේදය ප්‍රකාරව අවසන් තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මැනිය යුතුය. කෙසේ නමුත්, වසර 20 කට අධික කාලයක් තිස්සේ පාවිච්චියට නොගෙන තොග | සමාගමේ ගබඩා වල පවතින තොග පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නිවැරදි තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ගබඩාවේ පැවති තොග පිරිවැයට ගණනය කර රු.47,440,818 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | | |
| (ආ) | 2005 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු රු.840,774 ක ශේෂය හඳුනාගෙන අදාළ ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි. | 2005 වර්ෂයේ සිට ගිණුම් වල පවතින කෙරීගෙන යන වැඩ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. | වැළැක්වීමේ පියවර ගෙන නොතිබුණි. | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්ත ආයතනය 1994.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසා දමා තිබූ බැවින් ගොඩනැගිල්ල අවසන් කර ඇත්ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනීමට නොහැකි වූ බව වාර්තා විය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම රු.73,849,491ක් වුවද, අනුරූප වාර්තා අනුව වටිනාකම රු.540,000,000 ක් වූ අතර ඒ හේතුවෙන් රු. 466,150,509 ක වෙනසක් නිරීක්ෂණය විය. | සමාගම සතුව පවතින වත්කම් තක්සේරු කර සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කළ යුතුය. | අමාත්‍යාංශය විසින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ 2007 සහ 2017 වර්ෂවල දී වත්කම් තක්සේරු කර ඇත. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ඈ) | 2018 වසර අවසන් වන විට පැවති රු.16,598,342 ක වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂයන් සත්‍යාපනය කිරීම සඳහා ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම්වල පෙන්වා ඇති ශේෂය තහවුරු කිරීමට අවශ්‍ය විගණන සාක්ෂි, විගණනයට ලබා දිය යුතුය. | යකඩ විකිණීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් ලැබුණු රු.16,598,342 ක අතිරික්ත මුදල ගෙවීමට සමාගමට සිදුව ඇතැයි වාර්තා වේ. | තහවුරු කිරීම් ඉදිරිපත් කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 1993 වර්ෂයේ සිට පැවත එන රු.42,183,209 ක් වූ ලැබිය යුතු සහ ඉදිරියට කළ ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | වසර 20ක පමණ කාලයක සිට පෙර ආයෝජකයාගෙන් අයවිය යුතු රු.14,036,375ක මුදල අයකර ගැනීමට අධිකරණයේ පවරා ඇති නඩුව තවදුරටත් පවත්වාගෙන යා නොහැකි බව නීතිපති දෙපාර්තමේන්තුව දැනුම් දීම නිසා මෙම මුදල අය කර ගැනීමට නොහැකි බවද වාර්තා වේ. ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඊ) | 2010 වර්ෂයේ සිට ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවියයුතු ලෙස දක්වා ඇති රු.76,352,246 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු මුදල් පියවීමට කටයුතු කළ යුතුයි. | පියවීමට කිරීමට කටයුතු කර නැත. | ශේෂය නොපියවා පවතී. |
| (උ) | වර්ෂ 25 කට ආසන්න කාලයක සිට කිසිදු නිෂ්පාදන කාර්යයකට දායකත්වයක් නොමැතිව වසා දමා ඇති කන්තලේ සීනි කර්මාන්ත ශාලාව නැවත ආරම්භ කර එමඟින් දේශීය සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සිදු කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන යටතේ ආයෝජකයින් විසින් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක් ආයෝජනය කරමින් වර්ෂ 5 ක් තුළ මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ යුතුව තිබුණද එවැනි කිසිදු ආයෝජනයක් | දේශීය සීනි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සමාගම වහාම ප්‍රතිව්‍යුහගත කර නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කළ යුතුය. | ප්‍රතිව්‍යුහගත කිරීම සහ නිෂ්පාදනය ආරම්භ කර නොමැත. | ප්‍රතිව්‍යුහගත කිරීමට සහ නිෂ්පාදනය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 ජනවාරි 31 දින වන විටත් සිදු වී නොමැති අතර කර්මාන්ත ශාලාවට අයිතිව තිබූ සියලුම යන්ත්‍රෝපකරණ ඇතුළු ගොඩනැඟිලි වල අයිතියද ශ්‍රී ලංකා රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. එසේම කිසිදු නිෂ්පාදනයක් සිදු නොවන මෙම කර්මාන්තායතනයේ සේවයේ නියුතු සේවකයින් සඳහා 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැටුප් හා දීමනා ලෙස රු.මිලියන 40.392 ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | | | |
| (ඌ) | කන්තලේ සීනි කර්මාන්තශාලාව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ආයෝජකයකු තෝරා ගැනීමේදී විවෘත ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය නොකර ඉඩම් අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය වෙත සෘජුව ලැබුණු අයදුම්පත් දෙකක් පදනම් කරමින් ආයෝජන ඇගයීම සිදුකර තිබුණි. මෙහිදී ආයෝජනය සඳහා යෝජනා කැඳවීම ප්‍රමාණවත් විනිවිදභාවයකින් තොරව සිදුවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. තවද මෙම ක්‍රියාවලියට අදාළ කිසිදු ලියවිල්ලක් ඉඩම් අමාත්‍යාංශය සතුව නොමැති බව විගණනයට දන්වා තිබුණි. | පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර විනිවිදභාවයකින් යුක්තව සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීමට කටයුතු කළ යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | සුදුසු ආයෝජකයෙකු තෝරා ගත් බවක් නිරීක්ෂණය නොවීය. |
| (එ) | 2016 අගෝස්තු 01 දින නීතිපති දෙපාර්තමේන්තුව විසින් දෙන ලද නිෂ්කාශන බැහැර කරමින් මුදල් අමාත්‍යාංශයේ එවකට හිටපු නීති | මුදල් අමාත්‍යාංශයේ නීති උපදේශක විසින් නීතිපතිගේ නිෂ්කාශණ | මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැත. | ගැටලුව නොවිසඳී පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | උපදේශක විසින් කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීමේ කොටස්කාර ගිවිසුම පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2016 අගෝස්තු 01 දින දෙන ලද නිෂ්කාශනයට අදාළ තාක්ෂණික හා වාණිජ කරුණු පිළිබඳ වැඩිදුර අධ්‍යනයකින් තොරව, 2016 අගෝස්තු 04 දින නිෂ්කාශනයක් ඉදිරිපත් කරමින් මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීමට නීතිමය අවහිරතාවයක් නොමැති බව දන්වා ඇති බව නිරීක්ෂණය විය. | සම්බන්ධයෙන් නිරීක්ෂණ ඉදිරිපත් කිරීමේදී මුදල් අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඒ සඳහා අනුමැතිය ලබාගත යුතුව තිබුණු අතර අවසාන කොටස්කාර ගිවිසුම අත්සන් කිරීමට පෙර එහි සඳහන් කොන්දේසි පිළිබඳව පරීක්ෂා කර බැලිය යුතුව තිබුණි. | | |
| (ඒ) | නීතිපති දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලද නිරීක්ෂණ ඇතුළත් ලිපියට පිළිතුරු ලෙස මුදල් අමාත්‍යාංශයේ හිටපු නීති උපදේශක විසින් නීතිපති දෙපාරේතමේන්තුවට යවා තිබුණ පිළිතුරු ලිපියේ අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් හෝ වෙනත් නිළධාරියෙකු දැනුවත් කොට නොතිබූ බව නිරීක්ෂණය විය. එමෙන්ම අවසන් ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදීද ඉහත 2016.08.01 දිනැති නීතිපති නිරීක්ෂණ භාණ්ඩාගාර ලේකම්ගේ අවධානයට ලක් කොට නොමැති බව නිරීක්ෂණය විය. | අවසාන කොටස්කාර ගිවිසුම අත්සන් කිරීමට පෙර නීති උපදේශක විසින් එම ගිවිසුමේ සඳහන් වගන්ති පිළිබඳ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුව තිබුණි. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | ආයෝජකයා විසින් කර්මාන්තශාලාවට අවශ්‍ය යන්ත්‍රෝපකරණ රැගෙන ආ යුතු බවට දක්වා ඇති කොන්දේසියට පටහැනිව ආයෝජකයාට දැනට පවත්නා යන්ත්‍රසූත්‍ර භාවිතයට ගැනීමට හැකියාවක් ඇති බවට වගන්තියක් මුදල් අමාත්‍යාංශයේ හිටපු නීති උපදේශක විසින් අත්සනට එළඹි ගිවිසුමෙහි ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. එහෙත් එම වගන්තිය නිෂ්කාශනය සඳහා නීතිපති වෙත යවන ලද අවසන් කෙටුම්පත් කොටස්කාර ගිවිසුමේ ඇතුළත් නොවන බව විගණනයට නිරීක්ෂණය විය. | නීති උපදේශක විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිෂ්කාෂණයට යවන ලද කෙටුම්පත් කොටස්කාර ගිවිසුමේ ඇතුළත් නොවන වගන්තියක් අත්සන් කරන ලද අවසාන කොටස්කාර ගිවිසුමට ඇතුළත් කිරීම පිළිබඳ විමර්ශනයක් කළ යුතුය. | මෙම සංශෝධනය සිදු කළ නිලධාරියා දැනට මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ සේවය නොකරන බව වාර්තා වේ. වැළැක්වීමේ පියවර ගෙන නොමැත. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ඕ) | කන්තලේ සීනි කර්මාන්තශාලාවට අයත් ගොඩනැඟිලි ඇතුළු යන්ත්‍ර උපකරණ අපහරණය කිරීමේ ක්‍රියාවලිය අඩාල වීම කෙරෙහි අත්සනට එළඹී කොටස්කාර ගිවිසුම හේතු වී ඇති බව විගණනයට නිරීක්ෂණය විය. | අත්සන් කරන ලද කොටස්කාර ගිවිසුමේ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ සඳහන් වගන්තියක් ඇතුළත් නොකිරීම නිසා අපහරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගෙන ඒ පිළිබඳව සුදුසු පියවර ගත යුතුය. | කිසිදු වැළැක්වීමේ පියවරක් ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | ගැටලුව නොවිසඳී පවතී. |
| (ක) | මුදල් අමාත්‍යාංශයේ හිටපු නීති උපදේශක විසින් අත්සනට එළඹෙන ලද කොටස්කාර ගිවිසුම සාපේක්ෂව ශ්‍රී ලංකා රජයට අවාසි සහගත වන ලෙසත්, ආයෝජකයාට | ශ්‍රී ලංකා රජයට අවාසිදායක කොන්දේසි ගිවිසුමට ඇතුළත් කිරීම නිසා ගෙවීමට සිදුවී ඇති වන්දි මුදල ඊට වගකිව | බේරුම්කරණ තීන්දු අධිකරණ තීන්දු පරිදි අභියාචනා කල හැකි නොවන බැවින් මෙම බේරුම්කරණයට එරෙහිව අභියාචනයක් | අදාළ වන්දි මුදල වගකිවයුතු පාර්ශවවලින් අයකර ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | හිතකර ලෙසත් පිළියෙල කර ඇති බව නිරීක්ෂණය වූ අතර සිංගප්පූරු අන්තර්ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ තීරණය අනුව වන්දි වශයෙන් සිංගප්පූරු ඩොලර් 894,516.83 ක් හා ඇමරිකානු ඩොලර් 211,913.93 ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් ආයෝජකයා වෙත ගෙවිය යුතු බවට නියම කර ඇති බවත් එයට අමතරව ව්‍යාපෘති පිරිවැය සියයට 15 කින් වැඩිකර ඇති බවත් නිරීක්ෂණය විය. | යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරිපත් කිරීමට නීතිමය හැකියාවක් නොමැති බව වාර්තා වේ. | කටයුතු කර නොතිබුණි. |
| (ග) | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල සම්බන්ධිත ආයතන වන මුදල් අමාත්‍යාංශය, ඉඩම් ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සහ ආයෝජන මණ්ඩලය යන ආයතන අතර මනා සම්බන්ධීකරණයකින් තොරව අමාත්‍ය මණ්ඩල සංදේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම හේතුවෙන් 1994 වර්ෂයේ සිට සීනි නිෂ්පාදන කටයුතු නතර කරන ලද කන්තලේ සීනි කර්මාන්ත ආයතනය විගණිත දිනය වන විටද සුදුසු ආයෝජකයකුට පැවරීමට නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය ප්‍රතිව්‍යුහගත කිරීම කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුයි. | සුදුසු ආයෝජකයෙකු වෙත පවරා නොතිබුණි. | ප්‍රතිව්‍යුහගත කිරීම් සිදු කර නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ච) | කර්මාන්ත ශාලාවට අයත් වගාබිම් එළිපෙහෙලි කිරිම සඳහා යොදා ගන්නා ලද "Jungle Cleaning" නැමැති මිල අධික දම්වැලක් මේ වන විට වල් වැදෙමින් පවතින බව විගණනයට නිරීක්ෂණය විය | සමාගම සතු මෙම වත්කම් හානි වීමට පෙර ආරක්ෂා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම වත්කම් ආරක්ෂා කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බවක් වාර්තා නොවීය. | වත්කම් විනාශ නොවී ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත් බවක් නිරීක්ෂණය නොවීය. |
| (ජ) | කර්මාන්ත පරිශ්‍රයේ පවතින වාහන නිසි ආරක්ෂාවකින් හා ආවරණයකින් තොරව වසර 25 කට ආසන්න කාලයක් තිස්සේ දිරාපත් වන බව විගණනයට නිරීක්ෂණය වූ අතර ටෙන්ඩර් පටිපාටිය සඳහා වාහන වල වැසි අංක කපා ඇති නමුත් යන්ත්‍රෝපකරණ ඇතුළු වාහන වල අයිතිය ආයෝජකයාට හිමි වීම මත ටෙන්ඩර් පටිපාටිය අවලංගු වී ඇති බවත් වැසි අංක ඉවත් කිරීම හේතුවෙන් වාහන වල අනන්‍යතාව තහවුරු කර ගැනීමටද නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. | මෙම වත්කම් අපහරණය කරන තෙක් ඒවා ආරක්ෂාකාරී ලෙස තබාගැනීමට කටයුතු කළ යුතු අතර ඒවා කඩිනමින් අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | වැළැක්වීමේ පියවරක් ගෙන නොතිබුණි. | වත්කම් අපහරණය කළ බවක් නිරීක්ෂණය නොවීය. |
| (ට) | වාර්ෂික සීනි මෙට්‍රික් ටොන් 16,320 ක්, මොලැෂස් මෙට්‍රික් ටොන් 9,000 ක් හා පරිපාරක ස්ප්‍රීතු ලීටර් මිලියන 3.9 ක නිෂ්පාදන ධාරිතාවයකින් යුතු සීමාසහිත කන්තලේ සීනි කර්මාන්තායතනය තාවකාලිකව 1993 සැප්තැම්බර් 01 දින රජයට පවරා ගෙන තිබුණද 1994 අප්‍රේල් මස සිට සීනි නිෂ්පාදන කටයුතු සිදු නොවීම හේතුවෙන් එම ප්‍රදේශයේ ජීවත් වූ දහස් ගණනකට සෘජු හා වක්‍ර රැකියා අහිමි වී තිබුණි. තවද 1991 වර්ෂයේ තක්සේරු | 1994 වර්ෂයේ සිට වසා දමා ඇති මෙම සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමටත්, භාවිතයට ගත නොහැකි වත්කම් බැහැර කරමින් සුදුසු ආයෝජකයෙකුට පැවරීමටත් වගකිවයුතු ආයතන පියවර ගත යුතුය. | යන්ත්‍ර සූත්‍ර සහ වාහන වෙන්දේසියට ඉදිරිපත් කළ බව වාර්තා විය. | සුදුසු ආයෝජකයෙකු වෙත පැවරීමට සහ භාවිතයට ගත නොහැකි වත්කම් බැහැර කිරීමට කටයුතු කළ බවක් නිරීක්ෂණය නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් රු.මිලියන 125 කට තක්සේරු කරන ලද යන්ත්‍ර උපකරණ සහ කර්මාන්ත පරිශ්‍රයේ පවතින වාහන නිසි ආරක්ෂාවක් හා ආවරණයකින් තොරව පැවතීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි තත්වයට පත්ව තිබුණි. එසේම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2012 සහ 2017 වර්ෂවල ඉදිරිපත් කල තක්සේරු වාර්තා අනුව ගත වූ වර්ෂ 5 තුළ වාහන වල වටිනාකම රු.12,463,500 කින් අඩුවී තිබුණද භාවිතයට ගත නොහැකි යන්ත්‍රෝපකරණ සහ වාහන අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | | | |
| (ඩ) | කර්මාන්ත ශාලාව සතු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 8596 ක් පමණ වන අතර හෙක්ටයාර 164 ක සීනි කම්හල හා නිල නිවාස සංකීර්ණය පිහිටා ඇත. සීනි කර්මාන්තශාලාව ක්‍රියාකාරී තත්වයෙන් තිබූ අවධියෙහි හෙක්ටයාර 4800 ක් පමණ උක් වගාව සඳහා යොදවා තිබුණද වර්තමානය වන විට කිසිදු බිම් කොටසක උක් වගා කටයුතු සිදු නොවන අතර අනවසර වගා කරුවන් විසින් වී ගොවිතැන සහ අනෙකුත් වගාවන් සඳහා මෙම ඉඩම් බලෙන් අත්පත් කරගෙන තිබුණද අනවසර වගාකරුවන් ඉවත් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | සමාගම සතු ඉඩම් වල වසර ගණනාවක සිට කිසිදු වගාවක් සිදු නොවන නිසා එම ඉඩම් අනවසරයෙන් අත්පත් කර ගැනීම් සිදුවිය හැකි නිසා ඒවා වැලැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | වැළැක්වීමේ පියවර කිසිවක් වාර්තා වී නොමැත. | අනවසර වගාකරුවන් ඉවත් කිරීමට කටයුතු කළ බවක් නිරීක්ෂණය නොවීය. |

| | | | | |
|---|---|---|---|---|
| (ණ) | 2017 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තා අනුව රු. 133,150,000 ක වටිනාකමකින් යුතු කර්මාන්තශාලා පරිශ්‍රයට අයත් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල, ගබඩා කාමර, විද්‍යාගාර, සීනි ගබඩා, ආරක්ෂක ගොඩනැගිල්ල, නිල නිවාස යනාදී ගොඩනැගිලි සමූහය නඩත්තු නොකිරීම සහ ඒවාට නිසි ආරක්ෂාවක් නොමැති වීම හේතුවෙන් එම ගොඩනැගිලි බොහොමයකට වන අලින්, වඳුරන් ආදී සත්ත්වයන්ගෙන් හානි සිදුවී ඇති බව නිරීක්ෂණය විය. තවද ගබඩා වල සහ කර්මාන්ත ශාලාවන්හි ඇති ලී බඩු, යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍රෝපකරණ අමතර කොටස් ඇතුළු වටිනා තොග ද විනාශ වෙමින් පැවතුණි. | කර්මාන්තායතනය සතු වත්කම් වලින් ප්‍රයෝජනයට ගත නොහැකි වත්කම් අපහරණය කිරීමටත් අනෙකුත් වත්කම් වල ආරක්ෂාවටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. | වන අලින්ගෙන් ගොඩනැගිලි ආරක්ෂා කර දෙන ලෙස වනජීවී කාර්යාලයට සහ පොලිසියට දැනුම් දී ඇති බව වාර්තා වේ. | භාවිතයට ගත නොහැකි වත්කම් බැහැර කර ඇති බව නිරීක්ෂණය නොවූ අතර වත්කම් ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |
| (ත) | කර්මාන්ත ශාලාවට අයත් වටිනා ගැල්වනයිස් බට කිසිදු ආවරණයකින් තොරව අනාරක්ෂිතව ගොඩගසා තිබූ අතර තවත් යකඩ බට තොගයක් ආයතනය ආසන්නයේ ඇති හමුදා කඳවුර සහ පන්සලේ කටයුතු සඳහා ගෙන ගොස් තිබුණද ඒවා නැවත ආයතනයට ආපසු බාර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත ශාලාව සතු ගබඩා වල පවතින තොග ආරක්ෂිතව තබා ගැනීමට කටයුතු කළ යුතුය.. | එම නළ නැවත ලබා ගැනීමට කටයුතු කරන බවද වාර්තා විය. | නැවත ලබා ගැනීමට කටයුතු කරන බවට කිසිදු තොරතුරක් නොවීය. |

## 4.70 සීමාසහිත ජය කන්ටේනර් ටර්මිනල්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 337,434,783 | 246,140,155 | 633,982,773 | 42,759,596 | 112,616,660 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 329,561,000 | 236,675,352 | 428,834,353 | 43,891,892 | 98,466,635 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 235,051,947 | 222,456,068 | 448,005,375 | 52,617,485 | 19,772,978 | තත්ත්වාගණනය කළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 337.43 | 246.14 | 633.98 | 42.76 | 112.62 |
| 2019 | 329.56 | 236.68 | 428.83 | 43.89 | 98.47 |
| 2020 | 235.05 | 222.46 | 448.01 | 52.62 | 19.77 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.3.8 අනුව දේපළ, පිරියත හා උපකරණ වල සුන්බුන් අගය, ඵලදායී ජීව කාලය හා ක්ෂය කරන ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කරන බව සඳහන් කර තිබුණි. | වත්කම් සමාලෝචන මණ්ඩලයකින් ලබාදෙන නිර්දේශ මත අවශ්‍ය ගැලපීම් සිදුකල යුතුය. | මෝටර් රථ වල ඵලදායී ජීව කාලය වසර 5 සිට වසර 7 දක්වා වැඩි කරණු ලැබුණේ ඉංජිනේරු කොට්ඨාශ ප්‍රධානීගේ නිර්දේශය මතය. මෙම වාහන වලින් කිහිපයක් වසර 5 ඉක්මවා ඇති අතර ඉදිරි | 2021 වසරේ සිට මෙම වත්කම් වල ඵලදායී ජීව කාලය සුනබුන් අගය ආදිය සමාලෝචනය කිරීමට ඉංජිනේරු කොට්ඨාශ ප්‍රධානී, |

| | | | | |
|---|---|---|---|---|
| | රු.65,507,108 ක් පිරිවැය වූ මෝටර් වාහන වල ඵලදායී ජීව කාලය වසර 5 සිට වසර 7 ක් දක්වා වත්කම් සමාලෝචන කමිටු නිර්දේශයකින් තොරව වැඩි කර තිබූ අතර සමාගම සතු පිරිවැය රු. 58,432,733 ක් වූ අනිකුත් දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගිණුම්කරණ ප්‍රතිපත්තියේ දක්වා ඇති පරිදි සමාලෝචන මණ්ඩලයක් විසින් සමාලෝචනයක් සිදු කර නොතිබුණි. | | වසර වලදී ද පාවිච්චි කිරීමට අපේක්ෂා කරන බැවින් එම තීරණය ගනු ලැබිණ. ඉදිරියේදී වත්කම් සමාලෝචන මණ්ඩලයක් පිහිටුවා එහි නිර්දේශ මත කටයුතු කරනු ඇත. | විධායක ඉංජිනේරුවරු සහ අනෙකුත් අංශයන් හි තාක්ෂණික දැනුම ලත් කමිටුවක් පිහිටුවීමට කටයුතු කර ඇත. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් සමාගමට ලැබිය යුතු ශේෂය රු.28,268,536 ක් ලෙස දක්වා තිබූ නමුත් එදිනට ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සමාගම වෙත ලබා දී තිබූ ශේෂ සනාථන ලිපිය අනුව අධිකාරිය විසින් සමාගමට ගෙවිය යුතු මුදල රු.26,947,624 ක් විය. මේ අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂයේ රු.1,320,912 ක හිඟයක් නිරීක්ෂණය විය. මෙම වෙනස තුළ ඇතුලත් වූ 2014 වර්ෂයේ සිට ලංකා ඛණිජ තෙල් සංස්ථාවෙන් ලැබිය යුතු රු.544,684 ක් 2022 පෙබරවාරි 23 දින වන විටද අයකර ගෙන නොතිබුණි. | අදාල ආයතන සමග සාකච්ඡාකර ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුය. | 2021 පෙබරවාරි මස 25 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වෙත මෙම හිඟ මුදල් පිළිබඳ වාර්තාවක් මුදල් කොට්ඨාශ ප්‍රධානී විසින් ඉදිරිපත් කරන ලදී .එහිදී අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණය වූයේ, එම මුදල් කෙසේහෝ අදාල සමාගම් වලින් අය කරගන්නා ලෙසටය. තවද ව්‍යාපාර සංවර්ධන හා මෙහෙයුම් ප්‍රධානී වෙත ඒ පිළිබඳව කටයුතු කරන මෙන් උපදෙස් ලබා දෙන ලදී . | රු. 544,684 ක මුදල ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාවෙහි කළමනාකාර අධ්‍යක්ෂක මගින් 2022 ජනවාරි වන විට ලබා දෙන බවට පොරොන්දු වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව ආයතනයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු මෙහෙයවීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යවස්ථාපිත වගකීම දැරිය යුතු වුවත් ජය බහළුම් පර්යන්ත සමාගමේ 2011 අගෝස්තු 29 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සේවකයන් බඳවාගැනීම, උසස්වීම් ලබාදීම, විශ්‍රාම ගැන්වීම සහ සේවකයන් සම්බන්ධ වෙනත් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය සභාපතිවරයාට පවරා ඇති බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර 2021 අප්‍රේල් 9 දින වන විටත් එම තීරණය නිවැරදි කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි. | සමාගමේ කටයුතු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය වගකිව යුතු බැවින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණ මත අදාල කාර්යයන් සිදු කල යුතුය. | 2021/02/25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි සභාපතිතුමා වෙත සේවක බඳවා ගැනීම්, විශ්‍රාම ගැන්වීම්, සේවය අවසන් කිරීම් ආදි අදාල අනෙක් කරුණු පිළිබඳ 2011/08/29 දිනැති අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව ලබාදි ඇති බලය පිළිබඳව සකච්ඡා කරන ලදී.<br>එහිදි තීරණය කරනු ලැබුවේ එකි බලතල යටතේ ගත් ක්‍රියාමාර්ග අධ්‍යක්ෂක මණ්ඩලය වෙත දැනුම් දිමට යටත්ව සිදු කළ යුතුබවය. එසේ සිදු නොකරන ක්‍රියා මාර්ග බල ශුන්‍ය හා අවලංගු තීරණ ලෙස සැලකිය යුතු වන බව තවදුරටත් තීරණය කරන ලදී. | අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කිරීමට යටත්ව එම කාර්යයන් සිදු කලයුතු බවටත් සභාපතිතුමා විසින් එවැනි කටයුතු සම්බන්ධයෙන් ආවරණ අනුමැතිය ලබා නොගෙන ඇත්නම් එම ක්‍රියා ශුන්‍ය හා බල රහිත බවටත් තීරණය කර ඇත . |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 5.1 වගන්තිය අනුව සමාගමේ අනාගත දිශාව පෙන්වන පරිදි හා තාත්වික හා ලඟාකරගත හැකි ඉලක්ක ඇතුළත් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිත, සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම කළමනාකරණයේ වගකීම වේ. | ආයතනය විසින් පිළියෙළ කරන ලද සංයුක්ත සැලැස්මේ පිටු අංක 20 -21 හි ආයතනය විසින් කෙටි කාලීනව හා දිගු කාලීනව ඉදිරි වසර 5 ඇතුලත නිම කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘති පිළිබඳ සැලසුමක් අන්තර්ගත කර ඇත. මේවා ආයතනයේ ඉදිරි වසර 5 තුල ඉටු කිරීමට | චක්‍රලේඛ අවශ්‍යතාවය පරිදි සංයුක්ත සැලැස්ම පිළියෙල කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | බලාපොරොත්තු වන අරමුණු සහ ඉලක්ක වේ. | |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය අනුව රජය සතු සමාගමක් විසින් කෙටිකාලීන තැම්පතු, භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැම්පතු හෝ වෙනත් මූල්‍ය ආයෝජනයන් සිදු කරන්නේ නම් මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවයෙ (Concurrence) ලබාගත යුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට පැවති රු.185,420,331 ක්වූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකගතාවය ලබාගෙන නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව රාජ්‍ය ආයතනයක අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී අදාල එකඟතාවය ලබාගත යුතු වේ. | ආයතනය විසින් සියළුම අතිරික්ත මුදල් ලංකා බැංකුවේ ස්ථාවර තැම්පතු වල ආයෝජනය කර ඇත. මෙම තැන්පතු සියල්ල 2019 වසරට පෙර සිදු කල තැම්පතු වේ. ඉදිරියේදී සිදුකරනු ලබන තැම්පතු සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | 2021 වසරේ සිට කරනු ලැබූ ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 9.2 වගන්තිය අනුව සෑම රාජ්‍ය ව්‍යාපාරයක් විසින්ම සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකල යුතු වුවත්, සමාගම ඉහත අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි මානව සම්පත් පිළිබඳ මෙම අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමට කළමනාකරණය කටයුතු කළයුතු වේ. | උපදේශකවරයෙකු තෝරා පත්කර ගැනීම සඳහා පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව හරහා උපදේශකවරයෙකු පත් කර සංවිධාන සැලැස්ම හා සේවක සංඛ්‍යාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. | අදාල ලියවිලි සකස් කිරීම සඳහා උපදේශකවරයකු තෝරා පත්කර ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. 2021/12/10 දිනට ලංසු භාර ගන්නා ලද අතර ලංසු 6 ක් ලැබී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය අනුව සමාගම සඳහා විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා රේඛීය අමාත්‍යංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබාගෙන නොතිබුණි. | විධිමත් හා විනිවිධභාවයකින් යුතුව මානව සම්පත් කළමනාකරණය කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ඡේදයේ දක්වා ඇති පරිදි අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වේ. | උපදේශකවරයෙකු තෝරා පත්කරගැනීම සඳහා පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව හරහා උපදේශකවරයෙකු පත්කර විධිමත් බඳවාගැනීමේ පරිපාටියක් සකස් කර අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය, රේඛීය අමාත්‍යංශයේ අනුමැතිය සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. | අදාල ලියවිලි සකස් කිරීම සඳහා උපදේශකවරයකු තෝරා පත්කර ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. 2021/12/10 දිනට ලංසු භාර ගන්නා ලද අතර ලංසු 6 ක් ලැබී ඇත. |
| (ඌෟ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී12 දරණ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති යහපාලනය පිළිබඳ චක්‍රලේඛයේ 9.9 වගන්තිය අනුව ආවරණ අනුමැතිය (Covering sanction) ලබා ගැනීම සඳහා එක් එක් මාසයේ අතිකාල ගෙවීම්වලට අදාල සියළු විස්තර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාගම විසින් 2020 වර්ෂයේදී ගෙවන ලද රු.26,915,745 ක අතිකාල ගෙවීම් වලට අදාල විස්තරාත්මක තොරතුරු මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අතිකාල ගෙවීම් වලට අදාල සියළු විස්තරාත්මක තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය. | ඉදිරියේ දී මේ පිළිබඳව කටයුතු කරනු ඇත . | 2021 වසරේ සිට අතිකාල ගෙවීම් වලට අදාල සියළු විස්තරාත්මක තොරතුරු අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වලට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| (එ) | 1954 අංක 19 හා 1954 අගෝස්තු 9 දිනැති සාප්පු හා කාර්යාල සේවක පනතේ I කොටසේ 3 හා | සාප්පු හා කාර්යාල සේවක පනතේ අවශ්‍යතා වලට | සමාගමේ සේවා අවශ්‍යතාවය අනුව පැය 24 සේවා මුරය මෙහෙයුම් කටයුතු | සමාගමේ සේවා අවශ්‍යතාවය අනුව හඳුන්වා දුන් පැය 24 |

| | | | | |
|---|---|---|---|---|
| | 7 වන වගන්තිය අනුව යම් ආයතනයක් සේවකයන් වැඩමුර ක්‍රමයට සේවයේ යොදවයි නම් දිනකට උපරිම පැය 8 කට හා සතියකට පැය 45 කට සීමා විය යුතු වුවත් සමාගම විසින් 2020 වර්ෂයේ මෙහෙයුම් කටයුතු සඳහා සේවයේ යොදවා තිබු සේවකයන් 46 දෙනෙකු පැය 24 ක වැඩමුර සඳහා සේවයේ යොදවා තිබුණි. | අනුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවය සොයා බැලිය යුතුය. | කාර්යක්ෂමව හා බාධාවකින් තොරව සිදු කිරීම සඳහා හඳුන්වා දී ඇත. එකී පැය 24 සේවා මුර ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 25.02.2021 දරණ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබී ඇත. | සේවා මුර ක්‍රමය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා 2021.02.25 අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී ඇත. |
| (ඒ) | 2014 ජනවාරි 06 දිනැති අංක 01/2014 කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2 වගන්තිය අනුව සමාගම කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව කාර්ය මණ්ඩල හා අදාල වැටුප් තීරණය කරනු නොලබන ආයතනයක් බැවින් ජීවන වියදම් දීමනාව හිමි නොවන අස්ථිත්වයක් වුවද 2018 වර්ෂයේ සිට රු.7,800 බැගින් සේවකයින් 95 ක් සඳහා ජීවන වියදම් දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. | ජීවන වියදම් දීමනාව ලබා දීම සඳහා 2018 මැයි 3 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලැබිණි. මේ සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා වෙත 2018.02.16 වන දින යවන ලද ලිපියට ප්‍රතිචාර දක්වමින් අදාල රේඛීය අමාත්‍යවරයා 23.02.2018 වන දින අධ්‍යක්ෂක ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යවා මේ සඳහා අනුමැතිය ඉල්ලා ඇත. | ගැටලුව නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඔ) | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 4 (i) සහ (ii) වගන්තිය අනුව සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ 4 (i) සහ (ii) වගන්ති අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවය කරන | අධිකාරියෙන් ඉවත්ව ගිය නිලධාරීන්ගේ කොටස් නම් කරන ලද නිලධාරීන්ට පැවරීමට කටයුතු කල යුතුය. | ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් හි කොටස් හිමිකම දරණ නිලධාරියකු වරාය අධිකාරියේ සේවයෙන් ඉවත්ව ගිය විට අධිකාරිය විසින් ඒ බව ජය කන්ටේනර් ටර්මිනල්ස් | මේ සම්බන්ධව ඉල්ලීමක් 2021.10.06 දින වරාය අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරීන් හය දෙනෙකු විසින් සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් එක් කොටස බැගින් දැරිය යුතුය. එසේම සමාගමේ කොටස් හිමිකම දරණ නිලධාරියෙකු අධිකාරියේ සේවයෙන් ඉවත්ව යන විට අධිකාරිය විසින් නම් කරනු ලබන නිලධාරින් හට කොටස් හිමිකම පැවරිය යුතු වුවද 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ලැබූ නිලධාරීන් පස් දෙනෙකුට නිකුත් කරන ලද කොටස් අයිතිය, අධිකාරිය නම් කරන ලද නිලධාරීන් පස් දෙනෙකු වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් කොටස් පැවරීමේ කටයුතුවල යාවත්කාලීන හා වලංගුභාවය පිළිබඳ නීතිමය ගැටළු ඇතිවීමේ අවධානම බැහැර කල නොහැකි විය . | අධිකාරියට නිකුත් කරන ලද කොටස් වලට අදාල කොටස් සහතිකය විගණනය සඳහා ඉදිරිපත් කල යුතුය. | ලිමිටඩ් වෙත කඩිනම්ව දැනුවත් කිරීමේ යාන්ත්‍රණයක් ඇති කරන ලෙස අධිකාරිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ. | |
| (ඕ) | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරණ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය අනුව තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර "2030 න්‍යාය පත්‍රය" අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර ඒ අනුව තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ලගා විය යුතු ආකාරය, ඉලක්ක | තිරසාර සංවර්ධන අරමුණු, හඳුනාගෙන ඒ අනුව ඉලක්ක පිහිටුවා, එම ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වේ. | එකඟ වේ. ඉදිරියේදී මෙය ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ඇත. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කර නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| | මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගැනීම සිදු කර නොතිබුණි. | | | |
| (ක) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය රු.1,540,551 ක් වූ අතර ඊට අදාල රඳවා ගැනීමේ බදු සහතිකපත් විගණනයට ඉදිරිපත් නොවුණි. ඒ හේතුවෙන් ඉහත රඳවා ගැනීමේ බදු මුදල් ආදායම් බදු ගෙවීමේදී අඩු කර ගැනීම පිළිබඳව අවිනිශ්චිත තත්ත්වයක් පවත්නා බව නිරීක්ෂණය විය | බදු බැර ලබා ගැනීමට අපේක්ෂිත රඳවා ගැනීමේ බදු වෙනුවෙන් අදාල සහතික රඳවා තබා ගැනීමට කටයුතු කිරීම කළමනාකරණයේ වගකීම වේ. | ස්ථාවර තැම්පතු සඳහා පොලිය ගිණුම් තැබීමේදී ආයතනය විසින් උපචිත පදනමට පොලී ආදායම සහ රඳවා ගැනීමේ බදු සෑම වසරකම දෙසැම්බර් මස 31 වනතෙක් ගිණුම් ගත කරනු ලබයි. (2020 ට පෙර) නමුත් බැංකුව විසින් රඳවාගැනීමේ බදු සඳහා සහතිකයක් නිකුත් කරණුයේ අදාල කල්පිරීමේ දිනය තෙක් පමණි.<br><br>ආදායම් බදු ගෙවීමේදී අඩු කර ගනු ලබන්නේ සහතික පත් වල පවතින ප්‍රමාණය බැවින් 2014 සිට 2019 දක්වා සෑම වසරකම රඳවා ගැනීමේ බදු ගිණුමේ කිසියම් මුදල් ප්‍රමාණයක් ඉතිරි විය. | මෙම රඳවා ගැනීමේ බදු පිළිබඳව හානිකරන වෙන්කිරීමක් ඉදිරියේදී සිදු කරනු ඇත. |
| (ග) | මෙට්‍රික් ටොන් 3200 ක් ගබඩා කල හැකි නව තෙල් ටැංකියක් ඉදිකිරීම සහ තෙල් ටැංකි 10 ක් ආවරණයවන පරිදි ගිනි නිවීමේ පද්ධතියක් සවි කිරීම සඳහා එකගවන ලද කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක් වූ රු.45,517,357 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම සඳහා සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂය තුලදී මුදල් | කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන බදු ඉන්වොයිසිය පදනම් කරගෙන යෙදවුම් බද්ද අඩුකර ගැනීමට කටයුතු කල යුතුය. | මෙට්‍රික් ටොන් 3200 ක් ගබඩා කල හැකි තෙල් ටැංකියක් ඉදිකිරීම සහ තෙල් ටැංකි සඳහා ගිනි නිවීමේ පද්ධතියක් සවි කිරීමට අදාල 20% ක අත්තිකාරම් මුදලට අදාලව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත රු.45,517,357.58 ක මුදලක් 2020 ඔක්තෝම්බර් මස 6 වන දින ගෙවනු ලැබීය.<br><br>එම මුදල වරායට ගෙවූ පසු 2020 ඔක්තෝම්බර් මස 20 | මෙය ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පළමු වරට ඉන්වොයිසිය නිකුත් කිරීමේදී සිදුවූ වරදකි. වර්තමානයේ මෙය නිවැරදිව සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබා දී තිබුණි. ඉහත මුදල තුළ අන්තර්ගත රු.3,371,656 ක් වූ එකතු කළ අගය මත බදු (VAT) වටිනාකම කොන්ත්‍රාත්කරු විසින් නිකුත් කරනු ලබන බදු ඉන්වොයිසිය ලබා ගැනීමකින් තොරව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ලිපි ශීර්ෂ යටතේ ලබා දුන් බදු ඉන්වොයිසියක් පදනම් කරගෙන සමාගම විසින් යෙදවුම් බදු ලෙස 2020 ඔක්තෝබර් මාසයේදී දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් බදු බැර ලෙස ලබා ගැනීමට කටයුතු කර තිබුණි. | | වන දින සභාපති ජය කන්ටේනර් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් වරාය අධිකාරිය වෙත ලිපියක් යවා එම මුදලෙහි අඩංගු රු.3,371,656.11 ක වැට් (VAT) බදු මුදල JCT ආයතනය වෙත නැවත ලබා දෙන ලෙස (refund) ඉල්ලා සිටින ලද අතර, ඉදිරියේදී මෙම ප්‍රාග්ධන වියදම් සඳහා කරණු ලබන ගෙවීම් සඳහා වැට් බදු මුදල ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්ම දරා, යෙදවුම් බද්දක් ලෙස අඩුකර ගැනීමට (claim) කටයුතු කරන මෙන් ඉල්ලා සිටින ලදී. නමුත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් 2020.11.05 දින දී මෙම වියදම සඳහා බදු ඉන්වොයිසියක් අප ආයතනය වෙත ලබා දෙන ලදී. එම බදු ඉන්වොයිසියට අනුව අප ආයතනය විසින් යෙදවුම් බද්දක් ලෙස මෙය අඩු කර ගනු ලැබීය. එසේ අඩුකර නොගතහොත් මෙම බදු මුදල නිසා අප ආයතනයෙහි වියදම් අධිගණනයක් සිදුවනු ඇත. | |
| (ච) | ආයතනය සතු තෙල් ටැංකි 13 තුල නියෝජිතයන් 07 දෙනෙකු සතු තෙල් වර්ග 03 ක් ගබඩා කරන අතර එහිදි නියෝජිතයන් විසින් ටැංකි පොදුවේ භාවිතා කරයි. ටැංකි තුලට පොම්ප කරන | පොත් ශේෂය හා භෞතික තොගය අතර වෙනස්කම් අවම වන පරිදි තෙල් ප්‍රමාණනය සඳහා තාක්ෂණික වශයෙන් | තෙල් කර්මාන්තය සඳහා ලෝකයේ භාවිතා කරන සෑම මිනුම් ක්‍රමයක්ම 100% නිවැරදි නොවේ. එය 0.05% පමණ ප්‍රතිශතයකින් වෙනස්වීමේ සම්භාවිතාවක් | බලපත්‍ර ලාභීන් ගේ තෙල් මිශ්‍රව තැම්පත් කිරීමේ ස්ථානයක් වශයෙන් දැනට ලෝකයේ පවතින නිවැරදිම ක්‍රම |

| | | | |
|---|---|---|---|
| තෙල් ප්‍රමාණය හා ඉවත් කරන තෙල් ප්‍රමාණය නිමානය කිරීම සඳහා යොදා ගන්නා උපකරණ වල පවත්නා දූර්වලතා හේතුවෙන් නිවැරදිව තෙල් තොගය නිමානය කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට පැවති තෙල් තොගයේ පොත් ශේෂ හා භෞතික ශේෂ අතර තෙල් මෙට්‍රික් ටොන් 557 ක අතිරික්තයක් නිරීක්ෂණය විය. | දියුණු ක්‍රම භාවිතා කිරීම කළමනාකරණයේ වගකීම වේ. | පවතී. මෙ.ටොන් 557, තෙල් ප්‍රමාණය එකතු වී ඇත්තේ, එකී වෙනසට අමතරව HSFO ටැංකි සහ තෙල් නල LSFO බවට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙසය. | වේදය අප විසින් භාවිතා කරන අතර මෙය ක්ෂත්‍රයේ තෙල් කර්මාන්තයේ භාවිතා කරන නිවැරදි ක්‍රමවේදයක් වේ. උදා : CPC, CPSTL භාවිතා කරන්නේද මෙම ක්‍රමවේදය වේ. |

## 4.71 මාගම්පුර වරාය කළමනාකරණ (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 30,472,055 | 832,031,579 | 1,249,093,942 | 4,045,091,813 | (801,559,524) | වියාචනය |
| **2019** | 67,625,610 | 196,129,361 | 1,275,834,471 | 4,200,336,094 | (128,503,752) | වියාචනය |
| **2020** | 54,206,475 | 301,080,892 | 1,319,275,274 | 4,490,651,313 | (246,874,417) | වියාචනය |




| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් යටතේ දැක්වෙන රු.12,430,943 ක් වූ තොග, ධාරණ අගය රු.406,546 ක් වූ ස්ථාවර වත්කම් සහ අත ඉතිරි මුදල් රු.173,727 ක් භෞතිකව නොපැවතුණි. රු.13,011,216 ක් වූ මෙම පාඩු | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු නිරීම හා වත්කම්වල ආරක්ෂාව සඳහා විධි විධාන යෙදීම | දේපළ, පිරියත හා උපකරණ කිසිවක් මේ වන විට සමාගම සතුව නොපවතී. එම දේපළ මේ වන විට හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහය සමාගම විසින් භාවිතා කරනු ලබනු ඇතැයි යන පදනම මත | වගකිව යුතු පුද්ගලයන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ පවත්වා නොමැති අතර ආයතනය සතුව භෞතිකව නොපවතින තොග සඳහා ඉදිරියේ දී තොග |

| | | | | |
|---|---|---|---|---|
| | සඳහා ප්‍රතිපාදනයන් ද මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබීම හේතුවෙන් වාර්ෂික/ සමුච්චිත පාඩුව එම ප්‍රමාණයෙන් වැඩි විය යුතු බව නිරීක්ෂණය විය. මූල්‍ය ප්‍රකාශනවල පවත්නා වත්කම් භෞතිකව නොපැවතීමට හේතු සහ ඊට වගකිවයුතු පුද්ගලයින් නිශ්චය කිරීමට පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් ද කළමනාකරණය විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. | කළමනාකරණයේ වගකීම වේ. | මෙම වටිනාකම සමාගම වෙත ගෙවන මෙන් ලිඛිතව එම සමාගම වෙත දැනුම් දී ඇත. ඉදිරියේදී මේ සඳහා හානිකරණ වෙන්කිරීමක් සිදුකිරීමට කටයුතු කරනු ඇත. තවද රු.12,430,943.00 ක් වූ ද තොග සහ රු.173,727.00 ක් වූ මුදල් ද සඳහා ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩලය තීරණයක් මත හානිකරන වෙන්කිරීමක් සිදු කරනු ඇත. | හානිකරණය සඳහා වෙන්කිරීමක් සිදු කිරීමට නියමිතය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ සමුච්චිත අලාභය රු.3,246,376,040 ක් වූ අතර එදිනට සමාගමේ ශුද්ධ වත්කම් රු.3,171,376,040 ක ඍණ අගයක් නිරූපණය විය. සමාගමේ මෙහෙයුම් කටයුතු 2017 නොවැම්බර් 13 දින සිට නතර කර තිබුණු අතර 2018 පෙබරවාරි 15 දින සමාගම ඈවර කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර තිබුණ ද, 2021 මාර්තු 15 දින දක්වාම ඈවරකරුවෙකු පත්කර නොතිබුණි. | සමාගම ඈවර කිරීමට තීරණය කර ඇති බැවින් එය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකල යුතුය. | මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම කැබිනට් අනුමැතියක් යටතේ පිහිටුවා ඇති බැවින් එය විසුරුවා හැරීම සඳහා ද කැබිනට් අනුමැතියක් ලබා ගතයුතු බව සමාගම විසින් තීරණය කරන ලදී. එබැවින් ඒ සඳහා අවශ්‍ය කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාව සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය වල පිටපත් දැනටමත් අමාත්‍යාංශ ලේකම්තුමා වෙතට භාර දී ඇත. කැබිනට් අනුමැතිය ලැබුණු පසු අවශ්‍යය අනෙකුත් පියවර කඩිනමින් ගනු ඇත. | සමාගම ඈවර කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇත. මේ අනුව මව් සමාගම වන ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග විශේෂ මහා සභා රැස්වීමක් (EGM) පවත්වා සමාගම ඈවර කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව 2020 දෙසැම්බර් 31 දිනට රජයෙන් ලැබිය යුතු රු.17,782,563 ක්, | විගණන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. | මේ පිළිබඳව ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු |

| | | | | |
|---|---|---|---|---|
| | නැව්තෙල් රක්ෂණය වෙනුවෙන් ලැබිය යුතු රු.28,040,453 ක් සහ වෙළඳ ණයගැතියන්ගෙන් ලැබිය යුතු රු.3,589,879 ක් සහ එදිනට සමාගම විසින් ගෙවිය යුතු රු.7,297,497 ක ශේෂයන්ට අදාළ මූලාශ්‍ර ලේඛන, ශේෂ සනාථන ලිපි, වයස් විශ්ලේෂණ වාර්තා සහ උපකාරක ලියවිලි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. තවද, ඉහත සඳහන් රු.49,412,895 ක් වූ ලැබිය යුතු ශේෂ අයකරගැනීම සඳහා වර්ෂය තුලදී කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | | කරන මෙන් අධ්‍යක්ෂක මණ්ඩලය දන්වන ලදී . |
| (ඇ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනට මව් සමාගම වන ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය ලෙස රු.103,666,952 ක් දක්වා තිබුණ ද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන අනුව එදිනට සමාගමට ගෙවිය යුතු ශේෂය රු.98,938,252 ක් විය. ඒ අනුව සමාගමට ලැබිය යුතු ශේෂයේ රු.4,728,700 ක වෙනසක් නිරීක්‍ෂණය විය. මෙම වෙනස්කම සඳහා හේතු වූ කරුණු පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ නොතිබුණි. තවද, ඉහත ශේෂය තුල අන්තර්ගත 2017 වර්ෂයේ සිට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අයකරගත යුතු වූ ටග් යාත්‍රා සඳහා වන්දි මුදල් | සමාගම වෙත ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතු වීම | මෙම මුදල් ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් අය කර ගැනීම සඳහා 2021.01.25 වන දින ලිපියක් යවා ඇත. එහෙත් එම මුදල් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් තවමත් ලබා දී නොමැත. | ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු ශේෂ සඳහා පෙර සනාතන ලිපි විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන මෙන් අධ්‍යක්ෂක මණ්ඩලය දන්වා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.25,719,981 ක්, කළමනාකරණ සේවා ගාස්තු රු. 76,547,855 ක් හා සමාගම් පරිශ්‍රයේ පිහිටි ඉන්ධන පිරවුම්හලෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් වාහන සඳහා නිකුත් කර තිබූ ඩීසල් හා පෙට්‍රල් ලීටර් 11,449 ක් සඳහා වූ රු. 1,399,116 ක් වූ ශේෂ 2021 මැයි 15 දින දක්වාම සමාගම වෙත ලැබී නොතිබුණි. | | | |
| (ඉ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාගමෙන් අධිකාරියට ලැබිය යුතු මුදල් ලෙස රු.5,800,921 ක් දක්වා තිබුණි. කෙසේ වුවද, සමාගමේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉහත මුදල ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා නොතිබුණි. ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව අධිකාරියට ලැබිය යුතු කළමනාකරණ ගාස්තු හා සමාගමේ විවිධ බිල්පත් පියවීම වෙනුවෙන් ඉහත මුදල අධිකාරියට ලැබිය යුතුව පැවතුණි. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග සාකච්ඡා කොට අදාළ මුදල ගෙවිය යුතු ශේෂයක් නම් එය සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමට කටයුතු කල යුතුය. | මේ සම්බන්ධව සොයා බලා කටයුතු කරනු ලැබේ. | මෙම මුදල ගෙවීම සම්බන්ධයෙන් සමාගම ඇවර කිරීමේදී සලකා බලනු ඇත. |
| (ඊ) | සමාගම විසින් 2014 වර්ෂයේදී නැව් තෙල් මිලදී ගැනීම සඳහා දේශීය පෞද්ගලික බැංකුවකින් ලබා ගෙන තිබූ රු.3,144,178,059 කට සමාන එක්සත් ජනපද ඩොලර් 24,002,438 ක ණය මුදලට අදාලව සමාගම විසින් 2017 වර්ෂයේදී සහ එයින් පසු වර්ෂවලදී ණය වාරික හෝ පොළී මුදල් කිසිවක් ගෙවා නොතිබුණි. සමාගමේ මූල්‍ය ප්‍රකාශ | ගරු අධිකරණය ලබාදෙන නඩු තීන්දුව ප්‍රකාරව කටයුතුකල යුතු වීම | සමාගමට විරුද්ධව අදාල බැංකුව විසින් 2020 වර්ෂයේදී ගොනු කර ඇති නඩුව පිළිබඳව ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමක් කරනු ඇත . | මෙම ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් සමාගම ඇවර කිරීමේදී සලකා බලනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුව සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු වූ රු.180,268,282 ක් වූ පොළී මුදල ද ඇතුලත්ව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ගෙවිය යුතු ණය හා පොළී මුදල රු. 971,528,124 ක් වී තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ණය හා පොළී ශේෂය රු. 4,480,972,700 කට සමාන එ.ජ.ඩො.24,038,495 ක් වී තිබුණි. මෙම ශේෂය සම්බන්ධයෙන් සමාගම විසින් 2021 ජනවාරි 12 දින ශේෂය සනාථන කැඳවා තිබුණ ද අදාල බැංකුව විසින් ශේෂ සනාථන ලබා දී නොතිබුණි. ඒ හේතුවෙන් ඉහත සඳහන් ගෙවිය යුතු ණය ශේෂයෙහි නිරවද්‍යතාවය පිළිබඳව අවිනිශ්චිතතාවයක් පැවතුණි. තවද මෙම ණය මුදල ආපසු අයකර ගැනීම සඳහා අදාළ බැංකුව විසින් 2020 වර්ෂයේදී සමාගමට විරුද්ධව නඩුවක් ගොනුකර පවත්වාගෙන යන නමුත් ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | | |
| (උ) | 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.2 වගන්තිය අනුව සමාගම එෆ් (F) වර්ගීකරණයට ඇතුළත්වන බැවින් සමාගමේ පාලක මණ්ඩල රැස්වීම් දීමනා ගෙවීම සඳහා නිර්දේශය හා එකඟතාවය ලබා ගත යුතු වේ. තවද, චක්‍රලේඛය අනුව එහි සඳහන් | විධිමත් අනුමැතියකින් තොරව ගෙවන ලද මුදල් අය කර ගැනීමට කටයුතු කල යුතු වීම. | 2020 ජනවාරි 13 වන දින ජනාධිපති චක්‍රලේඛ අංක පීඑස්/එස්පී/චක්‍රලේඛ/02/2020 ට අනුව අධ්‍යක්ෂක මණ්ඩල සමාජික දීමනාව මසකට රු.25,000.00 ක් දක්වා ගෙවිය හැක.මීට පෙර පැවති 2019 සහ 2018 රැස්වීම් සඳහා අධ්‍යක්ෂක | චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය නිර්දේශ හා එකඟතාවය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඒ (A) සිට ඊ (E) දක්වා වූ වර්ගීකරණය අනුව වැඩිම රැස්වීම් දීමනාව වූ රු. 12,500 ක් ඒ (A) ශ්‍රේණියේ රජය සතු ව්‍යාපාර සඳහා ගෙවනු ලබයි. එසේ තිබියදී, මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක නොකරන එෆ් (F) වර්ගයේ රාජ්‍ය ව්‍යාපාරක් වූ සමාගම 2020 වර්ෂයේදී පවත්වන ලද රැස්වීම් 04 ක් සඳහා සහභාගී වූ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත පැමිණීමේ දීමනාව රු.25,000 ක් බැගින් රු.475,000 ක් ද, 2019 හා 2018 වර්ෂ තුළ දී රැස්වීම් 15 ක් පැවැත්වීම වෙනුවෙන් රු.1,875,000 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි. තවද, ඈවර කිරීමට නියමිත වූ සමාගම වෙනුවෙන් වැයකරන ලද මෙම වියදම්වල ආර්ථිකභාවය මතභේදයට තුඩුදෙන බව නිරීක්ෂණය විය. | | මණ්ඩල අනුමැතින්ට යටත්ව ගෙවා ඇත. | |
| (ඌ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8 වගන්තිය අනුව සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂක මණ්ඩල තීරණවල ප්‍රගතිය සොයාබලා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කලයුතු වුවත් සමාගම විසින් වර්ෂය තුළදී එසේ සිදුකර නොමැති බව විගණනයේදී අනාවරණය විය. | අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා ඉදිරිපත් කිරීමට තටයුතු කල යුතු වීම. | මේ සඳහා සමාගම් ලේකම් වෙත උපදෙස් ලබා දී ඇති අතර, එය සමාගම් ලේකම්ගේ වගකීමකි. | සමාගම් ලේකම්ගේ කාර්යයක් බවත් ලේකම්ට උපදෙස් ලබා දී ඇති බවත් දන්වා ඇත. |
| (එ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශ අනුව ලැබිය යුතු රඳවා | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව | සියළුම බදු සම්බන්ධ ගෙවීම්, ඇපැල ඉදිරිපත් කිරීම් ආදී | 2017 සහ 2018 වර්ෂ වල රඳවා ගැනීමේ බදු සහතික |

| | | | | |
|---|---|---|---|---|
| | ගැනීමේ බදු ශේෂය රු.5,037,187 ක් වූ නමුත් එයින් රු.3,021,258 කට අදාල බදු සහතිකපත් විගණනයට ඉදිරිපත් නොවුණි. තවද, බදු සහතිකපත් නොවීම හේතුවෙන් ඉහත ලැබිය යුතු ශේෂය උපලබ්ධිවීම අවිනිශ්චිත බව නිරීක්ෂණය විය. | සමඟ සාකච්ඡාකර අවසාන එකඟතාවයකට පැමිණිය යුතු වීම. | කටයුතු සිදු කරමින් පවතී, මෙම අගය ද ඉතාමත් ඉක්මණින් නැවත ගණනය කිරීමෙන් පසුව පියවීමට කටයුතු කරනු ලැබේ. | පත් බැංකුව මගින් එකළ ලබා දී නැත. තවද 2019 න් පසු ආයතනයේ ආදායම් බදු වගකීමක් නොපවතින බැවින් මෙම රඳවාගැනීමේ බදු ශේෂය අදායම් බදු වගකීමට එරෙහිව කපා හැරිය නොහැකි තතත්වයක් පවතී. |
| (ඒ) | ව්‍යවස්ථාපිත ගෙවීම් අදාළ කාල පරිච්ඡේදයන් තුළදී නිරවුල් කළ යුතු වුවද, 2017 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.2,381,117 ක් වූ ගෙවිය යුතු ආදායම් බදු ශේෂය නිරවුල් කිරීමට සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නෙතිබුණි. | ව්‍යවස්ථාපිත ගෙවීමක් වූ ආදායම් බදු ශේෂය නිරවුල් කිරීමට කළමනාකරණය විසින් ක්‍රියාකල යුතුය. | පිළිතුරු ලබාදී නොමැත. | 2017 වර්ෂයට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.2,381,117 ක් වූ ගෙවිය යුතු අදායම් බදු ශේෂය නිරවුල් කර ගැනීම සඳහා එවකට සිටි මුදල් කළමනාකරු විසින් අදායම් බදු දෙපර්තමේන්තුව වෙත ලිඛිත ඇපැලක් යවා ඇත. |
| (ඔ) | 2018 වර්ෂයේදී සමාගමේ සේවකයන් වන්දි ගෙවා ඉවත් කිරීමේදී ඇති වූ ආරවුල් සහගත තත්ත්වය කොළඹ කාර්මික අධිකරණයේ, කාර්මික බේරුම්කරණ අංක.A/37/2017 දරන තීරණය සහ 2018 පෙබරවාරි 02 දින පාර්ශවකරුවන් අතර ඇති කර ගන්නා ලද සමථ කොන්දේසිවලට එකඟ වීම මත අවසන් කර තිබුණි. සමථ ගිවිසුමේ කොන්දේසි අංක 18 (ආ) අනුව 2017 නොවැම්බර් මාසය සඳහා හිඟ අතිකාල දීමනා සහ/හෝ 2018 ජනවාරි දක්වා හිඟ | වන්දි මුදල් ගෙවීමේදී සමථ කොන්දේසි අනුව කටයුතු කල යුතුය. එම කොන්දේසිවල පටහැනිව යම් ගෙවීමක් සිදු කර ඇත්නම් අදාල ගෙවීම්වලට වගකිවයුතු නිලධාරීන්ගෙන් ඒවා ආපසු අය කර ගැනිමට | සමථ මණ්ඩල සාකච්චා වලට සහභාගී වී ඇත්තේ එවකට සමාගමේ කළමනාකාරීත්වයයි. එම සමථ කොන්දේසි වල 18 "අ" සහ "ආ" යටතේ සේවකයන්ගේ හිඟ සිටින ලද වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එකඟ වූ කොන්දේසි දක්වා ඇත. එම කොන්දේසි එකඟවූ පදනම පහත පරිදි වේ.<br><br>2017 නොවැම්බර් මාසයේ 29 වන දින සියළුම සේවකයන් | වන්දි ගෙවීම් සම්බන්ධ විගණන නිරීක්ෂණය පිළිබඳව සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| වැටුප් ගෙවිය යුතුව ඇත්නම්, එම ගෙවීම් 2018 පෙබරවාරි 28 වන දිනට පෙර ගෙවා නිම කළ යුතු බවට එකඟ වී තිබුණි. සමාගම විසින් එම එකග වූ කොන්දේසිවලට පටහැනිව සමාගමේ මෙහෙයුම් අක්‍රියව පැවති 2017 දෙසැම්බර් සහ 2018 ජනවාරි මාසයන්ට අදාලව ගමන් වියදම්, නවාතැන් දීමනා, කාර්යසාධන දීමනා හා වාහන දීමනා ලෙස රු.12,211,073 ක් වූ වෙනත් දීමනාවන් සේවකයන් වෙත ගෙවා තිබුණි. මේ පිළිබඳව 2017, 2018 සහ 2019 වර්ෂවල විගණන වාර්තා මගින් ද පෙන්වා තිබු නමුත් අදාල කරුණ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර වැඩිපුර ගෙවීම් සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීම සඳහා කළමනාකරණය සහ වගකිවයුතු පාර්ශවයන් විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කළමනාකරණය ක්‍රියාකල යුතු වීම. | වෙත පරිශ්‍රයෙන් ඉවත් වන ලෙස දැනුම් දෙන ලදී.<br><br>ඒ වන විට නොවැම්බර් මාසයේ එතෙක් වැඩ කල කාලසීමාවට අදාළව අතිකාල දීමනා සහ වැටුප් ගෙවීම සිදු නොකර තිබු බැවින් විශේෂයෙන්ම නොවැම්බර් මාසය සඳහා ඇතිකාල දීමනා ගෙවන ලෙස එකඟ වී ඇත.<br><br>එමෙන්ම බහුතරයක් සේවකයන්ගේ 97% පමණම මූලික වැටුප රු. 12,000 - 20,000 අතර පැවතිනි .එබැවින් කාර්යසාධන දීමනාව සෑම සේවකයෙක් වෙතම ස්ථිර දීමනාවක් ලෙස සමාගම විසින් ආරම්භයේ සිටම ගෙවා තිබුණි.<br><br>තවද, ඉන්ධන, ප්‍රවාහන, නවාතැන් දීමනා ආදිය ගෙවනු ලැබුවේ සමාගමේ මධ්‍ය සහ ඉහළ කළමණාකාරීත්වයේ සේවකයන් 07 දෙනෙක් සඳහා පමණි. එම සේවකයන් වෙත සමාගමේ අවශේෂ කටයුතු පවත්වාගෙන යාම සඳහා දිගටම සේවයේ නිරතවන ලෙස උපදෙස් ලබා දී තිබුණි. සේවකයන් 360 කට වඩා සේවය කල සමාගමක් එක් වරම ව්‍යාපාර කටයුතු නතර කලද සේවකයන් ඉවත් කිරීම, වන්දි මුදල් සාකච්චා කිරීම, වත්කම් පැවරීම, ලියවිලි ඉවත් |


| | | | | |
|---|---|---|---|---|
| | | | කරගැනීම ආදී කටයුතු සඳහා ආයතනය නියෝජනය කරමින් සේවකයින් සිටිය යුතුය. එම සේවකයින් 2018.01.31 දක්වාම සිය සේවය පෙර පරිදි ම ආයතනය වෙත ලබා දෙන ලද බැවින් ඔවුන්ගේ සියළු වැටුප් ගෙවිය යුතුය. | |
| (ඕ) | ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් තුල ගෙවීම් වවුචර් සියල්ල අනුක්‍රමික අංක අනුව පිළියෙල කොට ආරක්‍ෂා සහිතව තබා ගත යුතුය. එසේම සියළුම වවුචර් විගණනය සඳහා සම්පූර්ණ කර සුදානම් කර තැබීමට වවුචර් භාර නිලධාරියා වගබලා ගත යුතු වුවද, මාගම්පුර වරාය කළමනාකරණ සමාගම විසින් 2017 සහ 2018 වර්ෂවලදී ගෙවීම් කරන ලද පිළිවෙලින් රු.29,975,094 කට රු.4,543,395 ක අදාළ ගෙවීම් වවුචර් 123 ක් 2021 මැයි 15 දින දක්වාම විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. | සමාගමේ ලිපි ලේඛණ හා වත්කම් පරිශ්‍රයෙන් ඉවත්වීමේදී විධිමත්ව හා ක්‍රමානුකූලව සිදු කර නොමැති හෙයින් ඒ පිළිබඳ වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | හම්බන්තොට වරාය පරිශ්‍රයෙන් පැය කිහිපයක් වැනි ඉතාමත් කෙටි දැනුම්දීමකින් සියළු සේවකයන් සහ ෆයිල් ආදිය ඉවත් කර ගැනීමට සිදු විය, එසේම සේවකයන් පරිශ්‍රය තුල බලෙන් රැඳී සිට වෘත්තීය ක්‍රියාමාර්ගයකට එලැඹෙන ලදී. එවන් පසුබිමක් තුල මෙම ලියකිවිලි අස්ථාන ගත වීමේ සම්භාවිතාවක් තිබූ බව එවකට සභාපති විසින් ද ඔබ වෙත කරුණු දක්වා ඇත. කෙසේ උවත් මෙම ගෙවීම් වලට අදාල චෙක් පත් වල පිටපත් ඔබ වෙත ඉදිරිපත් කර ඇත. | 2017 සහ 2018 වර්ෂය සඳහා අස්ථාන ගතවූ වවුචර සහ උපකාරක ලියවිලි පිලිබඳ පරීක්ෂා කිරීමට වරාය හා නාවික අමාත්‍යාංශයේ ලේකම් විසින් කමිටුවක් පත්කර ඇත. |
| (ක) | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අරමුණු අනුව ප්‍රසම්පාදනයකදී වඩාත් යහපත් වූ විනිවිදභාවයක් හා මනා පරිපාලනයක් පැවතීම තහවුරු කිරීමට සමාගම වගබලා ගත යුතු වුවත්, සමාගම විසින් 2020 | ප්‍රසම්පාදන කටයුතු වලදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කිරීම | ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටි නීතිඥයන්ට කරන වියදම් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත.නව අධ්‍යක්ෂක මණ්ඩලය රැස්වූ පළමු අවස්ථාවේ දී කොළඹ දිසා අධිකරණයේ පනවා ඇති DDR 1347/19 | මෙම මුදල් ගෙවා ඇත්තේ සම්පූර්ණ නඩු කටයුත්ත සඳහා වේ. නැවත කිසිදු ගෙවීමක් මේ සඳහා සිදු නොකෙරේ. |

| | | |
|---|---|---|
| වර්ෂයේදී ආයතනයේ නීතිමය කටයුතු සඳහා පෙනී සිටින නීතිඥ සමාගමකට රු.7,250,000 ක මුදලක් නීති වියදම් ලෙස ගෙවා තිබුණ ද, එම නීතිඥයන් තෝරා ගැනීමේදී විනිවිදභාවයකින් හා මනා පරිපාලනයකින් යුක්ත ක්‍රමවේදයක් අනුගමනය කරන ලද බවට තොරතුරු හා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම අදාළ නීති උපදේශක සමාගම සමඟ එළඹෙන ලද ගිවිසුම් ද විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | කළමනාකරණයේ වගකීම වේ. | දරණ නඩුව සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදී. එම නඩුව 2020.08.18 දින අධිකරණයේ කැඳවීමට නියම කර තිබුණි. මෙම නඩුවල විශේෂත්වය වන්නේ නඩුව කඳවන ප්‍රථම දිනයේදීම විරෝධතා ගොනු කළ යුතු බවයි. එසේ නොවුනහොත් ගරු අධිකරණය විසින් නඩුවේ ඉල්ලා ඇති බිලියන 4.4 මුදල සඳහා නෛසයි තීන්දු ප්‍රකාශය නියම කළහොත් සමාගම බරපතල අර්බුදයකට පත් වේ. මන්ද ඒ වන විටත් සමාගම සතුව තිබූ මුදල බිලියන 1.2 කට ආසන්න මුදලක් නිසාවේ. ඒ අනුව හැකි ඉක්මණින් ගරු අධිකරණය එකී විරෝධතා ගොනු කිරීමට අවශ්‍ය වූ නිසා ඒ සඳහා කාලයක් නොතිබූ බැවින් විශ්වාසවන්ත සහ හැකි ඉක්මණින් විරෝධතා සකස්කිරීම සඳහා නීතිඥ උපදෙස් ලබා ගැනීම ප්‍රධාන අවශ්‍යතාවයක් වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව ඉහත නීතිඥ වරුන්ගේ සහය ලබා ගන්නා ලදී. එහිදි නීතිඥවරුන් සඳහා නීතිඥ ගාස්තු මුදලින් ගෙවා ඇත්තේ සම්පූර්ණ නඩු කටයුත්ත සඳහා වේ. නැවත කිසිදු ගෙවීමක් මේ සඳහා සිදු නොකෙරේ. |

උපදේශන වැනි කරුණු, ප්‍රති-තර්ක ගොනු කිරීම, නඩුවට අදාළ ලිඛිත දේශන ගොනු කිරීම, අධිකරණය හමුවේ පෙනී සිටීම ඇතුළු නීතිමය කරුණු සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් ඇත්නම් ලිඛිත දේශන ගොනු කිරීම ආදී කරුණු නීතීඥවරුන් සඳහා ගෙවන මුදලින් ආවරණය කෙරේ.

## 4.72 සිලෝන් ෂිපිං කෝපරේෂන් ලිමිටඩ්

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 3,324,917,174 | 4,848,058,265 | 13,672,450,365 | 13,728,113,672 | (1,523,141,091) | තත්ත්වාගණනය කළ |
| **2019** | 3,989,119,660 | 5,074,335,216 | 13,730,143,678 | 15,005,645,794 | (1,085,215,556) | තත්ත්වාගණනය කළ |
| **2020** | 3,334,544,974 | 3,861,670,002 | 12,092,519,473 | 14,134,132,967 | (527,125,027) | තීරණය කර නැත |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | බොරතෙල් ප්‍රවාහන (CPC) පාලන ගිණුමේ රු.95,420,000 ක ශේෂයක් පසුගිය වසර 3 තුළ කිසිදු ගනුදෙනුවකින් තොරව ඉතිරි පැවතුනි. මෙම ශේෂය | කළමනාකරණය විසින් එම පාලන ගිණුම් සැසඳීමට කටයුතු කළ යුතු අතර විචල්‍යතා | ලංකා නැව් සංස්ථා සමාගම, ලංකා ඛනිජතෙල් සංස්ථාව සහ නියෝජිතයා අතර අතරමැදි | ලංකා නැව් සංස්ථාවේ නීති දෙපාර්තමේන්තුව මගින් අදාළ කරුණු නීතිපති දෙපාර්තමේන්තුව වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | සනාථ කර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. ECB ඉන්ටර්නැෂයල් ආයතනය ගෙවන ලද ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සඳහා ලංකා ඛනිජතෙල් සංස්ථාව වෙත 2014/15 වර්ෂයේදී රු.82,192,817 ක ඉන්වොයිසි 5 ක් නිකුත් කර ඇති බව විගණන පරීක්ෂණවලට අනුව අනාවරණය විය. කෙසේ වෙතත්, ECB ඉන්ටර්නැෂනල් ආයතනයට ප්‍රමාදයන් ලෙස සමාගම ගෙවා තිබුණේ රු.51,890,465 ක් වන අතර ඉන්වොයිස් මුදල සහ ගෙවූ මුදල අතර රු.30,302,352 වෙනසක් ඉහත ශේෂයට ඇතුළත් කර තිබුණි. | හඳුනා ගැනීමට ක්‍රියා කළ යුතුය. | පුද්ගලයෙකු ලෙස ක්‍රියා කර ඇති අතර දෙපාර්ශවයටම ඉන්වොයිසි නිකුත් කර ඇති අතර අයකරගැනීම් අයකරගන්නා විට ඒ අනුව පියවීම් සිදු කෙරේ. මූල්‍ය ප්‍රකාශන සහ ඒවාට ඉදිරිපත් කිරීමට නියමිත අවසාන ශේෂයන් උකහා ගන්නා පාලන ගිණුම් මෙය වන බව ඔබගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමු. LKAS 01 අනුව වාර්තා කිරීමේ කිසිදු උල්ලංඝනයක් සිදුකර නැත. එක් එක් පාර්ශ්වයන් සඳහා ගෙවිය යුතු සැබෑ ශේෂයන් ලංකා නැව් සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයේ වාර්තා කර ඇත. | යොමු කර ඇත. දැනට, උපදේශන කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල (LKAS 01) 32 වැනි ඡේදයට අනුව, වෙනත් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතියකට අවශ්‍ය නම් මිස වත්කම් සහ බැරකම් හෝ ආදායම් සහ වියදම් පියවා ගැනීමට අවසර නොදේ. | මූල්‍ය තොරතුරුවල නිරවද්‍යතාවය සම්පූර්ණත්වය සහ විනිවිදභාවය කළමනාකරණය විසින් සහතික කළ යුතුය. තවද ප්‍රමිතීන්ට | අප එයට එකඟ නොවන අතර LKAS 01 ට අනුකූලව, අපි අපගේ ලෙජර් ගිණුම්, සියලු වියදම් සහ ආදායම් මෙන්ම වත්කම් සහ වගකීම් තබා ඇත. ඔබගේ | මෙම විනිමය අනුපාත වෙනස්කම් 2021/2022 මූල්‍ය වර්ෂයේ සිට විනිමය ලාභ සහ අලාභ හෝ වෙනත් ආදායම් ලෙස හඳුනා ගැනීමට සමාගම අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කෙසේ වෙතත්, ඊට පටහැනිව සමාගම විසින් වෙන වෙනම ගිණුම්ගත කර තිබූ වෙළඳ සහ අනෙකුත් ණය රු.46,755,453 ක ශේෂය, වෙළඳ හා අනෙකුත් ලැබියයුතු ශේෂයට එදිරිව පියවා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුළු වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු හා වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අනුව ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. | ප්‍රකාශයට අනුව, බහාලුම් ආපසු යැවීමෙන් රු.46,755,453 ක් ලැබී ඇති අතර ඒවා ලංකා නැව් සංස්ථාවේ තොගකරුවන්ට ආපසු ගෙවනු ලැබේ. මෙය LKAS 01 හි 33, 34, සහ 35 ඡේදයන්ට අනුකූල වේ. | |
| (ඇ) | විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් වල බලපෑම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 21) 23 (අ) ඡේදයට අනුව, එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ දී විදේශ මුදල් අධීක්ෂණ අයිතම අවසාන අනුපාතය භාවිතා කර පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඊට පටහැනිව, 2019 මාර්තු 31 වන දිනට විදේශ වෙළඳ ණය ගැතියන් සහ විදේශ වෙළඳ ණය හිමියන් ශේෂ පිළිවෙලින් රු.348,746,443 ක් සහ රු.536,871,355 ක්, ගනුදෙනුව සිදු වූ දිනයේ පැවති අනුපාතය භාවිතා කර පරිවර්තනය කර ඇත. තවද, විදේශීය ණය හිමියන් සඳහා එක්සත් ජනපද ඩොලර් අගයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ශේෂ පරිවර්තනය කිරීමේදී කළමනාකරණය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 21 (LKAS 21) සමඟ අනුකූල විය යුතුය. | එම ණයගැති ශේෂයන් බොහොමයක් වාණිජ දෙපාර්තමේන්තුව විසින් අයකරගෙන නොතිබුණි. එබැවින් එම අගයන් මූල්‍ය ප්‍රකාශය සඳහා විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය නොකර සිටීමට කළමනාකාරිත්වය තීරණයක් ගෙන ඇත. | මෙම විදේශීය ණය හිමියන් වසර 10 කට වඩා ක්‍රියාත්මක නොවන බැවින් මෙම දිනට අගය නොකිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | වත්කම් අපහායනය කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (LKAS 36) අනුව, සමාගම විසින් තම යාත්‍රා දෙකෙහි කිසිදු අපහායනයක් නොමැති බවට තක්සේරු කර තිබුණි. එම ක්‍රියාවලියේදී ඉදිරි වසර 23 සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් අපේක්ෂා කරන බව සමාගම ඇස්තමේන්තු කර තිබුණි. එම උපලේඛන අනුව 2020/21 වසර සඳහා විවෘත වෙළඳපල මෙහෙයුම් සඳහා එක් එක් යාත්‍රාවේ සාමාන්‍ය කුලී ගාස්තුව දිනකට ඩොලර් 13,754 කි. කෙසේ වෙතත්, වාණිජ කළමනාකරණ සමාගම් සමඟ ඇති කර ගත් ගිවිසුමට අනුව 2020 අගෝස්තු දක්වා සත්‍ය ඉපැයීම් MV Ceylon Breeze සහ MV Ceylon Princess සඳහා පිළිවෙලින් ඇමරිකානු ඩොලර් 5,893 සහ ඇමරිකානු ඩොලර් 8,236 පමණක් බව නිරීක්ෂණය වේ. ඒ අනුව සැබෑ සහ පුරෝකථනය කළ කුලී ගාස්තු අතර සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, සමාගම විසින් එම කාරණය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයේ සටහන්වල කිසිදු අනාවරණයක් කර නොතිබුණි. | යථාර්ථවාදී පුරෝකථන හැකිතාක් ඉදිරිපත් කළ යුතු අතර අවශ්‍ය යැයි හැඟේ නම් සුදුසු අපහායන ප්‍රතිපාදන යෙදිය යුතුය. | M/S Clarkson Research Intelligence Weekly Reports Supermax මත පදනම්ව සාමාන්‍ය කුලියට ගැනීම, වාර්ෂික ඉපැයීම් සඳහා මෙට්‍රික් ටොන් එකක හීතිය අනුපාතය සහ ඉන්දන ගැලපුම සඳහා PLATTS bunker wire දර්ශකය ගණනය කිරීම සඳහා ගනු ලැබුවේ වඩාත් විශ්වාසදායක සාධාරණ මූලාශ්‍රයක් වූ නමුත් පැතිරීම Covid - 19 පැතිරීම හේතුවෙන් ලෝක ආර්ථිකය විශාල ලෙස පහත වැටනු බැවින් අනපේක්ෂිත තත්ත්වක් ඇති වුනි. වසංගතය සමඟ 2020 වසරේ වෙලඳපොල පෙර නොවූ අයුරින් පහත වැටී ඇත. බොහෝ රටවල් අගුලු දමා ඇති අතර ඉන්දියානු උප මහාද්වීපයේ විවිධ වරායන්හි අනුපාතික බලපෑම ප්‍රකාශ කරන ලද කාල සීමාව තුළ | 2019/20 මූල්‍ය ප්‍රකාශනයේ ද මේ සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් සිදුකර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | මෙම යාත්‍රා දෙකම කුලියට ගැනීම සඳහා විවෘතව පැවති අතර Mv. Ceylon Prince 2020 අප්‍රේල් 19 වැනි දින කුලියට ලබා දුන් අතර ඒ වන විට BSI Asia දර්ශකය අනුව දිනකට ඇමරිකානු ඩොලර් 2,886ක් වූ අතර M/S Clarkson දර්ශකයේ supermax ප්‍රමාණය දකුණු අප්‍රිකාව සිට ඉන්දියාවේ බටහිර වෙරළ දක්වා RBCT සඳහා දිනකට ඇමරිකානු ඩොලර් 2,312ක් විය. | |
| (ඉ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 25 වැනි ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී, කළමනාකරණය විසින් ආයතනයක අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරු කළ යුතුය. එම තක්සේරු කිරීම සිදු කිරීමේදී, ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි සිදුවීම් හෝ කොන්දේසි සම්බන්ධ සැලකියයුතු අවිනිශ්චිතතාවයන් පිළිබඳව කළමනාකාරීත්වය හඳුනාගන්නේ නම්, ආයතනය එම අවිනිශ්චිතතාවයන් හෙළිදරව් කළ යුතුය. කෙසේ | කළමනාකාරිත්වය විසින් එවැනි පාඩු තවදුරටත් සිදුවීම වැළැක්වීමට කඩිනම් පියවර ගත යුතු අතර නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය දැක්වීම සඳහා මූල්‍ය ප්‍රකාශනයේ එය ඉදිරිපත් කළ යුතුය. | නිරීක්ෂණය සමඟ එකඟ විය | මෙම තත්ත්වය මඟහරවා ගැනීම සඳහා සමාගම විසින් 2021 ජූලි 3 වැනි දින පැවති ඔවුන්ගේ විශේෂ රැස්වීමේදී අවම කිරීමේ ක්‍රියාමාර්ග කිහිපයක් යෝජනා කර ඇත.<br>ඩොලර් මිලියන 1,009 ක ණය ශේෂය 2020 මාර්තු 31 දිනට ශ්‍රී ලංකා රුපියල් වටිනාකමට පරිවර්තනය කිරීමෙන් ඇති වූ විනිමය අලාභය, සමාලෝචිත වර්ෂයේ අලාභයට ප්‍රධාන හේතුව වූ බව 2019/20 |

වෙතත්, මූල්‍ය ප්‍රකාශනවලින් අවිනිශ්චිත තත්ත්වයන් හඳුනාගත හැකි වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය අනාවරණය කර නොතිබුණි.

මූල්‍ය වර්ෂයට අදාළ විශේෂ මහ සභා රැස්වීම වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවේ දැක්වේ.

නමුත්, මෙම රැස්වීමේදී ඇමරිකානු ඩොලර් ණය ශ්‍රී ලංකා රුපියල් ණයක් බවට පරිවර්තනය කිරීමට සහ නැව් ඉදිකිරීමේ කර්මාන්තයේ සාමාන්‍ය භාවිතය පරිදි පොලී අනුපාතය සියයට 7.88 සිට සියයට 2 - 4 දක්වා අඩු කිරීම ඇතුළු හිතකර කොන්දේසි සහිතව ණය නැවත සකස් කිරීමට කළමනාකාරිත්වයට අනුමැතිය ලබා දී ඇත.

කෙසේ වෙතත්, මහ බැංකුවෙන් ඒකඟතාවය නොලැබුණු බැවින් ණය මුදල රුපියල් බවට පරිවර්තනය කිරීමට නොහැකි විය.

බැංකුව විසින් ණය කාලය වසර 15 සිට අවුරුදු 20 දක්වා නැවත සකස් කර ඇත.

නමුත් පොලී අනුපාතිකය අපේක්ෂා කළ පරිදි සියයට 2 - 4 ප්‍රමාණයකින් අඩු කර නොතිබූ අතර සියයට 5.25 සිට සියයට 0.25ක් පමණක් සහ මාස 6ක LIBO අඩු කර ඇත. එබැවින්, අංක:

259/2021/151 දරන අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව ඇමරිකානු ඩොලර් සිට ශ්‍රී ලංකා රුපියල් වෙත ණය පරිවර්තනය කිරීමට පෙර සහ පසු ජනනය වන මුදල් ප්‍රවාහ මත පදනම් වූ ප්‍රධාන පාඩු අවම කිරීමේ සාධකය සාර්ථක වී නොමැත.


තවද, 2020 නොවැම්බර් 17 වැනි දිනැති කැබිනට් තීරණයට අනුව ණය ප්‍රතිමූල්‍යකරණ ක්‍රියාවලිය 2022 ජනවාරි 21 වන විටත් අවසන් කර නොතිබුණි.

ශ්‍රී ලංකා ධජ ලේඛනය ප්‍රවර්ධනය කිරීම, පාවෙන ඉන්ධන ගබඩාවක් ක්‍රියාත්මක කිරීම, නොරච්චෝලේ මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා බෝට්ටුවක් සකස් කිරීම, බංග්ලාදේශ නැව් සංස්ථාව සමඟ සම්බන්ධීකරණයෙන් කොළඹ සහ බංගලාදේශය අතර පෝෂක සේවාවක් ක්‍රියාත්මක කිරීම සහ කාලයෙන් කාලයට හිස් බෝට්ටු කුලියට ගැනීමේ පදනම මත ටැංකි නැවක්

කුලියට ගැනීම හෝ මුහුදු මගින් බොරතෙල් ප්‍රවාහනය සඳහා ඇතුළුවීම වැනි දිගුකාලීන වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ව්‍යාපාර උපාය මාර්ගයක් ලෙස ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීම සඳහා වන වෙනත් යෝජනා ක්‍රියාත්මක කර නොමැත.

## 4.73 නෝර්ත්සී ලිමිටඩ්

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 383,791,242 | 394,688,954 | 456,729,008 | 418,731,312 | (10,897,711) | තත්ත්වාගණනය කල |
| **2019** | 258,829,633 | 376,990,294 | 366,679,295 | 471,140,734 | (118,160,662) | වියාචනය |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නැත | | | | | |




| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| (අ) 2001 නොවැම්බර් සිට 2019 දෙසැම්බර් දක්වා කාලයට අදාළව එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු වැනි ව්‍යවස්ථාපිත ගෙවීම් පියවීමට සමාගම විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 දෙසැම්බර් 31 වන විට එකතුව | අනවශ්‍ය දඩ ගෙවීම් වළක්වා ගැනීම සඳහා කළමනාකරණය අදාළ බදු නීතිවලට අනුකූල විය යුතුය | එකතු කළ අගය මත බද්ද නොගෙවීම සම්බන්ධයෙන් සමාගම කිසිදු දඩ මුදලක් නොගෙවූ අතර එය ඉවත් කරන ලෙස මුදල් අමාත්‍යාංශයට අභියාචනයක් යොමු කර ඇත. | වගකීම් ඉවත් කිරීමට කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.212,299,019 ක හිඟ මුදල් පැවතුනි. තවද, එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු නියමිත කාලය තුළ නොගෙවීම හේතුවෙන් රු.34,677,273 ක දඩ මුදලක් ගෙවීමට සමාගමට සිදුවී තිබුණි. | | | |
| (ආ) | වීරවිල සහ යාපනයේ පිහිටි සමාගමේ කර්මාන්තශාලා සහ ස්ථිර ගොඩනැගිලි රු.11,247,881 ක වියදමකින් ඉදිකර තිබුණද, මෙම ඉඩම්වල අයිතිය සමාගමේ නමට පවරාගෙන හෝ සමාගම වෙත ඉඩම් බදු පදනමට ලබා ගෙන නොතිබුණි. | අනාගතයේදී කිසිදු නීතිමය ගැටලුවක් මතුවීම වළක්වා ගැනීමටත්, එම පරිශ්‍රයේම ආයෝජනය සහ ව්‍යාපාර පවත්වාගෙන යාම ආරක්ෂා කර ගැනීම සඳහාත් ඉඩමේ අයිතිය සමාගමේ නමට පවරා ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. | සීමාසහිත නෝර්ත්සී හි වත්මන් කළමනාකාරීත්වය යාපනය සහ වීරවිල කර්මාන්තශාලාවල ඉඩම්වල අයිතිය සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගනු ඇත. | සීමාසහිත නෝර්ත්සී සමාගමට ඉඩම් පවරා ගැනීම සඳහා සාකච්ඡා සිදුකරමින් පවතියි. |
| (ඇ) | 2018 දී රු.3,076,305 ක රජයේ ප්‍රදානයක් වියදම් කරමින් ලුණුවිල කම්හල සඳහා අපජල පද්ධතියක් සමාගම විසින් මිලදී ගෙන ඇති අතර, ඒ සඳහා පසුව 2019 දී ද ඒ සඳහා රු.2,531,801 ක් වියදම් කර ඇත. කෙසේ වෙතත්, 2021 මැයි 31 දින වනවිටත් එම පද්ධතිය භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුනි. | අදාළ කරුණ සම්බන්ධයෙන් විමර්ශනයෙන් පසු නිෂ්ක්‍රීය වත්කම් සම්බන්ධයෙන් කළමනාකාරීත්වය නිසි පියවර ගත යුතුය. | සමාගම විසින් කාර්ය සාධන බැඳුම්කර දළ වශයෙන් රු.මිලියන 7.3ක් අපජල පවිත්‍රාගාරයට අදාළව මුදල් කරගෙන ඇති අතර එය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම මුදල කොටස් වශයෙන් අයකර ගන්නා ලදී. මෙම වත්කම පෙර කළමනාකාරිත්වය විසින් ස්ථාපනය කරන ලද අතර එහි ක්‍රියාකාරී නොවන තත්ත්වය සඳහා ඔවුන් වගකිව යුතුය. | එය රසායනික අපජල පවිත්‍රාගාරයක් නොවන බැවින්, එය භාවිතා නොකෙරේ. නමුත් කාර්ය සාධන බැඳුම්කරය මුදල් කර මුදල් අයකරගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 5 වන වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කළ වහාම, සමාගම විසින් එම පුද්ගලයාට හිමි කොටස සංස්ථාගත කිරීම සඳහා වන අයදුම්පතෙහි නම් කර ඇති එක් එක් කොටස් හිමියාට නිකුත් කළ යුතුය. සමාගම 2001 දී සංස්ථාපිත කර සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇති අවස්ථාවේ සමාගම කොටස් නිකුත් කර තිබුණද, එහි කොටස් හිමියන්ට කොටස් සහතික නිකුත් කර නොතිබුණි. | කොටස් හිමියන්ට කොටස් සහතික නිකුත් කළ යුතුය. | රු. 700 ක් වූ සමාගමේ ආරම්භක ප්‍රාග්ධනය, සමාගම සංස්ථාගත කිරීමේ සිට 2014/15 මූල්‍ය වර්ෂය දක්වා රු.100 බැගින් වූ කොටස් හතකින් කොටස් හිමියන් හත් දෙනෙකුට නිකුත් කරන ලදී. පසුව, 2015/16 වර්ෂයේදී එය අවලංගු කරන ලද අතර වත්කම්, ආරම්භක ප්‍රාග්ධනය ලෙස පවරන ලදී. පෙර කළමනාකාරීත්වය විසින් කිසිදු කොටස් සහතිකයක් නිකුත් කර නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් අපට මග පෙන්වීම් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ඉල්ලීමක් යවා තිබුණද, එයට කිසිදු ප්‍රතිචාරයක් නොලැබුණි. | කොටස් සහතික නිකුත් කර නොතිබුණි |
| (ඉ) | 2018 වර්ෂයේ රාජ්‍ය බැංකුවකින් ණයවර ලිපි ණයක් ලබා ගැනීම හේතුවෙන් 2018 වසරේ සිට 2020 ජූලි දක්වා කාලයට අදාළ පොලී වියදම රු.14,420,368 ක් වන අතර එය මෙම කාලසීමාව තුළ වියදම් ලෙස පෙන්වා දී ඇති බැවින් වර්ෂය සඳහා වූ ශුද්ධ අලාභය සහ ජංගම වගකීම් වැඩිපුර දක්වා ඇත. තවද, රු.56,399,310 හි හිඟ ණය සඳහා වන තහවුරු කිරීම ද විගණන කටයුතු අවසන් කරන විටත් ලබාගෙන නොතිබුණි. | කළමනාකරණය විසින් යම් කාල පරිච්ඡේදයකට අදාළ වියදම් හඳුනාගෙන ලාභ/අලාභ සහ වත්කම්/බැරකම් වැඩි හෝ අඩුවෙන් දැක්වීම වළක්වන අයුරින් මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. | ලංකා බැංකුව විසින් වසර අනුව ආනයන ණය පොලී විස්තර පිළිබඳ නිශ්චිත බණ්ඩනය කිරීමක් අපට ලබා නොදුන් අතර 2018/19 වර්ෂයට අදාළ ආනයන ණය පොළිය 2018/19 වර්ෂය සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොමැත. එබැවින්, Covid 19 වසංගතය හේතුවෙන් මාර්තු 16 සිට මැයි 11 දක්වා සමාගම වසා දැමීම නිසා ගිණුම් පියවීම ප්‍රමාද වූ බැවින්, 2020 ජූලි මාසයේදී ගිණුම් පියවූ දිනයේ සම්පූර්ණ පොළිය 2019/20 වසර සඳහා | ගැටළුව විසඳීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| | | | මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු කෙරිනි. වර්තමාන 2020/21 වර්ෂයේදී තත්ත්වය නිවැරදි කර ආනයන ණය පොලිය ඒ අනුව අය කෙරේ. | |
| (ඊ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 20 අනුව, සධාරණ අගයක් සහිත මූල්‍ය නොවන ප්‍රදාන ඇතුලු වත්කම් සම්බන්ධ ප්‍රදාන, විලම්බිත ආදායම් ලෙස හෝ වත්කමේ අගය අඩු කිරීමෙන් හෝ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්විය යුතුය. එහෙත්, ඊට පටහැනිව සමාගම විසින් වත්කම්වල ඵලදායී ජීව කාල නොසලකා හරිමින් 2018/2019 වර්ෂයේ රු.103,500,000 ක්ද 2016/2017 වර්ෂයේ රු.99,968,373 ද වශයෙන් වත්කම් මිල දී ගැනීම සඳහා වූ රජයේ ප්‍රදාන සියල්ල ක්‍රමක්ෂය කර තිබුණි. කෙසේ වුවද, මෙම දෝෂය වාර්තාව නිකුත් කරන දින වන විටත් නිවැරදි කර නොතිබුණි. එබැවින්, 2019 අප්‍රේල් 01 දිනට වූ සමුච්චිත අලාභය අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී.ලං.ගි.ප්‍ර. (LKAS) අනුව, ගිණුම් කටයුතු සිදුකරන බව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. ඒ අනුව රජයේ ප්‍රදාන ශ්‍රී.ල.ගි.ප්‍ර. (LKAS) 20හි දක්වා ඇති අවශ්‍යතාව පරිදි ගිණුම්ගත කළ යුතුය. | මෙම රජයේ ප්‍රදාන මූල්‍ය වර්ෂ 2015/16 සිට මූල්‍ය වර්ෂ 2019/20 දක්වා හිමිකම ලෙස වර්ගීකරණය කරනු ලැබූ බැවින් එය ආපසු ගෙවීම අවශ්‍ය නොවේ. ඒ හේතුවෙන් එම ප්‍රදානය දැනටමත් උපයෝජනය කර ඇති බැවින් ජංගම නොවන වගකීම් යටතේ විලම්බිත ආදායමක් ලෙස දැක්වීම ප්‍රායෝගික නොවේ. තවද, 2015/16, 2016/17, 2017/18 සහ 2018/19 මූල්‍ය වර්ෂවල ප්‍රදාන පිළිබඳ කටයුතු කළ ආකාරය විගණනය විසින් අනුමත කර තිබුණු අතර මෙම ප්‍රදාන, ප්‍රාග්ධන සංචිත ලෙස සැලකීමට ජාත්‍යන්තර ප්‍රමිතීන් විසින් අවසර දී ඇත. කෙසේ වුවද, රජයේ ප්‍රදාන වර්ගීකරණය පිළිබඳ භාණ්ඩාගාර නියෝජිතයින් විසින් වාර්ෂික මහා සභා රැස්වීමේදී විමසනු ලැබූ අතර ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අංක 20 අනුව කටයුතු කිරීමටත් එය විලම්බිත ආදායමක් ලෙස සලකා ජංගම නොවන වගකීමක් ලෙස | 2020/21 මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වර්ගීකරණය කිරීමටත් කටයුතු කරන ලෙස අප දැනුවත් කර තිබුණි. රජයේ ප්‍රදාන වර්ගීකරණය පිළිබඳ දෝෂය නිවැරදි කිරීමට එකඟ වූ අතර එය 2020/21 මූල්‍ය වර්ෂයේ සිට ජංගම නොවන වගකීම් යටතේ විලම්භිත ආදායමක් ලෙස සලකා වර්ගීකරණය කිරීමට කටයුතු කරනු ඇත. | |
| (උ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 25 වැනි ඡේදයට අනුව, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී, කළමනාකරණය විසින් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තක්සේරුවක් කළ යුතු අතර යම් ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් අනාවරණය කළ යුතුය. ඊට පටහැනිව, මූල්‍ය ප්‍රකාශන සකස් කරන අවස්ථාවේ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පැවතියද, ඒවා එහි සටහන් ලෙස අනාවරණය කර නොතිබුණි. | කළමනාකරණය විසින් ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී ඇති අවිනිශ්චිතතාවයන් සලකා බැලිය යුතු අතර මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට සමාගමේ සැබෑ තත්ත්වය ඉදිරිපත් කල යුතුය. | නොර්ත් සී සමාගම යනු සියයට 100ක් භාණ්ඩාගාරය සතු සමාගමක් වන අතර ආරම්භයේ සිටම අවිනිශ්චිතතාවයන්ට මුහුණ දී ඇත. සංයුක්ත සැලැස්ම තුළ අපගේ ගැටළු සඳහන් කර ඇති අතර අපි ඒවා විසඳාගෙන ඉදිරියට යාමට උත්සාහ කරමු. | 2020/21 මූල්‍ය ප්‍රකාශන 2022 පෙබරවාරි 28 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඌ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව වාර්ෂික අයවැය, ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සැලැස්ම, ආපසු ගෙවීමේ සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම ඇතුළුව ඉදිරි මූල්‍ය වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, 2020 මාර්තු 31 න් අවසන් වසර සඳහා සමාගම විසින් එවැනි | කළමනාකාරිත්වය අදාළ චක්‍රලේඛය මගින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූල විය යුතු අතර සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. | 2019/2020 වර්ෂයේදී අපට කිසිදු ප්‍රදානයක් නොලැබුණු නිසා සහ ක්‍රියාත්මක කිරීමට නිශ්චිත වාණිජ ක්‍රියාකාරකමක් නොතිබූ නිසා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම, අයවැය, ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ඇත. මානව සම්පත් සැලැස්ම අවසන් කරමින් පවතී. |

ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 4.74 මන්තායි සෝල්ට් ලිමිටඩ්

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 170,096,004 | 128,359,827 | 302,344,046 | 108,470,777 | 41,736,177 | තත්ත්වාගණනය කල |
| **2019** | 115,888,547 | 103,590,304 | 296,506,131 | 89,836,529 | 12,298,244 | තත්ත්වාගණනය කල |
| **2020** | 218,204,048 | 148,035,518 | 350,461,990 | 86,973,075 | 70,168,530 | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මන්නාරම ලුණු ලේවායේ 2018 මාර්තු 31 දිනට රු.7,012,838 කට සමාන මෙට්‍රික් ටොන් 1,243.4 ලුණු තොග හිඟයක් පැවති අතර 2019 මාර්තු 31 දිනට රු.4,959,911 ට සමාන | තොග පවත්වාගෙන යාමේදී නිරවද්‍යතාවය පවත්වා ගැනීම සඳහා කළමනාකාරීත්වය විසින් ඉන්වෙන්ටරි තක්සේරු කිරීමේ පරිචය භාවිතය භාවිතා කළ යුතුය. | අස්වැන්න නෙළන ලද ලුණු පැතලි ආකෘතිය මත තැබූ වහාම කම්කරුවන් විසින් ත්‍රිකෝණ කදම්භයේ හැඩගස්වනු ලබන අතර පසුව විද්‍යාත්මක සූත්‍රය භාවිතා කර බර ගණනය කරනු ලැබේ. | අස්වනු නෙළන ලද ලුණු මිනුම් කිරීම සඳහා භාවිතා කරන සම්මත ක්‍රියා පටිපාටිය සකස්කර ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | මෙට්‍රික් ටොන් 797.7 ක ලුණු තොග හිඟයක් පැවතුනි. කෙසේ වෙතත්, තොග හිඟය විමර්ශනය කිරීමටත් මූල්‍ය ප්‍රකාශනවල තොග හිඟය ගැලපුම්කිරීමටත් කටයුතු කර නොතිබුණි. තවද, සැකසෙමින් පවතින තොග මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තවද, සමාගම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත වල 3.19 ඇ (ii) හි අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. | බර = අගය X ඝනත්වය<br>Wight = (HXBXL) ලුණු වල ඝණත්වය<br>මෙම මිනුමේ දුර්වලතාවය වන්නේ ලුණු ගොඩේ ඇති අංශුවල ප්‍රමාණය අනුව ලුණුවල ඝනත්වය වෙනස් වීමයි. තවද පීඩන බලපෑම නිසා කාලය පුරාවටම ගොඩේ ඉහළම ලක්ෂ්‍ය පහළට පැමිණේ.<br>එබැවින් මෙම ක්‍රමය රළු ක්‍රම ලෙසද සැලකේ.<br>ලුණු නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය අනුව සැකසෙමින් පවතින තොග හඳුනා ගැනීමට සමාගමට හැකියාවක් නොමැත. මන්ද සැකසෙමින් පවතින තොග ප්‍රමාණාත්මකව ගණනය කළ නොහැක (ජලය යට ලුණු සෑදී ඇති බැවින්) | තවද, අභ්‍යන්තර විගණන කණ්ඩායම ලේවායේ කළමනාකාරීත්වය සමග එක්ව ලුණුවල ඝනත්වය මැන බලන ලදී. ඉදිරි තොග මිනුම් කිරීමේදී මෙය භාවිතා කරනු ඇත.<br><br>ඉහත සඳහන් කළ පරිදි ගනු ලබන ක්‍රියාමාර්ග අනුව අනාගතයේදී තොග හිඟයක් ඇති නොවන බවට සහතික වනු ඇත. |
| (ආ) | 2019 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති රු.42,900,000 ක ඉඩමේ අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පුව, ගිවිසුම වැනි ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | දේපල, පිරියත සහ උපකරණවල ඇතුළත් කර ඇති ඉඩමේ අයිතිය තහවුරු කරන නිසි සහ පිළිගත හැකි නෛතික ලේඛන කළමනාකරණය විසින් පවත්වාගෙන යා යුතුය. | ලුණු ලේවා ඉතිහාසයට අනුව ජාතික ලුණු සංස්ථාව යටතේ සියලුම ලුණු ලේවා තිබූ අතර පසුව ඒවා ලංකා සෝල්ට් ලිමිටඩ් වෙත මාරු කරන ලදී. පුත්තලම සහ හම්බන්තොට ලුණු ලේවාය 1994 දී පෞද්ගලීකරණය කරන ලද අතර, ලංකා සෝල්ට් ලිමිටඩ් හි අනුප්‍රාප්තිකයා ලෙස උතුරු පළාතේ ලුණු ලේවාය පවරා ගැනීම සඳහා 2001 දී | සමාගම බදු ගෙවීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉඩමේ තක්සේරුව ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. ලුණු ලේවාය ආශ්‍රිත අනවසර අත්පත්කරගැනීම් හේතුවෙන් තක්සේරු කිරීම් ප්‍රමාද වෙමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | | රජයේම සමාගමක් ලෙස මාන්තායි ලුණු සමාගම පිහිටුවන ලදී. සියලුම ලුණු ලේවායන් රජයේ ඉඩමක වූ බැවින් රජයේ දේපළක් ලෙස එය පිහිටුවන විට ගිණුම්වල ඉඩම් වටිනාකම ඇතුළත් කර ඇත. 2012 වසරේ නිෂ්පාදනය සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉඩම භාවිතයේ නොමැති අවස්ථාවල බදු නෙගෙවා සිටීම සඳහා සමාගම ප්‍රාදේශීය ලේකම්වරයා වෙතින් බදු බලපත්‍රය ඉල්ලුම් නොකරන ලදි. මන්නාරම ලුණු ලේවාය සම්බන්ධයෙන්ද ඉහත පැහැදිලි කිරීම අදාළ වේ. මේ අතර සමාගම කල්බදු බලපත්‍රය සඳහා ඉල්ලුම් කර ඇති අතර බලපත්‍රය ඉක්මනින් නිකුත් කරනු ඇත. | |
| (ඇ) | රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 9.14.1 ඡේදයට අනුව, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ නීති සහ රෙගුලාසි සහිත පරිච්ඡේදයක් ඇතුළත් කරමින් මානව සම්පත් කළමනාකරණයට අදාළ | සමාගමට මානව සම්පත් කළමනාකරණ ක්‍රියා පටිපාටි ඇතුළත් ක්‍රියා පටිපාටි අත්පොතක් තිබිය යුතුය. | සමාගමට අවශ්‍ය සියලුම ලියකියවිලි ක්‍රමානුකූලව සකස් කරමින් පවතියි. | මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙතින් උපදේශන සේවා ලබාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | සියලු කාරණා සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අත්පොත සැකසීම සමාගම අපොහොසත් වී තිබුණි.. | | | |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2 වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සවිස්තරාත්මකව ඇතුළත් කරමින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි. | කළමනාකරණය ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වීම සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. | අවම වශයෙන් වසර තුනක සැලැස්මක් දක්වා ඇති සංයුක්ත සැලැස්ම මත පදනම්ව සමාගම වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරයි. අනාගතයේදී ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ආයතනික සැලැස්මෙන් වෙන්ව තබා ගැනීමට සලකා බලනු ලැබේ. | වසර 3ක් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරමින් පවතින අතර මේ වන විට 2022 සිට 2025 දක්වා සකස් කර ඇත. |

## 4.75 සීමාසහිත ශ්‍රී ලංකා වරාය කළමනාකරණය සහ උපදේශන (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 97,602,996 | 82,211,903 | 248,065,387 | 85,045,314 | 15,391,094 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 102,966,275 | 89,177,127 | 244,548,244 | 76,235,429 | 13,789,148 | තත්ත්වාගණනය කල |
| **2020** | 96,040,842 | 86,103,586 | 325,409,594 | 156,753,350 | 9,937,256 | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියට (SLPA) අයත් Mc Cullum Lock gate පරිශ්‍රය, 2018 පෙබරවාරි 01 වැනි දින සිට වසර පහකට බදු ගිවිසුමකට එළැඹෙමින් පුද්ගලික පාර්ශවයකට බදු දීම සඳහා | ආපසු ගෙවිය හැකි තැන්පතු සහ අනෙකුත් එකඟ වූ ගෙවීම් නියමිත වේලාවට එකතු කර ගැනීමට කළමනාකාරීත්වය | ආපසු ගෙවිය හැකි තැන්පතුවේ ඉතිරි මුදල ලබාගැනීමට සමාගම සාකච්ඡා ආරම්භ කළේය. පාස්කු ඉරිදා ප්‍රහාරය සහ වසංගතයේ ප්‍රතිවිපාක ලෙස ඇති වූ ප්‍රධාන | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රට තුළ නිතර සිදුවන සංචරණ සීමා කිරීම් ආදිය හේතුවෙන් ආපනශාලාව නඩත්තු කළ නොහැකි බව කොන්ත්‍රාත්කරු විසින් |

| | | | | |
|---|---|---|---|---|
| | සමාගම විසින් 2018 අප්‍රේල් 10 වැනි දින බදු ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම ක්‍රියාත්මක කරන අවස්ථාවේ තක්සේරු ගාස්තුව සහ මාස හයක කල්බදු කුලිය රු.3,150,000 ට සමාන ආපසු ගෙවිය හැකි තැන්පතුවක් ලෙස තැන්පත් කළ යුතුය. කෙසේ වෙතත්, බදුකරු විසින් ආපසු ගෙවිය හැකි තැන්පතු ලෙස තැන්පත් කර ඇත්තේ රු.1,811,250 ක් පමණක් වන අතර, සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු.5,279,263 ක හිඟ මුදල් පැවතියදී බදුකරු විසින් ගිවිසුම අවසන් කර තිබුණි. | විසින් පියවර ගත යුතු අතර, එමගින් සමාගමට බොල් ණය ඇතිවීම වළක්වා ගත යුතුය. | අනපේක්ෂිත අයහපත් තත්ත්වයන් දෙක මෙවැනි ව්‍යාපාරවලට බෙහෙවින් බලපා ඇත. කෙසේ වෙතත්, හැකි ඉක්මනින් ගෙවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | දැනුම් දීමෙන් පසු කොන්ත්‍රාත්කරු 2021 සැප්තැම්බර් මාසයේ සිට පරිශ්‍රයෙන් ඉවත් වෙමින් සිටී.<br>කෙසේ වෙතත්, ඔවුන්ගෙන් අයවිය යුතු හිඟ බදු මුදල් අයකර ගැනීමට සමාගම මේ වන විට කටයුතු කරමින් සිටී.<br>තවද එම පරිශ්‍රයේ ආපනශාලාවක් සම්මත ටෙන්ඩර් පටිපාටිය යටතේ පවත්වාගෙන යාමට දැනටමත් පුවත්පත් දැන්වීමක් හරහා පාර්ශ්වයක් තෝරාගෙන ඇති අතර 2022 අප්‍රේල් මාසයේ සිට එම පරිශ්‍රය නව පාර්ශ්වයට නැවත බදු දීමට නියමිතය. |
| (ආ) | ගාලු මුවදොර පිටියේ පරිපාලනය, නඩත්තුව සහ කළමනාකරණය සඳහා සමාගම විසින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමඟ අත්සන් කළ ගිවිසුම 2019 පෙබරවාරි 09 දිනෙන් අවසන් වූ අතර මෙය 2021 මැයි 31 දක්වා අලුත් කර නොතිබුණි. | අනාගතයේදී නීතිමය ගැටළු ඇති නොවන පරිදි ගිවිසුම නිසි ලෙස අත්සන් කළ යුතුය. | ගිවිසුම අත්සන් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරන ලෙස SLPMCS විසින් කිහිප වතාවක්ම ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ඉල්ලා ඇත.<br>කෙසේ වෙතත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපතිවරයාගේ 2020.06.17 දිනැති ලිපිය මගින් පරිශ්‍රය පරිපාලනය කිරීමට නියමිත බලය ලබා දී ඇත. | නව ගිවිසුමකට එළැඹීමට කටයුතු සූදානම් කරමින් පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ගාලුමුවදොර පිටියේ ආහාර අලෙවිසැල් පිහිටුවීම සඳහා ඉඩමක් පෞද්ගලික සමාගමක් වෙත ලිඛිත ගිවිසුමකින් තොරව 2017 මාර්තු 28 දින බදු දී තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට එම සමාගමෙන් ගෙවිය යුතු කුලිය රු. 1,635,000 ක් වූ අතර ආපසු ගෙවිය හැකි තැන්පතුව රු. 900,000 කි. | ගෙවිය යුතු මුදල් අයකර ගැනීමට කළමනාකාරීත්වය කඩිනමින් පියවර ගත යුතුය. | මෙම කොටස Dinemore (Pvt) Ltd වෙත බදු දී ඇත. ගිවිසුම දැනටමත් අවසන් කර ඇති අතර සමාගම විසින් හිඟ ගාස්තු අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනු ඇත. | මේ සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුමක් ඇති අතර මෙම මුදල අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීමට සමාගමේ නීති උපදේශකවරයාට පවරා ඇත. |
| (ඈ) | ගාලු මුවදොර පිටියේ වෙළෙන්දන්ගෙන් ආදායම් එකතු කිරීම සඳහා නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් සමාගමට නොමැති අතර, 2020 සහ ඊට පෙර වසර සඳහා නොගෙවූ ශේෂයන් පිළිවෙලින් රු.5,898,125 ක් සහ රු.5,301,077 ක් විය. | ගාලු මුවදොර පිටියේ වෙළෙන්දන්ගෙන් ආදායම් එකතු කර ගැනීම සඳහා නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් කළමනාකරණය විසින් හඳුන්වා දිය යුතුය. | මෙම වෙළෙන්දන් නිසි ලෙස ලියාපදිංචි වී නොමැති අතර සමාගම සමඟ ගිවිසුමකට එළඹ නොමැත. ඔවුන් ව්‍යාපාර කරන්නේ උරුම පදනම මතයි. කෙසේ වෙතත්, මෙම කාලසීමාව තුළ ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පරිශ්‍රය ප්‍රතිව්‍යුහගත කරනු ලබන අතර ඉදිරි වර්ෂයේදී නිසි සැලසුමකට අනුව විකුණුම්කරුවන් විධිමත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. | ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු මේ වන විටත් ආරම්භ කර ඇති අතර පැරණි කඩ කාමර ඉවත් කර නව පහසුකම් සහිත කඩ කාමර නැවත ඉදිකරමින් පවතින අතර ඉදිකිරීම් කටයුතු අවසන් වූ වහාම නව ප්‍රතිසංස්කරණයක් යටතේ මෙම කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත. |
| (ඉ) | ගාලු මුවදොර පිටියේ පිහිටි භූගත අවන්හල 2017 මැයි 19 දින ගිවිසුමක් මඟින් 2017 ජූනි 01 දින සිට වසර පහකට බදු දී පෞද්ගලික පාර්ශවයකට ලබා දී ඇති අතර එයින් එකඟ වූ | හිඟ මුදල් නියමිත වේලාවට අදාළ පාර්ශව වලින් අයකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. | ආපසු ගෙවිය හැකි තැන්පතුවේ ඉතිරි මුදල ලබාගැනීමට සමාගම සාකච්ඡා ආරම්භ කර ඇත. පාස්කු ඉරිදා ප්‍රහාරය සහ වසංගතයේ | මේ වන විට එම මුදල් වාරික වශයෙන් අය කරගනිමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | කොන්දේසි 2017 දෙසැම්බර් 11 දිනැති ලිපියක් මගින් වෙනස් කර ඇත. එකඟ වූ කොන්දේසි අනුව මාස තුනක කල්බදු කුලියට සමාන රු.1,500,000 ක් ආපසු ගෙවිය හැකි තැන්පතුවක් ලෙස සමාගම තබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාගම 2020 දෙසැම්බර් 31 වන විටත් එවැනි තැන්පතුවක් ලබාගෙන නොතිබුණි. | | ප්‍රතිවිපාක ලෙස ඇතිවූ අයහප් තත්ත්වය ප්‍රධාන වශයෙන් මෙවැනි ව්‍යාපාරවලට බෙහෙවින් බලපා ඇත. කෙසේ වෙතත්, හැකි ඉක්මනින් අය විය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| (ඊ) | සමාගම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කළමනාකාරිත්වය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | 2019 වර්ෂයේදී වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2021 දී පවත්වන ලදී. |
| (උ) | සමාගම 2020 මැයි 28 වන දින වන විටත් එහි දිගුකාලීන ඉලක්ක ගෙනහැර දක්වමින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | දිගුකාලීන ඉලක්ක සහිත සංයුක්ත සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතුය. | එය සකස් කරමින් පවතී. | සකස් කර නොමැත. |
| (ඌ) | ආයතනයේ සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. | සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | ලියාපදිංචි කර නොතිබුණි. |
| (එ) | 2017 වසරේ විගණන වාර්තා මගින් ගාලු මුවදොර ප්‍රදේශයේ | පරිශ්‍රයේ වෙළෙඳාම් කරන වෙළෙඳුන් | එවැනි වෙළෙන්දන් සමඟ ගිවිසුම්වලට එළඹීම | නව ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ගාලුමුවදොර |

| | | | | |
|---|---|---|---|---|
| | වෙළෙදාම් කරන වෙළෙන්දන්ගෙන් ආදායම් එකතු කිරීම විධිමත් කිරීමේ අවශ්‍යතාව සමාගම වෙත පෙන්වා දී තිබුණද, වෙළෙඳුන් සමඟ ගිවිසුම්වලට එළඹීම වැනි විධිමත් ක්‍රියා පටිපාටි 2022 මැයි 31 වැනිදා දක්වා අනුගමනය කර නොතිබුණි. | සමඟ විධිමත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. | ප්‍රායෝගිකව කළ නොහැකි බව ප්‍රකාශ කර සිටියි. | පිටියේ කටයුතු සිදු කරන සියලුම වෙළෙන්දන් සමඟ නීතිමය ගිවිසුම්වලට එළඹීමට පියවර ගැනේ. |
| (ඒ) | ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් (සම්බන්ධිත පාර්ශ්වයෙන්) සමාගම වෙත 2020 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු ලෙස රු.165,254,816 ක ශේෂයක් පෙනවා ඇතත්, වරාය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාගමට ගෙවිය යුතු වෙළඳ ශේෂය ලෙස පෙන්වා ඇත්තේ රු.13,496,949 කි. ඒ අනුව, රු.151,757,868 වෙනසක් නිරීක්ෂණය විය. 2021 ජූනි 30 වන විට ශ්‍රී ලංකා වරාය අධිකාරියෙන් ලැබිය යුතු මුදල රු.214,992,582 දක්වා වැඩි වී තිබුණි. | ඇති විය හැකි විෂමතා මඟහරවා ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශය සැකසීමට පෙර කළමනාකාරිත්වය විසින් කාලානුරූපීව අදාළ පාර්ශවයන් සමඟ ශේෂය සැසඳුම් කළ යුතුය. | SLPMCS විසින් සේවා ලබා ගත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශේෂිත අංශය වෙත ඊළඟ මාසයේ සේවා සඳහා SLPA වෙත ඉන්වොයිසි ඉදිරිපත් කරයි. අපගේ අවබෝධයට අනුව, මෙම ගැටලුවට හේතු වන්නට ඇති එම ලේඛන අදාළ අංශයෙන් මූල්‍ය අංශයට යැවීමට සුළු කාලයක් ගතවනු ඇති අතර, අපි මේ පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලිඛිතව ද දැනුම් දී ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ශේෂයන් අපගේ විෂය පථයට නොවැටෙන අතර අපගේ ශේෂයන් සඳහා පමණක් අපි සහතික වෙමු. | 2021 වසරේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වරාය අධිකාරිය සමඟ මෙම ගැටලුව සාකච්ඡා කර ඇති අතර ශේෂයන් සකස් කිරීමට කටයුතු කරමින් පවතී. |

## 4.76 ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 41,470,171,433 | 41,482,629,437 | 5,849,612,288 | 5,750,518,006 | 0 | තත්ත්වාගණනය කල |
| **2019** | 42,470,160,495 | 42,480,493,670 | 3,677,721,659 | 3,578,627,377 | 0 | තත්ත්වාගණනය කල |
| **2020** | 41,000,383,219 | 41,008,538,055 | 6,546,358,988 | 6,439,389,706 | 0 | තත්ත්වාගණනය කල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 41,470.17 | 41,482.63 | 5,849.61 | 5,750.52 | - |
| 2019 | 42,470.16 | 42,480.49 | 3,677.72 | 3,578.63 | - |
| 2020 | 41,000.38 | 41,008.54 | 6,546.36 | 6,439.39 | - |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොයා වත්කම් ලැයිස්තුව එක්සෙල් ලේඛනයක පවත්වාගෙන යන අතර එය අනවසර වෙනස්කිරීම්වලට | සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර ස්ථාවර වත්කම් පවත්වාගෙන යාමේදී | සමාගම විසින් නිර්දේශ ක්‍රියාත්මක නොකරන ලදි. | සමීක්ෂණ මණ්ඩලයට අමතරව, සමාගම විගණකවරුන් විසින් නිර්දේශ කර |

| | | | | |
|---|---|---|---|---|
| | ගොදුරු වීමේ අවදානමක් ඇති බව නිරීක්ෂණය විය. ස්ථාවර වත්කම් ලේඛනයේ විදුලි උපකරණවල අනුක්‍රමික අංක අඩංගු නොවන අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම ගොනු කිරීමේදී පූර්ණ ලෙස සත්‍යාපනය කළ නොහැකි විය. | සුදුසු අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දිය යුතුය. | | ඇති පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගියේය |
| (ආ) | සමාගම ඉන්වොයිසි නිකුත් කිරීම සඳහා අඛණ්ඩ ඉන්වොයිස් අංක මාලාවක් සහිත පෙර මුද්‍රිත ඉන්වොයිස් පෝරම භාවිතා නොකරයි. එබැවින් ඉන්වොයිසි පටිගත කිරීමේ සම්පූර්ණත්වය තහවුරු කළ නොහැක. | ඉන්වොයිස් කිරීම සම්බන්ධයෙන් සමාගම සුදුසු අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දිය යුතුය. | අඛණ්ඩ ඉන්වොයිස් අංක මාලාවක් හඳුන්වා දී නොමැත. | අවසාන බදු ඉන්වොයිසිය ලංකා ගල් අඟුරු සමගම විසින් නිකුත් කරනු ලබන්නේ නැව්ගත කිරීමේ අංකය සඳහන් කරමිනි. |
| (ඇ) | ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (LKAS 12) 88 වැනි ඡේදයට අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු (ESC) රු. 159,549,619 ක් සහ රු. 75,461,644 ක දඩ මුදල් සම්බන්ධව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | සමාගම ප්‍රමිතයට අනුකූල විය යුතුය. | සාකච්ඡා සිදු වෙමින් පැවතුනි. | 2021 මූල්‍ය පනත යටතේ ආර්ථික සේවා ගාස්තු සහ අදාළ දඩ මුදල් ඉවත් කරගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා සිදු කරමින් පවතී. |
| (ඈ) | ආදායම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට (LKAS 18) අනුව, ගල් අඟුරු ආනයනය කරන විට, රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කර ගැනීමේ සංකේතාත්මක ගැලපුමක් ලෙස රේගුවේ වටිනාකමට සියයට 10 ක ලකුණු කිරීමක් එකතු කරන ලදි. කෙසේ වෙතත්, සමාගම ආදායමට | මෙම කාරණය සම්බන්ධයෙන් දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමට සමාගම වහාම පියවර ගත යුතුය. | දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන නොතිබුණි. | ආදායමේ අන්තර්ගතය වන 10% සංකල්පීය ආන්තිකය ඉවත් කර නිමැවුම් වැට් බද්ද ගණනය කිරීමේ හැකියාව පිළිබඳව ලංකා ගල් අඟුරු සමාගම |

| | | | | |
|---|---|---|---|---|
| | රු. 3,653,155,934 ක් වූ සියයට 10 ක ලකුණු එකතු කර ඇති අතර පසුව සමාගම ණයගැතියන්ට වට්ටමක් ලෙස එවැනි මුදලක් ලබා දී විකුණුම් පිරිවැයට අය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විකුණුම් සහ ආදායම් සමාන ප්‍රමාණයකින් වැඩි කර දක්වා තිබුණි. | | | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් විමසා ඇතත් මෙතෙක් ප්‍රතිචාර ලැබී නොමැත. |
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට වසර 03කට වඩා පැවත එන රු.10,624,394 ක් වූ ලැබිය යුතු දීර්ඝ කාලීන කලමනාකරණ ගාස්තු ශේෂය අපහායනය සඳහා සමාගම කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොතිබුණි. | සමාගම දීර්ඝ කාලීන ලැබිය යුතු මුදල් සඳහා ප්‍රතිපාදන සැපයිය යුතුය. | ලැබිය යුතු කළමනාකරණ ගාස්තු අයකරගෙන නොතිබූ අතර කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ එකතු කර අවසන් කිරීම සඳහා තවදුරටත් නිතිපතා රැස්වීම් පැවැත්වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයේ 2,559,819 ක හර ශේෂයක් පවතින අවිනිශ්චිත ගිණුමක විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු.12,073,788 ක ශෙෂයක් තිබී ඇති අතර 2020.01.01 දිනට එහි ආරම්භක ශේෂය රු. 4,674,041 කි. සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් කිසිදු හේතුවක් නොමැතිව ඉහත අවිනිශ්චිත ගිණුමට රු. 1,594,325 ක් බැර කර තිබූ අතර රු. 3,708,547 ක් හර කර තිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තාවේ ගැලපුම් ඇතුළත් කිරීම් සම්බන්ධයෙන් කිසිදු නිර්දේශයක් ඉදිරිපත් කර නොතිබූ අතර සාධාරණ පදනමකින් තොරව එම ගැලපීම් සමාගම විසින් සිදු කර ඇත. එබැවින්, අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට සමාගම සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. | සමාගම විගණකගේ නිර්දේශයට අනුකූල වී නොමැත. | අංක CEB/CIA/SA-33/2019-85 දරන අභ්‍යන්තර විගණන වාර්තාවට (පිටුව අංක 04) අනුව CSC වෙත ගෙවිය යුතු පැරණි ගිණුමේ රු.5,218,271 ක ගිණුම්කරණ දෝෂයක් පැවතුනි. එම විගණන වාර්තාවේ විමසුම් අංක 3.1.2 සහ 3.1.3 යටතේ, ඇතුළත් කිරීම් සකස් කල යුතු ආකාරය නිර්දේශ කර ඇති අතර ලංකා ගල් අඟුරු සමාගම |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඒ අනුව ගැලපීම් සිදු කරන ලදී. |
| (ඩ) | මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2020 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලි බල මණ්ඩලයෙන් අවසන් වැට් බද්ද සහ අනෙකුත් ලැබිය යුතු ශේෂය රු.197,452,711 කි. කෙසේ නමුත්, එය ලංකා විදුලිබල මණ්ඩලය විසින් තහවුරු කර නොතිබුණි. එබැවින්, විගණනය සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකිරීම නිසා වෙළඳ ණයගැති ශේෂයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය. | සමාගම ලංකා විදුලිබල මණ්ඩලය සමග සාකච්චා කර කඩිනමින් ගැටළුව විසඳා ගත යුතුය. | ගැටළුව විසඳහී නොතිබුණි. | ලංකා ගල්අඟුරු සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමා සහිත ලංකා නැව් සංස්ථාව අතර ත්‍රෛයි පාර්ශවික සාකච්ඡාවලින් පසු රු. මිලියන 205 න් රු.මිලියන 81ක් පියවීමට ලංවිම දැනටමත් එකඟ වී ඇත. |
| (ඪ) | සීමා සහිත ලංකා නැව් සංස්ථාව (CSCL) හරහා Taurian Iron and Steel Company Limited (TISCL) වෙතින් රු.539,192,079 ක් වූ දිගු කාලීනව ලැබිය යුතු හිඟ ශේෂය අයකර ගැනීමට සමාගම අපොහොසත් විය. ලංකා නැව් සංස්ථාව 2020.12.31 දිනට ඔවුන්ගේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත ශේෂය ගිණුම්ගත කර නොතිබුණි. TISCL/CSCL මෙම ශේෂය තහවුරු කර නොතිබූ අතර හානිකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා දී නොමැත. එබැවින් ඉහත ශේෂයේ නිරවද්‍යතාවය සහ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | අදාළ පාර්ශවයෙන් ශේෂයන් අයකර ගැනීමට සමාගම කටයුතු කළ යුතුය. | සාකච්ඡා සිදු වෙමින් පැවතුනි. | මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් සහ පෞද්ගලික උපදේශකවරුන්ගෙන් ලබාගත් නීතිමය අදහස්වලට අනුව ලංකා ගල් අඟුරු සමාගම, ගිවිසුම ප්‍රකාරව අඛණ්ඩව ගල් අඟුරු සැපයීමට ඉඩ නොදී ගිවිසුමේ කොන්දේසි කඩකර ඇති බැවින් TISCL ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ලංකා ගල් අඟුරු සමාගමට ස්ථිර පදනමක් නොමැත. මෙය සාකච්ඡා |

| | | | | |
|---|---|---|---|---|
| | | | | මාර්ගයෙන් විසඳාගත හැකි කාරණයකි. |
| (එ) | ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC) රු.578,678,686 ක ශේෂය, විවිධ ණය ගැතියන්ගේ රු.18,075,801 ක ශේෂය, Noble Resources International (Pte.) Ltd වෙතින් ලැබිය යුතු රු.1,115,987 ක ශේෂය, වෙළඳ ණය හිමි Nobel Resources International (Pte.) Ltd 85,887,776 ක ශේෂය සහ Liberty Commodities Ltd වෙතින් ලැබිය යුතු 50% SGS ගාස්තු රු.8,048,531 ක ශේෂය සඳහා ශේෂ තහවුරු කිරීම් සහ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | **ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු (ESC): රු. 578,678,686.** සමාගම ආර්ථික සේවා ගාස්තු පනතට අනුකූල විය යුතු අතර ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල් වහාම අයකර ගැනීමට පියවර ගත යුතුය. | ශේෂය ලංකා විදුලිබල මණ්ඩලයෙන් අයකරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂය මූල්‍ය පනත යටතේ අත්හැරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතී. වෙනත් තහවුරු නොකළ ශේෂවල මූලාශ්‍රය/ආරම්භය සොයා ගැනීම සඳහා තවදුරටත් විමර්ශනය කෙරේ. |
| | | **විවිධ ණය ගැතියන් රු.18,075,802** සමාගම විසින් ලැබිය යුතු ශේෂයේ මූලාශ්‍රය කඩිනමින් හඳුනා ගත යුතුය. | ලැබිය යුතු ශේෂයේ මූලාශ්‍රය නිශ්චය කරගෙන නොතිබුණි. | |
| | | **Noble Resource වෙළඳ ණය හිමියන් රු.85,887,776 සහ ලැබිය යුතු රු.1,115,987** සමාගම විසින් ශේෂයන් තහවුරු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | තහවුරු කිරීම් ලබාගෙන නොමැත. | * 2021 අවසන් මූල්‍ය ප්‍රකාශනවල සටහන 11 පිළිබිඹු වන වෙනත් ජංගම නොවන වත්කම් - Liberty Commodities Ltd හිමිකම් පාන්නාට (ලංකා ගල් අඟුරු සමාගමට) ඇමරිකානු ඩොලර් |

| | | | | |
|---|---|---|---|---|
| | | **Liberty Commodities Ltd වෙතින් ලැබිය යුතු 50% SGS ගාස්තු: රු.8,048,531**<br>ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට සමාගම පියවර ගත යුතුය. | ශේෂය අය කර ගෙන නොතිබුණි. | 1,575,141.86 ගෙවීමට සහ/හෝ ප්‍රදානය කිරීමට 2021/12/31 දින පැවති බේරුම්කරණයෙන් වගඋත්තරකරුට කරන ලද නියෝගයක් ලැබී ඇත. |
| (ඒ) | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 6 වැනි වගන්තියට අනුව ආර්ථික සේවා ගාස්තු වගකීම කාර්තුව අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ විසිවන දින හෝ ඊට පෙර ගෙවිය යුතුය. රු.579,179,232 ක් වූ සමාගම විසින් ගෙවිය යුතු මුළු ආර්ථික සේවා ගාස්තුව මෙම වාර්තාවේ වන විටත් ගෙවා නොතිබුණි. | සමාගම පනතට අනුකූල විය යුතුය. | ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු අත්හැරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙතින් උපදෙස් ලබාගෙන නොමැත. | ලැබිය යුතු ශේෂය මුදල් පනත යටතේ කපා හැරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරමින් පවතී. |
| (ඔ) | ආයතනයේ සේවකයකු ගෙවීම් වවුචර හසුරුවමින් රු.590,193 ක වංචාවක් 2018 වසරේදී සිදුකර තිබේ. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් සමාගම මෙම සේවකයාට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයට අනුව අදාළ සේවකයින්ට එරෙහිව සමාගම විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | සමාගම විසින් විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත. | ඊට සම්බන්ධ සේවකයාට එරෙහිව ආයතන සංග්‍රහයට අනුව මූලික විමර්ශනය තවදුරටත් පැවැත්වේ |
| (ඕ) | සමාගම විසින් නැව්ගත කිරීමේ අංක 123 සඳහා රේගු වැට් බද්ද ලෙස රු. 136,236,370 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් රේගු ප්‍රකාශනය අනුව සත්‍ය වැට් බදු | සමාගම ශ්‍රී ලංකා රේගුවෙන් ඉතිරි මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ශේෂය පියවීමට උපදෙස් ලැබී නොමැත. | අප දැනටමත් මුදල් ආපසු ගෙවීමේ ආපසු ලබා ගැනීම් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති අතර රේගු |

| | | | | |
|---|---|---|---|---|
| | මුදල රු.106,969,404 කි. ඒ අනුව, රු. 29,266,965 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | | දෙපාර්තමේන්තුව විසින් ලංකා ගල් අඟුරු සමාගම වෙත ආපසු ගෙවීම් සිදු කිරීමට හෝ රේගුවෙන් ගෙවිය යුතු ශේෂයන්ට හිලව් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් සිටී. |
| (ක) | පවතින ලියකියවිලිවලට අනුව ශ්‍රී ලංකා රේගුව විසින් රු.205,000,000 ක දඩයක් නියම කර තිබුණි. 2019 වර්ෂයේදී සමාගම විසින් ඉහත දඩ මුදල ශ්‍රී ලංකා රේගු වැට් බදු ගිණුමට රු.158,186,165 ක්, වැට් පාලන ගිණුමට රු. 39,970,418 ක් හා CSCL වගකීම් ගිණුමට රු.6,843,417 ලෙස වැරදි අයුරින් හර කර ඇත. එබැවින්, රඳවාගත් ඉපැයීම්වල ආරම්භක ශේෂය රු.205,000,000 ක් වැඩියෙන් සහ ශ්‍රී ලංකා රේගු වැට් ගිණුම සහ වැට් පාලන ගිණුම රු.198,156,583 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර CSCL වගකීම් ගිණුම රු. 6,843,417 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br>නැව්ගත කිරීමේ බිල්පත් පියවීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු අරමුදල්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් නොමැතිව, සමාගම විසින් මෙම රු. 205,000,000 ක දඩ මුදල ගෙවීමට භාවිතා කර තිබුණු අතර | සමාගම විසින් මෙම ගෙවීම, දඩ මුදල් වියදම් ලෙස සටහන් කර මෙම ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම අලාභයට වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | කරුණ අවසන් කර නොතිබුණි. | ලංකා ගල්අඟුරු සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ලංකා නැව් සංස්ථාව අතර ත්‍රෛයි පාර්ශවික සාකච්ඡාවලින් පසු රු. මිලියන 205 න් රු.මිලියන 81ක් පියවීමට ලංවිම දැනටමත් එකඟ වී ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | මෙම අලාභයට වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | | | |
| (ග) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ උසස්කිරීමේ යෝජනා ක්‍රමයක් (SORP) සමාගම සතුව නොතිබුණි. | සමාගම 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 ට අනුකූල විය යුතු අතර බඳවා ගැනීමේ සහ උසස්කිරීමේ යෝජනා ක්‍රමයක් සකස් කර ඩකඩිනමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතුය. | | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දී ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව කටයුතු කර ඇත |
| (ච) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, සමාගම විසින් ආපදා ණය යෝජනා ක්‍රමයක් 2017 වසරේ සිට ක්‍රියාත්මක කර ඇති අතර සමාගම විසින් ලබා නොගත් කාර්ය මණ්ඩල අසනීප නිවාඩු ලෙස රු. 1,418,274 ක් සඳහා විධිමත් අනුමැතියකින් තොරව ප්‍රතිපාදන සලසා තිබුණි. | සමාගම චක්‍රලේඛයට අනුකූල විය යුතුය. | සමාගම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 73 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රුස්වීමේදී සියයට 6ක වෙලඳපොල අනුපාතිකය සමඟ ගැලපෙන පොලී අනුපාතිකයක් යටතේ හීන වන ශේෂ ක්‍රමයට සහතික ලත් නීතිඥයෙකුගේ නිර්දේශය මත ඇපකරුවකු සහිතව සේවකයෙකුට උපරිම රු.350,000 ක් ලබා දීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අනුමැතිය ලබා දී ඇත. කාර්ය මණ්ඩල අසනීප නිවාඩු සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ක්‍රියාත්මක කිරීමට 87 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමත කර ඇත. |
| (ජ) | සමාගම විසින් මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල ප්‍රසාද දීමනා ලෙස රු. 1,795,212 ක් ගෙවා තිබුණි. | සමාගම 2016 දෙසැම්බර් 16 දිනැති අංක 05/2016 චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | සමාගම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ලංකා ගල් අඟුරු සමාගමේ වියදම් ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කරනු ලබන බැවින්, විදුලිබල මණ්ඩලයෙන් විරෝධයක් නොමැති බවට ලිපියක් ලබා ගැනීමට යටත්ව ප්‍රසාද දීමනා සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. තවද මෙය ලංකා විදුලිබල මණ්ඩලය අමතර වියදමක් නොවේ. 2020 වසර සඳහා ද එම ක්‍රියා පටිපාටියම අනුගමනය කර එයට අනුගත වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ට) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව 2015 සිට 2020 වසර දක්වා සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගම චක්‍රලේඛයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව 2017, 2018 සහ 2019 වර්ෂ සඳහා වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සූදානම්ව පවතින අතර 2020 වාර්තාව මුද්‍රණ ක්‍රියාවලියේ පවතියි. |

## 4.77 කොලදෙණිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 115,920,606 | 45,251,219 | 486,288,252 | 47,721,053 | 70,669,387 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 107,122,844 | 45,313,902 | 474,335,657 | 156,975,414 | 61,808,942 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 52,742,198 | 118,444,230 | 175,609,898 | 23,212,570 | (65,702,032) | තත්ත්වාගණනය නොකල |





| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 115.92 | 45.25 | 486.29 | 47.72 | 70.67 |
| 2019 | 107.12 | 45.31 | 474.34 | 156.98 | 61.81 |
| 2020 | 52.74 | 118.44 | 175.61 | 23.21 | (65.70) |

- ප්‍රධාන ගැටළු නොමැත

## 4.78 ශ්‍රී ලංකා එනර්ජීස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 52,548,039 | 123,362,625 | 333,385,190 | 327,858,815 | (66,151,871) | තත්ත්වාගණනය කළ |
| **2019** | 395,291,314 | 354,572,258 | 488,433,684 | 442,206,363 | 46,735,544 | තත්ත්වාගණනය කළ |
| **2020** | 323,765,340 | 256,076,551 | 476,457,347 | 375,755,975 | 76,115,183 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | තොග පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (LKAS 02) 37 වැනි ඡේදයට අනුව, විවිධ තොග වර්ගීකරණයන්හි පවතින ධාරණ වටිනාකම් පිළිබඳ තොරතුරු සමාගම විසින් | සමාගම ගිණුම්කරණ ප්‍රමිතයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය 02 ට අනුකූලව නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සටහනට අංක 6 ට අනුව, |

| | | | | |
|---|---|---|---|---|
| | අනාවරණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම මූල්‍ය ප්‍රකාශනවල විවිධ තොග වර්ගීකරණයන් අනාවරණය කර නොතිබුණි. | | | සම්පූර්ණ කරන ලද නිෂ්පාදනවල පොත් වටිනාකම මෙන්ම WIP සහ ද්‍රව්‍යවල වටිනාකම ද ඇතුළුව තොග වටිනාකම පිළිබඳ විස්තරයක් එමගින් සපයයි. මෙම සටහන 2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ද ඇතුළත් වේ. |
| (ආ) | අස්පෘශ්‍ය වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 38) 118 (අ) සහ (ආ) ඡේදයට අනුව, ඵලදායී ජීවයන් අවිනිශ්චිතද හෝ සීමිතද යන්න සහ සීමිත නම්, ඵලදායී ජීවයන් හෝ ක්‍රමක්ෂය අනුපාතය භාවිතා කරන ලද සහ සීමිත ඵලදායී ජීවයන් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා භාවිතා කරන ක්‍රමක්ෂය ක්‍රමය සමාගම විසින් අනාවරණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම ගිණුම්කරණ ප්‍රමිතයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගම නිර්දේශවලට අනුකූලව කටයුතු කර නොමැත. | 2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන යටතේ හෙළිදරව් කිරීමක් ඇතුළත් වේ. |
| (ඇ) | දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ (LKAS 16) 79 (ආ) ඡේදයට අනුව, තවමත් භාවිතයේ පවතින සම්පූර්ණ ක්ෂය වූ දේපල, | සමාගම ගිණුම්කරණ ප්‍රමිතයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | 2020 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල | 2021 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන යටතේ |

| | | | | |
|---|---|---|---|---|
| | පිරියත සහ උපකරණවල දළ ධාරණ වටිනාකම සමාගම විසින් අනාවරණය කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් වටිනාකම රු.9,573,376 ක් වූ සම්පූර්ණ ක්ෂය වූ වත්කම් සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි. | | අදාළ හෙළිදරව් කිරීම් සිදු කර නොමැත. | හෙළිදරව් කිරීමක් ඇතුළත් වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල 2020 දෙසැම්බර් 31 දිනට පවතින රු.2,218,582 ක අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. | සමාගම විසින් මෙම ශේෂයේ ආරම්භය හඳුනාගෙන කඩිනමින් නිරවුල් කළ යුතුය. | 2022 මැයි 31 දක්වා අවිනිශ්චිත ගිණුම නිරවුල් කර නොමැත. | දැනට මෙම අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගැනීමේ ක්‍රියාවලිය සිදුකරමින් පවතී. මෙය මූලික වශයෙන් සමන්විත වූයේ මීටර ආවරණ විකුණුම් සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබුණු හඳුනා නොගත් අරමුදලකිනි. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශනවල අංක 07 දරන සටහනට අනුව, වසර දෙකකට වැඩි කාලයක් සඳහා ලැබිය යුතු රඳවා ගැනීමේ බදු හිඟ මුදල රු.2,120,524 කි. කෙසේ වෙතත්, රඳවා ගැනීමේ බදු සහතිකය විගණන පරීක්ෂාව සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛනගත සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. | රඳවා ගැනීමේ බදු සහතිකය විගණනයට ලබා දී නැත. | දැනට බදු රෙගුලාසි සපුරාලීම සහ ඒ අනුව බදු වාර්තා ගොනු කිරීමේ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතියි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයේ උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති | ණයහිමියන් පිළිබඳව විමසා බැලීමෙන් පසු මෙම ශේෂයන් නැවත | ගෙවිය යුතු ශේෂයන් 2022 මැයි 31 දක්වා පියවා නොමැත. | මෙම පියවීම් සඳහා කටයුතු කරගෙන යයි. |

| | | | | |
|---|---|---|---|---|
| | රු.749,992 ක ශේෂය වසරකට වැඩි කාලයක් පියවීමකින් තොරව ඉතිරිව තිබුණු අතර, හිඟ ශේෂය පියවීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ලිවීමට ක්‍රියාමාර්ගය ගත යුතුය. | | |
| (උ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වැනි වගන්තියට අනුව, නියමිත පරිදි සම්පූර්ණ කරන ලද බදු ප්‍රතිලාභ වාර්තාව, උපලේඛන සහ වෙනත් අවශ්‍ය ලියකියවිලි සමඟ තක්සේරු වර්ෂය අවසන් වීමෙන් පසු වර්ෂයේ නොවැම්බර් 30 වැනිදා හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2011 වර්ෂයේදී සමාගම සංස්ථාපිත කිරීමෙන් පසු සමාගම කිසිදු ආදායම් බදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | දේශීය ආදායම් පනතට අනුකූල විය යුතුය. | 2022 මැයි 31 දක්වා ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර නොමැත. | දැනට බදු රෙගුලාසි සපුරාලීම සහ ඒ අනුව බදු වාර්තා ගොනු කිරීමේ ක්‍රියාවලිය සිදුකෙරෙමින් පවතියි. |
| (ඌ) | සමාගම විසින් මීටර ආවරණ නිෂ්පාදන කටයුතුවල නිරත වී ඇති අතර එම නිෂ්පාදන ලංකා විදුලිබල මණ්ඩලයට සහ ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගමට සපයන ලදී. කෙසේ වෙතත්, මීටර ආවරණ නිෂ්පාදනයට අදාළව කිසිදු ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය / ලංකා විදුලි සමාගම (පුද්ගලික) සමාගම අතර මීටර් ආවරණ නිෂ්පාදනය සහ විකිණීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළ යුතුය. | අවබෝධතා ගිවිසුමක් හෝ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | මෙය 100% හිමි අනුබද්ධිත ආයතනයක් එහි මව් සමාගමට මීටර ආවරණ සපයන අභ්‍යන්තර ව්‍යාපාරයක් බැවින් අවබෝධතා ගිවිසුමක් හෝ ගිවිසුමක් අත්සන් නොකරන ලදි. |


| | | | | |
|---|---|---|---|---|
| (එ) | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා සමාගම විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර නොතිබුණි. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය 2022 මැයි 31 දක්වා සමාගම විසින් සකස් කර නොතිබුණි. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සකස් කිරීම සමාලෝචනය කරමින් පවතී. |
| (ඒ) | සමූහය විසින් ඇම්ට්‍රෑඩ් හෝල්ඩිංග්ස් (පෞද්ගලික) සමාගම සමඟ හවුල් ව්‍යාපාරයක් ලෙස ෆ්ලයි ඇෂ් සහ බොටම් ස්ලැග් භාවිතයෙන් සිමෙන්ති පාදක නිෂ්පාදන නිෂ්පාදනය කිරීම සහ විකිණීම සඳහා කර්මාන්ත ශාලාවක් ඉදිකිරීමට 2014 දෙසැම්බර් 31 දිනට රු.7,364,447 ක් ආයෝජනය කරන ලදි. කෙසේ වෙතත්, හවුල් ව්‍යාපාර ගිවිසුම අවසන් කර ඇති අතර ව්‍යාපාරික හවුල්කරුවෙකු නොමැතිකම හේතුවෙන් වත්කම් නිෂ්කාර්යයව පවතී. තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වාර්තාවට අනුව රු. 2019 මැයි 31 දිනට දේපල තක්සේරුව රු.2,660,000 ක් වන අතර වෙනස අපහායනය කර ඇත. මේ සම්බන්ධයෙන් දරන ලද පිරිවැය ආපසු අයකර ගැනීමේ හැකියාව පිළිබඳව ප්‍රමාණවත් සුදුසු සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය. | නිෂ්කාර්යය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. | 2022 මැයි 31 වන දින දක්වා මෙම කාරණය සම්බන්ධයෙන් කිසිදු තීරණයක් ගෙන නොමැත. | විදුලිබල අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරණ කමිටු රැසිවීමේ ගත් තීරණයට අනුව, මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ සාකච්ඡා කිරීමට නියමිතව තිබූ අතර එම තීරණය ශ්‍රී ලංකා එනර්ජීස් සමාගම වෙත දැනුම් දෙනු ඇත. |
| (ඔ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත අනුමත මූල්‍ය | සමාගම චක්‍රලේඛවල විධිවිධානවලට අනුකූල විය යුතුය. | මූල්‍ය ප්‍රකාශන විගණනය ප්‍රමාද වී සඳහා ඉදිරිපත් කරන ලදී. | 2021 වර්ෂය සඳහා වන කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන දැනටමත් සකස් කර අධ්‍යක්ෂ |

| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු අතර එය තවදුරටත් 2007 ඔක්තෝබර් 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/45 ප්‍රකාර විය යුතුය. කෙසේ වෙතත්, සමූහයේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 28 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | | | මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| (ඔ) | 2016 වසරේ සිට වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සමාගම 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | වාර්ෂික වාර්තා 2022 මැයි 31 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණු. | 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස් කර ඇති අතර දැනට ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සමාලෝචනය යටතේ පවතී. |
| (ක) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයට අනුකූල විය යුතුය. | සංයුක්ත සැලැස්ම සකස් කිරීම සිදු කරමින් පැවතුනි. | සංයුක්ත සැලැස්ම ද මේ වන විට අවසන් කර සමාලෝචන කාර්යය සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ කළමනාකරණ කමිටුව වෙත භාර දී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව සමාගම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයට අනුකූල විය යුතුය. | තවමත් ඉදිරිපත් කර නැත. | දැනට සමාලෝචනය යටතේ පවතී |
| (ඝ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. නමුත් සමාගම විසින් සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය. | සමාගම විසින් සපුරාගත යුතු ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්කවල විෂය පථයට අනුකූල වන අතර පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සංවර්ධනය කිරීමෙහි නිරත වේ. |

## 4.79 ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 7,602,797 | 7,505,467 | 177,278,520 | 54,540,836 | 113,900 | තත්ත්වාගණනය කල |
| **2019** | 20,269,248 | 18,125,303 | 180,708,237 | 56,094,118 | 2,157,474 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 73,742,266 | 68,950,101 | 187,975,489 | 60,302,251 | 4,822,328 | තත්ත්වාගණනය නොකල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව 2015 වර්ෂයේ සමාගම සංස්ථාපිත කරන ලද දින සිට සමාගම ආදායම් බදු වාර්තා කිසිවක් | සමාගම 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | බදු වාර්තා 2022 මැයි 31 දක්වා විගණනයට ඉදිරිපත් කර නොමැත. | බදු රෙගුලාසි සපුරාලීම සහ ඒ අනුව බදු වාර්තා ගොනු කිරීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතියි. |


| | | | | |
|---|---|---|---|---|
| | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දක්වා වන රු.14,792,436 ක ආදායම් බදු ප්‍රතිපාදන 2021 නොවැම්බර් 10 වන විටත් ගෙවා නොතිබුණි. | | | |
| (ආ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 26 වැනි වගන්තියට අනුව සමාගම විසින් රු.17,114,299 ක එකතු කළ අගය මත බද්ද (VAT) ගෙවා නොතිබුණි. | සමාගම 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | ගෙවිය යුතු වැට් බදු ශේෂය 2022 මැයි 31 දක්වා ගෙවා නැත. | දැනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ ගෙවිය යුතු හිඟ වැට් බදු ශේෂ පියවීම සඳහා වන සාකච්ඡා සිදු කරමින් පවතින අතර ගෙවීම් සැලැස්මක් ඉල්ලා ඇත. ඉහත වැට් බදු සෑම මසකම රු.මිලියන 1 බැගින් පියවීමට කටයුතු කර ඇත. |
| (ඇ) | සමාගමට පෙර වසරට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් රු.7,418,633 ක ජාතිය ගොඩනැගීමේ බදු (NBT) දඩ දැන්වීම් ලැබී තිබුණි. කෙසේ වෙතත්, සමාගම අසම්භාව්‍ය වගකීම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | සමාගම ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධානවලට අනුකූල විය යුතුය. | ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු දඩය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පියවා නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | දැනට ගෙවිය යුතු හිඟ ජාතිය ගොඩනැගීමේ බදු ශේෂ පියවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ගෙවීම් සැලැස්මක් ඉල්ලා ඇති අතර ඉහත ජාතිය ගොඩනැගීමේ බදු වගකීම් සෑම මසකම මිලියන 1 බැගින් පියවීමට කටයුතු කර ඇත. මෙය අසම්භාව්‍ය වගකීමක් ලෙස හඳුනා ගැනේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සටහන අංක 6.1 - වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු පරිදි, මූල්‍ය ප්‍රකාශනයේ ලැබිය යුතු රඳවා තබා ගැනීමේ බදු මුදල රු.84,949 කි. කෙසේ වෙතත්, රඳවා තබා ගැනීමේ බදු සහතිකවල මුල් පිටපත් විගණනය සඳහා ලබා දී නොමැත. | විගණනය සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | රඳවා තබා ගැනීමේ බදු සහතික විගණනය සඳහා ලබා දී නොමැත. | 2021 වර්ෂයේ විගණන ක්‍රියාවලිය සඳහා මෙම සහතික ලබා දීමට කටයුතු කරනු ඇත. |
| (ඉ) | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා සමාගම විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර නොතිබුණි. | 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව SOR එකක් සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දැනට සමාගම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කරමින් පවතී. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන හා 2007 ඔක්තෝබර් 02 දිනැති අංක PED/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත අනුමත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ඉදිර්පත් කල යුතුය. කෙසේ වෙතත්, 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 28 වැනි දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි. | මෙම වසරේ සිට පරිචයට අනුගත වනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| ( උ) | 2016 වසරේ සිට වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සමාගම 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස් කර ඇති අතර දැනට ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සමාලෝචනය කරමින් පවතී. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංයුක්ත සැලැස්ම සකස් කිරීම සිදු වෙමින් පැවතුනි. | සංයුක්ත සැලැස්ම ද මේ වන විට අවසන් කර සමාලෝචන කාර්යය සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ කළමනාකරණ කමිටුව වෙත භාර දී ඇත. |
| (එ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව සමාගම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට සමාලෝචනය කරමින් පවතී |
| (ඒ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. නමුත් සමාගම විසින් සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය. | සමාගම විසින් සපුරාගත යුතු ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්කවල විෂය පථයට අනුකූල වන අතර පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සංවර්ධනය කිරීමෙහි නිරත වේ. |

## 4.80 කුඹල්ගමුව මිනිහයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 95,130,264 | 101,031,890 | 553,037,458 | 444,881,319 | (5,863,611) | තත්ත්වාගණනය නොකල |
| **2019** | 106,274,755 | 92,472,958 | 541,456,433 | 419,438,841 | 13,861,453 | තත්ත්වාගණනය කල |
| **2020** | 115,197,323 | 83,025,944 | 546,942,415 | 392,674,336 | 32,250,486 | තත්ත්වාගණනය කල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | කුඩා ජල විදුලි බලාගාරය ඉදිකිරීම, හිමිකර ගැනීම සහ පවත්වාගෙන යාම සඳහා ඉඩමක් 2015 පෙබරවාරි 15 දින සිට වසර 20ක කාලයකට බදු ගැනීමට සමාගම | ගිණුම්කරණ ප්‍රමිතිවල විධිවිධානවලට අනුකූල විය යුතුය. | නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වාර්ෂික බලපත්‍ර ගාස්තුව 2021 වර්ෂය සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන යටතේ මෙහෙයුම් කල්බදු |


| | | | | |
|---|---|---|---|---|
| | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළැඹ ඇත. වාර්ෂික බලපත්‍ර ගාස්තුව ලෙස රු.4,436,705ක් ගිවිසුමට අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. කෙසේ වෙතත්, බලපත්‍ර ගාස්තුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත - 16 යටතේ බදු ගෙවීමක් ලෙස හඳුනාගෙන නොතිබූ අතර කල්බදු වගකීම සහ වත්කම් භාවිතා කිරීමේ අයිතිය ගිණුම්ගත කර නොතිබුණි. තවද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව වාර්ෂික බලපත්‍ර ගාස්තු ගණනය කිරීම සඳහා සිදු කරන ලද සංශෝධනයට සමාගම අනුකූලව කටයුතු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂය අවසානයේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. 578,700 කින් අඩු කර දක්වා තිබුණි. | | | ගෙවීම ලෙස හඳුනාගෙන ඇත. |
| (ආ) | 2015 මාර්තු 06 දිනැති ආයෝජන මණ්ඩල ගිවිසුමේ 2(i) වගන්තියට අනුව, බදු සහන කාලය අවසන් වන තෙක් ව්‍යාපාරය විසින් වසරකට ඇමෙරිකානු ඩොලර් 5,000 ට සමාන වාර්ෂික ගාස්තුවක් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවිය යුතුය. තවද, එක් එක් වර්ෂයේ පළමු මාසයේ 10 වැනි දින හෝ ඊට පෙර ආයෝජන මණ්ඩලයට ගෙවීමට ව්‍යාපාරය අපොහොසත් වුවහොත්, එම වර්ෂය සඳහා පවතින 364 භාණ්ඩාගාර බිල්පත් | මෙය කඩිනමින් විසඳීමට කටයුතු කල යුතුය. | හිඟ ශේෂ පියවීමට කටයුතු කර නොතිබුණි. | කුඹල්ගමුව මිනි හයිඩ්‍රෝ ප්ලාන්ට් හි විදුලි උත්පාදනයට හදිසි බාධා ඇති වූ අතර, ආයෝජන මණ්ඩල ගෙවීම් පියවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් සකස් කිරීම දුෂ්කර වූ අතර දැනට පවතින හිඟ මුදල් පියවීම සඳහා සාකච්ඡා කරමින් පවතියි. |

| | | | | |
|---|---|---|---|---|
| | අනුපාතයට (“පොළී”) සමාන පොළියක් වාර්ෂික ගාස්තුවට අමතරව ප්‍රමාද වූ ගෙවීම මත අය කරනු ලැබේ. කෙසේ වෙතත්, 2018, 2019 සහ 2020 වසර සඳහා වාර්ෂික ගාස්තුව 2021 නොවැම්බර් 10 වන විටත් සමාගම විසින් ගෙවා නොතිබුණි. | | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර වත්කම්වල භෞතික සත්‍යාපනය සමාගම විසින් සිදු කර නොතිබුණි. | වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනය සිදු කර වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. | ස්ථාවර වත්කම් සත්‍යාපනය සිදු කර නොමැත. | 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය අවසන් කර ඇත. |
| (ඈ) | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා සමාගම විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර නොතිබුණි. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සකස් කර නොතිබුණි | දැනට සමාගම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කරමින් පවතී. |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 සහ 2007 අංක PED/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත අනුමත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 28 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛවල විධිවිධානවලට අනුකූල විය යුතුය. | කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව සකස් කිරීමට කටයුතු කරන ලදී | මෙම වසරේ සිට මෙම පරිචයට අනුගත වනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2016 වසරේ සිට වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස් කර ඇති අතර දැනට ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සමාලෝචනය යටතේ පවතී. |
| (උ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංයුක්ත සැලැස්ම සකස් කිරීම සිදු වෙමින් පැවතුනි. | සංයුක්ත සැලැස්ම ද මේ වන විට අවසන් කර සමාලෝචන කාර්යය සඳහා ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ හි කළමනාකරණ කමිටුව වෙත භාර දී ඇත. |
| (ඌ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව සමාගම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | තවමත් ඉදිරිපත් කර නැත. | දැනට සමාලෝචනය යටතේ පවතී |
| (එ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය. | තිරසාර සංවර්ධන ඉලක්ක විෂය පථය තුළ සාක්ෂාත් කරගත යුතු ඉලක්ක හඳුනා ගැනීමට සමාගම කටයුතු කර තිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්කවල විෂය පථයට අනුකූල වන අතර පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සංවර්ධනය කිරීමෙහි නිරත වේ. |

## 4.81 දැදුරු ඔය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 0 | 217,165 | 11,189,757 | 11,722,479 | (216,572) | තත්ත්වාගණනය නොකල |
| **2019** | 0 | 3,781,647 | 71,527,333 | 31,023,221 | (3,327,306) | තත්ත්වාගණනය කල |
| **2020** | 0 | 3,556,168 | 180,330,853 | 143,262,614 | (3,435,873) | තත්ත්වාගණනය නොකල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | - | 0.22 | 11.19 | 11.72 | (0.22) |
| 2019 | - | 3.78 | 71.53 | 31.02 | (3.33) |
| 2020 | - | 3.56 | 180.33 | 143.26 | (3.44) |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වැනි වගන්තියට අනුව නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රතිලාභය, උපලේඛන සහ වෙනත් අවශ්‍ය ලියකියවිලි සමඟ තක්සේරු වර්ෂයේ නොවැම්බර් 30 වැනිදා | සමාගම දේශීය ආදායම් පනතට අනුකූල විය යුතුය. | සමාගම බදු රෙගුලාසිවලට අනුකූල වී නොමැත. | බදු රෙගුලාසිවලට අනුකූලව බදු ප්‍රතිලාභ සම්පූර්ණ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම 2019/2020 තක්සේරු වර්ෂය සඳහා වන ආදායම් බදු ප්‍රතිලාභ 2020 වසර අවසානය වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | | | |
| (ආ) | කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා සමාගම විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර නොතිබුණි. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) සකස් කර අනුමැතිය ලබා ගත යුතුය. | සමාගම විසින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) හඳුන්වා දී නොතිබුණි. | දැනට බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කරමින් පවතී. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2007 ඔක්තොම්බර් 02 දිනැති අංක PED/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාර මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත අනුමත මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිවරයා වෙත ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 28 වන දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | | මෙම වසරේ සිට මෙම පරිචයට අනුකූල වේ.. |
| (ඈ) | 2016 වසරේ සිට වාර්ෂික වාර්තා සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | සමාගම 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ | 2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සකස් කර ඇති අතර |

| | | | | |
|---|---|---|---|---|
| | | විධිවිධානවලට අනුකූල විය යුතුය. | සභාගත කර නොතිබුණි. | මේ වන විට එය ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ සමාලෝචනය කරමින් පවතී. |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | සංයුක්ත සැලැස්ම සකස් කිරීම තවමත් සිදු කරමින් පවතී. | සංයුක්ත සැලැස්ම සකස් කර සමාලෝචන කාර්යය සඳහා එය ශ්‍රී ලංකා එනර්ජීස් සමාගමේ කළමනාකරණ කමිටුව වෙත භාර දී ඇත. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව සමාගම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | සමාගම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | තවමත් ඉදිරිපත් කර නැත. | දැනට එය සමාලෝචනය කරමින් පවතී. |
| (උ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. නමුත් සමාගම විසින් සාක්ෂාත් කර ගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය. | | සමාගම තිරසාර සංවර්ධන ඉලක්කවල විෂය පථයට අනුකූල වන අතර පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සංවර්ධනය කිරීමේ නිරතව සිටී. |

## 4.82 ඇන්ටි ලෙකෝ මීටරින්ග් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 889,599,495 | 929,609,118 | 815,363,775 | 423,202,380 | (40,009,623) | තත්ත්වාගණනය නොකල |
| **2019** | 1,256,226,767 | 1,184,260,753 | 874,041,183 | 434,001,797 | 71,966,014 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 974,265,278 | 944,869,436 | 745,791,976 | 288,428,145 | 29,395,843 | තත්ත්වාගණනය නොකල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම විසින් ජර්නල් වවුචර නිසි පරිදි අදාළ උපකාරක ලියකියවිලි සමඟ විධිමත් ලෙස නඩත්තු කර නොතිබුණි. | ජර්නල් වවුචර් නිසි පරිදි පවත්වාගෙන යා යුතුය | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |


| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාගම ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව යාවත්කාලීන කළ යුතුය | සමාගම 2021 ජූනි 30 සිට බලපැවැත්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනය සහිත නව ERP පද්ධතියක් මිලදී ගෙන ක්‍රියාත්මක කරන ලදී. | නව ස්ථාවර වත්කම් ලේඛනය වැඩිදියුණු කිරීම සිදු කරමින් පවතී. |
| (ඇ) | සමාගමේ දේපළ, පිරියත සහ උපකරණ ලේඛනයේ 2020.12.31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් රු.94,681,267 ක් නිරීක්ෂණය වූ අතර මෙම වත්කම්වලින් සමහරක් තවමත් භාවිතයේ පවතී.<br>වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂිත අගයන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස් නම්, වෙනස ගණනය කරනු ලැබේ.<br>කෙසේ වෙතත්, සමාගම ඉහත සඳහන් අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. | 2021 වසර තුළදී පරීක්ෂණ බංකු, ඩීසල් ජෙනරේටරය සහ වාහනය වැනි ඇතැම් යන්ත්‍ර සූත්‍ර ප්‍රතිස්ථාපනය කිරීමට අපි සැලසුම් කළෙමු. ආර්ථික තත්ත්වය සහ බැංකුවල පවතින ඇමරිකානු ඩොලර් හිඟය හේතුවෙන් ආනයන සීමා කිරීම් නිසා වත්කම් බැහැර කිරීමට නොහැකි විය. | යන්ත්‍රෝපකරණ ප්‍රතිස්ථාපනය 2022 වර්ෂයේදී ආරම්භ වේ. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ සහ ප්‍රවර්ධන | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | යෝජනා ක්‍රමයක් (SORP) සමාගම සතුව නොතිබුණි. | | | |
| (ඉ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව විස්තීර්ණ පාලන සහ පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොතක් සමාගම සතුව නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි සමාගම විසින් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අංක.PED/12 දරන චක්‍රලේඛයේ අදාළ විධිවිධානවලට අනුකූල විය යුතුය | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |
| (උ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. | අංක.PED/12 දරන චක්‍රලේඛයේ අදාළ විධිවිධානවලට අනුකූල විය යුතුය | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |
| (ඌ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි සමාලෝචිත වර්ෂය සඳහා සමාගම විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි. | අංක.PED/12 දරන චක්‍රලේඛයේ අදාළ විධිවිධානවලට අනුකූල විය යුතුය | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | සමාගම අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුයි | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |
| (ඒ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |
| (ඔ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. කෙසේ වෙතත්, සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාවට නංවා නොතිබූ අතර සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයට" අනුකූල විය යුතුය. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. | කළමනාකාරිත්වයෙන් පිළිතුරු ලැබී නොමැත. |

## 4.83 සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 34,155,206,000 | 30,937,904,000 | 44,107,019,000 | 12,350,902,000 | 3,217,302,000 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 36,729,109,163 | 32,801,317,005 | 47,496,836,471 | 13,960,234,591 | 3,927,792,158 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 32,498,903,423 | 30,189,910,809 | 47,344,681,926 | 12,662,316,361 | 2,308,992,614 | තත්ත්වාගණනය කල |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 97.60 | 82.21 | 248.07 | 85.05 | 15.39 |
| 2019 | 102.97 | 89.18 | 244.55 | 76.24 | 13.79 |
| 2020 | 96.04 | 86.10 | 325.41 | 156.75 | 9.94 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | තොරතුරු තාක්ෂණය සඳහා වන සමස්ත සැලැස්ම කෙටි කාලීනව හෝ දිගු කාලීනව | ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව සමාලෝචනය සහ | තොරතුරු තාක්ෂණ සැලැස්ම සහ ප්‍රතිපත්ති | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය |

| | | | | |
|---|---|---|---|---|
| | නිරූපණය කිරීමට සමාගමට තොරතුරු තාක්ෂණ උපාය මාර්ගයක් නොතිබුණි. | අනුමැතිය මගින් නියම කරන ලද දේශීය ව්‍යාපාර අවශ්‍යතා සඳහා සපයනු ලබන තොරතුරු තාක්ෂණය අනුගමනය කළ යුතු උපාය මාර්ගික දිශාව ආයතනය විසින් ස්ථාපිත කළ යුතුය. | පටිපාටි සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යවා ඇත. | බලාපොරොත්තු වේ. |
| (ආ) | PRONTO XI සහ BILLING පද්ධති දෙකෙහිම සාමාන්‍ය සහ අධි පරිශීලකයින් සඳහා විධිමත් කාලානුරූපී පරිශීලක ප්‍රවේශ අධීක්ෂණයක් සමාගම විසින් සිදු නොකරයි. | අනවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැති බව සහතික කිරීම සඳහා බල ලත් පරිශීලක හැඳුනුම්පත් මගින් සිදු කරනු ලබන සියලුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර (හෝ බාහිර) තොරතුරු තාක්ෂණ විගණන කණ්ඩායමක් විසින් සටහන් කර සමාලෝචනය කළ යුතුය. පරිශීලක ප්‍රවේශ හිමිකම්වල නිරවද්‍යතාවය සහ යෝග්‍යතාවය සහතික කිරීම සඳහා ඔවුන්ගේ සැබෑ රැකියා භූමිකාවන්/කාර්යයන් සම්බන්ධයෙන් වරින් වර සමාලෝචන සිදු කිරීම තවදුරටත් නිර්දේශ කෙරේ. | පරිශීලක ප්‍රවේශයන් මාසිකව යාවත්කාලීන වේ. | නව ERP පද්ධතිය සමඟින් සමාලෝචන ක්‍රියාවලියක් හඳුන්වාදීමට නියමිතය. |
| (ඇ) | බිල්පත් පද්ධතියේ නව සම්බන්ධතා ආරම්භක දිනය ඕනෑම පෙර දිනයකට සකස් කල හැකි වේ. . | සම්බන්ධතා ආරම්භක දිනය පෙර දිනයකට සකස් කිරීම සීමා කිරීම | දිනය, මීටර මුද්‍රා තැබීමේ ඩොකට් එකෙන් ගන්නා | බිල්පත් පද්ධති දිනය සහ භෞතිකව |

| | | | | |
|---|---|---|---|---|
| | | සඳහා කළමනාකරණය විසින් බිල්පත් පද්ධතිය වැඩිදියුණු කළ යුතු බවට නිර්දේශ කෙරේ. | අතර එය සත්‍ය ආරම්භක දිනය වේ. | සම්බන්ධිත දිනය තාක්ෂණික නිලධාරීන් විසින් සංසන්දනය කරනු ලැබේ. |
| (ඈ) | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2002 වසරේදී ලංකා විදුලි (පුද්ගලික) සමාගම නාරාහේන්පිට ප්‍රදේශයේ ඉඩමක් මිලදී ගෙන ඇත. මිලදී ගත් දා සිට නිෂ්කාර්යව පවතින මෙම ඉඩමට ආරක්ෂාව සැපයීම සඳහා සමාගම සැලකිය යුතු පිරිවැයක් දරයි.<br>ලංකා විදුලි (පුද්ගලික) සමාගමට නාරාහේන්පිට ඉඩමමේ හිමිකාරීත්වය පැවතුනද, සමාගමේ මෙහෙයුම් කටයුතු සියලු බදු ඇතුළුව රු.3,543,040 මාසික කුලියකට අංක 411, ඊළව් කුරේ ගොඩනැගිල්ල, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පවත්වාගෙන යනු ලබයි. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කරමින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. | ගොඩකිරීමේ (Filling) කටයුතු සිදුවෙමින් පවතී. |
| (ඉ) | ඇන්ටි ලෙකෝ (පුද්ගලික) සමාගමේ වසර 4 කට පෙර කරන ලද රු.මිලියන 47.1 ක ආයෝජනයක් සඳහා කොටස් සහතික සහ කොටස් වෙන් කිරීම් තවමත් ලැබී නොතිබුණි. | සමාගම ඇන්ටි ලෙකෝ (පුද්ගලික) සමාගමේ සමඟ ගැටළුව සාකච්ඡා කර විසඳා ගත යුතු අතර, මෙම ආයෝජනයට අදාළ කොටස් හැකි ඉක්මනින් ලබා දෙන බවට සහතික විය යුතුය. | තාක්ෂණික තක්සේරුව සිදු කරන ලද නමුත් අවසාන කොටස් නිකුතුව තවමත් අවසන් වී නොමැත. | අවසාන කොටස් නිකුතුව සම්පූර්ණ කර නොතිබුණි. |
| (ඊ) | ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා විදුලි සමාගම (පෞද්ගලික) අතර විධිමත් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමක් නොතිබුණි. | තව දුරටත් ප්‍රමාදයකින් තොරව දෙපාර්ශවයක් අතර ගැටළු ඇතිවීම වැලැක්වීම සඳහා විධිමත් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමක් සකස් කළ යුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය සමග සාකච්ජාව සිදු කරමින් පවතී. | බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | සීමාසහිත ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් (පුද්ගලික) සමාගමේ රු.මිලියන 5 ක සාමාන්‍ය කොටස්වල ආයෝජනය සඳහා වන කොටස් සහතික ඉදිරිපත් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර මෙම මුදල 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණයෙන්ම අපහායනය කර තිබුණි. | නීතිපතිවරයාගේ තීරණය ලැබීමෙන් පසු එම මුදල අයකර ගැනීමට සමාගම පියවර ගත යුතුය. | කළමනාකරණයෙන් පිළිතුරු ලැබී නොමැත. | සමාගම නීතිපති දෙපාර්තමේන්තුවෙන් නීති උපදෙස් පතයි. |
| (ඌ) | සමූහය තුළ සම්පූර්ණ පාලන සහ පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොතක් නොතිබුණි. | සමූහය විසින් ලිඛිත සම්මත පාලන සහ පරිපාලන ක්‍රියා පටිපාටි සකස් කර පවත්වාගෙන යා යුතුය. අත්පොත සකස් කිරීමෙන් පසුව ඒවා අවබෝධ කර ගැනීමට සහ අදාළ කර ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට කාර්ය මණ්ඩලය පුහුණු කළ යුතුය. | පාලන සහ පරිපාලන ක්‍රියා පටිපාටි සකස් කරමින් පවතී. | අත්පොත් සකස් කිරීම සඳහා උපදේශකයෙකු තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවූ අතර එය දැන් විශේෂඥ කණ්ඩායමක් විසින් සකස් කරමින් පවතී. |
| (එ) | පාරිභෝගිකයාට නිකුත් කරන ලද භෞතික බිල්පත් සමඟ ආදායම් නිලධාරියා විසින් පද්ධතියේ ඇතුළත් කරන ලද ඒකකවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට සමාගම කිසිදු පාලනයක් ක්‍රියාත්මක කර නොමැත. පාරිභෝගිකයා විසින් එවැනි විචලනයන් දැනුම් දෙන අවස්ථාවේදී සමාගම එවැනි වෙනස්කම් හඳුනා ගනී. ආදායම වැරදි ලෙස හඳුනා ගැනීමට මෙය හේතු විය හැක. | ආදායම් නිවැරදිව වාර්තා කිරීමට විශ්වාසදායක ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. | එවැනි ගැටළු අවම කිරීම සඳහා දුරස්ථ මීටර කියවීමේ පහසුකම සමඟින් පාරිභෝගිකයන් සඳහා සුහුරු (Smart) මීටර හඳුන්වා දෙන ලදී. | කාරණය නිවැරදි කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඒ) | කළමනාකරණය විසින් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය නිතිපතා සමාලෝචනය කර නොතිබුණි. මේ හේතුව නිසා, 2019 දෙසැම්බර් 31 වන විට සමාගමේ | කළමනාකරණය විසින් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය නිතිපතා | අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය සහ ක්ෂයවීම් අනුපාත ක්ෂේත්‍රයේ පරිචය | ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ සහායෝගයෙන් සමාලෝචනය |

| | | | | |
|---|---|---|---|---|
| | රු.බිලියන 8.7 ක වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණි. | සමාලෝචනය කළ යුතුය. | මත පදනම්ව තීරණය වේ. | කිරීමට නියමිතය. |
| (ඔ) | නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාගම විසින් 2002 වසරේදී නාරාහේන්පිට ප්‍රදේශයෙන් පර්චස් 73.85 ක ඉඩමක් රු.53,541,250 ක මුදලකට මිලදී ගෙන ඇති අතර 2019 වන විට කිසිදු ඉදිකිරීමක් සිදු කර නොතිබුණි. ඉඩමේ ආරක්ෂාව සඳහා වසර 18 ක් පුරා රු.මිලියන 10 කට වඩා වැය කර ඇති අතර 1999 සැප්තැම්බර් සිට 2019 ජූනි දක්වා ගොඩනැගිල්ල කුලියට ගැනීමට රු.මිලියන 208ක් වැය කර ඇත. ඉඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2015 වසරේ කුලියට ගත් අමතර ගොඩනැගිල්ල සඳහා 2019 ජූනි මාසය දක්වා රු.මිලියන 22.3ක් කුලිය ලෙස ගෙවා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් කටයුතු කඩිනම් කළ යුතුය. | ඉදිකිරීම් කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. | ගොඩකිරීමේ (Filling) කටයුතු සිදුවෙමින් පවතී. |
| (ඕ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූලව සියලුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. නමුත් සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව දැනුවත්ව නොසිටි අතර සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2030 න්‍යාය පත්‍රයට අනුකූල විය යුතුය. | ක්‍රියාකාරී සැලැස්මේ මෙය හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පියවර ගැනේ. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ක) | ඒකල ගබඩාවේ, වස්කඩුව ගබඩාවේ, කෝට්ටේ ශාඛාවේ, නුගේගොඩ ශාඛාවේ සහ මීගමුව ශාඛාවේ පිළිවෙලින් රු.841,799 ක, රු.763,212 ක, රු.2,149,068 ක, රු. 1,527,221 ක සහ රු.547,038 ක වෙනස්කම් තොග සත්‍යාපන ලේඛන සහ සාමාන්‍ය ලෙජරය අතර පැවතුණි. | වෙනස්කම් අවම කිරීම සඳහා පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | පාරිභොගිකයින්ගෙන් එකතු කරන ලද මීටර් පරීක්ෂණ ගාස්තු වෙනත් මෙහෙයුම් ආදායම්වලට ඇතුළත් කර තිබුණි. මෙම ගාස්තුව ඉල්ලීම සිදු කරන අවස්ථාවේ දී මනු පරීක්ෂාව සඳහා ඉල්ලා සිටින සියලුම පාරිභෝගිකයින්ගෙන් අය කරනු ලබන අතර එම ගාස්තු ගෙවීමේ කුවිතාන්සියේදී ආදායම ලෙස හඳුනාගෙන ඇත. මීටර පරීක්ෂා කිරීමේදී දෝෂ සොයාගෙන තිබේ නම්, පාරිභෝගිකයාගෙන් අය කළ ගාස්තුව ආපසු ගෙවිය යුතුය. මීටරයේ කිසිදු දෝෂයක් නොමැති නම්, මීටර පරීක්ෂාව සඳහා එකතු කරන ලද ගාස්තුව ආදායම ලෙස පවතී. (එය ආපසු ගෙවිය නොහැකි බැවින්). ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 හි 31 වන ඡේදයේ දක්වා ඇති විධිවිධානවලට මීටර් පරීක්ෂණ ගාස්තුවල ආදායම් හඳුනාගැනීම අනුකූල නොවන බව නිරීක්ෂණය විය. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ච) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 හි 9 වන වගන්තියට අනුව, අඩු පිරිවැයට හෝ ශුද්ධ යථාර්ථවාදී වටිනාකමට තොග අගය කල යුතුය. කෙසේ වෙතත්, සමාගම තොග තක්සේරුවේදී ශුද්ධ යථාර්ථවාදී වටිනාකම සලකා නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ජ) | ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ අවිනිශ්චිත වගකීම සම්බන්ධයෙන් නීති හා පරිපාලන කළමනාකරු විසින් නිකුත් කරන ලද 2021 අප්‍රේල් 29 දිනැති අංක.LO/GEN/13 ලිපියට අනුව, සමාගමට එරෙහිව රු. 11,253,884 ක වටිනාකමකින් යුත් නඩු තුනක් පවරා ඇති බව නිරීක්ෂණය වූ අතර එහි තීරණය සමාගමට හිතකර වීමට අඩු සම්භාවිතාවයකි පැවතුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 37 අනුව අවිනිශ්චිත වගකීම් සම්බන්ධයෙන් සමාගම අනාවරණය කර නොතිබුණි. | | | |
| (ට) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදයට පටහැනිව, සැපයුම්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු රු.64,314,868 ක් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම් වලට එරෙහිව පියවා ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ඩ) | සමාගම විසින් රු. 9,174,474 ක් වූ ගනුදෙනුකරුවන්ගේ ණය ශේෂය, බිල්පත් පද්ධතියට ඇතුළත් වූ සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ ලැබිය යුතු ශේෂයට එරෙහිව පියවා තිබුණි. තවද, මෙම සියලු ණය ශේෂයන් වැඩිපුර ගෙවා ඇති විදුලි බිල්පත් නොවූ අතර ඒවායින් බොහොමයක් සූර්යබල ණය හිමියන්ගෙන් එකතු කරන ලද ගෙවීම් වේ.<br>සමාගම විසින් එකතු කරන ලද සූර්යබල ණය වාරික බිල්පත්, පද්ධතියෙන් ජනනය කරනු ලබන ණය පියවීම් වාර්තාව මත පදනම්ව ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත මාරු කරයි. බිල්පත් පද්ධතිය තුළ සූර්යබල ණය වාරික නිවැරදිව යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය විය. මේ නිසා ඉහත කී ණය පියවීම් වාර්තාව නිවැරදි නොවිය හැක. මේ අනුව, එකතු කළ වාරිකය බැංකුවට පැවරීමේ ප්‍රමාදයක් ඇති විය. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ණ) | රු.9,385,853 ක අත්තිකාරම් ගෙවීම්, සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ඇතුළුව විවිධ ණය හිමියන්ට එරෙහිව හිලව් කර තිබුණි. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ත) | 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වටිනාකම රු.9,206,401,000 ක් වූ වත්කම් සමාගමේ ස්ථාවර වත්කම් ලේඛනයේ පැවති අතර මෙම වත්කම්වලින් සමහරක් තවමත් භාවිතයේ පවතින බව නිරීක්ෂණය විය. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ද) | සාමාන්‍ය ලෙජරය (මූල්‍ය ප්‍රකාශන) සහ 2020 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් සඳහා සපයා ඇති උපලේඛන අතර ප්‍රගතියේ ප්‍රාග්ධන කටයුතුවල වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | මූල්‍ය ප්‍රකාශනවල ගනුදෙනු නිවැරදිව සටහන් කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| ශාඛාව | 2020.12.31 දිනට සාමාන්‍ය ලෙජරයට අනුව ශේෂය (රු.) | 2020.12.31 දිනට උපලේඛනයට අනුව ශේෂය (රු.) | වෙනස (රු.) |
|---|---|---|---|
| කෝට්ටේ | 124,530,978 | 124,637,375 | (106,397) |
| නුගේගොඩ | 215,834,467 | 237,329,923 | (21,495,456) |
| මීගමුව | 29,970,666 | 35,308,618 | (5,337,952) |
| කළුතර | 96,670,525 | 96,695,527 | (25,002) |
| ගාල්ල | 77,226,400 | 65,301,260 | 11,925,140 |
| මොරටුව | 32,400,255 | 32,204,210 | 196,045 |
| කලණිය | 21,444,022 | 21,417,744 | 26,278 |
| කළුතර-ගොඩනැගිල්ල | 751,837 | අදාළ නොවේ | - |
| නුගේගොඩ-11KVA විදුලි රැහැන් | 117,070,917 | අදාළ නොවේ | - |
| ප්‍රධාන කාර්යාලය-ගොඩනැගිලි | 20,460,697 | අදාළ නොවේ | - |
| ප්‍රධාන කාර්යාලය-උපපොළ ආසියානු සංවර්ධන බැංකු අරමුදල් | 725,414 | අදාළ නොවේ | - |

| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය- ගොඩනැගිල්ල | 6,133,274 | අදාළ නොවේ | - |
| එකතුව | 743,219,454 | 612,894,657 | |

| | | | | |
|---|---|---|---|---|
| (න) | 2020 දෙසැම්බර් 31 දින නුගේගොඩ ශාඛාවේ සිදු කරන ලද රු. 5,997,445 ක මුදල් තැන්පතුව, මූල්‍ය ප්‍රකාශනවල බැංකු අයිරාවක් ලෙස හඳුනාගෙන තිබුණි. | ගනුදෙනු නිවැරදිව සටහන් කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ප) | මහජන බැංකුවේ කාලීන තැන්පතු නවයක් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් පොලී ආදායම සමාලෝචිත වර්ෂය තුළ හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව, ආයෝජන වටිනාකම දළ වශයෙන් රු.136,806,661 කින් අඩුවෙන් දක්වා තිබුණු අතර පොලී ආදායම දළ වශයෙන් රු.67,972,005 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ආයෝජනයේ පොලී ආදායම නිවැරදිව සටහන් කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (බ) | සමාගම වත්කම් භාවිතා කිරීමේ ක්ෂයවීම් වැරදි ලෙස ගණනය කර ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, එක් එක් වත්කම් භාවිතා කිරීමේ අයිතිය මත මාසයක ක්ෂයවීම් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම් භාවිතා කිරීමේ අයිතිය මත ක්ෂයවීම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ම) | ආදායම් ප්‍රකාශයෙන් අඩු කරන ලද පාරිතෝෂිත ප්‍රතිපාදන රු. 188,775,000 ක් වූ අතර, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී සමාගම විසින් රු.378,219,000 ක් පාරිතෝෂික ප්‍රතිපාදන ලෙස ගැලපුම් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ය) | මූල්‍ය ප්‍රකාශනවල සහ බිල්පත් පද්ධතියේ ණය ගැති ශේෂය අතර රු.13,548,574ක හඳුනා නොගත් වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස්කම් සැසඳුම් කිරීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ර) | ඇන්ටි ලෙකෝ් සමාගමේ රු.6,092,227 ක් වූ ආදායම් බදු වියදම සමාලෝචිත වර්ෂය සඳහා ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය තුළ ගැලපුම් කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාලනය නොවන පොලී සහ රඳවාගත් ඉපැයීම් පිළිවෙළින් රු.1,827,668 කින් සහ රු. 4,264,559 කින් වැඩියෙන් දක්වා තිබුණි | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ල) | සූර්යබල ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් 2017 පෙබරවාරි 13 වැනි දින ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ පැවති රැස්වීමේ දී එකඟ වූ පරිදි සමාගම විසින් ඉදිරිපත් කළ යුතු ශුද්ධ ගිණුම්කරණය සහ ශුද්ධ එකතු කිරීමේ ක්‍රමය භාවිතයෙන් විදුලිය මිලදී ගැනීම සඳහා වූ අලාභ ගැලපුම් යෝජනාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රැස්වීමේදී එකඟ වූ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. ඒවා පිළිපැදීමට නොහැකි නම්, අදාළ පාර්ශ්වයන්ගෙන් අවසර ලබා ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ව) | Lanka Broadband Network (Private) Limited සහ LECO Projects (Private) Limited හි ආයෝජන අඩාල වීමට හේතු වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ ලියකියවිලි විගණනය වෙත ඉදිරිපත් කල යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ස) | බිල්පත් පද්ධතිවල දක්වා ඇති වසර 2 කට වැඩි කාලයක් සඳහා අය විය යුතු මුළු ණය ගැතියන්ගෙන් සියයට 6 කට සමාන රු.429,985,332 න් රු. 388,266,981 ක් හෙවත් වසර 2 කට වැඩි කාලයක් සඳහා හිඟ මුදල්වලින් සියයට 90 ක්, පළාත් සභාවලින් අයවිය යුතු වීදි ආලෝක බලශක්ති ගාස්තුවලින් ලැබිය යුතු මුදල්වලින් සමන්විත විය. | ණයගැති ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (හ) | රු. 1999, 2001 සහ 2002 වර්ෂවලට අදාළව වැට් සහ GST ආපසු අය විය යුතුවීම් රු.12,020,077ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | පාර්ශ්වවලින් අය වියයුතු මුදල් අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ළ) | 2020 දෙසැම්බර් 31 දිනට ප්‍රතික්ෂේප කරන ලද ගිණුම්වල රු. 8,075,976 ක හඳුනා නොගත් තැන්පතුවක් තිබූ බව නිරීක්ෂණය විය. | ලෙජර් ගිණුම්වල ඇති නොගැලපෙන ගනුදෙනු නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (අඅ) | තාවකාලික සම්බන්ධතා වල තැන්පතු මුදල් රු.12,335,580 ක් පහසුකම විසන්ධි කිරීමෙන් පසුව සමාගම විසින් ආපසු ලබා දී නොමැති අතර මෙම ශේෂයන් දිගු කාලයක් පවතින බව නිරීක්ෂණය විය. | තැන්පතු ආපසු ගෙවීමට හෝ ආදායමක් ලෙස හඳුනාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ආආ) | කැලණිය විහාරස්ථානයේ සිට ලංකා විදුලි සමාගම් අන්තය දක්වා මාර්ගය ඉදිකිරීම සඳහා 2012 ජූනි 7 වන දින මාර්ග සංවර්ධන අධිකාරියෙන් රු.3,026,458 ක මුදලක් සමාගමට ලැබී ඇත. කෙසේ වෙතත්, විගණන දිනය වන විටත් සමාගම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබූ බව නිරීක්ෂණය විය. | ප්‍රාග්ධන ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ඇඇ) | වැට් බදු ගෙවීම සම්බන්ධයෙන් රු. 33,427,699 ක දිගු හිඟ ශේෂයක් පෙරගෙවුම් යටතේ ඇතුළත් කර තිබූ අතර විගණන දිනය දක්වා ඉහත ශේෂය අයකර ගැනීමට සමාගමට නොහැකි විය. | අනෙකුත් පාර්ශ්වවලින් අය විය යුතු මුදල් අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ඈඈ) | 2020 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ, ජා-ඇල සහ කඳාන පාරිභෝගික සේවා මධ්‍යස්ථානවල හඳුනාගත් ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමේ අලාභය පිළිවෙළින් රු.3,767,651 ක්, රු. 234,975 ක් සහ රු.26,916,683 ක් විය. | ඉඩම් හා ගොඩනැගිලිවල පිරිවැය නිවැරදිව හඳුනා ගැනීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉඉ) | ශුද්ධ ගිණුම්කරණ සහ ශුද්ධ එකතු කිරීමේ ක්‍රමය භාවිතයෙන් විදුලිය මිලදී ගැනීම සඳහා සූර්යබල ණය යෝජනා ක්‍රමයට අදාළව ලංකා විදුලිබල මණ්ඩලය සහ සමාගම අතර ගිවිසුමක් නොතිබුණි. | අදාළව ලංකා විදුලිබල මණ්ඩලය සමග විධිමත් ගිවිසුමකට එළඹීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ඊඊ) | ස්වයං ජනන ගෙවීම් සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ සමාගම අතර ගිවිසුමක් නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලය සමග විධිමත් ගිවිසුමකට එළඹීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (උඋ) | කැලණිය, නුගේගොඩ සහ මොරටුව ශාඛාවල ගනුදෙනුකරුවන් 9 දෙනෙකුගෙන් ලැබුණු රු.1,326,946 ක වටිනාකමකින් යුතු චෙක්පත් 11 ක් අගරු වී ඇති බව නිරීක්ෂණය වූ අතර එම හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සමාගමට නොහැකි විය. | ගනුදෙනුකරුවන්ගෙන් අයවියයුතු මුදල් අයකර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ඌඌ) | ලංකා විදුලි (පුද්ගලික) සමාගම විසින් මිලදී ගන්නා ලද ඉඩම්වල ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රාථමික උපපොළවල් ඉදිකර ඇති අතර එම ඉඩම්/ගොඩනැගිලි සම්බන්ධයෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.206,610,712 ක පිරිවැයක් සමාගමට දැරීමට සිදුවිය. ඉඩම්වල වටිනාකම වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දේ තුළ හඳුනාගෙන ඇත. තවද, ඉහත ව්‍යාපෘති සම්බන්ධයෙන් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර විධිමත් ගිවිසුමක් නොතිබුණි. | ආයතනයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා ආයතනය සතු සම්පත් ප්‍රයෝජනයට ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (එඑ) | ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාථමික උපපොළ පිහිටා ඇති (නාවල) පර්චස් 52.5ක (ලොට් ඩබ්ලිව්) ඉඩම සම්බන්ධයෙන් පර්චස් 6ක ඉඩමක සහ පර්චස් 14.55ක පාරේ අයිතිය සඳහා අයිතිය ඉල්ලා කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර තිබුණි. මෙම ඉඩමේ පර්චස් | ක්‍රියාකාරකම් සිදු කිරීමේදී, සමාගමේ වටිනාකම වැඩි කිරීමට සහ පාඩු අවම කර ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 6 ලබා දෙන ලෙස 2013 මාර්තු 04 දින අධිකරණය විසින් සමාගමට නියෝග කර තිබුණි. එම තීන්දුවට එරෙහිව සමාගම විසින් අභියාචනාධිකරණයේ ගොනු කර තිබූ නඩුව ඉල්ලා අස්කර ගන්නා ලෙසත්, පර්චස් 6 ක ඉඩම ලබා දෙන ලෙසත්, මාර්ගයේ අයිතිය සමථයකට පත් කරන ලෙසත් නීතිපතිවරයා විසින් සමාගමට දන්වා තිබුණි.<br>මූල්‍ය ප්‍රකාශයේ මෙම නඩුව සම්බන්ධයෙන් සමාගම කිසිදු අනාවරණයක් හෝ ගැලපීමක් සිදු කර නොතිබුණි. ඊට අමතරව ඉහත කී පර්චස් 6 ඉඩමේ ගැනුම් මිල රු. 11,664,122 (102,061,068/52.50*6) වන බැවින් සමාගමට සිදුවූ පාඩුව දළ වශයෙන් රු. 11,664,122 කි. | | | |
| (ඒඒ) | සමාගම සිය දේපල, පිරියත සහ උපකරණ රක්ෂණ ඔප්පුවක් යටතේ රක්ෂණය කර නොමැති බව නිරීක්ෂණය විය. 2020 දෙසැම්බර් 31 දිනට දළ වශයෙන් රු.මිලියන 243 ක මෝටර් වාහන සඳහා පමණක් රක්‍ෂණ ඔප්පු ලබාගෙන තිබුණු අතර ස්ථාවර වත්කම්වලට අමතරව පැවති රු.මිලියන 2,805 ක තොග සඳහා ද 2020 දෙසැම්බර් 31 වන විට රක්ෂණ ආවරණයක් නොතිබුණි. | ස්ථාවර වත්කම් ආරක්ෂා කිරීම සඳහා සැලකිය යුතු පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ඔඔ) | නාරාහේන්පිට අල්විටිගල පාරේ අංක 508 දරන ස්ථානයේ පිහිටි පර්චස් 73.7ක ඉඩමක් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2001 වර්ෂයේදී රු.53,432,500 කට මිල දී ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී ද එහි ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. උපදේශන ගාස්තු ඇතුළුව මේ සම්බන්ධයෙන් දරන ලද වියදම් කරමින් පවතින ප්‍රාග්ධන වැඩ ගිණුමට ඇතුළත් කර තිබුණි. | ඉදිකිරීම් ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව නිම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

<table>
<tr>
<td>(ඕ ඕ)</td>
<td>2000 ජනවාරි සිට 2018 දක්වා ශාඛා කාර්යාල, පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා ඉඩම් මිලදී ගෙන තිබුණද, විගණන දිනය වන විටත් අදාළ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. විස්තර පහත පරිදි වේ.
<table>
<tr><th>කාර්යාලය</th><th>ඉඩම් මිලදී ගත් දිනය</th><th>පරිශ්‍රයේ ප්‍රමාණය (පර්චස්)</th></tr>
<tr><td>ශාඛා කාර්යාලය - කැලණිය</td><td>2001 අගෝස්තු</td><td>117.55 (රූඩ් 2 පර්චස් 37.55)</td></tr>
<tr><td>පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ය - දළුගම</td><td>2015 අගෝස්තු</td><td>57.12 (රූඩ් 1 පර්චස් 27.12)</td></tr>
<tr><td>පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ය - වත්තල</td><td>1994</td><td>30</td></tr>
<tr><td>පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ය - මීගමුව</td><td>2018 ඔක්තෝබර් 19</td><td>32.3</td></tr>
<tr><td>පාරිභෝගික සේවා මධ්‍යස්ථාන නිල නිවාස - පයාගල</td><td>2019</td><td>15.5</td></tr>
</table>
</td>
<td>දිගුකාලීන ප්‍රතිලාභ සමාගමට ලැබෙන බැවින් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් නිම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.</td>
<td>කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත.</td>
<td>කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත.</td>
</tr>
</table>

| | | |
|---|---|---|
| ශාඛා කාර්යාලය - කෝට්ටේ | 2000 ජනවාරි 26 | 51.50 (රුඩ් 1 පර්චස් 11.5) |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථානය - නුගේගොඩ | 2001 මැයි 10 | 35.80 |
| පාරිභෝගික සේවා මධ්‍යස්ථාන නිල නිවාස - පානදුර | 2019 මැයි | 20 |

| | | | | |
|---|---|---|---|---|
| (කක) | වත්තල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා කැබිනට් අනුමැතිය මත 1994 දී නාගරික සංවර්ධන අධිකාරියෙන් 99 අවුරුදු බදු පදනම මත ලබාගත් ඉඩම, එම ඉඩමෙහි පාරිභෝගික සේවා මධ්‍යස්ථානයක් හෝ අදාළ සංවර්ධන කටයුත්තක් ඉදිකිරීමට සමාගමට නොහැකි වූ බැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2003 අගෝස්තු 20 දිනැති ඔවුන්ගේ ලිපියෙන් ආපසු පවරාගෙන තිබුණි.<br><br>1997 වර්ෂයේ දී මෙම ඉඩම සඳහා සමාගම විසින් රු.3,099,000 ක් ගෙවා ඇති අතර විවිධ ණය ගැතියෙකු ලෙස එය සටහන් කර ඇත. කෙසේ වෙතත්, මෙම ආයෝජනය සඳහා කිසිදු මූල්‍ය හෝ වෙනත් ප්‍රතිලාභයක් ලැබී නොතිබූ අතර, එය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, සැලසුම් කළ පරිදි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය ඉදිකිරීමට සමාගම අපොහොසත් වූ බැවින් කුලී පදනම මත | ආයතනයට උපරිම ප්‍රතිලාභ ලබා දීම සඳහා ආයතනය සතු සම්පත් භාවිතා කළ යුතුය**.** | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගත් ගොඩනැගිල්ලක අදාළ කාර්යාලය පවත්වාගෙන යමින් පැවතුනි. | | | |
| (ගග) | සැලසුම් කළ පරිදි කාර්යාල ඉදිකිරීමට කටයුතු නොකිරීම නිසා බොහෝ කාර්යාල පරිශ්‍ර දිගුකාලීනව කුලියට ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාගමට කාර්යාල කුලිය සඳහා වැඩි මුදලක් වැය කිරීමට සිදු වූ අතර සමාලෝචිත වර්ෂය තුළ දරන ලද කුලී වියදම රු.71,429,500 කි. | වියදම් ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (චච) | සමාගම විසින් රු.2,000,000,000ක ණය මුදලක් 2020 මාර්තු 02 දින ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන් අතර මේ සම්බන්ධයෙන් පාර්ශව දෙකක් අතර ඇති විධිමත් ගිවිසුමක් විගණනයට ඉදිරිප් නොකරුනි. තවද, ඉහත ණය මුදලේ කිසිදු වාරිකයක් විගණනය කරන දිනය දක්වා සමාගමට ලැබී නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයට සමග විධිමත් ගිවිසුමකට එළඹීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ජජ) | ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ සමාගම අතර සූර්යබල ණය ගිවිසුමේ පොලී ගෙවන දිනය සහ පොලී ගණනය කිරීම සඳහා යොදාගත යුතු මුදල පැහැදිලිව සඳහන් කර නොමැති බව නිරීක්ෂණය විය. | සියලුම ගිවිසුම්වලට අවශ්‍ය කොන්දේසි පැහැදිලිව ඇතුළත් කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ටට) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම වසර තුනක කාලයක් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් වලින් සමන්විත නොවූ අතර 2020 දී සිදුකිරීමට නියමිත ප්‍රසම්පාදන ඊට ඇතුළත් විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව වසර 03ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතු අතර වසර 01 ක් සඳහා සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඩඩ) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම නිතිපතා යාවත්කාලීන කර ප්‍රගතිය සමාලෝචනය කර නොමැති නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ විධිවිධාන අනුව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට නොවැඩි කාල පරතරයකින් නිතිපතා යාවත්කාලීන කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ණණ) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් වූයේ සම්මත තොග අයිතම සහ ලිපි ද්‍රව්‍ය පමණි. වැඩ සඳහා ප්‍රසම්පාදන, උපදේශන සේවා ඇතුළු සේවාවන් සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | සියලුම ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (තත) | ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය යාවත්කාලීන කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් නොතිබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, නිශ්චිත දිනකදී අවසන් කර හෝ අවසන් නොකළ ප්‍රසම්පාදන හඳුනා ගැනීම දුෂ්කර විය. | ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය නිතිපතා සමාලෝචනය කිරීම අවශ්‍ය වේ. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (දද) | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණේ 2020 ක්‍රියාකාරී සැලැස්මට අදාළ ප්‍රසම්පාදන 6ක් පමණි. එබැවින් ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම අතර නිසි සම්බන්ධයක් නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රසම්පාදන සැලැස්ම සමඟ සම්බන්ධ කිරීමට පියවර ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (නන) | අංක.PED/12 දරන චක්‍රලේඛයේ 9.3 වගන්තිය ප්‍රකාරව බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ අනුමත පටිපාටියක් නොතිබුණි. | එය අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (පප) | අංක.PED/12 දරන චක්‍රලේඛයේ 9.2 වගන්තිය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති සංවිධාන සටහනක් සහ අනුමත සේවක සංඛ්‍යාවක් සමාගමට නොතිබුණි. | එය අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |


| | | | | |
|---|---|---|---|---|
| (බබ) | අංක.PED/12 දරන චක්‍රලේඛයේ 9.14 වගන්තියට අනුව සමාගමේ ක්‍රියා පටිපාටි අත්පොතක් නොතිබුණි. | එය අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (මම) | සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන නිලධාරි, ගිණුම් සහකාර, ප්‍රවාහන විධායක සහ පුහුණු විධායක යන තනතුරු සඳහා සේවකයින් අට දෙනෙකු බඳවා ගෙන තිබුණි. මෙම බඳවා ගැනීම් පරීක්ෂා කිරීමේදී අපේක්ෂකයින් විසින් සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛනවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය අදාළ ආයතනවලින් තහවුරු කර ගැනිමට කටයුතු කර නොමැති බවත් පෞද්ගලික ලිපිගොනුවල ඇතුළත් අදාළ සුදුසුකම්වල සහතික කරන ලද පිටපත් විධිමත් ලෙස සහතික කර නොමැති බවත් නිරීක්ෂණය විය. | ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (යය) | පරිපාලන නිලධාරි බඳවා ගැනීම් පරීක්ෂා කිරීමේදී, අංක 57 දරන අයදුම්කරු එකී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද සේවා සහතිකයට අනුව 2009 නොවැම්බර් 26 සිට 2015 මැයි 08 දක්වා වසර 5ක කාලයක් කළමනාකරණ සහකාරවරයෙකු ලෙස මූල්‍ය සමාගමක සේවය කර ඇත. එම කාලය තුළ ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධි අපේක්ෂිකාවක් වූවාය. අදාළ මූල්‍ය සමාගම විසින් ඇය තම ආයතනයේ සේවිකාවක් නොවන බව විගණනයට ඍජුවම තහවුරු කර ඇති බැවින් එම අයදුම්කරු ඉදිරිපත් කළ සේවා සහතිකය ව්‍යාජ ලියවිල්ලක් විය හැකි බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කළ යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (රර) | ගිණුම් සහකාර බඳවා ගැනීම් සම්බන්ධයෙන්, 2020 සැප්තැම්බර් 21 දින දක්වා ලැබුණු අයදුම්පත් 1,382 න් තෝරා ගැනීම සඳහා සලකා බලා තිබුණේ පළමු අයදුම්පත් 325 පමණි. තවද, විගණන දිනය වන විටත් ඉතිරි අයදුම්පත් 1057 සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර, ඒ හේතුවෙන් වඩාත් සුදුසු අයදුම්කරුවන් බඳවා ගැනීමේ අවස්ථාව සමාගමට අහිමි වී තිබුණි. | සමාගමට සුදුසු සේවකයන් බඳවා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ලල) | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මූල්‍ය අංශයේ ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ ගිණුම් සහකාර පුරප්පාඩුව ස්ථිර පදනමින් පිරවීමට නියමිතව තිබුණද, මෙම තනතුර සඳහා 2020 දෙසැම්බර් 09 සහ 2021 ජනවාරි 12 අනියම් පදනමින් අපේක්ෂකයන් තිදෙනෙකු බඳවාගෙන තිබුණි. සුදුසුකම් ලත් අයදුම්කරුවන් විශාල පිරිසක් එම තනතුර සඳහා ඉල්ලුම් කර තිබුණද කිසිදු අයදුම්කරුවෙකු ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාගමට සුදුසු සේවකයන් බඳවා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (වව) | ගිණුම් සහකාර තනතුර සඳහා තෝරාගත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් පරීක්ෂා කිරීමේදී ඔවුන්ගේ අයදුම්පත් සෘජුවම සභාපතිවරයා වෙත යවා ඇති බව නිරීක්ෂණය වූ අතර අනියම් පදනමින් ගිණුම් සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා සලකා බලන ලෙස ඔහු මානව සම්පත් ප්‍රධානියාට උපදෙස් දී ඇත. සමාගමේ පවතින ක්‍රියා පටිපාටියට අනුව ප්‍රධාන මූල්‍ය නිලධාරියා සම්මුඛ පරීක්ෂණ පවත්වා සභාපතිවරයාගේ නිර්දේශය ලැබුණු වහාම අයදුම්කරුවන් අනියම් පදනමින් බඳවා ගන්නා ලෙස නිර්දේශ කර ඇත. කෙසේ වෙතත්, සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ බවට විගණනය සඳහා ලිඛිත සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොවුනි. | සමාගමට සුදුසු සේවකයන් බඳවා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (සස) | ගිණුම් සහකාර තනතුර සඳහා බඳවා ගන්නා ලද අපේක්ෂකයින් 3 දෙනාගෙන් අංක 103 දරන අයදුම්කරු විසින් පුවත්පත් දැන්වීම අනුව 2020 සැප්තැම්බර් 16 දින ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයට (පළමු අයදුම්පත) අමතරව 2020 දෙසැම්බර් 01 දින ඍජුවම සභාපතිවරයා වෙත අයදුම්පතක් (දෙවන අයදුම්පත) ඉදිරිපත් කර ඇත. එම අපේක්ෂකයා සති 11ක කාලයක් තුළ ඉදිරිපත් කළ මෙම අයදුම්පත් දෙක පරීක්ෂා කිරීමේදී අයදුම්පත් දෙකක සඳහන් සේවා සහතික සහ පළපුරුද්ද අතර විෂමතාවයක් ඇති බව නිරීක්ෂණය විය. එම අපේක්ෂකයා විසින් ඉදිරිපත් කරන ලද දෙවන අයදුම්පත්‍රයට අනුව ඇයට පරිගණක ආශ්‍රිත ගිණුම්කරණ පද්ධතියක් සහිත සාමාන්‍ය ලෙජර් සහ ණය පාලන ක්‍රියාකාරකම් පිළිබඳ සේවා පළපුරුද්දක් නොතිබූ අතර ඇයට පෞද්ගලික ආයතනයක පාරිභෝගික සේවා නිලධාරිනියක ලෙස වසරක පළපුරුද්දක් පමණක් තිබුණි. කෙසේ වෙතත්, ඉහත පරස්පරතා සහිතව එවැනි අයදුම්පත් දෙකක් ඉදිරිපත් කර තිබියදීත්, ඇයව අනියම් පදනමින් බඳවා ගෙන තිබුණි. | සමාගමට සුදුසු සේවකයන් බඳවා ගැනීමේදී නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුයි. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (හහ) | ප්‍රවාහන විධායක සහ පුහුණු විධායක තනතුර සඳහා අනුමත කරන ලද රැකියා විස්තරය සහ රාජකාරි ලැයිස්තුව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | රැකියා විස්තරයක් සහ රාජකාරි ලැයිස්තුවක් සකස් කර අනුමත කරගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |
| (ළළ) | ප්‍රසම්පාදන ප්‍රමාදයන් හේතුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සැලසුම් කර ඇති පරිදි ස්ථානය මත පදනම් වූ සේවා ස්වයංක්‍රීයකරණය (LBS Automation), පෝෂක අන්තයේ වෝල්ටීයතා අධීක්ෂණය (Feeder End Voltage Monitoring), වීදි පහන් පාලනය (Street Light controls) වැනි සමහර ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමට සමාගම අපොහොසත් විය. | සැලසුම් කළ පරිදි ඉලක්ක සපුරා ගැනීමට සෑම උත්සාහයක්ම ගත යුතුය. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. | කළමනාකරණයේ පිළිතුර ලැබී නොමැත. |

## 4.84 වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 40,653,198,427 | 28,549,747,785 | 78,742,999,488 | 17,045,740,424 | 12,103,450,641 | තත්ත්වාගණනය නොකල |
| **2019** | 49,390,293,390 | 37,827,250,026 | 73,475,019,095 | 12,730,159,755 | 11,563,043,364 | තත්ත්වාගණනය නොකල |
| **2020** | 46,293,609,871 | 30,718,744,552 | 89,344,010,769 | 15,557,526,991 | 15,574,865,318 | තත්ත්වාගණනය නොකල |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | බලශක්ති උත්පාදනය සම්බන්ධයෙන් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට අනුව සමාගම විසින් නිකුත් | මේ සම්බන්ධයෙන් විධිමත් ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතුය. | වෙස්ට් කෝස්ට් පවර් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය මේ සම්බන්ධයෙන් සාකච්ඡා | වෙස්ට් කෝස්ට් පවර් සමාගම සහ ලංකා විදුලිබල මණ්ඩලය මේ සම්බන්ධයෙන් සාකච්ඡා |


| | | | | |
|---|---|---|---|---|
| | කරන ලද මාසික ඉන්වොයිසි ලංකා විදුලිබල මණ්ඩලය (CEB) විසින් සමාලෝචනය කරන ලද අතර බොහෝ අවස්ථාවලදී ලංවිම විසින් පිළිගනු ලබන මුදල ඉන්වොයිස් ප්‍රමාණයට වඩා අඩුය. එකඟ වූ අගය ලංකා විදුලිබල මණ්ඩලය විසින් තහවුරු කරන අතර වෙනසට බලපෑ හේතු දක්වන්නේ නොදක්වයි. කෙසේ වෙතත්, මෙම වාර්තාව නිකුත් කරන දිනය වන විටත් මෙම ආරවුල සඳහා විසඳුමක් ලබා ගැනීමට සමාගමට නොහැකි විය. | | කරමින් සිටින නමුත් තවමත් අවසන් එකඟතාවයකට පැමිණ නැත. තවද, වෙස්ට් කෝස්ට් පවර් සමාගම විසින් පරාමිති වෙනස්කම් සම්බන්ධයෙන් කිහිප වතාවක් ලිපි යැවූ නමුත් ලංකා විදුලිබල මණ්ඩලය කිසිදු පිළිතුරක් ලබා දී නොමැත. කෙසේ වෙතත්, එම මතභේදයට තුඩු දී ඇති මුදල සඳහා කෝස්ට් පවර් සමාගම විසින් විසින් 50% ක අපහායනයක් ලබා දී ඇත. | කරමින් සිටින නමුත් ඔවුන් තවමත් අවසන් එකඟතාවයකට පැමිණ නැත. තවද, වෙස්ට් කෝස්ට් පවර් සමාගම විසින් පරාමිති වෙනස්කම් සම්බන්ධයෙන් කිහිප වතාවක් ලිපි යැවූ නමුත් ලංවිම කිසිදු පිළිතුරක් ලබා දී නොමැත. |
| (ආ) | සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී, ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී ලෙස මාණ්ඩලික නිලධාරීන් තිදෙනෙකු පත්කර සිටියද, සමාගම සඳහා බඳවා ගැනීමේ ක්‍රමයක් (SOR) සකස් කර නොතිබුණද. | සමාගම 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED/12 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගමට සිටින්නේ ප්‍රධාන විධායක නිලධාරී, ගණකාධිකාරී සහ සහකාර ගණකාධිකාරී පමණි. තවත් සේවකයන් බඳවා ගැනීමේ සැලසුමක් නැත. | තවත් සේවකයන් බඳවා ගැනීමේ සැලසුමක් නැත. එබැවින් බඳවා ගැනීමේ ක්‍රමයක් පිළිබඳ තත්ත්වය එලෙසම පවතී. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී | සමාගම 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක PED/12 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගමට මෙගාවොට් 300ක කෙරවලපිටිය බලාගාරය හිමිව පවතින අතර එය ක්‍රියාත්මක කෙරේ. සමාගමේ එකම කාර්යය එයයි. එහි ගනුදෙනු ලංකා බණිජ | මෙම සමාගමේ එකම අරමුණ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම යටතේ විදුලිබල මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් අනුව ක්‍රියාත්මක කිරීමට බලාගාරයක් ලබා දීමයි. |

| | | | | |
|---|---|---|---|---|
| | සැලැස්මක් සකස් කර නොතිබුණි. | | තෙල් සංස්ථාව වෙත මිලදී ගන්නා ලද ඉන්ධන සඳහා ගෙවීම් සිදු කිරීම, උපකරණ සැපයුම්කරුවන් විසින් නිර්දේශ කරනු ලබන ඇතැම් රසායනික ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාත්මක කිරීමේ හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුවේ කළමනාකරණයට සීමා වේ. මෙම එක් එක් ක්‍රියාකාරකම් සඳහා අනුමත ක්‍රියා පටිපාටි අනුගමනය කරයි. බලාගාර යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන ප්‍රාග්ධන අයවැය ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් සමාගමට ලබා දී ඇත්තේ වාර්ෂික සහ ආසන්න වශයෙන් නිම කිරීමේ සැලැස්මක් පමණි. තත්ත්වය 2021 මාර්තු 31 දිනට එලෙසම පවතියි. |
| (ඇ) | සමාගම විසින් අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණි. | සමාගම 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක.PED/12 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. | ව්‍යවස්ථාපිත විගණනය මෙම ක්‍රියා පටිපාටි සහ අයවැයට අනුකූල වීම පිළිබඳ විගණනය ආවරණය කරයි. සමාගමේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය පුද්ගලයන් 3 දෙනෙකුට සීමා වේ. | මෙම සමාගම යුගධනවි බලාගාරය හිමිකර තබා ගැනීම සඳහා වන තනි අරමුණක් සහිත සමාගමකි. විදුලිබල මණ්ඩලය සමඟ අත්සන් කරන ලද බලශක්ති මිලදී ගැනීමේ ගැවිසුමේ අවශ්‍යතා අනුව, බලාගාරයේ සම්පූර්ණ ක්‍රියාකාරීත්වය කොන්ත්‍රාත්කරුවෙකු විසින් සිදු කරනු ලැබේ. සමාගමේ |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ක්‍රියාකාරකම් සීමිත වන අතර බාහිර විගණකවරුන් විසින් විගණනය කරනු ලැබේ. තත්ත්වය එලෙසම පවතී. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් විගණන කමිටු පවත්වා නොතිබුණි. | සමාගම 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක.PED/12 හි විධිවිධානවලට අනුකූල විය යුතුය. | ව්‍යවස්ථාපිත විගණනය මෙම ක්‍රියා පටිපාටි සහ අයවැයට අනුකූල වීම පිළිබඳ විගණනය ආවරණය කරයි. සමාගමේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය පුද්ගලයන් 3 දෙනෙකුට සීමා වේ. | තත්ත්වය එලෙසම පවතී. |
| (ඊ) | තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) පිළිබඳ එක්සත් ජාතීනිගේ "2030 න්‍යාය පත්‍රයට" අනුව සියළුම රාජ්‍ය ආයතන එහි විෂය පථය යටතේ ඉලක්ක සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට දායක විය යුතුය. කෙසේ වෙතත්, සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳව දැනුවත්ව නොසිටි අතර සාක්ෂාත් කරගත යුතු ඉලක්ක, එම ඉලක්ක සපුරා ගැනීමේ හිඩැස් සහ ප්‍රගතිය මැනීමට සුදුසු දර්ශක හඳුනාගෙන නොතිබුණි. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ "2030 න්‍යාය පත්‍රයේ" විධිවිධානවලට අනුගත විය යුතුය. | සමාගම ලංකා විදුලිබල මණ්ඩලය සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමකට එළැඹ ඇති අතර ඊට අනුකූල විය | සමාගම බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට අනුගත වේ. සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ දැනුවත් අතර ලංකා විදුලිබල මණ්ඩලය එය බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමට ඇතුලත් කර ඇත. වෙස්ට් කෝස්ට් පවර් සමාගම බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම සමඟ අනුකූල වීමට සියලු පියවර ගෙන ඇති අතර පරිසරය ආරක්ෂා කරන බලාගාරය ක්‍රියාත්මක කිරීමට අනුමත කර ඇත. |

## 4.85 සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 2,769,526 | 17,608,938 | 88,775,429 | 8,669,386 | (14,839,412) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 1,771,230 | 15,246,464 | 68,177,476 | 1,470,740 | (13,475,234) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 102,596 | 12,977,874 | 61,530,167 | 8,499,147 | (12,875,278) | තත්ත්වාගණනය නොකළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 97.60 | 82.21 | 248.07 | 85.05 | 15.39 |
| 2019 | 102.97 | 89.18 | 244.55 | 76.24 | 13.79 |
| 2020 | 96.04 | 86.10 | 325.41 | 156.75 | 9.94 |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2015 අගෝස්තු 14 වැනි දින සීමාසහිත රුහුණු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්ගලික) සමාගම වෙත දාම සම්බන්ධක වැට (Chain Link Fence) ඉදිකිරීම රු. 48, 282,120 ක කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ ලබා දී ඇති අතර | කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |


| | | | | |
|---|---|---|---|---|
| | කොන්ත්‍රාත් කාලය මාස හයක් (06) කි. ඉදිකිරීම් අවසන් කල යුතු දිනය 2016 පෙබරවාරි 13 විය. ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා සමාගම විසින් 2018 මැයි 31 දක්වා දීර්ඝ කිරීම් එකොළහක් (11) ලබා දී තිබුණද, මෙම වාර්තාවේ දිනය වන විට භෞතික ප්‍රගතිය තිබුණේ සියයට 98ක් පමණි. | | | |
| (ආ) | සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම විසින් සාම්පූර්හි මෙගාවොට් 50ක සූර්ය බලාගාරයක් පිහිටුවීමට කැබිනට් අනුමැතිය ලැබී තිබුණද ඒකාබද්ධ කොටස් හිමියන්ගේ ගිවිසුම සහ ව්‍යාපෘති ගිවිසුම් අත්සන් කර නොමැති අතර ඉහත බලාගාරයේ කිසිදු සංවර්ධන කටයුත්තක් වාර්තාවේ දිනයේ වන විටත් සිදු කර නොතිබුණි.. | කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීමට වගකිවයුතු පාර්ශව කටයුතු කළ යුතුයි. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | කළමනාකරණය ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවිය යුතු අතර සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කල යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 ප්‍රකාරව සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. | සමාගම සඳහා වාර්ෂික අයවැය සකස් කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (ඉ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 සහ 41 වගන්තිවලට සහ 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව සමාගම අභ්‍යන්තර | අදාළ මාර්ගෝපදේශවලට හා චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| | විගණකවරයෙකු පත් කර හෝ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන කාර්යයන් සිදු කර නොතිබුණි. | | | |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 ප්‍රකාරව සමාගම ආරම්භයේ සිට මේ දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (උ) | ඉඩම් සහ සංවර්ධන වත්කම් සඳහා කපා හරින ලද රු. 2,985,550 ක මුදල සඳහා සාක්ෂි ලෙස කොන්ත්‍රාත්කරුගේ පිළිගැනීම සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව විගණනය වෙත ඉදිරිපත් නොවීය. | ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශයන් තහවුරු කර ගැනීම සඳහා සුදුසු විගණන සාක්ෂි සැපයිය යුතු අතර, ක්‍රියාවලිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන ලද පාලනයන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (ඌ) | ජාතික තාප බල සංස්ථාව උපදේශන පැවරුමෙන් අත්තිකාරම් ලෙස ලැබිය යුතු රු.3,241,657 ක් සඳහා සාත්ෂි ලෙස ආධාරක ලේඛනය හෝ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම අත්තිකාරම් ගෙවීම් සහ ඒවායේ අයකර ගැනීමේ හැකියාව සමාලෝචනය කිරීමට කළමනාකාරිත්වය පියවර ගත යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| (එ) | වටිනාකම රු. 10,000,000 ක් වූ කෙටි කාලීන බැංකු තැන්පතු සඳහා සාක්ෂි ලෙස අලුත් කිරීමේ දැන්වීම් විගණනයට ඉදිරිපත් නොවීය. | කෙටි කාලීන බැංකු තැන්පතු සම්බන්ධ ආධාරක ලේඛන සංවිධානාත්මකව පවත්වාගෙන යාමට පියවර ගත යුතු අතර විගණන පරීක්ෂණයන් සඳහා ඒවා ලබා දිය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (ඒ) | 2003 ජූනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 ප්‍රකාරව සමාගම විසින් අනුමත බඳවා ගැනීම් සහ උසස්වීම් යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබුණි. | අදාළ මාර්ගෝපදේශවලට හා චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |
| (ඔ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමත සංවිධාන සටහනක් සහ අනුමත සේවක සංඛ්‍යාවක් සමාගම සතුව නොතිබුණි | අදාළ මාර්ගෝපදේශ හා චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | පිළිතුරු ලබා දී නොමැත |

## 4.86 LECO ප්‍රොපෙක්ටිස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 787,608 | 834,328 | 7,181,466 | 8,331,522 | (46,720) | පුද්ගලික විගණන ආයතනයක් විසින් විගණනය සිදු කර ඇත |
| **2019** | 520,691 | 379,545 | 7,356,180 | 8,365,090 | 141,146 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 792,057 | 364,550 | 8,147,891 | 8,780,595 | 427,507 | තත්ත්වාගණනය නොකළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව රු.1,000 ක කොටස් ප්‍රාග්ධනයකින් ආරම්භ කරන ලද සමාගම, 2012 දී දියත් කරන ලද කණු නිෂ්පාදන ව්‍යාපෘතියේ තත්ත්ව පරීක්ෂණ අසමත් වීම | සමාගමේ මෙහෙයුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගත යුතුය. | පාඩුව අඩු කිරීම සඳහා අමතර ව්‍යාපෘති ලබාගැනීමට කටයුතු කරමින් සිටියි. රු.මිලියන 28 ක ව්‍යාපෘතියක් 2022 ජනවාරි මාසයේදී සිදු කරන ලදී. මෙය මගින් | සමාගම සතුටුදායක ලෙස පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් රු. මිලියන 5.9 ක සමුච්චිත ලාභයක සිට රු. මිලියන 3.4 ක සමුච්චිත අලාභයක් දක්වා පහත වැටුනි. ඉතා සරල මෙහෙයුමක් සිදු කිරීමට අපේක්ෂා කළ සමාගමට වැටුප් සඳහා ඉහළ පිරිවැයක් සහ ඉඩම සඳහා බදු කුලී දැරීමට සිදු විය. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ කිසිදු මෙහෙයුමක් සිදු නොවූ අතර කළමනාකාරීත්වය සමාගම ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | සමුච්චිත පාඩු අඩු කරනු ඇත. | |
| (ආ) | 2003 ජුනි 02 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 අනුව වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | එම චක්‍රලේඛයේ පරිදි වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුයි. | මෙහෙයුම් නොමැති බැවින් වාර්ෂික වාර්තාව සකස් කර නොමැත. | එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි |
| (ඇ) | තොග (ඉන්වෙන්ට්‍රි) සත්‍යාපන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය රු.12,141,603 කි. | වාර්ෂික තොග සත්‍යාපනය සිදු කළ යුතුය. | පැවති ස්ථානයේ කිසිදු වෙනස්වීමකින් තොරව එම කාලසීමාව සඳහා තොග ශේෂයන් එලෙසම පවතී. | එවැනි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහා අදාළ ප්‍රතිපාදන සලසා ඇති අතර ඒවා චලනය නොවන ද්‍රව්‍ය ලෙස හඳුනාගෙන ඇත. |
| (ඈ) | ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ශේෂය රු.5,159,044 කි. | සෑම වසරකම අවසානයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ යුතුය. | මෙම සියලු ස්ථාවර වත්කම් ද කිසිදු වෙනස්වීමකින් තොරව පවතියි. | මේවා සම්පූර්ණයෙන්ම ක්ෂය වූ අයිතම ලෙස පිළිබිඹු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.5,159,044 ක් වන දේපල, පිරියත සහ උපකරණවල 2013 වර්ෂයේ සිට උපයෝජනය නොකර පවතී. | එය වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිතා කළ යුතුය. | මෙම සියලු ස්ථාවර වත්කම් ද කිසිදු වෙනසිවීමකින් තොරව ඉතිරි වේ. | මේවා සම්පූර්ණයෙන්ම ක්ෂය වූ අයිතම ලෙස පිළිබිඹු වේ. |
| (ඊ) | 2003 ජූනි 02 දින නිකුත් කරන ලද අංක PED/12 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 5.1 ඡේදයේ අනුව**;** සංයුක්ත සැලැස්මට ව්‍යාපාරයේ අනාගත දිශානතිය සම්බන්ධ උපාය මාර්ග ඇතුළත් වේ. සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් විය. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | කිසිදු මෙහෙයුමක් නොමැති නිසා සංයුක්ත සැලැස්මක් නොමැත. | එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි |

**4.87 මගනැගුම උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම**

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 232,823,189 | 213,766,202 | 499,436,083 | 107,919,019 | 19,056,987 | තත්ත්වාගණනය කළ |
| **2019** | 251,998,683 | 217,100,535 | 531,482,358 | 116,489,335 | 34,898,148 | වියාවනය |
| **2020** | 181,367,841 | 167,827,660 | 522,410,890 | 101,221,270 | 13,540,181 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම විසින් තවමත් භාවිතා කරන සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල පිරිවැය රු. 21,745,498 කි. කෙසේ වෙතත්, දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (LKAS 16) ප්‍රකාරව නැවත තක්සේරු කර ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ | LKAS 16 අනුව නැවත තක්සේරු කිරීමට හෝ LKAS 08 අනුව නැවත ප්‍රකාශ කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. | සටහන් කරගන්නා ලදි. සියලු වත්කම් නැවත තක්සේරු කිරීමට කටයුතු කර ඇත. | තවමත් නැවත ඇගයීමේ ක්‍රියාවලිය අවසන් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | දෝෂ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට (LKAS 08) අනුකූලව සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් නැවත ප්‍රකාශ කිරීමට කටයුතු කර නොතිබුණි. මීට පෙර 2018 සහ 2019 විගණන වාර්තාවල මෙය වාර්තා කර ඇත. | | | |
| (ආ) | දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 16 හි 67 වන වගන්තියට අනුව, වත්කම් භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට වත්කම් හඳුනා නොගත යුතුය. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් භාවිතා නොකළ සම්පූර්ණ ක්ෂය වූ පිරිවැය රු.2,965,180 ක් වන වත්කම් මූල්‍ය ප්‍රකාශන වල හඳුනා නොගෙන නොතිබුණු අතර ඒවා සමාගමේ වත්කම් ලෙස පෙන්වා තිබුණි. | දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - LKAS 16 හි 67 වන වගන්තියට අනුව, භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට වත්කම් හඳුනා නොගත යුතුය. | සටහන් කරගන්නා ලදි. නැවත ඇගයීමේ ක්‍රියාවලියෙන් පසු පියවර ගනු ලැබේ. | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශය අනුව මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල රු. 97,131,281 කි. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල එය රු.73,770,988ක් ලෙස පෙන්වා ඇත. එබැවින් ශේෂයන් දෙකක් අතර රු.23,360,293ක වෙනසක් නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් 2018 සහ 2019 වසරවලදී ද මතු වී ඇත. | වෙනසට හේතු පැහැදිලිව සඳහන් කරමින් විස්තීරණ සැසඳීම් ප්‍රකාශයක් සකස් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. | තවමත් සැසඳීම් ක්‍රියාවලිය අවසන් වී නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂය සඳහා කිරුම් ගාස්තු සහ කාර්යාල ගොඩනැගිලි කුලිය සඳහා සමාගමෙන් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු මුදල 5,087,218 කි. කෙසේ වෙතත්, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් වාර්තාවල එවැනි මුදල් ප්‍රමාණයක් දක්වා නොමැති අතර ඒ සම්බන්ධයෙන් සමාගම විසින් කිසිදු සැසඳීමක් සිදු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිතිපතා සැසඳීම් කළ යුතුය. | ශේෂය සැසඳීම් කිරීම සඳහා දැනටමත් කටයුතු කර ඇත. | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |
| (ඉ) | ව්‍යාපෘතිවල රැඳවුම් මුදල් සහ වැඩ බිල්පත් රු. 35,160,969 ක ශේෂයක් වසර පහකට වැඩි කාලයක සිට මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයකර නොගෙන තිබුණි. 2018 සහ 2019 වසරවල සිට හිඟ මුදල් පිළිවෙලින් රු. 52,696,059 සහ රු.44,950,700 කි. | සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරියෙන් නියමිත ශේෂය අය කර ගැනීමට හෝ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වීමෙන් පසු ගෙවිය යුතු ශේෂවලින් හිලව් කිරීමට ක්‍රියාමාර්ගයක් ගත යුතුය. | සටහන් කරගන්නා ලදි. ඒවා අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |
| (ඊ) | සමාගම විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව මග නැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ සමාගමට ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. 882,118 ක් වසර 5ක කාලයක සිට පියවීමට කටයුතු කර නොමැත. මෙය 2018 සහ 2019 විගණන වාර්තාවල ද සඳහන් කර ඇත. | විධිමත් ලෙස ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමෙන් පසු හිඟ ශේෂ පියවීම හෝ සමාගමේ ආදායමට ගැනීමට කටයුතු කල යුතුය. | සටහන් කරගන්නා ලදි. පියවර ගෙන ඇත. කෙසේ වෙතත්, ඒවා විසඳීමට මූලාශ්‍ර ලියවිල්ලි ලබා ගැනීමට බලාපොරොත්තු වෙමු. | මෙම වාර්තාවේ දිනය වන විට ගෙවීම් සිදු කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2020 දෙසැම්බර් 31 දිනට ඇතැම් ව්‍යාපෘති සඳහා ගෙවිය යුතු හිඟ ශේෂය රු.23,041,015 ක් වසර පහක් පුරා නිරවුල් කර නොමැත. 2018 හා 2019 වර්ෂවල මෙම ශේෂයන් පිළිවෙලින් රු.24,612,484 සහ රු. පිළිවෙලින් 24,934,577 විය. | විධිමත් ලෙස ක්‍රියා පටිපාටි අනුගමනය කිරීමෙන් පසු හිඟ ශේෂ පියවීම හෝ සමාගමේ ආදායමට ගැනීමට කටයුතු කල යුතුය. | සටහන් කරගන්නා ලදි. නිවැරදි කිරීමට පියවර ගනු ඇත. | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |
| (ඌ) | සමාගම ජීවන වියදම් දීමනාව නොසලකා මූලික වැටුප මත පදනම්ව පාරිතෝෂිත ප්‍රතිපාදන ගණනය කර ගෙවීම් කර ඇත. | ගණනය කිරීමේදී සහ ගෙවීමේදී ජීවන වියදම් දීමනාව සලකා බැලිය යුතුය. | පිළිගෙන නිවැරදි කිරීමට එකඟ විය. | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |
| (එ) | සමාගම භාවිතා කරන වත්කම් සඳහා සමාගම සහ අදාළ පාර්ශ්ව අතර කුලී ගිවිසුමක් නොමැති බව නිරීක්ෂණය විය. | සමාගම මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්ව සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. | සටහන් කරගන්නා ලදි. ගිවිසුමට එළැඹීමට කටයුතු කර ඇතත් මාර්ග සංවර්ධන අධිකාරිය තවම එය ලබා දී නැත. | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |
| (ඒ) | 2015 මැයි 25 දිනැති අංක PED 01/2015 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 වගන්තියට පටහැනිව, හිමිකම් සීමාවන් ඉක්මවා සමාගමේ නිලධාරීන්ට එකතුව රු.94,030 ක ඉන්ධන දීමනා 2018 වර්ෂයේ සිට ගෙවා තිබුණි. | සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ පිළිපැදිය යුතුය, නැතහොත් වෙනම ක්‍රියා පටිපාටියක් සකස් කර අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය. | සටහන් කරගන්නා ලදි. | මාර්ග සංවර්ධන අධිකාරිය හෝ රේඛීය අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් සමාගමට තවමත් පැහැදිලි මග පෙන්වීමක් ලබා දී නොමැති බැවින්, නිරීක්ෂණය තවමත් නොවිසඳී ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | 2015 ජූනි 17 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 3/2015 හි 2.1 වගන්තියට අනුව, සභාපතිවරයාට සියල්ල ඇතුළත් මාසිකව ගෙවිය යුතු මුදල රු.75,000කි. කෙසේ වෙතත්, 2020 වර්ෂය තුළ රු.2,400,000 ක මුදලක් හිමිකම් පවතින සීමාවන්ට පටහැනිව වැඩියෙන් සභාපතිවරයාට ගෙවා තිබුණි. මෙය 2018 සහ 2019 වර්ෂ සඳහා පිළිවෙලින් රු.3,313,000 සහ රු.4,530,000 කි. | සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ පිළිපැදිය යුතුය, නැතහොත් වෙනම ක්‍රියා පටිපාටියක් සකස් කර අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය. | අංක. 001/02/ 2020 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව, සභාපතිවරයාගේ වැටුප සහ අනෙකුත් වේතන එලෙසම පවතිනු ඇති බව සටහන් කර ඇත. | මාර්ග සංවර්ධන අධිකාරිය හෝ රේඛීය අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් සමාගමට තවමත් පැහැදිලි මග පෙන්වීමක් ලබා දී නොමැති බැවින්, නිරීක්ෂණය තවමත් නොවිසඳී ඇත. |
| (ඕ) | 2003 ජූනි 2 දිනැති අංක. PED/12 චක්‍රලේඛයේ 5.1 වගන්තියේ උපදෙස් පරිදි, සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබූ අතර රේඛීය අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට සහ විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. | සෑම වසර හතරකට වරක් පෙරළීමේ පදනමින් සංයුක්ත සැලැස්මක් සමාගමේ කළමනාකාරිත්වය විසින් සකස් කළ යුතුය. | සටහන් කරගන්නා ලදි. | මාර්ග සංවර්ධන අධිකාරිය හෝ රේඛීය අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් සමාගමට තවමත් පැහැදිලි මග පෙන්වීමක් ලබා දී නොමැති බැවින්, නිරීක්ෂණය තවමත් නොවිසඳී ඇත. |
| (ක) | 2003 ජූනි 2 දිනැති PED/12 චක්‍රලේඛයේ 8.8 වගන්තියට අනුව, වියදම් සීමාවන් ඇතුළත් අධිකාරිය බෙදී යාමේ සටහනක් සෑම වසරකම ආරම්භයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබිය යුතුය. කෙසේ වෙතත්, අධිකාරිය බෙදී යාමේ සටහනක් සමාගම විසින් සකස් කර නොතිබුණි. | සමාගම අවම කාර්ය මණ්ඩලයකින් පවත්වාගෙන ගියද ආර්ථිකව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අධිකාරිය පැවරිය යුතුය. | MNCPMSC සමාගම ලාභදායී ලෙස පවත්වාගෙන යාම සඳහා ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු සිදුකිරීමට අවම කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යයි. එබැවින් සියලු බලතල සභාපතිවරයා සහ | නිරීක්ෂණය තවමත් විසඳී නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| | | | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර ඒ අනුව සභාපතිවරයා විසින් සියලු වියදම් අධීක්ෂණය කර අනුමත කරනු ලැබේ. | |
| (ග) | 2003 ජූනි 2 දිනැති PED/12 චක්‍රලේඛයේ 5.2 වගන්තියට අනුව, යාවත්කාලීන කරන ලද වාර්ෂික අයවැය සෑම මූල්‍ය වර්ෂයක්ම ආරම්භ වීමට දින 15කට පෙර රේඛීය අමාත්‍යාංශයට සහ විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත් සමාගම විසින් වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. | වාර්ෂික අයවැය, පාලන මෙවලමක් ලෙස සකස් කළ යුතු අතර සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වරින් වර සමාලෝචනය කළ යුතුය. | අංක BP013/02/2020 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව, 2020 වර්ෂය සඳහා වාර්ෂික අයවැය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය නියමිත දිනට හෝ ඊට පෙර අදාළ බලධාරීන්ට ඉදිරිපත් කර නොමැත. |
| (ඩ) | 2003 ජූනි 2 දිනැති අංක PED/12 චක්‍රලේඛයේ 9.2 සහ 9.3 වගන්තියට අනුව, සුදුසු සේවක සංඛ්‍යාවක් සහ බඳවාගැනීම් සහ උසස්වීම් පද්ධතියක් ඇතුළත් මානව සම්පත් සැලැස්මක් තිබිය යුතුය. කෙසේ වෙතත් සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ සහ උසස්වීම් ක්‍රමය සඳහා අනුමැතිය ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි. | සමාගම මේ සම්බන්ධයෙන් වහාම අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබා ගත යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව රේඛීය අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. කෙසේ වෙතත්, ඔවුන්ගේ අනුමැතිය තවමත් අප වෙත ලැබී නොමැති අතර එය බලාපොරොත්තුවෙන් සිටිමු. | අදාළ බලධාරීන්ගෙන් අනුමැතිය තවමත් ලැබී නැත. |
| (ජ) | සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගමේ කළමනාකාරිත්වය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එහි ප්‍රගතිය වරින් වර සමාලෝචනය කළ යුතුය. | සටහන් කරගන්නා ලදි | තවම අවසන් කර නැත. |

| | | | |
|---|---|---|---|
| (ට) | රේඛීය අමාත්‍යාංශයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට සමගාමීව සමාගම විසින් විගණන හා කමිටුව පිහිටුවිය යුතුයි. | විගණන කමිටුව සහ කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | තවම පිහිටුවා නැත | තවම පිහිටුවා නැත |

## 4.88 මගනැගුම මාර්ග ඉදිකිරීම් උපකරණ (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 4,276,329,230 | 4,193,995,112 | 4,694,103,156 | 2,568,291,643 | 82,334,119 | වියාචනය |
| **2019** | 3,462,668,986 | 3,421,792,274 | 5,410,169,409 | 3,238,271,798 | 40,876,711 | තීරණය කර නොමැත |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 4,276.33 | 4,194.00 | 4,694.10 | 2,568.29 | 82.33 |
| 2019 | 3,462.67 | 3,421.79 | 5,410.17 | 3,238.27 | 40.88 |
| 2020 | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය තුළ නිම කරන ලද සහ එම වසරේම මාර්ග සංවර්ධන අධිකාරිය (RDA) විසින් සහතික කරන ලද වැඩ සඳහා වන රු. මිලියන 683.04 ක ශේෂයක් 2018 වර්ෂය සඳහා ගිණුම්වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත | අඩුවෙන් හෝ වැඩියෙන් දැක්වීම වැළැක්වීම සඳහා වර්ෂයේ ආදායම එම වර්ෂයේම වාර්තා කිරීමට ක්‍රියා කළ යුතුය. | පිළිගත නොහැක | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වර්ෂයේ ආදායම සහ ජංගම වත්කම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා ඇත. 2019 වර්ෂයේදී මෙම මුදල රු.මිලියන 202.9 කි. | | | |
| (ආ) | 2012, 2014, 2015, 2016 සහ 2017 යන වර්ෂවල නිම කරන ලද වැඩවලට අදාළව රු. මිලියන 1,571.63 ක් වූ අතුරු ගෙවීම් සහතික 2018 වර්ෂයේ ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. ඊට අමතරව 2016, 2017 සහ 2018 වසරවලට අදාළව රු. මිලියන 590.8 ක සහතික කළ බිල්පත් 2019 වසරේ ගිණුම්ගත කර තිබුණි. | අඩුවෙන් හෝ වැඩියෙන් දැක්වීම වැළැක්වීම සඳහා වර්ෂයේ ආදායම එම වර්ෂයේම වාර්තා කිරීමට ක්‍රියා කළ යුතුය. | පිළිගත නොහැක | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට සහතික කළ වැඩ සහ රඳවා ගැනීම් මත මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.මිලියන 282.31ක ශේෂයේ සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට එය රු.මිලියන 1,111ක් විය. | සැසඳීම් ප්‍රකාශ කාලානුරූපීව සකස් කළ යුතු අතර ඒ අනුව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගන්නා ලදි. ශේෂ වෙනස්කම් සඳහා හේතු සහ දෝෂ නිවැරදි කිරීම් දක්වමින් සැසඳීම් ප්‍රකාශ වාර්තා කරන දින වන විට සකස් කරමින් පවතියි. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |
| (ඈ) | 2018 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු රු.මිලියන 1,162.72 ක ශේෂයක් සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය වූ අතර එය 2019 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 1,420 ක් විය. | සැසඳීම් ප්‍රකාශ කාලානුරූපීව සකස් කළ යුතු අතර ඒ අනුව ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. | පිළිගන්නා ලදි. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |


| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1999 අප්‍රේල් 07 දිනැති අංක 1074/7 දරන ගැසට් පත්‍රයේ දක්වා ඇති කොන්දේසි පහෙන් (05) සමාගම කොන්දේසි හතරක් (04) සපුරා ඇත. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) අනුගමනය කිරීම වෙනුවට කුඩා හා මධ්‍යම පරිමාණයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට (SMEs සඳහා SLFRS) අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1999 අප්‍රේල් 07 දිනැති අංක 1074/7 ගැසට් පත්‍රයේ දක්වා ඇති කොන්දේසි පහෙන් (05) කොන්දේසි හතරක් සපුරා ඇති බැවින් සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල විය යුතුය. | පිළිගෙන නැත. 2017 වර්ෂය සඳහා වූ විගණනයේදී ද මෙම නිරීක්ෂණය අවධාරණය විය. අංක 1074/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව, ලබා දී ඇති නිර්ණායක සපුරාලන ඕනෑම සමාගමක් මූල්‍ය ලේඛන සකස් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කළ යුතු බව සඳහන් කරයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන් තුනෙන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අයදුම් කිරීමට සමාගම සුදුසුකම් ලබයි. නියාමන අවශ්‍යතාවලට පටහැනි නොවේ. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 12 හි 9.2 වගන්තියේ දක්වා ඇති විධානයට අනුව, සංවිධාන සටහන සහ සේවක සංඛ්‍යාව සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයේ සහ මව් ආයතනයේ උපදෙස් ඇතිව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුගමනය කිරීමට ක්‍රියා කළ යුතුය. | සමාගමේ ක්‍රියාකාරිත්වය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු මාර්ගෝපදේශවල අදාළත්වය පිළිබඳ ගැටළුව තවමත් විසඳී නොමැත. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයන්ට අනුකූල වන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ කළමනාකරණය විසින් අනුගමනය කරයි. | තවමත් සමාගමේ සේවක සංඛ්‍යාව සකස් කර අවසන් වී නොමැත. |
| (උ) | 2008 අගෝස්තු 01 දිනැති අංක. 2008/1109 දරන මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, උප කොන්ත්‍රාත්කරුවන්ට කිසිදු ව්‍යාපෘතියක් ලබා නොදීමට මණ්ඩලය තීරණය කර තිබුණි. කෙසේ වෙතත්, සමාගමට ලැබුණු ව්‍යාපෘති 3,382 න් සියයට 5.4 ට සමාන ව්‍යාපෘති 185 ක් පමණක් 2008 සිට 2018 දක්වා කාලය තුළ සමාගම විසින් සෘජුවම නිම කර ඇති අතර මෙම කාලය තුළ උප කොන්ත්‍රාත්කරුවන් විසින් ව්‍යාපෘති 3,197 ක් නිම කර ඇත. | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන ඇති ඉදිකිරීම් කටයුතු, 2008 අගෝස්තු 01 දිනැති අංක.2008/1109 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූලව සමාගම විසින් සිදු කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| (ඖ) | 2018 සහ 2019 වසර සඳහා මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම පිළිවෙලින් මාස 6ක් සහ මාස 10ක් ප්‍රමාද විය. 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශය මේ දක්වා විගණනයට ඉදිරිපත් කර නොමැත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත මගින් නියම කර ඇති පරිදි සමාගම සිය මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |
| (ක) | රේඛීය අමාත්‍යාංශයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට සමගාමීව සමාගම විසින් නිවැරදි සංයුතියකින් යුතුව විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට සමගාමීව නිවැරදි සංයුතියකින් යුතුව විගණන කමිටුව සහ කළමනාකරණ කමිටුව පිහිටුවිය යුතුය. | පිළිතුරු ලබා දී නොමැත | කමිටුව මෑතකදී පිහිටුවන ලද නමුත් විගණකාධිපතිවරයාගෙන් කිසිදු නියෝජනයක් නොතිබුණි. |

## 4.89 මගනැගුම ඉමල්ෂන් ප්‍රොඩක්ෂන් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම<br>රු. | මුළු වියදම<br>රු. | මුළු වත්කම්<br>රු. | මුළු වගකීම්<br>රු. | බදු පෙර ලාභය (අලාභය)<br>රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 97,965,208 | 173,732,387 | 264,272,122 | 172,980,309 | (75,767,180) | තත්ත්වාගණනය කළ |
| **2019** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියට (LKAS 16) අනුව, සමාගම විසින් භාවිතා කරනු ලබන පිරිවැය රු.21,566,870 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම්, ඒවායේ ඵලදායී | අදාළ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, සමාගම විසින් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දේපල, පිරියත සහ උපකරණවල ඵලදායී | 2021 වසරේ සිට නිර්දේශ ක්‍රියාත්මක කෙරේ | වත්කම් තක්සේරු කිරීමට කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | ජීව කාලය සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත නොතිබුණි. | ජීව කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. | | |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට (LKAS 01) සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වන සංකල්පීය රාමුවට පටහැනිව, සමාගමේ ස්ථාවර තැන්පතු මත පොලී ආදායම මුදල් පදනමින් ගණනය කර ඇති අතර විගණනය මගින් ගණනය කරන ලද පොලී ආදායම සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පොලී ආදායම අතර රු.8,654,795 ක වෙනසක් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන අනෙකුත් ආදායම් ඊට සමාන ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | සමාගමේ ස්ථාවර තැන්පතු මත පොලී ආදායම උපචිත පදනම මත මැනිය යුතුය. | උපචිත පදනම මත පොලී ආදායම හඳුනා ගැනීම ඉතා අපහසු වනු ඇත. | එය නිවැරදි කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ (LKAS 01) සහ කල්බදු (LKAS 17) පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව වගකීම්, ජංගම සහ ජංගම නොවන වගකීම් ලෙස වෙන වෙනම වර්ග කළ යුතුය. කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2018 දෙසැම්බර් 31 දිනට රු.2,090,060 ක් වූ මුළු කල්බදු ණයහිමියන් ඒ අනුව වර්ගීකරණය කර නොතිබුණි. | අදාළ ගිණුම්කරණ ප්‍රමිතයේ නියම කර ඇති පරිදි කල්බදු වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වෙන වෙනම වර්ග කළ යුතුය. | නිවැරදි කිරීමට එකඟ වේ. | එය නිවැරදි කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඈ) | සමාගම විශ්‍රාම පාරිතෝෂිත වගකීම ගණනය කර තිබුණේ මාස භාගයක වැටුප පදනම් කරගෙන ගණනය | සමාගම ගිණුම්කරණ ප්‍රතිපත්ති ගොඩනඟන විට, විෂය කරුණු | සමාගමේ ප්‍රතිපත්තිය අනුව මාසයක මූලික වැටුප සම්පූර්ණ කරන ලද | එය නිවැරදි කිරීමට කිසිදු |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම වෙනුවට එක් එක් සේවකයා උපයන මාසික වැටුප සේවා කාලයයෙන් ගුණ කිරීමෙනි. | සම්බන්ධයෙන් පවතින නීති, රීති සහ රෙගුලාසි සහ සම්මත අවශ්‍යතා සලකා බැලිය යුතුය. | සේවා කාලයෙන් ගුණ කිරීම පාරිතෝෂිකය වෙන් කිරීම සහ ගෙවීම සඳහා යොදා ගනී. | පියවරක් ගෙන නොතිබුණි. |
| (ඉ) | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 4 ට අනුව, මාර්ග සංවර්ධන අධිකාරියෙන් සමාගමට සිදු කරන ලද ප්‍රාග්ධන ආයෝජනය වූයේ රු. 100 ක් පමණි. කෙසේ වෙතත්, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයට අනුව, ඉහත රු.100 ට අමතරව රු. 1,000,000 ක ආයෝජනයක් ද හිමිකම් දායකත්වයක් ලෙස ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, අධිකාරිය විසින් පසුව කරන ලද ආයෝජනය ජංගම වගකීම යටතේ නොගෙවූ ණයක් ලෙස සමාගම සටහන් කර ඇත. | විශේෂයෙන්ම සමාගමේ පාලන බලය තීරණය වන ගනුදෙනු සම්බන්ධයෙන් සමූහය තුළ සිදු වූ ගනුදෙනු වාර්තා කිරීමට ගිවිසුමක් අවශ්‍ය වේ. | නොගෙවූ ණය ශේෂය යනු මෙම සමාගම පිහිටුවීමේදී ලබා දීමට එකඟ වූ RDA වෙතින් ලැබිය යුතු මුදලයි. | එය නිවැරදි කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| (ඊ) | 2018 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව මාර්ග සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු මුදල රු.5,861,611 කි. කෙසේ වෙතත්, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එය රු. 2,428,542 කි. ඒ අනුව, ශේෂ දෙකක් අතර රු.3,433,069ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් සැසඳීමක් සිදු කර නොතිබුණි. | කාලානුරූපීව සැසඳීම් ප්‍රකාශයක් සකස් කළ යුතුය. | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ශේෂය නිවැරදි ශේෂයයි. | සැසඳීම් ප්‍රකාශය සකස් කර නොතිබුණි. |
| (උ) | 2018 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, මගනැගුම | කාලානුරූපීව සැසඳීම් ප්‍රකාශයක් සකස් කළ යුතුය. | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ශේෂය නිවැරදි ශේෂයයි. | සැසඳීම් ප්‍රකාශය සකස් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | ඉමල්ෂන් ප්‍රොඩක්ෂන් (පුද්ගලික) සමාගම වෙතින් පිරියත සහ යන්ත්‍ර සූත්‍ර කුලී ගාස්තු සඳහා ගෙවිය යුතු මුදල රු.4,456,625 කි. කෙසේ වෙතත්, සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව රු. 1,471,358 ක් අධිකාරියට ගෙවිය යුතු ලෙස පෙන්වා දී තිබුණි. එබැවින් ශේෂ දෙකක් අතර රු.3,985,267 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර මේ සම්බන්ධයෙන් සැසඳීමක් සිදු කර නොතිබුණි. | | | |
| (ඍ) | 2015 ජූනි 17 දිනැති PED 3/2015 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 2.1 වගන්තියට අනුව, හිමිකම් ඇති සීමාවන්ට පටහැනිව; සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙත රු.198,000 ක පැමිණීමේ දීමනා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | සමාගම විසින් එවැනි ගෙවීම් සිදු කිරීමේදී අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද පවතින රාමුව සහ මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එහි අධ්‍යක්ෂ මණ්ඩල නියෝජිතයින් හරහා මව් ආයතනය ලෙස මාර්ගෝපදේශ නියම කළ යුතුය. | මෙම දීමනාව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |
| (එ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED 01/2015 හි 3.1 වගන්තියට අනුව, හිමිකම් සීමාවන්ට පටහැනිව, ඉන්ධන දීමනා ලෙස රු.1,047,150 ක් ගෙවා ඇත. | සමාගම විසින් එවැනි ගෙවීම් සිදු කිරීමේදී අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද පවතින රාමුව සහ මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එහි අධ්‍යක්ෂ | මෙම දීමනාව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | | මණ්ඩල නියෝජිතයින් හරහා මව් ආයතනය ලෙස මාර්ගෝපදේශ නියම කළ යුතුය. | | |
| (ඒ) | 2003 ජූනි 2 දිනැති පොදු ව්‍යාපාර චක්‍රලේඛ PED/12 හි 5.2 වගන්තියට අනුව, සමාගම විසින් වාර්ෂික අයවැයක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛයට ප්‍රකාරව වාර්ෂික අයවැයක් සකස් කළ යුතුය. | පිළිගන්නා ලදි. ඊළඟ වසර සඳහා වාර්තාවක් සකස් කිරීමට එකඟ විය. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |
| (ඔ) | 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ PED/12 හි 9.2 සහ 9.3 වගන්තිවලට අනුව සේවක සංඛ්‍යාව මෙන්ම බඳවා ගැනීමේ සහ උසස්වීම් ක්‍රමය සඳහා අනුමැතිය ලබා ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි. | සේවක සංඛ්‍යාව සහ බඳවා ගැනීමේ සහ උසස්වීම් ක්‍රමය සඳහා අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබාගත යුතුය. | අදාළ සියලුම ක්‍රියා පටිපාටි ඇතුළුව අනුමත මානව සම්පත් අත්පොතක් තිබේ. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |
| (ඕ) | රේඛීය අමාත්‍යාංශයට සහ මාර්ග සංවර්ධන අධිකාරියට සමගාමීව සමාගම විසින් විගණන හා කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කළ යුතුය. | විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට කටයුතු කරයි. | නිරීක්ෂණයේ ඇති කාරණය තවමත් පවතී. |

## 4.90 සීමාසහිත තරුණ සේවා (පුද්ගලික) සමාගම

**2018** - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත.

**2019** - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත.

**2020** - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත.

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | නියැදි පරීක්ෂාවන්ට භාජනය වූ අවස්ථා 05 කදී සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රේෂණය කිරීම ප්‍රමාද වීම හේතුවෙන් සිදුවී ඇති එකතුව රු.1,644,253ක අලාභයට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | අලාභයට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී එසේ නොවීමට වගබලා ගන්නා අතර, මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | මේ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව තත්ත්කාර්ය අතුරු අග්‍රිමයන් ලබාදීම මාණ්ඩලික නිලධාරීන්ට පමණක් සීමා විය යුතු වුවත් ඊට අනුකූල නොවන පරිදි කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු නිලධාරියෙකුට අවස්ථා 09 කදී එකතුව රු. 472,415ක අත්තිකාරම් ලබා දී තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විශේෂ අවධානයක් යොමුකර කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | චක්‍රලේඛයට පටහැනිව කටයුතු කිරීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2020 නොවැම්බර් 16 දින දක්වා සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 26 ක් සඳහා පිළිතුරු ලබා දී නොතිබුණි. එසේම එම | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදිය යුතු අතර ඒ මගින් පෙන්වා දී ඇති අඩුපාඩු | විශේෂ අවධානය යොමුකර ක්‍රියාකරන ලෙසට උපදෙස් දෙන ලදී. | විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | විගණන විමසුම් මගින් පෙන්වා දී තිබූ අඩුපාඩු හා දුර්වලතා සම්බන්ධයෙන් හෝ ඒවා නිවැරදි කර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබුණි. | නිවැරදි කරගත යුතුය. | | |
| (ඇ) | 2020 ඔක්තෝබර් 20 දිනට මුද්‍රණ අංශයේ රු. 10,520,015 ක් වූ ණයගැති ශේෂයෙන් රු. 9,627,122 ක් එනම් මුළු ණය ශේෂයෙන් සියයට 91.5 ක් 2015 - 2019 කාලයට අදාල හිග ණය ශේෂ වූයෙන් එම ණය අයකරගැනීම තහවුරු කිරීම හෝ වේගවත් කිරීම සඳහා සමාගම විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණයගැති ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. | මේ සඳහා වෙනම නිළධාරනියක් පත්කර ඇත. | හිග ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමාගමේ ප්‍රධාන ව්‍යාපාර 05න් ව්‍යාපාර කටයුතු 03ක් පාඩු ලබමින් පැවති නමුත් එය වැලැක්වීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාරය ලාභදායි ආකාරයෙන් කරගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කල යුතුය. | ඉදිරියට ලාභදායි ලෙස පවත්වාගෙන යාමට අවධානය යොමුකරන ලෙසට උපදෙස් දෙන ලදී. | ව්‍යාපාරය ලාභදායි ලෙස පවත්වාගෙන යාමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ඊ) | 2003 ජුනි 02 දිනැති අංක.පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව, සමාගම්වල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාගම විසින් 2019/2020 ගිණුම් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2022 ජනවාරි 31 දින වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කළ යුතුය. | 2019/2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සැකසීම අවසන් වූ විගස පෙබරවාරි 15 වැනි දින වන විට ඉදිරිපත් කිරීමට කටයුතු සලසමි. | 2022 පෙබරවාරි 07 දින වන විටත් ගිණුම් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (උ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41(2)(උ) වගන්තිය ප්‍රකාරව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් දරනු ලබන සමාගමක් සඳහා විගණන හා කළමනාකරණ කමිටු පිහිටවිය යුතු වුවත්, සමාගම විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඉදිරි කටයුතු සැලසීමට උපදෙස් දෙන ලදී. | මේ වන විටත් විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි. |
| (ඌ) | 2016 අංක 12 දරන තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 23.1 (අ) වගන්තිය ප්‍රකාරව සමාගමේ තොරතුරු නිලධරයන් වශයෙන් නිලධරයන් එක් අයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ අභියාචනා විභාග කිරීම සඳහා නම් කළ නිලධාරියෙකු පත්කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඒ අනුව ඉදිරියේදී අදාළ නිලධාරියෙකු පත් කරන ලෙස කළමනාකාර අධ්‍යක්ෂවරයාට දන්වා ඇත. | අදාල නිලධාරියකු පත්කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (එ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 හා 4 ඡේද ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | අයවැය ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| (ඒ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.5 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් සහ ගබඩා සත්‍යාපනය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සහ විශේෂ සමීක්ෂණ මණ්ඩල පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවත් 2016 වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විටත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කර අතර, භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් දෙන ලදී. | මේ වන විටත් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඔ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 හා 9.3.1 ඡේද ප්‍රකාරව සමාගම සඳහා කාර්යය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණු අතර බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර අනුමත කරගෙන නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | දැනටමත් බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කරමින් පවතින අතර ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩල හා අමාත්‍යාංශ අනුමැතියට ලබාදීමට කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | බඳවා ගැනීමේ පටිපාටිය සකස් කර අනුමත කර නොතිබුණි. |
| (ඕ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපාර කටයුතු සඳහා කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව සංයුක්ත සැලැස්මක් සහ ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් ඇතුළත් කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් මේ වන විට සකසමින් පවතී. | මේ වන විටත් ක්‍රියාකාරී හා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ක) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 3.4.3(අ)(ආ)(ඇ)(ඈ) වගන්තිය අනුව, නිතර භාවිතා කරනු ලබන අයිතමයන් මිලදී ගැනීම සඳහා වාර්ෂිකව යාවත්කාලීන කරන ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලැයිස්තු භාවිතා | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ වන විට සැපයුම් කරුවන් ලියාපදිංචි කිරීමේ කටයුතු කරගෙන යනු ලබන අතර, ඒ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී. | සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | කළ යුතු වුවත් සමාගමේ පහළ ආපන ශාලාව සඳහා භාණ්ඩ මිලට ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | | |
| (ග) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.2.1(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු වුවත් සමාගම විසින් එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| (ඝ) | සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම සඳහා ගණකාධිකාරීවරයෙකු බඳවා ගැනීමට 2013 වසරේ සිට කටයුතු කර නොතිබුණි. එමෙන්ම 2019 ජුනි 03 වැනිදා සිට සහය ගණකාධිකාරී තනතුර පුරප්පාඩු වී තිබුණි. මෙම තත්ත්වය ද මූල්‍ය ප්‍රකාශන නියමිත කාලයට විගණනයට ඉදිරිපත් නොකිරීමට හේතු විය. | බඳවා ගැනීමේ පටිපාටිය අනුව පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | 2022 වර්ෂයේ නව මූල්‍ය උපදේශකවරයෙකු බඳවා ගැනීමේ කටයුතු සිදු කරන ලදී. ඉදිරියේ දී කඩිනමින් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන ලදී. | ගණකාධිකාරීවරයකු ස්ථිරව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ට) | සමාගමේ ආපනශාලාවෙන් සිදු කළ හැකිව තිබූ ආහාර ඇනවුම් කිරීම් අවස්ථා තුනකදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර බාහිර ආයතනයක් මගින් සිදු කර ගෙන ඇති අතර ඒ සඳහා වැය කර ඇති මුළු මුදල රු. 1,685,900 කි. ඒ හේතුවෙන්, සමාගමට ලාභ ලැබීමේ අවස්ථාව මග හැරී තිබුණි. | ව්‍යාපාර ලාභදායී ලෙස පවත්වාගෙන යා යුතුයි. | ලැබෙන ඇණවුම්වල ස්වභාවය අනුව අපගේ ආපනශාලාවේ අදාළ පහසුකම් සහ සේවා සැපයීම් නොමැති අවස්ථාවන් වලදී බාහිර සේවා සපයා ගත් අතර, වර්තමානයේ දී ද ඇණවුම් ලබා දෙන අයගේ ඉල්ලීම පරිදි බාහිර ආයතන මඟින් සේවා සැපයීම් සිදු කිරීම සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | ලාභදායී ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට විධිමත් සැලැස්මක් නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඞ) | 2030 වන විට සියලුම සාමාජික රටවල ආර්ථික වර්ධනය, සමාජ සංවර්ධනය සහ පාරිසරික ආරක්ෂාව සහතික කිරීමේ අරමුණ ඇතිව එක්සත් ජාතීන්ගේ සංවිධානය තිරසාර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය හඳුන්වා දී ඇත. එසේ වුවද, ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 2030 දී මෙම විෂය පථයට අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුය. | ඊට අදාළ කටයුතු දැනටමත් සිදුවෙමින් පවතී. | තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 4.91 කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ්

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 132,379,453 | 133,979,739 | 374,416,666 | 48,594,554 | (1,600,287) | තත්ත්වාගණනය කළ |
| **2019** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 132.38 | 133.98 | 374.42 | 48.59 | (1.60) |
| 2019 | - | - | - | - | - |
| 2020 | - | - | - | - | - |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2018 ජුලි 18 දිනැති කළමණාකරන සේවා චක්‍රලේඛ අංක. 03/2018 හි 1(ii) ඡේදය අනුව, අවම නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65 ක් වූ විට පතල් සේවකයන්ට හා නඩත්තු අංශයේ සේවකයන්ට දෛනිකව රු.300 ක දීමනාවක්ද, සැකසුම් අංශයේ හා | චක්‍රලේඛ උපදෙස් පරිදි සියලුම දීමනා ගෙවීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ | සාමූහික ගිවිසුම පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි නව නිෂ්පාදන දිරි දීමනා ක්‍රමයක් කෙටුම්පත් කරමින් ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | කාර්යාලයේ කාර්ය මණ්ඩලයට පිළිවෙලින් දීමනාවෙන් සියයට 50 ක් හා සියයට 40 ක් වශයෙන් දිරිදීමනාවක් ගෙවා තිබුණද ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමැතිය ලබාගත යුතුය. | | |
| (ආ) | 2007 ඔක්තෝබර් 04 දිනැති අංක.DMS/11P/C9 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය අනුව<br>(i) සමාගමට අනුමත කළ නිලධාරීන් 79 දෙනෙකු බඳවාගත යුත්තේ මාස 06 ක කොන්ත්‍රාත් කාලයකට යටත්ව වන අතර ලාභදායීත්වය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට සලකා බැලිය යුතු බව දක්වා තිබුණි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් 12 දින නිකුත් කරන ලද අංක'25/2014 දරන චක්‍රලේඛය සමාගම්වලට අදාළ නොවූවත් එම චක්‍රලේඛය අනුව සමාගමේ සේවකයන් 59 දෙනෙකු සේවයේ ස්ථිර කර තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව කටයුතු කළ යුතු අතර අදාළ චක්‍රලේඛ පමණක් අදාළ කළ යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීම. | දැනට සාකච්ඡා කරමින් පවතී. |
| | (ii) කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා වූ බඳවාගැනීමේ පරිපාටිය අනුමත කරගෙන නොතිබූ අතර 2019 මාර්තු 31 දින වන විටත් සමාගම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත ස්ථිර කාර්යය | චක්‍රලේඛ උපදෙස් පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබාගත යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීම. | ස්ථිර හා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කරගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අයදුම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | මණ්ඩලයක් නොවූවද , සමාගමේ තත්‍ය කාර්යය මණ්ඩලය 195 ක් විය. | | | |
| (ඇ) | එක් එක් වර්ෂයේ නිෂ්පාදන ඉලක්ක හඳුනාගෙන ඒ අනුව මාසික නිෂ්පාදනය සැලසුම් කර ප්‍රගතිය මැනීම මගින් නිෂ්පාදන ධාරිතාව වර්ධනය කර ගැනීමට උපායමාර්ග සකස් කිරීම කළ යුතු වුවත්, පසුගිය වර්ෂ 03 හි සාමාන්‍ය මාසික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් (MT) 65 ක මට්ටමක පැවතියද එය වර්ධනය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද නොහැකි වී තිබුණි. | නිෂ්පාදන ඉලක්ක හඳුනාගෙන ඒ අනුව මාසික නිෂ්පාදනය සැලසුම් කර නිෂ්පාදන ධාරිතාව වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. | මාසික නිෂ්පාදනය වර්ධනයකර ගැනීමට වැඩ සටහන් සැලසුම් කර ඇත. | 2021 වර්ෂය වන විටද නිෂ්පාදනය වර්ධනය වී නොතිබුණි. |
| (ඈ) | සමාගමේ තොග පිරිවැටුම් වාර ගණන 0.6 සහ තොග නේවාසික කාලය දින 608 ක් වීම මත නිෂ්පාදනය වන තොග අලෙවි කිරීමට දීර්ඝ කාලයක් ගත වීම මත අකාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලියක් පවතින බව නිරීක්ෂණය විය. | සමාගමේ තොග පිරිවැටුම් වාර ගණන වැඩිකරගැනීම සහ තොග නේවාසික කාලය අඩුකර කාර්යක්ෂම මෙහෙයුම් ක්‍රියාවලියක් ඇතිකර ගත යුතුයි. | අඩු කාබන් සහිත මිනිරන් තොග විකිණීම සඳහා ටෙන්ඩර් මිල ගණන් කැඳවීම හා විකුණුම් කළමනාකරුවෙකු බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමත් සිදු කර ඇත. | තොග නේවාසික කාලය තවදුරටත් එසේම නොවෙනස්ව පවතී. |

## 4.92 සීමාසහිත ලංකා සතොස

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 30,158,014,023 | 33,046,477,295 | 8,296,891,812 | 22,145,768,869 | (2,888,463,272) | **වියාචනය** |
| **2019** | 27,107,498,562 | 30,266,042,599 | 8,013,530,413 | 24,445,461,339 | (3,158,544,037) | **අභිතකර** |
| **2020** | මූල්‍ය ප්‍රකාශ ලැබී නැත | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 30,158.01 | 33,046.48 | 8,296.89 | 22,145.77 | (2,888.46) |
| 2019 | 27,107.50 | 30,266.04 | 8,013.53 | 24,445.46 | (3,158.54) |
| 2020 | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගම විසින් තොග අගය කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 අනුගමනය කර නොතිබුණි. එමෙන්ම දිවයින පුරා පිහිටි අලෙවිසැල් ජාලයෙන් 3/4 ක් පමණ ගිණුම්ගත කිරීම, අතින් (Manual) කරනු ලබන සටහන් ආශ්‍රයෙන් සිදු කිරීම හේතුවෙන් ආවේණික අභ්‍යන්තර වැරදි, | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. | අතින් ගිණුම්කරණයේදී සිදුවන දෝෂ මඟහරවා ගැනීම සඳහා සියලුම අලෙවිසැල් සහ ගබඩා පරිගණක ගත කිරීමට සමාගම පියවර ගෙන ඇත. | වඩාත් නිවැරදිව තොග තක්සේරු කිරීම සඳහා සියලුම අලෙවිසැල් සහ ගබඩාව පරිගණක ගත කිරීම සඳහා |

| | | | | |
|---|---|---|---|---|
| | දත්ත මඟ හැරීම, එකම සටහන දෙවරක් සටහන්වීම හා අගයන් අඩුවෙන්/ වැඩියෙන් සටහන්වීම ආදී විවිධ දෝෂයන් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.4,462,675,947 ක් වූ තොග වටිනාකම සම්බන්ධයෙන් හා එමඟින් විකුණුම් පිරිවැය සහ ජංගම වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්ට ඇති විය හැකි මූල්‍ය බලපෑම තීරණය කිරීමට හෝ ප්‍රමාණනය කිරීමට නොහැකි විය. | | | ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය සකස් කෙරේ. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයේ ආරම්භක ශේෂයට වඩා ලෙජරයේ දේපළ, පිරියත හා උපකරණ ආරම්භක ශේෂය රු.1,045,174,713 ක් වැඩියෙන් දැක්වුණු අතර මෙම වෙනස තුළ 2013 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් රු.529,010,712 ක් වූ ආරම්භක ශේෂවල එකතුවක් පැවතුණි. | මූලික ශේෂ වෙනස හඳුනාගත යුතුය. | පියවර ගෙන නොතිබුණි. | මූලික වෙනස හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) | සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවෙන් ලබාගත් රු.22,798,843 ක වත්කම්වලට අදාළ ලිඛිත සාක්ෂි සමාගම විසින් නඩත්තු කර නොතිබුණි. | සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවෙන් ලබාගත් වත්කම් හඳුනාගත යුතුයි. | සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව සමඟ අදාළ ශෙෂය තහවුරු කෙරේ. | අයිතිය තහවුරු කිරීමට අදාළ ලියකියවිලි සමාගම සතුව නොතිබුණි. |
| (ඈ) | කිලිනොච්චිය, වැලිගම, වැලිසර සහ කඹුරුපිටිය යන ප්‍රදේශවල 2014 සහ 2015 වසරවල ඉදිකරන ලද වාණිජ ගොඩනැගිලි හතරේ වියදම රු.384,921,862 කි. මෙම ගොඩනැගිලිවලට අයත් ඉඩම්වල තක්සේරු පිරිවැය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉඩමේ පිරිවැය ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. | මෙම ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ලබාගැනීමට කටයුතු කෙරේ. | අයිතිය තහවුරු කෙරන ලියකියවිලි ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | කුලී අත්තිකාරම් ගිණුමට අදාළ උපලේඛනයේ ඇතුළත් අලෙවිසැල් වෙත ගෙවා ඇති රු.3,298,677ක කුලී අත්තිකාරම් වසර 5ක කාලයක සිට හඳුනාගෙන නොතිබුණු අතර 2019 වර්ෂය තුළ ද මෙම ශේෂය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිගණක පද්ධති මාරු කිරීමේදී ශේෂය නිවැරදිව මාරු කළ යුතු අතර එවැනි වෙනස්කම් සඳහා හේතු පරීක්ෂා කළ යුතුය. | මෙම ශේෂය හඳුනා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | වසර 7 ක කාලයක සිට හඳුනානොගත් රු.1,484,265 ක ශේෂයක් මුල්‍ය ප්‍රකාශනවල කුලී තැන්පතු ගිණුමේ උපලේඛනයේ ඉතිරිව තිබූ අතර 2019 දී ද අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිගණක පද්ධති මාරු කිරීමේදී ශේෂය නිවැරදිව මාරු කළ යුතු අතර එවැනි වෙනස්කම් සඳහා හේතු විමසා බැලිය යුතුය. | ශේෂය ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2016 වර්ෂයට පෙර සිට සතොස අලෙවිසැල්වල දෛනික ආදායමෙන් කොටසක් සමාගමේ ප්‍රධාන කාර්යාලයට ප්‍රේෂණය නොකර එම අලෙවිසැල් වියදම් කර තිබුණ අතර එම ලැබිය යුතු මුදල තැන්පතු හා අත්තිකාරම් යටතේ රු.74,643,497 ක් ලෙස දක්වා තිබුණි. එසේ ආදායම රඳවා ගත් අලෙවි සැල් 217 ක් රඳවා ගෙන තිබුණු මුදල රු.2,000 සිට රු.900,000 ක පරාසයක විය. එසේ වුවද මෙම මුදල සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි නොමැති අතර 2016 වර්ෂයේදී රු.50,000,000 ක්ද 2017 වර්ෂයේදී රු.6,762,337 ක් අපහායනය කර තිබුණි. | අලෙවිසල්වල මුදල් විධිමත් අධිකාරියකින් යුතුව වියදම් කළ යුතු අතර එය ප්‍රධාන ලෙජරයේ ගිණුම්ගත කළ යුතුය. සෑම වසරකම රඳවාගත් මුදල් සහ වියදම් කළ ආකාරය පරීක්ෂා කර නිසි ලෙස ගිණුම්ගත කළ යුතුය. | සියලුම අලෙවිසැල් සහ ගබඩා පරිගණක ගත කිරීමටත් 2021 වසර වන විට ERP පද්ධතිය ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කරමින් සිටී. | 2016 වසරේ සිට ප්‍රධාන කාර්යාලයට එවිය යුතු මුදල හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඌ) | 2019 වර්ෂය අවසානයේ සමාගමේ සමුච්චිත ඌනතාවය රු.17,884,556,952 ක් වූ අතර ජංගම වත්කම් ඉක්ම වූ ජංගම වගකීම් රු.3,735,588,882 ක් විය. ඒ හේතුවෙන් සමාගමට සිය වත්කම් තුළින් එහි | කාරක ප්‍රාග්ධනය සඳහා ණය නොගත යුතුය. සමාගමට අවශ්‍ය කාර්ය මණ්ඩලය ස්ථිර | පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීම් මේ වන විට සිදුවෙමින් පවතී. | සමාගමට ණය ගෙවීමේ හැකියාවක් නොතිබූ අතර නියෝජ්‍ය |

| | | | | |
|---|---|---|---|---|
| | වගකීම්වලට මුහුණ දීමේ හැකියාව සහ සමාගම අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දීමකින් තොරව අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. මෙම තත්ත්වයට බලපාන ප්‍රධාන හේතු ලෙස ගෙවිය යුතු වෙළඳ හා අනෙකුත් ණය ශේෂ වටිනාකම මූල්‍ය ප්‍රකාශන අනුව රු.9,248,426,171 ක් වීම, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි තනතුරු සඳහා වසර එකට හා වසර දෙකට අඩු කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම හා ජ්‍යෙෂ්ඨ, තෘතීය හා ද්විතීය මට්ටමේ ශ්‍රේණිවල තනතුරු 912 ක් පුරප්පාඩුව පැවතීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණු බව නිරීක්ෂණය විය. | පදනමින් බඳවා ගත යුතුය. | | සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට පියවර ගෙන නොතිබුණි. තවද, මේ දක්වා ජ්‍යෙෂ්ඨ, තෘතීයික සහ ද්විතියික ශ්‍රේණිවල පුරප්පාඩු 912ක් පවතී. |
| (එ) | 2011 ජූලි 28 දිනැති අංක CP/11/135/540/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ “ලංකා සතොස ආයතනයේ අලෙවි සැල් ජාලය වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම” යන මැයෙන් ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සීමා සහිත ලංකා සතොස ආයතනය වෙත පවරන ලද සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් ස්ථාවර වත්කම් වෙනුවෙන් 2011 මාර්තු 31 දක්වා වූ කාලය සඳහා වන හිඟ කුළී මුදල හා වට්ටෝරු භාණ්ඩවල වටිනාකමද සහිතව මුළු මුදල සඳහා කොටස් නිකුත් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කළ යුතුය. | ඒ සම්බන්ධ ක්‍රියාමාර්ග මේ වනවිට ක්‍රියාත්මකයි. | හිඟ කුළී සහ ස්ථාවර වත්කම්වල වටිනාකම ඇතුළු සම්පූර්ණ මුදල සඳහා කොටස් නිකුත් කර නොතිබුණි. |
| (ඒ) | 2016 පෙබරවාරි 12 දිනැති අංක 02/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව, හානියට පත් තොග ඉවත් කිරීම සම්බන්ධ චක්‍රලේඛයට අනුව ඒ සඳහා සමාගම විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුව තිබුණද, එවැනි අනුමැතියක් | චක්‍රලේඛයට අනුකූල වීමට කටයුතු කල යුතුය. | 2021 වසරේදී හිඟ ශේෂය සොයා බැලීම සඳහා තොග හිඟ කමිටුවක් පත් කර ඇත. | හිඟ ශේෂයේ හේතුවෙන් ඇතිවූ අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් |

| | | | | |
|---|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණි. අතිරික්ත හා හිඟ ශේෂයන් වෙන්කර හඳුනා ගැනීමට නිසි යාන්ත්‍රණයක් නොතිබූ අතර හිඟ ශේෂයන් නිසා සිදුවූ අලාභය වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකරගෙන නොතිබුණි. | | | අයකරගෙන නොතිබුණි. |
| (ඔ) | 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5 වගන්තියට අනුව, මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වසරකුත් මාස හයක් ඉක්මවා 2021 ජූලි 19 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලදී. තවද, වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ, වර්ෂය සඳහා වන කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | 2020 වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පවතී. | 2020 සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2021 පෙබරවාරි 28 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2022 පෙබරවාරි 28 දින වන විටත් ලැබී නොතිබුණි. |
| (ඕ) | 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තියට පටහැනිව, මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රධාන විධායක නිලධාරීවරයාට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් හත්දෙනාට රු.75,000 බැගින් රු.4,350,000 ක කාර්ය සාධන දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ක) | 2017 ඔක්තෝබර් 25 දිනැති අංක 05/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව, රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ට ගෙවිය යුතු වෘත්තීය දීමනාව ඉක්මවා රු.630,000ක් වැඩිපුර ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | අද වන විටත් ගෙවිය යුතු වෘත්තීය දීමනාව ඉක්මවා ගෙවීම් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ග) | 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, HMI-1 කාණ්ඩයේ හෝ ඊට ඉහළ මට්ටමේ සහ නිල වාහන තම නිල සහ පුද්ගලික භාවිතය සඳහා භාවිත කිරීමට හිමිකම් ඇති නිලධාරීන්ට නිල වාහනයක් හෝ මාසික ප්‍රවාහන දීමනාව ලබා ගත හැකි වුවද, ඊට පටහැනිව සහ භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව නිල වාහන භාවිතා කිරීමට හිමිකම් නොමැති නිලධාරීන්ට මසකට රු. 12,500 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. 2018 වසරේ නිලධාරීන් 17 දෙනෙකුට රු.1,885,833ක් සහ 2019 වසරේදී රු.1,750,000ක් ප්‍රවාහන දීමනාවක් ගෙවා ලෙස ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විටත් නිල වාහන භාවිත කිරීමට හිමිකම් නොමැති නිලධාරීන්ට මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලබයි. |
| (ඝ) | 2017 මැයි 16 දිනැති අංක. DMS/1741 දරන කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියට අනුව, ප්‍රධාන විධායක නිලධාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් වෙත මාසිකව ගෙවිය යුතු දීමනාව පිළිවෙළින් රු.95,000 සහ රු.90,000 බැගින් ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ප්‍රධාන විධායක නිලධාරියාට මාසිකව රු.250,000 ක දීමනාවක් ද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ද නොමැතිව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ට මාසිකව රු.150,000 ක දීමනාවක් ද ගෙවා ඇත. ඒ අනුව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව 2018 වසරේ දී නිලධාරීන් 07 දෙනෙකුට රු.5,100,000 ක් වැඩිපුර ගෙවා ඇති අතර 2019 දී නිලධාරීන් 09 දෙනෙකුට රු.4,505,163 ක් වැඩිපුර තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විටත් අනුමත දීමනාවට වඩා වැඩි මුදලක් ගෙවා ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ජ) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2017 පෙබරවාරි 22 දිනැති DMS/1744 ලිපියට අනුව 2019 වර්ෂයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) තනතුර සඳහා බඳවාගත් නිලධාරියාට අනුමත මාසික දීමනාව වන රු.150,000 ඉක්මවා කාර්ය සාධන, ප්‍රවාහන, ඉන්ධන සහ දුරකථන දීමනා ලෙස රු.1,299,753 ක මුදලක් ගෙවා තිබුණි. | අනුමත වැටුපට අමතරව ගෙවන සියලුම දීමනා සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතුය. | නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විටත් අනුමත දීමනාවට වඩා වැඩි මුදලක් ගෙවා ඇත. |
| (ට) | කම්කරු දෙපාර්තමේන්තුව, සමාගමේ සේවක අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීම පිළිබඳව සිදු කළ පරීක්ෂාවකින් පසුව දෙන ලද උපදෙස් අනුව 2018 ජනවාරි මාසයේ සිට සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් අය කළ දායකය සියයට 10, සියයට 8 ක් ලෙස සංශෝධනය කිරීම මත 2018 ජනවාරි මාසය වෙනුවෙන් සේවකයාගෙන් වැඩියෙන් අය කර ගෙන සේවක අර්ථසාධක අරමුදලට බැර කර තිබුණු සියයට 2 කට සමාන රු.5,550,876 ක මුදල 2018 පෙබරවාරි මාසයේදී නැවත සේවක වැටුපට එකතු කර ගෙවා තිබුණි. | සංශෝධනය හේතුවෙන් සේවකයාට ගෙවන ලද දායක මුදල් සේවකයාගෙන් අයකර ගත යුතුය. | සේවකයාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම මුදල සේවකයන්ගෙන් අයකරගෙන නොතිබුණි. |
| (ඩ) | 2018 දෙසැම්බර් 07 දිනැති අංක 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව සමාගමේ සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ලෙස ගෙවිය යුතු මුදල රු.3,000 ක් වුවත් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.25,000 බැගින් ගෙවා තිබුණි. ප්‍රසාද දීමනා ගෙවීමේදී 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 6.5 ඡේදය අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නියමිත දින විගණකාධිපතිට ඉදිරිපත් කර තිබිය යුතු වුවද වසරකුත් මාස 06 ක් ප්‍රමාද වී මූල්‍ය | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කල යුතුය. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොමැති අතර ප්‍රසාද දීමනා ද ගෙවා ඇත. |


| | | | | |
|---|---|---|---|---|
| | ප්‍රකාශන ඉදිරිපත් කර තිබියදීත් වක්‍රලේඛවලට පටහැනිව ගෙවා තිබුණු ප්‍රසාද දීමනා එකතුව රු.74,698,075 ක් විය. | | | |
| (ණ) | 2019 දෙසැම්බර් 31 දිනට රු.5,801,312 ක් වූ උත්සව අත්තිකාරම් ශේෂය තුළ 2018 වර්ෂයට පෙර වූ රු.2,036,750 ක ශේෂ වූ අතර 2021 දෙසැම්බර් 02 වන විටත් එම ශේෂ අය කර ගෙන නොතිබුණු අතර මෙම ශේෂයෙන් රු.446,000 ක් අපහායනය කර තිබුණි. | හිඟ මුදල් කලින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ත) | කුළී පදනම මත ලබා ගත් රජයේ ආයතනවලට අයත් ගොඩනැගිලි 10 ක් වෙනුවෙන් විධිමත්ව එළඹි බදු ගිවිසුමකින් තොරව කුළී තැන්පතු වශයෙන් රු.2,708,780 ක් ගෙවා තිබුණි. 2019 වර්ෂයෙදී අලෙවිසැල් සඳහා කුළී පදනම මත ගොඩනැගිලි 03 ක් ලබා ගැනීමට රු.7,745,000 ක් ගෙවා තිබුණද අදාළ අලෙවිසැල්වලින් දෙකක් ප්‍රමාද වී ආරම්භ කර තිබුණු අතර එක් අලෙවිසැලක් මෙම වාර්තාවේ දිනය වන විටත් විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි කුලියට ලබා ගැනීමේදී විධිමත් කුළී ගිවිසුමකට එළඹිය යුතු අතර කුලියට ලබා ගන්නා ලද ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගිවිසුම්වලට අනුව අලෙවිසැල් විවෘත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ද) | සමාගම විසින් මන්නාරම ප්‍රදේශයෙහි වාණිජ ගොඩනැගිල්ලක් ඉදිකිරිම සඳහා 2017 වර්ෂයේදී සතොස ඉදිකිරීම් හා ඉංජිනියර් පෞද්ගලික සමාගම වෙත මුළු කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් වන රු.14,108,445 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණ අතර ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) වගන්තිය අනුව අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. අධිකරණ ක්‍රියාමාර්ගයක් හේතුවෙන් ඉදිකිරීම් නවතා | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. | වැඩ නිම කිරීමේ වාර්තාවට අනුව රඳවා තබා ගැනීමේ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රැඳවුම් මුදල් අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | දමා තිබුණ හෙයින් කොන්ත්‍රාත් සමාගම රු.2,051,486 ක් පමණක් ආපසු ගෙවා තිබුණු අතර ඉතිරි මුදල වූ රු.12,056,960 සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 (අ) හා (ආ) අනුව වැඩ අවසන් කිරීමේ සහතිකයක් හෝ එම වියදම සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි නොමැතිව කොන්ත්‍රාත් සමාගම රඳවා ගෙන තිබුණි. මෙම මුදල 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අපහායනය කර තිබුණි. | | | |
| (න) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2(ඇ), 2.7.5, 2.8.1(ඇ), 2.8.1(ඇ), 3.2, 3.4, 4.2.1, 4.2.2, 4.2.3, 4.3.1(අ), 4.3.2, 5.1.1(අ), 5.1.1(ආ), 6.3.3(අ), 6.3.6, 7.1.1, 7.11.1, 8.9.1(ආ) වගන්තිවලට පටහැනිව ප්‍රසම්පාදන භාණ්ඩයේ අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව ප්ලාස්ටික් ඇසුරුම් කූඩ 12,800 ක් රු.24,382,509 කට 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණ අතර 2019 දෙසැම්බර් 31 දිනට රු.3,761,348 ක් වූ කූඩ 1975 ක් නිෂ්කාර්යව පැවතුණි. | මිලදී ගැනීම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූලව සිදු කළ යුතු අතර මිලදී ගැනීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. | කූඩ භාවිතා කිරීමට පියවර ගෙන නොතිබුණි. | කූඩ භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුනි. |
| (ප) | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) ගේ නිර්දේශය මත 2017 ඔක්තෝබර් 16 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව තෝරා ගත් පෞද්ගලික විගණන සමාගමකට 2019 වර්ෂයේදී සමාගමේ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අනුමතිය ලබා දී තිබුණු අතර විගණන සමාගම විසින් ඉදිරිපත් කර තිබුණු මිල රු.3,800,000 ක් වූ විය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ මුදල රු.4,200,000 | ඉදිරිපත් කළ ලේඛනවලට අනුව, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුගමනය කළ බවට ලිඛිත සාක්ෂි නොමැත. අධ්‍යක්ෂ මණ්ඩලය මේ ගැන අවධානය යොමු කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජ්‍ය | වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවූ මුදල අයකරගෙන නොතිබුණි. |

| | |
|---|---|
| ක් වුවද අදාළ මුදල අනුමත කිරීමට හේතු අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ සඳහන් නොවීය. තවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර නොතිබුණද කොන්ත්‍රාත් අගය සංශෝධනය කර නොතිබුණි. 2020 මාර්තු 12 දින වන විට විගණන සමාගමට රු.5,133,896 ක් ගෙවා තිබීම හේතුවෙන් එකඟ වූ මුදලට වඩා රු.1,333,896 ක් වැඩියෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. එසේම මාස 3 කින් අවසන් කළ යුතු ප්‍රත්‍යාගණන කාර්යය නිම කිරීම සඳහා වසර දෙකක කාලයක්ද ගත කර තිබුණි. | සාමාන්‍යාධිකාරී (මූල්‍ය) නිර්දේශය අනුමත නොකළ යුතු අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය සලකා බැලිය යුතුය. |

## 4.93 සීමාසහිත ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 3,549,978,934 | 3,580,847,245 | 2,795,573,823 | 2,009,172,129 | (30,868,311) | තත්ත්වාගණනය කළ |
| **2019** | 2,562,338,573 | 2,683,638,884 | 2,492,632,179 | 1,841,918,914 | (121,300,311) | තත්ත්වාගණනය කළ |
| **2020** | 2,762,090,933 | 2,701,709,124 | 2,514,535,678 | 1,813,046,536 | 60,381,809 | තත්ත්වාගණනය කළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 3,549.98 | 3,580.85 | 2,795.57 | 2,009.17 | (30.87) |
| 2019 | 2,562.34 | 2,683.64 | 2,492.63 | 1,841.92 | (121.30) |
| 2020 | 2,762.09 | 2,701.71 | 2,514.54 | 1,813.05 | 60.38 |


| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED/12 හි 9.10 ඡේදයට අනුව, කොන්ත්‍රාත්තු, අනියම් හෝ වෙනත් ආකාරයේ බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු වුවද, ඊට ප්‍රතිවිරුද්ධව, කාර්ය මණ්ඩලය කොන්ත්‍රාත් සහ අනියම් පදනම මත | සියලුම බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය | කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී. | කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීම් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | බඳවා ගෙන තිබුණු අතර පිළිවෙලින් රු. 46,460,747 සහ රු.11,060,030 ක් වන වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂය තුළ කාර්යය මණ්ඩලයට ගෙවා තිබුණි. | | | |
| (ආ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED/12 හි 9.10 ඡේදයට අනුව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්ට රු.2,966,000ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව ක්‍රියා කළ යුතුය. | අවශ්‍ය අනුමතිය ලබා ගැනීම සිදු කරමින් පවතී. | අවශ්‍ය අනුමතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක. PED 2015/1 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව නිල වාහන භාවිත කිරීමට හිමිකම් නොමැති නිලධාරීන් හතළිස් හත්දෙනෙකුට (47) එකතුව රු. 3,645,000ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව ක්‍රියා කළ යුතුය. | අවශ්‍ය අනුමතිය ලබා ගැනීම සිදු කරමින් පවතී. | අවශ්‍ය අනුමතිය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | 2015 ජූනි 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED/03 හි 2.1 සහ 2.8 ඡේදයට අනුව, අවසර ලත් දීමනා ප්‍රමාණයට අමතරව සභාපතිවරයාට සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයාට පිළිවෙළින් මසකට රු. 100,00ක් බැගින් රු.1,079,333 ක් සහ මසකට රු.40,000ක් බැගින් රු.465,332 ක් විනෝදාස්වාද දීමනා ලෙස ගෙවා ඇති අතර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය සහ මුදල් | අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් පසු දීමනා ගෙවන්නේද යන්න කළමනාකරණය සහතික කළ යුතුය. | පෙර සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ STC වෙතින් ඉල්ලා අස්වී ඇති අතර අදාළ ගෙවීම නතර කරන ලදී. | අනුමත නොකළ දීමනාව නැවත අයකරගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යවරයාගේ එකඟතාව ලබාගෙන නොතිබුණි. | | | |
| (ඉ) | අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවූ අලෙවි සංවර්ධන සම්බන්ධීකාරක සහ අමාත්‍යාංශ සම්බන්ධීකරණ නිලධාරී යන තනතුරු දෙකක් සඳහා එක් නිලධාරියකු පත් කර තිබූ අතර එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඔහු අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකමක් ලබා ඇති බවට ඔප්පු වී නොමැත. සමාලෝචිත වර්ෂය තුළ අදාළ නිලධාරියාට ගෙවා ඇති මුළු වැටුප් හා දීමනා ප්‍රමාණය රු.1,095,753 කි. | අනුමත සේවක සංඛ්‍යාව සඳහා සුදුසුකම් ලත් පිරිස් බඳවා ගත යුතුය. | 2019 න් පසු කොන්ත්‍රාත්තුව දීර්ඝ කර නොතිබුණි. | අනවසර ගෙවීම් නැවත අයකරගෙන නොතිබුණි. |
| (ඊ) | පවතින ගිණුම්කරණ පද්ධතිය නවීකරණය කිරීම සඳහා 2017 දෙසැම්බර් 18 වන දින මුළු කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.9,025,000 න් රු.1,805,000 ක අත්තිකාරමක් ගෙවා තිබුණද, මෙම වාර්තාවේ දිනය වන විට අදාළ ප්‍රදානය කිරීමේ ලිපියේ එකඟ වූ ක්‍රියාකාරකම් දොළහකින් අවසන් කර තිබුණේ එක් ක්‍රියාකාරකමක් පමණි. කෙසේ වෙතත්, එම මුදල සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු ශේෂයට ඇතුළත් කර ඇත. | ගිණුම්කරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම නවීකරණය කිරීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුයි. | එම කොන්ත්‍රාත්කරු විසින් 2009 වසරේ ස්ථාපිත කරන ලද පරිගණක පද්ධතිය තුළ ගැටලු රැසකට සමාගම මුහුණ දී ඇත. සමාගම නව පරිගණක පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරයි. | ප්‍රදානය කිරීමේ ලිපියේ එකඟ වූ ක්‍රියාකාරකම් 12 සම්පූර්ණ කර නොතිබුණි. |

## 4.94 නැෂනල් වෙල්ත් කෝපරේෂන් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 15,737,938 | 14,773,190 | 1,262,579,982 | 7,720,880 | 964,748 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 3,951,125 | 6,919,452 | 1,268,541,338 | 6,485,778 | (2,968,327) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 2,425,791 | 5,252,549 | 1,265,977,343 | 6,456,602 | (2,826,758) | තත්ත්වාගණනය නොකළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | සමාගමේ සේවකයෙකු 2016 වසරේ සිට කොමර්ෂල් බැංකුව සමඟ රු.15,435,000ක වංචනික ගනුදෙනු සිදු කර ඇත. කෙසේ වෙතත්, සමාගම විසින් 2019 වර්ෂයේදී මෙම නීතිවිරෝධී ගනුදෙනු හෙළි කර ඇති අතර, සමාගම 2019 දෙසැම්බර් 24 වැනි දින අපරාධ පරීක්ෂණ | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනයේ මෙම කරුණ අනාවරණය කළ යුතුය. | මෙම වංචාව සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) මේ වන විට විමර්ශන සිදුකරන අතර එහි ප්‍රගතිය සොයා බැලීම සඳහා නැට් වෙල්ත් කෝපරේසන් විසින් නීතිඥවරයෙකුගේ සහය | 2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන සකස් කරමින් පවතින අතර 2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන මගින් මෙම වංචාව පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට නියමිතයි. |

| | | | | |
|---|---|---|---|---|
| | දෙපාර්තමේන්තුවට (CID) පැමිණිල්ලක් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම කරුණ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | | ලබාගෙන ඇත. මෙම වංචාව 2019 දී අනාවරණය වී ඇති අතර ඒ වන විට විමර්ශනය වෙමින් පැවති අතර 2019 ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර නොතිබූ අතර 2020 වර්ෂයේදී ද හෙළිදරව් කිරීම් සිදු කර නොමැත. වැඩිදුර තොරතුරු 2021 වසර සඳහා වන අවසන් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළි කිරීමට අපේක්ෂා කෙරේ. | |
| (ආ) | මූල්‍ය සේවාවන් සඳහා එකතු කල අගය මත බදු තක්සේරු 2013 වර්ෂය සඳහා වටිනාකම රු.16,600,601 සහ 2014 වර්ෂය සඳහා වටිනාකම රු.58,097,943 ක් ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණි. ආදායම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද උක්ත තක්සෙරුවලට එරෙහිව සමාගම විසින් අභියාචනයක් සිදු කර තිබුණි. අදායම් බදු දෙපාර්තමේන්තුව විසින් ඉහත අගය මත සියයට 50 ක දඩ මුදලක් පනවා තිබුණි. | සමාගම දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ නියමය ක්‍රියාත්මක කර බදු නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. | අභියාචනාධිකරණයේ ගොනු කොට තිබූ නඩු අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ඉවත් කොට ඇති අතර අදාල බදු මුදල් 2022 මාර්තු 31 දිනට පෙර ගෙවීමට කටයුතු කරන අතර ඒ අනුව සියළුම දඩ මුදල් නිදහස් කරනු ඇත. | බදු ගෙවීමට අදාල මූලික කටයුතු සිදු කරමින් පවතී. |

## 4.95 නැට්වෙල්ත් සිකියුරිටීස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 235,595,474 | 474,007,547 | 3,675,638,869 | 2,716,657,776 | (243,412,073) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 422,835,039 | 198,414,514 | 1,324,491,207 | 140,983,872 | 224,420,525 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 109,770,602 | 58,649,332 | 1,339,347,469 | 104,712,930 | 51,121,270 | තත්ත්වාගණනය කළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | තක්සේරු වර්ෂ 2008/2009, 2009/2010, 2010/2011, 2011/2012, 2013/2014, 2014/2015, 2015/2016 සහ 2017/2018 සඳහා පිළිවෙලින් රු.24,136,857 , රු.77,382,317 , රු.84,378,708 , රු.66,181,759 , | සමාගම මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය ගැලපීම් කල යුතුය. | දේශීය ආදායම් පනතේ විධිවිධානවලට යටත්ව ආදායම් හා වැට් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. ප්‍රාථමික වෙළඳපල ගණුදෙනු ආදායම් බද්දෙන් හා | ඡේදයේ සඳහන් කර ඇති තක්සේරු කරන ලද මුළු ආදායම් බදු වටිනාකම වූ රු.431,581,015 ක මුදල, 2022 |

රු.18,288,933 , රු.113,687,212 , රු.36,466,487 සහ රු.11,058,742 ක් ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආදායම් බදු තක්සේරු සමාගමට ලැබී තිබුණි. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට අනුව, නැට් වෙල්ත් සිකියුරිටීස් සමාගම විසින් බදු ගෙවිය යුතු අතර, එම බදු මුදල් මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු බවට ගිණුම්ගත කර නොතිබුණි.

වැට් බද්දෙන් නිදහස් බැවින් ඒ මත ජනිත වන ලාභයක් මත බදු ගෙවීමක් හෝ බදු වෙන් කිරීමක් සිදු කර නැත.

කෙසේ වෙතත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නිර්වචනය අනුව ප්‍රාථමික වෙළෙඳපල ගණුදෙනු වශයෙන් සලකා බලනු ලබන්නේ භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපලෙන් මිලදීගෙන විකිණීමට අදාලව එක් දවසක් පමණි. ඒ අනුව දෙවන දින සිට ඉහත සියළුම භාණ්ඩාගාර බැඳුම්කර ද්විතික වෙළෙඳපල ගණුදෙනු වශයෙන් සලකා තක්සේරු වාර්තා නිකුත් කොට ඇත.

මේ සම්බන්ධයෙන් නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම විසින් අභියාචනාධිකරණයේ හා බදු අභියාචනා කොමිෂන් සභාවේ නඩු ආරම්භ කොට පවත්වා ගෙන යයි. ඒ අනුව අවසන් ගිණුම්වල ගෙවිය යුතු බදුවලට අදාලව අසම්භාව්‍ය බැරකමක් වශයෙන් දක්වා ඇත.

දැනට සමාගම ඇවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් සියළුම හිඟ බදු ගෙවීමට

පෙබරවාරි 14 දින තෙක් ගෙවා නොතිබුණි.


| | | | | |
|---|---|---|---|---|
| | | | ඇවර කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | |
| (ආ) | 2013 වර්ෂය සඳහා රු.16,600,601 ක් සහ 2014 වර්ෂය සඳහා රු.58,097,943 ක් ලෙස මූල්‍ය සේවාවන් සඳහා එකතු කල අගය මත බදු තක්සේරු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණි. කෙසේ වෙතත් එය පියවීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනයේ ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි. | සමාගම මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය ගැලපීම් කල යුතුය. | ප්‍රාථමික වෙළඳපලේ ගණුදෙනු බදු නිදහස් ලෙස සලකා අවසන් ගිණුම් වල එකතු කල අගය මත ගෙවිය යුතු බදු වශයෙන් වෙන් කිරීමක් සිදුකොට නැත. කෙසේ වෙතත් සමාගම ඈවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ඒ සඳහා පත් කරන ලද ඈවර කිරීමේ කමිටුවේ නිර්දේශ හා මහපොළ භාරකාර මණ්ඩලයේ අනුමැතිය ඇතිව සියළුම හිඟ බදු ගෙවීමට තීරණය කර ඇත. | ඡේදයේ සඳහන් කරන ලද එකතු කරන ලද අගයමත වූ මුළු (VAT) බදු වටිනාකම වූ රු.74,698,544 ක මුදල 2022 පෙබරවාරි 14 දින තෙක් ගෙවා නොතිබුණි. |
| (ඇ) | සමාගම ප්‍රාථමික ගණුදෙනුකරුවකු ලෙස ව්‍යාපාරික කටයුතු සිදු කිරීම තාවකාලිකව අත්හිටුවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් කොන්දේසි සහිතව මාස 06 සඳහා අවලංගු කිරීමට තීරණය කර තිබුණි. මෙහිදී සමාගමේ අයිතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම අවසන් කරන තෙක් සහ මාසිකව සමාගමේ වර්ධනය පිලිබඳ වාර්තා ඉදිරිපත් කල යුතු විය. ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් වන තෙක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය අවසන් කිරීමට අවස්ථාව නොමැත. තවද සමාගම විසින් විමර්ෂණ හා අධීක්ෂණ කටයුතු සිදු කිරීමේදී ප්‍රාථමික හා ද්විතීක | සමාගම නියමිත වේලාවට කොන්දේසි වලට අනුකූල වීමට අවශ්‍ය පියවර ගත යුතුය. | සමාගමේ පැවැත්ම පවත්වාගෙන යා යුතු අවම ප්‍රාග්ධනය වූ රු. බිලියන 1 ක් පවත්වාගෙන යාමට අපොහොසත් වීම මත ශ්‍රී ලංකා මහ බැංකුව අවවාද කොට තිබූ අතර එවකට වෙළඳපල පැවති අවපාතය හේතුවෙන් හා ප්‍රාථමික ගැණුම්කාර සමාගමක් වූ පර්පැචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මූල්‍ය අවභාවිතය හේතුවෙන් ගණුදෙනු කරුවන්ගේ විශ්වාසය දුර්වල වීම මත ඔවුන්ගේ ආයෝජනය හදිසියේ ඉල්ලා සිටීම ඒ අනුව | සමාගම ඈවර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ඒ අනුව කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | |
|---|---|---|---|---|
| | වෙළඳපොළේ රජයේ සුරැකුම්පත් ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු වලට ඵලදායීව සහභාගී වීම සිදුකළ යුතු අතර සියළු අවස්ථා වල සමාගම අදාළ නීතිරීති හා රෙගුලාසි මාර්ගෝපදේශ වලට එකඟ විය යුතුය. කෙසේ වෙතත් එම කොන්දේසිවලට අනුකූල වීමට සමාගම අපොහොසත් වීම නිසා ප්‍රාථමික ගනුදෙනුකරුවකු ලෙස ව්‍යාපාර කටයුතු සිදු කිරීම අත්හිටුවන ලදී. | | රු.මිලියන 700 ක පමණ අලාභයක් ලබා තිබුණි.<br>තවද ප්‍රාථමික වෙළඳපලේ කටයුතු සඳහා රු.බිලියන 5 ක පමණ කාරක ප්‍රාග්ධනයක් අළුතින් හඳුන්වා දිය යුතුව තිබුණි.<br>ප්‍රධාන ආයෝජකයා වූ මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල, එම අවදානම් ව්‍යාපාරය සඳහා තවදුරටත් මුදල් යෙදවීම අනුමත නොකළ බැවින් ආයතනය සතු සියළු කොටස් විකිණීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලා සිටින ලදි.<br>2020 ඔක්තෝබර් මස අමාත්‍ය මණ්ඩල තීරණය ලැබූ අතර සමාගම ඈවර කිරීමට නිර්දේශ කොට තිබුණි. ඒ අනුව නැට් වෙල්ත් සෙකියුරිටීස් සමාගම විසින් 2020 නොවැම්බර් 20 වන දින ප්‍රාථමික ගැණුම්කාර බලපත්‍රය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ආපසු භාර දෙන ලදී. | |
| (ඇ) | 2014 වර්ෂයේදී පෞද්ගලික සමාගම් 02 කට (වයිට් ග්‍රෝව් හෝල්ඩින්ග්ස් හා ඇස්ට්‍රල් කැපිටල් හෝල්ඩින්ග්ස්) ගෙවන ලද රු.19,725,000 ක් වූ අවිධිමත් තැරැව් ගාස්තු සම්බන්ධයෙන් සමාගම විසින් 2016 වර්ෂයේදී අපරාධ පරීක්ෂණ | මෙම සමාගම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති ද යන වග තහවුරු කර ගැනීමටත් ඒ අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග | මෙම වංචනික ගණුදෙනුව සඳහා සෘජුවම සමාගමේ සිටි ප්‍රධාන විගණන නිලධාරී හාෆිස් කැම්බල් සම්බන්ධ බැවින් මෙම නොසලකා හැරීම් සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. | මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අවශ්‍ය පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. එහි ප්‍රගතිය පත් කරන |

| | | | |
|---|---|---|---|
| දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. මෙම සමාගම් මූල්‍ය සමාගම් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී තිබේද යන්න පිළිබඳ ගෙවීම කිරීමට පෙර සමාගම විසින් සනාථ කරගෙන නොතිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. | ගැනීමටත් කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් කටයුතු කළ සමාගමේ සියළු නිලධාරීන්ට විරුද්ධව පියවර ගත යුතුව තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් දැනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණ පවත්වන අතර අවශ්‍ය නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය . | ලද නිතීඥවරයා මාර්ගයෙන් සොයා බලනු ලබයි. |

## 4.96 ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී

| | මුළු ආදායම | මුළු වියදම | මුළු වත්කම් | මුළු වගකීම් | බදු පෙර ලාභය (අලාභය) | මතය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | |
| **2018** | 6,458,750,055 | 5,402,188,414 | 8,568,143,665 | 2,530,359,893 | 1,056,061,640 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 6,464,813,140 | 5,808,659,452 | 8,901,417,154 | 2,847,363,578 | 667,653,687 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 5,954,768,530 | 5,494,659,105 | 9,267,888,059 | 2,637,674,092 | 467,109,425 | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED 1/2015 ට පටහැනිව, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරි / ප්‍රධාන මූල්‍ය | සමාගමේ කටයුතු සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් පීඑල්සී යනු ලැයිස්තුගත පොදු සමාගමක් වන අතර ඉන්ධන දීමනාව සේවකයින්ගේ වේතනයේ කොටසකි. පෙර සිටම පවතින සංවිධාන භාවිතයට අනුව ඉන්ධන සීමාවන් අර්ථ දක්වා ඇත. බඳවා ගැනීමේදීම වැටුප් පැකේජයේ | 2022 ජනවාරි 31 දිනටත් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබූ අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය |


| | | | | |
|---|---|---|---|---|
| | නිලධාරි සඳහා පිළිවෙලින් ලීටර් 50 සහ ලීටර් 35 කින් සීමාව ඉක්මවා ඉන්ධන දීමනා ලබා දී ඇත. | | කොටසක් ලෙස ඉන්ධන හිමිකම තීරණය කර ඇත. ඉන්ධන ඇතුළුව සමස්ත වේතනය අපේක්ෂකයින් සමඟ සාකච්ඡා කරනු ලබන අතර සමාන තනතුරු කාණ්ඩ සහ අනෙකුත් පොදු ලැයිස්තුගත සමාගම් විසින් පිරිනමනු ලබන ප්‍රමාණයන්ට සමාන විය යුතුය. | ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2017 වර්ෂයේදී සමාගම රු.42,127,193ක් ආයෝජනය කරමින් සීෂෙල්ස් හි වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කළේය. සීෂෙල්ස් වෛද්‍ය මධ්‍යස්ථානය 2019 සහ 2018 වර්ෂයන්හි පිළිවෙලින් රු.11,193,820 සහ රු. 2,473,850 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. වෛද්‍ය මධ්‍යස්ථානය දිගින් දිගටම පාඩු ලබන බැවින් 2020 මැයි 12 වැනි දින මෙහෙයුම් නතර කිරීමට මණ්ඩලය තීරණය කළේය. තවද, කළමනාකාරිත්වය විසින් ආයෝජනයේ සම්පූර්ණ පාඩුව තක්සේරු කර නොතිබුණි. | ආයෝජනයක් කිරීමට පෙර නිසි ඇගයීමක් කළ යුතුය. | සීෂෙල්ස් වෛද්‍ය මධ්‍යස්ථානයක් විවෘත කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ සීෂෙල්ස් වෙතින් රෝගීන් යොමු කරවා ගැනීමයි. පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් පසු සීෂෙල්ස් වෙතින් රෝගීන් යොමු කර ගැනීමටට එය අහිතකර ලෙස බලපෑ අතර සීෂෙල්ස් වෛද්‍ය මධ්‍යස්ථාන මෙහෙයුම්වලින් පාඩු ලැබීමට එය හේතු වී තිබේ. COVID-19 තත්ත්වය ද සීෂෙල්ස් හි මෙහෙයුම්වලට අහිතකර ලෙස බලපාන ලදී. විශේෂයෙන්ම සීෂෙල්ස් හි පිහිටි මධ්‍යස්ථානයට අත්‍යවශ්‍ය සැපයුම් දිගටම කරගෙන යාමට අපට නොහැකි විය. අපගේ කාර්ය මණ්ඩලයේ අහිතකර ප්‍රවණතා සහ ආරක්ෂාව සැලකිල්ලට ගනිමින්, 2020 ජූලි 31 දින සිට මෙහෙයුම නතර කළෙමු. | මෙම වෛද්‍ය මධ්‍යස්ථානය 2020 වසරේ වසා දමා තිබූ නමුත් 2022 ජනවාරි 31 දින වන විටත් අලාභයට හේතු සහ වගකිවයුතු පුද්ගලයින් හඳුනාගෙන නොතිබුණි. |
| (ඇ) | සමහර විශේෂිත ක්ෂේත්‍ර සඳහා කුලියට ගත් උපදේශකයින් 21 දෙනෙකුගෙන් ලබාගත් සේවාවන් සඳහා සමාගම | ගෙවීම ලාභදායී දැයි පරීක්ෂා කිරීම සඳහා නිසි ඇගයීමක් කළ යුතුය. | ශ්‍රී ලංකාව රෝහල් මත පදනම් වූ වෙළඳපොළකට වඩා උපදේශකයින් විසින් මෙහෙයවන වෙළඳපොළක් ඇති රටකි. ශ්‍රී ලාංකීය රෝගීන්ගෙන් බහුතරයක් තමන් කැමති | මෙම අතිරේක ගෙවීම 2022 ජනවාරි 31 වන විට තවමත් ක්‍රියාත්මක වේ. |

වෙන වෙනම ගෙවා ඇති නමුත් ඊට අමතරව එම උපදේශකයින් රඳවා තබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ඔවුන්ට රු.110,381,165ක් ගෙවා ඇත.

උපදේශකවරුන්ගෙන් උපදෙස් ලබා ගන්නේ රෝහල් නම්වලින් නොව උපදේශකවරුන්ගේ නම්වලින්ය. මෙම ස්වභාවය ලංකා හොස්පිටල්ස් රෝහලට ද අදාළ වේ. කර්මාන්තයේ ප්‍රමුඛයා වීමට ලංකා හොස්පිටල්ස් රෝහලට ප්‍රධාන ඉහළ කීර්තිමත් උපදේශකයින් සමඟ හවුල්කාරිත්වයක් තිබිය යුතුය. පැය විසිහතර පුරාම රෝගීන් රෝහලට පැමිණෙන අතර සමහර රෝගීන්ට හදිසි පදනමක් මත විශේෂිත වෛද්‍ය ආධාර අවශ්‍ය වේ. වෙනත් ව්‍යාපාරවල මෙන් නොව වෛද්‍ය ආධාර ප්‍රමාද වීම මිනිස් ජීවිතයට හානියක් විය හැකි බැවින් රෝහලට විවිධ විශේෂතා පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ උපදේශකයින් සමඟ හවුල්කාරිත්වයක් අවශ්‍ය වේ. මෙම ප්‍රමුඛ උපදේශකවරුන් පූර්ණ කාලීන සේවකයෙකු ලෙස සම්බන්ධ වීමට අකමැති නිසා රෝහලේ කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගත නොහැකි අතර ඔවුන්ව පූර්ණ කාලීන සේවකයෙකු ලෙස බඳවා ගැනීමට අවශ්‍ය නම් ආයතනයට ඊටත් වඩා විශාල මුදලක් වැය වේ.

## 4.97 ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 1,369,559,775 | 1,092,302,605 | 1,145,665,150 | 295,833,057 | 277,257,170 | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 1,480,345,783 | 1,167,897,766 | 1,448,433,037 | 425,007,433 | 312,448,017 | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 1,582,098,465 | 1,213,650,272 | 1,359,213,402 | 384,884,011 | 368,448,193 | තත්ත්වාගණනය නොකළ |





| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 9.7 වගන්තියට අනුව වැටුප් හා දීමනා අනුමත බඳවාගැනීම් සහ උසස්වීම් | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. | ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම (LHD) යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපිත වූ සමාගමක් වන අතර ලංකා හොස්පිට්ල්ස් | 2022 ජනවාරි 31 වන විටත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පටිපාටි මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව කිසිදු සංශෝධනයකට ඉඩ නොදේ. කෙසේ වෙතත්, සමාගම එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | | කෝපරේෂන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධිත පුද්ගලික සීමිත වගකීම් සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. ශ්‍රී ලාංකේය රසායනාගාර කර්මාන්තය අතිශයින්ම තරඟකාරී වන අතර, සාර්ථක වීමට සහ ක්ෂේත්‍රයේ සැලකිය යුතු වෛද්‍ය රසායනාගාර සේවා සපයන්නෙකු ලෙස හඳුනා ගැනීමට, වෙළඳපොලේ අනෙකුත් පෞද්ගලික වෛද්‍ය රසායනාගාරවලට සමගාමීව සිය ක්‍රියාකාරකම් සිදුකිරීමට ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගමට සිදුවේ. එබැවින්, වෙළඳපොලේ තරඟකාරී වීම සඳහා තරඟකාරී වැටුප් සහ වේතන සපයන දක්ෂ හා කුසලතා සහිත කාර්ය මණ්ඩලයක් බඳවාගෙන නඩත්තු කිරීමට ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගමට සිදුවේ. | |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 9.2 (ඇ) වගන්තියට අනුව, | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. | ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම (LHD) යනු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස | 2022 ජනවාරි 31 වන විටත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | සංවිධාන සටහන සහ අනුමත සේවක සංඛ්‍යාව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබිය යුතු වුවත් සමාගම එම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | | සංස්ථාපිත වූ සමාගමක් වන අතර ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන්ස් පීඑල්සී හි පූර්ණ අනුබද්ධිත පුද්ගලික සීමිත වගකීම් සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ. | |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක PED/12 අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. | සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට අමතරව ලංකා හොස්පිට්ල්ස් ඩයග්නොස්ටික්ස් (පුද්ගලික) සමාගම සඳහා වෙනම වාර්ෂික වාර්තාවක් නොමැත. | 2022 ජනවාරි 31 වන විට වෙනම වාර්ෂික වාර්තාවක් සකස් කර නොතිබුණි. |

## 4.98 හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) පීඑල්සී

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2,995,518,000 | 3,108,030,000 | 15,330,551,000 | 1,409,733,000 | (126,461,000) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 4,363,245,000 | 3,258,352,000 | 16,605,325,000 | 1,579,615,000 | (312,448,000) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 1,117,399,000 | 2,043,595,000 | 16,295,030,000 | 2,195,516,000 | (877,343,000) | තත්ත්වාගණනය නොකළ |





| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 2,995.52 | 3,108.03 | 15,330.55 | 1,409.73 | (126.46) |
| 2019 | 4,363.25 | 3,258.35 | 16,605.33 | 1,579.62 | (312.45) |
| 2020 | 1,117.40 | 2,043.60 | 16,295.03 | 2,195.52 | (877.34) |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2020 වර්ෂය ආරම්භයේදී සමාගමේ සමුච්චිත අලාභය රු. 6,937,589,000 ක් වූ අතර 2020 වසර අවසන් වන විට එය රු. 7,821,569,000 දක්වා වැඩි වී තිබුණි. ඊට සමගාමීව 2020 වසර අවසානයේ දී සමාගමේ අහිතකර කාරක ප්‍රාග්ධනය රු.997,068,000 ක් විය. | ලාභදායී ස්ථාන කරා එහි දිශානතිය යොමු කිරීම සහ කාරක ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම. | සන්නාමගත නවාතැන්, වාණිජ කුළුණු සහ සිල්ලර අලෙවිසැල් සහිත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | සමාගමේ සමුච්චිත අලාභය සහ අහිතකර කාරක ප්‍රාග්ධනය වැඩි වී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | සමාගම විසින් 2014 වර්ෂයේදී හෝටලයේ නවීකරණය කිරීමේ වැඩසටහන සඳහා ලංකා බැංකුවෙන් සහ සම්පත් බැංකුවෙන් ඩොලර් මිලියන 27 ක ඒකාබද්ධ ණයක් අයැදුම් කර ඇත. කෙසේ වෙතත්, ඉහත බැංකු දෙක සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, සමාගම ඉහත ඩොලර් මිලියන 27 ක ණය අවලංගු කරමින් DFCC බැංකුවෙන් 2018 වර්ෂයේදී ඩොලර් මිලියන 30 ක අලුත් ණය මුදලක් අයැදුම් කර ඇත. පසුව, DFCC බැංකුව සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, සමාගම ඉහත USD මිලියන 30 ක ණය අවලංගු කරමින් 2020 වර්ෂයේදී රු.බිලියන 2 ක ණය මුදලක් මහජන බැංකුවෙන් අයදුම් කර ඇත. ඇමරිකානු ඩොලර් ණය මුදල ලබාගෙන නොතිබුණද, සමාගම විසින් දරන ලද ගිවිසුම් ගාස්තු, ඒකාබද්ධ ගාස්තු සහ නෛතික ගාස්තු රු. 17,659,767 ක් සහ මුද්දර ගාස්තු හා සැකසුම් ගාස්තු රු. 5,665,900 ක් නවීකරණය කිරීමේ වැඩසටහනේ පිරිවැය ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත. | දැනටමත් භාවිතා කර ඇති ණය සඳහා පිරිවැය සම්බන්ධ නොවන අතර දැනට පවතින ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා භාවිතා නොකරන ලද බැවින්, එය දරන ලද කාල සීමාව සඳහා වියදම් ලෙස සැලකිය යුතුය. | ණය ගිවිසුම සඳහා දරන ලද පිරිවැය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියට සෘජුවම සම්බන්ධ වූ අතර ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබුණේ සම්පූර්ණයෙන්ම සමාගමේ පාලනයෙන් තොරව ය. | වියදම් දැරූ කාලය තුළ එය හඳුනාගෙන නොතිබුණි. |

## 4.99 සීඑෆ්සී ෆවුන්ඩින්ග් (ඇපයෙන්) සීමිත සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 22,271,306 | 22,271,306 | 125,028,081 | 125,028,081 | - | තත්ත්වාගණනය කළ |
| **2019** | 25,097,649 | 25,097,649 | 100,004,729 | 100,004,729 | - | තත්ත්වාගණනය කළ |
| **2020** | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොමැත. | | | | | |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 22.27 | 22.27 | 125.03 | 125.03 | - |
| 2019 | 25.10 | 25.10 | 100.00 | 100.00 | - |
| 2020 | - | - | - | - | - |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | මූල්‍ය නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නෛතික ලේඛන කෙටුම්පත් කිරීම සඳහා මෙම සමාගම පිහිටුවා ඇති අතර 2019 අප්‍රේල් මාසයේදී කෙටුම්පත් කරන ලද කොළඹ මූල්‍ය නගර පනත නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. | මූල්‍ය නගර පනත සකස් කිරීම අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. | මූල්‍ය නගර පනත කෙටුම්පත් කර නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර පසුව කැබිනට් මණ්ඩලය පත් කළ කමිටුවක් වෙත යොමු කර ඇත. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |


| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2017 සහ 2018 වර්ෂවලදී පිළිවෙළින් රු.මිලියන 71ක් සහ රු.මිලියන 100ක් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රදානය කර තිබූ අතර එම මුදලින් රු.මිලියන 129ක් 2019 මාර්තු 31 වන විට ජංගම ගිණුමේ නිෂ්ක්‍රීයව පැවතුණි. | භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. | ප්‍රායෝගික ගැටලු සහ නීතිමය සීමාවන් හේතුවෙන් ජංගම ගිණුමක මුදල් ශේෂය රඳවා ගැනීමට සිදු වූ විය. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED/12 හි 6.5.1 වගන්තියට අනුව, මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගම විසින් වාර්ෂික මූල්‍ය ප්‍රකාශයේ කෙටුම්පත විගණකාධිපති වෙත ලබා දිය යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 05ක ප්‍රමාදයක් සහිතව 2019 නොවැම්බර් 06 දින වේ. | චක්‍රලේඛවල විධිවිධානවලට අනුකූල විය යුතුය. | සමාගමේ ගිණුම් කටයුතු සිදු කිරීම සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් නොමැති වීම. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |
| (ඈ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක. PED/12 හි 5.1.3 වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්මේ පිටපතක් ඊළඟ මූල්‍ය වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති වෙත යොමු කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම එය ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛවල විධිවිධානවලට අනුකූල විය යුතුය. | අමාත්‍යාංශයෙන් ඉල්ලන තොරතුරු ලබා දුන් අතර ඒ සම්බන්ධයෙන් නොදැන සිටීම. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ ආරම්භක සාමාජිකයෙකුට/ආරම්භක අධ්‍යක්ෂකවරයෙකුට ගෙවා ඇති රු.4,382,578ක වෘත්තීය දීමනාව 2020 මාර්තු 31 දිනෙන් අවසන් වූ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 18 වැනි ඡේදයට අනුව, සමාගම මූල්‍ය | පිළිතුරු සපයා නොතිබුණි. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |

| | | | | |
|---|---|---|---|---|
| | ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ප්‍රකාශනවල අදාළ පාර්ශව සමඟ ඇති ඍජු හෝ වක්‍ර ගිවිසුම්වල තත්ත්වය හෙළි කළ යුතුය. | | |
| (ඊ) | 2003 ජූනි 02 දින රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 හි 7.4.5 ඡේදය, ස්ථාවර වත්කම් සහ ඉන්වෙන්ට්‍රි අයිතම පිළිබඳ වාර්ෂික භෞතික සත්‍යාපනයක් පැවැත්වීම අවශ්‍ය වුවත්, 2020 මාර්තු 31 දිනෙන අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම රු.9,353,423 ක් වූ දේපල, පිරියත සහ උපකරණ සඳහා භෞතික සත්‍යාපනය එදිනට සිදු කර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |
| (උ) | 2020 මාර්තු 26 දිනැති අංක. CP/20/0595/204/052 දරන අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව සීමාසහිත CFC Founding (Guarantee) සමාගම ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීමට තීරණය කර තිබුණද, විගණන දිනය වන 2021 මාර්තු 19 වන විටත් සමාගම විසුරුවා හැරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ තීරණය ක්‍රියාත්මක කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |
| (ඌ) | සමාගම පිහිටුවා ඇති ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුමේ 1.4 වගන්තියට අනුව, කුලී තැන්පතුව මාසික කුලී වටිනාකම සහ සේවා තැන්පතුව මෙන් තුන් ගුණයක් විය යුතුය. ගිවිසුමේ 9 වන උපලේඛනයට | මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන මගින් හෙළිදරව් කළ යුතුය. | පිළිතුරු සපයා නොතිබුණි. | සමාගම විසුරුවා හැරීමට යෝජනා කළ නිසා කරුණු සොයා ගැනීමට නොහැකි විය. |

අනුව, සමාලෝචිත වර්ෂය සඳහා බදු ගිවිසුමේ තැන්පතු මුදල රු.2,124,636 ක් වූ අතර ගිණුම්වලට අනුව ගෙවා ඇති වටිනාකම රු.257,690 කි. වෙනස වූ රු.1,866,945 ක තැන්පතුව මුදල් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. තවද, විදුලි තැන්පතුව ලෙස රු.109,975 ක මුදලක් ද අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි.

## 4.100 සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල් සමාගම


| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 89,482,586 | 90,749,709 | 211,689,556 | 12,229,453 | 14,750,722 | තත්ත්වාගණනය කළ |
| **2019** | 69,608,460 | 78,021,201 | 211,591,653 | 11,535,430 | 5,862,694 | තත්ත්වාගණනය කළ |
| **2020** | 16,833,188 | 44,245,388 | 197,298,670 | 11,688,779 | 18,031,933 | තත්ත්වාගණනය නොකළ |




| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| 2011 නොවැම්බර් 18 දිනැති අංක.DMS/E4/47/9/282/1/1 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ විධිවිධානවලට පටහැනිව, නිලධාරීන් 33 දෙනෙකු සඳහා 2019 හා 2020 වර්ෂවල පිළිවෙලින් රු.2,638,750 ක් හා රු.2,266,500 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ විධිවිධාන පිළිපැදිය යුතුය. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත මෙම ගෙවීම් සිදු කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පමණක් මෙම ගෙවීම් අඛණ්ඩව සිදු කර තිබුණි. |

## 4.101 සීමාසහිත ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2,844,531,980 | 2,765,891,006 | 1,353,618,185 | 234,847,435 | 78,640,974 | තත්ත්වාගණනය කළ |
| **2019** | 3,321,821,316 | 3,143,686,220 | 1,525,439,303 | 238,575,310 | 178,135,096 | තත්ත්වාගණනය කළ |
| **2020** | 2,034,727,483 | 1,934,001,706 | 1,944,712,162 | 246,086,610 | 100,725,777 | තත්ත්වාගණනය කළ |





| විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|
| නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සියළු අමුද්‍රව්‍ය වියදම් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය විසින් දරන බැවින්, නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත් කරන අපතය විකිණීමෙන් ලැබෙන ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවත්, 2020 වර්ෂයේ අපතය විකුණුම් | නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත්කරන අපතය විකුණුම් ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කළ යුතු වීම. | 2011 වර්ෂයේ දී අධක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අපතය ලෙස ඉවත් වන ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ආදායම සේවක සුබසාධන ගිණුමට බැර කර ඇත. | අපතය විකුණුම් ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට සමාගම විසින් 2021 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. |

ආදායම රු. මිලියන 12.6 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. ඒ අනුව 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වර්ෂ 10 කදී රජයට අහිමිවී තිබුණු ආදායම රු. මිලියන 152.52 ක් විය.

## 4.102 ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 36,528,358 | 29,879,576 | 223,526,873 | 78,157,792 | 6,648,781 | තත්ත්වාගණනය කළ |
| **2019** | 22,696,922 | 25,712,706 | 196,812,423 | 54,606,225 | (3,015,782) | තත්ත්වාගණනය කළ |
| **2020** | 18,340,074 | 25,142,746 | 208,125,539 | 56,258,639 | (6,802,673) | තත්ත්වාගණනය කළ |




| | මුළු ආදායම රු.මිලියන | මුළු වියදම රු.මිලියන | මුළු වත්කම් රු.මිලියන | මුළු වගකීම් රු.මිලියන | බදු පෙර ලාභය (අලාභය) රු.මිලියන |
|---|---|---|---|---|---|
| 2018 | 36.53 | 29.88 | 223.53 | 78.16 | 6.65 |
| 2019 | 22.70 | 25.71 | 196.81 | 54.61 | (3.02) |
| 2020 | 18.34 | 25.14 | 208.13 | 56.26 | (6.80) |

| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | දකුණු කොරියාවේ රැකියා සඳහා විදේශගත වූ ශ්‍රමිකයන්ගෙන් වසර 10කට පෙර රඳවාගෙන සිටි රු.50,000 බැගින් වූ මුළු මුදල රු.16,215,000ක් සහ මැලේසියාව බලා පිටත්ව ගිය ශ්‍රමිකයින් 241 දෙනෙකුට | රැකියා සඳහා විදේශගත වූ ශ්‍රමිකයන්ගෙන් අයකරගෙන නැවත ගෙවීමේ පරමාර්ථයෙන් රඳවාගෙන ඇති මෙම මුදල් කඩිනමින් ගෙවා දැමීමට කටයුතු කළ යුතුය. | ඉල්ලීම් ඉදිරිපත් වුවහොත් ගෙවීම සඳහා මෙම ශේෂ ඉදිරියට ගෙන එමින් පවතී. කාර්යාංශය විසින් යැපෙන්නන් නිශ්චය කර ඉදිරිපත් නොකිරීම | 2021 දෙසැම්බර් 31 දින වන විටත් අදාල හිමිකරුවන් වෙත ගෙවා දැමීමට කටයුතු නොකර රඳවාගෙන තිබුණි. 2021 දෙසැම්බර් 31 වන විට නිරවුල් නොකළ |

| | | | | |
|---|---|---|---|---|
| | අදාළ පුද්ගලයින් වෙත ලබාදීම සඳහා මැලේසියානු සේවාලාභීන්ගෙන් වසර 02කට පෙර එවා තිබූ රු.1,904,322 ක වීසා ගාස්තුව ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි.<br>විදේශ රැකියා සඳහා රටින් පිටව ගොස් මියගිය ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් 2013-2018 කාලය තුළ නියෝජිතායතනයට ලැබුණු මරණ සඳහා රු.8,273,415 ක් වූ මුළු වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | විදේශගතව මිය ගිය ශ්‍රමිකයන් වෙනුවෙන් ලැබුණු මෙම වන්දි මුදල්, යැපෙන්නන් හඳුනාගෙන ඔවුන්ට අදාළ මුදල් ලබාදීමට කඩිනම් කටයුතු කළ යුතුය. | මත අදාල පාර්ශව වෙත ගෙවීමට ප්‍රමාද විය. | ශේෂය රු.7,090,083 ක්ව පැවතුණි. |
| (ආ) | රැකියා සඳහා කොරියාව සහ ඊශ්‍රායලය වෙත පිටත්වන ශ්‍රමිකයන්ට වෛද්‍ය වාර්තා නිකුත් කිරීමේ අරමුණ වෙනුවෙන් පුද්ගලික ආයතනයක් සමඟ ආරම්භ කරන ලද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා සමාගම විසින් රු.3,476,298 ක කාර්යාල උපකරණ සහ කුලියට ලබාගත් ගොඩනැගිල්ලක් සපයා තිබුණි.<br>එම වෛද්‍ය මධ්‍යස්ථානය මගින් ව්‍යාජ වාර්තා ලබාදී ඇති බව විදේශ රාජ්‍යයකින් දන්වා තිබීම මත අදාල ගිවිසුමට අනුකූලව, ව්‍යාපාරික කටයුතු නවතා | කළමනාකාරීත්වයේ අකාර්යක්ෂමතාවයේ සහ නොසැලකිලිමත්කමේ ප්‍රතිඵලයක් ලෙස මෙම වෛද්‍ය මධ්‍යස්ථානය ආරම්භ කිරීම සහ නඩත්තු කිරීම ආයතනයට අහිතකර වූ නිසා මෙයට වගකිවයුත්තන්ට විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථානයේ බලහත්කාරයෙන් රැඳී සිටින එහි අධ්‍යක්ෂක වරයා හේතුවෙන් බදු ගිවිසුමේ (f) වගන්තිය අනුව කටයුතු කිරීමට නොහැකි වී ඇත.<br>ගොඩනැගිලි හිමිකරුගේ ඉල්ලීමට අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව රු.2,640,000 ක කුලී මුදල වාරික 12 කින් ගෙවා ඇත.<br>2017 ඔක්තෝම්බර් මෙම ගැටලුව පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට | නියමිත කාලය තුල අදාල පෞද්ගලික ආයතනය කුලී ගොඩනැගිල්ලෙන් ඉවත් නොවීම හේතුවෙන් අයවීමට ඇති කුලී මුදල් සම්බන්ධයෙන් සමාගමට එරෙහිව ගොඩනැගිලි හිමිකරු ගොනුකර තිබුණු නඩුව අවසන් වී නොතිබුණි. |


| | | | | |
|---|---|---|---|---|
| | දමන ලෙස එම පුද්ගලික ආයතනයට දන්වා තිබුණද, අනවසරයෙන් වර්ෂ 05 ක් සමාගමේ වත්කම් සහ නාමය භාවිතා කරමින් වෛද්‍ය මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් තිබුණි. එසේම ව්‍යාපාරික කටයුතු අත් හිටුවා තිබියදී සමාගම විසින් වර්ෂයක ගොඩනැගිලි කුලී ලෙස රු. 2,640,000 ක් නිෂ්කාර්යයව ගෙවා තිබුණි. | | දැනුම් දී ඇත. ඒ අනුව දැනට විභාග වෙමින් පවතින නඩු දෙකක් සඳහා අවශ්‍ය නීතිමය සහාය නීතිපති දෙපාර්තමේන්තුව විසින් සමාගමට ලබා දී ඇත. | |
| (ඇ) | විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් සහන රක්ෂණ අරමුදලට අදාලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා සමාගම අතර ඇති කරගත් ගිවිසුමේ රක්ෂණ ආවරණ කාලය අවුරුදු 02 ක් සහ මාස 01 ක් වුවත්, ඊට අදාලව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා සමාගම අතර ඇති කරගෙන තිබුණු ගිවිසුමේ ආවරණ කාලය අවුරුදු 2 ක් සහ මාස 03 ක් වී තිබුණි. එම අමතර කාලය තුල රක්ෂිතයන්ට සිදු වූ හානි පූර්ණයේ වගකීම සමාගමට දැරීමට සිදු වී තිබීම හේතුවෙන් වර්ෂ 03 ක කාලපරිච්ඡේදයක් සඳහා එකතුව රු.7,024,940 ක අමතර වන්දි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | මෙම ගිවිසුම අත්සන් කිරීමේදී ඉදිරියේදී ඇති විය හැකි අවදානම සහ ඒ තුලින් සමාගමට සිදුවන මූල්‍යමය අලාභය පිළිබඳ අවධානය යොමු නොකිරීමත්, රක්ෂණය වී ඇති සාමාජිකයන්ට වන්දි ගෙවන ආකාරය පිළිබඳ විධිමත් පරිදි එකඟතාවයකට නොපැමිණීමට අදාළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | මෙම රක්ෂණ ක්‍රමයට අදාලව අත්සන් කර ඇති ගිවිසුමට අනුව, වන්දි මුදල් ගෙවීමේ වගකීම සමාගම සතු වූ බැවින් අදාල ගෙවීම් කර ඇත. | සමාගමේ කළමනාකරණය විසින් දිගින් දිගටම නොසැලකිලිමත්ව කටයුතු කර තිබීම හේතුවෙන් සමාගමේ මූල්‍ය තත්වය දූර්වල තත්වයකට පත්වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 හා 2020 වර්ෂවල සමාගමට රටවල් 05 කින් වසර දෙකක් දක්වා වලංගු රැකියා ඇණවුම් 14 ක් යටතේ රැකියා අවස්ථා 1492 ක් ලැබී තිබුණද, විගණිත දිනය වූ 2021 මාර්තු 30 දින වන විටත් විදේශගත කර තිබුණේ ශ්‍රමිකයින් 20 දෙනෙකු පමණි. ජපන් රජයෙන් වෘත්තීය හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර වලට අදාලව රැකියා ඇණවුම් 04 ක් යටතේ රැකියා අවස්ථා 481 ක් ලැබී තිබුණ ද, ඉන් ශ්‍රමිකයින් 15 දෙනෙකු පමණක් රැකියා සඳහා යොමුකර තිබුණි. | රාජ්‍ය අනුග්‍රහය සහිත මෙම ව්‍යාපාරික අවස්ථාව ප්‍රයෝජනයට ගෙන සමාගම ආරම්භ කිරීමේ අරමුණ ඉටුකර ගැනීමට කළමණාකරණයෙහි අවධානය යොමු විය යුතුය. | පසුගිය කාලපරිච්ඡේදයේ පැවති ගෝලීය වසංගත තත්ත්වය මත රැකියා ඇණවුම් සඳහා ශ්‍රමිකයින් විදෙස් ගතකිරීම අවම මට්මක පැවතුනි. | 2020 හා 2021 වර්ෂයන්හි දී සමාගම විසින් රැකියා ඇණවුම් මඟින් විදේශ ගත කර ඇති සංඛ්‍යාව පිළිවෙලින් 109 දෙනෙකු හා 152 දෙනෙකු පමණක් වී තිබුණි. |
| (ඉ) | ඊශ්‍රායල් රාජ්‍ය සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ රැකියා සඳහා යොමු කිරීම සම්බන්ධව ඇති කරගත් ගිවිසුමට අනුව ඊශ්‍රායිල් රාජ්‍ය වෙත පිටත්ව යන ශ්‍රමිකයින්ගේ රැකියා බලපත්‍ර කාල සීමාව අවසන්වන විට තම රටට නැවත ගෙන්වා ගැනීමේ වගකීම සමාගම සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැවරී තිබුණද වර්ෂ දෙකක් තුල නීති විරෝධී ලෙස ඊශ්‍රායල් රාජ්‍ය තුල රැඳී සිටි ශ්‍රමිකයින් 105 දෙනෙකු නැවත සිය රටට ගෙන්වා ගැනීමට හෝ ඔවුන්ගේ | රැකියා සඳහා විදේශ ගත වී නැවත නොපැමිණි ශ්‍රමිකයින් හෝ ඔවුන් වෙනුවෙන් ඇප බැඳුම්කර සඳහා අත්සන් තබන ලද පුද්ගලයින් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කල යුතුය. | බලපත්‍ර කාලසීමාව අවසන්ව නීත්‍යානුකූල නොවන පරිදි එම රටෙහි රැඳී සිටින ශ්‍රමිකයින් නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | විගණන වාර්තාවෙන් ඉස්මතු කර ඇති කරුණු පිළිබඳ නිසි අවධානය යොමු වී නොතිබුණු අතර ඊශ්‍රායලයට නැවත රැකියා සඳහා විදේශ ගත වන අයගෙන් ලබාගත් ඇප මුදලින් 2021 දෙසැම්බර් 31 දින මේ වන විට රු.15,100,000 ක ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. . |

ඇපකරුවන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. එහෙත් රු.2,500,000 ක ඇප බැදුම්කරයක් තබා ඊශ්‍රායලයේ රැකියාවට ගොස් තම රැකියා කාල සීමාව නිමකර සිය රටට පැමිණ නැවත විගමණය වූ විගමනිකයන්ගෙන් ඉහත ඇප බැදුම්කරයට අමතරව රු.100,000 ක මුදල් ඇපයක් ගැනීමට සමාගම කටයුතු කර තිබුණි.

## 4.103 ජාතික ව්‍යාපාර කළමනාකරණ පාසල (පුද්ගලික) සමාගම

| | මුළු ආදායම රු. | මුළු වියදම රු. | මුළු වත්කම් රු. | මුළු වගකීම් රු. | බදු පෙර ලාභය (අලාභය) රු. | මතය |
|---|---|---|---|---|---|---|
| **2018** | 2,554,680,695 | 2,896,207,306 | 10,618,379,569 | 10,038,296,389 | (341,526,610) | තත්ත්වාගණනය නොකළ |
| **2019** | 3,020,245,234 | 3,028,588,641 | 10,637,354,161 | 10,184,195,582 | (8,343,408) | තත්ත්වාගණනය නොකළ |
| **2020** | 3,336,322,289 | 2,751,571,491 | 11,218,648,450 | 10,298,017,335 | 584,750,798 | තත්ත්වාගණනය නොකළ |




| | විගණන නිරීක්ෂණය | විගණකාධිපතිගේ නිර්දේශය | ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග | ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති අංක. පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 ඡේදය ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟතාවය මත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාල අමාත්‍යාංශය විසින් බඳවා ගැනීමේ | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කිරීම කළ යුතුය. | කිසිදු භාණ්ඩාගාර මූල්‍ය ආධාරයකින් තොරව ක්‍රියාත්මක වන පූර්න ස්වයං මූල්‍ය ආයතනයක් බැවින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය | චක්‍රලේඛ උපදෙස් පරිදි 2021 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | පටිපාටිය අනුමත කළ යුතුය. කෙසේ නමුත්, සමාගමේ බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අමාත්‍යංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | පමණක් ප්‍රමාණවත් වේ. | |
| (ආ) | උක්ත චක්‍රලේඛයේ 8.3.3 ඡේදය ප්‍රකාරව, දිරි දීමනා ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ නමුත්, එලෙස අනුමැතිය ලබා නොගෙන 2018 වර්ෂය සඳහා රු.90,502,435 ක දිරි දීමනා හා අලෙවිකරණ අංශය සඳහා රු.3,663,218 ක විශේෂ දිරි දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. | සමාගමේ ව්‍යාපාර කටයුතු කළමණාකරණය සුපරීක්ෂණය හා මෙහෙයවීම සඳහා අවශ්‍ය සියළුම බලතල අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. | චක්‍රලේඛ උපදෙස් පරිදි 2021 දෙසැම්බර් 31 දක්වාම කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | තක්සේරු වටිනාකම රු.322.350,000 ක් වූ ජාතික ව්‍යාපාර කළමනාකාරීත්ව විද්‍යායතන සමාගම පවත්වාගෙන යනු ලබන අක්කර 25 ක භූමිය හා නව ගොඩනැගිල්ලක් ඉදිකරමින් පවතින අක්කර 15 ක භූමිය වසර 30 ක කල් බදු පදනම මත ලබා ගැනීමට නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එකඟ වී වසර ගණනාවක් ඉක්මවා තිබුණද 2021 මැයි මාසය දක්වාම නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කල්බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. | කල්බදු ගිවිසුම අත්සන් කිරීමට අදාල කටයුතු ඉටු කළ යුතුය. | කල්බදු ගිවිසුම අත්සන් කිරීමට අදාල කටයුතු ඉටු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇත. | 2021 දෙසැම්බර් 31 දක්වාම කල් බදු ගිවිසුම අත්සන් කර නොතිබුණි. |